සාරාර්ථචන්ද්‍රිකා නම් වූ

සාරස්වතාර්ථ ව්‍යාඛ්‍යාව

විද්‍යෝදය පරිවේණාධිපති

කහවේ ශ්‍රී සුමඞ්ගල රතනසාරාභිධාන

කොළඹ නවකෝරළේ

ප්‍රධාන නායක ස්ථවිරපාදයන් වහන්සේ විසින්

ලියන ලදී.

ප්‍රථම භාගය.

හත්වෙනි වරට

ගුණපාල කහවෙවිතාරණ විසින්

කොළඹ හුණුපිටියේ ජිනාලඞ්කාර යන්ත්‍රාලයෙහි

මුද්‍රණය කරවන ලදී.

බු: ව: 2501.
ක්‍රි: ව: 1957.

මිල රු: [illegible]-00

මෙය නීලම්මහර විහාරාධිපති

ඇරැව්වල ගරු සීලාලඞ්කාර

මහා ස්ථවිරයන්වහන්සේට පින්පිණිස පූජාකරණලදී.

සංගීසථවිවඳුලේ 1930 ක්‍රිවූ නොවැම්බර මස

7 වෙනි දිනදීය.

සංඥාපනය.

ශ්‍රී අනුභූති ස්වරූපාචාර්යයන් විසින් සාරස්වතීය සූත්‍ර සඞ්කලනයෙන් විරචිත සාරස්වත ව්‍යාකරණය වනාහි එකල පටන් මේ දක්වාත් බොම්බා කල්කටා බාරානසී ආදි ප්‍රදෙශයන්හි ද ලඞ්කාවෙහි ද දෙවිභාෂීය ශබ්දව්‍යුත්පත්තික්‍රමාදී ග්‍රහණධාරණාදියෙහි තත්පර වූ බොහෝදෙනාගේ පඨන පාඨකයන් සුප්‍රකාශිතවයට පැමිණ පවත්නා වූ කවිජන සම්භාවනීය සුප්‍රසිද්ධව්‍යාකරණයකි. මේ ව්‍යාකරණයෙහි "ලොකාවෙජ්ජසස්ස සිද්ධිඃ"යි පඨිත පාඨය අනුව යාමෙන් වරින්වර පාණිනීයාදි නානා ව්‍යාකරණයන්ගෙන් ගෙණ ඌනපූරණාදි වශයෙන් සම්මිශ්‍රිත බොහෝ පාඨයෝ තන්හි තන්හි දක්නා ලැබෙත්. එසේ කරණ ලද ඒ සම්මිශ්‍රණයෙන් හා නොයෙක් පලාත්හි නොයෙක් වර මුද්‍රණය කිරීමෙන් ඇති වූ සාවද්‍යපාඨ හා ඇතැම් තන්හි උචිත නොවන පාඨයෝ ද දක්නා ලැබෙත්. එසේ හෙයින් ම තන්හි තන්හි මුද්‍රිත ඒ ඒ පොත් ඇතැම් පාඨයන්ගෙන් එකිනෙකට සමනුවූවෝ ද වෙති. එබැවින් දුන් ව්‍යවහාරප්‍රාප්ත සාරස්වත ව්‍යාකරණය වනාහි සූචිරමතාවට වඩා ව්‍යාකරණාන්තරීය අධිකපාඨසම්මිශ්‍රණයෙන් දක්නා ලැබේ. ඒ සම්මිශ්‍රිත පාඨාන්තරයන් ද උද්ග්‍රහණයෙහි විශෙෂ ඥානයක් ඇතිවීමට මුත් පරිහාණියට හේතු නොවන බැවින් ඒ ඒ පලාත්හි වරින්වර මුද්‍රිත ඒ ඒ සාරස්වතයන් හා අපර ලඞ්කාවෙහි භාවිත පුස්කොළ පිටපත් ද සිද්ධාන්තකෞමුදී ආදි වෙනත් ව්‍යාකරණයන් ද සසඳා බලා ගතයුතු. ඒ පාඨාන්තරයන් ඉවත් නො කොට සැදැස් යැයි සිතියැකි බොහෝ පාඨ නිදෙස් කිරීමෙන් හා ඉවත් කිරීමෙන් අප් මේ ව්‍යාඛ්‍යානය කරණ ලදී.

K. RATANASARA

31 – 3 – 34

සාරස්වතීය සන්ධිප්‍රක්‍රියානාගත
උදාහරණයන්ගේ අර්ථ.

පිට　උදාහරණ　අර්ථ

33 අක්ෂෞහිණී-රථාදි සමූහවත් සේනාව
73 අග්නිඃ අත්‍ර-මෙහි ගින්නායි
47 අග්නී අත්‍ර-මෙහි ගිනි දෙකකි
73 අසෞඃ යාති-පාපිෂ්ඨය යව
40 අද්‍ය ඕම්-අද යහපති
74 අන්තර්ගතඃ-ඇතුළට ගියේය
46 අමී ආදිත්‍යාඃ-මොහු සූර්යයෝයි
36 අසෞ ඉන්දුඃ-මේ චන්ද්‍රයායි
70 අහඃ අත්‍ර-දවස මෙහි
,, අහර්ගණඃ-දින සමූහය (මාසය)
,, අහර්පතිඃ-දිවසාධිපති (හිරු)
,, අහෝරාත්‍රම්-දවල් රීයකිම්
64 ආක්‍රංස්‍යත්-ආක්‍රමණය කරන්නේය
92 ආච්ඡාදයති-වසයි
43 උපකාරීයති-ප්‍රාකාරයට සමීප (වූවක් මෙන් කෙරේ
42 උපාර්ච්ඡති-සමීපයටයේ
43 උපර්ෂභීයති-ඍෂභයෙකුට සමීප (වූවෙකුමෙන් කෙරේ
42 ඍණාර්ණම්-ණයදීමට ගන්නාය
32 ඏනුබන්ධඃ-ඏකාරය අනුව බැඳුනේ

පිට　උදාහරණ　අර්ථ

75 එෂඃ හසති-මෙමතම සිනාසේ
52 කකුප්ඵෙළී-ඉදුරුදිග
54 කකුප්භාසඃ-ශෝභාව, සතුට
42 කම්බලාර්ණම්-කම්බල වස්ත්‍රය පිණිස (වූ නය
64 කංසඃ-කස්තලිය
39 කකිඹුඃ-කකුළුවත් ඇති ලිද
71 කඃ අර්ථඃ-කිනම් අර්ථයක්ද ?
68 කඃ ඛනති-කවරෙක් හාරාද ?
71 කඃ ගතඃ- ,, ගියේද ?
56 කඃ චරති- ,, හැසිරේද ?
,, කඃ ඡිනත්ති- ,, ඡේද්ද ?
67 කඃ තනොති-,,පතුරුවාද ?
68 කඃ ඵලති- ,, ඵලදේද ?
56 කඃ ශූරඃ- ,, ශූරද ?
68 කඃ ශෙතෙ- ,, ශයනය කෙරේද ?
,, කඃ ෂණ්ඪඃ- ,, නපුංසකද ?
57 කඃ ෂෂ්ඨඃ- ,, සැවැනිද ?
68 කඃ සාධුඃ- ,, යහපත්ද ?
69 කාරස්කරඃ-කිම්පාකවෘක්ෂය
65 කිංහ්නුතෙ-කිම් සොරකම් කෙරේද ?
65 කිංහ්මලයති-කිම චලිත වේද ?
,, කිංහ්‍යඃ ඊයේද් කිම ?

පිට උදාහරණ අණ

65 කිං හ්ලාදයති-කිම
සතුටුකරවාද ?
,, කිං භවලයති-කිම
චලිතවේද ?
39 කුලටා -වේසගන
41 ගම්භෝදකම්-ගඟදිය
33 ගවාක්ෂඃ-දුල් කවුළුව
,, ගවාජිතම්-ගෙරිගම
,, ගවේන්ද්‍රඃ-ගෙරින්ගේ
අධිපතියා
74 ගිඃ පතිඃ-වාචස්පති
(සුරගුරු)
80 ගුඪඃ ආත්මා-ගුප්තවූ
ආත්මය
29 ගෞරී අත්‍ර-මෙහි උපමාවයි
67 චතුස්ත්‍රිංශත්වාජිනඃ
සූතියක් අශ්වයෝ
53 චින්මයම්-සිතින්
නිපදවනලද්ද
47 ජම්පතී ඉව-අඹුසැමි
දෙදෙනා මෙන්
,, ජායාපතී ඉව-අඹුසැමි
දෙදෙනා මෙන්
69 තස්කරඃ-සොරයා
56 තත් චිත්‍රම්-ඒ චිත්‍රකර්මය
හෝ ආශ්චර්යය
57 තත් ටිකතෙ-ඊට
ගමන්කෙරේ
,, තත් ටීකා-ඒ ටීකාව
58 තත් ලුනාති-ඒ කපයි
51 තත් ශාස්ත්‍රම්-ඒ ශාස්ත්‍රය
54 තත් හවිඃ-ඒ ගිතෙල
39 තව ඉදම්-මේ තාගේය
41 තව සෞඛ්‍යඃ-තාගේ සෞඛ්‍යය
43 තව සංස්කාරඃ-තාගේ
සංස්කාරය
45 තව එෂා-මේ තොමෝ
තාගේය
,, තව ඓශ්වර්යම්-තාගේ
ඓශ්වර්යය
,, තව ඔදනම්-තාගේ බත
,, තව ඔෂ්ඨඃ-තාගේ තොල
,, තව ඖන්නත්‍යම්-තාගේ
උන්නත භාවය
,, තව ඡත්‍රම්-තාගේ ඡත්‍රය
36 තමෙව ආසනම්-ඒ
පිණිසවූ ආසනය
64 තං කරොති-ඒ කෙරේ
,, තං ජානාති-ඒ දනී
,, තං තනොති-ඒ විස්තර
කෙරේ
63 තං හසති-ඊට සිනාසේ
37 තෙ අත්‍ර-මෙහි ඔහුයි
36 තෙ ආගතාඃ-ඔහු ආවාහුය
26 තෞ ඉහ-මෙහි ඔහු
දෙදෙනයි
33 දධි ආනය-දී ගෙණෙව
37 දධි ඉහ-දී මෙහිය
47 දම්පතී ඉව-අඹුසැමි
දෙදෙන වැනි
42 දශාණම්-පයොදුශ්යන්
දශයක් ඇති පෙදෙස
50 දෙවදත්ත අත්‍රගෙහෙ වරති-
දෙවදත්තය මෙහි
ගෙයා හැසිරේ
,, දෙවදත්ත එහි - දෙවදත්තය එව
71 දෙවාඃ ශාන්ති- දෙවියෝ ඉවසා සිටිත්

පිට උදාහරණ අණ

67 දෙවානාම් රාජා-දෙවිරජ
72 දෙවඃ අත්‍ර-දෙවියෝ
මෙහිය
74 ධූඃ පතිඃ-ධුරපතියා
32 නයනම්-ඇස
35 නායකඃ-පමුණුවන්නා
63 පවුං චාථා-දක්ෂයාට
නිරර්ථකයි
73 පටුඃ යජතෙ-දක්ෂතෙම
පුදයි
67 පටූ අත්‍ර-මෙහි දක්ෂයෝ
දෙදෙනෙකි
37 පටො අත්‍ර - දක්ෂයා මෙහි
36 පටො ඉහ- ,,
40 පතංජලිඃ-එනම් ,,
භාෂ්‍යකාර ඍෂිතෙම්
63 පයාංසි-ජලය හෝ කිරි
42 පරමතීඃ-පරමවූ පූජිතයා
44 පර්යංකඃ-පලඟ
69 පාරස්කරඃ-පරතෙර
කරන්නේ
32 පිත්‍රර්ථඃ-පියාගේ අර්ථය
75 පුනඃ රමතෙ-නැවත ඇලේ
33 ප්‍රෞඪඃ-ඉතා වැඩුනේ
,, ප්‍රෞඪිඃ-ඉතා වැඩීම
(සාමාර්ථ්‍යය)
42 ප්‍රාර්ච්ඡති-ඉතා මුළාවේ
,, ප්‍රාණම්-ප්‍රකෘෂ්ටනය
43 ප්‍රාර්ෂභීයති-ප්‍රකෂීයෙන්
ඍෂභයෙකු මෙන් කෙරේ
61 ප්‍රත්‍යඞ් ඉදම්-මේ
පශ්චිමරටයි
66 ප්‍රාඞ්ෂෂ්ඨඃ-පූර්වදෙශය
සවැනිමේ
74 භ්‍රාතඃ අත්‍ර-උදෑසන මෙහි
45 බිම්බොෂ්ඨඃ-බිඹුවැනි
තොල් ඇත්තේ
73 භගොඃ නමස්තෙ-පින්වත
ඔබට නමස්කාරවේවා
60 භවාන්තනොති-
පින්වත් තෙමේ පතුරුවයි
58 භවාන් ලිඛති-
පින්වත්තෙමේ ලියයි
61 භවාන් ශූරඃ- ,, ශූරයි
59 භවාන් ෂෂ්ඨඃ- ,, සවැනියි
69 භාස්කරඃ-ආලෝක
කරන්නේ (හිරු)
77 භූමිඃ ආදදෙ-බිම් ගන්නේය
73 භොඃ එහි-පින්වත
එනුමැනව
31 මධු අත්‍ර-මී මෙහි
,, මධ්වරිඃ-මධුරිපු
,, මධ්වාසනම්-මධුනම්
අසුරයාගේ අස්න
37 මධූදකම්-මිහිරි ජලය
39 මනීෂා-බුද්ධිය
71 මනො රථඃ-කැමැත්ත
62 මාච්ඡිදත්-නොකපව
47 මාලෙ ආනය-මල්දෙක
ගෙණෙව
62 ම්ලෙච්ඡඃ-පාමරජ තිනයා
65 යං ලොකම්-යම් ලෝකයක්
61 රාජං ඉහ-එම්බා රජමෙහි
60 රාජං චිත්‍රම්- ,, ආශ්චර්යය
47 රොදසී ඉව-සගී දෙකක්
වැනි
62 ලක්ෂ්මීච්ඡායා-ශ්‍රීයගේ
සෙවන

පිට	උදාහරණ	අර්ථ
39	ලාඞ්ගලීෂා–	නගුලිය
42	වත්සරාණීම්–	අවුරුද්දෙදකින් දිය යුතු නය
,,	වත්සතරාණීම්–	වසුපැටවා පිණිසවූ නය
67	වයංසොම–	සොමය අපිවෙමු
42	වසනාණීම්–	විසීම පිණිසවූ නය
53	වාඞ්මාත්‍රම්–	වචනය ප්‍රමාණකොට ඇති
52	වාක්යථා–	වචනය යම්සේද
54	වාචිශූරඃ–	වචනයෙහි ශූරයා
,,	වාග්ෂරිඃ–	වචනයට සිංහ වූ
69	වාචස්පතිඃ–	වචනාධිපති
72	වාතා වාතා–	වාතයෝ වාතයෝ
69	වෘහස්පතිඃ–	මහතුන්ගේ ස්වාමියා
39	ශකන්ධුඃ–	ශක නම් දෙශයාකූපය
40	ශිව එහි–	ඊශ්වරය එනු මැනවි
42	ශීතාර්තඃ–	ශීතයෙන් පීඩායි
75	ශුක්තිඃ–	රූප්‍යාත්මනාභාති යහපත්වූ සක තෙමේම බබලයි
37	ශ්‍රද්ධා අත්‍ර –	මෙහි ශ්‍රද්ධාවයි
52	ෂට් අත්‍ර–	මෙහි සයකි
59	ෂට්තරඃ–	සදෙනෙක් මිනිස්සු
53	ෂට් ඉමේ–	සයක් මේවයි
59	ෂට්සිද්ධාන්ති–	සදෙනෙක් නිෂ්පාදයට පැමිණෙත්
65	සයන්තා–	සාරථියා
,,	සංවත්සරඃ–	හවුරුද්ද
67	සඃ ඉමාම්–	ඔහුතෙම, මෙය
,,	සඃ උසාම්–	ඔහුතෙම අඩුයම
75	සඃ චරති–	ඔහුතෙම හැසිරේ
67	සාමයජූංසි–	සාම වෙදමන්ත්‍ර හා යජුර්වෙදමන්ත්‍ර
,,	සිංහස්‍යසි–	සිංහයාධනුවක්වෙහි
61	සුගණ් ඉහ–	මෙහි යහපත් ගණින්නෙකි
66	සුගණ්සෂ්ඨඃ–	ගණින්නා
45	සුඵල්ලාතුඃ–	තරබලලා (සවැනිවෙ)
33	ස්වෛරම්–	ස්වෙච්ඡාව
,,	ස්වෛරිණී–	ස්වෙච්ඡාචාරිණී
40	ස්වරඹම්–	ගොඳයි ශබ්දකරණු
69	හරිශ්චන්ද්‍රඃ–	චන්ද්‍රය වැනි සෘෂියෙක්
39	හලීශා–	නගුලිය,
51	හිමර්තුඃ–	හිමකාලය
,,	හෙ අනඩ්වන්–	එම්බා වෘෂභය
36	හෙ සඛෙ ඉති–	එම්බා යහළුව යනු
44	හොතෘකාරඃ–	හොමකරුගේ ඍකාරය
62	හ්‍රීවත්ඃ –	ලජ්ජා ඇත්තෙක්

මෙහි නිත්‍යසන්ධි සන්ධි කිරීමෙන් ද අනිත්‍යසන්ධි සන්ධි නොකිරීමෙන් ද යොජිත යි.

සාරාර්ථචන්ද්‍රිකා

නම් වූ

සාරස්වතාර්ථ ව්‍යාඛ්‍යාව.

෧ ප්‍රණම්‍ය පරමාත්මානං බාලාධීවෘද්ධිසිද්ධයෙ,
සාරස්වතීමෘජුං කුර්වේ ප්‍රක්‍රියාං නාතිවිස්තරාම්.

ප්‍රණිපත්‍ය ප්‍රණම්‍යාර්ථසිද්ධ්‍යෙ බුද්ධං මුදා හෘදා,
සාරස්වතීප්‍රක්‍රියාර්ථ විවෘතිර්නිජභාෂයා,
සාරාර්ථචන්ද්‍රිකා නාම බාලාර්ථබුද්ධසිද්ධයෙ,

ග්‍රන්ථයන්ගේ ආදිමධ්‍යාවසානයන්හි තමතමන්ගේ ඉෂ්ට දෙවතානුස්මෘති සඞ්ඛ්‍යාත මඞ්ගලාචරණය ස්වසමයාගත විඝ්න ප්‍රශාන්ති නිමිත්ත සච්චරිත්‍රධර්මතාවයයි, නොහොත් ප්‍රාරබ්ධ කෘතිව්‍යාඝාතජනක සමීරිත විඝ්නදූරීභාවයෙන් ඉෂ්ටාර්ථසංසිද්ධි හෙතුයයි ශිෂ්ටසම්මතබැවින් මෙහිදු අනුභූතිස්වරූපාචාර්යවරයෝ ප්‍රථමකොට ආත්මනට පරමාත්මප්‍රණතිකරණය පිණිස "ප්‍රණම්‍ය" යනාදී ශ්ලොකය රචනා කළෝ.

"අහං (අනුභූතිස්වරූපාචාර්ය්‍යඃ) සාරස්වතීං ප්‍රක්‍රියාං ඍජුං කුර්වේ" යනු එහි වාක්‍යයොජනායි. (අනුභූතිස්වරූපාචාර්ය්‍යවූ) මම සාරස්වතීප්‍රක්‍රියාව ඍජු කෙරෙමි යනු එහි අර්ථයි. කුමක් කොට කුමක් පිණිස කෙබඳු සාරස්වතීප්‍රක්‍රියාවක් ඍජු කෙරෙම්ද යත් ?-

෧. පරමාත්මානං, පරමේශ්වරයා, නොහොත් බ්‍රහ්ම විෂ්ණු මහේශ්වර යන මූර්තිත්‍රයය; ප්‍රණම්‍ය, භක්තිශ්‍රද්ධාතිශයෙන් වැඳ; බාලාධීවෘද්ධිසිද්ධයෙ, අව්‍යුත්පන්න බාලජනයාගේ ප්‍රඥාභිවෘද්ධිසිද්ධිය පිණිස; නාතිවිස්තරාම්, (ශබ්දබාහුල්‍යයෙන් තොරබැවින්) ඉතා විස්තර නැත්තාවූ; සාරස්වතීම්, සාරස්වතී නම් වූ, හෙවත්

සරස්වතීප්‍රොක්ත සූත්‍රයන් සම්බන්ධවූ; ප්‍රක්‍රියාම්, පදසාධක ක්‍රියාව, හෙවත් ශබ්දව්‍යුත්පාදකශාස්ත්‍ර සඞ්ඛ්‍යාත ව්‍යාකරණය; සෘජුං කුර්වේ, සෘජු කෙරෙමි, හෙවත් ව්‍යක්තොදාහරණාදියෙන් යුක්ත කෙරෙමි.

මම පරමාත්මයා වැඳ ආධුනිකයන්ගේ ප්‍රඥාභිවෘද්ධිසිද්ධිය සඳහා සාරස්වත ව්‍යාකරණය ව්‍යක්තිඋදාහරණාදියෙන් යුක්ත වූවක් කෙරෙමි යනු මෙහි භාවාර්ථයි.

අනුභූතිස්වරූපාචාර්යයන්ගේ මේ පරමාත්මප්‍රණතියෙහි ලා ස්වලබ්ධිවශයෙන් එක් දෙවතාවෙක් හෝ බොහෝ දෙවතාවෝද නමස්කෘතයයි ගතහැකි වෙත්, හේ වනාහි "පරමාත්මන්" ශබ්දයාගේ අර්ථවිවෙචනයෙන් දතයුතු වේ. නිරුක්තිනයින් එහි අර්ථවිවෙචනය කරන්නාවූ ශාබ්දිකයෝ;- "පරානාත්මනොන්‍යාන් ජනාන් මාති සෘජතීති-පරමඃ, පරම ආත්මාස්වරූපං යස්‍යාසෞ-පරමාත්මා ධාතා" යනුද, පරා උත්කෘෂ්ටා මා ලක්ෂ්මීර්මායා වා යස්‍යාසෞ-පරමඃ, පරම ආත්මා යස්‍යාසෞ-පරමාත්මා හරිඃ" යනුද, 'පරම උත්කෘෂ්ටා ආත්මා ස්වරූපං යස්‍යාසෞ-පරමාත්මා-ඊශ්වරඃ" යනුද කීහු. මෙහි පළමුවන වාක්‍යයෙහි අර්ථය නම්-තමාගෙන් අන්‍යවූ ජනයන් මවන ආත්මස්වරූපය ඇත්තේ යනුයි, ඒ අර්ථයෙන් බ්‍රහ්මයාද, දෙවැන්නෙහි අර්ථය නම්-උත්කෘෂ්ටවූ ලක්ෂ්මියෙන් හෝ මායාවෙන් යුත් ආත්මස්වරූපය ඇත්තේ යනුයි, ඒ අර්ථයෙන් විෂ්ණුද, තෙවැන්නෙහි අර්ථය නම් උත්කෘෂ්ටවූ ආත්ම ස්වරූපය ඇත්තේ යනුයි, ඒ අර්ථයෙන් ඊශ්වරයාද ගම්‍යමානයි, මෙසේ මේ නිරුක්ති ක්‍රමත්‍රයෙන් මූර්තිත්‍රයම වාච්‍ය වේ. මෙහි "ප්‍රක්‍රියා" ශබ්දයාගේ නිරුක්ති දක්වන්නෝ ප්‍රක්‍රියන්තෙ ප්‍රකෘති ප්‍රත්‍යයාදි විභාගෙන ව්‍යුත්පාද්‍යන්තෙ ශබ්දා යයා සා-ප්‍රක්‍රියා"යි කීහු. යමකින් ප්‍රකෘතිප්‍රත්‍යය විභාගයෙන් ශබ්දයෝ විශෙෂණයෙන් උපදවනුලැබෙත් නම් ඒ 'ප්‍රක්‍රියා"යි කියනු ලැබේ යනු එහි අර්ථයි, එනම් ව්‍යාකරණශාස්ත්‍රයයි.

මෙසේ නමස්ක්‍රියාදිය දක්වා නැවත සකල ශබ්දසාගර නිස්තරණය ඉන්ද්‍රාදීන්ට පවා විෂය නොවූබවද, එබැවින් මෙහිදු සාරස්වතීප්‍රක්‍රියාජීවකරණයම පමණක් කරණ බවද පවසනුවස් "ඉන්ද්‍රාදයොපි" යනාදි ශ්ලොකය රචනාකළෝ.

a ඉන්ද්‍රාදයොපි යස්‍යාන්තං න යයුඃ ශබ්දවාරිධෙඃ;
ප්‍රක්‍රියාං තස්‍ය කෘත්ස්නස්‍ය ක්ෂමො වක්තුං නරඃ කථම්.

b තත්‍ර තාවත් සංඥා සංව්‍යවහාරාය සංගෘහ්‍යතෙ.

1. අ ඉ උ ඍ ඏ සමානාඃ.

(අ, 1; 1; ඉ 1, 1; උ 1. 1; ඍ 1, 1; ඏ 1, 1; සමානාඃ 1,3;]

c. අනෙන ප්‍රත්‍යාහාරග්‍රහණාය වර්ණාඃ පරිගණ්‍යන්තෙ, තෙෂාං සමානසංඥා ච විධීයතෙ.

---

a යස්‍ය ශබ්දවාරිධෙඃ, යම් ශබ්ද නමැති සාගරයක්හුගේ; අන්තම්, පරතෙරට; ඉන්ද්‍රාදයඃ අපි, ඉන්ද්‍රාදි දෙවියෝ පවා, නොහොත් ඉන්ද්‍රචන්ද්‍රාදි මහාවෛයාකරණයෝ පවා; න යයුඃ, නොපැමිණියාහුද; තස්‍ය කෘත්ස්නස්‍ය, ඒ සියල්ල සම්බන්ධවූ; ප්‍රක්‍රියාම්, පදසාධන ක්‍රියාවක්; වක්තුම්, කියන්නට; නරඃ, (මා වැනි) මිනිසෙක්; කථම්, කෙසේ; ක්ෂමඃ, සමර්ථ වේද (නොවේමය.)

ඉන්ද්‍රාදීහු-(දිව්‍යවර්ෂසහස්‍රයක් හදාරා මේ ප්‍රකෘතිය මේ ප්‍රත්‍යය මේ සාධනෝපාය කියා) යම් ශබ්දසාගරයක්හුගේ පරතෙරට නොගියාහු නම් (අල්පමතික අල්පායුෂ්ක වූ) මා වැනි මිනිසෙක් කෙසේ එහි පරතෙරට යන්නේද, ඒ නොහැක්කේමය යනු මෙහි භාවාර්ථයි.

මෙසේ මඞ්ගලාචරණාදිය දක්වා ඉක්බිති පළමුකොට මේ ව්‍යාකරණයෙහි සංක්ෂෙපප්‍රක්‍රියාජීවය කරන්නාහු "තත්‍ර තාවත්" යනාදිය කීහු.

b තත්‍ර, ඒ සාරස්වතී ප්‍රක්‍රියාවෙහි; තාවත්, පළමුකොට සංව්‍යවහාරාය; මොනවට ශාස්ත්‍රව්‍යවහාරය පිණිස; සංඥා; සංඥා නොමෝ, හෙවත් ව්‍යාකරණ ව්‍යවහාරයෙහි උචිතවූ සමාන සන්ධ්‍යක්ෂරාදි නාමසමූහය; සංගෘහ්‍යතෙ සඞ්ග්‍රහකරණු ලැබේ.

1 (සමානසංඥාසූත්‍රයි.) අ, අවර්ණය; ඉ, ඉවර්ණය; උ, උවර්ණය; ඍ, ඍවර්ණය; ඏ, ඏවර්ණය (යන මොහු); සමානාඃ, සමාන නම් වෙත්.

c අනෙන, මේ සූත්‍රයෙන්; ප්‍රත්‍යාහාරග්‍රහණාය; ප්‍රත්‍යාහාර ගැණීම පිණිස; වර්ණාඃ, වර්ණයෝ, පරිගණ්‍යන්තෙ, සකලභාවයෙන් ගණිනුලැබෙත්, නොහොත් ප්‍රත්‍යාහාරපරිපාටියෙන් ප්‍රකාශකරණු ලැබෙත්. තෙෂාම්, ඔවුන්ට; සමානසංඥා ච, "සමාන" යන සංඥාවද; විධීයතෙ, කරණුලැබේ.

ව්‍යාකරණාදි ශාස්ත්‍රයන්හි පළමුකොට සංඥාවන් සඞ්ග්‍රහකිරීම ස්වභාවයෙකි කුමක් පිණිසද යත්?, සංව්‍යවහාරය පිණිසයි. සංව්‍යවහාරය නම් ඒ ඒ ශාස්ත්‍රයන්හි අර්ථවිශේෂාවබෝධය පිණිස පවත්නා ශබ්දවිශේෂයන්ගේ සම්‍යක්ප්‍රයෝගයයි. ඒ සංඥාවන් නොදන්නවුන්ට ඒ ශාස්ත්‍රයෝද දුරවබෝධවෙති, එසේ දුරවබෝධවීමෙන් ඔවුන්ගේ පදසිද්ධිනිෂ්පාදනාදියද අර්ථගහන වන්නේ නොවේ. ලෝකයෙහිද ඒ ඒ දේ පිළිබඳව පවත්නා සංඥාවන් නොදන්නවුන්ට ලෝකය පිළිබඳ කටයුතු දේ සිද්ධකර ගැණීම නොහැකිවන්නාක්මෙනි. එබැවින් මේ ව්‍යාකරණයාගේ සංව්‍යවහාරය පිණිස ඒ සංඥාවන් සඞ්ග්‍රහ කරන්නාහු පළමුකොට "අ ඉ" යනාදි සූත්‍රය කීහු. මේ සූත්‍රයෙන් වනාහි කාර්‍ය්‍යවාක් සූචිත වේ. එනම් සාමාන්‍යයෙන් අයන්න පටන් සයන්න තෙක් ඇති අකුරු දෙසාළිස මේ ව්‍යාකරණයෙහි වර්ණමාලාවයි, ඒ වර්ණමාලාවෙහිවූ මේ "අ" ආදි වර්ණ පංක්තියද ගෙණ "අව ඉල" ආදි ප්‍රත්‍යාහාර ගතයුතුබවද, වෙන්කොට ගත් ඒ පංක්තියට "සමාන" යන නාමය ව්‍යවහාරකරණ බවද සූචිතයි. මෙසේ හෙයින් මේ සූත්‍රය "හයවරල" යනාදි වර්ණමාලාවසානයෙහි හදල "අද්‍යන්තා-භ්‍යාම්" යන්න හා එකසම්බන්ධ භාවයෙන් පවත්නේ වේ. එහෙයින්ම මේ සූත්‍රය සංඥා සූත්‍රයෙකි මෙහි "සමාන" යනු සංඥායි. "අ ඉ උ ඍ ඏ" යන මොහු වෙන් වශයෙන් සංඥීන්හුයි (සංඥාව ඇත්තාහුයි)

පදවිභාග වශයෙන් මේ සූත්‍රය සපද වේ, "අ" ආදි පස සමස්තවූ එක් පදයෙකැයි ගතහොත් විපද වේ. එකල්හි:-

"සංහිතෛකපදෙ නිත්‍යා නිත්‍යා ධාතූපසර්ගයොඃ
නිත්‍යා සමාසෙ වාක්‍යෙ තු සා විවක්ෂාමපෙක්ෂතෙ"

යන මෙයින් නිර්දිෂ්ට නියමයට අනුරූප නොවේ, මෙහි අදහස නම් එකපදයෙහි සන්ධියද, ධාතූපසර්ගයන් පිළිබඳ සන්ධියද, සමාසයෙහි සන්ධියද නිත්‍ය වේ; වාක්‍යයෙහි වූකලී කියනුකැමැත්තක්ම අපේක්ෂාකෙරේ යනුයි. මේ නියමය පරිද්දෙන් ගත්කල මේ "අ" ආදි වර්ණපංක්තිය සන්ධිනොකොට සූත්‍රය හැදූරීමෙන් ඒ වර්ණ පංක්තියද අසමස්ත වාක්‍යයක් විය යුතුයි, එකල්හි ඒ පංක්තිය පද පංක්තියක් වියයුතුයි. එබැවින් එහි සන්ධිය වක්තෘවිවක්ෂා වශයෙනි. එසේ තිබියදී වක්තෘ අවිවක්ෂිත බවද ඊට හෙතුද දක්වන්නාහු "නෛතෙෂු" යනාදිය කීහු.

a. නෛතෙෂු සූත්‍රෙෂු සන්ධිරනුසන්ධෙයො 'විවක්ෂිතත්වාත්; විවක්ෂිතස්තු සන්ධිර්භවතීති නියමාත්, ලෞකිකප්‍රයොග නිෂ්පාදනාය සමයමාත්‍රත්වාච්ච.

a එතෙෂු සූත්‍රෙෂු, මේ (උක්තවක්ෂ්‍යමාණ) සූත්‍රයන්හි, සන්ධිඃ, සන්ධිය; නඅනුසන්ධෙයඃ, අනුසන්ධානය නොකටයුතුයි; හෙවත් අන්වේෂණය නොකටයුතුයි. (කුමක්හෙයින්ද?) අවිවක්ෂිතත්වාත්, කතෘවිවක්ෂිතනුවූ බැවිනි, හෙවත් සන්ධිකොට නොකියනු කැමැත්තිවූ බැවිනි. (ඊට හෙතු කිමයත් ?) විවක්ෂිතස්තු, කතෘ විවක්ෂිතවූයේ වනාහි (සන්ධිකොට කියනු කැමැත්තේ වනාහි) සන්ධිඃ භවතීති, සන්ධිවේය යන; නියමාත්, (ආචාර්‍ය්‍යොපදෙශ) නියමහෙයින්ද; ලෞකිකප්‍රයොග නිෂ්පාදනාය, ශිෂ්ටලෝක ප්‍රසිද්ධ ප්‍රයෝගයන්ගේ නිෂ්පත්තියට; නොහොත් ව්‍යාකරණයෙහි වූ ප්‍රයොග නිෂ්පත්තියට; සමයමාත්‍රත්වාච්ච, සඞ්කේතය හෝ නිර්දේශය ප්‍රමාණවත් බැවින්ද අවිවක්ෂිත වී.

මේ සූත්‍රයෙහි හා මෙබඳු තවත් සූත්‍රයන්හි සන්ධියට යෝග්‍ය බොහෝ තැන් කතෘවිවක්ෂාරහිත භාවයෙන් අසංහිතව දක්නා ලැබෙත්. එබැවින් එබඳුතන්හි සන්ධිවිධිය පිළිබඳව අන්වේෂණය නොකටයුතුයි. එබඳු තැන් අවිවක්ෂිත වීමට හෙතුව නම් වාක්‍යයෙහි වූකලී කතෘවිවක්ෂිත වූයේම සන්ධි වේය යන ගුරූපදෙශ නියමයයි, විවක්ෂිතත්වයෙන් සන්ධිකටහැකිවද තිබියදී සන්ධි නොකිරීමට හෙතුව නම්: ලෞකික ප්‍රයොග නිෂ්පත්තිය පිණිස පවත්නා නිර්දේශ සඞ්ඛ්‍යාතවූ සඞ්කෙත ප්‍රමාණවත්ව තිබියයුතුබවයි. මේ සූත්‍රයෙහි ඒ සඞ්කෙත නම් "අ ඉ උ ඍ ඏ" යන මොහුයි මේ පංක්තිය වනාහි සංහිත වීනම් පංක්තියක්සේ නොපැණේ. මේ වර්ණ පංක්තිය සන්ධිවූ විට "අයවෘ" යනු වේ. එකල අසන බලන අයට එහි සන්ධියෙන් ඇති වූ යකාර වකාරද සමානවර්ණයයි සැක කටහැකිවේ. එපමණකුත් නොව ආරම්භයේදීම අවබෝධයට දුෂ්කරසේ සූත්‍රරචනාවට වඩා ප්‍රකාශ මාත්‍රයකින්ම සමාන ස්වරයෝ මොහුයයි දැනගැණීමට සුකරසේ සූත්‍රරචනාව යුතු බැවින්ද මෙහි සන්ධිය අවිවක්ෂිතයි.

මේ "අ ඉ" ආදි ස්වරපංක්තියට පමණක් "සමාන" යන නාමය කුමක් හෙයින් ව්‍යවහාරකරණ ලද්දේද යත්?, මොවුන්ට ස්ථාන ප්‍රයත්න වශයෙන් හා ජාති වශයෙන් තුල්‍ය වූ තමත් මෙතන් ප්‍රමාණයක් ඇතිහෙයිනි. "සමානං මානං තුල්‍යං පරිමාණං

2. හ්‍රස්වදීර්ඝප්ලුතභේදාඃ සවර්ණාඃ.

(හ්‍රස්වදීර්ඝප්ලුතභේදාඃ 1, 3; සවර්ණාඃ 1, 3;)

ශේෂාං තෙ=සමානාඃ" යනු එහි නිරුක්තියි. මේ "අ ඉ උ ඍ ඏ" යන ජාතිපසෙහි ඔවුන්ට සමාන "ආ ඊ ඌ ඎ ඐ" යන පවකයෙක්ද වේ. "ඒ ඓ ඔ ඖ" යන අනික් ස්වර සතරෙහි වනාහි ඒ සතරම හැර තවත් ඔවුන්ට සමානවූ එබඳු වර්ණ නැති බැවින් ඒ සතර සමාන සංඥාවෙන් තොරවූහ. තවද මේ ව්‍යාකරණ සූත්‍රයෝ වනාහි ලක්ෂණ වශයෙන්:-

"සංඥා ච පරිභාෂා ච විධිර්නියම එව ච,
අතිදේශොධිකාරශ්ච ෂඩ්විධං සූත්‍රලක්ෂණම්"

යනු හෙයින් "සංඥා, පරිභාෂා, විධි, නියම, අතිදේශ, අධිකාර" යයි සවැදෑරුම් වෙති. එහි-ශාස්ත්‍රයාගේ සංව්‍යවහාරය පිණිස කරණලද ප්‍රඥප්ති සඞ්ඛ්‍යාත සඞ්කේතසමූහය සංඥායි. ශාස්ත්‍රයාගේ සංක්ෂෙප පරිසමාප්තිය පිණිස කරණලද සඞ්කේතවිශේෂය පරිභාෂායි. නොපැමිණියක්හුගේ පැමිණීම කරන්නේ විධියි. ඒ විධියද වර්ණොත්පාදකස්වරූපය අභාවස්වරූපයයි දෙපරිදි වේ. ඒ අභාවස්වරූපවිධියද නාශ නිෂෙධ වශයෙන් ද්විවිධ වේ. සාමාන්‍යයෙන් පැමිණියක්හුගේ විශෙෂාවධාරණය නියමයි. නැතත සිටි ස්වභාවයක් අන්තැනක ආරොපණය කිරීම අතිදෙශයි. පූර්වසූත්‍රස්ථ පද පරසූත්‍රයන්හි එලඹසිටීම අධිකාරයි. ඒ අධිකාරයද-"සිංහාවලෝකිතාධිකාරය, මණ්ඩූකප්ලුත්‍යධිකාරය, ගඞ්ගාස්‍රොතොධිකාරය"යි ත්‍රිවිධ වේ. එහි-පිළිවෙළින් සූත්‍රකීපයෙක්හි එලඹ සිටීම සිංහාවලෝකිතාධිකාරලක්ෂණයි. සූත්‍ර කීපයක් හැර සූත්‍රයෙක්හි එලඹ සිටීම මණ්ඩූකප්ලුත්‍යධිකාරලක්ෂණයි, අතරතුර සූත්‍ර නොහැර පිළිවෙළින් බොහෝ සූත්‍රයන්හි එලඹසිටීම ගඞ්ගාස්‍රොතොධිකාරලක්ෂණයි. මෙහිද සඞ්කේතසඞ්ඛ්‍යාත භාවයෙන් හෙවත් සංඥාසංඥීභාවයෙන් උපලක්ෂිතවූ "අ ඉ උ ඍ ඏ සමානාඃ" යනාදි සූත්‍රයෝ සංඥාසූත්‍රයෝයි. පරිභාෂාසූත්‍රාදීහුද ඒ ඒ තන්හි ඒ ඒ ලක්ෂණානුසාරයෙන් දතයුතුයි.

"අ ඉ උ ඍ ඏ සමානාඃ" යන සූත්‍රයෙන් මෙසේ "සමාන" සංඥාව කොට නැවත ඒ සමානයන් පිළිබඳ විශෙෂසංඥාවක් කරන්නාහු පරිභාෂා වශයෙන් "හ්‍රස්ව" යනාදි සූත්‍රය කීහු.

2. (සවර්ණපරිභාෂාසූත්‍රයි.) හ්‍රස්වදීර්ඝප්ලුතභේදාඃ, (සමානයන්ගේ) හ්‍රස්ව දීර්ඝ ප්ලුත යන භේද හා උදාත්තාදි භේදයෝ; සවර්ණාඃ, සවර්ණ නම් වෙත්.

අ. ඒතෙෂාං හ්‍රස්වදීර්ඝප්ලුතභෙදාඃ පරස්පරං සවර්ණාඃ, භණ්‍යන්තෙ.

අ. ඒතෙෂාම්, මේ සමානයන්ගේ; හ්‍රස්වදීර්ඝප්ලුතභෙදාඃ, හ්‍රස්ව දීර්ඝ ප්ලුතභෙදයෝ; පරස්පරම්, එකිනෙකට; සවර්ණාඃ භණ්‍යන්තෙ සවර්ණයයි කියනු ලැබෙත්.

පූර්වසූත්‍රයෙන් "සමාන" යයි නම් කරණලද වර්ණපඤ්චකයෙහි වෙන් වෙන් වශයෙන් හ්‍රස්වය දීර්ඝය ප්ලුතයයි භෙද තුණ තුණද තවත් ඒ තුණතුණවූ භෙදයන්ගේ උදාත්ත අනුදාත්ත ස්වරිතයයි භෙද තුණ තුණද, එහි අනුනාසික නිරනුනාසිකයයි භෙද දෙක දෙකද වෙත්; කෙසේද යත්? "අ" යන්නෙහි හ්‍රස්ව දීර්ඝ ප්ලුත යයි භෙද තුණෙකි, ඒ තුණ උදාත්ත අනුදාත්ත ස්වරිත යන භෙදත්‍රයෙන් ගිණීමෙන් නවයෙකි, ඒ නවය අනුනාසික නිරනුනාසික යන ද්විභෙදයෙන් දසඅටෙකි, ඒ දසඅට එකිනෙක සවර්ණ වෙති, "ඉ" ආදියෙහිද මෙසේයි. "ඍ" යන්න පිළිබඳ දසඅට ඒ දසඅටට හා "ඏ" යන්න පිළිබඳ දසඅටටද එසේම "ඏ" යන්න පිළිබඳ දස අට ඒ දසඅටට හා "ඍ" යන්න පිළිබඳ දසඅටටද සවර්ණ වෙති, තවද පාණිනීය මතයෙහි "ඏ" යන්න දීර්ඝභෙදයෙන් තොර වේ, එකල එහි හ්‍රස්වප්ලුත භෙදයෙන් දෙකක්ද, ඒ දෙක උදාත්තාදි භෙදත්‍රයෙන් සයක්ද, ඒ සය අනුනාසික නිරනුනාසික භෙදයෙන් දොළසක්ද වෙත්. මේ "සවර්ණ" යන නාමයාගේ නිරුක්ති දක්වන්නාහු "ස්ථාන ප්‍රයත්නාභ්‍යාං ජාත්‍යා ච සමානො වර්ණඃ-සවර්ණඃ"යි කීහු, ස්ථානප්‍රයත්න වශයෙන් හා ජාති වශයෙන් සමාන වූ වර්ණය සවර්ණ නම් වේ යනු එහි අර්ථයි.

මෙහි සරස්වතීප්‍රොක්ත සූත්‍රයන්ගෙන් අවසාන සූත්‍රය "ලොකාච්ඡෙෂස්‍ය සිද්ධිර්යථා මාතරාදෙඃ" යනුයි. මෙහි නොකියා ශෙෂවූවහුගේ සිද්ධිය අන්‍යව්‍යාකරණයෙන් හෝ ආචාර්‍ය්‍යොපදෙශයෙන් දතයුතු වේ, "මාතර" ශබ්දාදිය සම්බන්ධි සිද්ධිය යම්සේ නම් එසේයි යනු එහි අර්ථයි. අනුභූතිස්වරූපාචාර්‍ය්‍යයෝ ඒ ඇසුරුකොට මෙහි ශෙෂවූවන් පවසනු කැමැත්තෙන් "ලොකාත්" යනාදිය කීහු.

a. ලොකාච්ඡෙෂස්‍ය සිද්ධිරිති වක්ෂ්‍යති, තතො ලොකත එව හ්‍රස්වාදිසංඥා ඥාතව්‍යාඃ, එකමාත්‍රො හ්‍රස්වඃ, ද්විමාත්‍රො දීර්ඝඃ, ත්‍රිමාත්‍රඃ ප්ලුතඃ, ව්‍යඤ්ජනඤ්චාර්ධමාත්‍රකම්.

b. එකමාත්‍රො භවෙද්ධ්‍රස්වො ද්විමාත්‍රො දීර්ඝ උච්‍යතෙ,
ත්‍රිමාත්‍රස්තු ප්ලුතො ඥෙයො ව්‍යඤ්ජනඤ්චාර්ධමාත්‍රකම්.
චාෂස්ත්වෙකං වදෙන්මාත්‍රාං ද්විමාත්‍රං වායසොවදෙත්,
ත්‍රිමාත්‍රං තු ශිඛී බ්‍රෑයාන්නකුලශ්චාර්ධමාත්‍රකම්.

---

a. ලොකාත්, අන්‍යව්‍යාකරණයෙන්; (නොහොත්) ලෝකයෙන් හෝ ආචාර්‍ය්‍ය පරම්පරාවෙන්; ශෙෂස්‍ය, ශේෂයාගේ හෙවත් මෙහි නොකියන ලද්දහුගේ; සිද්ධිඃ ඉති, නිෂ්පත්තියවේයයි; වක්ෂ්‍යති, (ග්‍රන්ථාවසානයෙහි) කියන්නේය; තතඃ, එහෙයින්; ලොකතඃ එව, අන්‍යව්‍යාකරණයෙන් හෝ ආචාර්‍ය්‍ය පරම්පරාවෙන්ම; හ්‍රස්වාදිසංඥාඃ, හ්‍රස්වදීර්ඝාදිසංඥාවෝ; ඥාතව්‍යාඃ, දතයුත්තාහ. (එනම්) එකමාත්‍රඃ, (උච්චාරණකාලවිශෙෂවූ) එකමාත්‍රාවක් ඇත්තේ; හ්‍රස්වඃ, හ්‍රස්ව නම වේ. ද්විමාත්‍රඃ, (එබඳු) මාත්‍රා දෙකක් ඇත්තේ; දීර්ඝඃ, දීර්ඝ නම් වේ; ත්‍රිමාත්‍රඃ, මාත්‍රා තුනක් ඇත්තේ; ප්ලුතඃ, ප්ලුත නම්; ව්‍යඤ්ජනං ච, ව්‍යඤ්ජනයද, අර්ධමාත්‍රකං, අර්ධ මාත්‍රාවෙක් ඇත්තේ වේ.

b එකමාත්‍රඃ, එකමාත්‍රාවක් ඇත්තේ; හ්‍රස්වඃ භවෙත්, හ්‍රස්ව නම වන්නේය; ද්විමාත්‍රඃ, මාත්‍රා දෙකක් ඇත්තේ; දීර්ඝඃ උච්‍යතෙ, දීර්ඝයයි කියනුලැබේ; ත්‍රිමාත්‍රස්තු, මාත්‍රා තුනක් ඇත්තේ වනාහි; ප්ලුතඃ ඥෙයඃ, ප්ලුතයයි දතයුතුයි; ව්‍යඤ්ජනඤ්ච, ව්‍යඤ්ජනාක්ෂරයද; අර්ධමාත්‍රකං, අර්ධයෙක් ඇත්තේ වේ.

චාෂස්තු, නලකිරිතිපක්ෂියා වනාහි; එකාං මාත්‍රාං, එක් මාත්‍රාවක්, වදෙත්, කියන්නේය හෙවත් හඬන්නේය; වායසඃ, කවුඩුතෙම; ද්විමාත්‍රං, මාත්‍රදෙකක්; වදෙත්, හඬන්නේය; ශිඛී තු, මයුරතෙම වනාහි; ත්‍රිමාත්‍රං, මාත්‍රාතුනක්; බ්‍රෑයාත්, හඬන්නේය; නකුලශ්ච, මුගටිතෙමේද; අර්ධමාත්‍රකං, අර්ධමතක් (හඬන්නේය;)

මෙහි අන්‍ය ව්‍යාකරණාදියෙහි නිර්දිෂ්ට ක්‍රමයෙන් හ්‍රස්වාදීන්ගේ ලක්ෂණ ප්‍රකාශිතයි. ඒ පිණිස ගෙණහැර දක්වන ලද ප්‍රථම ශ්ලොකයෙන් හ්‍රස්වාදීන්ගේ මාත්‍රානියමය හා ද්විතීය ශ්ලොකයෙන් තත්තන්මාත්‍රාපරිච්ඡෙදෝච්චාරක සත්ත්වවිශෙෂයද සූචිතයි. මෙහි “මාත්‍රා” ශබ්දය වනාහි අවිච්ඡෙදය අල්පය

a. එෂාමන්‍යෙප්‍යුදාත්තාදිභෙදාඃ සන්ති, උච්චෛරුපලභ්‍යමාන උදාත්තඃ, නීචෛරනුදාත්තඃ, සමවෘත්ත්‍යා ස්වරිතඃ, ස පුනඃ සානුනාසිකො නිරනුනාසිකශ්ච.

3. එ ඓ ඔ ඖ සන්ධ්‍යක්ෂරාණි.

එ 1, 1; ඓ 1, 1; ඔ 1, 1; ඖ 1, 1; සන්ධ්‍යක්ෂරාණි 1, 3;

b. එෂාං හ්‍රස්වා න සන්ති.

පරිච්ඡෙදය අක්ෂරාවයවය ද්‍රව්‍යය ප්‍රමාණය කර්ණභූෂණය කාලය ව්‍රතය ' යන මෙතෙක් අර්ථයන්හි වැටේ, ඉන් මෙහි වනාහි “මාත්‍රා” ශබ්දය කාලවාචක වේ. එබැවින් මාත්‍රාවක් නම් ඇසිපිය හෙළන පමණ කාලය හෝ අසුරගසන පමණ කාලයයි කියනු ලැබේ.

උදාත්තාදි භෙදයන්ද ස්වර පිළිබඳ බැවින් ඔවුන් දක්වන්නාහු ‘එෂාං” යනාදිය කීහු.

a. එෂාං, මේ සමානාක්ෂර සන්ධ්‍යක්ෂරයන්ගේ; අන්‍යෙ අපි; අන්‍යවූද, උදාත්තාදි භෙදාඃ, උදාත්ත අනුදාත්තාදි ප්‍රභෙදයෝ, සන්ති, වෙත්; උච්චෛඃ, උස්තැන්හි හෙවත් උත්පත්තිස්ථානයන්ගේ ඌර්ධ්ව භාගයෙහි; උපලභ්‍යමානඃ, උච්චාරණය කරණු ලබන්නේ; උදාත්තඃ, උදාත්ත නම් වේ; නීචෛඃ; (උත්පත්තිස්ථානයන්ගේ) අධොභාගයෙහි (කියනු ලබන්නේ); අනුදාත්තඃ, අනුදාත්ත නම් වේ; සමවෘත්ත්‍යා, (උදාත්ත අනුදාත්තයන්ගේ සමවෘත්තියෙන් (කියනු ලබන්නේ;) ස්වරිතඃ, ස්වරිත නම් වේ. සඃ, ඒ ප්‍රභෙද සමූහය; පුනඃ, නැවත; සානුනාසිකඃ, නාසානුගත උච්චාරණ සහිත වූයේද; නිරනුනාසිකශ්ච, නාසානුගත උච්චාරණ රහිත වූයේද වේ.

මේ උදාත්තාදි ලක්ෂණයෝ උච්චාරණයෙන් දතයුතුයි. එනම්:- උච්චාරණයෙහිදී ස්වරයාගේ රූක්ෂභාවය හා අස්නිග්ධ භාවයද කණ්ඨවිවරයාගේ සංවෘතභාවයද උදාත්ත ලක්ෂණයි. ස්වරයාගේ මෘදුභාවය හා ස්නිග්ධභාවයද කණ්ඨවිවරයාගේ මහද්භාවයද අනුදාත්ත ලක්ෂණයි. ඒ ලක්ෂණ දෙදෙනාගේ සමාහාරත්වය ස්වරිත ලක්ෂණයි. එහි විස්තර කාශිකාවෘත්තියෙහි නිර්දිෂ්ටයි.

3. (සන්ධ්‍යක්ෂර සංඥා සූත්‍රයි.) එ, එකාරය; ඓ, ඓකාරය; ඔ, ඔකාරය; ඖ, ඖකාර (යන මොහු;) සන්ධ්‍යක්ෂරාණි, සන්ධ්‍යක්ෂර නම් වෙත්.

b. එෂාං, මොවුන්ගේ; හ්‍රස්වාඃ, හ්‍රස්වයෝ; න සන්ති, නැත්තාහ.

4. උභයෙ ස්වරාඃ. (උභයෙ 1, 3; ස්වරාඃ 1, 3;)

a. අකාරාදයඃ සඤ්ඤ ඒකාරාදයශ්චත්වාරශ්චෙවොභයෙ ස්වරා උච්‍යන්තෙ-"අ ඉ උ ඍ ඏ එ ඓ ඔ ඖ".

5. අවර්ණා නාමිනඃ. අවර්ණාඃ 1, 3; නාමිනඃ 1, 3;

මෙහිදු සන්ධ්‍යක්ෂර අවශ්‍යකයි තැති. ප්‍රත්‍යාහාර ග්‍රහණය සඳහා පිළිවෙළින් වර්ණයන් තබන්නාහු 'එ' ආදි වර්ණ චතුෂ්කයද දක්වා ඔවුන්ට "සන්ධ්‍යක්ෂර" යයි නම් කළාහ. "සන්ධෞ ජාතාන්‍යක්ෂ රාණි=සන්ධ්‍යක්ෂරාණි" යනු ඒ සංඥානාමයාගේ නිර්වචනයි. සන්ධියෙහි උපන් අකුරු යනු එහි අර්ථයි. එනම්:- "අ, ඉ" දෙදෙනාගේ සන්ධියෙහි "එ" යන්නද "අ, එ" දෙදෙනාගේ සන්ධියෙහි "ඓ" යන්නද "අ, උ" දෙදෙනාගේ සන්ධියෙහි "ඔ" යන්නද "අ, ඔ" දෙදෙනාගේ සන්ධියෙහි "ඖ" යන්නද වේ. මේ "එ, ඓ, ඔ, ඖ" යන සතරෙහි හ්‍රස්ව නැති බැවින් දීර්ඝ ප්ලුත භෙදයෙන් දෙකදෙකද, ඒ භෙදවල උදාත්තාදි භෙදවශයෙන් ගිණීමෙන් සය සයද, ඒ සය අනුනාසික නිරනුනාසික භෙදයෙන් ගිණීමෙන් දොළොස දොළසද වෙත්. මෙසේ ගත්කල "අ" ආදි පසෙහි දසඅට දොළොස භෙද අනුවක්ද "එ" ආදි සතරෙහි දොළොස බැගින් භෙද අටසාළිසක්ද සියල්ල එකතුව එක්සිය අටතිසක්ද වෙත්. මේ උච්චාරණ විෂයෙහි පවත්නා භෙදයෝයි. "ඏ" යන්නෙහි දීර්ඝ නැත්තේයයි ගත්කල එහි භෙද සයක් පිරිහේ.

4. (ස්වරසංඥා සූත්‍රයි.) උභයෙ, (සමාන වර්ණ සන්ධ්‍යක්ෂර යන) දොවැදෙන; ස්වරාඃ, ස්වර නම් වෙත්.

a. අකාරාදයඃ, අකාරය ආදිකොට ඇත්තාවූ; පව, පසද; එකාරාදයඃ, එකාරය ආදිකොට ඇත්තාවූ; චත්වාරශ්ච, සතරද එහා; උභයෙ, දෙකොටස වර්ණයෝ; ස්වරාඃ උච්‍යන්තෙ, ස්වරයයි කියනු ලැබෙත්. (එනම්) "අ, ඉ, උ, ඍ, ඏ, එ, ඓ, ඔ, ඖ" යන මොහුයි.

"ස්වරන්ති ශබ්දායන්ති ඉති=ස්වරාඃ" යනු නිරුක්ති හෙයින් ශබ්ද උපදවන වර්ණයෝ ස්වරයෝයි. එනම්:-මේ "ආදි වර්ණ නවය ශබ්ද පහළකරණ වර්ණයෝයි.

5. (නාමින් සංඥා සූත්‍රයි.) අවර්ණාඃ, අවර්ණය තොරකරන්නා වූ ස්වරයෝ; හෙවත් අවර්ණය තොරකොට ඇති ස්වරයෝ; නාමිනඃ, "නාමින්" නම් වෙත්.

a. අවර්ණවර්ජාඃ ස්වරා නාමින උච්‍යන්තෙ.

b. අනුක්‍රාන්තාස්තාවත් ස්වරාඃ, ප්‍රත්‍යාහාරජිඝ්‍රාහයිෂයා ව්‍යඤ්ජනාන්‍යනුක්‍රාමති. තද්‍යථා-

6. හයවරල ඤමණනඞම ඣඪධඝභජඩදගබ ඛඵඡඨථචටතකප ශෂස ආද්‍යන්තාභ්‍යාම්.

c ප්‍රත්‍යාහාරං පිණ්ඩාක්ෂරා ආද්‍යන්තාභ්‍යාමේෂා වර්ණා ග්‍රාහ්‍යාඃ, ආදිමධ්‍යෙණාන්‍යෙන ගෘහ්‍යමාණ්‍යක්ෂරාණාමා ප්‍රත්‍යාහාරඃ, තද්‍යථා- අකාරෙණ බකාරෙණ ගෘහ්‍යමාණෝ'බ ප්‍රත්‍යාහාරඃ, සච "අඉඋඍඏ එඓඔඖ හයවරල ඤමණන

a. අවර්ණවර්ජාඃ, අවර්ණ හිනාවූ; ස්වරාඃ, ස්වරයෝ; නාමිනඃ, "නාමින්"යයි; උච්‍යන්තෙ, කියනු ලැබෙත්.

"නමනං නාමඃ, නාමොස්‍යාස්තීති=නාමී" යනු නිරුක්ති බැවින් නැමීම ඇත්තේ නාමින් යයි කියනු ලැබේ. ඉවර්ණාදිය අත්‍යුච්චයට නැමෙන බුලුවර්ණයි යේයි

b. තාවත්, පළමුකොට; ස්වරාඃ, ස්වරයෝ; අනුක්‍රාන්තාඃ, පිළිවෙළින් කියන ලද්දාහ. ප්‍රත්‍යාහාරජිඝ්‍රාහයිෂයා, ප්‍රත්‍යාහාර උගන්වනු කැමැත්තෙන්; ව්‍යඤ්ජනානි; ව්‍යඤ්ජනයන්; අනුක්‍රාමති, පිළිවෙළින් කියයි තද් යථා, ඒ මෙසේයි:-

6. (ප්‍රත්‍යාහාර සංඥා සූත්‍රයි.) හයවරල, යනු හලප්‍රත්‍යාහාර නම්; ඤමණනඞම, යනු ඤම ප්‍රත්‍යාහාරනම්; ඣඪධඝභ, යනු ඣභප්‍රත්‍යාහාර නම්; ජඩදගබ, යනු ජබප්‍රත්‍යාහාර නම්; ඛඵඡඨථ, යනු ඛථප්‍රත්‍යාහාර නම්; චටතකප, යනු චපප්‍රත්‍යාහාර නම්; ශෂස; යනු ශස ප්‍රත්‍යාහාර නම්; ආද්‍යන්තාභ්‍යාම්, (මේ ප්‍රත්‍යාහාර සංඥා වී, ආදි අන්ත අකුරු දෙක හා ගතයුතුවෙත්. හෙවත් ආදි අන්ත වර්ණවලයෙන් නම්කොට ගතයුත්තෝ වෙත්.

c. ප්‍රත්‍යාහාරං, ප්‍රත්‍යාහාරය; පිණ්ඩාක්ෂරා, යනු කැමැත්තනු විසින්; ආද්‍යන්තාභ්‍යාම්, ආදි අන්ත දෙකින්; එතෙ වර්ණාඃ, මේ වර්ණයෝ; ග්‍රාහ්‍යාඃ, ගතයුත්තාහ; ආදිමවර්ණඃ, ආදියෙහි වූ අකුර; අන්‍යෙන, අන්තයෙහිවූ අකුර සමග; ගෘහ්‍යමාණඃ, ගණු ලබන්නේ; තත්නාමා, එනම් ඇත්තාවූ; ප්‍රත්‍යාහාරඃ, ප්‍රත්‍යාහාරයයි. තද්‍යථා, ඒ එසේමැයි; අකාරඃ, අකාරයතෙම; බකාරෙන, බකාරය සමග; ගෘහ්‍යමාණඃ, ගනුලබන්නේ; අබ

ඞම ඣඪධඝභ ජඩදගබ” ඉති ඣබප්‍රත්‍යාහාරඃ, “ඣඪධඝභ” ඉති ඣභප්‍රත්‍යාහාරඃ, එවං යත්‍ර යත්‍ර යෙන යෙන ප්‍රත්‍යාහාරෙණ කාර්‍ය්‍යං භවති ස ස තත්‍ර තත්‍ර ග්‍රාහ්‍යඃ, ප්‍රත්‍යාහාරාණාං සඞ්ඛ්‍යානියමස්තු නාස්ති.

ප්‍රත්‍යාහාරඃ, ඣබප්‍රත්‍යාහාරයයි; සඃ ච, හෙද; ඣ-බ ඉති, “ඣ-බ” යනු; ඣබප්‍රත්‍යාහාරඃ, ඣබප්‍රත්‍යාහාරයයි; ඣඪධඝභ ඉති, “ඣ ඪ ධ ඝභ” යනු; ඣභප්‍රත්‍යාහාරඃ, ඣභප්‍රත්‍යාහාරයයි. එවං, මෙසේ; යත්‍ර යත්‍ර, යම් යම් තැනෙක්හි; යෙන යෙන ප්‍රත්‍යාහාරෙණ; යම් යම් යම් ප්‍රත්‍යාහාරයකින්; කාර්‍ය්‍යං භවති, කටයුත්තක්වේද; සඃ සඃ, ඒ ඒ ප්‍රත්‍යාහාරය; තත්‍ර තත්‍ර, ඒ ඒ තන්හි; ග්‍රාහ්‍යඃ, ගතයුතුයි; ප්‍රත්‍යාහාරාණාං, ප්‍රත්‍යාහාරයන්ගේ; සඞ්ඛ්‍යානියමස්තු ගණන් නියමයක් වනාහි; නාස්ති, නැත්තේය; තොහොත්-සඞ්ඛ්‍යා අනියමස්තු, සඞ්ඛ්‍යා අනියමයක් වනාහි; නාස්ති, නැත හෙවත් ගණන් නියමයක් ඇත්තේ වේ.

මේ සූත්‍රයෙන් ප්‍රත්‍යාහාර සංඥාවෝ නිර්දිෂ්ටයහ. මේ ප්‍රත්‍යාහාර සංඥාවෝ වනාහි පූර්වෝක්ත ස්වර නවයත් සමග ගතයුතු වෙත්. “ප්‍රත්‍යාහ්‍රියන්තෙ සංක්ෂිප්‍යන්තෙ වර්ණා යත්‍ර ස=ප්‍රත්‍යාහාරඃ” යනු “ප්‍රත්‍යාහාර” ශබ්දයාගේ නිර්වචනයි. යම් තැනෙක්හි වර්ණයෝ සංක්ෂෙපකරනු ලැබෙත් නම් ඒ ප්‍රත්‍යාහාරයයි කියනුලැබේ යනු එහි අර්ථයි. ඒ ඒ සූත්‍ර විධිවිෂයෙහි බොහෝ වර්ණයන් ගෙණහැර දක්වා කියයුතු තන්හි එසේ නොකියා ඒ කියයුතු වර්ණයන්ගේ ආදි වර්ණය හා අන්ත්‍ය වර්ණය යන දෙකෙන් ඒ සියල්ලටම නම් කොට “අබ, ඉල” යනාදි වශයෙන් යොදා සූත්‍ර හදාරණ ලද්දාහ. මේ ක්‍රමයෙන් “අබ” යනු අයන්ත පටන් බයන්ත තෙක් ඇති එකුන්තිසක් පමණ වූ වර්ණයන්ට නමකි. සෙස්සද මෙසේයි. මේ ක්‍රමයෙන් ඒ ඒ තන්හි බොහෝ වර්ණයන් වර්ණද්වයකින් සංක්ෂෙපහරණ බැවින් මොවුන්ට ප්‍රත්‍යාහාරයයි ව්‍යවහෘතයි.

මෙසේ ආදිවර්ණ අන්ත්‍යවර්ණවයෙන් නම්කිරීමේ ශාස්ත්‍ර නියමයෙන් ගත්කල ප්‍රත්‍යාහාරයන්ගේ සඞ්ඛ්‍යාව මෙපමණ යයි නියත නොවේ. එබැවින් ප්‍රත්‍යාහාරයන්ගේ නියමයෙක් නැත්තේයයි කීහු, එහෙත් කත්තූත් ප්‍රත්‍යාහාරග්‍රාහක සූත්‍ර නියමයෙන් “සඞ්ඛ්‍යා නියමස්තු නාස්ති” යන්න “සඞ්ඛ්‍යා අනියමස්තු නාස්ති” යනුවෙන් ගෙණ සඞ්ඛ්‍යා නියමය ඇත්තේයයිද ටීකාවන්හි කීහු. ඒ නියමය දක්වන්නාහු:-

7. හසා ව්‍යඤ්ජනානි. (හසාඃ 1, 3; ව්‍යඤ්ජනානි 1, 3;)

ෂ. හකාරාදයඃ සකාරාන්තා වර්ණා හසාව්‍යඤ්ජනානි භවන්ති, ස්වරහීනං ව්‍යඤ්ජනම්. (ස්වරෙණාන්‍යාන් ස්වරහීනම්, අන්‍යථා ස්වරෙෂු ස්වරො නාස්තීති තෙෂාං ස්වරාණාමපි ව්‍යඤ්ජනතා ස්‍යාත්; ස්වා භාවප්‍රධානො නිර්දෙශඃ, ස්වරත්වහීන මිත්‍යර්ථඃ,) තෙෂවකාරඃ ඤුබොධවාරණාර්ථවාදිතසංඥකාඃ.

“එකාදිවර්ණවලහාඃ සහාඃ සථූර්
වාහ්‍යාං මතාමෙරාඨ පඤ්ච චතුහයීඃ,
ෂඩ්භ්‍යඃ ස ආද්‍යක්ෂරනිත්‍යතාත්‍ර
සාරස්වතීයොත්තරසූත්‍රතඃ ස්‍යාත්”

යනුහෙයින් ප්‍රත්‍යාහාර විස්සක්යයි කීහු. එනම්:- “එ ල හ ත” යන වර්ණ සතර එක් එක් ආදිවර්ණයකින් ගෙණ “අව ඉ ල ඣ ස ඡත”යි ප්‍රත්‍යාහාර සතරක්ද, “ඞ” යන්න ආදිවර්ණවයකින් ගෙණ “ඤම යම”යි ප්‍රත්‍යාහාර දෙකක්ද, “පබ” දෙක ආදි වර්ණ සතරකින් ගෙණ “යප ඣප බප චප හබ අබ ඣබ ජබ”යි ප්‍රත්‍යාහාර අටක්ද; “ස” යන්න ආදි වර්ණ සයකින් ගෙණ “හස වස රස ඣස ඛස ශෂ”යි ප්‍රත්‍යාහාර සයක්ද යන මේ විස්සයි. මේ ආද්‍යක්ෂර නියමයෙන් මෙසේ විස්සක් ගැණීම වනාහි මේ සාරස්වතීප්‍රක්‍රියාවෙහි කියනුලබන සූත්‍ර වශයෙනි. ඒ සූත්‍ර නම් “අවකුපවනානරෙපි, සම්ලාත්ෂඃ සඃ තාසනස්‍ය, හො ඣහාඃ, නඃ සක් ඡතෙ, ඤමෙ ඤමා වා, ඤම යමඃ, යමා යපෙස්‍ය, චප ඣපානාං ජබචපාඃ, ශසාත්ඛපාඃ, ආදබෙ ලොපශ්, ජබඣාබ ජබාඃ, හබෙ, හසෙගිහසඃ, රුදාදගවතුර්ණාං භවසාදෙඃ, උරෙස, ඛසෙ චපා ඣසානාම්” යන මේ ආදීහුයි.

තවද මේ “හයවරල” යනාදි සූත්‍රය විපදික එක් සූත්‍රයක් වශයෙන් උපන්‍යස්තවුවත් ඇතැම් කෙනෙක් “හ” ආදිය වෙන වෙන පද වශයෙන් ගෙණ චතුස්ත්‍රිංශත්පදිකයයිද, ඇතැම් කෙනෙක් “හ-ස” යනු එක් සූත්‍රයක් වශයෙන්ද “ආද්‍යන්තාභ්‍යාම්” යනු වෙන සූත්‍රයක් වශයෙන්ද සම්හරෙක් “හයවරල” යනාදීන් සූත්‍ර අටක්යයිද ව්‍යවහාර කළ බැව් පෙනේ.

7. (ව්‍යඤ්ජනසංඥා සූත්‍රයි.) හසාඃ, හසප්‍රත්‍යාහාර වර්ණයෝ; ව්‍යඤ්ජනානි, ව්‍යඤ්ජන නම් වෙත්.

ෂ. හකාරාදයඃ, හකාරය ආදිකොට ඇත්තාවූ; සකාරාන්තාඃ, සකාරය කෙළවර කොට ඇත්තා වූ; වර්ණාඃ, වර්ණයෝ; හසාඃ, හසසංඥකවූවෝ; ව්‍යඤ්ජනානි භවන්ති, ව්‍යඤ්ජන නම් වෙත්,

8. කාර්‍යායෙත්. (කාර්‍යාය 4, 1; ඉත් 1, 1;)

ස්වරහීනං, ස්වරයෙන් හීනවූයේ; ව්‍යඤ්ජනම්, ව්‍යඤ්ජන නම් වේ. (ස්වරෙභ්‍යඃ, ස්වරයන් කෙරෙන්; අන්‍යත්, අන්‍යවූයේ හෙවත් ස්වරයෙන් වෙන්වූයේ; ස්වරහීනම්, ස්වරහීන නම් වේ.) අන්‍යථා, (භාවාර්ථය හැර) අන්පරිද්දෙකින් (ගත හොත්); ස්වරෙෂු, ස්වරයන්හි; ස්වරඃ; ස්වරයෙක්; නාස්තීති, නැතැයි; තෙෂාං ස්වරාණාං අපි, ඒ ස්වරයන්ගේද; ව්‍යඤ්ජනතා, ව්‍යඤ්ජනබවය; ස්‍යාත්, වන්නේය. යතඃ, යම්හෙයකින් සේ; නිර්දේශඃ, (මේ "ස්වරහීනම්" යන) නිර්දේශය; භාවප්‍රධානඃ, භාවාර්ථය ප්‍රධානකොට ඇත්තේද, එහෙයින් ව්‍යඤ්ජනබව නොවේ. ස්වරත්වහීනං ඉති, ස්වරභාවයෙන් තොරවූයේ ව්‍යඤ්ජන වේ යන; අර්ථඃ, අර්ථයි. තෙෂු, ඒ ව්‍යඤ්ජනයන්හි; අකාරඃ, අකාරයතෙම; සුඛොච්චාරණාර්ථත්වාත්, සුවසේ කීම ප්‍රයොජනකොට ඇති බැවින්; ඉත්සංඥකඃ, ඉත්සංඥා ඇත්තේ වේ.

මෙහි ව්‍යඤ්ජන නම් මේයයි ව්‍යාඛ්‍යාන කරන්නාහු පළමු කොට ස්වරහීනවූයේ ව්‍යඤ්ජනයයි කියා පසුව ඒ "ස්වරහීන" යන්නෙහි අර්ථය පලකරන්නාහු ස්වරහීන නම් ස්වරයෙන් වෙන්වූයේයයි කීහු. මේ ක්‍රමයෙන් අර්ථ ගැණීමේදී "ස්වරහීන" යන තැන්හි "ස්වර" යන්නෙහි භාවාර්ථය ගෙණ ස්වරභාවයෙන් වෙන්වූයේ ව්‍යඤ්ජනයයි අර්ථය ගතයුතු වේ. කුමක්හෙයින්දයත්, මෙහි භාවාර්ථය හැර අන්පරිද්දෙකින් ගතහොත් ඒ ඒ ස්වර සෙසු ස්වරයන්ගෙන් වෙන්වූවත් බැවින් ස්වරයන්ගේද ස්වරහීනබවය වේයයි ගෙණ ස්වරයන් කෙරෙහිද ව්‍යඤ්ජනබවය ආරොපණය කොට ගතහැකි හෙයිනි. ස්වරභාවයෙන් තොරවූයේ ව්‍යඤ්ජනයයි ගත්කල ඒ ඒ ස්වර අනිත් ස්වරයන්ගෙන් වෙන් වූවත් ස්වරභාවයෙන් වෙන්නුවූ හෙයින් ඔවුන්ට ව්‍යඤ්ජනයයි කියහැකි නොවේ. ඒ කකාරාදි ව්‍යඤ්ජනගත "අ" යන ස්වරය වනාහි ඉත් සංඥක වේ. එහෙයින් ඒ "ඉත්" යන සංඥාවද කරන්නාහු "කාර්‍යායෙත්" යනු කීහු.

8. (ඉත්සංඥා සූත්‍රයි.) කාර්‍යාය, කාර්‍යයක් පිණිස, හෙවත් කිසියම් ප්‍රයොජනයක් සඳහා උසුරුවනු ලබන්නේ; ඉත්, "ඉත්" නම් වේ.

a. ප්‍රත්‍යයාද්‍යතිරික්තඃ කශ්චිත්කාර්‍යායොච්චාර්‍යමාණො වර්ණ ඉත්සංඥො භවති. යස්‍යෙත්සංඥා තස්‍ය ලොපඃ

b. "වර්ණාදර්ශනං ලොපඃ" "වර්ණවිරොධො ලොපශ්" (එකං වර්ණං නාශයති අන්‍යස්‍යොත්පත්තිං ප්‍රතිබධ්නාති ස වර්ණවිරොධඃ) "මිත්‍රවදාගමඃ". "ශත්‍රුවදාදෙශඃ" "ස්වරානන්තරිතා හසාඃ සංයොගඃ". "කුචුටුතුපු වර්ගාඃ"–උකාරඃ සවර්ණපරිග්‍රහණාර්ථඃ.

---

a. ප්‍රත්‍යයාද්‍යතිරික්තඃ, ප්‍රත්‍යයාගමාදීයෙන් ඉතිරිවූ; කශ්චිත් කාර්‍යාය, කිසියම් කටයුත්තක් පිණිස; උච්චාර්‍යමාණඃ, උසුරුවනු ලබන්නාවූ; වර්ණඃ, වර්ණය; ඉත්සංඥඃ භවති ඉත් නම් වේ. යස්‍ය, යමකට; ඉත්සංඥා, ඉත්සංඥාවේද; තස්‍ය, ඊකට; ලොපඃ, ලොපය වේ.

සුඛොච්චාරණාදි ප්‍රයොජනයක් සඳහා ප්‍රත්‍යයාදෙශාදියෙහි යොදා කියනු ලබන වර්ණයෝ ඉත් නම් වෙත්. "එති ගච්ඡතීති–ඉත්" යනු ඉත්" යන සංඥා නාමයෙහි නිර්වචනයි. පදසිද්ධි අවස්ථාවෙහි පහව යේනුයි ඉත් නම් වේ යනු එහි අර්ථයි. මෙහි "හයවරල" යනාදියෙහි අ යන්න ඉත්සංඥකයි. ඒ උච්චාරණය පිණිසයි. "තඃ සක් ජනෙ" යන සූත්‍රයෙහි "සක්" යන්නෙහි "ක්" යන්න ඉත්සංඥකයි. ඒ ස්ථාන නියමය පිණිසයි, එනම් අන්තයෙහි හිරීමයි.

මෙතැන් පටන් සාරස්වත සූත්‍රාගත සංඥාවන්ගෙන් ශෙෂවූ "ලොප, ලොපශ්, ආගම, ආදෙශ, සංයොග, වර්ග" යන මේ සංඥාවන්ද "ලොකාච්ඡෙෂස්‍ය සිද්ධිඃ" යන නියමයෙන් වර්ණනා කරන්නාහු "වර්ණාදර්ශනං ලොපඃ" යනාදිය කීහු.

b. වර්ණාදර්ශනම්, වර්ණයන්ගේ නොපෙනීයාම හෝ නොඇසීයාම, හෙවත් වර්ණනාශය; ලොපඃ, ලොප නම් වේ. වර්ණවිරොධඃ, වර්ණයන්ගේ විරොධය හෙවත් වර්ණනාශයෙන් අන්‍යවර්ණොත්පත්ති ප්‍රතිඝාතය; ලොපශ්, ලොපශ් නම් වේ. (එකං වර්ණං, එක් වර්ණයක්; නාශයති, නසාද; අන්‍යස්‍ය, අන්‍යවර්ණයක්හුගේ; උත්පත්තිම්, ඉපැත්ම; ප්‍රතිබධ්නාති, වළකාද; සඃ, හෙතෙම; වර්ණවිරොධඃ, වර්ණවිරොධ නම්.) මිත්‍රවත්, මිතුරෙකු කෙරෙහි මෙන් පවත්නා වර්ණය; ආගමඃ, ආගම නම්වේ. ශත්‍රුවත්, සතුරෙකු කෙරෙහිමෙන් පවත්නා වර්ණය; ආදෙශඃ, ආදෙශ නම් වේ. ස්වරානන්තරිතාඃ, ස්වරයෙන් අතර නැත්තාවූ හෙවත් ස්වරය කරණකොටගෙණ අතරතුර විවර

9. අරෙදො නාමිනො ගුණඃ.

[අරෙදො 1, 1; නාමිනඃ 6, 1; ගුණඃ 1, 1]

රහිතවූ; හසාඃ, ව්‍යඤ්ජනයෝ; සංයොගඃ, සංයොග නම් වෙත්. කුචුටුතුපු, "කුචුටුතුපු" යන මොහු; වර්ගාඃ, වර්ග නම් වෙත්. උකාරඃ, (කු ආදියෙහි) උකාරය, පඤ්චවර්ණපරිග්‍රහණාර්ථඃ, වර්ණ පඤ්චකයක් ගැණීම ප්‍රයොජනකොට ඇත්තේ වේ.

ඒ ඒ ශබ්දයන්හි විද්‍යමාන වර්ණයන් නැති කිරීමට "ලොප" යන සංඥාවද, වර්ණනාශයට හා තවර්ණනාශයෙන් පසු එහි අන්‍යවර්ණයන්ගේ උත්පත්තිය වැලැක්මට "ලොපශ්" යන සංඥාවද, මිතුරෙක් පැමිණ තම මිතුරෙකු කෙරෙහි පවත්නාක් මෙන් වර්ණයකට පීඩාවක් නොකොට වර්ණයක් සමීපයෙහි පැමිණ සිටින වර්ණයට "ආගම" යන සංඥාවද, සතුරෙක් තම සතුරෙකුගේ නැසීම පිණිස පවත්නාක් මෙන් තුබුනු වර්ණයක් නැති කොට එහි පෙණීසිටින වර්ණයට "ආදෙශ" යන සංඥාවද, අතරතුර ස්වර නිසා සෑදෙන විවර රහිතව එකතුවූ ව්‍යඤ්ජනයන්ට "සංයොග" යන සංඥාවද පිළිවෙළින් කවර්ගාදි වර්ගපසට "කුචුටුතුපු" යන සංඥා පසද මෙහි ව්‍යවහාර කරණුලැබේ. මෙහි "ලොප" සංඥා ශබ්දය "ලුප-ආදර්ශනෙ" යන ධාතුවෙන් සිඩයි. එබැවින් වර්ණ දර්ශනය ලොපයයි කීහු. මේ "ලොප" යන්නෙන් පරව "ශ්" යන්න යොදා වෙනස් කොට "ලොපශ්" යන්න ව්‍යවහාර කරණලදී. (වර්ගපසෙහි මුල් අකුරුපස "කචටතප" යන මොහුයි. මෙහි උයන්න ඉත් වශයෙන් යොදා වර්ග පසට "කුචුටුතුපු"යි නම් පසක් ව්‍යවහාර කරණු ලැබේ. මේ ඉත් වශයෙන් යෙදූ උයන්න ස්වරයන්ගේ පස්වන වර්ණයයි. ඒ වනාහි මේ සංඥාවකින් "ක ඛ ග ඝ ඞ" යනාදි වශයෙන් අකුරු පස පස ගතයුතු බැව් ඇඟවීම පිණිසයි. "වර්ජ්‍යනෙත විජාතීයෙයරිති=වර්ගාඃ" යනු නිරුක්ති බැවින් විජාතීයවර්ණයන් විසින් බැහැරකරණු ලැබෙත් යන අර්ථයෙන් මොවුන්ට වර්ගයයි කියනු ලැබේ.

9. (ගුණසංඥා සූත්‍රයි.) නාමිනඃ, නාමින් ස්වරයාගේ ස්ථානයෙහිවූ; අරෙදො, "අර්, එ, ඔ" යන මේ ශබ්දත්‍රය; ගුණඃ, ගුණ නම් වේ.

a. නාමිනඃ ස්ථානකා අර් එ ඔ එතෙ ගුණසංඥකා භවන්ති.

10. ආරෛරෞ වෘද්ධිඃ.

ආරෛරෞ 1, 1; වෘද්ධිඃ 1, 1;

b. ආ ආර් ඓ ඖ එතෙ වෘද්ධිසංඥා භවන්ති.

11. අන්ත්‍යස්වරාදිෂ්ටිඃ.

අන්ත්‍යස්වරාදිඃ 1, 1; ටිඃ 1, 1;

c. අන්ත්‍යො යඃ ස්වරස්තදාදිවර්ණෞ ටිසංඥො භවති.

---

a. නාමිනඃස්ථානකාඃ, නාමින් ස්වරයාගේ ස්ථානයෙහිවූ, අර් එ ඔ එතෙ, "අර් එ ඔ" යන මොහු; ගුණසංඥකාඃ භවන්ති; ගුණසංඥා ඇත්තාහු වෙත්.

මෙහි නාමින් ස්වර සියල්ලම ගුණයට ස්ථානත්වයෙන් කීවත් සංඥා බලයෙන් හෙවත්–"අර්, එ, ඔ" යන තුණ ගුණ සංඥක වර්ණයයි කීමේ බලයෙන් උත්පත්තිස්ථාන වශයෙන් මේ තුණට සමවූ "ඍ ඉ උ" යන තුණ පමණක් ගනු ලැබේ. එබැවින් "ඍ ඉ උ" යන තුණට පිළිවෙළින් "අර් එ ඔ" යන තුණ ගුණ වෙත්. ("ඍ ඏ" දෙදෙනාගේ සමානත්වයෙන් "ඍ" යන්නට "අර්" යන්න වන්නාක් මෙන් "ඏ" යන්නට "අල්" යන්න වේ.)

10. (වෘද්ධිසංඥාසූත්‍රයි.) ආරෛරෞ, "ආ ආර් ඓ ඖ" යන මේ සමූහය; වෘද්ධිඃ, වෘද්ධි නම්.

b. ආ ආර් ඓ ඖ එතෙ, "ආ ආර් ඓ ඖ" යන මොහු; වෘද්ධිසංඥාඃ භවන්ති, වෘද්ධිසංඥා ඇත්තාහු වෙත්.

"අ" යන්නට "ආ" යන්නද, "ඍ" වර්ණයට "ආර්" යන්නද, ඉවර්ණයට හා එකාරයට "ඓ" යන්නද, උවර්ණයට හා ඔකාරයට "ඖ" යන්නද වෘද්ධි වෙත්. (ඏ වර්ණයට "ආල්" යන්න වේ.

11. (ටිසංඥා සූත්‍රයි.) අන්ත්‍යස්වරාදිඃ, අන්ත්‍යස්වරය ආදි (අවයව) කොට ඇත්තේ, හෙවත් ස්වරාන්තයන්ගේ අන්ත්‍යස්වරය හා හසාන්තයන්ගේ අන්ත්‍යස්වරය සහිත ඒ ආදිකොට ඇත්තේද; ටිඃ, ටිසංඥා වේ.

c. අන්ත්‍යඃ, අන්තයෙහිවූ; යඃ ස්වරඃ, යම් ස්වරයෙක් වේ නම් (ඒහා); තදාදිවර්ණඃ, ඒ ආදි අවයව කොට ඇති වර්ණය; ටිසංඥඃ භවති, ටිසංඥා වේ.

12. අන්ත්‍යාත් පූර්ව් උපධා.

අන්ත්‍යාත් 5, 1; පූර්වඃ 1, 1; උපධා 1, 1;

a. අන්ත්‍යාද්වර්ණමාත්‍රාත් පූර්වො යඃ ස උපධාසංඥො භවති.

b "අසංයොගාදිපරො හ්‍රස්වො ලඝුඃ" "විසර්ගානුස්වාර සංයොගපරොදීර්ඝශ්ච ගුරුඃ" "මුඛනාසිකාභ්‍යාමුච්චාර්යමාණො

මෙහි "අන්ත්‍යස්වරාදිඃ" යන්නෙන් අන්ත්‍යස්වරය ආදි කොට ඇත්තේයයි කීමෙන් යම් ශබ්දයෙක්හි අන්ත්‍යස්වරය ආදි අවයවය වීමෙන් ඉන් පරවද වර්ණයක් සිටියොත් එබඳු තන්හි ඒ ස්වරය හා ඉන් පර වර්ණද, අන්ත්‍යස්වරයෙන් පර වර්ණ නැති තන්හි ඒ අන්ත්‍යස්වරය හුදකලාවද ටිසංඥයි. කුමක්හෙයින්ද යත්? අන්ත්‍ය ස්වරයෙන් පරවර්ණ නැති තන්හි සංඥීහුගේ ආදියද අන්තයද එකම හෙයිනි, "මනස්" ශබ්දයේ අන්ත්‍යස්වරය නකාරස්ථ අකාර යයි. ඒ ආදිකොට ඇති වර්ණය ඉන් පර "ස්" යන්නයි, එබැවින් ඒ "අ, ස්" යන දෙකම ටිසංඥයි. "ලාඞ්ගල" යන තන්හි අන්ත්‍ය ස්වරය ලකාරස්ථ අකාරයයි. ඉන් පර වර්ණ නැති බැවින් ඒම හුදකලාව ටිසංඥයි. සෙස්සද මෙසේයි. යම් තැනෙක් හුදකලා ස්වරයෙක්ම පමණක් වේ නම් එහි ආදියත් මධ්‍යයත් අන්තයත් එයම බැවින් හෙද ටිසංඥ වේ. එනම් "ස්‍ය" ශබ්දයේ ටිසංඥය එයමයි.

12. (උපධාසංඥා සූත්‍රයි.) අන්ත්‍යාත්, අන්තවර්ණයා කෙරෙන්; පූර්වඃ, පූර්වවූයේ; උපධා, උපධා නම් වේ.

a. අන්ත්‍යාත් වර්ණමාත්‍රාත්, අන්තයෙහිවූ වර්ණමාත්‍රයා කෙරෙන්; පූර්වඃ, පූර්වවූ; යඃ, යම් වර්ණයෙක් වේ නම්; සඃ, ඒ වර්ණය; උපධා සංඥඃ භවති, උපධාසංඥ වේ. (යම්කිසි ශබ්ද යෙක්හි අන්තයෙහි සිටි වර්ණයට ආදිමවර්ණය කොහි වර්ණයක් වුවත් උපධා නම්. යථොක්ත "මනස්" ශබ්දයාගේ අන්ත්‍ය වර්ණය "ස්" යන්නයි, ඉන් පූර්වවූයේ නකාරස්ථ අකාරයයි, ඒ උපධායි. "ලාඞ්ගල" ශබ්දයාගේ අන්ත්‍ය වර්ණය ලකාරස්ථ අකාරයයි, ඉන් පූර්වවූයේ "ල්" යන්නයි, ඒ උපධායි.

b. අසංයොගාදිපරඃ, සංයොගාදියක් පරකොට නැත්තාවූ; හ්‍රස්වඃ, හ්‍රස්ව වර්ණය; ලඝුඃ, ලඝු නම් වේ. විසර්ගානුස්වාරසංයොග පරඃ, විසර්ගය අනුස්වාරය සංයොගය යන මොවුන් පරකොට

වර්ණොනුනාසිකඃ" "අඃ ඉති විසර්ගඃ" "වර්ණශිරො බින්දුර නුස්වාරඃ"—අං අඃ ඉති අචඃ පරාවනුස්වාරවිසර්ගෞ භවතඃ.

a අකුහවිසර්ජනීයානාං කණ්ඨඃ, ඉචුයශානාං තාලු, ඍටුරෂාණාං මූර්ධා, ඏතුලසානාං දන්තාඃ, උපූපධ්මානීයානාමොෂ්ඨෞ, ඤමඞණනානාං නාසිකා ච, ඒඓතොඃ කණ්ඨතාලු, ඔඖතොඃ කණ්ඨොෂ්ඨම්, වකාරස්‍ය දන්තොෂ්ඨම්, ජිහ්වාමූලි

ඇති වර්ණයද; දීර්ඝශ්ච, දීර්ඝ වර්ණයද; ගුරුඃ, ගුරු නම් වේ. මුඛ නාසිකාභ්‍යාම්, මුඛ නාසිකා දෙකෙන් නොහොත් මුඛ සහිත නාසිකා විවර දෙකෙන්; උච්චාර්යමාණඃ උසුරුවනු ලබන්නාවූ වර්ණඃ, වර්ණය; අනුනාසිකඃ, අනුනාසික නම් වේ. අඃ ඉති, "අඃ" යන මෙහි බින්දුද්වය; විසර්ගඃ, විසර්ග නම් වේ. වර්ණශිරොබින්දුඃ, වර්ණ යන්ගේ මස්තකයෙහිවූ බින්දුව; අනුස්වාරඃ, අනුස්වාර නම් වේ. අං අඃ ඉති, 'අං අඃ' යන තන්හි; අචඃ පරෞ, ස්වරයා කෙරෙන් පරවූදෙක; අනුස්වාර විසර්ගෞ භවතඃ, අනුස්වාර විසර්ග දෙක වෙත්.

සංයොග අනුස්වාර විසර්ග යන මොවුන් පරකොට නැති "අ" යන්න වැනි හ්‍රස්ව වර්ණයන්ට 'ලඝු" යන නාමයද, "අඃ අං අඞ්" යන තන්හි මෙන් විසර්ගය අනුස්වාරය සංයොගය යන මොවුන් පරකොට ඇති වර්ණයන්ට හා "ආ" යන්න වැනි දීර්ඝ වර්ණයන්ට "ගුරු" යන නාමයද, මුඛ සහිත නාසිකාවෙන් නොහොත් නාසානුගත මුඛයෙන් කියනුලබන "ඞඤණනම" යන මොවුන්ට "අනුනාසික" යන නාමයද, බින්දුද්වයට "විසර්ග" යන නාමයද, හුදකලා බින්දුවට "අනුස්වාර" යන නාමයද අන්‍ය ව්‍යාකරණයන් ගෙණ මෙහිදු ව්‍යවහාර කරණු ලැබේ. ("විසර්ග" යන්නට "විසර්ජනීය" යනුද නමෙකි.)

a අකුහවිසර්ජනීයානාම්—අ, අවර්ණය; කු, කවර්ගය; හ හකාරය; විසර්ජනීයානාම්, විසර්ගය යන මොවුන්ට; කණ්ඨඃ, බෙල්ල (උත්පත්තිස්ථානයි); ඉචුයශානාම්—ඉ, ඉවර්ණය; චු, චවර්ගය; ය, යකාරය; ශානාම්, ශකාරය යන මොවුන්ට; තාලු, තල්ල (උත්පත්තිස්ථානයි.) ඍටුරෂාණාම්-ඍ, ඍවර්ණය; ටු, ටවර්ගය, ර, රකාරය, ෂාණාං, ෂකාරය යන මොවුන්ට; මූර්ධා, මූදුන (උත්පත්තිස්ථානයි); ඏතුලසානාං—ඏ, ඏවර්ණය; තු තවර්ගය; ල, ලකාරය; සානාං, සකාරය යන මොවුන්ට; දන්තාඃ, දත් (උත්පත්තිස්ථානයි); උපූපධ්මානීයානාම්—උ, උවර්ණය; පු පවර්ගය;

ෂස්‍ය ජිහ්වාමූලම්, නාසිකානුස්වාරස්‍ය, ᳵකᳵඛ ඉති කඛාභ්‍යාං ප්‍රාගර්ධවිසර්ගසදෘශො ජිහ්වාමූලීයඃ, ᳶපᳶඵ ඉති පඵාභ්‍යාං ප්‍රාගර්ධවිසර්ගසදෘශ උපධ්මානීයඃ, ශෂසහා ඌෂ්මාණඃ, කාදයො මාවසානාඃ ස්පර්ශාඃ, යරලවා අන්තඃස්ථාඃ.

a හකාරං පඤ්චමෛර්යුක්තමන්තඃස්ථාභිශ්ච සංයුතම්,
උරස්‍යං තං විජානීයාත් කණ්ඨ්‍යමාහුරසංයුතම්
අෂ්ටෞ ස්ථානානි වර්ණානාමුරඃ කණ්ඨඃ ශිරස්තථා,
ජිහ්වාමූලඤ්ච දන්තාශ්ච නාසිකෞෂ්ඨෞ*ච තාලු ච.

ඉති සංඥාප්‍රක්‍රියා.

උපධ්මානීයානාං,.. උපධ්මානීය යන මොවුන්ට; ඕෂ්ඨෞ, දෙතොල (උත්පත්තිස්ථානයි); ඤම්ඞණනානාං, "ඤම්ඞණන" යන මොවුන්ට; නාසිකා ච, නැහැයද (උත්පත්තිස්ථානයි;) ඒඓදෙතොඃ, ඒ ඓ දෙකට; කණ්ඨතාලු, බොටුව හා තල්ල (උත්පත්තිස්ථානයි) ඔදෞතොඃ, ඔ ඖ දෙකට; කණ්ඨ්‍යොෂ්ඨ්‍යම්, බොටුව හා දෙතොල (උත්පත්තිස්ථානයි); වකාරස්‍ය, වකාරයට; දන්තොෂ්ඨ්‍යම්, දත් හා දෙතොල (උත්පත්තිස්ථානයි); ජිහ්වාමූලීයස්‍ය, ජිහ්වාමූලීය වර්ණයට; ජිහ්වාමූලම්, දිවමුල (උත්පත්තිස්ථානයි); අනුස්වාරස්‍ය, අනුස්වාරයට; නාසිකා, නැහැය උත්පත්තිස්ථානයි.) ᳵකᳵඛ ඉති, "ᳵකᳵඛ" යන මෙහි; කඛාභ්‍යාම්, ක ඛ (යන) දෙකෙන්; ප්‍රාක්, පෙරටුව; අර්ධවිසර්ගසදෘශඃ, අර්ධබින්දුවයක් සමාන වූයේ; ජිහ්වාමූලීයඃ, ජිහ්වාමූලීය නම් වේ. ᳶපᳶඵ ඉති, "ᳶපᳶඵ" යන මෙහි, පඵාභ්‍යාම්, පඵ දෙකෙන්; ප්‍රාක්, පෙරටුව; අර්ධවිසර්ගසදෘශඃ; අර්ධබින්දුවයක් සමානවූයේ; ශෂසහාඃ, උපධ්මානීයඃ උපධ්මානීය නම් වේ; ශෂසහ යන අකුරු, ඌෂ්මාණඃ, ඌෂ්මන් නම් වෙත්; කාදයඃ, කකාරය ආදිකොට ඇති; මාවසානාඃ, මකාරය අවසන් කොට ඇත්තාහු; ස්පර්ශාඃ, ස්පර්ශාක්ෂරයි; යරලවාඃ, යරලව යන අකුරු; අන්තඃස්ථාඃ; අන්තඃස්ථා නම්. ('නාසිකාච" යන තන්හි චශබ්දයෙන් පූර්වොක්ත කවර්ගාදියට උත්පත්තිස්ථානවූ කණ්ඨාදියද ගනු ලැබේ.)

a පඤ්චමෛඃ, වර්ගපඤ්චමාක්ෂරයන් සමග; යුක්තම්, යෙදුනාවූද (බැඳුනාවූද); අන්තඃස්ථාභිඃ, ("යරලව") යන අන්තඃස්ථාක්ෂරයන් සමග; සංයුතං ච, යෙදුනාවූද; හකාරම්, හකාරය; උරස්‍යංතම්, ළෙහි පිහිටියයි, හෙවත් ළය උත්පත්තිස්ථානකොට ඇතියයි; විජානීයාත්, දන්නේය. අසංයුතම්, එසේ සංයුක්ත නොවූ හකාරය; කණ්ඨ්‍යං ආහුඃ, කණ්ඨජයයි කියත්.

වර්ණානාම්, (යථොක්ත) වර්ණයන්ගේ; ස්ථානානි, උත්පත්ති ස්ථානයෝ; අෂ්ටෞ, අටදෙනෙක් වෙත්. අට නම්) උරඃ, ළය; කණ්ඨඃ, බොටුවය; ශිරඃ, මුදුනය; තථා, එසේම; ජිහ්වාමූලං ච, දිව මුලය; දන්තාශ්ච, දත්ය; නාසිකා, නැහැය; ඕෂ්ඨෞ ච, දෙතොලය; තාලු ච, තල්ලය යන මොහුයි. සංඥප්‍රක්‍රියා, සංඥ ප්‍රක්‍රියාව; ඉති, මෙතෙකින් සමාප්තයි.

මෙහිද "ලොකාත්" යනාදීන් නිර්දිෂ්ට ශෙෂයන් වර්ණනා කරන්නාහු 'අකුහ" ආදි වශයෙන් ඒ ඒ වර්ණයන්ගේ ස්ථාන හා ජිහ්වාමූලීයාදි සංඥවන්ද දක්වූහ. "තිෂ්ඨන්ත්‍යත්‍ර වර්ණා ඉති-ස්ථානම්" යනු නිරුක්ති හෙයින් ස්ථාන නම්-ඒ ඒ වර්ණ සිටින තැනුයි, හෙවත් වර්ණයන් ඇසුරුකරණ තැනුයි. ඒ ස්ථාන වනාහි ශබ්ද පහළවීමේ පිළිවෙළින් දතයුතුයි. ඒ ඒ අදහස් ප්‍රකාශ කිරීමේදී පළමුකොට ඒ පිළිබඳ චිත්තය උපදනේ වේ. ඒ චිත්තය විසින් තෙජොධාතුවද තෙජොධාතුව විසින් වායුවද මෙහෙයනලද්දේ වේ. ඒ වායුව තෙමේ හෘදයෙහි හැසිරෙමින් මන්දවූ ස්වරයක් උපදවා ඌර්ධ්වගතව මූර්ධාන්තයෙහි හැපී වක්ත්‍රයට පැමිණ ඒ ඒ ශබ්දයන්ගේ ප්‍රවෘත්තියට සුදුසුවූ කණ්ඨාදි ස්ථාන යන් ඇසුරුකොට ශබ්ද පහළකරන්නේ වේ. එහිදු තාලුජ වර්ණ වනාහි දිවේ මැද හැපීමෙන්ද, මූර්ධජවර්ණ දිව අග ලග හැපීමෙන්ද කණ්ඨජාදීහු ඒ ඒ තැන්ම ස්පර්ශ කිරීමෙන්ද ශබ්ද පහළ කරන්නෝ, වෙති. මෙකී වර්ණයෝ වනාහි අභ්‍යන්තර ප්‍රයත්න වශයෙන් ඇති වන්නාවූ 'ස්පෘෂ්ට, ඊෂත්ස්පෘෂ්ට, විවෘත, ඊෂද්විවෘත, සංවෘත', යන ගුණපසින්ද බාහ්‍යප්‍රයත්න වශයෙන් ඇතිවන්නාවූ 'විවාර, ශ්වාස, අඝොෂ, සංවාර, නාද, ඝොෂ, අල්පප්‍රාණ, මහාප්‍රාණ' යන ගුණ අටෙන්ද යුක්ත වෙති.

මෙහි කී ජිහ්වාමූලීය හා උපධ්මානීය යන දෙක ලිපියෙහි බින්දුපළු යුවලයෙක්හි සටහන් ඇති වර්ණයි, එහි ජිහ්වාමූලීය "කඛ" දෙකෙන් එක්ක පෙරටුව යෙදී දිවමුලද, උපධ්මානීය "පඵ" දෙකෙන් එක්ක පෙරටුව යෙදී දෙතොලෙහිද උපදනේ වේ. "ජිව්හාමූලෙභවඃ = ජිව්හාමූලීයඃ" යනුද, උපධ්මානෙ (ඕෂ්ඨෙ)

* මෙහි "නාසිකෞෂ්ඨෞ" කියා බොහෝ පොත්හි දක්නා ලැබේ. එසේ වුවහොත් "නාසිකා ච ඕෂ්ඨෞ ච = නාසිකොෂ්ඨෞ"යි සමාසනවූවක් වියයුතුයි. සමස්ත වශයෙන් ගැණීමට වඩා ව්‍යස්ත වශයෙන් ගැණීම උචිතයයි හැඟේ.

"භවඃ=උපධ්මානීයඃ" යනුද, එහි නිරුක්තියි. "ඌෂ්මන්" නම් ඌෂ්ම සහිත වායුවෙන් උසුරුවන වර්ණයි. දිව අග ආදිය තලු ආදියෙහි ගැපීමෙන් උසුරුවනු ලබන වර්ණ ස්පර්ශයි, මේ වර්ණ නියමයෙහිලා "යරලව" යන සතර ස්පර්ශ ඌෂ්මයන් යන දෙකොටස අතර සිටින බැවින් ඔවුන්ට "අන්තඃස්ථා"යි කියනු ලැබේ.

තවද මේ වර්ණයන්ගේ සවර්ණත්වය ස්ථානප්‍රයත්න වශයෙන් ලැබෙන බැවින් මෙහි ඒ ඒ ස්ථාන හා ප්‍රයත්නභෙදයද සඳහන් කරණු ලැබේ.

අභ්‍යන්තර ප්‍රයත්න හා ස්ථාන.

ප්‍රයත්න	කණ්ඨජ	තාලුජ	මූර්ධජ	දන්තජ	ඔෂ්ඨජ
ස්පෘෂ්ට	කඛගඝඞ,	චඡජඣඤ,	ටඨඩඪණ,	තථදධන	පඵබභම
ඊෂත්ස්පෘෂ්ට -	,,	ය	ර	ල ව	ව
විවෘත	අආඑඒඔඖහ,	ඉඊඑඒශ,	ඍෲෂ	ඏ ස	උඌඔඖ
ඊෂද්විවෘත -	හ	ශ	ෂ	ස	,,
සංවෘත -	අ	,,	,,	,,	,,

බාහ්‍යප්‍රයත්න. නම වර්ණ.

විවාර ශ්වාස අඝොෂ – කචටතප ඛඡඨථඵ, ඃ; ᳵක, ᳶප ශෂස
සංවාර නාද ඝොෂ – ගජඩදබ ඝඣඪධභ, හයවරල,
ඞඤණනම, බින්දු, ස්වර

අල්පප්‍රාණ – කචටතපගජඩදබ, යරලව, ඞඤණනම
මහාප්‍රාණ – ඛඡඨථඵඝඣඪධභ, ඃ, ᳵක, ᳶප, ං, ශෂස, ස්වර

ශෙෂස්ථාන.

කණ්ඨ	ජිහ්වාමූල	ඔෂ්ඨ	නාසා
ඃ	ᳵක	ᳶප	ංඞඤණනම

මේ සංඥාප්‍රක්‍රියාවෙහි ඇතුලත් නොවූ "නාමන්, පද" යනාදි සංඥාදෝද මේ ව්‍යාකරණයෙහි තන්හි තන්හි කියනු ලැබෙත්. ඒ සංඥාවෝ ඒ ඒ තන්හි දතයුතු වෙත්.

සංඥාප්‍රක්‍රියාවේ ව්‍යාඛ්‍යාව නිමි.

සන්ධිප්‍රක්‍රියාවේ ව්‍යාඛ්‍යාව.

෧. **අථාධුනා ස්වරසන්ධිරභිධීයතෙ. "දධි + ආනය" ඉති ස්ථිතෙ:—(වර්ණග්‍රහණෙ සවර්ණග්‍රහණම්, කාරග්‍රහණෙ කෙවලග්‍රහණම්, තපරග්‍රහණෙ තාවන්මාත්‍රග්‍රහණමිති ශිෂ්ටසඞ්කෙතඃ. තස්මින්නිති නිර්දිෂ්ටෙ පූර්වස්‍ය"—සප්තමීනිර්දෙශෙන විධීයමානං කාර්‍ය්‍යං වර්ණාන්තරෙණාව්‍යවහිතස්‍ය පූර්වස්‍ය බොද්ධ්‍යම්, අතො වෘත්තෞ "පරෙ" ඉති ව්‍යාචෂ්ටෙ, එවමන්‍යත්‍රාපි ඥෙයම්)***

මෙසේ සැකෙවින් සංඥාප්‍රක්‍රියාජීවය කොට සන්ධි ප්‍රක්‍රියාජීවය කරන්නාහු "අථාධුනා' යනාදිය කීහු.

෧. අථ, මඞ්ගලයක් වේවා, නොහොත් සංඥාප්‍රක්‍රියාවට අනතුරුව; ස්වරසන්ධිඃ, ස්වරසන්ධිය; අභිධීයතෙ, කියනු ලැබේ. දධි ආනය ඉති, "දධි + ආනය" කියා; ස්ථිතෙ, සිටිකල්හි (වක්ෂ්‍යමාණ කාරයෙන් සන්ධි වේ.) වර්ණග්‍රහණෙ, වර්ණග්‍රහණය ඇතිකල්හි, හෙවත් "වර්ණ" ශබ්දය පරකොට යොදාගැන්මෙහි; සවර්ණග්‍රහණම් සවර්ණයන්ගේ ගැණීමද; කාරග්‍රහණෙ, කාරග්‍රහණය ඇතිකල්හි, හෙවත්, 'කාර"ශබ්දය පරකොට යොදා ගැණීමෙහි; කෙවලග්‍රහණම්, හුදකලා අකුර ගැණීමද; තපරග්‍රහණෙ, තපර ග්‍රහණය ඇතිකල්හි, හෙවත් තකාරය පරකොට ඇත්තක් හෝ තයන්නෙන් පරවූවක් ගැණීමෙහි; තාවන්මාත්‍රග්‍රහණං ඉති, එපමණක්ම මාත්‍රාවන්ගේ හෝ එපමණ මාත්‍රා ඇත්තවුන්ගේ ගැණීම වේයයි; ශිෂ්ටසඞ්කෙතඃ, පණ්ඩිතයන් විසින් සංඥපිත ලක්ෂණයි. තස්මින් ඉති නිර්දිෂ්ටෙ, "තස්මින්" යනුවෙන් ගම්‍යවන සප්තමියෙන් නිර්දේශකරණලද තන්හි; පූර්වස්‍ය, පූර්වයට කාර්‍ය්‍යය වේ. (මේ පාණිනීය සූත්‍රයි.) සප්තමීනිර්දේශෙන, සප්තමීනිර්දේශයෙන්; විධීයමානම්, කරණු ලබන්නාවූ; කාර්‍ය්‍යම්, කාර්‍ය්‍යය; වර්ණාන්තරෙණ, අන්‍යවර්ණයකින්; අව්‍යවහිතස්‍ය, ව්‍යවධාන රහිතවූ; පූර්වස්‍ය, පූර්වයට වේයයි; බොද්ධ්‍යම්, දතයුතුයි. අතඃ, මේ හෙතුවෙන්; වෘත්තෞ, සූත්‍ර වෘත්තියෙහි; පරෙඉති, "පරෙ" කියා; ව්‍යාචෂ්ටෙ, ව්‍යාඛ්‍යාන කෙරේ. අන්‍යත්‍ර අපි, අන්තන්හිද; එවම්, මෙසේ; ඥෙයම්, දතයුතුයි.

* මේ වාක්‍යයෝ බොහෝ පොත්හි නොපැණෙත්. ඇතැම් පොත්හි සංඥාප්‍රක්‍රියාවසානයෙහි පෙණෙත්. කෙසේද වුවත් උචිතනාදේ බැවින් එක් වෘත්තියෙක්හි පොතක තුබුනු පරිද්දෙන් මෙහි යොජිතයි.

මෙහි සංඥප්‍රක්‍රියාවට අනතුරුව මෙතැන් පටන් සන්ධි විධිය ප්‍රකාශකරනු ලැබේ. එහි "පූර්වපරවර්ණයෝඃ සන්ධානං=සන්ධිඃ" යනු නිරුක්ති හෙයින් භාෂාවෙහි එකිනෙක ගළපා කියයුතු තැන් නොගැළපීමෙන් උච්චාරණයෙහි ක්ලිශ්ටභාවය හා අසුශ්‍රාව්‍යතාවද ඇතිවන බැවින් තන්නිවාරණය පිණිස පූර්වපරවර්ණවයක් එනම්- පූර්වශබ්දයාගේ අන්ත්‍යවර්ණය හෝ, පර ශබ්දයාගේ ආදිවර්ණය හෝ ඒ වර්ණවයම හෝ වෙනස්වීමෙන් පූර්වපරවර්ණවයක්හුගේ එකට ගැළපීම සන්ධියයි කියනුලැබේ. ඒ වනාහි මෙහි "ස්වරසන්ධි, (ප්‍රකෘති භාවසන්ධි.) ව්‍යඤ්ජනසන්ධි, විසර්ගසන්ධි" යයි චතුර්විධත්වයෙන් ප්‍රකාශ කරණු ලැබේ. මෙහි කී ප්‍රකෘතිභාව සන්ධියෙහි වනාහි යථොක්ත වර්ණවිකෘතිය නොවේ. "ස්වරයෝඃ සන්ධානඃ=ස්වරසන්ධිඃ" යනු හෙයින් යථොක්තාකාරයෙන් ස්වරදෙකක්හුගේ ගැළපීම ස්වර සන්ධියි. ඒ ස්වරසන්ධිවිධි දක්වන්නාහු "දධි + ආනය" යන්නෙහි පටන් පවසනු ලැබේ. මේ සන්ධිවිධියෙහි නිත්‍යානිත්‍යතාව වනාහි පෙර සංඥප්‍රක්‍රියා ව්‍යාඛ්‍යාවෙහි කියනලද ක්‍රමයෙන් දතයුතුයි.

තවද මේ සන්ධ්‍යාදි ව්‍යාකරණ විධි සම්පාදනය කිරීමෙහි උගතමනා කරුණු කීපයක් පළමුකොට දක්වනු පිණිස "වර්ණ ග්‍රහණේ" යනාදිය කීහු. එහි "අඉඋඍඏ" යන මේ සමානසංඥ ඇති ස්වරයන් කෙරෙන් "වර්ණ" ශබ්දය පර කොට යොදා "අවර්ණ" යනාදීන් ව්‍යවහාරකරණ තන්හි ඔවුන්ගේ සවර්ණයෝ ගතයුතුයි. එනම් "අවර්ණ" යන්නෙන් "අආ" දෙක යන මේ ආදි වශයෙනි. "කාර" ශබ්දය පරකොට යොදා "අකාර, ආකාර, කකාර" යනාදි වශයෙන් ව්‍යවහාර කරණ තන්හි ඒ "කාර" යන්නෙන් පූර්වයෙහි සිටි වර්ණ පමණක් ගත යුතුයි. මෙසේහෙයින් "කාර" යන්න සියලු වර්ණයන් කෙරෙත්ම යෙදියහැකි වේ. ස්වරකෙරෙන් පරව "ත්" යන්න යොදා "අත්, ආත්" ආදි වශයෙන් ව්‍යවහාරකරණ තන්හි ඒ "ත්" යන්නෙන් පූර්වයෙහි සිටි වර්ණමාත්‍රය ගතයුතුයි. පාණිනීයාදි ව්‍යාකරණයන්හි මේ තපරග්‍රහණයෙන් විධිවිශෙෂයෙහිලා විශෙෂ ප්‍රයෝජන ඇතත් මෙහි බොහෝ සෙයින් සූත්‍රලාඝව සුඛොච්චාරණාදිය සඳහා තපරග්‍රහණය ව්‍යවහාරකරණු ලැබේ. "තපරස්තත්කාලස්‍ය" යනු පාණිනීය සූත්‍රයි. තයන්න පරකොට හෝ තයන්නෙන් පරකොට උසුරුවනු ලබන වර්ණය උච්චාරණයට සමානකල් ඇත්තහුටම නම් වේ යනු එහි අර්ථයි.

13. ඉ යං ස්වරෙ. (ඉ 1, 1; යම 2, 1; ස්වරෙ 7, 1;)

a. **ඉවර්ණෝ යත්වමාපද්‍යතෙ ස්වරෙ පරෙ. "දධ්+ය්+ආනය" ඉති තාවද්භවති.**

තවද "තස්මින්නිති නිර්දිෂ්ටෙ" යනාදි පාණිනීයසූත්‍රවෘත්ති වශයෙන් මේ ශාස්ත්‍රයෙහි ආදෙශාගමාදීයෙන් සන්ධ්‍යාදිකාර්‍ය්‍ය සම්පාදනයෙහි නිර්දිෂ්ට පූර්වපරනිමිත්තවශයෙන් පරනිමිත්ත ස්වරූපය නිරූපිතයි, ආදෙශාදි විධියක් ඒ ඒ තන්හි ඇති වන්නේ යමක් නිසා නම් ඒ නිමිත්තයි. මේ ශාස්ත්‍රයෙහි ඒ ඒ මීයන සප්තමී විභක්තියෙන් දක්වන තන්හි ඒ ආදෙශාදිවිධි යද ඒ නිමිත්තවූ වර්ණයට මුලින් ඒ ලඟම සිටි වර්ණයට වනබව මෙයින් නිර්දිෂ්ටයි. වක්ෂ්‍යමාණ "ඉයං ස්වරෙ" යන සූත්‍රවිධියෙහි "ස්වරෙ"යි සප්තමීනිමිත්ත කරණලදි. එබැවින් ස්වරයකින් මුල ඒලඟම සිටි ඉවර්ණයට යකාරය වේ.

(මෙහි වනාහි පරනිමිත්තස්වරූපය පමණක් නිරූපිතයි, මෙසේ පූර්වනිමිත්තද දක්වන්නාවූ පාණිනීයාචාර්‍ය්‍යයෝ "තස්මාදිත්‍යුත්තරස්‍ය" යන සූත්‍රය කීහු. පඤ්චමීවිභක්තියෙන් නිමිත්ත කියන තන්හි ඒ නිමිත්තවූවහු කෙරෙන් පරව ඒලඟම සිටි වර්ණයට කාර්‍ය්‍යයවිය යනු එහි අර්ථයි. මෙහි "රාඥෙපාචිඃ" යන සූත්‍රයෙහි "රාජ්" යනු පඤ්චමීනිමිත්ත බැවින් රයන්නෙන් පරව ඒලඟම සිටි යප ප්‍රත්‍යාහාරයට විත්වය වේ.)

13. (යකාරාදෙශවිධිසූත්‍රයි.) ස්වරෙ, ස්වරයා පරකල්හි; ඉ, ඉවර්ණයතෙම; යම්, යකාරබවට පැමිණේ.

a ස්වරෙ පරෙ, ස්වරයා පරකල්හි; ඉවර්ණඃ, ඉවර්ණයතෙම; යත්වං ආපද්‍යතෙ, යකාරබවට පැමිණේ. දධ්ය් ආනය ඉති, "දධ් + ය් + ආනය" කියා; තාවත්, පළමුකොට; භවති, වේ.

මෙහි "දධි ඉ ආනය" යන විසන්ධියෙහි ආයන්න පර නිමිති වීමෙන් ඊට මුල ඒලඟම සිටි ඉයන්නට "ය්" යන්න ආදෙශ වීමෙන් "දධ් ය් ආනය" කියා වේ. තවද මෙහි "ස්වරෙ" යන්නෙන් ඉවර්ණයෙන් අන්‍යවූ ස්වරම ගතයුතුයි. ඊට හෙතුව නම් ඉවර්ණය පරවූතන්හි පූර්වව සිටි ඉවර්ණයට විය හැකි දීර්ඝවිධිය මීට වඩා බලවත්වීමෙන් මේ විධිය නොවීමයි.

14. හසෙර්හසඃ. (හසෙ 7, 1; අර්හසඃ 1, 1;)

අ. ස්වරාත් පරෙ රේඵහකාරවර්ජිතා හසා හසෙ පරෙ ද්විර්භවන්ති. (ස්වරෙ පරෙ ඉති වක්තව්‍යම්, තෙන ධකාරස්‍ය න පුනර්ද්විත්වම්); ඉති ධකාරස්‍ය ද්විත්වම්.

---

14. (ද්විත්වවිධිසූත්‍රයි.) හසෙ, හසප්‍රත්‍යාහාරය පරකල්හි අර්හසඃ, රකාරහකාරවර්ජිත හසප්‍රත්‍යාහාරය ද්විරුක්ත වේ.

අ. හසෙ පරෙ, හසප්‍රත්‍යාහාරය පරකල්හි; ස්වරාත් පරඃ, ස්වරයා කෙරෙන් පරවූ; රේඵහකාරවර්ජිතඃ, රකාරහකාරයන් විසින් තොරකරණලද්දාවූ, හෙවත් රකාර හකාර රහිතවූ; හසඃ, හසප්‍රත්‍යාහාරය; ද්විඃ භවන්ති, ද්විරුක්ත වේ. ස්වරෙ පරෙ ඉති, ස්වරය පරකල්හි ද්විත්වය වේයයි; වක්තව්‍යම්, කියයුතුයි. තෙන, එහෙයින් හෙවත් ස්වරය පරකල්හි යයි කීමෙන්; ධකාරස්‍ය, ධකාරයාගේ; න පුනර්ද්විත්වම්, පුනර්ද්විත්වය නොවේ. ධකාරස්‍ය, ධකාරයාගේ; ද්විත්වම්, ද්විභාවය; ඉති, මෙසේ දතයුතුයි.

ස්වරයක් කෙරෙන් පරව සිටි ව්‍යඤ්ජනය වනාහි ඉන් පරවද ව්‍යඤ්ජනයක් සිටි තන්හි ද්විරුක්ත වේ යනු මෙහි සාමාන්‍ය නියමයයි, එහෙත් මෙහි ස්වරයක් පරකල්හි මේ ද්විත්වයවේය යනු වාර්තික විශෙෂයෙකි. එයින් හැඟෙන්නේ පරනිමිතිවූ ව්‍යඤ්ජනයෙන් පරව ස්වරයක් සිටිතන්හි පමණක් ද්විත්වය වන බවයි. මෙහි "දධි + ආනය" යන විසන්ධියෙහි ධකාරයාට ඉකාරයට "ය්" යන්න කළකල්හි "දධ් ය් ආනය" යනු වේ. පසුව මෙහි "ය්" යන ව්‍යඤ්ජනය හා ඉන් පර ස්වරයද නිමිතිවීමෙන් ධකාරය ද්විත්වයට පැමිණ "දධ් ධ් ය් ආනය" යනු වේ. සාමාන්‍ය නියමය පරිද්දෙන් වූකලි මෙහි දකාරයට අකාරයවූ ස්වරයෙන් පරව සිටි පූර්ව "ධ" යන්නට අතිත් "ධ්" යන්න පරනිමිත්තෙන් ද්විත්වය පැමිණියහැකිවත්ම තන්නිවාරණය පිණිස පරනිමිත්තවූ ව්‍යඤ්ජනයා කෙරෙන්ද ස්වරයක් පරව සිටිතන්හිම ද්විත්වය වන බැව් කීහු. මෙහි පර නිමිතිවූ ධකාරයෙන් පරව සිටියේ ස්වරයක් නොව "ය්" යන ව්‍යඤ්ජනය බැවින් නැවත ධකාරද්විත්වයෙක් නොවේ. තවද මෙහි පර නිමිතිවූ යකාර සඞ්ඛ්‍යාත ව්‍යඤ්ජනය ස්වරයට ආදේශව සිටි වර්ණයක් බැවින් තත්ස්ථානිවද්භාවයෙන් (ඒ ස්ථානයෙහි සිටි ස්වරය සලකාගැනීමෙන්) ස්වරයා

15. ඛසෙ ජබාඃ. (ඛසෙ 7, 1; ජබාඃ 1, 3;)

අ. ඛසානාං ඛසෙ පරෙ ජබා භවන්ති. ඉති පූර්වධකාරස්‍ය දකාරඃ සවර්ණත්වාත්. "වර්ගේ්‍යා වර්ගේ්‍යණ සවර්ණඃ" ඉති වචනාත් යථාසඞ්ඛ්‍යං වා වක්තව්‍යම්. "දද් + ධ + ය් + ආනය" ඉති සිද්ධම්. පශ්චාත්-ස්වරහීනං පරෙණ සංයෝජ්‍යම්. ශලිෂ්ටොච්චාරණං කර්තව්‍යම්. දද්ධ්‍යානය.

පරකල්හි ද්විත්වය වේයයි කියයුතුවේ යන අදහසද ඇතැම් ටීකාවන්හි දක්නාලැබේ. තවද "ජාතෞ පදාර්ථෙ සකෘදෙව ලක්ෂණ ප්‍රවෘත්තිර්න පුනඃ" යනු න්‍යාය හෙයින් ජාතිපදාර්ථය ඇතිකල්හි සූත්‍රලක්ෂණයාගේ පැවැත්ම එක්වරක්ම මුත් දෙවරක් නොවේ යන නියමය හෙයින්ද පුනර්ද්විත්වය නොවේ. එනම්-එක් ජාතියක් පිළිබඳ එක් කාර්‍ය්‍යප්‍රවෘත්තියක් එක් වරක් පමණක් වේ, යනු එහි අදහසයි. මෙහි වාගබ්දයාගේ අනුවර්තනයෙන් මේ ද්විත්වය විකල්පයයිද කියති,

15. (ජබප්‍රත්‍යාහාරවිධිසූත්‍රයි.) ඛසෙ, ඛසප්‍රත්‍යාහාරය පරකල්හි; ජබාඃ, (ඛසප්‍රත්‍යාහාර වර්ණයන්ට) ජබප්‍රත්‍යාහාර වර්ණයෝ වෙත්.

අ. ඛසෙ පරෙ, ඛසප්‍රත්‍යාහාරය පරකල්හි; ඛසානාම්, ඛසප්‍රත්‍යාහාරවර්ණයන්ට; ජබාඃ, ජබප්‍රත්‍යාහාරවර්ණයෝ; භවන්ති, වෙත්. ඉති, මෙසේ මේ සූත්‍රයෙන්; පූර්වධකාරස්‍ය, (ධකාරට යෙන්) පූර්වධකාරයට; දකාරඃ, දකාරය වේ. (කුමක්හෙයින්ද යත්?) සවර්ණත්වාත්, සාවර්ණ්‍යහෙයිනි. (සවර්ණත්වය කුමක් හෙයින්ද යත්?) වර්ග්‍යඃ, වර්ගයෙහිවූයේ; වර්ගේ්‍යණ, ඒ වර්ගයෙහිවූ වර්ණය සමග; සවර්ණඃ ඉති, සවර්ණයයි; වචනාත්, කීම හෙයිනි. යථාසඞ්ඛ්‍යං වා, පිළිවෙළින් හෝ වේයයි; වක්තව්‍යම්, කියයුතුයි. (එකල්හි) දද්ධ්‍යානය ඉති, "දද් + ධ + ය් + ආනය" කියා; සිද්ධම්, සිද්ධයි. පශ්චාත්, පසුව; ස්වරහීනම්, ස්වරහීනවූ ව්‍යඤ්ජනය; පරෙණ, පරස්වරය හා; සංයෝජ්‍යම්, ගැළපියයුතුයි. ශලිෂ්ටොච්චාරණම්, සිලුටුකොට කීම; කර්තව්‍යම්, කටයුතුයි. දද්ධ්‍යානය, (එකල) "දධි ආනය"යි සිටි විසන්ධියෙහි සංහිතාකාර්‍ය්‍යව "දද්ධ්‍යානය" යනු වේ.

a. **තක්‍රං න රොචතෙස්මාකං දුග්ධං වා මධුරං ප්‍රියෙ,**
අනන්‍යප්‍රරොචනාර්ථාය දධ්‍යානය වරානනෙ.

මෙහි ධකාරද්විත්වයෙන් "ධධ්‍ය් ආනය"යි සිටි තන්හි පූර්වධකාරයට දකාරය කිරීමට "ඣෂෙ ජබාඃ" යන සූත්‍රය කීහු. ඣබ ප්‍රත්‍යාහාරයෙහි වර්ණදශයෙන් කිසිවක් පරකල්හි ඣස ප්‍රත්‍යාහාරයෙහි වර්ණතෙවිස්සෙන් එකකට "ජබදගබ" යන මොවුන්ගෙන් එකක් වේය යනු මේ සූත්‍රයාගේ සාමාන්‍ය නියමයයි. මෙසේ සාමාන්‍යයෙන් කී ආදේශවිධිය පිළිබඳ විශේෂ දැක්වන්නාවූ වාර්තිකයෝ "වර්ගීයා වර්ගීයාණ" යනාදිය දක්වමින් සවර්ණත්වයෙන් හෝ යථාසංඛ්‍යත්වයෙන් මේ ආදේශ විධිය වේයයි කීහු. මේ ව්‍යාකරණ ශාස්ත්‍රයෙහි වනාහි ආදේශාදි සකල විධානයන්ගේම පැමිණීම සවර්ණත්වයෙන් යයි පරිභාෂිතයි. ඒ සවර්ණත්වයද තුල්‍යවූ ස්ථානප්‍රයත්න වශයෙන් වේ. මෙහි ධකාරයට දකාරය පැමිණීමද එකී සවර්ණත්වයෙනි, වර්ගාක්ෂරයෝ වූකලි ඒ ඒ වර්ගාක්ෂර සමග ස්ථානප්‍රයත්න වශයෙන් සවර්ණ වෙති. මොවුන්ගේ යථාසංඛ්‍යත්වය වනාහි ඇතැම් තන්හි නොලැබේ, මෙහි ද ඣස ප්‍රත්‍යාහාර වර්ණතෙවිස්සෙන් "ඣඪධඝභ" යන පසට යථා සංඛ්‍යත්වයෙන් ආදේශවුවත් "බඑජඩද" යනාදීන්ට එසේ වන බැව් නොපෙණේ, මේ සාරස්වත සූත්‍රවිධානයන් පැමිණෙන පිළිවෙළ දක්වන්නාවූ වෛයාකරණයෝ:-

"සාරස්වතත්වෙ තුල්‍යෙපි සූත්‍රවක්තව්‍යයොර්භිදඃ,
ප්‍රවෘත්තිර්ලක්ෂණාත් සූත්‍රෙ වක්තව්‍යෙ තු ප්‍රයොගතඃ"

යනු කීහු. සාරස්වත සූත්‍රයන්ගේ ප්‍රවෘත්තිනිමිත්ත තුල්‍යවුවත් සූත්‍රය වක්තව්‍යය (කියයුත්තාය) යන දෙදෙනාගේ භේදයෝවෙත්, කෙසේද? සූත්‍රයෙහි පැවැත්ම ලක්ෂණ වශයෙනි, වක්තව්‍යයෙහි පැවැත්ම වනාහි ප්‍රයොගානුසාරයෙනි යනු මෙහි අර්ථයි. මෙසේ හෙයින් මේ සූත්‍රවිධියේ පැවැත්මද ප්‍රයොගානුසාරයෙනි. මෙසේ "දධ්‍යානය" යන සන්ධිය සිඬකොට එය ශිෂ්ටව්‍යවහාරයෙහි ඇති බැව් දැක්වීම පිණිස "තක්‍රම්" යනාදිය කීහු.

a. ප්‍රියෙ, සොඳුර; අස්මාකම්, අපට; තක්‍රම්, මෝරු හෝ; මධුරම්, මිහිරිවූ; දුග්ධම් වා, කිරි හෝ; නරොචතෙ, නුරුස්නේ වේ. වරානනෙ, සොඳුරුමුහුනක් ඇත්තිය; අනන්‍යප්‍රරොචනාර්ථාය, ආහාර ඉතා රුචිවීම පිණිස; දධි ආනය, දීගෙණ එව, (මෙහි "දධ්‍යානය" යන සන්ධිය නිදර්ශිතයි.)

a **කෘතස්‍ය කරණං නාස්ති මෘතස්‍ය මරණං නහි,**
පිෂ්ටස්‍ය පෙෂණං නාස්ති ද්විතීයෙ ත්‍රිතයං නහි.

b. ගෞරී අත්‍ර ඉති ස්ථිතෙ: "ඉ:යං ස්වරෙ" (ඉ: වි: 13 සූ) "ගෞර් + ය් + අත්‍ර" ඉති තාවද්භවති. යණෙව ස්‍යාත අර්හ ඉති විශෙෂණාන්නරෙඵස්‍ය ද්විත්වම් කින්තු:-

16. රාද්‍යපො ද්විඃ. (රාත් 5, 1; යපඃ 1, 1; ද්විඃ 1, 1;]

---

a. කෘතස්‍ය, කරණලද්දහුගේ; කරණම්, (නැවත) කිරීමෙක්; නාස්ති, නැත; මෘතස්‍ය, මළහුගේ; මරණම්, (නැවත) මැරීමෙක්; නහි, නැත. පිෂ්ටස්‍ය, අඹරණලද්දහුගේ; පෙෂණම්, (නැවත) ඇඹරීමෙක්; නාස්ති, නැත. ද්විතීයෙ, දෙවැන්නෙකු ඇතිවූ කල්හි; ත්‍රිතයම්, ත්‍රිසංඛ්‍යාසමාහෘතියක්; නහි, නැත්තේය.

මේ ශ්ලොකයෙන්ද ද්විත්ව කළතන්හි පුනර්ද්විත්වය නොවන බැව් සූචිතයි. එනම්-අවසන් කළදේ නැවත කිරීමක්ද, මළහුගේ නැවත මැරීමක්ද, ඇඹරූදේ නැවත ඇඹරීමක්ද නැති බැව් ස්ඵුටයි. එසේම ඒකජාතීය ද්විතීය වර්ණයෙකු ඇතිවූ කල්හි තජ්ජාතීය වර්ණත්‍රයක සමාහෘතියක් නොවේ, යනු මෙහි භාවාර්ථයි.

තවද මේ ස්වරසන්ධියෙහි ස්වරයන්ගේ මුල් ස්වරයවූ අයන්හ පිළිබඳ සන්ධිය හැර ඉයන්න පටන් කීමට හෙතුව නම්-ඉකාරාදිය පිළිබඳ සන්ධිවිධි පූර්වවිධි වශයෙන් දක්වා සවර්ණදීර්ඝවිධිය බලවත් කොට පරවිධි වශයෙන් දැක්වීමයි. මෙසේ ඉකාරයට යකාරය වන බැව් දක්වා ඊකාරයටද යකාරය වන බැව් දැක්වීමට "ගෞරී අත්‍ර" යනාදිය කීහු.

b ගෞරීඅත්‍ර ඉති, "ගෞරී + අත්‍ර" කියා; ස්ථිතෙ, සිටිකල්හි; "ඉ:යංස්වරෙ" යන සූත්‍රයෙන් ඊකාරයට යකාරය වේ. (එකල්හි) ගෞර්ය් අත්‍ර, "ගෞර් + ය් + අත්‍ර" කියා; තාවත්, පළමුකොට; භවති, වේ. යණ්ව ස්‍යාත, (මෙසේ) යකාරභාවය කළකල්හි; "අර්භ" යන නොවත් රකාර හකාර දෙදෙනාගේ ද්විත්වය නොවේය යනු; විශෙෂණාත්, විශෙෂණයෙන්; රෙඵස්‍ය, රෙඵයාගේ; ද්විත්වම්, දෙකවීම; න, නොවේ. කින්තු, වැලි එකෙක් ඇත. (එනම්: වක්ෂ්‍යමාණද්විත්වයයි.)

16. (විභක්තිසූත්‍රයි) රාත්, (ස්වරපූර්ව) රකාරයා කෙරෙන් පරවූ; යපඃ, යප ප්‍රත්‍යාහාරය; ද්විඃ, ද්විරුක්ත වේ.

a. **ස්වරපූර්වාද්‍රේඵාත්පරෝ යණෝ ද්විර්භවති. ඉති යණස්‍ය ද්විත්වම්. "ගෞර්+ය්+ය් අත්‍ර"-ස්වරහීනං පරේණ සංයෝජ්‍යම්. ජලතුම්බිකාන්‍යායෙන රේඵස්‍යෝර්ධ්වගමනම්. ගෞර්‍ය්‍යත්‍ර.**

b. **තුම්බිකාතෘණකාෂ්ඨං ච තෛලං ජලසමාගමේ,**
ඌර්ධ්වස්ථානං සමායාන්ති රේඵාණාමීදෘශී ගතිඃ

c. **රේඵඃ ස්වරපරං වර්ණං දෘෂ්ට්වාරෝහති තච්ඡිරඃ,**
පුරඃ ස්ථිතං යදාපශ්‍යේදධඃ සංක්‍රමතේ ස්වරම්.

---

a. ස්වරපූර්වාත්, ස්වරයක් පූර්වකොට ඇත්තාවූ; රේඵාත් පරඃ, රකාරයාකෙරෙන් පරවූ; යණඃ, යණ්ප්‍රත්‍යාහාරය; ද්විඃ භවති ද්විරුක්ත වේ. යණස්‍ය, යණ්ප්‍රත්‍යාහාරයාගේ; ද්විත්වම්, ද්විත්වය; ඉති, මෙසේයි. (එකල්හි) "ගෞර් + ය් + ය් + අත්‍ර" යනු වේ. ස්වරහීනම්, ස්වරහීනවූයේ; පරේණ, පරස්වරය හා; සංයෝජ්‍යම්, යෙදිය යුතුයි. ජලතුම්බිකාන්‍යායෙන, ජලතුම්බිකාන්‍යායයෙන්, රේඵස්‍ය, රේඵයාගේ; ඌර්ධ්වගමනම්, උඩට යාම වේ. (එකල්හි) ගෞර්‍ය්‍යත්‍ර, "ගෞරී අත්‍ර" යන විසන්ධියෙහි සංහිතාකාර්‍ය්‍යව "ගෞර්‍ය්‍යත්‍ර" යනු වේ.

b. තුම්බිකා, ලබුකබල්ද; තෘණකාෂ්ඨං ච, තණ හා වියළි දඬුද; තෛලම්, තෙල්ද; ජලසමාගමේ, දිය හා එකතුවීමෙහි; ඌර්ධ්වස්ථානම්, උඩසිටීමට; සමායාන්ති, පැමිණෙත්, රේඵාණාම්, රේඵයන්ගේ; ගතිඃ, ගමනද; ඊදෘශී, මෙබඳු වේ.

මේ ශ්ලෝකයෙන් පූර්වෝක්ත ජලතුම්බිකාන්‍යාය වර්ණිතයි. මෙහි තුම්බිකාදිය සැහැල්ලු බැවින්ද ජලය බරබැවින්ද තුම්බිකාදිය ජලයෙහි ලූ කල ජලයේ මතුපිට සිටින්නාක්මෙන් අන්‍යවර්ණ හා එකතුවූ රකාරයද ඒ වර්ණයන්ගේ මත්තෙහි සිටින්නේ වේ. එසේ සිටීම ආවශ්‍යක නොවන බැවින් අන් පරිච්ඡේදයකින්ද රකාරයාගේ සංයෝගත්වය වන බැව් පවසනු වස් "රේඵඃ" යනාදිය කීහු.

c. රේඵඃ, රේඵයතෙම; ස්වරපරං වර්ණම්, ස්වරයක් පරකොට ඇති වර්ණය; දෘෂ්ට්වා, දැක, තච්ඡිරඃ, ඊමත්තට; ආරෝහති නැගේ; යදා, යම් කලෙක්හි; පුරස්ථිතම්; පෙරටුව සිටියාවූ; ස්වරම්, ස්වරයක්; පශ්‍යන්, දක්නේද; (එකල්හි) අධඃ, යටට; සංක්‍රමතේ, බසී.

a. **ස්වර ඉත්‍යනුවර්තතේ ඒවමන්‍යත්‍රාපි. යත්‍ර න සූත්‍රාක්ෂරෛඃ කාර්‍ය්‍යසිද්ධිස්තත්‍ර සර්වත්‍ර සූත්‍රාන්තරාත්පදාන්තරානුවෘත්තිර්ඥාතව්‍යා, ග්‍රන්ථභූයස්ත්වභයාන්නාස්මාභිර්ලිඛ්‍යතේ.**

17. උ වම්. [උ 1, 1; වම් 2, 1;]

b. **උවර්ණෝ වත්වමාපද්‍යතේ ස්වරේපරේ. "හසේර්හහසඃ" (ප්‍ර: ච. 14. සූ) "ඛබෙ ජබාඃ" (ප්‍ර ච. 15. සූ) මධු+අත්‍ර-මද්ධ්වත්‍ර, මධු+අරිඃ-මද්ධ්වරිඃ, මධු+ආසනං-මද්ධ්වාසනම්.**

රකාරය ස්වරයකින් පූර්වයෙහි සිටි වර්ණයාගේ මස්තකයට නැගේ. "ගෞර්‍ය්‍ය්අත්‍ර" යන තන්හි රකාරය අයන්නෙත් පූර්වයෙහි සිටි යකාරයාගේ මුදුනට නැගීමෙන් "ගෞර්‍ය්‍යත්‍ර" යනු වේ. තවද යම්තැනෙක්හි රකාරයාකෙරෙන් පරව ස්වරයක් සිට රකාරයෙන් පූර්වයෙහි ව්‍යඤ්ජනයක් සිටියහොත් එතන්හි රකාරය ඒ පූර්වවූ ව්‍යඤ්ජනයාගේ යටපැත්තට බස්නේ වේ. "පිත් ර්අණඃ" යන තන්හි රකාරයෙන් පරව ලඟම ස්වරය සිටි බැවින් ඒ රකාරය ආදියෙහි සිටි තකාරයාගේ යට දෙසට බැසීමෙන් "පිත්‍රණඃ" යනු වේ.

a. ස්වරේති, "ස්වරේ" යන පදය; අනුවර්තතේ, මතුසූත්‍ර හා වැටේ. අන්‍යත්‍රාපි, අන්තන්හිද; ඒවම්, මෙසේයි. යත්‍ර, යම් තැනෙක්හි; සූත්‍රාක්ෂරෛඃ, සූත්‍රයෙහි අකුරුවලින්; න කාර්‍ය්‍යසිද්ධිඃ, කටයුතුසිද්ධිය නොවේද, තත්‍ර සර්වත්‍ර, ඒ සැම තන්හි; සූත්‍රාන්තරාත්, අන්‍යසූත්‍රයෙකින්; පදාන්තරානුවෘත්තිඃ, අන්‍යපදයන්ගේ අනුවෘත්තිය; ඥාතව්‍යා, දතයුතුයි. ග්‍රන්ථභූයස්ත්වභයාත්, ග්‍රන්ථබාහුල්‍යභීතියෙන්; අස්මාභිඃ, අප විසින්; න ලිඛ්‍යතේ, අනුවර්තනය කොට නොලියනු ලැබේ.

17. (වකාරදෙශ විධි සූත්‍රයි.) උ, උවර්ණය තෙම; වම්, (ස්වරයා පරකල්හි) වකාරබවට පැමිණේ.

b. ස්වරේ පරේ; ස්වරයා පරකල්හි; උවර්ණඃ, උවර්ණයතෙම; වත්වං, වකාරබවට; ආපද්‍යතේ, පැමිණේ. "හසේර්හහසඃ" යන පූර්වසූත්‍රයෙන් ධකාරද්විත්වය ද; "ඛබෙ ජබාඃ" යන සූත්‍රයෙන් පූර්වධකාරයට දකාරයද වේ. "මධු + අත්‍ර" යන තන්හි සංහිතාකාර්‍ය්‍යව "මද්ධ්වත්‍ර" යනු වේ. සෙස්සද මෙසේ දතයුතු.

18. ස්‍ව රම්. (ස්‍ව 1, 1; රම් 2, 1;)

a ඍවර්ණො රත්වමාපද්‍යතෙ ස්වරෙ පරෙ. පිතෘ + අර්ථඃ පිත්‍රර්ථඃ

19. ඣ ලම්. (ඣ 1, 1; ලම් 2 1;)

b ඣවර්ණො ලත්වමාපද්‍යතෙ ස්වරෙ පරෙ. ඣ+අනුබන්ධඃ–ලනුබන්ධඃ.

20. එ අය්. (එ 1, 1; අය් 1, 1;)

c එකාරඃ අය් භවති ස්වරෙ පරෙ. නෙ + අනම්-නයනම්.

21. ඔ අව්. (ඔ 1, 1; අව් 1; 1;)

d ඔකාරඃ අව් භවති ස්වරෙ පරෙ. භො + අති–භවති.

---

18. (රකාරාදෙශ විධි සූත්‍රයි.) ඍ, ඍවර්ණයතෙම; රම්, (ස්වරයා පරකල්හි) රකාරබවට පැමිණේ.

a. ස්වරෙ පරෙ, ස්වරයා පරකල්හි; ඍවර්ණඃ, ඍවර්ණයතෙම; රත්වං, රකාරබවට; ආපද්‍යතෙ, පැමිණේ. පිත්‍රර්ථඃ, "පිතෘ+අර්ථඃ" යන තන්හි සංහිතාකාර්‍යයීව "පිත්‍රර්ථඃ" යනු වේ.

19. (ලකාරාදෙශ විධි සූත්‍රයි.) ඣ, ඣ වර්ණයතෙම; ලම්, (ස්වරයා පරකල්හි) ලකාරබවට පැමිණේ.

b. ස්වරෙ පරෙ, ස්වරයා පරකල්හි, ඣ වර්ණඃ, ඣ වර්ණයතෙම; ලත්වම්, ලකාරබවට; ආපද්‍යතෙ, පැමිණේ. ලනුබන්ධඃ "ඣ + අනුබන්ධඃ" යන තන්හි සංහිතාකාර්‍යයීව "ලනුබන්ධඃ" යනු වේ.

20. (අය් ආදෙශ විධි සූත්‍රයි.) එ, එකාරයතෙම; අය්, (ස්වරයා පරකල්හි] "අය්" ආදෙශ වේ.

c. ස්වරෙ පරෙ, ස්වරයා පරකල්හි; එකාරඃ, එකාරයතෙම; අය් භවති, "අය්" ආදෙශ වේ. "නෙ+අනම්" යන විසන්ධියෙහි එකාරයට "අය්" ආදෙශ වීමෙන් "නයනම්" යනු වේ.

21 (අව් ආදෙශ විධි සූත්‍රයි,) ඔ, ඔකාරයතෙම; අව්, (ස්වරයා පරකල්හි) "අව්" ආදෙශ වේ.

b. ස්වරෙ පරෙ, ස්වරයා පරකල්හි; ඔකාරඃ, ඔකාරයතෙම; අව් භවති, අව් ආදෙශ වේ, "භො+අති" යන විසන්ධියෙහි ඔකාරයට "අව්" ආදෙශ වීමෙන් "භවති" යනු වේ.

a. "ගවාදෙරවර්ණාගමොක්ෂාදෞ වක්තව්‍යඃ" ගො+අක්ෂඃ ගවාක්ෂඃ, ගො + ඉන්ද්‍රඃ–ගවෙන්ද්‍රඃ, ගො + අජිනම්–ගවාජිනම්, ප්‍ර+ඌඪඃ–ප්‍රෞඪඃ, ප්‍ර+ඌඪිඃ–ප්‍රෞඪිඃ, ස්ව+ඊරම්,–ස්වෛරම්, ස්ව+ඊරිණී–ස්වෛරිණී, අක්ෂ + ඌහිනී–අක්ෂෞහිණී. ඉති ගවාදයඃ. *

b. ("ප්‍රකෘතිප්‍රත්‍යයයොර්මධ්‍යෙ ප්‍රත්‍යයාශ්‍රිතං කාර්‍යමාදෞ ස්‍යාත්" "නිත්‍යානිත්‍යයොර්මධ්‍යෙ නිත්‍යවිධිර්බලවාන්" අවිහිතලක්ෂණප්‍රයොගො ගවාදෞ ද්‍රෂ්ටව්‍යඃ.) †

---

a. අක්ෂාදෞ, අක්ෂශබ්දාදිය පරකල්හි; ගවාදෙඃ, "ගො" ශබ්දාදිය කෙරෙන්; අවර්ණාගමඃ, අවර්ණාගමය; වක්තව්‍යඃ, කියයුතුයි. "ගො+අක්ෂඃ" යන විසන්ධියෙහි සංහිතාකාර්‍යයීව "ගවාක්ෂඃ" යනුද; "ගො + ඉන්ද්‍රඃ" යන විසන්ධියෙහි "ගවෙන්ද්‍රඃ" යනුද; "ගො+අජිනම්" යන විසන්ධියෙහි "ගවාජිනම්" යනුද; ප්‍ර + ඌඪඃ" යන විසන්ධියෙහි "ප්‍රෞඪඃ" යනුද, "ප්‍ර+ඌඪිඃ" යන විසන්ධියෙහි "ප්‍රෞඪිඃ" යනුද; "ස්ව + ඊරිණී" යන විසන්ධියෙහි "ස්වෛරිණී" යනුද; "අක්ෂ+ඌහිනී" යන විසන්ධියෙහි "අක්ෂෞහිණී" යනුද වේ. ගවාදයඃ, ගවාදීහු; ඉති, මෙසේයි.

b. (ප්‍රකෘතිප්‍රත්‍යයයොඃ මධ්‍යෙ, ප්‍රකෘතිය ප්‍රත්‍යය යන දෙක අතරෙහි; ප්‍රත්‍යයාශ්‍රිතම්, ප්‍රත්‍යය ඇසුරුකළාවූ; කාර්‍යම්, කාර්‍යය; ආදෞ ස්‍යාත්, ආදියෙහි වන්නේය. නිත්‍යානිත්‍යයොඃ මධ්‍යෙ, නිත්‍යවිධි අනිත්‍යවිධි දෙක අතරෙහි නිත්‍යවිධිඃ, නිත්‍යවිධිය; බලවාන්, බලවත් වේ. අවිහිතලක්ෂණ ප්‍රයොගඃ, විධාන නොකළ ලක්ෂණ ඇති නිදර්ශන සමූහයෙක්; ගවාදෞ, ගවාදිගණයෙහි; ද්‍රෂ්ටව්‍යඃ, දැක්කයුතුයි.)

---

* බොහෝ පොත්හි මේ ගවාදිගණයෙහි ලා "අඉඑ; එඑඑ, උඔ, ඔඔඔ" යන සූත්‍රද දක්නා ලැබෙත්. මෙතන්හි ඒ සූත්‍ර යෙදීම සූත්‍රපරිපාටියට හා කාර්‍යපරිපාටියටද සම නොවේයයි හැඟේ. මෙහි ඒ සූත්‍ර පසුව කියනු ලැබෙත්.

† ඇතැම් පොත්හි මේ අනතුරුව:—

"ගවාක්ෂශ්ච ගවෙන්ද්‍රශ්ච ගවාග්‍රශ්ච ගවාජිනම්;
ස්වෛරමක්ෂෞහිණී ප්‍රෞඪ එතෙ ප්‍රොක්තා ගවාදයඃ"

යන ශ්ලෝකයද දක්නා ලැබේ. ගවාදීහු නම් "ගවාක්ෂ" යනාදීහුය යනු එහි අදහසයි. මේ වාක්‍යයෝ ඇතැම් පොත්හි නොදක්නා ලැබෙත්.

a. **ක්වචිත් ස්වරවද්‍යකාරඃ, යථාධ්වපරිමාණෙ**-ගො+යූතිඃ-ගව්‍යූතිඃ-ක්‍රොශයුගලම්. අන්‍යත්‍රාධ්වනඃ පරිමාණාභාවෙ ගවාං මිශ්‍රීභාවො ගොයූතිඃ.

මෙහි "ඔ අව්" යන සූත්‍රයෙන් නිර්දිෂ්ට "අව්" ආදෙශවිධානය ගො ශබ්දය පිළිබඳව ඇතැම් තන්හි "අව" යි අකාරාන්තව පෙණෙන බැවින් ඒ සන්ධිවිධියෙහි ලා මෙහි "අක්ෂ" ශබ්දාදිය පරනිමිත්තෙන් "ගො" ශබ්දාදිය කෙරෙන් අවර්ණාගමයෙක් කටයුතුයයි නියමිතයි. ඒ මෙසේයි-"ගො+අක්ෂඃ" යන තන්හි අවර්ණාගමය කළ කල්හි "ගො අ අක්ෂඃ" යනු වේ. පසුව අකාර වය එකතුව දීඝවූ පසු ඔකාරයට "අව්" ආදෙශව "ගවාක්ෂඃ" යනු වේ. "ගවාජිනම්" යනුද මෙසේයි. "ගො-ඉන්ද්‍රඃ" යන තන්හි අකාරාගමය වූපසු ඒ අයන්න ඉයන්න සමග එකතුව "අ ඉ එ" යන සූත්‍රයෙන් එයන්න වේ. පසුව ඔයන්නට "අව්" ආදෙශ වීමෙන් "ගවෙන්ද්‍රඃ" යනු වේ. මෙහි මේ ගවාදි ගණයෙහි ලා "ගො, ප්‍ර, ස්ව, අක්ෂ" යන මොහුද, අක්ෂාදි ගණයෙහි ලා "අක්ෂ, ඉන්ද්‍ර, අජින, ඌඪ, ඌඩි, ඊර, ඊරිණී, ඌහිනී" යන මොහුද සඞ්ගෘහීතයි. තවද "ප්‍ර+ඌඪඃ" යන තන්හි අකාරාගමයවූ පසු "ප්‍ර අ ඌඪඃ" යනු වේ. මෙහි ආගමවූ අකාරයාගේ බහිරඞ්ගත්ව යෙන් හෙවත් අයන්න ප්‍රකෘතියෙන් පිටත අවයවයක් බැවින් ප්‍රත්‍යයෙකැයි සැලකිය යුතුයි. ඒ බහිරඞ්ග සඞ්ඛ්‍යාත ප්‍රත්‍යය ඇසුරු කොට වන්නාවූ විධිය අන්තරඞ්ග සඞ්ඛ්‍යාත ප්‍රකෘතිය ඇසුරු කොට වන්නාවූ විධියට වඩා බලවත්ද නිත්‍යද වේ. එහෙයින් පළමුකොට ඌයන්න පරනිමිත්තෙන් අයන්නට "උඔ" යන සූත්‍රයෙන් ඔයන්න වේ. එකල "ප්‍ර ඔඪඃ" යනු වේ. පසුව ප්‍රයන්න පිළිබඳ අයන්නට ඔයන්නත් සමග "ඔඖඖ" යන සූත්‍රයෙන් "ඖ" යන්න වීමෙන් "ප්‍රෞඪඃ" යනු වේ. "ප්‍රෞඪිඃ, අක්ෂෞහිණී" යනුද මෙසේයි. "ස්ව ඊරම්, ස්ව ඊරිණී" යන දෙතන්හිද මේ ක්‍රම යෙන්ම පළමුකොට ආගමවූ අයන්නට ඊයන්න සමග "අ ඉ එ" යන සූත්‍රයෙන් එයන්න හා නැවත "අඑ" දෙකට ඓයන්නද වීමෙන් "ස්වෛරම්, ස්වෛරිණී" යනු වේ. තවද මේ ගවාදිගණ යෙහි වූ අභිහිතලක්ෂණ නම්-මේ සන්ධි කාර්‍ය්‍යයෙහි වූ සවර්ණදීඝය හා "එ, ඓ, ඔ, ඖ" යන මේ ආදෙශයෝයි. ඒ විධිහු පසුව කියනු ලබන්නෝ වෙති.

a. ක්වචිත්, කිසියම් ප්‍රයොගයෙක්හි; යකාරඃ, යකාරය; ස්වරවත්, ස්වරයක් මෙන් ගණුලැබේ. යථා, එනම්; අධ්වපරි මාණෙ, මාර්ගප්‍රමාණ වාචක තන්හි; "ගො යූතිඃ" යන විසන්ධියෙහි

21. ඓ ආය්. (ඓ 1, 1; ආය් 1; 1;)

a. ඓකාර ආය් භවති ස්වරෙ පරෙ. නෛ + අකඃ-නායකඃ.

22. ඖ ආව්. [ඖ 1, 1; ආව් 1, 1;)

b. ඖකාර ආව් භවති ස්වරෙ පරෙ. තෞ + ඉහ-තාවිහ.

23. ය්වොලොපශ් වා පදාන්තෙ.

(ය්වොඃ 6, 2; ලොපශ් 1, 1; වා 1, 1; පදාන්තෙ 7, 1;)

ඔකාරයට "අව්" ආදෙශ වීමෙන් "ගව්‍යූතිඃ" යි සන්ධි වේ, ක්‍රොශයුගලම්, "ගව්‍යූතිඃ" යනු ගඩයන දෙකයි. අන්‍යත්‍ර, අන් පරිද්දෙන්; (එනම්) අධ්වනඃ, මාර්ගයාගේ; පරිමාණාභාවෙ, ප්‍රමාණවාචකත්වය නැතිතන්හි; ගවාම්, ගෙරින්ගේ; මිශ්‍රීභාවඃ එකීභාවය, හෙවත් ගොසමූහය; ගොයූතිඃ, "ගොයූති" නම් වේ,

මෙහි යකාරය ස්වරයක්මෙන් ගැණීමේ ප්‍රයොජනය නම් ස්වරයා පරකල්හි කටයුතුදේ යකාරය පරකල්හිත් කිරීමයි. එනම් "ගො යූති" යන ශබ්දවය ක්‍රොශයුගලාභිවාචකව සමාසවූ තන්හි යකාරය ස්වරයක් මෙන් සලකා "ගො"ශබ්දයේ ඔකාරයට "ඔ අව්" යන සූත්‍රයෙන් ස්වරයා පරනිමිත්තෙන් නියමිත "අව්" ආදෙශය වීමෙන් "ගව්‍යූතිඃ"යි සිඬයි. ගෙරිරැළට කියන තන්හි එසේ සන්ධිනොව "ගොයූතිඃ" කියාම වේ.

21.("ආය්" ආදෙශවිධිසූත්‍රයි.) ඓ, ඓකාරය තෙම; ආය්, (ස්වරයා පරකල්හි) ආය් ආදෙශ වේ.

a. ස්වරෙ පරෙ, ස්වරයා පරකල්හි; ඓකාරඃ, ඓකාරය තෙම; ආය් භවති, "ආය්" ආදෙශ වේ. නායකඃ, "නෛ + අකඃ" යනු "නායකඃ"යි සන්ධි වේ.

22 (ආව් ආදෙශවිධි සූත්‍රයි.) ඖ, ඖකාරය තෙම; ආව් (ස්වරයා පරකල්හි) ආව් ආදෙශ වේ.

b. ස්වරෙ පරෙ, ස්වරයා පරකල්හි; ඖකාරඃ, ඖකාරය තෙම; ආව් භවති, ආව් ආදෙශ වේ, තාවිහ, "තෞ + ඉහ" යන තන්හි "තාවිහ" යනු වේ.

23, (ලොපශ්විධිසූත්‍රයි.) පදාන්තෙ, පදාන්තයෙහිවූ; ය්වොඃ, යකාර වකාර දෙකට; වා, විකල්පයෙන්; ලොපශ්, ලොපශ්වේ; හෙවත් ලොපශ් යන්නෙන් ලොප් වේ.

a. පදාන්තස්ථිතානාමයාදීනාං යකාරවකාරයොර්ලොපශ් වා භවති. තෙ+ආගතාඃ-ත ආගතාඃ, තයාගතාඃ; පටෝ-ඉහ-පට ඉහ, පටවිහ; තස්මෙ + ආසනම්-තස්මා ආසනම්, තස්මායාසනම්; අසෞ + ඉන්දුඃ-අසා ඉන්දුඃ, අසාවින්දුඃ

b. "ලොපශි පුනර්න සන්ධිඃ" ඡන්දසි තු භවති, හෙ සඛෙ + ඉති-හෙ සඛෙති-හෙ සඛයිති.

---

a. පදාන්ත ස්ථිතානාම්, (විභක්ත්‍යන්ත) පදවසානයෙහි (ආදෙශව) සිටියාවූ; අයාදීනාම්, අය් ආදී ආදෙශයන්ගේ; යකාර වකාරයොඃ, යකාර වකාර දෙකට; වා, විකල්පයෙන්; ලොපශ් භවති, ලොපශ් යන්නෙන් ලොප් වේ. "තෙ + ආගතාඃ" යන තන්හි යකාරය ලොප්ව "ත ආගතාඃ" යනුද විකල්පයෙන් ලොප් නොව "තයාගතාඃ" යනුද වේ. "පටෝ+ඉහ" යන තන්හි වකාරය ලොප්ව "පටඉහ" යනුද ලොප් නොව "පටවිහ" යනුද, තස්මෙ + ආසනම්" යන තන්හි යකාරය ලොප්ව "තස්මා ආසනම්" යනුද, ලොප් නොව "තස්මායාසනම්" යනුද, "අසෞ + ඉන්දුඃ" යන තන්හි වකාරය ලොප්ව "අසාඉන්දුඃ" යනුද ලොප් නොව "අසාවින්දුඃ" යනුද වේ.

b. ලොපශි, ලොපශ් යන්න ඇති තන්හි හෙවත් ලොපශ් යන්නෙන් ලොපය පැමිණි තන්හි; පුනඃ, නැවත; න සන්ධිඃ, සන්ධි නොවේ. ඡන්දසිතු, වෙදයෙහි වනාහි; භවති, සන්ධි වේ. (එනම්) "හෙ සඛෙ + ඉති" යන තන්හි "හෙ සඛෙති" යනුයි. "හෙසඛයිති" යනුද වේ.

පදාන්තව සිටි "එ ඓ ඔ ඖ" යන මොවුන්ට "එ අය්" යනාදි සූත්‍රවිධිවලින් පැමිණි "අය් අව් ආය් ආව්" යන මේ ආදෙශයන්ගේ යකාර වකාර දෙකට ලොපශ් යන්නෙන් විකල්පයෙන් ලොප් වේ. "ලොපශ්" යන සංඥව වර්ණවිරොධයයි කී බැවින් එයින් ලොප්කළ තන්හි නැවත සන්ධිකාර්‍ය්‍යයෙක් නොවේ. එනම්:- යකාරය ලොප්වීමෙන් සිටියාවූ "තආගතාඃ" යන්න නැවත සන්ධිව "තාගතාඃ"යි නොවේ. සෙස්සද මෙසේයි. වෙදයෙහි ලොපශ් යන්නෙන් ලොප්කළ තන්හිද නැවත සන්ධිවන බැව් නියමකොට "හෙසඛෙති"යි උදාහරණකරණ ලදී. මෙහි හෙසඛ + ඉති- හෙසඛය් + ඉති යන තන්හි යකාර ලොපයෙන් "හෙසඛ ඉති" යනු වේ. පසුව එහි අ ඉ දෙකට එකාරය වීමෙන් "හෙසඛෙති"යි සිද්ධයි.

24. එදොතොතඃ. (එත්ඔතඃ 5, 1; අතඃ 6, 1;)

a පදාන්තස්ථිතාදෙකාරාදොකාරාච්ච පරස්‍යාකාරස්‍ය ලොපශ් භවති. තෙ + අත්‍ර-තෙත්‍ර, පටෝ+අත්‍ර-පටෝත්‍ර.

25. සවර්ණෙ දීර්ඝඃසහ. (සවර්ණෙ 7, 1; දීර්ඝඃ 1; 1; සහ 1. 1;)

b. සවර්ණස්‍ය සවර්ණෙ පරෙ සහ දීර්ඝො භවති. ශ්‍රද්ධා + අත්‍ර- ශ්‍රද්ධාත්‍ර, දධි + ඉහ-දධීහ, මධු + උදකම්-මධූදකම්.

c. සාමාන්‍යශාස්ත්‍රතො නූනං විශෙෂො බලවාන්භවෙත්, පරෙණ පූර්වබාධො වා ප්‍රායශො දෘශ්‍යතාමිහ

---

24. ලොපශ් විධිසූත්‍රයි.) එත්ඔතඃ, (පදාන්ත) එකාරයා කෙරෙන් හා ඔකාරයා කෙරෙන් පරවූ; අතඃ, අකාරයට (ලොපශ් යන්නෙන් ලොප් වේ.)

a. පදාන්ත ස්ථිතාත්, පදකෙළවර සිටියාවූ; එකාරාත්, එකාරයා කෙරෙන්ද; ඔකාරාච්ච, ඔකාරයා කෙරෙන්ද; පරස්‍ය, පරවූ; අකාරස්‍ය, අකාරයට; ලොපශ් භවති, ලොපශ් යන්නෙන් ලොප් වේ. "තෙ + අත්‍ර" යන තන්හි "තෙත්‍ර" යනුද, "පටෝ+අත්‍ර" යන තන්හි "පටෝත්‍ර" යනුද වේ. (මෙහි අකාරලොපයි.)

25. (දීර්ඝවිධිසූත්‍රයි.) සවර්ණෙ, සවර්ණයා පරකල්හි; සහ, ඔහු සමග; දීර්ඝඃ, (පූර්වසමාන වර්ණයට) දීර්ඝ වේ.

b. සවර්ණෙ පරෙ, සවර්ණයා පරකල්හි; සවර්ණස්‍ය, පූර්ව සවර්ණයට; සහ, පරසවර්ණයත් සමග; දීර්ඝඃ භවති, දීර්ඝ වේ. "ශ්‍රද්ධා + අත්‍ර" යන තන්හි "ශ්‍රද්ධාත්‍ර"යි සන්ධි වේ. "දධිඉහ" යන තන්හි "දධීහ" යනුද, "මධු උදකම්" යන තන්හි "මධූදකම්" යනුද වේ.

සවර්ණවූ සමානස්වරවයක් එකතුවූ තන්හි පරවර්ණයත් සමග පූර්වවර්ණයට දීර්ඝ වේ. එනම්, අ ආ දෙකෙන් එකක් පරව පූර්වයෙහුත් ඉන් එකක්ම තිබුනි නම් ඒ පරවර්ණයත් සමග පූර්වවර්ණයට දීර්ඝ වේ. ඉ ආදියෙහිද මෙසේයි.

c. සාමාන්‍යශාස්ත්‍රතඃ, සාමාන්‍යශාස්ත්‍රවිධියට වඩා, හෙවත් සාමාන්‍ය සූත්‍රවිධියට වඩා; විශෙෂඃ, විශෙෂ සූත්‍රවිධිය; නූනම්, එකාන්තයෙන්; බලවාන් භවෙත්, බලවත් වන්නේය. වා

a. අදීර්ඝෝ දීර්ඝතාං යාති නාස්ති දීර්ඝස්‍ය දීර්ඝතා,
පූර්වදීර්ඝස්වරං දෘෂ්ට්වා පරලොපො විධීයතෙ.

b. බහුව්‍යාපකං සාමාන්‍යම්, අල්පව්‍යාපකෝ විශෙෂඃ.

26. අ ඉ ඒ. (අ 1, 1: ඉ 7, 1; ඒ 1, 1;)

නොහොත්; පරෙණ, පරවූ සූත්‍රවිධියෙන්; පූර්වබාධඃ, පූර්වවිධිහුගේ වැළැක්ම; ඉහ, මෙහි; ප්‍රායශඃ, බෙහෙවින්; දෘශ්‍යතාම්, දක්නා ලැබේවා; නොහොත් අවබොධ කරණු ලැබේවා

මෙයින් න්‍යාය දෙකක් නියමිත වේ. එනම්, සාමාන්‍ය විධියට වඩා විශෙෂවිධිහුගේ බලවත් භාවය හා පරවිධියෙන් පූර්වවිධිය වළකිනබවයි. සාමාන්‍යවිධිය නම් බහුව්‍යාපක විධියයි හෙවත් බොහෝ තන්හි පැතිර පවත්නා විධියයි. විශෙෂ නම් අල්පව්‍යාපක විධියයි හෙවත් කොටසෙක්හි පැතිර පවත්නා විධියයි. "ඉයං ස්වරෙ, උවම්" යනාදි සූත්‍රයන්හි නිමිතිවූ "ස්වරෙ" යන්න බහුව්‍යාපකත්වයෙන් සියලු ස්වරයන්ට සාධාරණ වශයෙන් කියනලද බැවින් සාමාන්‍යයි. සවර්ණෙ දීර්ඝඃ සහ" යන සූත්‍රයෙහි නිමිත්ත වනාහි සවර්ණ ස්වරයයි කොටසක් වෙන්කොට කී බැවින් විශෙෂයි. "දධි+ඉහ" යනාදියෙහි "ඉ යං ස්වරෙ" යනාදි සූත්‍රොක්ත සාමාන්‍ය විධි නොව විශෙෂවිධිවූ හෝ පරවිධිවූ දීර්ඝවිධිය වීමෙන් "දධීහ මධූදකං" යනාදිය වේ. මෙහි "ප්‍රායශඃ"යි කී බැවින් පරසූත්‍රවිධියෙන් පූර්වසූත්‍රවිධිය වැළැක්ම සමහර තන්හි නොවේ.

a. අදීර්ඝඃ, දීර්ඝනුවූයේ; දීර්ඝතාම්, දීර්ඝභාවයට; යාති, පැමිණේ; දීර්ඝස්‍ය, දීර්ඝවූවහුගේ; දීර්ඝතා, (නැවත) දීර්ඝභාවයක්; නාස්ති; නැත්තේය; පූර්වදීර්ඝස්වරං, පූර්වයෙහි සිටි දීර්ඝස්වරය; දෘෂ්ට්වා, දැක; පරලොපඃ, පරස්වරලොපය; විධීයතෙ, කරණුලැබේ.

පූර්වාපරව සිටි වර්ණ දෙකෙන් පූර්වාක්ෂරය හ්‍රස්වයක් නම් දීර්ඝවන බවද දීර්ඝ නම් පරස්වරයට ලොපය කටයුතු බවද මෙයින් නියමිතයි.

b. බහුව්‍යාපකම්, බොහෝ තන්හි පැතිර පවත්නේ; සාමාන්‍යම්, සාමාන්‍ය නම් වේ. අල්පව්‍යාපකඃ, ස්වල්පතන්හි පැතිර පවත්නේ; විශෙෂඃ, විශෙෂ නම් වේ.

26. (එකාරාදෙශවිධිසූත්‍රයි.) ඉ, ඉවර්ණය පරකල්හි; අ, අවර්ණය තෙම; ඒ, (පරනිමිත්ත සමග) එකාරයෙක් වේ.

a. අවර්ණ ඉවර්ණෙ පරෙ සහ ඒ භවති. තව+ඉදම්-තවෙදම්.

b. "සර්වවිධිභ්‍යො ලොපවිධිර්බලවාන්" "හලාදෙරීෂාදෞ ටෙර්ලොපො වක්තව්‍යඃ" ක්වචිත්තදාදිවර්ණාභාවෙ කෙවලස්වරස්‍යාපි ටිසංඥා වක්තව්‍යා. * හල+ඊෂා - හලීෂා. ලාඞ්ගල+ඊෂා - ලාඞ්ගලීෂා, මනස්+ඊෂා - මනීෂා, ශක+අන්ධුඃ-ශකන්ධුඃ, කර්ක+අන්ධුඃ-කර්කන්ධුඃ, කුල+අටා-කුලටා, සීමන්+අන්තඃ - සීමන්තඃ, කෙශවෙශෙ; අන්‍යත්‍ර සීමාන්තඃ,

---

a. ඉවර්ණෙ පරෙ, ඉවර්ණය පරකල්හි; අවර්ණඃ, අවර්ණයතෙම; සහ, පරනිමිත්ත සමග; ඒ භවති, එ යන්නක වේ. "තව + ඉදම්" යන විසන්ධියෙහි එකාරව "තවෙදම්" යනු වේ. (මේ එකාරවිධියට හා යථොක්ත දීර්ඝවිධියටද නිමිති ඇති ඇතැම්තන්හි එසේ නොව ටිසංඥලොපයෙන් සිද්ධ සන්ධි දක්නාලබන බැවින් ඒ ලොපවිධිය බලවත් බව දක්වන්නාහු "සර්වවිධිභ්‍යඃ" යනාදිය කීහු.

b. සර්වවිධිභ්‍යඃ, සියලු විධිවලට වඩා; ලොපවිධිඃ, ලොපවිධිය; බලවාන්, බලවත් වේ. ඊෂාදෞ, ඊෂාශබ්දාදිය පරකල්හි; හලාදෙඃ, හලශබ්දාදිය සම්බන්ධිවූ; ටෙඃ, ටිසංඥයට; ලොපඃ, ලොපය; වක්තව්‍යඃ, කියයුතුයි. (ඊෂාශබ්දාදිය නම්-"ඊෂා, ඕම්, අන්ධු, අන්ත, අටා, අජලි, අඞ්ග" යන මේ ආදියයි. හලශබ්දාදිය නම්-"හල, ලාඞ්ගල, මනස්, අද්‍ය, ශක, කර්ක, සීමන්, කුල, පතත්, සාර" යන මේ ආදියයි. මේ ඊෂාදි ශබ්ද පරකල්හි හලාදීන්ගේ ටිසංඥ ලොපය වේ.) ක්වචිත්, කිසිතන්හි; තදාදිවර්ණාභාවෙ, ඊට ආදි වර්ණයක් නැතිතන්හි; කෙවලස්වරස්‍යාපි, හුදකලා ස්වරයටද; ටිසංඥා, ටිසංඥව; වක්තව්‍යා, කියයුතුයි. (මේ "හල" ආදීන්හි ටිසංඥ ලොපය වේයයි නියමිත බැවින් ස්වරාන්තයන්ගේ හුදකලා අන්ත්‍යස්වරයට පමණක් ටිසංඥව වේයයිද එබැවින් "හල" ආදීන්ගේ ඒ අන්තස්වර ලොපය වේයයිද යනු මෙහි අදහසයි.) "හල+ඊෂා" යන තන්හි ටිසංඥලොපයෙන් "හලීෂා" යනු වේ. ලාඞ්ගලීෂා" යනාදියද මෙසේයි. "සීමන් + අන්තඃ" යන තන්හි ටිසංඥලොපයෙන් "සීමන්තඃ" යි සන්ධි වේ. කෙශවෙශෙ,

* මේ පාඨය ටිසංඥව නියමිත තන්හි පඨනීය පාඨයක් බැවිද ටිසංඥසූත්‍ර ව්‍යාඛ්‍යාවෙන් මෙ අදහස දතහැකි බැවින් මෙහි උච්චතානතාවන බවද හැඟේ

පතත්+අඤ්ජලිඃ–පතඤ්ජලිඃ, සාර + අඞ්ගඃ–සාරඞ්ගඃ, පශුපක්ෂිණෞඃ, අන්‍යත්‍ර සාරාඞ්ගඃ, අද්‍ය+ ඔම්–අද්‍යෝම්

a. හලීෂා ලාඞ්ගලීෂා ච මනීෂාද්‍යෝං තථෛවච
ශකන්ධුරථ කර්කන්ධුඃ සීමන්තඃ කුලටා තථා,
පතඤ්ජලිශ්ච සාරඞ්ග එතෙ ප්‍රොක්තා හලාදයඃ,

b. "ඔමාඞාවපි" අවර්ණාත් පරෙ ඔමාඞෝ විලොප නිමිත්තෙ ස්තඃ. අද්‍ය+ඔම්–අද්‍යෝම්, ශිව + ආ + ඉහි–ශිවෙහි.

කෙශරචනාවියෙහි එසේ වේ; අන්‍යත්‍ර, අන්තන්හි; සීමාන්තඃ, 'සීමාන්තඃ'යි සන්ධි වේ. "පතත්+අඤ්ජලිඃ"යන තන්හි "පතඤ්ජලිඃ" යනු වේ. "සාර + අඞ්ගඃ" යන තන්හි "සාරඞ්ගඃ" යනු වේ; 'පශුපක්ෂිණෞඃ, පශුපක්ෂිඅභිධෙය වාච්‍ය තන්හි එසේ වේ. අන්‍යත්‍ර, අන්තන්හි; සාරාඞ්ගඃ, "සාරාඞ්ගඃ" යි දීර්ඝවිධියෙන් සන්ධි වේ. (මෙහි සීමාන්තඃ"යි සන්ධිවූ තන්හි "නාමෙනඃ; නොලොපශබ්දෙ" යනසූත්‍රයෙන් නකාර ලොපයවූ පසු සමානවර්ණ දීර්ඝවිධියෙන් සිද්ධයි.)

a. හලීෂා "හල + ඊෂා" යන තන්හි "හලීෂා" යනුද; ලාඞ්ගලීෂා ච, "ලාඞ්ගල + ඊෂා" යන තන්හි "ලාඞ්ගලීෂා" යනුද; මනීෂා, "මනස් + ඊෂා" යන තන්හි "මනීෂා" යනුද; තථෛවච, එසේම; අද්‍යෝම්, "අද්‍ය+ඔම්" යන තන්හි "අද්‍යෝම්" යනුද, ශකන්ධුඃ, "ශක + අන්ධුඃ" යන තන්හි "ශකන්ධුඃ" යනුද; අථ, නැවත; කර්කන්ධුඃ, "කර්ක + අන්ධුඃ" යන තන්හි "කර්කන්ධුඃ" යනුද; සීමන්තඃ, "සීමන් + අන්තඃ" යන තන්හි "සීමන්තඃ" යනුද; තථා; එසේම; කුලටා, "කුල + අටා" යන තන්හි "කුලටා" යනුද; පතඤ්ජලිශ්ච, "පතත්+අඤ්ජලිඃ" යන තන්හි "පතඤ්ජලිඃ" යනුද, සාරඞ්ගඃ, "සාර + අඞ්ගඃ" යන තන්හි "සාරඞ්ගඃ"යනුද වේ; එතෙ මොහු; හලාදයඃ, හලාදීහුයයි; ප්‍රොක්තාඃ, කියනලද්දහ.

b. ඔමාඞෝ අපි, ඔම් ආඞ් යන දෙකද (විසන්ධිලොපයට නිමිති වෙත්.) අවර්ණාත් පරෙ, අවර්ණයා කෙරෙන් පරවූ; ඔමාඞෞ, ඔම් ආඞ් යන දෙක; විලොපනිමිත්තෙ ස්තඃ, විසන්ධිලොපයට නිමිති වෙත්. "අද්‍ය + ඔම්" යන තන්හි විසන්ධිලොපයෙන් "අද්‍යෝම්" යනුද; "ශිව + ආ + ඉහි" යන තන්හි "ශිවෙහි" යනුද වේ. (මෙහි "ආඞ්" යන්න පරනිමිත්තෙන් වකාරස්ථ අකාර සන්ධ්‍යාන්ත විසන්ධිය ලොප්ව නැවත "ආ ඉ" දෙකට එකාරය වීමෙන් "ශිවෙහි"යි සිද්ධයි.)

a. "ඔමි නිත්‍යම්"-ඔමි පරෙ නිත්‍යමවර්ණස්‍ය ලොපො භවති. ස්වර+ඔම් ස්වරොම්. *

27. උ ඔ (උ 7, 1; ඔ 1, 1)

b. අවර්ණ උවර්ණෙ පරෙ සහ ඔ භවති. ගඞ්ගා+උදකම්–ගඞ්ගොදකම්.

28. ඍ අර්. (ඍ 7, 1; අර් 1, 1;]

c. අවර්ණ ඍවර්ණෙ පරෙ සහ අර් භවති. තව + ඍද්ධිඃ–තවර්ද්ධිඃ, "රාද්‍යුපොමිඃ" (16 පුඃ සූඃ)

29. ක්වචිදාර්. (ක්වචිත් 7, 1; ආර් 1, 1;)

---

a. ඔමි, ඔම් යන්න පරකල්හි; නිත්‍යම්, (අවර්ණලොපය) නිත්‍යයි. ඔමි පරෙ, ඔම් යන්න පරකල්හි; නිත්‍යම්, අවිකල්ප යෙන්; අවර්ණස්‍ය, අවර්ණයට; ලොපඃ භවති, ලොප්වේ. ස්වර+ඔම්" යන තන්හි "ඔම්" යන්න පරනිමිත්තෙන් නිත්‍යයෙන් විසන්ධිය ලොප්ව "ස්වරොම්" යනු වේ.

27. (ඔකාරාදෙශවිධි සූත්‍රයි.) උ, උවර්ණය පරකල්හි; ඔ, (පරනිමිත්ත සමග අවර්ණයට) ඔයන්න වේ.

b. උවර්ණෙ පරෙ, උවර්ණය පරකල්හි; අවර්ණඃ, අවර්ණය තෙම; සහ, පරනිමිත්ත සමග; ඔ භවති, ඔයන්න වේ. "ගඞ්ගා + උදකම්" යන විසන්ධියෙහි ඔකාරාදෙශව "ගඞ්ගොදකම්" යනු වේ.

28. (අර් ආදෙශ විධිසූත්‍රයි.) ඍ, ඍවර්ණය පරකල්හි; අර්, (පරනිමිත්ත සමග අවර්ණයට) අර් යන්න වේ.

c. ඍවර්ණෙ පරෙ, ඍවර්ණය පරකල්හි; අවර්ණඃ, අවර්ණය තෙම; සහ, පරනිමිත්ත සමග; අර් භවති, අර් යන ආදෙශය වේ. "තව + ඍද්ධිඃ" යන තන්හි අර් ආදෙශව "තවර්ද්ධිඃ" යනු වේ. "රාද්‍යුපොමිඃ" යන සූත්‍රයෙන් (මෙහි ධකාර ද්විත්වයයි.)

29. (ආර් ආදෙශවිධි සූත්‍රයි.) ක්වචිත්, කිසි තන්හි; ආර්, (ඍවර්ණය පරකල්හි අවර්ණයට) "ආර්" යන්න වේ.

---

* මේ පාඨය බොහෝ පොත්හි අවිද්‍යමානයි. "ඔමාඞොශ්ච" යනු පාණිනීය සූත්‍ර බැවින් මෙහිද "ඔමාඞාවපි" යන්න වාර්තිකයක් වශයෙන් ලියහැකි වේ.

a. **අවර්ණ ඍවර්ණේ පරෙ සහ ආර්වෘද්ධිර් භවති.** ඍණ+ඍණම්-ඍණාර්ණම්, ප්‍ර+ඍණම් ප්‍රාර්ණම්, වසන+ඍණම්-වසනාර්ණම්, වත්ස+ඍණම්, වත්සාර්ණම්, වත්සතර+ඍණම් වත්සතරාර්ණම්, කම්බල+ඍණම් - කම්බලාර්ණම්, දශඍණම්-දශාර්ණම්. ශීත+ඍතඃ ශීතාර්තඃ, "ඍතෙ ච තෘතීයා සමාස එවාර්" අන්‍යත්‍ර පරමර්තඃ.

b. **"උපසර්ගාදවර්ණාන්තාද්ඍකාරාදෞ ධාතෞ ආර් භවති" ප්‍රාර්ච්ඡති.**

---

a ඍවර්ණේ පරෙ, ඍවර්ණය පරකල්හි; අවර්ණඃ, අවර්ණය තෙම; සහ, පරනිමිත්ත සමග; සවිත්, කිසිතැනෙක්හි; ආර් භවති, "ආර්" යන ආදේශය වේ. "ඍණ+ඍණම්" යන තන්හි "ඍණාර්ණම්" යනු වේ. "ප්‍ර+ඍණම්- ප්‍රාර්ණම්" යනාදිය ද මෙසේයි. "ශීත+ඍතඃ" යන තන්හි "ශීතාර්තඃ" යනු වේ. ඍතෙ ච, "ඍත" ශබ්දය පරකල්හි ද; තෘතීයාසමාසෙ එව, තෘතීයාතත්පුරුෂ සමාසයෙහිම; ආර්, "ආර්" යන්න වේ. අන්‍යත්‍ර, (තෘතීයා තත්පුරුෂ සමාසයෙන්) අන්තන්හි; පරමර්තඃ, (ආර් නොව අර්වීමෙන්) "පරමර්තඃ" යනු වේ.

"ආර්වෘද්ධිර්" යන සූත්‍රයෙන් නියමිත "ආර්" යන්න වනාහි "ඍත" ශබ්දයට ඍකාරයට වන කල්හි තෘතීයාසමාසවූ තන්හිම වේ. "ශීතෙන ඍතඃ" යන වාක්‍යයෙහි විභක්තිලොපාදියෙන් සමාසව "ශීත+ඍතඃ"යි තුබූ කල්හි මේ සූත්‍රයෙන් ආර් ආදේශව "ශීතාර්තඃ" යනු වේ. මෙහි තෘතීයාතත්පුරුෂ සමාසයි. "පරමර්තඃ" යන තන්හි "පරමශ්ච සඃ ඍතඃ"යි කර්මධාරය සමාස බැවින් ආර් නොව අර්වීමෙන් "පරමර්තඃ"යි සන්ධි වේ.

b අවර්ණාන්තාත්, අවර්ණයක් අන්තකොට ඇත්තාවූ; උපසර්ගාත්, උපසර්ගයා කෙරෙන්; ඍකාරාදෞ, ඍකාරය ආදිකොට ඇත්තාවූ; ධාතෞ, ධාතු පරකල්හි; ආර්භවති, (පරනිමිත්ත සහිත අවර්ණයට) ආර් යන්න වේ. උපාර්ච්ඡති, "උප+ඍච්ඡති" යන තන්හි "උපාර්ච්ඡති" යනුද; ප්‍රාර්ච්ඡති, "ප්‍ර+ඍච්ඡති" යන තන්හි "ප්‍රාර්ච්ඡති" යනුද වේ.

"ප්‍ර, පරා, අප, අව, ආ, උප" යන මේ අවර්ණාන්ත උපසර්ගයන් කෙරෙන් ඍකාරය ආදිකොට ඇති ධාතුවක් සිටි කල්හි ඒ උපසර්ගාන්ත අවර්ණයට ධාතුවෙහි ඍකාරයත් සමග "ආර්" යන්න වේ. "උපාර්ච්ඡති" යනාදියෙහි "ඍච්ඡ" යනු ධාතුයි.

a **"ඍකාරාදෞ නාමධාතෞ වා" උපාර්ෂභීයති, උපර්ෂභීයති; ප්‍රාර්ෂභීයති - ප්‍රර්ෂභීයති.**

b. **"ඍකාරාදෞ ආර් නෙති වාච්‍යම්" උප+ඍකාරීයති + උපකාරීයති.**

30. ඏ අල්. (ඏ 7, 1; අල් 1, 1;)

c. **අවර්ණ ඏවර්ණෙ පරෙ සහ අල් භවති තව+ඏකාරඃ- තවල්කාරඃ.**

---

a. ඍකාරාදෞ, ඍකාරය ආදිකොට ඇත්තාවූ; නාම ධාතෞ, නාමධාතු පරකල්හි; වා, මෙකී විධිය විකල්පයි. "උප+ඍෂභීයති" යන තන්හි ආර් ආදේශව "උපාර්ෂභීයති" යනුද විකල්පපක්ෂයෙහි "අර්" ආදේශව "උපර්ෂභීයති" යනුද වේ. "ප්‍ර+ඍෂභීයති" යන තන්හි "ප්‍රාර්ෂභීයති" යනුද විකල්පයෙන් "ප්‍රර්ෂභීයති" යනුද වේ.

පෙර කියනලද අවර්ණාන්ත උපසර්ගයකින් පරව ඍකාරාදික නාමධාතුවක් සිටියහොත් එහි ඍකාර සහිත අවර්ණයට වනාහි ආර් ආදේශය විකල්පයෙන් වේ. නාමධාතු නම් නාම යන්ගෙන් ක්‍රියා සිද්ධකිරීමේදී ඒ ඒ නාම අග "ය" ආදි ප්‍රත්‍යයන් යෙදීමෙන් සිද්ධ ධාතු ස්වරූපයි. මෙහි "ආත්මනඃ ඍෂභමිච්ඡති" යන වාක්‍යයෙහි "ඍෂභ" යන නාමයෙන් පරව "ය" ප්‍රත්‍යයාදිය වීමෙන් "ඍෂභීය" යනු සිද්ධයි. ඒ නාමධාතුවෙකි.

b. ඍකාරාදෞ, ඍකාරය ආදිකොට ඇති නාමධාතු පරකල්හි; ආර්, ආර් යන්න; න ඉති, නොවේයයි; වාච්‍යම්, කිය යුතුයි. "උප+ඍකාරීයති" යන තන්හි ආර් යන්න නොව අර් යන්න වීමෙන් "උපකාරීයති" යනු සිද්ධයි. (පූර්වසූත්‍රයෙන් කියනලද "ආර්" යන්න "ඍකාරීය" යනාදි නාමධාතු පරකල්හි නොවේයයි මෙහි නිර්දිෂ්ටයි මේ හිම බොහෝ තැන්හි නොදක්නා ලැබේ.)

30. (අල් ආදේශවිධි සූත්‍රයි.) ඏ, ඏවර්ණය පරකල්හි; අල්, (අවර්ණයට පරනිමිත්ත සමග) අල් යන ආදේශය වේ.

c. ඏවර්ණේ පරෙ, ඏවර්ණය පරකල්හි; අවර්ණඃ, අවර්ණය තෙම; සහ, පරනිමිත්තත් සමග; අල්, අල් යන්න වේ.-"තව+ඏකාරඃ" යන තන්හි 'තවල්කාරඃ'' යනු වේ.

a. "ඍඏවර්ණයොඃ සාවර්ණ්‍යං වක්තව්‍යම්" ඍඏවර්ණ ස්ථානිත්වාද්‍රලයොරපි සාවර්ණ්‍යං වාච්‍යම්"-හොතෘ + ඏකාරඃ-හොතෲකාරඃ.

b. "පරි + අඞ්කඃ" "ඉයං ස්වරෙ. (13 ප්‍ර. සූ.) "රාදෲපොච්ඃ" (16, ප්‍ර සූ) පය්‍යඞ්කඃ-පල්‍යඞ්කඃ.

c. රලයොර්ඩලයොශ්චෛව ශසයොර්බවයොස්තථා,
වදන්ත්‍යෙෂාං සාවර්ණ්‍යමලඞ්කාරවිදො ජනාඃ.

31. එ ඓ ඓ. (එ 1, 1; ඓ 7, 1; ඓ 1, 1.)

d. අවර්ණ එකාරෙ ඓකාරෙ ච පරෙ සහ ඓකාරො

---

a. ඍඏවර්ණයොඃ, ඍඏවර්ණ දෙදෙනාගේ; සාවර්ණ්‍යම්, සවර්ණ භාවය; වක්තව්‍යම්, කියයුතුයි. ඍඏවර්ණස්ථානිත්වාත්, ඍඏවර්ණ දෙදෙනාගේ උත්පත්තිස්ථානය ඇති බැවින්; රලයොඃ අපි, රකාර ලකාර දෙදෙනාගේද; සාවර්ණ්‍යම්, සවර්ණත්වය; වාච්‍යම්, කියයුතුයි. - "හොතෘ + ඏකාරඃ" යන තන්හි ඍඏවර්ණ දෙදෙනාගේ සවර්ණත්වයෙන් පූර්වයට දීර්ඝව "හොතෲකාරඃ" යනුද, ඍකාරයට දීර්ඝ ඏකාරව "හොතෟකාරඃ" යනුද වේ.

b. පරි+අඞ්කඃ, "පරි + අඞ්කඃ" යන විසන්ධියෙහි; "ඉයංස්වරෙ" යන පූර්ව සූත්‍රයෙන් (ඉයන් තැන් යකාරයද) "රාදෲපොච්ඃ" යන පූර්ව සූත්‍රයෙන් (යකාරලොපයද කළකල්හි) "පය්‍යඞ්කඃ" යනුද; රකාරලකාර සාම්‍යයෙන් රකාරයට ලකාරව "පල්‍යඞ්කඃ" යනුද වේ.

c රලයොඃ, රකාරලකාර දෙදෙනාගේද; ඩලයොඃ ච එව, ඩකාර ලකාර දෙදෙනාගේද; ශසයොඃ, තාලව්‍යශකාර දන්තජ සකාර දෙදෙනාගේද; තථා, එසේම; බවයොඃ, බකාර වකාර දෙදෙනාගේද (යන); එෂාං ච, මේ අක්ෂරයන්ගේද; සාවර්ණ්‍යම්, සවර්ණත්වය; අලඞ්කාරවිදඃ, අලඞ්කාරශාස්ත්‍ර දන්නාවූ; ජනාඃ, ජනයෝ; වදන්ති, කියත්; (අලඞ්කාර ශාස්ත්‍රඥයන්ට වනාහි රකාර ලකාර දෙදෙනාගේ සම්බන්ධය පමණක් නොව ඩකාර ලකාරාදීන්ගේ සම්බන්ධයද අභිමත වේයයි මෙයින් නිර්දිෂ්ටයි.)

31. (ඓකාරාදෙශවිධි සූත්‍රයි.) එ, එකාරය පරකල්හිද; ඓ, ඓකාරය පරකල්හිද; ඓ, (අවර්ණයට නිමිත්තත් සමග) ඓකාරය වේ.

d අවර්ණඃ, අවර්ණය තෙම; එකාරෙ, එකාරයද; ඓකාරෙච, ඓකාරයද; පරෙ, පරකල්හි; සහ; පරනිමිත්ත සමග; ඓකාරඃ

හවති. තව + එෂා-තවෛෂා, තව + ඓශ්වර්‍ය්‍යම්-තවෛශ්වර්‍ය්‍යම්.

32. ඔ ඖ ඖ. [ඔ 7, 1; ඖ 7, 1; ඖ 1, 1;)

a අවර්ණ ඔකාරෙ ඖකාරෙ ච පරෙ සහ ඖකාරො හවති. තව + ඔදනම් - තවෞදනම්, තව + ඖන්නත්‍යම්-තවෞන්නත්‍යම්.

33. ඔෂ්ඨොත්වොර්වා සමාසෙ.

(ඔෂ්ඨොත්වොඃ 7, 2; වා 1, 1; ඔ 1 1; සමාසෙ 7, 1;)

b. අවර්ණස්‍ය ඔෂ්ඨොත්වොඃ පරයොඃ සමාසෙ සති සහ වා ඔ හවති බිම්බ+ඔෂ්ඨඃ-බිම්බොෂ්ඨඃ-බිම්බෞෂ්ඨඃ; ස්ථූල + ඔතුඃ-ස්ථූලොතුඃ-ස්ථූලෞතුඃ. සමාසෙ කිම්? තව + ඔෂ්ඨඃ-තවෞෂ්ඨඃ-

ඉති ස්වරසන්ධිප්‍රක්‍රියා.

හවති, ඓකාරය වේ. "තව+එෂා" යන විසන්ධියෙහි ඓකාරව "තවෛෂා" යනුද; "තව + ඓශ්වර්‍ය්‍යම්" යන තන්හි "තවෛශ්වර්‍ය්‍යම්" යනුද වේ.

32. (ඖකාරාදෙශවිධිසූත්‍රයි. (ඔ, ඔකාරය පරකල්හිද; ඖ, ඖකාරය පරකල්හිද; ඖ, (අවර්ණයට පරනිමිත්තයන් සමග) ඖකාරය වේ.

a අවර්ණඃ, අවර්ණය තෙම; ඔකාරෙ, ඔකාරයද; ඖකාරෙ ච, ඖකාරයද; පරෙ, පරකල්හි; සහ, පරනිමිත්තයන් සමග; ඖකාරඃ හවති, ඖකාරය වේ. "තව + ඔදනම්" යන තන්හි ඖකාරව "තවෞදනම්" යනුද; "තව + ඖන්නත්‍යම්" යන තන්හි "තවෞන්නත්‍යම්" යනුද වේ.

33. (ඔකාරාදෙශවිධි සූත්‍රයි.) සමාසෙ, සමාසවිග්‍රහයෙහි; ඔෂ්ඨොත්වොඃ, "ඔෂ්ඨ ඔතු" යන ශබ්දවය පරකල්හි; වා විකල්පයෙන්; ඔ, (අවර්ණයට පරනිමිත්ත සමග) ඔකාරය වේ.

b. ඔෂ්ඨොත්වොඃ පරයොඃ, ඔෂ්ඨ ඔතු යන ශබ්ද දෙක පරකල්හි, හෙවත් ඔෂ්ඨ ඔතු ශබ්දයන්ගේ ඔකාරය පරකල්හි; සමාසෙ සති, සමාසය ඇතිකල්හි; අවර්ණස්‍ය, අවර්ණයට; සහ, පරනිමිත්ත සමග; වා, විකල්පයෙන්; ඔ හවති, ඔකාරය වේ. "බිම්බ+ඔෂ්ඨඃ" යන විසන්ධියෙහි ඔකාරය වීමෙන් "බිම්බොෂ්ඨඃ" යනුද විකල්ප පක්ෂයෙහි පූර්වොක්ත ඖකාර විධියෙන් "බිම්බෞෂ්ඨඃ" යනුද,

a. අථ ප්‍රකෘතිභාව උච්‍යතෙ, (ප්‍රකෘතෙයථාසම්හිතස්‍ය රූපස්‍ය භවනං ප්‍රකෘතිභාවඃ.)

34. නාමී. (න 1, 1; අමී 1, 1;]

b. අදසොමී සන්ධිං න ප්‍රාප්නොති. අමී ආදිත්‍යාඃ.

'ස්ථූල + ඔතුඃ' යන විසන්ධියෙහි මෙසේම "ස්ථූලෞතුඃ" යනුද විකල්පයෙන් "ස්ථූලොතුඃ" යනුද වේ. සමාසෙ කිම්, සමාසයෙහි යනු කිම ?; "තව+ඔෂ්ඨඃ" යන විසන්ධියෙහි සමාස රහිත බැවින් ඔකාරය නොව ඖකාරය වීමෙන් "තවෞෂ්ඨඃ"යි සිඩ බැවිනි. ස්වරසන්ධිප්‍රක්‍රියා, ස්වරසන්ධිප්‍රක්‍රියාව; ඉති, මෙතෙකින් සමාප්තයි.

"ඔෂ්ඨ" ශබ්දය හෝ "ඔතු" ශබ්දය පරව සිට අවර්ණාන්ත ශබ්දයක් හා සමාසවූ තන්හි පූර්ව අවර්ණය සහිත එහි ඔකාරයට ඔකාරයම වේ. මින් පූර්වෝක්ත "ඔ ඖ ඖ" යන සූත්‍රවිධිය විකල්පිතයි. "බිම්බ ඉව ඔෂ්ඨෞ යස්‍ය සඃ=බිම්බෞෂ්ඨඃ-බිම්බොෂ්ඨඃ" "ස්ථූලශ්චාසාවොතුශ්ච=ස්ථූලෞතුඃ - ස්ථූලොතුඃ"-යනු සමාසයි.

ස්වරසන්ධි ප්‍රක්‍රියාවේ ව්‍යාඛ්‍යාවයි.

ප්‍රකෘතිභාවසන්ධි ප්‍රක්‍රියාවේ ව්‍යාඛ්‍යාව.

යථොක්ත ස්වරසන්ධි විධියෙහි ඒ ඒ ආදෙශාදිය වීමෙන් විකෘතියට පැමිණ සන්ධිවන තැන් දක්වා, ඇතැම් තැන් එසේ විකෘතියට නොපැමිණ ප්‍රකෘතියෙන්ද සිටින බැව් දක්වනුවස් "අථ ප්‍රකෘතිභාවඃ" යනාදිය කීහු.

a. අථ, (ස්වරසන්ධිප්‍රක්‍රියාවට) අනතුරුව; ප්‍රකෘතිභාවඃ, ප්‍රකෘතිභාවය; උච්‍යතෙ, කියනු ලැබේ. ප්‍රකෘතෙඃ, "ප්‍රකෘතෙඃ" යයි සේ:; යථාසම්හිතස්‍ය රූපස්‍ය භවනම්, විද්‍යමාන රූපයාගේ වීම; ප්‍රකෘතිභාවඃ, ප්‍රකෘතිභාව නම් වේ. (පූර්වෝක්ත නිමිති ඇති ඇතැම් පද ආදෙශාදියෙන් වෙනස්නොව සිටිලෙසම සිටීත්, එසේම සිටීම ප්‍රකෘතිභාවයි. මෙතැන් පටන් ඒ විකෘත නොවන තැන් නිරූපණය කරණු ලැබෙත්.

34. (ප්‍රතිෂෙධවිධි සූත්‍රය.) අමී, (අදස් ශබ්දය සම්බන්ධි) "අමී" යන රූපය; න; සන්ධි නොවේ.

b. අදසඃ, අදස් ශබ්දය සම්බන්ධිවූ; අමී "අමී" යන රූපය; සන්ධිං, සන්ධියට; නප්‍රාප්නොති, නොපැමිණේ. "අමී ආදිත්‍යාඃ" යනු

35. යෙව ද්විවෙ. (යෙව 1, 1; ද්විවෙ 7, 1;)

a. (ඊ ච ඌ ච ඒ ච=යෙව) ඊකාරාන්ත ඌකාරාන්ත එකාරාන්තශ්ච ශබ්දා ද්විවෙ වර්තමානාඃ සන්ධිං නප්‍රාප්නුවන්ති, (මණීවාදිවර්ජ්‍යම්) අග්නී අත්‍ර, පටූ අත්‍ර, මාලෙ ආනය. මණීවාදෙයස්තු සන්ධිර්භවති. මණී + ඉව-මණීව, දම්පතී + ඉව - දම්පතීව ජම්පතී + ඉව-ජම්පතීව, ජායාපතී + ඉව, රොදසී+ඉව-රොදසීව.

b. මණීවොෂ්ට්‍රස්‍ය ලම්බෙතෙ ප්‍රියෞ වත්සතරෞ මම, ම්‍රියමාණෞ තු තෞ දම්‍යෞ මකිසතෙත්‍රදමබ්‍රවීත්.

ඊට උදාහරණයි. (අදස් ශබ්දයාගේ ප්‍රථමා බහුවචනයෙහි නිපන් "අමී" යන රූපය හෙවත් ඒ රූපයාගේ ඊකාරය පරව සිටි ස්වරයක් හා විකෘත වීමෙන් සන්ධි නොවේ. රොගීවාචක "අමී" යන්නව නාහිසන්ධි වේ. එනම්-"අමී + අසෞ" යන්න "අම්‍යසෞ" යි සන්ධි වේ. මෙතෙම රොගියෙකි යනු අර්ථයි.)

35. (ප්‍රතිෂෙධවිධිසූත්‍රයි) ද්විවෙ, ද්විවචන භාවයෙහි (නිෂ්පන්නාවූ) යෙව, ඊකාරාන්ත ඌකාරාන්ත එකාරාන්ත ශබ්දය; (සන්ධි නොවේ.)

a. ඊ ච, ඊයන්නද; ඌ ච, ඌයන්නද; එච, එයන්නද; යෙව "යෙව" නමි. ඊකාරාන්තඃ, ඊකාරාන්තවූද; ඌකාරාන්තඃ, ඌකාරාන්තවූද; එකාරාන්තඃ ච, එකාරාන්තවූද; ශබ්දඃ, ශබ්දය; ද්විවෙ වර්තමානාඃ, ද්විවචනභාවයෙහි උපන්නෝ; සන්ධිං නප්‍රාප්නොති, සන්ධියට නොපැමිණේ. මණීවාදිවර්ජ්‍යං, "මණීව" යනාදිය හැරයි -"අග්නී අත්‍ර" යනු ද්විවචනභාවයෙහි ඊකාරාන්තය සන්ධි නොවීමට උදාහරණයි. "පටූ අත්‍ර" යනු ද්විවචනභාවයෙහි ඌකාරාන්තය සන්ධිනොවීමට උදාහරණයි. "මාලෙ ආනය" යනු ද්විවචනභාවයෙහි එකාරාන්තය සන්ධි නොවීමට උදාහරණයි. මණීවාදෞ තු, "මණීව" යනාදියෙහි වනාහි; සන්ධිඃ භවති, සන්ධි වේ. (එනම්, "මණී+ඉව" යන තන්හි දීර්ඝ විධියෙන් "මණීව" කියා සන්ධිවේ. සෙස්සද මෙසේයි.

b. මම, මාගේ; ප්‍රියෞ, ප්‍රියවූ; වත්සතරෞ, වසුපැටියෝ දෙදෙන; උෂ්ට්‍රස්‍ය, ඔටුවාගේ; මණී ඉව, මිණිදෙක මෙන්; ලම්බෙතෙ, එල්ලෙත්; ම්‍රියමාණෞ, හරිණුලබත්නාවූ; තෞතු, ඔහු දෙදෙන වනාහි; දම්‍යෞ, දමනය කටහැකි වෙත්, මඤ්ඤ, මකී නම් ආචාර්යතෙම; තත්‍ර, එහි; ඉදම්, මෙය; අබ්‍රවීත්, කීයේය.

36. ඖ නිපාතඃ (අ 1, 1; ඔ 1, ඖ 1, 1; නිපාතඃ 1, 1;)

a. (ආ ච ඔ ච, අ ච ඉ ච උ ච ඍ ච ඎ ච එ ච ඓ ච ඔ ච ඖ ච-ඖ, ආ ඔ ඉති ප්‍රෘථක්පදං වා නිපාතඃ) ආකාරනිපාත ඔකාර නිපාත එකාක්ෂරශ්ච සන්ධිං න ප්‍රාප්නොති, ආ එවං මන්‍යසෙ, නො අත්‍ර ස්ථාතව්‍යම්, අ අපෙහි, ඉ ඉන්ද්‍රං පශ්‍ය, උ උත්තිෂ්ඨ,

---

ද්විවචනයෙහි සිඛව ඊකාරාන්තවූ "මණී" යනාදිය "මණීව" යනාදි වශයෙන් සන්ධියට පැමිණ පෞරාණික රචනාවන්හිද තිබෙන බැව් දැක්වීමට මේ භාරත ශ්ලොකය නිර්දිෂ්ටයි. තවද මේ "මණීව" යනාදියෙහි "ඉව" ශබ්දය නොව ඉව ශබ්දාර්ථ "ව" ශබ්දයයිද ඇතැම් ආචාර්යයන්ගේ මතයි.

36. (නිපාතසන්ධිප්‍රතිෂෙධවිධි සූත්‍රයි.) ආ, "ආ" නිපාතයද; ඔ, ඔකාරාන්ත නිපාතයද; ඖනිපාතඃ, ඖප්‍රත්‍යාහාර නිපාතයද; නොහොත් ස්වරනිපාතයද සන්ධියට නොපැමිණේ.

a. (ආ ච, ආයන්නද; ඔ ච, ඔයන්නද; අ ච, අයන්නද; ඉ ච, ඉයන්නද; උ ච, උයන්නද; ඍ ච, ඍයන්නද; ඎ ච, ඎයන්නද; එ ච, එයන්නද; ඓ ච, ඓයන්නද; ඔ ච, ඔයන්නද; ඖ ච, ඖයන්නද (යන මොවුන්ගේ සමාහාරය;)ඖ, ඖනද; ආඔඉති,(මෙහි පදච්ඡේදයෙහි) "ආ ඔ"යි; ප්‍රෘථක්පදංවා, යනුවේ. වෙන් වෙන් පදය හෝ; නිපාතඃ, නිපාතයි; (එබැවින්) ආකාර නිපාතඃ, ආකාරනිපාතයද; ඔකාරනිපාතඃ, ඔකාර නිපාතයද; එකාක්ෂරශ්ච, එකාක්ෂර නිපාතයද; සන්ධිං නප්‍රාප්නොති, සන්ධියට නොපැමිණේ. "ආ එවං මන්‍යසෙ" යනු "ආ" යන නිපාතය සන්ධි නොවනබවට උදාහරණයි (ඕ මෙසේ සිතන්නෙහි යනු අර්ථයි.) "නො අත්‍ර ස්ථාතව්‍යම්" යනු ඔකාරාන්ත නිපාතයාගේ සන්ධි නොවීමට උදාහරණයි. (මෙහි නොසිටියයුතුයි යනු අර්ථයි.) "අ අපෙහි" යනු "අ" යන එක ස්වරනිපාතයාගේ සන්ධිය නොවීමට උදාහරණයි. (පහනොවෙව, යනු හෝ එම්බල පහවෙවයනු හෝ අර්ථයි) මෙහි "අ" යන්න ප්‍රතිෂෙධාර්ථ හෝ ආක්ෂෙපාර්ථයි.) "ඉ ඉන්ද්‍රං පශ්‍ය" යනු "ඉ" යන නිපාතයාගේ සන්ධිය නොවීමට උදාහරණයි. (විස්මයෙකි, ඉන්ද්‍රයා බලව යනු අර්ථයි. මෙහි ඉයන්න විස්මයාර්ථයි.) "උ උත්තිෂ්ඨ" යනු "උ" යන නිපාතයාගේ සන්ධිය නොවීමට උදාහරණයි. (නිශ්ශ්‍රවකී නැඟිටුව යනු අර්ථයි.)

a. ආග්‍රහණාද්‍යබො න නිෂෙධඃ, තථා චොක්තම්:—

**b. ඊෂදර්ථෙ ක්‍රියායොගෙ මර්‍ය්‍යාදාභිවිධෞ ච යඃ,
එතමාතං ඞිතං විද්‍යාද් වාක්‍යස්මරණයොරඞිත්.**

**c. ඔතානමෙමෙරෙක්ෂයෙ නතවමාමෘතාදෙඤ්ජතොබිලෙඃ,
ආ එවං සම්වෙදසි ආ එවං සමෙච, හරෙඃ.**

ඇතැම් කෙනෙක් මේ සූත්‍රය ව්‍යපදයයි යායනි. එසේ ව්‍යපදයයි ගතහොත් මෙහි යථාර්ථය ගම්‍යමාන නොවෙයි. මෙබඳු සූත්‍රයන්ගේ පදච්ඡේදය වනාහි උදාහරණානුසාරයෙන් කටයුත වේ. "ඖ" යන්නෙහි ස්වර සියල්ලම ඇතුළත්වුවත් "ආ" රූපයෙන් හා "ඔ" රූපයෙන් දෙක දෙක ගතයුතු බැවින් "ආ, ඔ" දෙක වෙන්වශයෙන්ද පද දෙකක් කොට කිය යුතුවේ. එහි "ආ" යන්න වෙනම ගැණීමෙන් "ඖ" යන්නෙහි ඇතුළත් "ආ" යන්න ප්‍රතිෂිද්ධයි. ඔයන්න වෙනම ගැණීමෙන් "ඔ" යන නිපාතය පමණක් නොව ඔකාරාන්ත "නො' අහො" යනාදිය ගම්‍යමාන වේ. මෙසේ ගණුලබත්වන් උදාහරණානු සාරයෙනි. තවද මේ විධියෙහි ප්‍රතිෂිද්ධ ආයන්න නම් ඞිත්වූ "ආඞ්" යන්නයි, ඒ වනාහි අර්ථානුසාරයෙන් දතයුතු වේ, ඒ වණීනාකාරණු පිණිස "ආ ග්‍රහණාත්,, යනාදිය කීහු.

a. ආග්‍රහණාත්, (සූත්‍රයෙහි) ආයන්න ගැණීමෙන්; ආඞඃ, "ආඞ්" යන උපසර්ගයාගේ; න නිෂෙධඃ, ප්‍රතිෂෙධය නොවේ. තථා, එසේහෙයින්; උක්තම, භාෂ්‍යකාරයන් විසින් කියන ලද්දේද වේ. (සන්ධි නොවන්නේ ආයන්නයයි සූත්‍රාකතයි. එබැවින් "ආඞ්" යන්න සම්බන්ධ සන්ධිය අප්‍රතිෂිද්ධයි. "ආ, ආඞ්" යන නිපාතොපසර්ගවය අර්ථවශයෙන් හැඳිනිය යුතුයි. ඒ මේ ශ්ලොකයෙන් ප්‍රකාශිතයි.)

b. ඊෂත්අර්ථ, අල්පාර්ථයෙහිද; ක්‍රියායොගෙ, ක්‍රියාපදයක් හා පූර්වයෙන් යෙදීමෙහිද; මර්‍ය්‍යාදාභිවිධෞ ච, මර්‍ය්‍යාදාර්ථයෙහි හා අභිවිධ්‍යර්ථයෙහිද, නොහොත් හරණලද සීමාවෙහි හා ගත්නා ලද සීමාවෙහිද ව; යඃ, යම් ආයන්නක් වේ නම්; එතං ආතං, මේ ආයන්න; ඞිතං, ඞකාරය ඉත්කොට ඇතියයි, නොහොත් ඞිත්යයි; විද්‍යාත්, දත්තේය; වාක්‍යස්මරණයොඃ, වාක්‍යාර්ථ සමරණාර්ථදක්හි වූයේ; අඞිත්, ඞිත්රහිත වේ.

c. ආ උදකාන්තමෙඃ, මදක් උතුම්වූ; අඛිලෙඃ, සියල්ලන් විසින්; ආ අමෘතාත්, අමෘතය දක්වා; ආ ඉන්ද්‍රාත්, ඉන්ද්‍රය

37. ප්ලුතඃ (ප්ලුතඃ 1, 1;)

a. ප්ලුතඃ සන්ධිං න ප්‍රාප්නෝති. දෙවදත්ත3 එහි, දෙවදත්ත අත්‍ර ගෞරවමසි.

අහෝ, හෙ ආදී ප්‍රශ්න පැහැර; ඕං, අහෝ, ආහෝ; හා ආ ඊක්ෂෙය, නොදන්නා ලැබෙනිය; සම්වෙදනීං, ඉනම්පූදුමස; ආ එවම්, ගහේ මෙහෙයි; හරෙ, විෂ්ණුගුණේ; සද්වම්ඃ, යනපත් වචනය; ආ එවම්, ඔ මෙමෙයි.

මෙහි සූත්‍ර ශ්ලෝකයෙන් නිපාතය ලැබෙන නොලැබෙන තැන්ද මිනිස ශ්ලෝකයෙන් උදාහරණද නිර්දිෂ්ටයි. එහි "ආ+උෂ්ණමෙද්ඃ" යන තන්හි ආ යන්න අල්පාර්ථ බැවින් ඕන් සහිතයි, එබැවින් සන්ධිව "ඔෂ්ණමෙද්ඃ" යනු වේ, එසේම "ආ+ඊෂ්‍යායෙ" යන තන්හි ආ යන්න ක්‍රියායොගාර්ථ බැවින් සන්ධිව "ඒෂ්‍යායෙ" යනු වේ, "ආ+අමිෂනාත්" යන තන්හි ආයන්න මර්යාදාර්ථ බැවින් සන්ධිව "ආමිෂනාත්" යනු වේ. "ආ+ඉක්ෂුහා" යන තන්හි ආයන්න අභිවිධ්‍යර්ථ බැවින් සන්ධිව "එක්ෂුහා" යනු වේ. "ආ එවං සම්වෙදනීඃ" යන තන්හි ආයන්න වාක්‍යාර්ථ බැවින් ඕන්රහිත බැවින් නිපාතවූයේ සන්ධි නොවේ. "ආ එවං සමමෙවා භරෙඃ" යන තන්හි ආ යන්න සමරණාර්ථ බැවින් ඕන්රහිත නිපාතවූයේ සන්ධි නොවේ. මෙහි වාක්‍යාර්ථ ආයන්න නම් - සූත්‍රප්‍රනායක (සූත්‍රයෙහි බලා පසුකල) වාක්‍යාර්ථයාගේ අනනුවෘත්තිද්‍යෝතක ආයන්නයි, වාක්‍යාලඞ්කාර පිණිස යොදන ආයන්නද වාක්‍යාර්ථ ආයන්නයයි ඇතැම් අයගේ මතයි. සමරණාර්ථ ආයන්න නම් - සමෘති විරහිතව තුබූ දෙයක් සිහිපත්වී පසු ඒ සිහිවූ බැව් ඇඟවීම පිණිස යොදන ආයන්නයි, මේ අර්ථයෙහි ආයන්න සන්ධිවූ වොත් යථාර්ථය නොනැඟෙන බැවින් සන්ධි නොවේ. එහි ශබ්දමාත්‍රයෙන් යථාර්ථය නැඟවියයුතු බැවිනි.

37. (ප්ලුතප්‍රකෘතිභාව විධි සූත්‍රයි.) ප්ලුතඃ, ප්ලුතය; (සන්ධි නොවේ.)

a. ප්ලුතඃ, ප්ලුතය; සන්ධිං, සන්ධියට; නප්‍රාප්නෝති, නොපැමිණේ. "දෙවදත්ත3 එහි" යනාදිය උදාහරණයි, (මෙහි දෙවදත්ත" යන්නෙහි තාත්පර්යාර්ථ අකාරය ප්ලුත බැවින් සන්ධිනොවී)

38. දූරාද්ධූතෙ ච වෙඃ ප්ලුතඃ

(දූරාත් 5, 1; ආහ්වානෙ 7, 1; ච 1, 1; වෙඃ 6; 1; ප්ලුතඃ 1, 1;)

a. දූරාද්ධූතෙ ගානෙ රෝදනෙ විචාරෙ ච ගම්‍යමානෙ වෙඃ ප්ලුතො භවති. (දූරාදිකාන්‍ය ව්‍යාකරණාන්තරෙ ඛ්‍යාතෙ ද්‍රෂ්ටව්‍යානි.) "වෙඃ ගමනයොඃ ස්වරෙ සන්ධිර්න වක්තව්‍යඃ" ගෙ අභාවෙන්.

39. සාතෙ සමානො වා.

(සාතෙ 7, 1; සමානඃ 1, 1; වා 1, 1;)

b. සාතෙ පරෙ සමානඃ සන්ධිං න ප්‍රාප්නෝති වා. හිම+සාතුඃ – හිමසීතු – හිමසාතුඃ.

ඉති ප්‍රකෘතිභාවප්‍රක්‍රියා.

38. (පරිභාෂා සූත්‍රයි.) දූරාත්, දුරින්; ආහ්වානෙ ච, ලඟට කැඳවීමෙහිද (ච ශබ්දයෙන් ගානාදියෙහිද;) වෙඃ, විසංඥයට; ප්ලුතඃ, ප්ලුත සංඥා වේ.

a. දූරාත්, දුරසිට; ආහ්වානෙ ච, කැඳවීමත්ද; ගානෙ, ගායනායක්ද; රෝදනෙ, හැඬීමක්ද; විචාරෙ, නානාවිකල්පය සඞ්ඛ්‍යාත විචාරයක්ද; ගම්‍යමානෙ, හැඟෙන කල්හි; වෙඃ, විසඥයට; ප්ලුතඃ භවති, ප්ලුතසංඥා වේ. (දූරාත් ඉති අත්‍ර, "දූරාත්" යන මෙහි; ව්‍යාකරණාන්තරෙ, අන්‍යශබ්දශාස්ත්‍රයෙහි, ඛ්‍යාතෙ ද්‍රෂ්ටව්‍යානි, "හානාහ + ඉති" යනාදියෙහි; සන්ධිඃ ස්‍යාත්, සන්ධි වන්නේය)

දුර සිටින කෙනෙක් ලඟට කැඳවීමේ ව්‍යවහාරකරණ වචනයන්ගේ අන්ත්‍යස්වරයද ප්ලුතයි. එබඳු ප්ලුතය තවත් ස්වරයක් සමඟ සන්ධි නොවේ "හානාහ+ඉති" යනාදී ඇතැම් ශබ්ද "හනාහෙනි" යනාදී වියෙයන් සන්ධි වෙනැයි ඇතැම් අයගේ මතයි.

ස්වරෙ, ස්වරයා පරකල්හි; මෙහෙමෙහෝ, මෙහෙහෙ යන දෙදෙනාගේ; සන්ධිඃ, සන්ධිය; නවක්තව්‍යඃ, නොකියයුතුයි. "මෙ අත ඩවත්" යනු ඊට උදාහරණයි,

39. (ප්‍රතිෂේධවිධි සූත්‍රයි.) සාතෙ, සාතශබ්දය පරකල්හි; සමානඃ, සමානවර්ණය; වා, විකල්පයෙන් (සන්ධි නොවේ)

b. සාතෙ පරෙ, සාතුශබ්දය පරකල්හි; සමානඃ, සමාන වර්ණය; වා, විකල්පයෙන්; සන්ධිං න ප්‍රාප්නෝති, සන්ධියට

a. අථ ව්‍යඤ්ජනකාර්‍ය්‍යමුච්‍යතෙ.

40. චපාං අබෙ ජබාඃ. (චපාඃ 1, 3; අබෙ 7, 1, ජබාඃ 1, 3;)

b. පදාන්ත වර්තමානාශ්චපා ජබා භවන්ති අබෙ පරෙ. ෂට් + අත්‍ර-ෂඩත්‍ර, වාක් + ඊශ, වාගීශ, කකුප් + භෙදී-කකුබ්භෙදී.

නොනැමිණේ. “හිම+ඍතුඃ” යන තන්හි සන්ධිවීමෙන් “හිමර්තුඃ” යනුද, සන්ධි නොවීම “හිම ඍතුඃ” යනුදවේ. ප්‍රකෘතිභාවප්‍රක්‍රියා, ප්‍රකෘතිභාවප්‍රක්‍රියාව; ඉති, මෙතෙකින් සමාප්තයි.

ප්‍රකෘතිභාවප්‍රක්‍රියාවේ ව්‍යාඛ්‍යාවයි.

මෙතෙකින් ස්වරසන්ධිප්‍රක්‍රියාවිවරණය නිමකොට ව්‍යඤ්ජන සන්ධි ප්‍රක්‍රියාවිවරණය කරන්නාහු “අථ ව්‍යඤ්ජනකාර්‍ය්‍යම්” යනාදිය කීහු

a. අථ, ප්‍රකෘතිභාවප්‍රක්‍රියාවට අනතුරුව; ව්‍යඤ්ජනකාර්‍ය්‍යම්, ව්‍යඤ්ජනයන් සම්බන්ධ සන්ධිකාර්‍ය්‍යය; උච්‍යතෙ, කියනු ලැබේ. (පූර්වාපරව සිටි ව්‍යඤ්ජනද්වයක් ගැළපීම ව්‍යඤ්ජන සන්ධියි, ඒ ගැළපීමද ඒ ඒ ව්‍යඤ්ජනයන්ට තුල්‍යවූ ඒ ඒ ආදෙශාගමාදිය වීමෙන් සිඬයි. ඒ මේ වක්‍ෂ්‍යමාණ සූත්‍රොදාහරණානුසාරයෙන් දතයුතුයි.)

40. (ජබප්‍රත්‍යාහාරාදෙශවිධි සූත්‍රයි.) අබෙ, අබප්‍රත්‍යාහාරය පරකල්හි; චපාඃ, (පදාන්තවූ) චපප්‍රත්‍යාහාර වර්ණයෝ; ජබාඃ, ජබ ප්‍රත්‍යාහාරවර්ණයෝ වෙත්.

b. අබෙ පරෙ, අබප්‍රත්‍යාහාරය පරකල්හි; පදාන්ත වර්තමානාඃ, පදාවසානයෙහි පවත්නාවූ; චපාඃ, චපප්‍රත්‍යාහාර වර්ණයෝ; ජබාඃ භවන්ති, ජබප්‍රත්‍යාහාර වර්ණයෝ වෙත් “ෂට් + අත්‍ර” යන තන්හි පදාන්ත ටකාරයට ඩකාරය වීමෙන් “ෂඩත්‍ර” කියාද; “වාක්+ඊශ” යන තන්හි කයන්නට ගයන්න වීමෙන් “වාගීශ” කියාද; “කකුප් + භෙදී” යන තන්හි පයන්නට බයන්න වීමෙන් “කකුබ්භෙදී” කියාද සන්ධි වේ. “අ ඉ උ ඍ ඏ එ ඓ ඔ ඖ හ ය ව ර ල ඤ ණ න ඞ ම ඣ ඪ ධ ඝ භ ජ ඩ ද ග බ” යනු මොවුන්ගෙන් කිසි වර්ණයක් පර කල්හි පදාන්තවූ “චටතකප” යන මොවුන්ට පිළිවෙළින් “ජඩදගබ” යන මොහු වෙත්.)

41. ඤමෙ ඤමා වා. (ඤමෙ 7, 1; ඤමාඃ 1, 3; වා 1, 1;)

a. පදාන්ත වර්තමානාශ්චපාඃ ඤමෙ පරෙ ඤමා වා භවන්ති. වාක් + මාත්‍රම්-වාඞ්මාත්‍රම්, වාගමාත්‍රම්; ෂට් + මම-ෂණ්මම-ෂඩ් මම. (“මයටි නිත්‍යං වාච්‍යම්” චිත් + මයම්-චින්මයම්; ප්‍රත්‍යයෙ ඤමො නිත්‍යමිති කෙචිත්, තෙන වාඞ්මාත්‍රමිත්‍යෙකමෙව රූපං ස්‍යාත්.)

42. චපාච්ඡඃ ශඃ. (චපාත් 5, 1; ඡඃ 1; 1; ශඃ 6, 1;)

---

41. (ඤමප්‍රත්‍යාහාරාදෙශවිධිසූත්‍රයි.) ඤමෙ, ඤමප්‍රත්‍යාහාරය පරකල්හි; වා, විකල්පයෙන්; ඤමාඃ, (පදාන්තවූ චප ප්‍රත්‍යාහාර වර්ණයන්ට) ඤමප්‍රත්‍යාහාර වර්ණයෝ වෙත්.

a. ඤමෙ පරෙ, ඤමප්‍රත්‍යාහාරය පරකල්හි; පදාන්ත, පදාවසානයෙහි; වර්තමානාඃ, පවත්නාවූ; චපාඃ, චපප්‍රත්‍යාහාර වර්ණයෝ; වා, විකල්පයෙන්; ඤමාඃ, ඤමප්‍රත්‍යාහාර වර්ණයෝ; භවන්ති, වෙත්. “වාක්+මාත්‍රම” යන තන්හි (සංහිතාකාර්‍ය්‍යයෙන්) “වාඞ් මාත්‍රම්” යනුද; (විකල්ප පක්‍ෂයෙහි පූර්වසූත්‍රයෙන් කාර්‍ය්‍යයෙන්) “වාග් මාත්‍රම්” යනුද වේ. එසේම “ෂට් + මම” යන තන්හි “ෂණ්මම” යනුද විකල්ප පක්‍ෂයෙහි “ෂඩ්මම” යනුද වේ. මයටි, “මයට්” ප්‍රත්‍යය පර කල්හි, හෙවත් “මයට්” ප්‍රත්‍යයෙහි මකාරය පරකල්හි; නිත්‍යම්, (චපප්‍රත්‍යාහාරයට ඤමප්‍රත්‍යාහාරවීම) නිත්‍යයයි; වාච්‍යම්, කියයුතුයි. එබැවින් “චිත්+මයම්” යන විසන්ධියෙහි නිත්‍යයෙන් “චින්මයම්” යනු වේ. ප්‍රත්‍යයෙ, ප්‍රත්‍යය පරකල්හි; නිත්‍යම්; නිත්‍යයෙන්; ඤමඃ ඉති, (චපප්‍රත්‍යාහාරයට) ඤමප්‍රත්‍යාහාරය වේයයි; කෙචිත්, සමහරු කියත්; තෙන, එහෙයින්; වාඞ්මාත්‍රං ඉති, “වාඞ්මාත්‍රම්” යයි; එකං එව රූපං, එකම රූපයක්; ස්‍යාත්, වන්නේය.

මෙහි “මයට්” ප්‍රත්‍යය පරකල්හි පමණක් පූර්වොක්ත කාර්‍ය්‍යය නිත්‍යයයි ඇතැම් අයගේ මතයි, අවශෙෂයෙන් සෙසු ප්‍රත්‍යයෙක්හි වුවත් ප්‍රත්‍යයක් පිළිබඳ ඤම ප්‍රත්‍යාහාර වර්ණයක් පරයන්හි මේ කාර්‍ය්‍යය නිත්‍යයයි බොහෝ ආචාර්‍ය්‍යවරුන්ගේ මතයි. එහෙයින් ‘වාක් + මාත්‍රම්” යන තන්හිද මාත්‍රට්” ප්‍රත්‍යය පර බැවින් රූපද්වයක් නොව “වාඞ්මාත්‍රම්”යි එකරූපයක්ම වන බවද කීහු.

42. (ඡකාරාදෙශවිධිසූත්‍රයි.) චපාත්, චපප්‍රත්‍යාහාරය කෙරෙන් පරවූ; ශඃ, තාලුජ ශකාරයට; ඡඃ, (අබප්‍රත්‍යාහාරය පරකල්හි විකල්පයෙන්) ඡකාරාදෙශ වේ.

a. චපාදුත්තරස්‍ය ශකාරස්‍ය ඡෝ වා භවති අමෙ පරෙ. වාක් + ශූරඃ - වාක්ඡූරඃ - වාක්ශූරඃ.

43. හෝ ඣභාඃ (ෂඃ 6, 7; ඣභාඃ ;, 3;)

a. චපාදුත්තරස්‍ය හකාරස්‍ය ඣභා වා භවන්ති. නනු කස්‍ය හකාරස්‍ය පඤ්චඣභාඃ ප්‍රාප්තාඃ? කෙන ක්‍රමෙණ භවන්ති? අත්‍රොච්‍යතෙ - යද්වර්ගීයශ්චපස්තද්වර්ගීයශ්චතුර්ථො භවති. තත් + හවිඃ - තද්ධවිඃ - තද්හවිඃ; වාක් + හරිඃ - වාග්ඝරිඃ - වාග්හරිඃ, කකුප් + හාසඃ - කකුබ්භාසඃ - කකුබ්හාසඃ.

---

a අමෙ පරෙ, අම් ප්‍රත්‍යාහාරය පරකල්හි; චපාත් උත්තරස්‍ය, චප ප්‍රත්‍යාහාරයෙන් මත්තෙහිවූ; ශකාරස්‍ය, තාලුජශකාරයට; වා, විකල්පයෙන්; ඡඃ භවති, ඡකාරාදෙශ වේ. "වාක් + ශූරඃ" යන තන්හි "වාක්ඡූරඃ" යනුද විකල්ප පක්‍ෂයෙහි "වාක්ශූරඃ" යනුද වේ. (මේ විධිය වීමට එතැනැහි ශකාරයෙන් පරව අම් ප්‍රත්‍යාහාර වර්ණයක් තිබියයුතුයි. "වාක්ශූරඃ" යන තන්හි ශයන්තෙන් පරවූයේ අම්ප්‍රත්‍යාහාරාත්මක ඌකාරයයි.)

43. (ඣභප්‍රත්‍යාහාරාදෙශවිධිසූත්‍රයි.) හඃ, (චපප්‍රත්‍යාහාරයෙන් පරවූ) හකාරයට; ඣභාඃ, ඣභ ප්‍රත්‍යාහාරවර්ණයෝ විකල්පයෙන් වෙත්.

b. චපාත් උත්තරස්‍ය, චපප්‍රත්‍යාහාරය කෙරෙන් පරවූ; හකාරස්‍ය, හකාරයට; ඣභාඃ, ඣභප්‍රත්‍යාහාරවර්ණයෝ; වා, විකල්පයෙන්; භවන්ති, වෙත්. එකස්‍ය හකාරස්‍ය, එක හකාරයට; පඤ්ච ඣභාඃ, ඣභ ප්‍රත්‍යාහාරයෙහි වර්ණ පස; නනු ප්‍රාප්තාඃ, නොපැමිණෙත්ද?; අත්‍ර, මේ කාරණයෙහිලා; උච්‍යතෙ, කියනු ලැබේ. (එනම්) චපඃ, චපප්‍රත්‍යාහාර වර්ණය; යද්වර්ගීයඃ, යම් වර්ගයකට පැමිණියේ නම්; තද්වර්ගීයඃ, ඒ වර්ගයට පැමිණියාවූ; චතුර්ථඃ භවති, සතරවෙනි වර්ණය වේ. "තත්+හවිඃ" යන තන්හි "තද්ධවිඃ" යනුද විකල්පයෙන් "තද්හවිඃ" යනුද; "වාක්+හරිඃ" යන තන්හි "වාග්ඝරිඃ" යනුද විකල්පයෙන් "වාග්හරිඃ" යනුද; "කකුප්+හාසඃ" යන තන්හි "කකුබ්භාසඃ" යනුද විකල්පයෙන් "කකුබ්හාසඃ" යනුද වේ.

මෙහි චපප්‍රත්‍යාහාරය කෙරෙන් පරවූ හකාරයට ඣභ ප්‍රත්‍යාහාරයෙහි අකුරු පස වෙත්යයි කීකල හුදකලා හකාරයට ඒ වර්ණ පස කෙසේ වෙත්දැයි ප්‍රශ්නකොට ඒ ප්‍රශ්නය

44. ස්තෝඃ ශ්චුභිඃ ශ්චුඃ. (ස්තොඃ 6, 1; ශ්චුභිඃ 3, 3; ශ්චුඃ 1, 1;)

a. ස්තොඃ සකාරස්‍ය තවර්ගීයස්‍ය ච ශකාරෙණ චවර්ගෙණ ච යොගෙ ශකාරචවර්ගෞ යථාසංඛ්‍යං භවතඃ. (ස් ච තුශ්චෙත්‍යනයොඃ, තස්‍ය ස්තොඃ, සමාහාරෙ ද්වන්ද්වෙ ඒකත්වම්. "ජඣය්‍ය වත් සූත්‍රාණි" ති වචනාන්නපුංසකස්‍ය පුංස්ත්වම්. ශ්ච චවශ්ච=ශ්චවස්තෙඃ ශ්චුභිඃ, ශ්චුශබ්ද චවර්ගස්ථවර්ණාපෙක්‍ෂයා බහුවචනම්.)

කරන්නාහු "යද්වර්ගීයඃ" යනාදිය කීහු. එහි අදහස නම් - පූර්ව නිමිත්තවූ චපප්‍රත්‍යාහාරවර්ණය යම් වර්ගයෙක්හි නම් ඒ වර්ගයෙහි සිවුවෙනි වර්ණය හකාරයට වේය යනුයි, එනම් චකාරය කෙරෙන් පර හකාරයට ඣකාරයද, ටකාරය කෙරෙන් පර හකාරයට ඪකාරයද; යනාදි වශයෙනි, මෙසේ වන්නේ නිමිත්තාදෙශ දෙදෙනාගේ සමානත්වයෙනි. "තත්+හවිඃ" යන තන්හි මේ සූත්‍රයෙන් හකාරයට ධකාරය හා තකාරයට "චපා අමෙ ජබාඃ" යන සූත්‍රයෙන් දකාරයද වීමෙන් "තද්ධවිඃ" යි සිද්ධයි. සෙස්සද මෙමැයි.

44. (ශ්චු ආදෙශවිධිසූත්‍රයි.) ශ්චුභිඃ, තාලව්‍යශකාර චවර්ගීයන් සමග යොගයෙහි; ස්තොඃ, දන්තජසකාරයට හා තවර්ගීයට; ශ්චුඃ තාලව්‍යශකාරය හා චවර්ගීය වේ.

a. ස්තොඃ, "ස්තොඃ"යයි සේයි; සකාරස්‍ය, දන්තජසකාරයටද; තවර්ගීයස්‍ය ච, තවර්ගීයටද; ශකාරෙණ, තාලුජශකාරය සමගද; චවර්ගීණ ච, චවර්ගීය සමගද; යොගෙ, යෙදීමෙහි; ශකාරචවර්ගෞ, තාලුජශකාරය චවර්ගීය යන දෙක; යථාසංඛ්‍යං, පිළිවෙළින්; භවතඃ, වෙත්. (ස් ච, "ස්" යන්නද; තුශ්ච, තුශබ්දයද හෙවත් තවර්ගීයද; ස්තුඃ, ස්තු නම් වේ, තස්‍ය ස්තොඃ, ඒ ස්තු හටයි, හෙවත් ඒ දන්තජසකාරයට හා තවර්ගීයටයි. සමාහාරෙ ද්වන්ද්වෙ, සමාහාරද්වන්ද්ව සමාසයෙහි; ඒකත්වං, ඒකවචන බවයි. සූත්‍රාණි, සූත්‍රයෝ; ජඣද්වත් ඉති, වෙදය මෙන් වෙත්යයි; වචනාත්, කීමෙන්; නපුංසකස්‍ය, නපුංසකලිඞ්ගයාගේ; පුංස්ත්වම්, පුංලිඞ්ග බවයි. ශ් ච, "ශ්" යන්නද, චවශ්ච, චවර්ගාක්‍ෂරයෝද; ශ්චවඃ, ශ්චවඃ යනු වේ. තෛඃශ්චුභිඃ, ඒ තාලුජශකාර චවර්ගීයන් සමග යොගයෙහි ශ්‍රාවණීය වේ. ශ්චුශබ්ද, ශ්චු යන සංඥාශබ්දයෙහි; චවර්ගීයස්ථවර්ණාපෙක්‍ෂයා, චවර්ගයෙහි සිටි වර්ණයන්ගේ අපෙක්‍ෂාවෙන්; බහුවචනම්, ("ශ්චවඃ"යි) බහුවචන වී.

a. ආකාශො සප්තමීමෙතාං තෘතීයාමකරොදිලා,
තතශ්චුභිඃ ශ්චුඃ පූර්වේණ සන්නිපාතඃ පරේණ වා.

b. කස් + චරති-කශ්චරති, කස් + ශූරඃ-කශ්ශූරඃ, තත් + චිත්‍රම්-තච්චිත්‍රම්, තත් + ශාස්ත්‍රම්-තච්ඡාස්ත්‍රම්.

දන්තජ සකාරය හා තවර්ගය තාලුජශකාරය සමග හෝ චවර්ගය සමග පූර්වභාගයෙහි හෝ පරභාගයෙහි සංයෝග වේ නම් ඒ දන්තජ සකාරයට තාලුජශකාරයද, එසේම තවර්ගය චවර්ගය සමග පූර්වභාග පරභාග දෙක්හි හා තාලුජ ශකාරය සමග පූර්වභාගයෙහිද සංයෝග වේ නම් තවර්ගයට චවර්ගයද ආදේශ වේ. මේ සූත්‍රයෙහි ක්‍රමභාවවිඥාපනය පිණිස "ශ්චුභිඃ"යි බහුවචන කරණලදී. එහෙත් වෘත්තියෙහි "යථාසඞ්ඛ්‍යන"යි යොදනලදී. ඒ සකාරයට ශකාරයත් තවර්ගයට චවර්ගයත් වීමේ පිළිවෙළ දැක්වීම ප්‍රයෝජනයි. මෙසේ පූර්වභාග අපරභාග දෙක්හිම සංයෝග වුවත් විශේෂ ආදේශ වන බැව් දක්වනු පිණිස "ආකාශො" යනාදි ශ්ලෝකය ප්‍රකාශකළෝ.

a. ඉලා, සරස්වතී තොමෝ; එතාං, මේ ("ශ්චුභිඃ" යන්නෙහි) විභක්තිය; සප්තමීං අකාශො, සප්තමිය නොකොට; තෘතීයාං අකරොත්, තෘතීයාව කළාය; තතඃ, එහෙයින්; ශ්චුභිඃ, තාලුජ ශකාර චවර්ගයන් සමග යොගයෙන්; පූර්වේණ, පූර්වභාගයෙහි හෝ; පරේණවා, පරභාගයෙහි හෝ සිටි (සිටි සකාරයට හා තවර්ගයට ආදේශවූ) ශ්චුඃ, ශකාරයාත් හා චවර්ගයාත්; සන්නිපාතඃ, එකතුවීම වේ.

මේ සූත්‍රයෙහි "ශ්චුභිඃ" යන්න "ශ්චුෂු" කියා සප්තමිය කෙළේනම් තාලුජශකාර චවර්ගයන් පරකල්හියයි අර්ථය ගත යුතු වේ. එකල මේ කාර්ය්‍යය වීම තාලුජ ශකාර චවර්ගයන්ගෙන් පූර්වයෙහි සිටි සකාර තවර්ගයන්ට පමණක් වේ. එබැවින් ඒ වළක්වා උභයපාර්ශ්වයෙහිම කාර්ය්‍යය වන බැව් දැක්වීම පිණිස "ශ්චුභිඃ"යි තෘතීයාව කළා වේ.

b. "කශ්+චරති" යන තන්හි චකාර යොගයෙන් සකාරයට ශකාරව "කශ්චරති" යනුද; "කස් + ශූරඃ" යන තන්හි ශකාර යොගයෙන් සකාරයට ශකාරව "කශ්ශූරඃ" යනුද; "තත් + චිත්‍රම්" යන තන්හි චකාර යොගයෙන් තකාරයට චකාරව "තච්චිත්‍රම්" යනුද, "තත් + ශාස්ත්‍රම්" යන තන්හි ශකාර යොගයෙන් තකාරයට චකාරය හා ඉන් පරවූ ශකාරයට "ච්පාචඡඃ ශඃ" යන සූත්‍රයෙන් ඡකාරයද වීමෙන් "තච්ඡාස්ත්‍රම්" යනුද වේ.

45. න ශාත්. (න 1, 1; ශාත් 5, 1;)

a. **ශකාරාදුත්තරස්‍ය තවර්ගස්‍ය චුත්වං න භවති. විශ්නඃ, ප්‍රශ්නඃ.**

46. ෂ්ටුභිඃ ෂ්ටුඃ. (ෂ්ටුභිඃ 3, 3; ෂ්ටුඃ 1, 1;)

b. **සෙතාඃ සකාරස්‍ය තවර්ගස්‍ය ච ෂකාරෙණ ටවර්ගේණ ච යොගෙ ෂකාරටවර්ගෞ යථාසඞ්ඛ්‍යන භවතඃ. කස් + ෂණ්ඩඃ-කෂ්ෂණ්ඩඃ, කස් + ටීකතෙ - කෂ්ටීකතෙ, තත් + ටීකතෙ-තට්ටීකතෙ, තත් + ටීකා - තට්ටීකා.** *

---

45. (චවර්ගාදෙශප්‍රතිෂෙධවිධිසූත්‍රයි.) ශාත්, තාලුජශකාරයා කෙරෙන් (පරවූ තවර්ගයට;) න, චවර්ගාදෙශ නොවේ.

a. ශකාරාත්, තාලුජ ශකාරයා කෙරෙන්; උත්තරස්‍ය, මත්තෙහි වූ; තවර්ගස්‍ය, තවර්ගයට; චුත්වං, චවර්ගභාවය; න භවති, නොවේ. "විශ්නඃ, ප්‍රශ්නඃ" යනු ඊට උදාහරණයි, (මෙහි තවර්ගීය වූ නකාරය ශකාරය හා සංයොගවූයේද ශකාරයෙන් පර බැවින් චවර්ගීය ඤකාරය නොවී.)

46. (ෂකාරටවර්ගාදෙශවිධිසූත්‍රයි.) ෂ්ටුභිඃ, මූර්ධන්‍ය ෂකාර ටවර්ගයන් හා යොගයෙහි; ෂ්ටුඃ, දන්තජසකාරයට හා තවර්ගයට මූර්ධන්‍ය ෂකාරය හා ටවර්ගය වේ.

b. සෙතාඃ, "සෙතාඃ" යයි සේයි; සකාරස්‍ය, දන්තජසකාරයටද; තවර්ගස්‍ය ච, තවර්ගයටද; ෂකාරෙණ, මූර්ධන්‍යෂකාරය සමගද; ටවර්ගේණ ච, ටවර්ගය සමගද; යොගෙ, යොගයක් ඇතිකල්හි; ෂකාරටවර්ගෞ, මූර්ධන්‍යෂකාරය ටවර්ගය යන දෙක; යථාසඞ්ඛ්‍යන, පිළිවෙළින්; භවතඃ, වෙත්. "කස් + ෂණ්ඩඃ" යන තන්හි "කෂ්ෂණ්ඩඃ" යනුද, "කස් + ටීකතෙ" යන තන්හි "කෂ්ටීකතෙ" යනුද, "තත් + ටීකතෙ" යන තන්හි "තට්ටීකතෙ" යනුද, "තත් + ටීකා" යන තන්හි "තට්ටීකා" යනුද වේ.

මූර්ධන්‍යෂකාරය සමග හෝ ටවර්ගය සමග දන්තජසකාරය පූර්වභාගයෙන් හෝ පරභාගයෙන් යෙදීමෙහි දන්තජසකාරයට මූර්ධන්‍යෂකාරයද, මූර්ධන්‍යෂකාරය සමග පරභාගයෙන් හා

---

* මෙහි ඇතැම් පොත්හි "ෂ්ටුභිරති බහුවචනාත් සර්වත් ෂකාර යොගං විනාපි ෂ්ටුත්වම්, අගතිෂෙටාමිඃ" යන පාඨය දක්නාලැබේ. ඒ නොමැනවි. "අගතිෂෙටාමිඃ" යනාදිය "අනන්‍යාදෙඃ ෂෙසාමාදීනාං ෂත්වම්" යන සමාස නියමයෙන් සිද්ධ නෙයිනි.

47. තොර්ලි ලඃ. (තොඃ 6, 1; ලි 7, 1; ලඃ 1, 1;)

a. තවර්ගස්‍ය ලකාරෙ පරෙ ලකාරො භවති. තත්+ලුනාති- තල්ලුනාති, භවාන් + ලිඛති - භවාँල්ලිඛති.

b. අන්තඃස්ථා ද්විප්‍රභෙදාඃ - රේඵවර්ජිතා යවලාඃ සානුනාසිකා නිරනුනාසිකාශ්ච, තත්‍ර සානුනාසිකා එව නකාරස්‍ය ලකාරෙ භවති.

ටවර්ගය සමග පූර්වභාගයෙන් හෝ පරභාගයෙන් යෙදීමෙහි තවර්ගයට ටවර්ගයද වේ. මේ සූත්‍රද්වයෙහි "ශ්චුභිඃ, ෂ්ටුභිඃ" යන දෙතන්හි බහුවචනය යොගක්‍රමාභාවය ප්‍රකාශකිරීම පිණිසයි. සූත්‍රයන්හි ආදෙශාදෙශිනිමිත්තයන්ගේ එකත්වාදි වශයෙන් සම්බන්ධය ඇති තන්හි ඒ ආදෙශයන්ගේ පරිපාටිය ලැබේ. මෙහි තත්සම්බන්ධය නැති බැවින් ඒ පරිපාටියද නොලැබේ. මෙහි වනාහි එකවචනයෙන් යෙදූ "ස්තොඃ, ශ්චුඃ, ෂ්ටුඃ" යන මොවුන්ගේ තත්පරිපාටිය ලැබේ, එනම්-සකාරයට ශකාරය හා තවර්ගයට චවර්ගයද, සකාරයට ෂකාරය හා තවර්ගයට ටවර්ගයද වීමයි.

47. (ලකාරාදෙශවිධිසූත්‍රයි.) ලි, ලකාරය පරකල්හි; තොඃ, තවර්ගයට; ලඃ, ලකාරාදෙශ වේ.

a. ලකාරෙ පරෙ, ලකාරය පරකල්හි; තවර්ගස්‍ය, තවර්ගයට; ලකාරඃ භවති, ලකාරයෙක් වේ. "තත් + ලුනාති" යන තන්හි තකාරයට ලකාරව "තල්ලුනාති" යනුද, "භවාන් + ලිඛති" යන තන්හි නකාරයට සානුනාසික ලකාරව "භවාල්ලිඛති" යනුද වේ. (මෙහි තවර්ගයට නියමිත ලකාරාදෙශයාගේ විභෙදයක් දක්වන්නාහු "අන්තඃස්ථාඃ" යනාදිය කීහු.)

b. අන්තඃස්ථාඃ, (රකාරවර්ජිත) අන්තඃස්ථාක්ෂරයෝ; ද්විප්‍රභෙදාඃ, ප්‍රභෙද දෙකක් ඇත්තෝ වෙත්. (එනම්)-රේඵවර්ජිතාඃ, රකාරය තොරකොට ඇත්තාවූ; යවලාඃ, "ය ව ල" යන අකුරු; සානුනාසිකාඃ, සානුනාසිකවූවෝද; නිරනුනාසිකාශ්ච, නිරනුනාසිකවූවෝද වෙත්. තත්‍ර, ඔවුන් අතුරෙන්; සානුනාසිකාඃ එව, අනුනාසිකසහිතවූම; ලකාරඃ, ලකාරය; නකාරස්‍ය, (සානුනාසික) නකාරයට; භවති, වේ.

"යවල" යන අකුරුතුණ සානුනාසික නිරනුනාසික යන විභෙදයෙන් පවතිත්, ඒ විභෙදයෙන් පවත්නවුන්ගේ ආදෙශ විධිය වනාහි "ස්ථානෙන්තරතමඃ" යන පාණිනීය සූත්‍රානුසාර

48. න ෂි. (න 1, 1; ෂි 7, 1;)

a. ෂකාරෙ පරෙ තවර්ගස්‍ය මූර්ධන්‍යං නභවති. භවාන් + ෂණ්ඨඃ භවාන්ෂණ්ඨඃ.

49 ටොරන්ත්‍යාත්. (ටොඃ 5, 1; අන්ත්‍යාත් 5, 1;)

b. පදාන්තෙ වර්තමානාට්ටවර්ගාත්පරස්‍ය සෙතොඃ ෂ්ටුත්වං න භවති. ෂට් + නරඃ - ෂණ්නරඃ, ෂට් + සිදන්ති - ෂට්සිදන්ති.

50 නඃ සක් ඡතෙ. (නඃ 6. 1; සක් 1, 1; ඡතෙ 7, 1;)

ගෙන් ප්‍රසඞ්ගප්‍රාප්තිය ඇති තන්හි ස්ථානප්‍රයත්න වශයෙන් සදෘශතම වූයේම වේ. එබැවින් මෙහි අනුනාසික නයන් නට අනුනාසික ලයන්න වේ. "භවාන් + ලිඛති" යන තන්හි ලකාරය පරනිමිත්තකොට අනුනාසික නකාරයට ලකාරය සානුනාසිකව වීමෙන් "භවාල්ලිඛති" යනු සිඬයි.

48 (ටවර්ගප්‍රතිෂෙධවිධිසූත්‍රයි.) ෂි, මූර්ධන්‍ය ෂකාරය පරකල්හි; න, (තවර්ගයට ටවර්ගය) නොවේ.

a. ෂකාරෙ පරෙ, ෂකාරය පරකල්හි; තවර්ගස්‍ය, තවර්ගයට; මූර්ධන්‍යං, ටවර්ගභාවය; නභවති, නොවේ. "භවාන්ෂණ්ඨඃ" යනු ඊට උදාහරණය. (මෙහි මූර්ධන්‍ය ෂකාරය පරබැවින් තවර්ගීය නකාරයට ටවර්ගීය ණකාරය නොවී.)

49. (ෂකාර ටවර්ග ප්‍රතිෂෙධවිධිසූත්‍රයි.) අන්ත්‍යාත්, පදාන්තයෙහි වූ; ටොඃ, ටවර්ගයා කෙරෙන් පරවූ (දන්තජසකාරයට හා තවර්ගයට මූර්ධන්‍යෂකාරය හා ටවර්ගය නොවේ.)

b. පදාන්තෙ වර්තමානාත්, පදකෙළවර පවත්නාවූ; ටවර්ගාත් පරස්‍ය, ටවර්ගයා කෙරෙන් පරවූ; සෙතොඃ, සකාරයට හා තවර්ගයට; ෂ්ටුත්වම්, ෂකාරත්වය හා ටවර්ගත්වය; න භවති, නොවේ. "ෂට් + නරඃ" යන තන්හි "ෂණ්නරඃ" යනුද, "ෂට්+සිදන්ති" යන තන්හි "ෂට්සිදන්ති" යනුද මීට උදාහරණයි. ("ෂට් + නරඃ" යන තන්හි ටකාරය පදාන්ත බැවින් ඉන් පරවූ නකාරයට මූර්ධන්‍ය ණකාරය නොව "ඤමෙ ඤමා වා" සූත්‍රයෙන් ටකාරයට ණකාරව "ෂණ්නරඃ" යි සිඬයි, "ෂට්සිදන්ති" යන තන්හි පදාන්ත ටකාරයා කෙරෙන් පර බැවින් සකාරයට ෂකාරය නොවී. මෙහි අනුවර්තිත වාශබ්දයාගේ ව්‍යවස්ථා වාචිත්වයෙන් "ෂණ්ණවතිඃ, ෂණ්ණගර්‍ය්‍යඃ" යන තන්හි මේ විධිය ප්‍රතිෂිඬ නොවේ.)

50 (සක්ආගමවිධිසූත්‍රයි.) ඡෙ, ඡතප්‍රත්‍යාහාරය පරකල්හි; නඃ, නකාරාන්ත පදයට; සක් ආගම වේ.

a. **නාන්තස්ස පදස්ස ඡතෙ පරෙ සගාගමො භවති.**

b. **"ටිත්කිතාවාද්‍යන්තයොර්වක්තව්‍යෞ" ටිත්වාදෞ, කිත්වාදන්තෙ. රාජන් + චිත්‍රම් - රාජංශ්චිත්‍රම්, භවාන් + තනොති - භවාංස්තනොති.**

51. ශෙ චගවා. [ශෙ 7, 1 චක් 1, 1; වා 1, 1;]

a. ඡතෙ පරෙ, ඡතප්‍රත්‍යාහාරය පරකල්හි; නාන්තස්සපදස්ස, නකාරාන්ත පදයට; සගාගමඃ භවති, සක් ආගම වේ.

මේ සූත්‍රයෙන් මේ නියමිත කාර්‍ය්‍යය මුග්ධබොධයෙහි මීට විශෙෂත්වයෙන් නියමිත වේ. එනම්—පරන්මිතිවූ ඡතප්‍රත්‍යාහාරය කෙරෙන් අම් ප්‍රත්‍යාහාරයේ අකුරක්ද තිබියයුතු බව හා "ප්‍රශාම්" ශබ්දය සම්බන්ධව මේ කාර්‍ය්‍යය නොවන බවයි. එහි "සන් + ත්සරුඃ" යන තන්හි ඡතප්‍රත්‍යාහාරාත්මක තකාරය පරවූවත් ඉන් පරව "අම්" ප්‍රත්‍යාහාරය නැති බැවින් මේ විධිය නොවේයයිද "ප්‍රශාන්තනොති" යන තන්හි "ප්‍රශාම්" ශබ්දය බැවින් නොවේයයිද උදාහරණ කරනලදී. පාණිනීයාදියෙහිද එසේයි.

b. ටිත්කිතෞ, ටයන්න ඉත්කොට ඇත්ත හා කයන්න ඉත්කොට ඇත්තය යන දෙක; ආද්‍යන්තයොඃ, ආදී අන්ත දෙක්හි; වක්තව්‍යෞ කියයුතුයි. ටිත්වාත්, ටකාරය ඉත් කොට ඇති බැවින්; ආදෞ, ආදියෙහිද; කිත්වාත්, කයන්න ඉත්කොට ඇති බැවින්; අන්තෙ, අන්තයෙහිද වේ. "රාජන්+ චිත්‍රම්" යන තන්හි "රාජංශ්චිත්‍රම්" යනුද, "භවාන් + තනොති" යන තන්හි "භවාංස්තනොති" යනුද වේ.

ටයන්න ඉත්කොට ඇත්තක් යමකට වේයයි කීවහොත් ඒ ඔහුගේ ආදියෙහිද, කයන්න ඉත්කොට ඇත්තක් නම් ඔහුගේ අන්තයෙහිද වේ. මේ දෙකම ආගමවිධි වේ. මෙහි පූර්වෝක්ත "සක්" යන්නෙහි අයන්න හා කයන්නද ඉත් අකුරුයි. අයන්න උච්චාරණය පිණිසද කයන්න ස්ථාන නියමය පිණිසද යොජිතයි. "රාජන්+චිත්‍රම්" යන තන්හි නකාරාන්තයෙහි 'ස්' යන්න හා නකාරයට "නශ්චාපදාන්තස්‍ය ඣලි" යන සූත්‍රයෙන් අනුස්වාරයද, පසුව චකාර සංයොගයෙහි සකාරයට ශකාරයද වීමෙන් "රාජංශ්චිත්‍රම්"යි සිද්ධයි.

51. (චගාගමවිධිසූත්‍රයි.) ශෙ, තාලව්‍ය ශකාරය පරකල්හි; වා, විකල්පයෙන්; චක්,(නකාරාන්තපදය සම්බන්ධව) චක් ආගම වේ.

a. **නාන්තස්ස පදස්ස ශෙ පරෙ වා චගාගමො භවති. භවාන් + ශූරඃ - භවාඤ්ඡූරඃ - භවාඤ්චඡූරඃ, භවාඤ්චශූරඃ, භවාඤ් ශූරඃ.**

52. ඞණනා හ්‍රස්වාද්ද්විඃ ස්වරෙ.

(ඞණනාඃ 1, 3; හ්‍රස්වාත් 5, 1; ද්විඃ 1, 1; ස්වරෙ 7, 1;)

b. **ඞකාරණකාරනකාරා හ්‍රස්වාදුත්තරා ද්විර්භවන්ති ස්වරෙ පරෙ පදාන්තෙ. ප්‍රත්‍යඞ් + ඉදම් - ප්‍රත්‍යඞ්ඞිදම්, සුගණ් + ඉහ - සුගණ්ණිහ, රාජන් + ඉහ - රාජන්නිහ.**

a. ශෙ පරෙ, තාලව්‍ය ශකාරය පරකල්හි; නාන්තස්ස පදස්ස, නකාරාන්තපදයට; වා, විකල්පයෙන්; චගාගමඃ භවති, චක් ආගම වේ. "භවාන් + ශූරඃ" යන විසන්ධියෙහි 'භවාඤ්ඡූරඃ' කියාද; "භවාඤ්චඡූරඃ" කියාද; "භවාඤ්චශූරඃ" කියාද "භවාඤ් ශූරඃ" කියාද සන්ධි වේ.

මෙහි "භවාන් + ශ් + ඌරඃ"යි විච්ඡෙද කොට පක්ෂවශයෙන්හි නකාරාන්තයෙහි "ච්" යන්න හා ඉන් පරවූ "ශ්" යන්නට "ශශ්ඡොඃටි" යන සූත්‍රයෙන් ඡකාරයද චකාර සංයොගයෙහි නකාරයට ඤකාරයද කොට පසුව පක්ෂයක්හි එක වර්ගීය වර්ණද්වයෙන් මධ්‍යවර්ණයට ලොප් කිරීමෙන් හා පක්ෂයක්හි ලොප් නොකිරීමෙන්ද "භවාඤ්ඡූරඃ, භවාඤ්චඡූරඃ"යි සිද්ධවෙයි. "භවාඤ්චශූරඃ" යනු "ශශ්ඡොඃටි" යන සූත්‍රයාගේ විකල්පත්වයෙන් ශකාරයට ඡකාරය නුවූතැනි. "භවාඤ්ශූරඃ" යනු මේ සූත්‍රයේ විකල්පත්වයෙන් "චක්" ආගම නූවූතැනි. මෙහිද ශකාර සංයොගත්වයෙන් නකාරයට ඤකාරය වී.

52. (ද්විත්වවිධිසූත්‍රයි.) ස්වරෙ, ස්වරය පරකල්හි; හ්‍රස්වාත්, හ්‍රස්වය කෙරෙන් පරවූ; ඞණනාඃ, (පදාන්තවූ) ඞකාර ණකාර නකාරයෝ; ද්විඃ, ද්විරුක්ත වෙත්.

b. ස්වරෙ පරෙ, ස්වරය පරකල්හි; පදාන්තෙ, පදාන්තයෙහිවූ; ඞකාරණකාරනකාරාඃ, ඞකාර ණකාර නකාරයෝ; හ්‍රස්වාත් උත්තරාඃ, හ්‍රස්වය කෙරෙන් පරවූවෝ; ද්විර්භවන්ති, ද්විරුක්ත වෙත්. "ප්‍රත්‍යඞ් + ඉදම්" යන තන්හි ඞකාරද්විත්වයෙන් "ප්‍රත්‍යඞ්ඞිදම්" යනුද, "සුගණ් + ඉහ" යන තන්හි ණකාරද්විත්වයෙන් "සුගණ්ණිහ" යනුද, "රාජන් + ඉහ" යන තන්හි නකාරද්විත්වයෙන් "රාජන්නිහ" යනුද වේ.

53. ඡඃ. (ඡඃ 1, 1;)

a. හ්‍රස්වාදුත්තරස්‍ය ඡකාරස්‍ය චිර්භවති.

54. ඣසෙ චපා ඣසානාම්.

(ඣසෙ 7, 1; චපාඃ 1, 3; ඣසානාම් 6, 3;)

b. ඣසානාං ඣසෙ පරෙ චපා භවන්ති. තව + ඡත්‍රම් - තවච්ඡත්‍රම්.

c. "ක්වචිද්දීර්ඝාදපි වක්තව්‍යම්" ම්ලෙ + ඡඃ-ම්ලෙච්ඡඃ, හ්‍රී + ඡඃ - හ්‍රීච්ඡඃ, "අපිශබ්දාද්දීර්ඝාත්පදාන්තාද්වෙති වක්තව්‍යම්" ලක්ෂ්මී+ඡායා-ලක්ෂ්මීච්ඡායා, "ආඞ්මාඞ්භ්‍යාං ච වක්තව්‍යම්" ආච්ඡාදයති, මාච්ඡිදත්.

---

53. (ඡකාර චිත්වවිධි සූත්‍රයි.) ඡඃ, (හ්‍රස්වයා කෙරෙන් පරවූ ඡකාරයට) (චිරාගම වේ.)

a. හ්‍රස්වාත් උත්තරස්‍ය, හ්‍රස්වයා කෙරෙන් පරවූ; ඡකාරස්‍ය, ඡකාරයට; චිඃ භවති, චිරාගම වේ.

54. (චපප්‍රත්‍යාහාරවිධි සූත්‍රයි.) ඣසෙ, ඣසප්‍රත්‍යාහාරය පරකල්හි; ඣසානාම්, ඣසප්‍රත්‍යාහාරයෙහි අක්ෂරයන්ට; චපාඃ, චපප්‍රත්‍යාහාරයෙහි අක්ෂරයෝ වෙත්.

b. ඣසෙ පරෙ, ඣසප්‍රත්‍යාහාරය පරකල්හි; ඣසානාම්, ඣසප්‍රත්‍යාහාරයෙහි අක්ෂරයන්ට; චපාඃ භවන්ති, චපප්‍රත්‍යාහාරයෙහි අකුරු වෙත්.

"ඛ ඵ ඡ ඨ ථ ච ට ත ක ප ශ ෂ ස" යන මෙයින් කිසි අකුරක් පරකල්හි "ඣ ඪ ධ ඝ භ ජ ඩ ද ග බ ඛ ඵ ඡ ඨ ථ ච ට ත ක ප ශ ෂ ස" යන අකුරුවලට "චටතකප" යන අකුරු වෙත්. මේ ආදේශවිධිය වනාහි ආදේශාදේශී දෙදෙනාගේ සම්බන්ධයෙන් වේ. "තව + ඡත්‍රම්" යන තන්හි ඡකාර චිත්වයෙන් "තව + ච් + ඡත්‍රම්" යනු වේ. නැවත මේ සූත්‍රයෙන් පූර්ව ඡකාරයට සම්බන්ධයෙන් චකාරය කළ කල්හි "තවච්ඡත්‍රම්" යනු වේ.

c. ක්වචිත්, කිසිතැනෙක්හි; දීර්ඝාත් අපි, දීර්ඝයා කෙරෙන්ද; වක්තව්‍යම්, ඡකාර චිත්වය කියයුතුයි, "ම්ලෙ+ඡඃ" යන තන්හි "ම්ලෙච්ඡඃ" යනුද, "හ්‍රී + ඡඃ" යන තන්හි "හ්‍රීච්ඡඃ" යනුද ඊට උදාහරණයි. (මෙහි "ම්ලෙ, හ්‍රී" යන දෙතන්හි "එ ඊ" යන දීර්ඝයන් කෙරෙන් පරවූ ඡකාරයාගේ චිත්වයයි.) අපි ශබ්දයෙන්,

55. මොනුස්වාරඃ. (මඃ 6, 1; අනුස්වාරඃ 1, 1;)

a. පදාන්තවර්තමානස්‍ය මකාරස්‍යානුස්වාරො භවති හසෙ පරෙ. තම් + හසති-තංහසති, පටුම් + වෂ්ඨා -පටුංවෂ්ඨා කෞමාරාස්ත්වවසානෙප්‍යනුස්වාරමිච්ඡන්ති. "අවසානෙ වා"—දෙවං දෙවම්.

56. නශ්චාපදාන්තෙ ඣසෙ.

(නඃ 6, 1; ච 1 1; අපදාන්තෙ 7, 1; ඣසෙ 7, 1;)

b. නකාරස්‍ය මකාරස්‍ය චාපදාන්තවර්තමානස්‍යානුස්වාරො භවති ඣසෙ පරෙ. යශාන් + සි-යශාංසි, පයාන් + සි - පයාංසි,

---

(මෙහි) අපිශබ්දයෙන්; පදාන්තාත්, පදාන්තවූ; දීර්ඝාත්, දීර්ඝයා කෙරෙන්; වා ඉති, (ඡකාර චිත්ව) විකල්පයයි; වක්තව්‍යම්, කියයුතුයි. "ලක්ෂ්මී+ඡායා" යන තන්හි "ලක්ෂ්මීච්ඡායා" යනු ඊට උදාහරණයි. (මෙහි "ලක්ෂ්මී" යන තන්හි ඊකාරය පදාන්තාශ්‍රිත බැවින් විකල්පයයි.) ආඞ්මාඞ්භ්‍යාං ච, "ආඞ් මාඞ්" දෙකෙන්ද පරවූ (ඡකාරයට;) වක්තව්‍යම්, චිත්වය කියයුතුයි. "ආ + ඡාදයති" යන තන්හි "ආච්ඡාදයති" යනුද, "මා+ඡිදත්" යන තන්හි "මාච්ඡිදත්" යනුද වේ.

55. (අනුස්වාරවිධිසූත්‍රයි.) මඃ, (පදාන්තවූ) මකාරයට; අනුස්වාරඃ, (හසප්‍රත්‍යාහාරය පරකල්හි) අනුස්වාරාදේශ වේ.

a. හසෙ පරෙ, හස ප්‍රත්‍යාහාරය පරකල්හි; පදාන්ත වර්තමානස්‍ය, පදාන්තයෙහි පවත්නාවූ; මකාරස්‍ය, මකාරයට; අනුස්වාරඃ භවති, අනුස්වාරාදේශ වේ "තම් + හසති" යන තන්හි "තංහසති" යනුද; "පටුම්+වෂ්ඨා" යන තන්හි "පටුංවෂ්ඨා" යනුද වේ. කෞමාරාස්තු, කෞමාරාචාර්යයෝ වනාහි; අවසානෙ අපි, අවසානයෙහිද; අනුස්වාරං, අනුස්වාරය; ඉච්ඡන්ති කැමතිවෙත්. අවසානෙ, අවසානයෙහි හෙවත් විරාමය පරකල්හි; වා විකල්පයෙන් වේ. "දෙවම්" යන තන්හි මකාරයට අනුස්වාරය වීමෙන් "දෙවං" යනුද, විකල්පයෙන් "දෙවම්" යනුද වේ.

56. (අනුස්වාරවිධිසූත්‍රයි.) ඣසෙ, ඣස ප්‍රත්‍යාහාරය පරකල්හි; අපදාන්තෙ, අපදාන්තයෙහිවූ; නශ්ච, නකාරයටද; චශබ්ද සමුච්චයෙන් මකාරයටද; (අනුස්වාරය වේ.)

b. ඣසෙ පරෙ, ඣසප්‍රත්‍යාහාරය පරකල්හි; අපදාන්ත, පදාන්ත නොවූ තන්හි; වර්තමානස්‍ය, පවත්නාවූ; නකාරස්‍ය, නකාරයටද; මකාරස්‍ය ච, මකාරයටද; අනුස්වාරඃ භවති,

කම්+සඃ කංසඃ, පුම් + භ්‍යාම් - පුංභ්‍යාම්, ආක්‍රම් + ස්‍යතෙ- ආක්‍රංස්‍යතෙ.

57. යමා යපෙ පරස්‍ය. (සමා: 1, 3: සන්ධි 7, 1; අෂ්ට 6, 1,)

a. **අනුස්වාරස්‍ය යමා වා භවන්ති යපෙ පරෙ. තත්‍රෛකස්‍යානුස්වාරස්‍ය කව යමාඃ ප්‍රාප්තාඃ? කෙන ක්‍රමෙණ භවන්ති? අස්‍ය යපස්‍ය සවර්ණාඃ, ශාන්තඃ.**

b **"වා පදාන්ත" සඳහෙන පදාන්තස්‍යානුස්වාරස්‍ය යමා වා භවන්ති යපෙ පරෙ. තඞ්කරොති-තං කරොති, තන්තනොති-තං තනොති; තඤ්ජානාති-තං ජානාති.**

අනුස්වාරය වේ. "ශාන් + සි" යන තන්හි නකාරයම අනුස්වාරය වීමෙන් "ශාංසි" යනුද, එසේම "පශාන්+සි" යන තන්හි "පශාංසි" යනුද, "කම්+සඃ" යන තන්හි මකාරයට අනුස්වාරය වීමෙන් "කංසඃ" යනුද, එසේම "පුම් + භ්‍යාම්" යන තන්හි "පුංභ්‍යාම්" යනුද, "ආක්‍රම් + ස්‍යතෙ" යන තන්හි "ආක්‍රංස්‍යතෙ" යනුද වේ. මේ සියලු තන්හිම අපදාන්ත නකාර මකාරයන්ට අනුස්වාරයයි.

57. (යමප්‍රත්‍යාහාරාදෙශවිධි සූත්‍රයි.) යපෙ, යපප්‍රත්‍යාහාරය පරකල්හි; අස්‍ය, මේ යප ප්‍රත්‍යාහාරයට සමානවූ; යමාඃ, යම ප්‍රත්‍යාහාර වර්ණයෝ (අනුස්වාරයට) වෙත්.

a. යපෙ පරෙ, යපප්‍රත්‍යාහාරය පරකල්හි; අනුස්වාරස්‍ය, අනුස්වාරයට; යමාඃ, යමප්‍රත්‍යාහාර වර්ණයෝ; වා භවන්ති. ව්‍යවස්ථිත විභාෂා වශයෙන් වෙත්. එකස්‍ය අනුස්වාරස්‍ය, එක අනුස්වාරයට; කව යමාඃ, යමප්‍රත්‍යාහාරයෙහි වර්ණ නවය; නනු ප්‍රාප්තාඃ, පැමිණියාහු නොවෙද්ද?; කෙන ක්‍රමෙණ, කවර ක්‍රමයකින්; භවන්ති, වෙත්ද?; අස්‍ය යපස්‍ය, මේ යපප්‍රත්‍යාහාරයට; සවර්ණාඃ, සවර්ණවූවෝ වෙත්. "ශාං + තඃ" යන තන්හි "ශාන්තඃ" යනු වේ.

මෙහි කී යපප්‍රත්‍යාහාරයෙන් රයන්ත නොගණු ලැබේ, තවද මේ සූත්‍රයට "ශෙ වර්ග්වා" යන සූත්‍රයෙන් වායන්න අනුවර්තිත වේ. ඒ වනාහි ව්‍යවස්ථා වාචකයි. ඒ ව්‍යවස්ථානාවය වර්ණනා කරන්නාහු:-"වා පදාන්ත" යනාදිය කීහු-

b. පදාන්ත" පදාන්තයෙහි; වා, මෙහි විධිය විකල්පයි. (එනම්) යපෙ පරෙ, යපප්‍රත්‍යාහාරය පරකල්හි; පදාන්ත

a. **"වර්ගෙවර්ගාන්තඃ" - වර්ගෙ පරෙ වර්ගාන්තො භවති, වර්ගාභාවෙ පරරූපං ස්‍යාත්. සය්‍යන්තා-සංයන්තා, සව්වත්සරඃ- සං + වත්සරඃ; සල්ලොකම්-සං ලොකම්.** *

b. **මනයවලපරෙ හකාරෙනුස්වාරස්‍ය තෙ යථාක්‍රමං භවන්ති" කිං + හ්මලයති - කිම්හ්මලයති, කිං + හ්නුතෙ - කින්හ්නුතෙ, කිං + හ්‍යඃ - කිය්‍යහ්‍යඃ, කිං + හ්වලයති - කිව්හ්වලයති, කිං+ල්හාදයති-කිල්ල්හාදයති.**

වර්තමානස්‍ය, පදාන්තයෙහි පවත්නාවූ; අනුස්වාරස්‍ය, අනුස්වාරයට; වා, විකල්පයෙන්; යමාඃ භවන්ති, යමප්‍රත්‍යාහාරයෙහි වර්ණයෝ වෙත්. "තං + කරොති" යන තන්හි "තඞ්කරොති" යනුද, විකල්පයෙන් "තංකරොති" යනුද, "තං + තනොති" යන තන්හි "තන්තනොති" යනුද, විකල්පයෙන් "තං තනොති" යනුද, "තං + ජානාති" යන තන්හි "තඤ්ජානාති" යනුද, විකල්පයෙන් "තං ජානාති" යනුද වේ. (මෙහි අනුස්වාරය පදාන්ත බැවින් විකල්පයි.)

a වර්ගෙ, වර්ගව්‍යඤ්ජනය පරකල්හි; වර්ගාන්තඃ, (අනුස්වාරයට වර්ගාන්තාක්ෂරය වේ. (එනම්)-- වර්ගෙ පරෙ, වර්ගව්‍යඤ්ජනය පරකල්හි; වර්ගාන්තඃ, වර්ගාන්තාක්ෂරය; භවති, වේ. වර්ගාභාවෙ, වර්ගාක්ෂරයක් නැතිකල්හි; පරරූපං ස්‍යාත්, (අනුස්වාරයට) පරරූප වන්නේය. "සං + යන්තා" යන තන්හි අනුස්වාරයට පරරූපවූ යකාරය වීමෙන් "සය්‍යන්තා" යනුද විකල්පයෙන් "සංයන්තා" යනුද, "ස + වත්සරඃ" යන තන්හි අනුස්වාරයට පරරූපවූ වකාරය වීමෙන් "සව්වත්සරඃ" යනුද, විකල්පයෙන් "සංවත්සරඃ" යනුද, "සං + ලොකම්" යන තන්හි අනුස්වාරයට පරරූපවූ ලකාරය වීමෙන් "සල්ලොකම්" යනුද විකල්පයෙන් "සංලොකම්" යනුද වේ.

b ම න ය ව ල පරෙ, "ම න ය ව ල" යන අකුරු පරකොට ඇත්තාවූ; හකාරෙ, හකාරය පරකල්හි; අනුස්වාරස්‍ය, අනුස්වාරයට; තෙ, ඒ "ම න ය ව ල" යන අකුරු; යථාක්‍රමම්, පිළිවෙලින්, භවන්ති, වෙත්. "කිං + හ්මලයති" යන තන්හි මකාරය

---

* මේ පාඨයෝ බොහෝ පොත්හි නොදක්නා ලැබෙත් ඇතැම් පොත්හි "වා පදාන්ත" යනුද "වර්ගෙ වර්ගාන්තඃ" යනුද සූත්‍රවශයෙන් දක්නා ලැබෙති. මේ පාඨ වනාහි මෙහි අනුවර්තන වා ශබ්දයාගේ ව්‍යවස්ථාවාචිත්වය හා ආදෙශපරිපාටිය වර්ණනාකරණු පිණිස පසුව යොදනලද පාඨයයි හැඟේ.

a. "ඞණොඃ කුක්ටුග්වා ශරි" ඞකාරණකාරයොඃ ශෂසෙ පරෙ කුක්ටුගාවාගමෞ වාසතඃ. ප්‍රාඞ් + ෂෂ්ඨඃ - ප්‍රාඞ්ක්ෂෂ්ඨඃ, ප්‍රාඞ්ෂෂ්ඨඃ, සුගණ් + ෂෂ්ඨඃ - සුගණ්ට්ෂෂ්ඨඃ, සුගණ්ෂෂ්ඨඃ.

57. මඃ ස්වරෙ. (මඃ 1, 1; ස්වරෙ 7, 1;)

b අනුස්වාරස්‍ය මකාරො භවති ස්වරෙ පරෙ. කිං + අසති - කිමසති.

58. ඁ ඡන්දසි. (ඁ 2, 1; ඡන්දසි 7, 1;)

පරකොට ඇති හකාරය පරනිමිත්තකොට අනුස්වාරයට මකාරව "කිම්හ්මලයති" යනු වේ. "කිං + හ්නුතෙ" යනාදීමයෙහි නකාර යකාර වකාර ලකාර පරකොට ඇති හකාරය පරනිමිත්තකොට අනුස්වාරයට "න ය ව ල" යන අක්ෂර ආදේශවීමෙන් "කින්හ්නුතෙ, කිය්හ්‍යඃ, කිව්හ්වලයති, කිල්හ්ලාදයති" යනු වේ. මෙහි ශේෂවූ සිද්ධියක් දක්වන්නාහු "ඞණොඃ" යනාදි පාණිනීය සූත්‍ර වෘත්ති කීහු.

a. ශරි, ශර්ප්‍රත්‍යාහාරය පරකල්හි; ඞණොඃ, ඞකාර ණකාර දෙකට; වා, විකල්පයෙන්; කුක්ටුක්, කුක්ටුක් යන ආගම දෙක වෙත්. ශෂසෙ පරෙ, ශෂස යන වර්ණත්‍රය පරකල්හි; ඞකාරණකාරයොඃ, ඞකාරණකාරදෙකට; වා, විකල්පයෙන්; කුක්ටුගෞ ආගමෞ, "කුක්ටුක්" යන ආගම දෙක; භවතඃ, වෙත්. "ප්‍රාඞ් + ෂෂ්ඨඃ" යන තන්හි ඞකාරයට "කුක්" ආගමව "ප්‍රාඞ්ක්ෂෂ්ඨඃ" යනුද විකල්පයෙන් "ප්‍රාඞ්ෂෂ්ඨඃ" යනුද "සුගණ් + ෂෂ්ඨඃ" යන තන්හි ණකාරයට "ටුක්" ආගමව "සුගණ්ට්ෂෂ්ඨඃ" යනුද විකල්පයෙන් "සුගණ්ෂෂ්ඨඃ" යනුදවේ. ("කුක්ටුක්") දෙකෙහි උකාර කකාර ඉත් අකුරුයි. ඉන් උකාරය සුඛොච්චාරණය පිණිසද, කකාරය ස්ථානනියමය පිණිසද වේ. එනම් ඞකාර ණකාර දෙදෙනාගේ අන්තයෙහි කිරීමයි. "ශර්" යනු පාණිනීය ප්‍රත්‍යාහාර සංඥාවෙයි, ඒ මෙහි ශසප්‍රත්‍යාහාරයයි.

57. (අනුස්වාරාදේශවිධිසූත්‍රයි.) ස්වරෙ, ස්වරයා පරකල්හි; මඃ, (අනුස්වාරයට) මකාරය වේ.

b. ස්වරෙ පරෙ, ස්වරයා පරකල්හි; අනුස්වාරස්‍ය, අනුස්වාරයට; මකාරඃ භවති, මකාරය වේ. "කිං + අසති" යන තන්හි "කිමසති" යනු වේ. (මේ සූත්‍රය බොහෝ පොත්හි නොදක්නා ලැබේ.)

58. (ඁ ආදේශවිධිසූත්‍රයි.) ඡන්දසි, වෙදවිෂයෙහි; ඁ, (අනුස්වාරය "ඁ" යන්නට පැමිණේ.

a. අනුස්වාරශ්ඡන්දසි ඁකාරමාපද්‍යතෙ ශෂසහරෙඵෙෂු පරතඃ. චතුස්ත්‍රිඁශමාජිනඃ, සාමයජුඁෂි, වයඁසොමඃ, සිඁහ්‍යසි, දෙවානාඁරාජා.

ඉති ව්‍යඤ්ජනසන්ධි ප්‍රක්‍රියා.

b අථ විසර්ගසන්ධිර්නිගද්‍යතෙ.

59. විසර්ජනීයස්‍ය සඃ [විසර්ජනීයස්‍ය 6, 1; සඃ 1, 1;]

c විසර්ජනීයස්‍ය සකාරො භවති ඛසෙ පරෙ. කඃ + තනොති - කස්තනොති.

60. ශෂසෙ වා. (ශෂසෙ 7, 1; වා 1 1;)

---

a ශෂසහරෙඵෙෂු පරතඃ, ශෂසහරඵ යන මොවුන් පර කල්හි; අනුස්වාරඃ, අනුස්වාරය තෙමේ; ඁකාරං ආපද්‍යතෙ, "ඁ" යන ආදේශයට පැමිණේ "චතුස්ත්‍රිං+ශමාජිනඃ" යන තන්හි "චතුස්ත්‍රිඁශමාජිනඃ" යනුද, "සාමයජුං + ෂි" යන තන්හි "සාමයජුඁෂි" යනුද, "වයං + සොමඃ" යන තන්හි "වයඁසොමඃ" යනුද, 'සිං+හ්‍යසි' යන තන්හි "සිඁහ්‍යසි" යනුද, "දෙවානාං+රාජා" යන තන්හි "දෙවානාඁරාජා" යනුද වේ,

ව්‍යඤ්ජනසන්ධිප්‍රක්‍රියාවේ ව්‍යාඛ්‍යාවයි.

a. අථ, (ව්‍යඤ්ජනසන්ධිප්‍රක්‍රියාවට) අනතුරුව; විසර්ගසන්ධිඃ, විසර්ග සන්ධිය; නිගද්‍යතෙ, ප්‍රකාශ කරණු ලැබේ.

59. (සකාරාදේශවිධිසූත්‍රයි.) විසර්ජනීයස්‍ය, විසර්ගයට; සඃ, (ඛසප්‍රත්‍යාහාරය පරකල්හි) සකාරාදේශ වේ.

c. ඛසෙ පරෙ, ඛසප්‍රත්‍යාහාරය පරකල්හි; විසර්ජනීයස්‍ය, විසර්ගයට; සකාරඃ භවති, සකාරාදේශ වේ. "කඃ + තනොති" යන තන්හි විසර්ගයට සකාරව "කස්තනොති" යනු වේ.

60. (සකාරාදේශවිධි සූත්‍රයි.) ශෂසෙ, ශසප්‍රත්‍යාහාරය පර කල්හි; වා, විකල්පයෙන් (විසර්ගයට සකාරය) වේ.

a. **විසර්ජනීයස්‍ය වා සකාරො භවති ශෂසෙ පරෙ. කශ්ශෙතෙ-කඃ ශෙතෙ; කෂ්ෂණ්ඩඃ-කඃ ෂණ්ඩඃ; කස්සාධුඃ-කඃ සාධුඃ.**

61. කුප්වොඃ ᳵක ᳶපෞ වා.

(කුප්වොඃ 6, 2; ᳵකᳶ පෞ 1, 2; වා 1, 1;)

b **විසර්ජනීයස්‍ය කවර්ගපවර්ගසම්බන්ධිනි ඛසෙ පරෙ ᳵකᳶපෞ වා භවතඃ. කපාවුච්චාරණාර්ථෞ, කᳵකරොති-කඃ කරොති; කᳵඛනති-කඃ ඛනති; කᳶපචති-කඃ පචති; කᳶඵලති-කඃ ඵලති.**

---

a. ශෂසෙ පරෙ, ශෂප්‍රත්‍යාහාරය පරකල්හි; විසර්ජනීයස්‍ය විසර්ගයට; වා, විකල්පයෙන්; සකාරඃ භවති, සකාරය වේ. "කඃ + ශෙතෙ" යන තන්හි "කශ්ශෙතෙ" යනුද, විකල්පයෙන් "කඃශෙතෙ" යනුද, "කඃ+ෂණ්ඩඃ" යන තන්හි "කෂ්ෂණ්ඩඃ" යනුද, විකල්පයෙන් "කඃ ෂණ්ඩඃ" යනුද, "කඃ+සාධුඃ" යන තන්හි "කස්සාධුඃ" යනුද, විකල්පයෙන් "කඃ සාධුඃ" යනුද වේ. (මෙහි "කශ්ශෙතෙ, කෂ්ෂණ්ඩඃ" යන දෙතන්හි මේ සූත්‍රයෙන් වූ සකාරයට ශකාර සංයොගයෙන් හා ෂකාරසංයොගයෙන් ශකාර ෂකාර වීමෙන් සිඬයි. තවද "ඛ ඵ ඡ ඨ ථ ච ට ත ක ප" යන අකුරු පරකල්හි විසර්ගයට සකාරාදෙශය නිත්‍යයෙන්ද, "ශෂස" යන මොවුන් පරකල්හි විකල්පයෙන්ද වේ.

61. (ජිහ්වාමූලීය උපධ්මානීයාදෙශවිධි සූත්‍රයි.) කුප්වොඃ" කවර්ග පවර්ග දෙක සම්බන්ධි (ඛසප්‍රත්‍යාහාරය පරකල්හි;) වා, විකල්පයෙන්; ᳵකᳶපෞ, (විසර්ගයට) ජිහ්වාමූලීය උපධ්මානීය දෙක වෙත්.

b. කවර්ගපවර්ග සම්බන්ධිනි, කවර්ගපවර්ගදෙක සම්බන්ධිවූ; ඛසෙ පරෙ, ඛසප්‍රත්‍යාහාරය පරකල්හි; විසර්ජනීයස්‍ය, විසර්ගයට; වා, විකල්පයෙන්; ᳵකᳶපෞ, ජිහ්වාමූලීය උපධ්මානීය දෙක වෙත්. කපෞ, කකාරපකාරදෙක; උච්චාරණාර්ථෞ, උසුරුවීම් ප්‍රයොජන කොට ඇත්තාහ. "කඃ + කරොති" යන තන්හි විසර්ගයට ජිහ්වාමූලීය වීමෙන් "කᳵකරොති" යනුද විකල්පයෙන් "කඃ කරොති" යනුද, එසේම "කඃ+ඛනති" යන තන්හි 'කᳵඛනති" යනුද විකල්පයෙන් "කඃ ඛනති" යනුද, 'කඃ+පචති" යන තන්හි විසර්ගයට උපධ්මානීය වීමෙන් "කᳶපචති" යනුද, විකල්පයෙන් "කඃපචති" යනුද, එසේම "කඃ + ඵලති" යන තන්හි "කᳶඵලති" යනුද "කඃ ඵලති" යනුද වේ.

a. **"වාචස්පත්‍යාදයඃ සංඥාශබ්දා නිපාතාත්සාධවඃ"-වාචස්පතිඃ, වාහස්පතිඃ, කාරස්කරඃ, පාරස්කරඃ, භාස්කරඃ තස්කරඃ, හරිශ්චන්ද්‍රඃ "තද්වාහතොඃ කරපත්‍යොශ්චෞරදෙවතයොඃ සුට් තලොපශ්ච."**

පූර්වසූත්‍රොක්ත ඛසප්‍රත්‍යාහාරයට ඇතුළත් අකුරුවලින් "කඛ" දෙක පරකල්හි විසර්ගයට ජිහ්වාමූලීය හා 'පඵ' දෙක පරකල්හි උපධ්මානීයද විකල්පයෙන් වේ.

a. වාචස්පත්‍යාදයඃ, "වාචස්පති" ශබ්දය ආදිකොට ඇත්තාවූ; සංඥාශබ්දාඃ, සංඥාශබ්දයෝ; නිපාතාත්, නිපාතන විධියෙන්; සාධවඃ, සාධුහු වෙත්. "වාචඃ+පතිඃ" යන තන්හි "වාචස්පතිඃ" යනුද, "වාහත්+පතිඃ" යන තන්හි "වාහස්පතිඃ" යනුද, "කාර +කරඃ" යන තන්හි "කාරස්කරඃ" යනුද, "පාර + කරඃ" යන තන්හි "පාරස්කරඃ" යනුද, "භා+කරඃ" යන තන්හි "භාස්කරඃ" යනුද, "තත් + කරඃ" යන තන්හි "තස්කරඃ" යනුද "හරි+චන්ද්‍රඃ" යන තන්හි "හරිශ්චන්ද්‍රඃ" යනුද වේ. චෞරදෙවතයොඃ, චෞරාර්ථදෙවතාර්ථ දෙක්හි; කරපත්‍යොඃ, කරපති ශබ්ද දෙකට; සුට්, සුට් ආගමයද; තද්වාහතොඃ, තත් ශබ්ද වාහත් ශබ්ද දෙදෙනාගේ; තලොපශ්ච, තකාරලොපයද වේ.

"වාචස්පති" ශබ්දාදියෙහි සකාරය පිළිබඳ විසර්ගයට මේ ජිහ්වාමූලීය උපධ්මානීය දෙක කිරීමට නිමිති ඇතත් එසේ නොකටයුතුබවද, ඔවුහු නිපාතන විධියෙන් සාධුහුයයි සැලකිය යුතුබවද මෙහි කීහු. "නිපාතනාදිෂ්ටසිද්ධිඃ" - "අලක්ෂණෙනානුපපන්නං තත් සර්වං නිපාතනාත් සිද්ධම්" යන භාෂ්‍යොක්තියෙන් නිපාතන ලක්ෂණ ප්‍රකාශිතයි. එනම්, සූත්‍රලක්ෂණයෙන් ව්‍යාකරණයෙහි යමක් නූපන්නේ නම් ඒ සියල්ල නිපාතනයෙන් සිඬයි යනුයි. භාෂාවෙහි ඒ ඒ සූත්‍රවිධිවලට ඇතුළත් නොව තන්හි තන්හි විද්‍යමාන සන්ධ්‍යාදිය සිඬස්වරූපයෙන් නිපදා ගැණීමට විධාන කිරීම් වශයෙන් ව්‍යාකරණ කර්තෘවරයෝ නිපාතනසූත්‍රයයි කොටසක් සැදූලෝ. මේද ඇතැම් පොත්හි සූත්‍රයක් වශයෙන්ද ඇතැම් පොත්හි වෘත්තිපාඨයක් වශයෙන්ද ප්‍රකාශිතයි. එබැවින් මේ "වාචස්පති" යනාදියද එසේ නිපාතනයෙන් සිඬයි. ඒ සිඬියෙහිදී චෞරාර්ථදෙවතාර්ථ වාචක තන්හි "කර, පති" ශබ්ද දෙදෙනාගේ ආදියෙහි සකාරාගමද "තත්, වාහත" ශබ්දයන්ගේ තකාර ලොපයද වීමෙන් "තස්කරඃ, වාහස්පතිඃ" යි සිඬයි.

62 අහ්නොරොරාත්‍රිෂු.

(අහ්නඃ 6 1; රඃ 1, 1; අරාත්‍රිෂු 7, 3;

a. අහ්නො විසර්ජනීයස්‍ය පදාන්ත රො භවති රාත්‍ර්‍යාදිවර්ජිතෙෂු පරතඃ. අහඃ + පතිඃ—අහර්පතිඃ, අහඃ + ගණඃ—අහර්ගණඃ, අහඃ + අභ්‍ර–අහරභ්‍ර, "අරාත්‍රිෂු"ති විශෙෂණාත් - අහඃ + රථන්තරම්–අහෝරථන්තරම්. රූපරාත්‍රිරථන්තරෙෂු න රෙඵ ඉත්‍යාදි.

63. අතොත්‍යුඃ. (අතඃ 5 1 අති 7, 1; උඃ 1,1;]

62. (රකාරාදෙශවිධිසූත්‍රයි.) අරාත්‍රිෂු, රාත්‍රිශබ්දාදිය තොර කොට ඇත්තවුන් පරකල්හි; අහ්නඃ, අහන් ශබ්දය සම්බන්ධී විසර්ගයට; රඃ, රකාරාදෙශ වේ.

a. රාත්‍ර්‍යාදිවර්ජිතෙෂු, රාත්‍රිශබ්දාදිය තොරකොට ඇත්තවුන්, පරතඃ, පරකල්හි; අහ්නඃ, අහන්ශබ්දය සම්බන්ධීවූ; පදාන්ත; පදාන්තයෙහිවූ; විසර්ජනීයස්‍ය, විසර්ගයට; රඃ භවති, රකාරාදෙශ වේ. "අහඃ+පතිඃ" යන තන්හි "අහර්පතිඃ" යනුද "අහඃ+ගණඃ" යන තන්හි "අහර්ගණඃ" යනුද, "අහඃ + අභ්‍ර" යන තන්හි "අහරභ්‍ර" යනුද වේ. අරාත්‍රිෂු ඉති, "අරාත්‍රිෂු" කීයා හෙවත් රාත්‍රිශබ්දාදිය තොරකොට ඇත්තවුන් පරකල්හියයි; විශෙෂණාත්, විශෙෂණයෙන් මෙසේ වෙන්කොට කීමෙන්; "අහඃ + රාත්‍රම්" යන තන්හි "අහෝරාත්‍රම්" යනුද "අහඃ+රූපම්" යන තන්හි "අහෝරූපම්" යනුද, "අහඃ+රථන්තරම්" යන තන්හි "අහෝරථන්තරම්" යනුද වේ. රූපරාත්‍රිරථන්තරෙෂු, "රූපරාත්‍රිරථන්තර" යන මේ ශබ්දයන් පරකල්හි; නරෙඵඃ, නොවේ. ඉත්‍යාදි මේ ආදිය වේ.

මෙහි කියන ලද "අහන්" ශබ්දය සම්බන්ධී විසර්ගය නම් "අහ්නඃ සඃ" යන සූත්‍රයෙන් "අහන්" ශබ්දයාගේ නකාරයට ආදෙශවූ සකාරයට "ස්‍රොර්විසර්ගඃ" යන සූත්‍රයෙන් විසර්ගයයි. ඒ විසර්ගයට "රූප, රාත්‍රි, රථන්තර" යන මොවුන් හැර අන්කක් පරකල්හි රකාරය වේ. "රූප" ශබ්දාදිය පරකල්හි අනතුරු වක්ෂ්‍යමාණ සූත්‍රයෙන් උකාරය වේ. විසර්ගයට වන්නාවූ සකාරාදෙශය හා ජිහ්වාමූලීය උපධ්මානීය උකාරාදෙශ ලොපශ් යන විධි මේ සූත්‍රවිධියෙන් ප්‍රතිෂිද්ධයි. "අහන්" ශබ්දය සම්බන්ධී විසර්ගයට මේ විධි නොව රකාරවිධියම වේ.

63. (උකාරාදෙශවිධිසූත්‍රයි.) අති, අකාරයා පරකල්හි අතඃ, අකාරයා කෙරෙන්, පර (විසර්ගයට;) උඃ, උකාරය වේ.

a. අකාරාත් පරස්‍ය විසර්ජනීයස්‍ය උකාරො භවති අති පරතඃ. "එදෙතොතඃ" (26 ප්‍ර: සූ:) කඃ+අපිඃ - කොපිඃ.

64. හබෙ. (හබෙ 7, 1;)

b. අකාරාත් පරස්‍ය විසර්ජනීයස්‍ය උකාරො භවති හබෙ පරෙ. කඃ + ගතඃ–කොගතඃ, දෙවඃ + යාති–දෙවොයාති, මනඃ+රථඃ–මනොරථඃ.

65 ආදබෙ ලොපශ්. (ආත් 5, 1, අබෙ 7, 1, ලොපශ් 1, 1;)

a. අති පරතඃ, අකාරය පරකල්හි; අකාරාත් පරස්‍ය, අකාරයා කෙරෙන් පරවූ; විසර්ජනීයස්‍ය, විසර්ගයට; උකාරඃ භවති, උකාරාදෙශ වේ. "එදෙතොතඃ" යන සූත්‍රයෙන් (අකාරයට ලොප් වේ.) "කඃ + අපිඃ" යන තන්හි "කොපිඃ" යනු වේ.

අකාර දෙකක් අතර සිටි විසර්ගයට මේ සූත්‍රයෙන් උකාරාදෙශය නියමිතයි. "කඃ+අපිඃ" යන තන්හි කකාරස්ථ අකාරයට හා "අපිඃ" යන්නේ අකාරයටද අතර සිටි විසර්ගයට මේ සූත්‍රයෙන් උකාරය වේ. නැවත ඒ උකාරයත් සමග පූර්ව අකාරයට "උමි" යන සූත්‍රයෙන් ඔකාරය හා ඉන් පර අකාරයට "එදෙතොතඃ" යන සූත්‍රයෙන් ලොපයද වීමෙන් "කොපිඃ" යනු සිද්ධයි.

64. (උකාරාදෙශවිධි සූත්‍රයි.) හබෙ, හබ්ප්‍රත්‍යාහාරය පරකල්හි (අකාරයා කෙරෙන් පර විසර්ගයට උකාරය වේ.)

b. හබෙ පරෙ; හබ්ප්‍රත්‍යාහාරය පරකල්හි; අකාරාත් පරස්‍ය, අකාරයා කෙරෙන් පරවූ; විසර්ජනීයස්‍ය, විසර්ගයට; උකාරඃ භවති, උකාරය වේ. "කඃ+ගතඃ" යන තන්හි "කොගතඃ" යනුද, "දෙවඃ + යාති" යන තන්හි "දෙවොයාති" යනුද, "මනඃ + රථඃ" යන තන්හි "මනොරථඃ" යනුද වේ.

"හයවරල ඤණනඞම ඣඪධඝභ ජබදගඩ" යන වර්ණයන් ගෙන් කිසිවක් පරකල්හි අකාරයා කෙරෙන් පර විසර්ගයට උකාරය වේ. මේ සූත්‍රය පූර්වසූත්‍රය හා එකයොග නොකලේ මෙහි අනිත්‍ය බවක් දැක්වීමටයි; එබැවින් "උෂර්බුධඃ" යනාදි සමහර තන්හි විසර්ගයට උකාරය නොවනබව සූචිතයි.

65. (ලොපශ්විධි සූත්‍රයි.) අබෙ, අබ්ප්‍රත්‍යාහාරය පරකල්හි; ආත්, අවර්ණයා කෙරෙන් පර විසර්ගයට; ලොපශ්, (ලොපශ් යන්නෙන්) ලොප් වේ.

a. අවර්ණාත් පරස්‍ය විසර්ජනීයස්‍ය ලොපශ් භවත්‍යබෙ පරෙ. දෙවාඃ + අත්‍ර දෙවාඅත්‍ර, වාතාඃ + වාතාඃ–වාතාවාතාඃ.

66. ස්වරෙ යත්වං වා (ස්වරෙ 7, 1; යත්වං 1, 1; වා 1, 1;)

b. අවර්ණාත් පරස්‍ය විසර්ජනීයස්‍ය යත්වං වා භවති ස්වරෙ පරෙ. දෙවාඃ + අත්‍ර–දෙවායත්‍ර, දෙවා අත්‍ර.

---

a. අබෙ පරෙ, අබ්ප්‍රත්‍යාහාරය පරකල්හි; අවර්ණාත්පරස්‍ය, අවර්ණයා කෙරෙන් පරවූ; විසර්ජනීයස්‍ය, විසර්ගයට; ලොපශ් භවති, ලොපශ් වේ. "දෙවාඃ + අත්‍ර" යන තන්හි "දෙවාඅත්‍ර" යනුද, "වාතාඃ + වාතාඃ" යන තන්හි "වාතාවාතාඃ" යනුද වේ.

අබ්ප්‍රත්‍යාහාරය පරකල්හි අවර්ණයා කෙරෙන් පර විසර්ගයට මේ සූත්‍රයෙන් ලොපය වේ. එහෙත් පූර්වසූත්‍රමයෙහි නිමිති ඇති තන්හි උකාරයම වේ. මෙසේ වන්නේ මේ විධානයන්ගේ සාවකාශ නිරවකාශ භාවයෙනි. ලොපශ් විධිය සාවකාශද, උකාරවිධිය නිරවකාශද වේ. "සාවකාශවිධිභ්‍යස්තු බලී නිරවකාශකඃ" යනු හෙයින් සාවකාශවිධියට වඩා නිරවකාශවිධිය බලවත් වේ. පූර්වවිධියකට අවකාශ ඇති විධිය සාවකාශ නම්ද පූර්ව විධියකට අවකාශ නැති විධිය නිරවකාශ නම්ද වේ. මේ සූත්‍රයෙහි නිමිති පූර්වසූත්‍රමයෙන් විහිත උකාර විධිය විමටද ඉඩ ඇතිබැවින් මේ සාවකාශයි. මේ සූත්‍රයෙන් විසර්ගලොපනියස්ථාන නම්— අයන්නෙන් පර විසර්ගයට "ආ ඉ ඊ උ ඌ ඍ ඎ ඏ ඐ එ ඓ ඔ ඖ" යන මොවුන් පරකල්හිද, ආයන්නෙන් පර විසර්ගයට අයන්න පටන් ඛයන්න අවසන්කොට ඇති අකුරු සූතිසෙන් එකක් පරකල්හිද ලොප් වේ.

66. (යකාරාදෙශවිධිසූත්‍රයි.) ස්වරෙ, ස්වරයා පරකල්හි; වා, විකල්පයෙන්; යත්වං, (අවර්ණයා කෙරෙන් පර විසර්ගයට) යකාරබව වේ.

b. ස්වරෙ පරෙ, ස්වරයා පරකල්හි; අවර්ණාත් පරස්‍ය, අවර්ණයා කෙරෙන් පරවූ; විසර්ජනීයස්‍ය, විසර්ගයට; වා විකල්පයෙන්; යත්වම්, යකාරබව; භවති, වේ, "දෙවාඃ + අත්‍ර" යන තන්හි "දෙවායත්‍ර" යනුද, විකල්පයෙන් "දෙවා අත්‍ර" යනුදවේ.

අකාරාදි ස්වරයන්ගෙන් එකක් පරකල්හි ආකාරයා කෙරෙන් පර විසර්ගයටද, ආකාරය පටන් ඖකාරය කෙළවර කොට ඇති ස්වර පරකල්හි අකාර ආකාරයන් කෙරෙන් පර විසර්ගයටද විකල්පයෙන් යකාරය වේ. යකාරය නුවූ තන්හි පූර්වසූත්‍රයෙන් ලොප් වේ.

67. හොසඃ. (හොසඃ 6, 1;)

a. හො භගො අඝො ඉත්‍යෙතස්මාත් පරස්‍ය විසර්ජනීයස්‍ය ලොපශ් භවත්‍යබෙ පරෙ. හොඃ+එහි–හොඑහි, භගොඃ–නමස්තෙ–භගොනමස්තෙ. අඝොඃ + යාති–අඝොයාති.

68. නාමිනො රඃ. (නාමිනඃ 5, 1; රඃ 1, 1;)

b. නාමිනඃ පරස්‍ය විසර්ජනීයස්‍ය රෙඵො භවති අබෙ පරෙ. අග්නිඃ + අත්‍ර–අග්නිරත්‍ර, පටුඃ + යජතෙ පටුර්‍යජතෙ.

---

67. (විසර්ගලොපශ්විධිසූත්‍රයි.) හොසඃ, "හොස්" ප්‍රත්‍යාහාරය සම්බන්ධිවූ හෙවත් "හොස් භගොස් අඝොස්" යන මොවුන් සම්බන්ධිවූ විසර්ගයට (ලොපශ් යන්නෙන් ලොප් වේ.)

a. අබෙ පරෙ, අබ්ප්‍රත්‍යාහාරය පරකල්හි; හො භගො අඝො ඉති, "හො භගො අඝො" යන; එතස්මාත්, මොහු කෙරෙන්; පරස්‍ය, පරවූ; විසර්ජනීයස්‍ය, විසර්ගයට; ලොපශ් භවති, ලොපශ් වේ. "හොඃ + එහි" යන තන්හි "හොඑහි" යනුද, "භගොඃ+ නමස්තෙ" යන තන්හි "භගොනමස්තෙ" යනුද, "අඝොඃ + යාති" යන තන්හි "අඝොයාති" යනුද වේ.

මෙහි "හොස් භගොස් අඝොස්" යන මොවුන්ගේ ආද්‍යන්ත වර්ණවලයෙන් ප්‍රත්‍යාහාරයකොට ෂෂ්ඨ්‍යෙකවචනාන්ත වශයෙන් "හොසඃ" යි එකපදිකසූත්‍රය විරචිතයි. ඇතැම්කෙනෙක් මෙය පඤ්චම්‍යන්ත යයිද කීහු. එහෙත් මෙහි "හොස්" යනාදියෙන් පර අන්‍ය විසර්ගයකට කාර්‍ය්‍ය නොව ඔවුන්ගේම සකාරය සම්බන්ධී විසර්ගයට වන බැවින් ෂෂ්ඨ්‍යන්තකිරීම යුක්තතරයි. පාණිනීයාදියෙහි මේ "හොස්" යනාදිය සම්බන්ධී විසර්ගයටද යකාරය නියම කොට "භොයච්ඡුත්" යනාදිය උදාහරණ කරණ ලදී.

68. (රකාරාදෙශවිධිසූත්‍රයි.) නාමිනඃ, නාමින් සංඥක ස්වරයා කෙරෙන් පර (විසර්ගයට;) රඃ, (අබ්ප්‍රත්‍යාහාරය පරකල්හි) රේඵය වේ.

b. අබෙ පරෙ, අබ්ප්‍රත්‍යාහාරය පරකල්හි; නාමිනඃ පරස්‍ය, නාමින් ස්වරයා කෙරෙන් පරවූ; විසර්ජනීයස්‍ය, විසර්ගයට; රෙඵඃ භවති, රකාරය වේ. "අග්නිඃ + අත්‍ර" යන තන්හි "අග්නිරත්‍ර" යනුද; "පටුඃ + යජතෙ" යන තන්හි "පටුර්‍යජතෙ" යනුද වේ.

69. රේඵප්‍රකෘතිකස්‍ය ඛපෙ වා.

(රේඵප්‍රකෘතිකස්‍ය 6, 1; ඛපෙ 7, 1; වා 1, 1;)

a. නාමිනඃ පරස්‍ය රේඵප්‍රකෘතිකස්‍ය විසර්ජනීයස්‍ය ඛපෙ පරෙ වා රේඵො භවති. ගීඃ+පතිඃ-ගීර්පතිඃ-ගීᳶපතිඃ, ධූඃ+පතිඃ-ධූර්පතිඃ-ධූᳶපතිඃ.

70 රඃ (රඃ 6, 1;)

b. රේඵසම්බන්ධිනො විසර්ජනීයස්‍ය රේඵො භවති අබෙ පරෙ. ප්‍රාතඃ+අත්‍ර-ප්‍රාතරත්‍ර, අන්තඃ+ගතඃ-අන්තර්ගතඃ.

අයන්ත පටන් ඛයන්ත තෙක් ඇති අකුරුවලින් කිසිවක් පරකල්හි ඉයන්ත පටන් ඖයන්ත තෙක් ඇති අකුරුවලින් පර විසර්ගයට රකාරාදෙශය වේ.

69. (රේඵාදෙශවිධිසූත්‍රයි.) ඛපෙ, ඛපප්‍රත්‍යාහාරය පරකල්හි **රේඵප්‍රකෘතිකස්‍ය**, රේඵය ප්‍රකෘතිකොට **ඇත්තාවූ** විසර්ගයට; වා, විකල්පයෙන් (රේඵය වේ.)

a. ඛපෙ පරෙ, ඛපප්‍රත්‍යාහාරය පරකල්හි; නාමිනඃ පරස්‍ය; නාමින් ස්වරයා කෙරෙන් පරවූ; රේඵප්‍රකෘතිකස්‍ය, රේඵය ප්‍රකෘතිකොට ඇත්තාවූ; විසර්ජනීයස්‍ය, විසර්ගයට; වා, විකල්පයෙන්; රේඵඃ භවති, රකාරය වේ. "ගීඃ + පතිඃ" යන තන්හි "ගීර්පතිඃ" යනුද, විකල්පයෙන් "ගීᳶපතිඃ" යනුද, "ධූඃ + පතිඃ" යන තන්හි "ධූර්පතිඃ" යනුද, විකල්පයෙන් "ධූᳶපතිඃ" යනුද වේ.

මේ සූත්‍රවිධියෙන් පූර්වොක්ත සකාර ජිහ්වාමූලීය උපධ්මානීය යන මේ විධි ප්‍රතිෂිද්ධයි. රේඵ ප්‍රකෘතික විසර්ගය නම් රේඵයට ආදෙශව සිටි විසර්ගයයි. මෙහි රේඵප්‍රකෘතික විසර්ගයට රේඵය වේයයි අවිශෙෂයෙන් කීවද පාණිනීය වාර්තික පාඨයෙහි "අහරාදීනාං පත්‍යාදිෂු වා රේඵඃ"යි නිර්දිෂ්ටයි. "පති" ශබ්දාදිය පරකල්හි "අහන් ගිර් ධූර්" යනශබ්දයන් සම්බන්ධි විසර්ගයට විකල්පයෙන් රේඵය වේ යනු මෙහි භාවයයි. මුග්ධබොධටීකාවෙහිද මේ මෙසේම කියන ලදී. එහි වනාහි සමාසය ඇතිතන්හි මේ කාර්ය්‍යය වේයයිද විශෙෂිතයි.

70. (රේඵාදෙශවිධිසූත්‍රයි.) රඃ, (අබප්‍රත්‍යාහාරය පරකල්හි රේඵ සම්බන්ධි විසර්ගයට)රේඵය වේ.

අබෙ පරෙ, අබප්‍රත්‍යාහාරය පරකල්හි; රේඵසම්බන්ධිනඃ, රකාරය සම්බන්ධිවූ; විසර්ජනීයස්‍ය, විසර්ගයට; රේඵඃ භවති, රකාරය වේ. "ප්‍රාතඃ + අත්‍ර" යන තන්හි "ප්‍රාතරත්‍ර" යනුද,

71. රි ලොපො දීර්ඝශ්ච.

(රි 7, 1, ලොපඃ 1, 1; දීර්ඝඃ 1, 1; ච 1, 1;

a. රේඵස්‍ය රේඵෙ පරෙ ලොපො භවති පූර්වස්‍ය ච දීර්ඝඃ. පුනඃ+රමතෙ-පුනාරමතෙ, ශුකතිඃ+රූප්‍යාත්මනා භාති--ශුකතීරූප්‍යාත්මනා භාති.

72. සෛෂාද්ධසෙ. (සෛෂාත් 5, 1; හසෙ 7, 1;)

b. සශබ්දාදෙෂශබ්දාච්ච පරස්‍ය විසර්ජනීයස්‍ය ලොපශ් භවති හසෙ පරෙ. සඃ + චරති-සචරති, එෂඃ + හසති-එෂහසති.

"අන්තඃ + ගතඃ" යන තන්හි "අන්තර්ගතඃ" යනුද වේ. (අබ ප්‍රත්‍යාහාරයෙහි අකුරක් පරවූ තන්හි රකාරයට ආදෙශව සිටි විසර්ගයට නැවතත් රකාරය අවිකල්පයෙන් වේයයි කියනලදී. මේ සූත්‍රවිධියෙන් පූර්වොක්ත උකාර විධිය ප්‍රතිෂිද්ධයි.)

71. (ලොප හා දීර්ඝවිධිසූත්‍රයි.) රි, රකාරය පරකල්හි; ලොපඃ, (රකාරයට) ලොප් වේ; දීර්ඝශ්ච, (පූර්වයට) දීර්ඝද වේ.

a. රේඵෙ පරෙ, රකාරය පරකල්හි; රේඵස්‍ය, රේඵයට; ලොපඃ භවති, ලොප් වේ; පූර්වස්‍ය, පූර්වයට; දීර්ඝශ්ච, දීර්ඝද වේ. "පුනඃ + රමතෙ" යන තන්හි "පුනාරමතෙ" යනුද, "ශුකතිඃ + රූප්‍යාත්මනා භාති" යන තන්හි "ශුකතීරූප්‍යාත්මනා භාති" යනුද වේ.

මෙහි රකාරය පරනිමිත්තකොටත් පූර්වරකාරයට ලොපය හා ඉන් පූර්වව සිටි ස්වරයට දීර්ඝයද නියමිතයි. මුග්ධබොධව්‍යාකරණාදියෙහි මේ හා විධ්‍යන්තරයකින්ද සූත්‍රය රචනා කොට ඪකාරය පරකල්හි ඪකාර ලොපයද වේයයි "රූඪඃ" යනාදිය උදාහරණ කරණලදී. මෙහිද ආඛ්‍යාතප්‍රක්‍රියාවෙහි "ඪෙ ඪො ලොපො දීර්ඝශ්ච" යන සූත්‍රයෙන් ඒ නියමිතයි.

72. (විසර්ගලොපශ්විධිසූත්‍රයි.) හසෙ, හසප්‍රත්‍යාහාරය පරකල්හි; සෛෂාත්, "ස" ශබ්දයෙන් හා "එෂ" ශබ්දයෙන් (පරවූ විසර්ගයට ලොපශ් වේ.)

b. හසෙ පරෙ, හසප්‍රත්‍යාහාරය පරකල්හි; සශබ්දාත්, "ස" ශබ්දයා කෙරෙන්ද; එෂශබ්දාච්ච, "එෂ" ශබ්දයා කෙරෙන්ද; පරස්‍ය, පරවූ; විසර්ජනීයස්‍ය, විසර්ගයට; ලොපශ්භවති, ලොපශ් ඇත්තෙන් ලොප් වේ. "සඃ + චරති" යන තන්හි "සචරති"

a. **සෛෂාදිති සංහිතා සමාසෙ'ඛ්‍යාතෙ'සම්මතා, සා "සෛෂදාශරථිරාම" ඉත්‍යාදෞ පාදපූරණෙ සන්ධ්‍යභාවො ඥෙයා.**

b. **සෛෂ දාශරථී රාමඃ සෛෂ රාජා යුධිෂ්ඨිරඃ,**
සෛෂ කර්ණෝ මහාත්‍යාගී සෛෂ භීමො මහාබලඃ

යනුද, "එෂඃ + හසති" යන තන්හි "එෂහසති" යනුද වේ. ("තත්" ශබ්ද ප්‍රථමෛකවචනයවූ "සඃ" යන රූපයෙහි හා "එතත්" ශබ්ද ප්‍රථමෛකවචනයවූ "එෂඃ" යන රූපයෙහි විසර්ගයට හසප්‍රත්‍යාහාරය පරකල්හි මේ සූත්‍රයෙන් ලෝප් වේ. මේ සූත්‍රය අවිශේෂයෙන් කීවද මුග්ධබෝධාදියෙහි යථොක්ත ශබ්දවය නඤ් නිපාතයෙන් හා "අක්" යන්නෙන් යුක්ත තන්හි මේ විධිය නොවේයයි කියා "අසඃ ශිවඃ, එෂකොරුද්‍රඃ"යි උදාහරණ කරණලදී. මෙහි "අසඃ" යන තන්හි "නඤ්" නිපාත යුක්ත බැවින්ද "එෂකඃ" යන තන්හි "අක්" යන්නෙන් යුක්ත බැවින්ද විසර්ගලෝපය නොවේයයි නිර්දිෂ්ටයි.

a. සෛෂාත් ඉති' "සෛෂාත්" යන මෙහි; සමාසෙ අඛ්‍යාතෙ, සමාසය නොකළකල්හි; අසම්මතා, නොගැළපෙන්නාවූ; සංහිතා, යම් සංහිතාවක් කරණලද්දීද; සා, ඕතොමෝ; සෛෂදාශරථිරාම ඉත්‍යාදෞ, "සෛෂදාශරථිරාමඃ" යනාදියෙහි; පාදපූරණෙ, ශ්ලෝකපාදපූරණස්ථානයෙහි; සන්ධ්‍යභාවො, සන්ධිය අවිනොව ඇත්තීයයි; ඥෙයා, දතයුතුයි.

"සෛෂාඛ්‍යෙ" යන සූත්‍රය ඇතැම්අය "සඃ එෂාත් හසෙ"යි ත්‍රිපද වශයෙන් දක්වූහ එකල "සඃ" යන්න පඤ්චම්‍යර්ථ ප්‍රථමාන්ත පදයකි, මෙසේ ත්‍රිපද වශයෙන් ගැණීමේදී "සඃ එෂාත්" යන තන්හි විසර්ගයට "ආදබෙ ලොපශ්" යන සූත්‍රයෙන් ලෝපශ් වේ. ඒ "ලොපශ්" යන්නෙන් ලෝප්වූ පසු එහිසන්ධි ප්‍රතිෂේධය පැමිණෙන්නෙම "ඡන්දොවත් සූත්‍රාණි" යන න්‍යායෙන් වෙද විධියක් මෙන් සලකා නැවත සන්ධිකොට සූත්‍රය විරචිතයයිද, එසේ විරචිතවූයේ (වෙදවිෂයෙහි) ශ්ලෝකපාද පූරණ ස්ථානයන්හි මෙබඳු සන්ධි දක්නාලබන බැවින් යයිද ඔවුන්ගේ මතයයි. ඒ ස්ඵුටකිරීම පිණිස "සෛෂදාශරථි" යනාදි ශ්ලෝකයද නිර්දිෂ්ටයි.

b සඃ එෂඃ රාමඃ, ඒ මේ රාමතෙමේ; දාශරථී, දශරථරජහුගේ පුත්‍රයාය; සඃ එෂඃ රාජා, ඒ මේ රජතෙමේ; යුධිෂ්ඨිරං යුධිෂ්ඨිර නම්, හෙවත් යුද්ධයෙහි ස්ථිරය; සඃ එෂඃ කර්ණඃ, ඒ මේ අඞ්ගදෙශාධිපති කර්ණරාජතෙමේ; මහාත්‍යාගී, මහත්වූ ත්‍යාග

73. ක්වචින්නාමිනොබෙ ලොපශ්.

(ක්වචිත් 7, 1; නාමිනඃ 5, 1; අබෙ 7, 1; ලොපශ් 1, 1;)

a **නාමිනඃ පරස්‍ය විසර්ජනීයස්‍ය ලොපශ් භවති ක්වචිදබෙ පරෙ භූමීඃ + ආදදෙ-භූම්‍යාදදෙ.**

b **යදුක්තං ලෞකිකායෙහ තමෙවෙද බහුලං භවෙත්,**
සෙමාං භූම්‍යාදදෙ සොෂාමිත්‍යාදිනාමදුෂ්ටතා.

ඇත්තේය; සඃ එෂඃ භීමඃ, ඒ මේ භීමපාණ්ඩවතෙමේ; මහාබලඃ, මහත් බලඇත්තේය. (මේශ්ලෝකය අකුරු අටෙන්පාදයක් පිරෙන අනුෂ්ටුප්ඡන්දසෙහි ශ්ලෝකයෙකි. යථොක්ත සන්ධිය නොකළේ නම් ශ්ලෝකපාදය නොපිරේ. එබැවින් ඒ ශ්ලෝකපාද පූරණය සඳහා එහි සන්ධිකරණ ලදී.)

මෙබඳු වෙදවිධි වූකලි තවත් බොහෝ ඇතිබැව් දක්වීමට "ක්වචින්නාමිනො" යනාදිය කීහු.

73. (ලොපශ්විධිසූත්‍රයි.) අබෙ, අබ්ප්‍රත්‍යාහාරය පරකල්හි; නාමිනඃ, නාමීන් ස්වරයාකෙරෙන් පරවූ විසර්ගයට; ක්වචිත්, කිසිතන්හි; ලොපශ්, ("ලොපශ්" යන්නෙන්) ලෝප් වේ.

a. අබෙ පරෙ, අබ්ප්‍රත්‍යාහාරය පරකල්හි; නාමිනඃ පරස්‍ය, නාමීන් ස්වරයා කෙරෙන් පරවූ; විසර්ජනීයස්‍ය, විසර්ගයට; ක්වචිත්, කිසිතන්හි; ලොපශ් භවති, ලෝපශ් වේ. "භූමීඃ + ආදදෙ" යන තන්හි "භූම්‍යාදදෙ" යනු වේ. (මෙහි විසර්ගයට මේ සූත්‍රයෙහි "ලොපශ්" යන්නෙන් ලෝප්කළකල්හි නැවත සන්ධිවිධානය ප්‍රතිෂිද්ධවුවත් මේ වෛදිකප්‍රයොග බැවින් මකාරස්ථ ඊකාරයට යකාරය වීමෙන් "භූම්‍යාදදෙ" යි සිද්ධයි.)

b. ඉහ, මේ ශාස්ත්‍රයෙහි; ලෞකිකාය, ලෞකිකප්‍රයොගය පිණිස, හෙවත් ලාක්ෂණිකයන් අතර ප්‍රසිද්ධවූ උදාහරණ සිද්ධිය පිණිස; යත් "සෛෂාත්" යනුවෙන් නිර්දිෂ්ට යම් වෙදවිධියක්; උක්තම්, කියන ලද්දේද; තත්, එය; වෙදෙ, වෙදවිෂයෙහි; බහුලං භවෙත්, බහුලවත්නේය, (එනම්) සෙමාං, "සඃ+ඉමාම්" යන තන්හි "සෙමාම් යනුද, "භූම්‍යාදදෙ, "භූමීඃ + ආදදෙ" යන තන්හි "භූම්‍යාදදෙ" යනුද; සොෂාම්, "සඃ + උෂාම්" යන තැන්හි "සොෂාම්" යනුද වේ. ඉත්‍යාදිනාම්, මේ ආදීන්ගේ; අදුෂ්ටතා, අදුෂ්ටභාවය වේ, හෙවත් සාධුභාවය වේ.

a. ක්වචිත්ප්‍රවෘත්තිඃ ක්වචිදප්‍රවෘත්තිඃ
ක්වචිද්විභාෂා ක්වචිදන්‍යදේව,
විධේර්විධානං බහුධා සමීක්ෂ්‍ය
චතුර්විධං බාහුලකං වදන්ති.

මෙහි "සඃ+ඉමාම්" යන තන්හි "ආදබේ ලොපශ්" යන සූත්‍රයෙහි 'ලොපශ්' යන්නෙන් විසර්ගලොපයවූ කල්හි නැවත සන්ධිය ප්‍රතිෂිද්ධවුවත් වෛදිකප්‍රයොග බැවින් "අ ඉ එ" යන සූත්‍රයෙන් එකාරව "සෙමාම්" යි සිද්ධයි. "භූම්‍යාදදෙ" යනු පූර්වොක්තයි. "සඃ+ඖෂාම්" යන තන්හිද විසර්ගලොපයෙන් පසු "උ ඖ" යන සූත්‍රයෙන් ඖකාරව "සෞෂාං"යි සිද්ධයි. මේ බාහුලකප්‍රයොගයන් පිළිබඳ භෙද දක්වන්නාහු "ක්වචිත්" යනාදිය කීහු.

a. ක්වචිත්, කිසියම් ප්‍රයොගයෙක්හි; ප්‍රවෘත්තිඃ, (නිෂිද්ධකාර්‍ය්‍යයාගේ) පැවැත්මද හෙවත් පැමිණීමද; ක්වචිත්, කිසියම් ප්‍රයොගයෙක්හි; අප්‍රවෘත්තිඃ (ප්‍රවර්තමානකාර්‍ය්‍යයාගේ) නොපැවැත්මද; ක්වචිත්, කිසියම් ප්‍රයොගයෙක්හි; විභාෂා (නිත්‍ය විධීහුගේ) විකල්පයද; ක්වචිත්, කිසියම් ප්‍රයොගයෙක්හි; අන්‍යත් එව, (ප්‍රවර්තමානකාර්‍ය්‍යයෙන්) අනිකක්ද වේ. විධෙඃ, විධිහුගේ හෙවත් ව්‍යාකරණසූත්‍රයාගේ; විධානං, කිරීම; බහුධා, බොහෝ පරිද්දෙන්; සමීක්ෂ්‍ය, බලා; බාහුලකම්, බාහුලකවිධිය, හෙවත් වෛදිකප්‍රයොගය; චතුර්විධම්, සිව්වැදෑරුම්කොට; වදන්ති, කියත්.

මෙහි "සෙමාම්" යනාදියෙහි විසර්ගලොපයෙන් පසු ප්‍රසිද්ධ සන්ධිහුගේ ප්‍රාප්තිය ඇතිබැවින් නිෂිද්ධකාර්‍ය්‍යයාගේ ප්‍රවෘත්තියයි. "භූම්‍යාදදෙ" යනාදියෙහි "නාමිනොරඃ" යන සූත්‍රයෙන් පැමිණෙන රකාරය නුවූ බැවින් ප්‍රවර්තමානකාර්‍ය්‍යයාගේ අප්‍රවෘත්තියයි. අකාරාන්ත ශබ්දයන්ගේ තෘතීයා බහුවචනයෙහි අවිකල්පයෙන් නියමිත "දෙවෛඃ" යනාදි රූප වෙදයෙහි "දෙවෙභිඃ, දෙවෛඃ"යි කරණ ලද විකල්පය හා "ශෂහරෙඑ" යන මොවුන් පරකල්හි "හංසඃ" යනාදියෙහි බින්දුවර්ණයට විකල්පයෙන් ම යන්න වීමෙන් "හම්සඃ" යනාදීන් කරණලද විකල්පයද, "භූම්‍යාදදෙ" යනාදියෙහි විසර්ගයට පූර්ව නියමිත රකාරය නොව ලොප්වූ බැවින් කියනලද්දෙන් අනිකක්දවිය. මෙහිලා පඤ්චවිධ නිරුක්තයද දක්වන්නාහු "වර්ණාගමො" යනාදිය කීහු.

a. වර්ණාගමො වර්ණවිපර්‍ය්‍යයශ්ච
ද්වෞ චාපරෞ වර්ණවිකාරනාශෞ,
ධාතොස්තදර්ථාතිශයෙන යොග-
ස්තදුච්‍යතෙ පඤ්චවිධං නිරුක්තම්.

b. වර්ණාගමො ගවෙන්ද්‍රාදෞ සිංහෙ වර්ණවිපර්‍ය්‍යයඃ
ෂොඩශාදෞ විකාරශ්ච වර්ණනාශඃ පෘෂොදරෙ,
වර්ණවිකාරනාශාභ්‍යාං ධාතොරතිශයෙන යඃ
යොගඃ ස උච්‍යතෙ ප්‍රාඥෛර්මයූරභ්‍රමරාදිෂු.

a. වර්ණාගමඃ, වර්ණාගමයද; වර්ණවිපර්‍ය්‍යයශ්ච, වර්ණයන්ගේ විපර්‍ය්‍යාසයද, හෙවත් වර්ණපෙරළියද; අපරෞ, අන්‍යවූ; වර්ණවිකාරනාශෞ, වර්ණවිකාරය වර්ණලොපය යන; ද්වෞ ච, දෙකද; ධාතොඃ, ධාතුහුගේ; තදර්ථාතිශයෙන, තත් ප්‍රසිද්ධාර්ථාතිශයසිත අර්ථාන්තරයක් හා; යොගඃ, යෙදීමද; (නොහොත්) තදර්ථාතිශයෙන, ඒ වර්ණ විකාර නාශ දෙක කිරීමෙන් ගම්‍යමාන අතිශයාර්ථයක් සමග; යොගඃ, යෙදීමද (කියා;) තත් නිරුක්තං, ඒ නිරුක්තය; පඤ්චවිධම්, පස්වැදෑරුම්යයි; උච්‍යතෙ, කියනුලැබේ.

b. ගවෙන්ද්‍රාදෞ, "ගවෙන්ද්‍ර" ශබ්දාදියෙහි; වර්ණාගමඃ, වර්ණාගමයද; සිංහෙ, සිංහශබ්දයෙහි; වර්ණවිපර්‍ය්‍යයඃ, වර්ණවිපර්‍ය්‍යාසයද; ෂොඩශාදෞ, ෂොඩශ ශබ්දාදියෙහි; විකාරශ්ච, වර්ණවිකාරයද; පෘෂොදරෙ, පෘෂොදර ශබ්දයෙහි; වර්ණනාශඃ, වර්ණලොපයද වේ. වර්ණවිකාරනාශාභ්‍යාම්, වර්ණවිකාර වර්ණලොප දෙකෙන් (ගම්‍යමානවූ;) ධාතොඃ, ධාතුහුගේ; අතිශයෙන, අතිශයාර්ථයක් සමග; යඃ යොගඃ, යම් යෙදීමක් වේද; සඃ, එතෙම; ප්‍රාඥෛඃ, පණ්ඩිතයන් විසින්; මයූරභ්‍රමරාදිෂු, මයූර භ්‍රමර ශබ්දාදියෙහි; උච්‍යතෙ, කියනුලැබේ.

චතුර්විධත්වයෙන් කී යථොක්ත බාහුලක විධිය වනාහි වර්ණාගමාදි වශයෙන් නිර්දිෂ්ට පඤ්චවිධ නිරුක්තයයි ඇතැම් ආචාර්‍ය්‍යයන් විසින් ප්‍රකාශිතයි. එනම්— "නිරුච්‍යතෙර්ථ සම්නාතීති-නිරුක්තම්" යනු හෙයින් මෙහි වර්ණාගමාදියෙන් අර්ථය නිර්ණය කොට කියනුලබන බැවින් ඒ බාහුලකවිධියට නිරුක්තයයි කියනුලැබේ. ඒ පඤ්චවිධ නිරුක්තය හා උදාහරණ දක්වන්නාහු "වර්ණාගමො ගවෙන්ද්‍රාදෞ" යනාදියනුකීහු. "වර්ණාගමය වර්ණවිපර්‍ය්‍යාසය වර්ණවිකාරය වර්ණනාශය ධාත්වර්ථාතිශය යොගය" යන මොහු පඤ්චවිධනිරුක්තයෝයි. මෙහි පූර්වොක්ත ගවෙන්ද්‍රාදි සංහිතාවන් මෙන් ආගමවිධියෙන්

a. (විතකම්හගෙන—විතසකාමහගෙන, ශුනඃ ශෙඵං විත්—ශුනශ්ශවිච්ඡම්)

b. "ආතබසයොරුඃ" ආකාරෙ ඛසෙ ච පරෙ විසර්ජනීයස්‍ය සහ උඃ සන්ධිර්භවති. ශුඩඃ + ආතමා–ශුඩෝතමා.

සිද්ධවූවෝ වර්ණාගමයට උදාහරණයි. "හිංස" යනධාතුවෙහි අප්‍රත්‍යය වූ කල්හි හකාර සකාර දෙදෙනාගේ පෙරළීමෙන් "සිංහ" යන රූපය සිඬයි. මෙසේ වර්ණපෙරළීමෙන් සිද්ධවූවෝ වර්ණවිපර්‍ය්‍යාසයට උදාහරණයි. "ෂඞ්+දශ" යන තන්හි "ෂ්" යන්නට උකාර හා දයන්නට ඩයන්නද විකාරවීමෙන් "ෂොඩශ" යන රූපය සිඬයි. මෙසේ වර්ණයකට වර්ණයක් වෙනස්වීමෙන් හෙවත් ආදේශ වීමෙන් සිද්ධවූවෝ වර්ණවිකාරයට උදාහරණයි. "පෘෂත්+උදරම්" යන තන්හි තකාරලෝපයෙන් "පෘෂොදරම්" යනු සිඬයි. මෙසේ වර්ණයන් ලොප්වීමෙන් සිද්ධවූවෝ වර්ණනාශයට උදාහරණයි. "මහ්‍යාමතිශයෙනරෞති" යන වාක්‍යයෙහි හා "භ්‍රමන්නතිශයෙන රෞති" යන වාක්‍යයෙහි "මහී භ්‍රමත්" යන ශබ්දවය පූර්වකොට ඇති "රු ශබ්දෙ" යන ධාතුවෙන් "ඩ" ප්‍රත්‍යයව "මහී" යන්නෙහි හකාර ඊකාර දෙකට යකාර ඌකාර දෙක විකාරවීමෙන් හා "භ්‍රමත්" යන්නෙහි තකාර නාශයෙන් "මයූර, භ්‍රමර" ශබ්ද සිඬයි. මෙසේ අතිශයාර්ථයෙන් යුක්තවූ ශබ්දයෝ අතිශයාර්ථයෝගයට උදාහරණයි. මෙහි "රු" ධාතුවෙහි විද්‍යමානවූ ශබ්දාර්ථයට අතිශයාර්ථය යුක්තවීමෙන් ශිඛිෂට්පදවාය වාච්‍ය වේ. අතිශයාර්ථ යෝගයෙන් තොරවූයේ නම් ඒ නාමවය වාච්‍ය නොවේ. මෙසේ හෙයින් ලෞකික විධියෙහිද මේ බාහුලක විධිය වේ

a. ("විත්– කමහනෙන" යන තන්හි සකාරාගම විධියෙන් "විතසකාම්හනෙන" යනුද "ශුනඃ ශෙඵඃවිච්" යන තන්හි පද විපර්‍ය්‍යාසයෙන් "ශුනශ්ශවච්ඡම්" යනුද වේ.)

b' ආතබසයොඃ, ආකාරය බසප්‍රත්‍යාහාරය යන දෙක පර කල්හි; උඃ, (පරනිමිත්ත සමග විසර්ගයට) උකාරය වේ, ආකාරෙ, ආකාරයද; බසෙ ච පරෙ, බසප්‍රත්‍යාහාරයද පරකල්හි; විසර්ජනීයස්‍ය, විසර්ගයට; සහ, පරනිමිත්ත සමග; සන්ධිත්, කිසිතන්හි; උඃ භවති, උකාරය වේ. "ශුඩඃ + ආතමා" යන තන්හි "ශුඩෝතමා" යනු වේ. (මේද වෛදික ප්‍රයෝගයෙකි.) විසර්ගසන්ධිප්‍රක්‍රියා, විසර්ගසන්ධිප්‍රක්‍රියාව; ඉති, මෙතෙකින් සමාප්තයි.

විසර්ගසන්ධිප්‍රක්‍රියාර්ථව්‍යාඛ්‍යාව

සන්ධිප්‍රක්‍රියාර්ථව්‍යාඛ්‍යාව නිමි.

විභක්තිප්‍රක්‍රියාර්ථව්‍යාඛ්‍යාව.

a. අථ විභක්තිර්විභාව්‍යතෙ, සා ද්විධා–ස්‍යාදිස්ත්‍යාදිශ්ච.

76. විභක්ත්‍යන්තං පදම්. (විභක්ත්‍යන්තම් 1, 1; පදම් 1, 1;)

b. විභක්ත්‍යන්තං රූපං පදසංඥං භවති. තත්‍ර ස්‍යාදිර් විභක්තිර්නාමෙනා යොජ්‍යතෙ.

සන්ධිප්‍රක්‍රියාව මෙසේ සැකෙවින් සාජුභාවයට පමුණුවා ඉක්බිති විභක්තිප්‍රක්‍රියාර්ථය කරන්නාහු "අථ විභක්තිඃ" යනාදිය කීහු.

a. අථ, (සන්ධිප්‍රක්‍රියාවට) අනතුරුව; විභක්තිඃ, විභක්ති ප්‍රක්‍රියාව, විභාව්‍යතෙ, ප්‍රකාශකරනු ලැබේ, හෙවත් කියනු ලැබේ. සා, ඒ විභක්තිතොමෝ; ද්විධා, දෙවැදෑරුම්වේ. එනම්—ස්‍යාදිඃ, සිආදියද; ත්‍යාදිශ්ච, තිආදියද කියායි.

"විභජ්‍යතෙත පෘථක්ක්‍රියතෙත" සඞ්ඛ්‍යාකර්මාදයොයාභිඃ යයා සා—විභක්තිඃ" යනු "විභක්ති" යන සංඥ නාමයාගේ නිර්වචනයි. ඒ ඒ නාමයන් පිළිබඳවූ එකවචනාදිසඞ්ඛ්‍යාර්ථ හා කර්මාදි අර්ථ යමකින් බෙදනුලැබෙත් නම් ඒ විභක්තියි යනු එහි අර්ථයි. මේ විභක්තිවිධියෙහි ඇතුළත් ශබ්දයෝ වනාහි ස්වරාන්තහලන්තවශයෙන් දෙපරිදි වූවෝද පුංස්ත්‍රී නපුංසකවශයෙන් තෙපරිදි වූවෝද මෙහි වර්ණනා කරණු ලැබෙත්. ඔවුන්ගේ එකවචනාදිසඞ්ඛ්‍යාර්ථ හා කර්මාදි අර්ථද වක්ෂ්‍යමාණ "සි ඖ ජස්" යනාදියෙන් බෙදනු ලැබෙති, එබැවින් ඒ "සි" ආදියට හා තදාශ්‍රිතපදයන්ටද විභක්තියයි ව්‍යවහාර කරණු ලැබේ. ආඛ්‍යාතයෙහි වූකලි ඒ ඒ ධාතූන් පිළිබඳවූ වර්තමානාදිභෙද සහගත අර්ථසමූහය "තිප් තස් අන්ති" යනාදීයෙන් බෙදනු ලබන බැවින් ඔවුන්ටද විභක්තියයි කියනු ලැබේ. මේ නාම විභක්තිවිධිය ප්‍රකාශ කරන්නාහු "විභක්ත්‍යන්තං පදම්" යනාදිය කීහු.

76. (පදසංඥසූත්‍රයි.) විභක්ත්‍යන්තම්, විභක්ති අන්ත කොට ඇත්තේ; පදං, පද නම් වේ.

b. විභක්ත්‍යන්තං, විභක්තියක් අන්තකොට ඇත්තාවූ; රූපං, ශබ්දරූපය, පදසංඥං භවති, පදසංඥ වේ· තත්‍ර, ඒ විභක්ති දෙකොටස අතුරෙන්; ස්‍යාදිඃ විභක්තිඃ, සි ආදිවිභක්ති සමූහය; නාම්නඃ, නාමයා කෙරෙන්; යොජ්‍යතෙ, යොදනු ලැබේ.

77. අවිභක්ති නාම. (අවිභක්ති 1, 1; නාම 1, 1;)

a. **විභක්ති රහිතං ධාතුවර්ජිතමර්ථවච්ඡබ්දරූපං නාමෝච්‍යතෙ. කෘත්තද්ධිතසමාසාශ්ච. ප්‍රාතිපදිකසංඥා ඉති කෙචිත්.**

---

77. (නාමසංඥාසූත්‍රයි) අවිභක්ති, විභක්තිරහිතවූ ශබ්ද රූපය; නාම, නාම වෙයි.

a. විභක්ති රහිතං, විභක්ති විරහිතවූද, හෙවත් විභක්ත්‍යන්ත නොවූද; ධාතුවර්ජිතම ධාතුසංඥාවෙන් තොරකරණ ලද්දාවූද; අර්ථවත්, අර්ථයක් ඇත්තාවූ; ශබ්දරූපං, ශබ්දස්වරූපය; නාම උච්‍යතෙ, නාමයයි කියනුලැබේ. කෘත්තද්ධිතසමාසාශ්ච, කෘදන්ත තද්ධිතාන්ත සමාසාන්තයෝ ද නාම නම් වෙත්; ප්‍රාතිපදිකසංඥා ඉති, ප්‍රාතිපදිකසංඥා ඇත්තාහුයයි; කෙචිත්, සමහරු කියත්.

මෙහි විභක්තිරහිත ශබ්දස්වරූපය නාමයයි සූත්‍රෝක්තයි. එය පාණිනීයාදියෙහි නිර්දිෂ්ටලක්ෂණානුසාරයෙන් විස්තර කරන්නාවූ මාධවීයාදීන් "විභක්තිරහිතං" යනාදිය කීහ, සූත්‍රයෙහි "අවිභක්ති" යන පදය පර්‍යුදාසභාවයෙහිවූ "නඤ්" නිපාතය සමග සමාසවූ බැවින් "පර්‍යුදාසඃ සදෘශග්‍රාහී" යනාදි නියමයෙන් විභක්තියට සමානවූ ශබ්දස්වරූපය නාමයයි සාමර්ථ්‍යාදියෙහි ප්‍රකාශිතයි. ව්‍යාප්තියෙහි-විභක්තීන්ගෙන් තොරවූ ද ධාතුවෙන් තොරවූ ද අර්ථවත් ශබ්දස්වරූපය නාමයයි කීහ. ඒනම් – කෙවල ධාතුවක් අර්ථවත් විය නොහැකි හෙයින්, ඒ ධාතුව හා ප්‍රත්‍යයාදිය එකතුවීමෙන් නිෂ්පන්නව සිද්ධවූ ශබ්දස්වරූපය වනාහි අර්ථවත් වේ. ඒ ධාතුස්වරූපයෙන් වර්ජිතයි, ඒ රූපය විභක්තියෙන් තොරවූයේ නාමයයි කියනුලැබේ. මෙහි පාණිනීයාදි අන්‍යව්‍යාකරණයෙන් ගෙණ "කෘත්තද්ධිතසමාසාශ්ච" යන්න කුමක් සඳහා නිර්දිෂ්ටවද යත්?, පූර්වෝක්ත පරිච්ඡේදයෙන් ධාතුවර්ජිත නොවූ අර්ථවත් කෘදන්තශබ්දයෝද භාෂාවෙහි විද්‍යමානයි, එනම්- කෘත්ප්‍රත්‍යයාන්තවූ "සොමපා" ශබ්දාදියයි, ඔවුන්ද නාම සංඥාවට ඇතුළත් කිරීම පිණිස "කෘත්" ග්‍රහණය කරණලදී, ප්‍රත්‍යයවන් ඒමෙන් පූර්වස්ථ නාමත්වය හැර නිෂ්පන්නව සිද්ධවූ තද්ධිතාන්ත ශබ්ද ද විද්‍යමානයි, එනම් "චොර" යනාදි නාමයෙන් ගෙන ස්වාර්ථයෙහි "අණ්" ප්‍රත්‍යයාදියවීමෙන් සිද්ධවූ "චෞර" ශබ්දාදියයි' ඔවුන් ප්‍රත්‍යය යෝගයෙන් අර්ථාන්තරාන්විත නුවූවත් පූර්වාවස්ථාවෙන් භින්න බැවින් නැවත පෙර තුබූනු

78. තස්මාත් සි ඖ ජස්, අම් ඖ ශස්, ටා භ්‍යාම් භිස්, ඞෙ භ්‍යාම් භ්‍යස්, ඞසි භ්‍යාම් භ්‍යස්, ඞස් ඔස් ආම්, ඞි ඔස් සුප්.

(තස්මාත් 5 1; සි ඖ ජස් — ඞි ඔස් සුප් 1, 3;)

a. **තස්මාන්නාම්නඃ පරාඃ ස්‍යාදයඃ සප්තවිභක්තයො භවන්ති; තත්‍රාප්‍යර්ථමාත්‍රෛකත්වවිවක්ෂායාං ප්‍රථමෛකවචනං සිඃ.**

"චොර" යන නාමය චෞරත්ව සිද්ධවූ "චෞර" යන නාමයයි සංඥාන්තරයක් කිරීම පිණිස "තද්ධිත" ග්‍රහණය කරණලදී. ඒ ඒ සමාසයන්හි සමස්‍යමාන ශබ්දයෝ සාමාන්‍යාවස්ථාවෙහිදී විභක්ත්‍යන්තව පදබවට පැමිණෙත්, පසුව ඔවුන් සමස්තාවස්ථාවෙහි තත්තද්විභක්තිලෝපාදියෙන් විගතපදභාවයට පැමිණ අන්‍යස්වරූපවූ එක නාමත්වයක් භජනය කරන්නෝ වෙති. එසේවූ ඒ නාමයන් කෙරෙන් ද විභක්ති යොදා නානාකාර්‍යාදි අර්ථ ප්‍රකාශකිරීම උචිතනාබැවින් ඔවුන්ට ද නාමසංඥාකරණය පිණිස "සමාස" ග්‍රහණය කරණලදී. මෙසේ පෙනෙනකල්හි නව විභක්තිරහිතවූයේ නාමයයි පූර්වෝක්ත බැවින් මෙහි පූර්ව විභක්ත්‍යවස්ථාව සලකා "එකදෙශවිකෘතමනන්‍යවද්භවති" යනු න්‍යාය හෙයින් නැවත විභක්ති කිරීම නොහැකිනි වේ. "අර්ථවදධාතුරප්‍රත්‍යයඃ ප්‍රාතිපදිකම්" යනුද "කෘත්තද්ධිතසමාසාශ්ච" යනුද පාණිනීයාදියෙහි ප්‍රාතිපදිකසංඥාසූත්‍රයි "ප්‍රාතිපදික, ලිඞ්ග" යනු ද "නාම" යන්නෙහි පර්‍යායනාමයෝයි

78. (විභක්තිවිධිසූත්‍රයි) තස්මාත්, ඒ නාමය කෙරෙන් පරව; සිඖජස්, "සි ඖජස්" යන තුණ ද; අම් ඖ ශස්, "අම් ඖ ශස්" යන තුණද; ටාභ්‍යාම් භිස්, "ටා භ්‍යාම් භිස්" යන තුණද; ඞෙභ්‍යාම්භ්‍යස්, "ඞෙ භ්‍යාම් භ්‍යස්" යන තුණද; ඞසිභ්‍යාම්භ්‍යස්, "ඞසි භ්‍යාම් භ්‍යස්" යන තුණද; ඞස් ඔස් ආම්, "ඞස් ඔස් ආම්" යන තුණද; ඞිඔස්සුප්, "ඞි ඔස් සුප්" යන තුණද වෙත්.

a. තස්මාත් නාම්නඃ, ඒ නාමය කෙරෙන්; පරාඃ, පරව; ස්‍යාදයඃ, සි ආදිවූ; සප්තවිභක්තයඃ, විභක්ති සත; භවන්ති, වෙත්. තත්‍රාපි, එහිද; අර්ථමාත්‍ර, ලිඞ්ගාර්ථය සම්බන්ධවූ; එකත්වවිවක්ෂායාං, එකත්වභාවයක් කියනු කැමතිකල්හි; ප්‍රථමෛක වචනං, ප්‍රථමාඑකවචනවූ; සිඃ, සිවිභක්තිය යෙදියයුතුයි.

මේ සූත්‍රය මීපදයි, එහෙත් සමහරු සාරාදීන් ත්‍රිකයක් ප්‍රායා විභක්ත්‍යන්තවශයෙන් ගෙණ අෂ්ටාදිකයෝද, සමහරු

අකාරාන්තඃ පුල්ලිඞ්ගො දෙවශබ්දඃ, "දෙව + සි" ඉති ස්ථිතෙ-ඉකාරඃ සෙරිති විශෙෂණාර්ථඃ

79. ස්‍රොර්විසර්ගඃ. (පාඃ 6, 2; සිද්ධාඃ 1, 1;)

b සකාරරෙඵයොර්විසර්ජනීයාදෙශො භවත්‍යධාතො රසෙ පදාන්තෙ ච, * වකාරාත්පදාන්තෙ උභයොර්ධාතුනාමිනොඃ, දෙවඃ.

සි ආදිය වෙන් වෙන්ව විභක්ත්‍යන්තවශයෙන් ගෙණ චාවිංශති පදිකායයිද කීහු. මෙයින් සංඥාවිශෙෂයක්ද ගම්‍යමානයි. එනම් "සි ඖ ජස්" යනාදීහු තුණ තුණ පිළිවෙළින් "ප්‍රථමා, ද්විතීයා, තෘතීයා චතුර්ථී, පඤ්චමී, ෂෂ්ඨී, සප්තමී" යන මේ විභක්තිසංඥා ඇත්තෝ වෙත්, ඒ "සි ඖ ජස්" ආදි ත්‍රිකයන්හි ද එකක් එකක් එකද්විබහුවචන සංඥා ඇත්තෝද වෙත්. එහි- "සි ජස්, ශස්, ටා, ඞෙ, ඞස්, ඞි, සුප්" යන මේ විභක්තිවල පිළිවෙළින් "ඉ, ජ්, ශ්' ට්, ඞ්, ඞ්, ඞ්, යන මොහුද "ඞසි" යන්හි "ඞඉ" යන දෙකද ඉත් අකුරුයි, ඔවුන්ගේ ප්‍රයොජන වක්ෂ්‍යමානවූ "ඉකාරඃ සෙරිති විශෙෂණාර්ථඃ" යනාදියෙන් ප්‍රකාශකරුණු ලැබෙත්. සුබෝක්ත නාම සංඥකයන් අතුරෙන් ප්‍රථමකොට අකාරාන්ත යන්ගේ විභක්තිරූප නිරූපණය කරන්නාහු "අකාරාන්තඃ" යනාදිය කීහු.

a අකාරාන්තඃ පුංලිඞ්ගඃ, අකාරාන්තපුංලිඞ්ගවූ; දෙවශබ්දඃ, දෙවශබ්දය කියනු ලැබේ. දෙවසිඉති, "දෙවසි" කියා; ස්ථිතෙ, සිටිකල්හි (පදසිද්ධිය වක්ෂ්‍යමාණාකාරවේ;) ඉකාරඃ, (සියන්නෙහි) ඉකාරය තෙම; සෙඃ ඉති, "සෙඃ" යි; විශෙෂණාර්ථඃ, වෙසෙසා කීම ප්‍රයොජනකොට ඇත්තේය. සිවිභක්තියේ ඉකාරය ඉත්වශයෙන් යොදනලද්දේ "සෙරො" යනාදි සූත්‍රයොජනාවන්හි ප්‍රකෘති සයන්නෙන් වෙන්කොට දක්වීම පිණිසයි, එහි ඉකාරය ඉත් බැවින් ලොප්ව "දෙව + ස්" කියා සිටී.

79. (විසර්ගාදෙශවිධි සූත්‍රයි) ස්‍රොඃ, සකාර රෙඵ දෙකට; විසර්ගඃ, විසර්ගාදෙශ වේ.

b ර්සෙ, රසප්‍රත්‍යාහාරය පරකල්හි ද; පදාන්තෙ ච, විරාමය පරකල්හි ද; අධාතොඃ, ධාතුසම්බන්ධිනුවූ; සකාරරෙඵයොඃ, සකාරරෙඵදෙකට; විසර්ජනීයාදෙශඃ භවති, විසර්ගාදෙශ වේ. වකාරාත්, වග්‍රහණයෙන්; පදාන්තෙ, විරාමය පරකල්හි;

---

* මේ පාඨය ඇතැම් පොත්හි අදෘශ්‍යමානයි. මෙය තුබූනත් අර්ථවිරොධයක් නොවේ.

a ද්විත්වවිවක්ෂායාං ඖ, "ඖ ඖ ඖ" (පු. සූ. 33) දෙවෞ, බහුත්වවිවක්ෂායාං "දෙව + ජස්" ඉති ස්ථිතෙ ජකාරොජසිති විශෙෂණාර්ථඃ, ජකාරස්‍යෙත්සංඥා, ඉත්සංඥායාං තස්‍ය ලොපඃ, "දෙව + අස්" ඉති ස්ථිතෙ දීර්ඝවිසර්ගෞ' දෙවාඃ,

b "අකාරාජ්ජසොසුක් ඝඩ්විමිතනව්‍යෂඡන්දසි" කින්තා දන්තෙ; දෙවාසඃ, බ්‍රාහ්මණාසඃ.

උභයොඃ ධාතුනාමිනොඃ, ධාතු නාම දෙක (ම්) සම්බන්ධව වෙ. දෙවඃ, ප්‍රථමෛකවචනයෙහි "දෙවඃ" යනු වී. (දෙවඃ, දෙවතෙම)

ර- ප්‍රත්‍යාහාරය හෝ විරාමය පරකල්හි නාම සම්බන්ධි සකාරරකාර දෙකට ද, විරාමය පරකල්හි ධාතුසම්බන්ධි සකාර රකාර දෙකට ද විසර්ගය වේ. "ආශොත, විභතීති" යනාදියෙහි ධාතුසම්බන්ධි බැවින් රසප්‍රත්‍යාහාරය පරනිමිත්තකොට සකාර රකාරයන්ට විසර්ගය නොවී.

a ද්විත්වවිවක්ෂායාං, (ලිඞ්ගාර්ථයාගේ) ද්විත්වයක් කියනු කැමතිකල්හි; ඖ, "ඖ" විභක්තිය වේ. ඖ ඖ ඖ, "ඖ ඖ ඖ" යන සූත්‍රයෙන් සන්ධිවූකල්හි; දෙවෞ, "දෙවෞ" යනු වේ. දෙවෞ (දෙවියෝ දෙදෙනෙක් තුමූ:) බහුත්වවිවක්ෂායාං, බොහෝ බවක් කියනු කැමතිකල්හි; දෙවජස් ඉති, "දෙව ජස්" කියා; ස්ථිතෙ, සිටිකල්හි; ජකාරඃ, ජකාරය තෙම; ජසිති, "ජසි" යනාදි සූත්‍රයන්හි 'ජසි' කියා; විශෙෂණාර්ථඃ, වෙසෙසා කීම ප්‍රයොජන කොට ඇත්තේය. ජකාරස්‍ය, ජකාරයට; ඉත්සංඥා, ඉත්සංඥා වේ. ඉත් සංඥායාං, ඉත්සංඥාවූකල්හි; තස්‍ය, ඊට; ලොපඃ, ලොප්වේ. දෙව අස් ඉති, "දෙව + අස්" කියා; ස්ථිතෙ, සිටිකල්හි; දීර්ඝවිසර්ගෞ, දීර්ඝය විසර්ගය යන දෙක වෙත්. දෙවාඃ, ප්‍රථමා බහුවචනයෙහි "දෙවාඃ" යනුවේ. (දෙවාඃ, දෙවියෝ තුමූ)

b ඡන්දසි, වෙදයෙහි; ක්වචිත්, කිසිතන්හි; අකාරාත්, අකාරාන්ත යෙකරෙන් පරවූ; ජසඃ, ජස්විභක්තියට, අසුක්, "අසුක්" ආගමය; වක්තව්‍යඃ, කියයුතුයි. කිත්ත්වාත් කකාරය ඉත් අකාට ඇතිබැවින්; අන්ත, අන්තයෙහි වේ. දෙවාසඃ බ්‍රාහ්මණාසඃ, "දෙවාසඃ, බ්‍රාහ්මණාසඃ" යනු ඊට උදාහරණයි. ("අසුක්" යන්නේ උයන්න හා කයන්න ද ඉත් අකුරුයි, උයන්න උච්චාරණය පිණිසයි, කයන්න ස්ථාන නියමය පිණිසයි, මෙහි ජස් විභක්තියට "අසුක්" ආගම කළකල්හි "දෙව අස්අස් කියා වේ, නැවත දීර්ඝය හා විසර්ගය කළකල්හි "දෙවාසඃ" යනුවේ, "බ්‍රාහ්මණාසඃ" යනුද මෙසේයි.

a ද්විතීයෛකවචනෙ "දෙව + අම්" ඉති ස්ථිතෙ;-

80. අම්ශසෝරස්‍ය. (අම්ශසෝඃ 6, 2; අස්‍ය 6, 1;)

b **සමානාදුත්තරයෝරම්ශසෝරකාරස්‍ය ලෝපො භවති අධාතොඃ. දෙවම්, (පූර්වවත්) දෙවෞ. බහුත්ව විවක්ෂායාං "දෙව + ශස්" ඉති ස්ථිතෙ ශකාරඃ ශසිති විශෙෂණාර්ථඃ.**

81. සො නඃ පුංසඃ. [සඃ 6, නඃ 1, 1; පුංසඃ 5, 1;]

c **පුංලිඞ්ගාත්සමානාදුත්තරස්‍ය ශසඃ සකාරස්‍ය නකාරාදෙශො භවති.**

82. ශසි. (ශසි 7, 1;)

---

a. ද්විතීයෛකවචනෙ, ද්විතීයාඑකවචනයෙහි; දෙව + අම් ඉති, "දෙව + අම්" කියා; ස්ථිතෙ, සිටිකල්හි:-

80. (ලෝපවිධිසූත්‍රයි) අම්ශසෝඃ, (සමානවර්ණයා කෙරෙන් පර) අම් ශස් විභක්ති දෙක සම්බන්ධිවූ; අස්‍ය, අකාරයාට (ලෝප්වේ)

b අධාතොඃ, ධාතුරහිතවූ; සමානාත් උත්තරයෝඃ, සමාන වර්ණයා කෙරෙන් පරවූ; අම්ශසෝඃ, අම් ශස් දෙදෙනාගේ; අකාරස්‍ය, අකාරයට; ලෝපඃ භවති, ලෝප්වේ. දෙවම්, "දෙවම්" යනුවේ. (දෙවම්, දෙවියා.) (මෙහි ධාතුරහිතයා කෙරෙන්යයි කීමෙන් ක්විප්‍රත්‍යයාන්තවූ සොමපා" ශබ්දාදීන්ගෙන් පර "අම්ශස්" දෙකේ අයත්නට ලෝප් නොවේ.) පූර්වවත්, පෙර මෙන්; දෙවෞ, ද්විවචනයෙහි "දෙවෞ" යනුවේ. දෙවෞ, (දෙවියන් දෙදෙනකුන්.) බහුත්වවිවක්ෂායාං, බොහෝ බවක් කියන කැමති කල්හි; දෙව ශස් ඉති, "දෙව + ශස්" කියා; ස්ථිතෙ, සිටිකල්හි; ශකාරඃ ශකාරය තෙම; ශසිති, "ශසි" යනාදිය සූත්‍ර යන්හි 'ශසි' කියා; විශෙෂණාර්ථඃ, වෙසෙසා කීම ප්‍රයෝජන කොට ඇත්තේය.

81. (නකාරාදෙශවිධිසූත්‍රයි) පුංසඃ, පුංලිඞ්ගයා කෙරෙන් පරවූ; ශසඃ, (ශස්විභක්තිහුගේ) සකාරයට; නඃ, නකාරාදෙශ වේ.

c. පුංලිඞ්ගාත්, පුංලිඞ්ගවූ; සමානාත්, සමානවර්ණයා කෙරෙන්; උත්තරස්‍ය, මත්තෙහිවූ; ශසඃ, ශස්විභක්තිහුගේ; සකාරස්‍ය, සකාරයට; නකාරාදෙශඃ, භවති, නකාරාදෙශ වේ.

82. (දීර්ඝවිධිසූත්‍රයි) ශසි; ශස්විභක්ති පරකල්හි (පූර්වයට දීර්ඝ වේ.)

a **ශසි පරෙ පූර්වස්‍ය දීර්ඝො භවති. "යදාදෙශස්තද්වද්භවති" දෙවාන්.**

b **තෘතීයෛකවචනෙ "දෙව + ටා" ඉති ස්ථිතෙ ටකාරො නුබන්ධඃ ස්වරෙනෙති විශෙෂණාර්ථඃ. උච්චරිතප්‍රධ්වංසිත්වාදනුබන්ධඃ.**

83. ටෙන, (ටා 1, 1; ඉන 1, 1,)

c **අකාරාත්පරෂ්ටා ඉනො භවති. "අ ඉ එ" (ප්‍ර. සූ. 27) දෙවෙන.**

---

a ශසි පරෙ, ශස්විභක්ති පරකල්හි; පූර්වස්‍ය, (ඉන්) පූර්වවූ ස්වරයට; දීර්ඝඃ භවති, දීර්ඝ වේ. ("තස්මින්නිති නිර්දිෂ්ටෙ පූර්වස්‍ය" යනු කීහෙයින් මෙහිදු "ශසි" යන සප්තමීනිර්දේශයෙන් පූර්වයට දීර්ඝ වන බැව් හැඟේ.) යදාදෙශඃ, යමකට ආදෙශයක් වීනම් (එය;) තද්වත්, එමෙන් නොහොත් පෙර මෙන්; භවති, වේ.

මේ පූර්වසූත්‍රමෙයන් එකහින් "ශස්" විභක්තිහුගේ ආදි ලෝපය හා අන්තෙන් ශෙෂවූ සකාරයට 'න්' යන්න ආදෙශව "දෙවන්" යයි සිටි, එතැන් මේ සූත්‍රයෙන් ශස්විභක්තිය පරකල්හි දීර්ඝය නියමිතයි, ඒ මේ න්‍යාය පරිද්දෙන් වියයුතුයි, එනම්-යමකට ආදෙශයක් (හෝ ලෝපයක්) වීමෙන් එහි වෙනසක් වුවත් ඒ පරිද්දෙන් සලකා ඒ පරනිමිත්තතන් කටයුතු විධි වෙත් යනුයි, හෙද යථාර්ථව භාවයෙහි, 'ඉෂ්ටසාධනාර්ථමෙව න්‍යායඃ සංක්‍රියතෙ නත්වනිෂ්ටසාධනාර්ථම්" යන ප්‍රාමොක්තියෙන් ඒ ප්‍රකාශිතයි, ඉෂ්ටසිද්ධිය පිණිසම න්‍යාය ප්‍රකාශකරණු ලැබේ. අනිෂ්ටවූවක් සිද්ධකිරීම පිණිස නොවේ යනු එහි භාවයයි.

b. තෘතීයෛකවචනෙ, තෘතීයාඑකවචනයෙහි; දෙවටා ඉති, "දෙව + ටා" කියා; ස්ථිතෙ, සිටිකල්හි; අනුබන්ධඃ, අනුබන්ධවූ; ටකාරඃ, ටකාරය තෙම; ටෙනඉති, 'ටෙන" යනාදි සූත්‍රයන්හි; විශෙෂණාර්ථඃ, වෙනසප්‍රයෝජනකොට ඇත්තේය. අනුබන්ධඃ; හි, අනුබන්ධ වනාහි; උච්චරිතප්‍රධ්වංසී, උසුරුවීමෙන් පසු නැසෙන සුලු වේ.

83. (ඉන ආදෙශවිධිසූත්‍රයි) ටා, (අකාරයා කෙරෙන් පරවූ) ටාවිභක්තියට; ඉන, ඉන ආදෙශ වේ.

c. අකාරාත් පරඃ, අකාරයා කෙරෙන් පරවූ; ටා, ටාවිභක්තියට; ඉනඃ භවති, ඉනාදෙශ වේ. අඉඑ, "අඉඑ" යන සූත්‍රයෙන් සන්ධිවූ කල්හි, දෙවෙන "දෙවෙන" යනු වේ. (දෙවෙන, දෙවිහු විසින්;)

84. අදභි. (අත් 1, 1; භි 7, 1;)

a. අකාර ආ භවති භකාරෙ පරෙ. දෙවාභ්‍යාම්.

85. භිස්‍යඃ (භ් 6, 1; ස 6, 1; අඃ 1, 1;)

b. අකාරාන්තපරස්‍ය භිසඃ සකාරස්‍ය අකාරො භවති, "අ ඉ ඒ" (27 ප්‍ර. සූ.) "දෙව + ඒස්" ඉතිස්ථිතෙ වෘද්ධිවිසර්ගෞ, දෙවෛඃ.

c "අකාරස්‍ය භිසි ඡන්දස්‍යෙකාරො වක්තව්‍යඃ" දෙවෙභිඃ, කර්ණෙභිඃ. චතුර්ථ්‍යෙකවචනෙ දෙව + ඞෙ ඉති ස්ථිතෙ-ඞකාරො ඞිත්කාර්‍ය්‍යාර්ථඃ සඤ්ඥා.

---

84. (දීර්ඝවිධිසූත්‍රයි) භි, (විභක්තිසම්බන්ධි) භකාරය පරකල්හි; අත්, අකාරය (දීර්ඝ වේ.)

a භකාරෙ පරෙ, භකාරය පරකල්හි; අකාරඃ, අකාරයතෙම; ආ භවති, ආයන්නක් වේ. දෙවාභ්‍යාම්, තෘතීයා ද්විවචනයෙහි "දෙවාභ්‍යාම්" යනු වේ (දෙවාභ්‍යාම්, දෙවියන් දෙදෙනක් විසින්)

85. (අකාරාදෙශවිධිසූත්‍රයි) භි, භිස් විභක්තිය සම්බන්ධිවූ ස්, සකාරයට; අඃ, අකාරයක් වේ.

b. අකාරාන්තපරස්‍ය, අකාරයා කෙරෙන් පරවූ; භිසඃ, භිස් විභක්තිහුගේ; සකාරස්‍ය, සකාරයට; අකාරඃ භවති, අකාරාදෙශවේ. අඉඒ, "අඉඒ" යන සූත්‍රයෙන් අකාර ඉකාර දෙකට ඒකාරය වේ; දෙව ඒස් ඉති, "දෙව ඒස්", කියා; ස්ථිතෙ, සිටි කල්හි; වෘද්ධිවිසර්ගෞ, වෘද්ධිය විසර්ගය යන දෙක වෙත්. දෙවෛඃ, තෘතීයා බහුවචනයෙහි "දෙවෛඃ" යනු වේ. (දෙවෛඃ, දෙවියන් විසින්)

මෙහි "භි" යන්නෙන් "භිස්" විභක්තිය ගනුලැබේ. "සංඥෛකදෙශාඃ සංඥිතා භවන්ති" යනු න්‍යායයි, සංඥාවන්ගේ එකදෙශයෝ ද සංඥා ඇත්තෝ වෙති යනු එහි අදහසයි, මෙහි "භිස්" යන්න වෙනුවට තදෙකදෙශයක්වූ "භි" යන්න ව්‍යවහෘතයි, "දෙවෛඃ" යන රූපසිද්ධියෙහි "දෙව" ශබ්දයා කෙරෙන් පර "භිස්" විභක්තිහුගේ භකාරයේ ඉකාරය වෙන්කොට "දෙව + භ් ඉස්" කියා තබාගතයුතුයි, පසුව මේ සූත්‍රයෙන් භකාරයට ආකාරය කොට ප්‍රථමයෙන් "අඉ" දෙකට ඒයන්න ද පසුව වකාරයේ අකාරයට හා "ඒ" යන්නට "ඓ" යන්නද සකාරයට විසර්ගයද කටයුතුයි.

c. ඡන්දසි, වේදවිෂයෙහි; භිසි, භිස් විභක්තිය පරකල්හි; අකාරස්‍ය, අකාරයට; ඒකාරඃ, ඒකාරය; වක්තව්‍යඃ, කියයුතුයි.

86. ඞෙ අක්. (ඞෙ 6, 1; අක් 1, 1;)

a අකාරාන්තපරස්‍ය ඞෙ ඉත්‍යෙතස්‍යාගාගමො භවති, කිත්වාදන්ත. "ඒ අය්" (20 ප්‍ර. සූ.) "සවර්ණෙ දීර්ඝඃ සහ" (2[illegible] ප්‍ර. සූ.) දෙවාය දෙවාභ්‍යාම්.

87. ඒසභි බහුත්වෙ. (ඒ 1, 1; සභි 7, 1; බහුත්වෙ 7, 1;)

b අකාරස්‍ය ඒත්වං භවති සකාරෙ භකාරෙච පරෙ බහුත්වෙ සති, දෙවෙභ්‍යඃ. පඤ්චම්‍යෙකවචනෙ දෙව + ඞසි + ඉතිස්ථිතෙ ඉකාරඃ ප්‍රත්‍යයභෙදඥාපනාර්ථඃ.

"දෙවෙභිඃ කර්ණෙභිඃ" යනු ඊට උදාහරණයි. චතුර්ථ්‍යෙකවචනෙ, චතුර්ථීඑකවචනයෙහි; දෙවඞෙඉති, "දෙව + ඞෙ" කියා; ස්ථිතෙ, සිටිකල්හි (වක්ෂ්‍යමාණකාරණයෙන් පදසිද්ධිය කටයුතුයි.) ඞකාරඃ, (ඉත් සංඥක) ඞකාරය; සඤ්ඥා, සැමතන්හි; ඞිත්කාර්‍ය්‍යාර්ථඃ, ඞිත් කරණයෙන් කටයුතුදේ ප්‍රයෝජනකොට ඇත්තේය. ("ඞිති" යනාදි සූත්‍රයන්ගෙන් නියමිත ඒ ඒ විධි ඞකාරය ඉත්කොට ඇති "ඞෙ, ඞසි, ඞස්, ඞි" යන විභක්ති සතරම පරකල්හි කිරීම ඞකාර ඉත්කරණයෙහි ප්‍රයෝජනයයි.)

86. (අක් ආගමවිධිසූත්‍රයි) ඞෙ, (අකාරයා කෙරෙන් පර) ඞෙ විභක්තියට; අක්, අක් ආගමවේ.

a අකාරාන්තපරස්‍ය, අකාරයා කෙරෙන් පරවූ; ඞෙ ඉති, "ඞෙ" යන; එතස්‍ය මොහුසම්බන්ධව; අක්ආගමඃ භවති, අක් ආගම වේ. කිත්වාත්, කකාරය ඉත්කොට ඇතිබැවින්; අන්තා අන්තයෙහි වේ. "ඒ අය්" යන සූත්‍රයෙන් ඒකාරයට "අය්", ආදෙශ වේ; "සවර්ණෙ දීර්ඝඃ සහ" යන සූත්‍රයෙන් දීර්ඝ වේ. දෙවාය, චතුර්ථීඑකවචනයෙහි "දෙවාය" යනුද; දෙවාභ්‍යාම්, ද්විවචනයෙහි "දෙවාභ්‍යාම්" යනුද වේ. (දෙවාය, දෙවියාට; දෙවාභ්‍යාම්, දෙවියන් දෙදෙනකුන්ට;)

87 (ඒකාරාදෙශවිධිසූත්‍රයි) බහුත්වෙ, බහුවචනත්වයෙහි (පවත්නාවූ;) සභි, සකාරය හෝ භකාරය පරකල්හි, ඒ, (අකාරයට) ඒකාරය වේ.

b. බහුත්වෙ සති, බහුවචනභාවය ඇතිකල්හි; සකාරෙ, සකාරයද, භකාරෙ ච, භකාරයද; පරෙ, පරකල්හි; අකාරස්‍ය, අකාරයට; ඒත්වං භවති, ඒකාර බව වේ. දෙවෙභ්‍යඃ, චතුර්ථී බහුවචනයෙහි "දෙවෙභ්‍යඃ" යනු වේ. (දෙවෙභ්‍යඃ, දෙවියන්ට;)

88. ඞසිරත්. (ඞසිඃ 1, 1; අත් 1, 1;)

a **අකාරාන්තපරෙ ඞසිරත් භවති; දෙවාත් දෙවාභ්‍යාම් දෙවෙභ්‍යඃ. ෂෂ්ඨ්‍යෙකවචනෙ "දෙව + ඞස්" ඉති ස්ථිතෙ:-**

89 ඞස් ස්‍ය. (ඞස් 1, 1; ස්‍ය, 1;)

b **අකාරාන්තපරෙ ඞස් ස්‍යො භවති, දෙවස්‍ය.**

90 ඞි. (ඞි 7, 1;)

c **අකාරස්‍ය ඞි පරෙ එත්වං භවති. "එ අය්"** (20 ප්‍ර. සූ.) **දෙවයොඃ.**

පඤ්චම්‍යෙකවචනෙ, පඤ්චමීඑකවචනයෙහි; දෙව ඞසි ඉති, "දෙව + ඞසි" කියා; ස්ථිතෙ, සිටිකල්හි; ඉකාරඃ, අනුබන්ධ ඉකාරය; ප්‍රත්‍යයභෙදවිඥාපනාර්ථඃ, ප්‍රත්‍යයෙහි වෙනස ඇඟවීම් ප්‍රයොජනකොට ඇත්තේ වේ. (ෂෂ්ඨී එකවචනයෙහි යෙදෙන විභක්තියද "ඞස්" යන්න බැවින් පදසිද්ධියෙහිලා මේ එයින් වෙනස්කොට දැක්වීම පිණිස ඉ යන්නා ඉත්වශයෙන් යොදන ලදී.)

88. (අත් ආදෙශවිධිසූත්‍රයි) ඞසිඃ, (අකාරයා කෙරෙන්) පර ඞසි විභක්තිය; අත්, "අත්" ආදෙශ වේ.

a. අකාරාත් පරඃ, අකාරයාකෙරෙන් පරවූ; ඞසිඃ, ඞසි විභක්තිය; අත්භවති, "අත්" ආදෙශ වේ. පඤ්චමීඑකවචනයෙහි 'දෙවාත්' යනුද, ද්විවචනයෙහි "දෙවාභ්‍යාම්" යනුද, බහුවචනයෙහි "දෙවෙභ්‍යඃ" යනුද වේ. (දෙවාත්, දෙවියාකෙරෙන්; දෙවාභ්‍යාම්, දෙවියන් දෙදෙනාකුන් කෙරෙන්; දෙවෙභ්‍යඃ, දෙවියන් කෙරෙන්;) ෂෂ්ඨ්‍යෙකවචනෙ, ෂෂ්ඨීඑකවචනයෙහි; දෙව ඞස් ඉති, "දෙව+ඞස්" කියා; ස්ථිතෙ, සිටිකල්හි:-

89 (ස්‍යාදෙශවිධිසූත්‍රයි) ඞස්, (අකාරයා කෙරෙන් පර) ඞස් විභක්තිය; ස්‍ය, "ස්‍ය" ආදෙශ වේ.

b අකාරාත් පරඃ, අකාරයා කෙරෙන් පරවූ; ඞස්, ඞස්විභක්තිය ස්‍යඃ භවති, "ස්‍ය" ආදෙශ වේ. දෙවස්‍ය, ෂෂ්ඨීඑකවචනයෙහි "දෙවස්‍ය" යනු වේ. (දෙවස්‍ය, දෙවියාගේ;)

90 (එකාරාදෙශවිධිසූත්‍රයි) ඞි, ඞිවිභක්තිය පරකල්හි; (අකාරයට එකාරය වේ.)

c ඞි පරෙ, ඞිවිභක්තිය පරකල්හි; අකාරස්‍ය, අකාරයට; එත්වං භවති, එකාරබව වේ. "එ අය්" යන සූත්‍රයෙන් එකාරයට "අය්" ආදෙශ වේ. දෙවයොඃ; ෂෂ්ඨීද්විවචනයෙහි "දෙවයොඃ" යනු වේ. (දෙවයොඃ, දෙවියන් දෙදෙනාකුන්ගේ)

91. නුඩාමඃ (නුට් 1, 1; ආමඃ 6, 1;)

a **සමානාදුත්තරස්‍යාමො නුඩාගමො භවති. ටිත්ත්වා දාදෞ, උකාර උච්චාරණාර්ථඃ.**

92. නාමි. (නාමි 7, 1;)

b **නාමි පරෙ පූර්වස්‍ය දීර්ඝො භවති; දෙවානාම්.**

c **සප්තම්‍යෙකවචනෙ දෙ + ඞි ඉති ස්ථිතෙ:- "අඉඑ"** (27. ප්‍ර. සූ.) **දෙවෙ, දෙවයොඃ. බහුත්වවිවක්ෂායාං- දෙව + සුප් ඉති ස්ථිතෙ:- පකාරස්‍යෙත්සංඥායාං ලොපඃ, "එසහි බහුත්වෙ"** (87. ප්‍ර සූ)

---

91. (නුට් ආගමවිධිසූත්‍රයි,) ආමඃ, සමානවර්ණයාකෙරෙන් (පර ආම්විභක්තියට); නුට්, නුට් ආගම වේ.

a සමානාත්, සමානවර්ණයාකෙරෙන්; උත්තරස්‍ය, මත්තෙහිවූ; ආමඃ, ආම්විභක්තියට; නුඩාගමඃ භවති, නුට්ආගම වේ. ටිත්ත්වාත්, ටකාරය ඉත්කොට ඇතිබැවින්; ආදෞ, (ආම් විභක්තිහුගේ) ආදීයෙහි වේ. උකාරඃ, උකාරය; උච්චාරණාර්ථඃ, උසුරුවීම ප්‍රයොජනකොට ඇත්තේය.

92. (දීර්ඝවිධිසූත්‍රයි) නාමි, නාම් යන්න පරකල්හි; (පූර්වයට දීර්ඝ වේ)

b. නාමි පරෙ, නාම් යන්න පරකල්හි; පූර්වස්‍ය, ඉන් පූර්වවූ ස්වරයට; දීර්ඝඃ භවති, දීර්ඝ වේ. දෙවානාම්, ෂෂ්ඨීබහුවචනයෙහි "දෙවානාම්" යනු වේ. (දෙවානාම්, දෙවියන්ගේ;) මෙහි "නාම්" යනු "නුට්" ආගමසහිත ආම්විභක්තියයි.

c සප්තම්‍යෙකවචනෙ, සප්තමීඑකවචනයෙහි; දෙව ඞි ඉති, "දෙව + ඞි" කියා; ස්ථිතෙ, සිටිකල්හි, අඉඑ, "අඉඑ" යන සූත්‍රයෙන් සන්ධිව; දෙවෙ, "දෙවෙ" යනු වේ. දෙවයොඃ, ද්විවචන යෙහි "දෙවයොඃ" යනු වේ. (දෙවෙ, දෙවියා කෙරෙහි; දෙවයොඃ, දෙවියන් දෙදෙනාකුන් කෙරෙහි) බහුත්වවිවක්ෂායාං; (සප්තමී) බහුවචනබවක් කියනුකැමති කල්හි; දෙව සුප් ඉති, "දෙව + සුප්" කියා ස්ථිතෙ, සිටිකල්හි; (වක්ෂ්‍යමාණකාරණයෙන් පදසිද්ධිය කටයුතුයි.) ඉත්සංඥායාං, ඉත් සංඥායෙහි ලා; පකාරස්‍ය, පකාරයට; ලොපඃ, ලොප් වේ. "එසහිබහුත්වෙ" යන සූත්‍රයෙන් අකාරයට එකාරය වේ.

93. කවිලාත් ෂඃ සඃ කෘතස්‍ය.

අතියුෂ්මයාම් අත්‍යස්මයාම් ඉති, "අතියුෂ්මයාම් අත්‍යස්මයාම්" යනුද; එකෙ, සමහරු කියත්. "අතියුෂ්මයි—අත්‍යස්මාසු" යනු සප්තමී එකවි බහුවචනයි. (මෙහි බහුවචනයෙන් සමාස වූ බැවින් "සි ජස් ඔබ ඔස්" යන විභක්ති හැර අන්තන්හි ආදෙශ විධියක් නොව ප්‍රකෘතියෙන් සිටි "යුෂ්මත් අස්මත්" ශබ්ද දෙකෙන් පදසිඩයි. තවද මේ පක්ෂත්‍රයෙහිම පදසිඩි කිරීමෙහි "ආමමෞ, ආම්ස්මෞ, (ශෙෂාණෙ නාද්‍යන්තාව්‍යඃ,) එට්ාමෙභ්‍යඃ, භ්‍යස් ශ්‍යම්, ඞසිභ්‍යසොඃ ශ්තුඃ, සාමාකම්" යන සූත්‍රොක්ත විධිහු මෙවත්.) සවීම්, (ශෙෂණාවයෙහි) සියල්ල; අනෙන ප්‍රකාරෙණ එව, මේ ප්‍රකාරයෙන්ම; ඌහනීයම්, වරනැගිය යුතුයි. යුෂ්මදස්මත්ප්‍රක්‍රියා, යුෂ්මත් අස්මත් ශබ්ද දෙක සම්බන්ධ පදසිඩි ක්‍රියාව; ඉති, මෙතෙකින් සමාප්තයි.

යුෂ්මදස්මත්ප්‍රක්‍රියාර්ථ ව්‍යාඛ්‍යා.

"යුෂ්මත් අස්මත්" ශබ්දවලට සාමාන්‍යයෙන් පැමිණෙන "ත්වම්, අහම්" යනාදි ආදෙශයන් නිර්දෙශකොට විශෙෂ ආදෙශයන් දක්වන්නාහු "අථානයොඃ" යනාදිය කීහු.

a. අථ, (යුෂ්මත් අස්මත් ශබ්ද දෙදෙනාගේ විභක්තිරූප සාධනයට) අනතුරුව; අනයොඃ, මේ "යුෂ්මත් අස්මත්" ශබ්දදෙදෙනාගේ; ආදෙශ විශෙෂවිධිඃ, (පූර්වොක්ත) ආදෙශ සම්බන්ධ විශෙෂ විධිය; නිරූප්‍යතෙ, ප්‍රකාශකරණු ලැබේ.

234. (තෙමේ ආදි ආදෙශවිධි සූත්‍රයි.) ෂෂ්ඨීචතුර්ථීද්විතීයාභිඃ, ෂෂ්ඨීචතුර්ථි ද්විතීයා විභක්ති සහිත වූ; යුෂ්මදස්මදොඃ, යුෂ්මත් අස්මත් ශබ්දදෙකට; තෙමෙ, "තෙමේ" යන දෙකද; වාංනෞ, "වාං නෞ" යන දෙකද; වස් නසෞ, "වස් නස්" යන දෙකද ආදෙශ වෙත්,

a. යුෂ්මදස්මදොර්‍යථාසංඛ්‍යගාමී ආදේශාඃ ස්‍යුඃ. කීදෘශයොඃ? ෂෂ්ඨීචතුර්ථීද්විතීයාසහිතයොඃ, සහිතග්‍රහණාද්‍යුවයොඃ පුත්‍රඃ= යුෂ්මත්පුත්‍රඃ, ආවයොඃ පුත්‍රඃ=අස්මත්පුත්‍ර ඉත්‍යාදෞ විභක්තිලොපෙ සත්‍යපි ආදේශා නෙති භේදඃ, තත්‍රෛක වචනෙන සහ තෙමෙ භවතඃ, ද්විවචනෙන වාංනෞ, බහුවච නෙන වස්නසෞ ච.

---

a. යුෂ්මදස්මදොඃ, "යුෂ්මත් අස්මත්" දෙකට; යථාසංඛ්‍යන, පිළිවෙළින්; අමී ආදේශාඃ, මේ "තෙ මෙ" යනාදි ආදේශයෝ; ස්‍යුඃ, වන්නාහ. කීදෘශයොඃ, කෙබඳු යුෂ්මත් අස්මත් ශබ්ද දෙකට ද යත් ?; ෂෂ්ඨීචතුර්ථීද්විතීයා සහිතයොඃ, ෂෂ්ඨීචතුර්ථීද්විතීයා විභක්ති සහිත යුෂ්මත් අස්මත් දෙකටයි. සහිතග්‍රහණාත්, සහිත ශබ්දයාගේ ගැණීමෙන්; යුවයොඃ, තොප දෙදෙනාගේ; පුත්‍රඃ, පුත්‍රතෙම (යන විග්‍රහයෙහි;) යුෂ්මත්පුත්‍රඃ, "යුෂ්මත්පුත්‍රඃ" යනුද; ආවයොඃ, අප දෙදෙනාගේ; පුත්‍රඃ, පුත්‍රතෙමේ (යන විග්‍රහයෙහි;) අස්මත්පුත්‍රඃ, අස්මත්පුත්‍රඃ" යනුද වේ ඉත්‍යාදෞ, මේ ආදියෙහි; විභක්තිලොපෙ සත්‍යපි, විභක්තිලොපය කළකල්හි; ආදේශාඃ, (යථොක්ත) ආදේශයෝ; න ඉති, නොවෙත්යයි; භේදඃ, භේදයම්, දතයුතුයි. තත්‍ර, එහි; එකවචනෙන සහ, එකවචන ("ඞස් ඞෙ" යන දෙක) සමග; තෙමෙ භවතඃ, "තෙ මෙ" යන දෙක වෙත්; ද්විවචනෙන, ද්විවචන ("ඕස් භ්‍යාම් ඖ" යන තුණ) සමග; වාංනෞ, "වාංනෞ" දෙක වෙත්; බහුවචනෙන, බහුවචන (ආම්, භ්‍යස්, ශස් යන තුණ) සමග; වස්නසෞ ච, "වස් නස්" යන දෙකද වෙත්.

මේ "තෙ, මෙ" ආදීහු ආදේශ විශේෂයෝයි, මොවුහු කුමක් හෙයින් ආදේශ විශේෂයෝද යත් ? ෂෂ්ඨ්‍යාදියට පූර්වයෙහි නියමිත "තව, මම" ආදිහු කොතන්හි වුවත් වියහැකි ආදේශයෝයි, මොවුහු වනාහි සියලු තන්හිම නොවියහැකි බැවින් ආදේශ විශේෂ වෙත්.

වක්ෂ්‍යමාණ වූ "ත්වාංමාංමා" යන විශේෂ සූත්‍රයෙන් ද්විතීයෛක වචනයෙහි "ත්වා මා" යන දෙක නියමකරණු ලබන බැවින් මෙහි "තෙ මෙ" යන දෙක නොවෙත්. තවද මේ සූත්‍රයෙහි "ෂෂ්ඨීචතුර්ථීද්විතීයාභිඃ"යි විභක්තිනාමයෙන් කරණලද සාමාන්‍ය නිර්දේශය වනාහි විශේෂ රහිතව ඒ ඒ විභක්ති පිළිබඳ එකම බහුවචනම ගැණීම පිණිසයි, මෙහි කී යථාසංඛ්‍යත්වය වූකලී "යුෂ්මත් අස්මත්" දෙකට පිළිවෙළින් "තෙ, මෙ" ආදි

a. ස්වාමී තෙ ස සමායාතඃ ස්වාමී මෙ සාම්ප්‍රතං ගතඃ, නමස්තෙ භගවන් භූයො දෙහි මෙ මොක්ෂමව්‍යයම්.

b. ස්වාමී වාං ස ජහාසොච්චෛර්දෘෂ්ට්වා නෞ *දුනයාචනාම්, රාජා වාං දෘශ්‍යතෙ දූනං ඥානං නෞ මධුසූදනඃ.

වශයෙන් වීමත්ද; එකවචන ද්විවචන බහුවචන යන තුණට පිළිවෙළින් "තෙමෙ, වාම් නෞ, "වස්නස්" යන ආදේශයුග්මත්‍රය වීමෙත්ද ලැබේ. මේ සූත්‍රයෙහි "ද්විතීයා චතුර්ථී ෂෂ්ඨීභිඃ"යි පිළිවෙළින් නොයොද "ෂෂ්ඨී චතුර්ථී ද්විතීයාභිඃ"යි විපරීතයෙකොට යෙදීම වනාහි මෙහිද සමාසයෙහි අල්පාච්තර ශබ්දයන්ගේ පූර්වනිපාතය උචිත බැවින්යයි බොහෝ ආචාර්‍ය්‍යයන්ගේ මතයයි. ඇතැම් අය ඒ පිළිබඳව:—

"වෛපරීත්‍යවිධානෙන නියමො නෙෂ්‍යතෙ බුධෛඃ,
අතො භවන්ති සර්වාසු විභක්තිෂු වසාදයඃ"යි

කීහු, විපරීත විධානයෙන් ආදේශයන්ගේ නියමයෙක් පණ්ඩිතයන් විසින් අභිමත නොවේ. එබැවින් මේ වස් ආදි ආදේශයෝ සියලු විභක්ති වෙහෙහි වෙත්ය යනු එහි අර්ථයි, මෙසේ පවසන්නාහු "ගෙහෙ ගතා විනුතෞ ඌම්" යනාදි මහාකවිප්‍රයොගද කීහු, ගෙය වූමෙයහි තොපි දෙදෙන කවරෙකු විසින් ගික්වතලද්දහුද යනු එහි අර්ථයි, මෙහි "වාම්" යනු ප්‍රථමා ද්විවචනයි. මේ සූත්‍රයෙහි උදාහරණ දක්වන්නාහු "ස්වාමී" යනාදි ශ්ලෝකයන් කීහු.

a. තෙ, තාගේ; සඃ ස්වාමී, ඒ සාමිතෙම; සමායාතඃ, මනාකොට පැමිණියේය. මෙ, මාගේ; ස්වාමී, ස්වාමිතෙම; සාම්ප්‍රතම්, දැන්; ගතඃ, ගියේය. (මෙහි "තෙ මෙ" යනු ස්වාමී යොගයෙහි ෂෂ්ඨී එකවචනයි.) භගවන්, එම්බා පිනැත්ත; තෙ, ඔබට; භූයඃ, නැවත නැවත; නමඃ, නමස්කාරවේවා. (මෙහි "තෙ" යනු "නමස්" යන නිපාතයොගයෙහි චතුර්ථී එකවචනයි.) මෙ, මට; අව්‍යයම්, ව්‍යයරහිත වූ; මොක්ෂම්, මොක්ෂය; දෙහි, දුනමැනව. (මෙහි "මෙ" යනු "දෙහි" යන දානක්‍රියා යොගයෙහි චතුර්ථී එකවචනයි.)

b. වාං, තොප දෙදෙනාගේ; සඃ ස්වාමී, ඒ ස්වාමිතෙම; නෞ, අප දෙදෙනාගේ; දූනයාචනාං, දූනය ඉල්වීම; දෘෂ්ට්වා, දැක; උච්චෛඃ, උසස්කොට; ජහාස, සිනාසිය. (මෙහි "වාම" යනු

* "දීනයාචනාම්" ඇතැම් තන්හි

a. දේවෝ වාමවතාද් විෂ්ණුර්නරකාන්තකෝ ජනාදීනඃ,
ස්වාමී වෝ බලවාන් රාජා ස්වාමිනෝ නෞ ජනාදීනඃ.

b. නමෝ වෝ බ්‍රහ්මවිඥෙයාය ඥානං නෝ දීයතාං ධනම්,
සානන්දාන් වඃ ප්‍රපශ්‍යාමඃ පශ්‍යාමෝ නඃ සුදුඃඛිනඃ.

235. ත්වාමාමා. (ත්වාං මාං 1, 2; අම් 3, 1;)

c. අමා සහිතයෝයුෂ්මදස්මදෝස්ත්වාමා ඉත්‍යෙතාවාදේශෞ භවතඃ.

ස්වාමීයෝගයෙහි ෂෂ්ඨී ද්විවචනයි. "නෞ" යනු "යාචනාං" යන භාවක්‍රියායෝගයෙහි ෂෂ්ඨී ද්විවචනයි.) රාජා, රජතෙම; වාං, තොප දෙදෙනාට; දානං, දානය; දීයතෙ, දෙන්නේය. මධුසූදනඃ, මධුසූදන නම් වූ විෂ්ණුතෙම; නෞ, අප දෙදෙනාට; ශුභං, ශුභය දෙන්නේය. (මෙහි "වාං නෞ" යනු "දීයතෙ" යන දානාර්ථ ක්‍රියායෝගයෙහි චතුර්ථී ද්විවචනයි.)

a. විෂ්ණුඃ දේවඃ, විෂ්ණුදෙවතෙම; වාං, තොප දෙදෙනා, අවතාත්, රකීවා. ජනාදීනඃ, ජනාදීන නම් වූ කෘෂ්ණතෙම; නෞ, අප දෙදෙනා; නරකාත්, නරකයෙන් (වෙන් කොට;) අවතාත්, රකීවා (යන තන්හි "වාං නෞ" යනු කර්මාර්ථයෙහි ද්විතීයා ද්විවචනයි.) වඃ, තොපගේ; ස්වාමී, ස්වාමී වූ; රාජා, රජතෙම; බලවාන්, බලවත් වේ. අයං ජනාදීනඃ, මේ කෘෂ්ණතෙම; නඃ, අපගේ; ස්වාමී, හිමි වේ (යන තන්හි "වඃ නඃ" යනු ස්වාමියොගයෙහි ෂෂ්ඨී බහුවචනයි.)

b. බ්‍රහ්මවිඥෙයාය, බ්‍රහ්මපදාර්ථය විශෙෂයෙන් දන්නා වූ; වඃ, තොපට; නමඃ, නමස්කාරවේවා (යන තන්හි "වඃ" යනු "නමස්" යෝගයෙහි චතුර්ථී බහුවචනයි.) නඃ, අපට; ඥානං ධනං, ඥානසඞ්ඛ්‍යාත ධනය; දීයතාං, දෙනුලැබේවා. (මෙහි "නඃ" යනු දීයතාම්" යන දානාර්ථක්‍රියා යෝගයෙහි චතුර්ථී බහුවචනයි.) වඃ, තොප; සානන්දාන්, සතුටු සහිත වූවන් (කොට;) ප්‍රපශ්‍යාමඃ, දක්නෙමු; නඃ, අප; සුදුඃඛිනඃ, ඉතා දුක් ඇත්තවුන් (කොට;) පශ්‍යාමඃ, දක්නෙමු. (මෙහි "වඃ නඃ" යනු කර්මාර්ථයෙහි ද්විතීයා බහුවචනයි.)

235. (ත්වා මා ආදේශවිධි සූත්‍රයි.) අමා, අම්විභක්තියෙන් යුක්ත වූ යුෂ්මත් අස්මත් දෙකට; ත්වාමා, "ත්වා, මා" යන ආදේශ දෙක වේත්.

c. අමාසහිතයොඃ, අම් විභක්තියෙන් යුක්ත වූ; යුෂ්මදස්මදොඃ, යුෂ්මත් අස්මත් දෙකට; ත්වාමා ඉති, "ත්වාමා" යන; එතෞ

a පශ්‍යාමි ත්වා මදලිප්තං පශ්‍ය මා මදභෙදකම්,
පශ්‍යාමි ත්වා ජගත්පූජ්‍යං පශ්‍ය මා ජගතාං පතිම්.

236. නාදෞ (න 1, 1; ආදෞ 7, 1,)

b. පාදාදෞ වර්තමානයොර්‍යුෂ්මදස්මදොරෙතෙ ආදේශා න භවන්ති.

c. මම ස්වාමී භවෙත්කෘෂ්ණස්තව ස්වාමී මහෙශ්වරඃ,
තව මිත්‍රාණි යානි ස්යුර්මම මිත්‍රාණි තාන්‍යපි;
තව යෙ ශත්‍රවො රාජන්මම තෙප්‍යතිශත්‍රවඃ.

ආදේශෞ, මේ ආදේශ දෙක; භවතඃ, වේත්. (මේ විධියෙන් ද්විතීයා එකවචනයෙහි වියහැකි "තෙ මෙ" දෙක ප්‍රසිද්ධයි.)

a. ත්වා, තා; මදලිප්තං, මදව්‍යාප්තයෙකු (ගර්වයුක්තයෙකු කොට;) පශ්‍යාමි, බලමි; මා, මා; මදභෙදකං, මදභෙදය කරන්නෙකු (කොට;) පශ්‍ය, බලව. ත්වා, තා; ජගත්පූජ්‍යං, ලෝකයා විසින් පිදියයුත්තෙකු (කොට;) පශ්‍යාමි, බලමි; මා, මා; ජගතාං පතිං, ලෝකස්වාමියෙකු (කොට;) පශ්‍ය, බලව. (මෙහි "ත්වා මා" යනු ද්විතීයා එකවචනයි.) මෙසේ ආදේශ විශෙෂ දක්වා තත්ප්‍රතිෂෙධවිධි දක්වනු පිණිස "නාදෞ" යනාදිය කීහු.)

236. (මෙතෙම ආදි ආදේශ ප්‍රතිෂෙධවිධි සූත්‍රයි.) ආදෞ, වාක්‍යාදියෙහි හෝ ශ්ලොකපාදාදියෙහි පවත්නා වූ "යුෂ්මත් අස්මත්" දෙකට; න, මෙකී ආදේශ නොවේත්.

b. පාදාදෞ, (වාක්‍යයක්හුගේ ආදියෙහි හෝ) ශ්ලොකපාදයක්හුගේ ආදියෙහි; වර්තමානයොඃ, පවත්නා වූ; යුෂ්මදස්මදොඃ, "යුෂ්මත් අස්මත්" දෙකට; එතෙ ආදේශාඃ, මේ ආදේශයෝ; න භවන්ති, නොවේත්. (මේ සූත්‍රයෙහි "ආදෞ" යනු සාමාන්‍ය නිර්දේශයි, එබැවින් මේ විධියෙන් කොයි වාක්‍යයක්හි වුවත් ආදියෙහි පවත්නා "යුෂ්මත් අස්මත්" දෙකට මේ ආදේශ නොවේත්යයි ගතහැකි වේ, එහෙත් වෘත්තියෙහි "පාදාදෞ" යනුවෙන් ශ්ලොකපාදාදියෙහියයි නිර්දිෂ්ටයි. තවද මෙහි "න" කියා යොගවිභාගකරණයෙන් තවත් බොහෝ තන්හි මේ ප්‍රතිෂෙධය වේයයිද නිර්දිෂ්ටයි. එය අන්‍ය ව්‍යාකරණානුසාරයෙන් වර්ණනය කරන්නාහු "සම්බොධනපාදදග්‍රෙ" යනාදිය කීහු.

c. කෘෂ්ණඃ, කෘෂ්ණතෙම; මම, මාගේ; ස්වාමී භවෙත්, හිමි වන්නේය. (මෙහි "මම" යන්න සාමාන්‍යයෙන් ආදියෙහි බැවින් "මෙ" යන ආදේශ නොවීය.) මහෙශ්වරඃ, මහෙසුරු තෙම; තව, තාගේ; ස්වාමී, හිමිවන්නේය. (මෙහි "තව"

a. "සම්බොධනපදාදග්‍රෙ න භවන්ති වසාදයඃ"—අග්නෙ තව, දෙවාස්මාන් පාහි.

b "පදාත්පරයොරනයොරෙතෙ ආදෙශා වක්තව්‍යාඃ" ත්වාං පාතු, මාං පාතු.

c. "එතෙ ආදෙශා අන්වාදෙශෙ නිත්‍යමනන්වාදෙශෙ වා වක්තව්‍යාඃ":—

d යස්ත්වං විශ්වස්‍ය ජනකස්තස්මෛ තෙ විෂ්ණවෙ නමඃ. අනන්වාදෙශෙ තු—ත්වං මෙ මම වා දෙවොසි.

යන්නට පූර්වයෙහි "ත්‍රාෂණ" යන්න ඇතත් ශ්ලොකපාදාදිය බැවින් "තෙ" ආදෙශ නොවීය.) තව, තාගේ; යානි මිත්‍රාණිස්‍යුඃ, යම් මිත්‍රයෝ වන්නාහු නම්; තානි, ඔහු; මම අපි, මාගේද; මිත්‍රාණි, මිත්‍රයෝ වන්නාහ. (මෙහිද ඒ ක්‍රමයෙන්ම "තෙමෙ" ආදෙශ නොවීය.) රාජන්, එම්බා රජ; තව, ඔබගේ; යෙ ශත්‍රවඃ, යම් සතුරෝ වෙත්ද; තෙ, ඔහුතුමූ; මම, මාගේ; අති ශත්‍රවඃ, ඉතා සතුරෝ වෙත්. (මෙහිද එසේයි.)

a. සම්බොධනපදාත්, සම්බොධන පදයකින්; අග්‍රෙ, මත්තෙහි වූවන්ට; වසාදයඃ, වස් ආදි ආදෙශයෝ; නභවන්ති, නොවෙත්. (මෙය පූර්වොක්ත යොග විභාගයෙන් කළතයි.) අග්නෙ දෙව, අග්නිදෙවය; තව, ඔබ සම්බන්ධි වූ; අස්මාන්, අප; පාහි, රකිණු මැනව. (මෙහි "අග්නෙ" යන සම්බොධනයා කෙරෙන් පර යුෂ්මත් ශබ්දය බැවින් "තෙ" ආදෙශ නොවීය, "දෙවස්මාන්" යන තන්හි "දෙව" යන සම්බොධනයා කෙරෙන් පර අස්මත් ශබ්දය බැවින් "නඃ" ආදෙශ නොවීය.)

b. පදාත්පරයොඃ, පදයක් කෙරෙන් පර වූ; අනයොඃ, මේ යුෂ්මත් අස්මත් දෙකට; එතෙ ආදෙශාඃ, මේ ආදෙශයෝ; වක්තව්‍යාඃ, කියයුතුයි. ත්වාං, තා; පාතු, රකීවා; මාං, මා; පාතු, රකීවා. (මෙහි "ත්වාං මාං" යන තන්හි පදයක් කෙරෙන් පරනැති බැවින් "ත්වා මා" යනාදෙශ නොවීය.)

c. එතෙ ආදෙශාඃ, මේ ආදෙශයෝ; අන්වාදෙශෙ, පශ්චාදුක්තියෙහි (කීවාක් නැවත කීමෙහි;) නිත්‍යං, නිත්‍යයෙන්ද; අනන්වාදෙශෙ, අන්වාදෙශ රහිත තන්හි; වා, විකල්පයෙන්ද; වක්තව්‍යාඃ, කියයුතුයි,

d. යඃ ත්වම්, යම්බඳු වූ ඔබ; විශ්වස්‍ය ජනකඃ, සියල්ල උපදවන්නෙහිද; විෂ්ණවෙ, විෂ්ණුදෙව වූ; තස්මෛ තෙ, ඒ ඔබහට; නමඃ, නමස්කාරවේවා. (මෙහි "යඃ ත්වම්" යන්නෙන් කථිත වූ වක්ම "තෙ" යන්නෙන්ද කථිත බැවින් අන්වාදෙශයි, එබැවින් "තෙ" ආදෙශය නිත්‍යවිධි වශයෙන් විය.) අනන්වාදෙශෙ තු,

a. "විද්‍යමානපූර්වාත් ප්‍රථමාන්තාත් පරයොරනයොරන්වාදෙශෙප්‍යෙතෙ ආදෙශා වා වක්තව්‍යාඃ":—

b. භක්තස්ත්වමප්‍යහං තෙන හරිස්ත්වාං ත්‍රායතෙ ස මාම්

c. "අචාක්ෂුෂඥානාර්ථධාතූනාං යොගෙ නෛතෙ ආදෙශා වක්තව්‍යාඃ":—චෙතසා ත්වාමීක්ෂතෙ, ධ්‍යායති ස්මරති වා, චාක්ෂුෂඥානාර්ථධාතුයොගෙ තු-භක්තස්ත්වා පශ්‍යති චක්ෂුසා. "යුක්තයුක්තෙපි නිෂෙධඃ"—භක්තස්තව රූපං ධ්‍යායති, රූපෙණ සහ සම්බන්ධාද්ධ්‍යානෙන යුක්තං රූපං, තද්‍රූපෙණ යුක්තස්‍ය තවෙත්‍යස්‍ය යුක්තයුක්තත්වාත්.

අන්වාදෙශ රහිත තන්හි වනාහි (අනිත්‍යයයි කීහෙයින්) "ත්වංමෙ මම" යනාදිය වේ. ත්වං, ඔබ; මෙ, මාගේ; දෙවඃ අසි, දෙවි වෙහිය; මම වා, ("මෙ" යන තන්හි) "මම" කියා හෝ වේ.

a. විද්‍යමානපූර්වාත්, විද්‍යමාන වූ පදයක් පූර්වකොට ඇත්තා වූ; ප්‍රථමාන්තාත්, ප්‍රථමා විභක්ත්‍යන්තයා කෙරෙන්; පරයොඃ, පර වූ; අනයොඃ, මේ යුෂ්මත් අස්මත් දෙකට; අන්වාදෙශෙ අපි, පශ්චාදුක්තියෙහිද; එතෙ ආදෙශාඃ, මේ ආදෙශයෝ; වා වක්තව්‍යාඃ, විකල්පයෙන් කියයුතුයි. (යම්කිසි පදයක් පූර්වකොට ඇති ප්‍රථමා විභක්ත්‍යන්තයා කෙරෙන් පරවූවන්ට අන්වාදෙශ ඇති තන්හි යථොක්ත ආදෙශ විකල්ප වෙත්.)

b. ත්වම්, තෝ; භක්තඃ, භක්ති ඇත්තෙහිය; අහං අපි, මමද; භක්තඃ, භක්ති ඇත්තෙම්; තෙන, එහෙයින්; සඃ හරිඃ, ඒ විෂ්ණු තෙම; ත්වාං, තාද; මාං, මාද; ත්‍රායතෙ, රක්ෂාකෙරේ. (මෙහි "තෙන"යි විද්‍යමානපදය පූර්වකොට ඇති "හරිඃ" යන ප්‍රථමාන්තයා කෙරෙන් පර "යුෂ්මත්" ශබ්දයට අන්වාදෙශ ඇතත් විකල්පයෙන් "ත්වා" දෙශ නොව "ත්වාං" කියා වේ. එසේම "ත්‍රායතෙ" යන්න පූර්වකොට ඇති "සඃ" යන ප්‍රථමාන්තයා කෙරෙන් පර වූ "අස්මත්" ශබ්දයට "මා" ආදෙශ නොව "මාම්" කියා වේ. (විකල්පයෙන් "ත්වා මා" කියාද වේ.)

c. අචාක්ෂුෂඥානාර්ථ ධාතූනාං යොගෙ, ඇසපිළිබඳ නොවූ දැනීම අර්ථකොට ඇති ධාතූන්ගේ යොගයෙහි; එතෙ ආදෙශාඃ, මේ ආදෙශයෝ; නවක්තව්‍යාඃ, නොකියයුතු වෙත්. චෙතසා, සිතින් හෙවත් චින්තාසම්බන්ධි ධ්‍යානයෙන්; ත්වාං, තා; ඊක්ෂතෙ, බලයි. ධ්‍යායති, සිතයි; ස්මරති වා, සිහිකෙරෙයි කියා හෝ වේ. චාක්ෂුෂඥානාර්ථ ධාතුයොගෙ තු, ඇසපිළිබඳ දැනීම අර්ථකොට ඇති ධාතූන්ගේ යොගයෙහි වනාහි මෙහි ආදෙශ වෙත්;

ඍ. "විශෙෂ්‍යපූර්වං සම්බොධනෙතරපූර්වං සම්බොධනං හිත්වා අන්‍යසමාසසම්බොධනාත්පරයොරෙනීතෙ ආදෙශාභවන්ති" ඉති කෙචිත්.

(එනම්)—භක්තඃ, භක්ති ඇත්තේ; ත්වාං, තා; චක්ෂුසා, ඇසින්; පශ්‍යති, බලයි. (මෙහි දැනගැනීම ඇස පිළිබඳ බැවින් යථොක්ත ප්‍රතිෂෙධය නොව "ත්වා" ආදෙශ විය.) යුක්තයුක්තෙ අපි, යුක්ත වූ අනිකක් සමග යෙදුනු "යුෂ්මත් අස්මත්" දෙකටද;) නිෂෙධඃ, ප්‍රතිෂෙධ වේ. (එනම්)—භක්තඃ, භක්ති ඇත්තේ; තව, තාගේ; රූපං, රූපය; ධ්‍යායති, සිතයි. රූපෙණ සහ, රූපය හා, හෙවත් "රූපං" යන්න හා; සම්බන්ධාත්, සම්බන්ධහෙයින්; ධ්‍යානෙන, ධ්‍යානය හා හෙවත් "ධ්‍යායති" යන ක්‍රියාව හා; යුක්තං, යුක්තවූයේ; රූපං, රූපයයි. තද්‍රූපෙණ, ඒ රූපශබ්දය හා; යුක්තස්‍ය, යුක්ත වූ; තව ඉති, "තව" යන; අස්‍ය, මොහු; යුක්තයුක්තත්වාත්, යුක්ත යුක්ත බැවින් ("තෙ" යන්නාදෙශ නොවීය.)

මෙහි "ඊක්ෂතෙ ධ්‍යායති සමරති" යන ක්‍රියාවන්ගෙන් වාච්‍ය වූ දැනීම ඇස පිළිබඳ නොව සිත පිළිබඳ බැවින් ඒ ක්‍රියාවන් හා යුක්ත "යුෂ්මත්" ශබ්ද විතීයා එකවචනයෙහි "ත්වා" යන ආදෙශය නොවීය. මේ ප්‍රතිෂෙධය වනාහි යුක්ත යුක්ත සඞ්ඛ්‍යාත පරම්පරා සම්බන්ධය ඇත් තන්හිද වේ. පරම්පරා සම්බන්ධය නම් යථොක්ත "ඊක්ෂතෙ" යනාදි ක්‍රියාවන් හා යුක්ත වූ වෙන පදයක් හා සම්බන්ධ වීමයි. මෙහි "ධ්‍යායති" යන ක්‍රියාව හා යුක්ත වූ "රූපම්" යන්න සමග සම්බන්ධ වූ "යුෂ්මත්" ශබ්දයට "තෙ" ආදෙශ නොව "තව"යි සිටියේ වේ.

ඍ. විශෙෂ්‍යපූර්වං, විශෙෂ්‍යපදයක් පූර්වකොට ඇත්තා වූ සම්බොධනයද; සම්බොධනෙතරපූර්වං සම්බොධනං, සම්බොධනයෙන් අනිකක් පූර්වකොට ඇත්තා වූ සම්බොධනයද; හිත්වා, හැර; අන්‍යසමාසසම්බොධනාත්, අන්‍ය වූ සම්බොධන පදයකින්; පරයොඃ, පර වූ යුෂ්මත් අස්මත් ශබ්ද දෙකට; එතෙ ආදෙශාඃ, මේ ආදෙශයෝ; න භවන්ති ඉති, නොවෙත්යයි; කෙචිත්, සමහරු කියත්.

සම්බොධනයා කෙරෙන් පර යුෂ්මත් අස්මත් ශබ්ද දෙකට "තෙමෙ" යනාදි ආදෙශ නොවෙත්යයි පූර්වොක්ත සාමාන්‍ය නියමය මෙයින් විශෙෂිතයි, එබැවින් විශෙෂ්‍ය පද වූ සම්බොධනයක්ම හෝ වෙන කිසි පදයක් හෝ පූර්වකොට ඇති සම්බොධනයා කෙරෙන් පරවූවන්ට මේ ආදෙශ වෙත්.

a. දෙවාස්මාන් පාහි නාහරෙ විෂ්ණොස්මාන් පාහි සර්වතඃ

b. "විශෙෂ්‍යපූර්වාත්සම්බොධනෙතරපූර්වාත්තු භවන්ති."

c හරෙ කෘපාලො නඃ පාහි සර්වදා රක්ෂ දෙව නඃ.

237. චාදිභිශ්ච. (චාදිසිඃ 3, 3, ච 1, 1;)

d. චාදිභිරපි යොගෙ නෛතෙ ආදෙශා භවන්ති.

e. "යුවයොරාවයොර්දෙවයොශ්ච දැ්ෂ්ට්‍රවං තුභ්‍යමෙව ච."

---

a. දෙව, දෙවය; අස්මාන්, අප; පාහි, රක්ෂාකරණු මැනව. (මෙහි "දෙව" යන කෙවලසම්බොධනයා කෙරෙන් පර "අස්මත්" ශබ්දයට "නඃ" ආදෙශ නොවිය.) නාහරෙ, නරසිංහවතාරවත්වූ; විෂ්ණො, විෂ්ණුදෙවය; සර්වතඃ, සියල්ලෙන්; අස්මාන්, අප; පාහි, රක්ෂාකරණුමැනව. (මෙහි "නාහරෙ" යන විශෙෂණ සම්බොධනය පූර්වකොට ඇති "විෂ්ණො" යන සම්බොධනයා කෙරෙන් පර "අස්මත්" ශබ්දයට "නඃ" ආදෙශ නොවීය.)

b. විශෙෂ්‍යපූර්වාත්, විශෙෂ්‍යපදයක් පූර්වකොට ඇත්තා වූ සම්බොධනයා කෙරෙන් හෝ; සම්බොධනෙතරපූර්වාත්තු, සම්බොධනයෙන් අනිකක් පූර්වකොට ඇති සම්බොධනයා කෙරෙන් වනාහි; භවන්ති, යථොක්ත ආදෙශ වෙත්.

c. කෘපාලො, කරුණා ඇත්තා වූ; හරෙ, විෂ්ණුදෙවය; නඃ, අප; පාහි, රක්ෂාකරණු මැනව; (මෙහි "හරෙ" යන විශෙෂ්‍ය සම්බොධනය පූර්වකොට ඇත්තා වූ "කෘපාලො" යන සම්බොධනයා කෙරෙන් පර අස්මත් ශබ්දයට "නඃ" ආදෙශයි. දෙව, දෙවයන්වහන්ස; සර්වදා, සැමකල්හි; නඃ, අප; රක්ෂ, රක්ෂාකරණු මැනව. (මෙහි සම්බොධනයෙන් අනිකක් වූ "රක්ෂ" යන්න පූර්වකොට ඇති "දෙව" යන සම්බොධනයා කෙරෙන් පර අස්මත් ශබ්දයට "නඃ" ආදෙශයි.)

237. (තෙමෙ ආදි ආදෙශ ප්‍රතිෂෙධවිධි සූත්‍රයි.) චාදිභිශ්ච, චාදිනිපාත සමග යොගයෙහිද (යථොක්ත ආදෙශ නොවෙත්.)

d. චාදිභිඃ අපි යොගෙ, චාදිනිපාත සමග යොගයෙහිද; එතෙ, ආදෙශාඃ, මේ ආදෙශයෝ නභවන්ති, නොවෙත්.

e. යුවයොඃ, තොප දෙදෙනාගේද; ආවයොශ්ච, අප දෙදෙනාගේද; ඊශඃ, අධිපති වූ; හරිඃ, විෂ්ණුතෙම; මාංඑව, මාම; රක්ෂතු, රකීවා. දෙවෙශඃ, දෙවෙන්ද්‍රතෙම; තුභ්‍යම්, තටද; මහ්‍යම, මටද; ශං දද්‍යාත්, යහපත දේවා; තුභ්‍යං එව ච, (නැතහොත්) තටම දේවා. (මෙහි "ච එව" යන නිපාතයොග බැවින් "යුවයොඃ" යනාදි තන්හි යථොක්ත ආදෙශ නුවූහ.)

a. "ච වා හ අහ එව" ආදිශබ්දෙභ්‍යො පෘථක්ත්වග්‍රහණෙන, නාන්‍ය, "න චවාහාහෛවයුක්තෙ" ඉති පාණිනියමවචනාත්. සාක්ෂාද්‍යොගෙයං නිෂෙධඃ, න පුනර්යුක්තයුක්තෙ, "ශිවො හරිශ්ච මෙ ස්වාමී" ත්‍යාදෞ.

ආදෙශවිශෙෂප්‍රක්‍රියා.

238. චාදිර්නිපාතඃ. (චාදඃ, 1, 1; නිපාතඃ 1, 1;)

a. ආදිශබ්දය, (සූත්‍රයෙහි) ආදිශබ්දයෙන්; ච වා හ අහ එව, "ච වා හ අහ එව" යන; එතෙ පඤ්ච එව, මේ පසම; ග්‍රහණෙන, ගැණීලැබෙත්. අන්‍ය, අන්‍යයෝ; න, නොගැණීලැබෙත්. (කුමක් හෙයින්ද යත් ?) නචවාහාහෛවයුක්තෙ ඉති, "නචවාහාහෛව යුක්තෙ" යන; පාණිනීයවචනාත්, පාණිනීයවචනහෙයිනි; අයං නිෂෙධඃ, මේ ප්‍රතිෂෙධය; සාක්ෂාද්‍යොගෙ, (යුෂ්මත් අස්මත් ශබ්ද යන් හා ප්‍රත්‍යක්ෂසම්බන්ධයෙහි වේ. පුනර්යුක්තයුක්තෙ, නැවත යුක්තවූවක් හා යුක්ත කත්හි; න, ප්‍රතිෂෙධය නොවේ. (එනම්) ශිවඃ, ඊශ්වරතෙමේද; හරිශ්ච, විෂ්ණුතෙමේද; මෙ, මාගේ; ස්වාමී, හිමිය. ඉත්‍යාදෞ, මේ ආදියෙහි (ප්‍රතිෂෙධ නොවේ.) (චාදීහු යුෂ්මත් අස්මත් ශබ්දගත සමුච්චයාදිය ප්‍රකාශ කෙරෙත් නම් එහි සාක්ෂාද්‍යොගය වේ. මෙහි චයන්න හරිශබ්දගත සමුච්චයාර්ථය ප්‍රකාශකළ බැවින් සාක්ෂාත් යොග නොවේ, ඒ පුනර්යුක්ත යුක්ත වේ, හෙවත් පරම්පරා සම්බන්ධය වේ. එබැවින් මෙහි "තෙ මෙ" ආදීන්ගේ ප්‍රතිෂෙධය නොවේ.)

ආදෙශවිශෙෂප්‍රක්‍රියාර්ථව්‍යාඛ්‍යාව.

විභක්ත්‍යුත්පත්තියෙන් රූපවිශෙෂත්වය භජනය කරණ ශබ්දගණ දක්වා ඉක්බිති එබඳු රූ වෙසෙසක් නැතිව සියලු ලිඞ්ගවිභක්ත්‍යාදියෙහි රූපසාම්‍යයෙන් පවත්නා අව්‍යයශබ්ද ගණ දැක්වීම පිණිස "චාදිර්නිපාතඃ" යනාදිය කීහු.

238. (නිපාතසංඥා සූත්‍රයි.) චාදිඃ, ච ආදි ගණය; නිපාතඃ, නිපාත නම් වේ.

b ච වා හ අහ එව එවං නූන ශශ්වත් විනා නානා ස්වස්ති අස්ති දොෂා මෘෂා මිථ්‍යා මිථස් අථ අථො හ්‍යස් ශ්වස් උච්චෛස් නීචෛස් ශනෛස් ස්වර් අන්තර් ප්‍රාතර් පුනර් භූයස් අහො ස්විත් උත සහ සාකං අන්තරෙණ අන්තරා නමස් අලම් කෘතම්, අමානොනාඃ ප්‍රතිෂෙධෙ ඊෂත් කිල ඛලු වෛ ආරාත් දූරාත් භෘශම් යත් තත්, ස්වරාශ්ච, ඉත්‍යෙවමාදිගණො නිපාත සංඥො භවති, ද්‍රව්‍යවචනො නෙති ඥෙයම්.

b. ච, සමුච්චයාර්ථාදියෙහි "ච" යනුද; වා, විකල්පාර්ථාදියෙහි "වා" යනුද; හ, ප්‍රසිද්ධ්‍යාදියෙහි "හ" යනුද; අහ, පූජාදියෙහි "අහ" යනුද; එව, අවධාරණයෙහි "එව" යනුද; එවම්, උක්ත පරාමර්ශනාදියෙහි "එවම්" යනුද; නූනම්, නිශ්චයාදියෙහි "නූනම්" යනුද; ශශ්වත්, නිත්‍යාර්ථාදියෙහි "ශශ්වත්" යනුද; විනා, වර්ජනාදියෙහි "විනා" යනුද; නානා, බහුප්‍රකාරාදියෙහි "නානා" යනුද; ස්වස්ති, අශීර්වාදාදියෙහි "ස්වස්ති" යනුද; අස්ති, විද්‍යමානතාදියෙහි "අස්ති" යනුද; දොෂා, රාත්‍ර්‍යර්ථයෙහි "දොෂා" යනුද; මෘෂා මිථ්‍යා, අසත්‍යාර්ථයෙහි "මෘෂා මිථ්‍යා" යන දෙකද; මිථස්, අන්‍යොන්‍ය රහොගතත්වයෙහි "මිථස්" යනුද; ශ්වස්; ආගාමිදිවසාර්ථයෙහි (හෙට යන අර්ථයෙහි) "ශ්වස්" යනුද; උච්චෛස්, උච්චතාර්ථාදියෙහි "උච්චෛස්" යනුද; නීචෛස්, නිහතාර්ථාදියෙහි "නීචෛස්" යනුද; ශනෛස්, මන්දභාවාදියෙහි "ශනෛස්" යනුද; ස්වර්, ස්වර්ගාදියෙහි "ස්වර්" යනුද; අන්තර්, මධ්‍යතාදියෙහි "අන්තර්" යනුද; ප්‍රාතර්, ප්‍රභාතකාලාර්ථයෙහි "ප්‍රාතර්" යනුද; පුනර් භූයස්, පෞනඃපුන්‍යයෙහි "පුනර් භූයස්" යන දෙකද; අහො, ඛෙදාදියෙහි "අහො" යනුද; ස්විත්, විතර්කාදියෙහි "ස්විත්" යනුද; උත, විකල්පාදියෙහි "උත" යනුද; සහ, සාහිත්‍යාර්ථාදියෙහි "සහ" යනුද; සාකං අන්තරෙණ, විනාර්ථයෙහි "සාකං අන්තරෙණ" යන දෙකද; අන්තරා, මධ්‍යාර්ථාදියෙහි "අන්තරා" යනුද; නමස්, නමස්කාරාර්ථයෙහි "නමස්" යනුද; අලංකෘතම්, නිවරණාදියෙහි "අලං කෘතම්" යන දෙකද; ප්‍රතිෂෙධ, ප්‍රතිෂෙධාර්ථයෙහි; අමානොනාඃ, "අ මා නො න" යන සතරද; ඊෂත්, අල්පාර්ථයෙහි "ඊෂත්" යනුද; කිල ඛලු වෛ, නිශ්චයාදියෙහි "කිල ඛලු වෛ" යන තුනද; ආරාත්, දූරාර්ථයෙහි හා සමීපාර්ථයෙහි "ආරාත්" යනුද; දූරාත්, දූරාර්ථයෙහි "දූරාත්" යනුද; භෘශම්" අත්‍යර්ථයෙහි "භෘශම්" යනුද; යත්, යත්කාරණාර්ථයෙහි "යත්" යනුද; තත්, තත්කාරණාර්ථයෙහි "තත්" යනුද; ස්වරාශ්ච ඉති, "අ ඉ" ආදි ස්වරයෝද යන; එවමාදිගණඃ, මේ ආදිගණය; නිපාතසංඥඃ භවති, නිපාත නම් වේ. ද්‍රව්‍යවචනඃ, ද්‍රව්‍යවාචකවූයේ හෙවත් ද්‍රව්‍යයක් ප්‍රකාශකිරීමට ඉවහල්වූයේ; න ඉති, නිපාතසංඥ නොවේයයි; ඥෙයම්, දතයුතුයි. ("චශ්චෞරශශාඞ්කයොඃ" යනාදියෙන් ච යන්න චෞරාර්ථචන්ද්‍රාර්ථ දෙක්හි වේයයි කියනලදී, මෙසේ මෙහි චාදීහු යම් තැනක ද්‍රව්‍යවාචකවෙත් නම් එහි නිපාත නොවෙත්.)

මෙසේ මෙහි ප්‍රකෘතියෙන් නිපාතත්වයට පැමිණි චාදි සමූහය දක්වා ඉක්බිති ඒ ඒ නාමාදිය කෙරෙන් ප්‍රත්‍යයාදිය වීමෙන් නිපාතස්වරූපව සිද්ධවූවන් දක්වන්නාහු "තස්‍රාදිඃ" යනාදිය කීහු.

a. **"තත්‍රාදිර්විභක්ත්‍යර්ථෙ නිපාත්‍යතෙ" තස්මින්නිති=තත්‍ර, යස්මින්නිති=යත්‍ර, කස්මින්නිති=කුත්‍ර, කුහ, ක්ව. අස්මින්නිති=අත්‍ර, තස්මින් කාලෙ=තදා, යස්මින් කාලෙ=යදා, කස්මින් කාලෙ=කදා, අන්‍යස්මින් කාලෙ=අන්‍යදා, සර්වස්මින් කාලෙ=සර්වදා, තෙන ප්‍රකාරෙණ=තථා, යෙන ප්‍රකාරෙණ=යථා, කෙන ප්‍රකාරෙණ=කථම්, අනෙන ප්‍රකාරෙණ=ඉත්ථම්, සර්වථා, උභයථා, අන්‍යථා, අන්‍යතරථා, ඉතරථා. තස්මාදිති=තතඃ, යස්මාදිති=යතඃ අස්මාදිති=අතඃ, කුතඃ, අමුතඃ, යුෂ්මත්තඃ, අස්මත්තඃ, භවත්තඃ "සාර්වවිභක්තිකස්තස් ඉත්‍යෙකෙ" පූර්වතඃ, සර්වතඃ. පූර්වස්මින්නිති=පුරස්තාත්, අධරස්මින්නිති=අධරස්තාත්, පරස්මින්නිති=පරෙණ=පරස්තාත්.**

---

a. තත්‍රාදිඃ, "තත්‍ර" යනාදිය; විභක්ත්‍යර්ථෙ, විභක්තීන් සම්බන්ධි අර්ථයෙහි; නොහොත් විභක්ත්‍යර්ථයෙහි හා කාලාදි අර්ථයෙහි; නිපාත්‍යතෙ, නිපාතනය කරනුලැබේ. තස්මින් ඉති, "තස්මින්" යන වාක්‍යයෙහි හෙවත් එහි යන අර්ථයෙහි; තත්‍ර, "තත්‍ර" යනු වේ. යස්මින් ඉති, යමෙක්හි යන අර්ථයෙහි; යත්‍ර, "යත්‍ර" යනු වේ. කස්මින්නිති කොහි යන අර්ථයෙහි; කුත්‍ර, "කුත්‍ර" යනුද; කුහ, "කුහ" යනුද; ක්ව, "ක්ව" යනුද වේ. අස්මින්නිති, මෙහි යන අර්ථයෙහි; අත්‍ර, "අත්‍ර" යනු වේ. තස්මින් කාලෙ, එකල්හි යන අර්ථයෙහි; තදා, "තදා" යනු වේ. යස්මින් කාලෙ, යම්කලෙක්හි යන අර්ථයෙහි; යදා, "යදා" යනු වේ. කස්මින්කාලෙ කොයිකල්හි යන අර්ථයෙහි; කදා, "කදා" යනු වේ. අන්‍යස්මින් කාලෙ, අන් කලෙක්හි යන අර්ථයෙහි; අන්‍යදා, "අන්‍යදා" යනු වේ. සර්වස්මින් කාලෙ, සියලු කල්හි යන අර්ථයෙහි; සර්වදා, "සර්වදා" යනු වේ තෙන ප්‍රකාරෙණ, ඒ ප්‍රකාරයෙන් යන අර්ථයෙහි; තථා, "තථා" යනු වේ. යෙන ප්‍රකාරෙණ, යම් ප්‍රකාරයකින් යන අර්ථයෙහි; යථා, "යථා" යනු වේ. කෙනප්‍රකාරෙණ, කොයි ප්‍රකාරයෙන් යන අර්ථයෙහි; කථම්, "කථම්" යනු වේ. අනෙන ප්‍රකාරෙණ, මේ ප්‍රකාරයෙන් යන අර්ථයෙහි; ඉත්ථම්, "ඉත්ථම්" යනු වේ. සර්වථා, "සර්වේණ ප්‍රකාරෙණ" යන වාක්‍යයෙහි (සියලු ප්‍රකාරයෙන් යන අර්ථයෙහි) "සර්වථා" යනු වේ. උභයථා, "උභයෙන ප්‍රකාරෙණ" යන වාක්‍යයෙහි (දෙයාකාරයෙන් යන අර්ථයෙහි) "උභයථා" යනු වේ. අන්‍යථා, "අන්‍යෙන ප්‍රකාරෙණ" යන වාක්‍යයෙහි (අන්‍ය වූ ප්‍රකාරයෙන් යන අර්ථයෙහි) "අන්‍යථා" යනු වේ. අන්‍යතරථා, "අන්‍යතරෙණ ප්‍රකාරෙණ" යන වාක්‍යයෙහි (අන්‍යතර වූ ප්‍රකාරයකින් යන අර්ථයෙහි) "අන්‍යතරථා"

යනු වේ. ඉතරථා, "ඉතරෙණ ප්‍රකාරෙණ" යන වාක්‍යයෙහි (අන්‍ය වූ ප්‍රකාරයෙන් යන අර්ථයෙහි) "ඉතරථා" යනු වේ. තස්මාත් ඉති, එයින් යන අර්ථයෙහි; තතඃ, "තතඃ" යනු වේ. යස්මාත් ඉති, යමකින් යන අර්ථයෙහි; යතඃ, "යතඃ" යනු වේ. අස්මාත් ඉති, මෙයින් යන අර්ථයෙහි; අතඃ, "අතඃ" යනු වේ. කුතඃ, "කස්මාදිති" යන වාක්‍යයෙහි (කොයින් යන අර්ථයෙහි) "කුතඃ" යනු වේ අමුතඃ, "අමුෂ්මාත්" යන වාක්‍යයෙහි (මෙයින් යන අර්ථයෙහි) "අමුතඃ" යනු වේ. යුෂ්මත්තඃ, "ත්වත්" යන වාක්‍යයෙහි (තා කෙරෙන් යන අර්ථයෙහි) "යුෂ්මත්තඃ" යනු වේ. අස්මත්තඃ, "මත්" යන වාක්‍යයෙහි (මා කෙරෙන් යන අර්ථයෙහි) "අස්මත්තඃ" යනු වේ. භවත්තඃ, "භවතඃ" යන වාක්‍යයෙහි (භවත්හු කෙරෙන් යන අර්ථයෙහි "භවත්තඃ" යනු වේ. තස්, "තස්" ප්‍රත්‍යය; සාර්වවිභක්තිකඃ ඉති, සකලවිභක්ත්‍යර්ථ ඇත්තේ යයි; එකෙ, සමහරු කියත්. (එහෙයින්) පූර්වතඃ, "පූර්වස්මින්" යන වාක්‍යයෙහි (පූර්වයෙහි යන අර්ථයෙහි) "පූර්වතඃ" යනුද; සර්වතඃ, "සර්වස්මින්" යන වාක්‍යයෙහි (සියල්ලෙහි යන අර්ථයෙහි) "සර්වතඃ" යනුද වේ. පූර්වස්මින්නිති, පූර්වයෙහි යන අර්ථයෙහි; පුරස්තාත්, "පුරස්තාත්" යනු වේ. අධරස්මින්නිති, පාත්හි යන අර්ථයෙහි; අධරස්තාත්, "අධරස්තාත්" යනු වේ. පරස්මින්නිති, අනිකෙකු කෙරෙහි යන අර්ථයෙහි; "පරෙණ" යනුද; පරස්තාත්, "පරස්තාත්" යනුද වේ.

මෙහි "තත්‍ර යත්‍ර" යන දෙතන්හි "තත් යත්" ශබ්දදෙකෙන් පරව නිපාතනයෙන් සප්තම්‍යර්ථයෙහි ත්‍රප්‍රත්‍යය හා විසංඥයට අකාරාදේශයයි. "කුත්‍ර කුහ ක්ව" යන තන්හි කිම්ශබ්දයා කෙරෙන් සප්තම්‍යර්ථයෙහි පිළිවෙළින් "ත්‍ර, හ, අ" යන ප්‍රත්‍යය හා කිම් ශබ්දයට "කු" ආදේශයයි. "අත්‍ර" යන තන්හි ඉදම් ශබ්දයා කෙරෙන් "ත්‍ර" ප්‍රත්‍යය හා ඉදම් ශබ්දයට අකාරාදේශයයි. "තදා යදා කදා" යන තන්හි "තත්, යත්, කිම්" ශබ්දයන් කෙරෙන් කාලාර්ථයෙහි "දා" ප්‍රත්‍යය හා විසංඥයට අකාරාදේශයයි. "අන්‍යදා සර්වදා" යන තන්හිද "අන්‍ය, සර්ව" ශබ්දයන් කෙරෙන් එසේම "දා" ප්‍රත්‍යයයි. "තථා, යථා" යන තන්හි "තත්, යත්" ශබ්දකෙරෙන් ප්‍රකාරාර්ථයෙහි "ථා" ප්‍රත්‍යය හා විසංඥයට අකාරයයි. "කථම්" යන තන්හි "කිම්" ශබ්දයා කෙරෙන් "ථම්" ප්‍රත්‍යය හා විසංඥයට අකාරාදේශයයි. "ඉත්ථම්" යන තන්හි "ඉදම්" ශබ්දය කෙරෙන් "ථම්" ප්‍රත්‍යය හා විසංඥලොපයයි. "සර්වථා ඉතරථා" යන තන්හි සර්වශබ්දාදියෙන් ථා ප්‍රත්‍යයයි. "තතඃ යතඃ" යන තන්හි "තත් යත්" ශබ්ද කෙරෙන් පඤ්චම්‍යර්ථයෙහි "තස්" ප්‍රත්‍යය හා විසංඥයට අකාරයයි. "අතඃ" යන තන්හි "ඉදම්" ශබ්දයා කෙරෙන් "තස්" ප්‍රත්‍යය හා "ඉදම්" ශබ්දයට අකාරාදේශයයි. "කුතඃ" යන තන්හි "කිම්" ශබ්දයා කෙරෙන් "තස්" ප්‍රත්‍යය හා "කිම්" ශබ්දයට "කු" ආදේශයයි. "අමුතඃ" යන තන්හි "අදස්" ශබ්දයා කෙරෙන් "තස්" ප්‍රත්‍යය හා විසංඥයට අකාරයද පසුව දකාරයට මකාරය හා අකාරයට උකාරය ද වේ. "යුෂ්මත්තඃ අස්මත්තඃ භවත්තඃ"

a. "ආහි ච දූරෙ"-දූරෙඅර්ථෙ වාච්‍යෙ සති ආහිප්‍රත්‍යයො භවති. දක්ෂිණස්‍යාං දිශි දූරෙ ඉති-දක්ෂිණාහි, (වසන්ති චාණ්ඩාලාඃ.) චකාරදාච්, දක්ෂිණා.

b "කිමඃ සාමාන්‍යෙ චිදාදිඃ"- සර්වවිභක්ත්‍යන්තාත් කිංශබ්දාත් සාමාන්‍යාර්ථෙ චිත් චන ඉත්‍යෙතෞ ප්‍රත්‍යයෞ භවතඃ. කශ්චිත්, කශ්චන; ක්වචිත්, ක්වචන.

යන තන්හි "යුෂ්මත් අස්මත් භවත්" ශබ්ද කෙරෙන් "තස්" ප්‍රත්‍යය යයි. "පූජිතඃ සජිතඃ" යන තැනහිද "තස්" ප්‍රත්‍යය යයි. "පුරස්තාත් අධරස්තාත්, පරස්තාත්" යන තන්හි "පුර අධර පර" ශබ්දයන් කෙරෙන් "ස්තාත්" ප්‍රත්‍යයයයි. "පරෙණ" යන තන්හි "පර" ශබ්දයා කෙරෙන් "එන" ප්‍රත්‍යය යයි.

a. දූරෙ, දූරාර්ථයක් වාච්‍යකල්හි; ආහි ච, ආහිප්‍රත්‍යයද වේ. දූරෙඅර්ථෙ වාච්‍යෙ සති, දූරාර්ථයක් වාච්‍යකල්හි; ආහිප්‍රත්‍යයඃ භවති, ආහිප්‍රත්‍යය වේ. දක්ෂිණස්‍යාං දිශි, දකුණුදිග; දූරෙ ඉති, දූරෙහි යන අර්ථයෙහි; දක්ෂිණාහි. "දක්ෂිණාහි" යනු වේ. චණ්ඩාලාඃ, චණ්ඩාලයෝ; දක්ෂිණාහි, දකුණුදිග දූර; වසන්ති, වසත්. චකාරාත්, චශබ්දයෙන්; ආච්, ආච ප්‍රත්‍යය වේ. දක්ෂිණා, එකල "දක්ෂිණා" යනු වේ. (මේ ප්‍රත්‍යය දෙක "දක්ෂිණ; උත්තර" යන ශබ්දයන් කෙරෙන් වන බැව් පෙණේ.)

b. කිමඃ, කිම්ශබ්දයා කෙරෙන්; සාමාන්‍යෙ, සාමාන්‍යාර්ථයක් වාච්‍යකල්හි; චිදාදිඃ, චිත් ප්‍රත්‍යයාදිය වේ. සර්වවිභක්ත්‍යන්තාත්, සියලුවිභක්ති අන්තකොට ඇත්තා වූ; කිම්ශබ්දාත්, කිම්ශබ්දයා කෙරෙන්; සාමාන්‍යෙ අර්ථෙ, සාමාන්‍යාර්ථයෙහි; චිත්චන ඉති, "චිත්චන" යන; එතෞ ප්‍රත්‍යයෞ භවතඃ, මේ ප්‍රත්‍යය දෙක වෙත්. කශ්චිත් කශ්චන, සාමාන්‍ය වූ කවරෙක් (කිසිවෙක්)යන අර්ථයෙහි "කශ්චිත් කශ්චන"යනු වේ. ක්වචිත් ක්වචන, සාමාන්‍ය වූ කොතන්හි (කිසියම් තන්හි) යන අර්ථයෙහි "ක්වචිත් ක්වචන" යනු වේ.

මෙහි කියනලද "චිත් චන" යන ප්‍රත්‍යයමය ලිඞ්ගත්‍රයෙහි ප්‍රථමාදි සප්තවිභක්ත්‍යන්ත කිම්ශබ්දයා කෙරෙන් ද "ත්‍ර" ආදි ප්‍රත්‍යයාන්ත "කුත්‍ර" යනාදිය කෙරෙන් ද සාමාන්‍යාර්ථයෙහි වේ. එනම් "කශ්චිත් කාචිත් කිඤ්චිත්" යනාදි වශයෙන් ලිඞ්ගත්‍රයෙහිද; "කශ්චිත් කෞචිත් කෙචිත්" යනාදි වශයෙන් සියලු විභක්ති වචනයන්හිද වේ.

a. "තදධීනකාත්ස්න්‍යයොර්වා සාත්" තදධීනාර්ථෙ කාත්ස්න්‍යාර්ථෙ වා සාත්ප්‍රත්‍යයො භවති. රාඥොධීනං=රාජසාත්, සර්වං භස්ම ඉති-භස්මසාත්, අග්නෙඃ අධීනමිති=අග්නිසාත්. "සාත්ප්‍රත්‍යයස්‍ය ෂත්වං නෙච්ඡන්ති."

b. "උර්‍යුරර්‍යඞ්ගීකරණෙ"-උරීකෘත්‍ය, උරරීකෘත්‍ය

239. සද්‍ය ආදිඃ කාලෙ. (සද්‍ය අදිඃ 1, 1; කාලෙ 7, 1)

c. නිපාත්‍යන්තෙ. සද්‍යඃ අද්‍ය සපදි අධුනා ඉදානීම් සම්ප්‍රති සාම්ප්‍රතම් පූර්වේද්‍යුඃ පරේද්‍යුඃ අන්‍යෙද්‍යුඃ උභයෙද්‍යුඃ ආශු ශීඝ්‍රම් ඣටිති තූෂ්ණීම් යර්හි තර්හි ජොෂම් මෞනම්.

---

a. තදධීනකාත්ස්න්‍යයොඃ, ඔහුගේ අයිතිය සකලභාවය යන අර්ථදෙක්හි; වා, විකල්පයෙන්; සාත් සාත්ප්‍රත්‍යය වේ. තදධීනාර්ථෙ, ඔහුගේ අයිතිය යන අර්ථයෙහිද; කාත්ස්න්‍යාර්ථෙ, කෘත්ස්න භාවාර්ථයෙහි ද; වා, විකල්පයෙන්; සාත්ප්‍රත්‍යයඃ, භවති, සාත් ප්‍රත්‍යය වේ. රාඥඃ, රජහුගේ අධීනං, අයිතිය (යන අර්ථයෙහි;) රාජසාත්, "රාජසාත්" යනු වේ. සර්වම්, සියල්ල; භස්ම ඉති හලු වූයේ යන අර්ථයෙහි; භස්මසාත්, "භස්මසාත්" යනු වේ. අග්නෙඃ, අග්නිහුගේ; අධීනං ඉති, අයිතිය යන අර්ථයෙහි; අග්නිසාත්, "අග්නිසාත්" යනු වේ. සාත්ප්‍රත්‍යයස්‍ය, සාත්ප්‍රත්‍යයාගේ; සකාරං, සකාරයට; ෂත්වං, මූර්ධන්‍ය ෂකාරබව; නෙච්ඡන්ති, නොකැමති වෙත්. (මෙහි "අග්නිසාත්" යන තන්හි සාත් ප්‍රත්‍යයාගේ සකාරය ඉලප්‍රත්‍යාහාරීය ඉකාරයා කෙරෙන් පරවූවත් මූර්ධන්‍ය ෂකාරය නොවන බැව් කීහ.)

b. අඞ්ගීකරණෙ, පිළිගැනීම් අර්ථයෙහි; උරී උරරී, "උරී" "උරරී" යන දෙක (පූර්වයෙන්) නිපාතනය කරණු ලැබෙත්. උරීකෘත්‍ය උරරීකෘත්‍ය, ස්වීකාරකොට යන අර්ථයෙහි "උරීකෘත්‍ය" යනු ද "උරරීකෘත්‍ය" යනු ද වේ.

239. සද්‍යආදිඃ, "සද්‍යඃ" යනාදිය; කාලෙ, කාලාර්ථයෙහි වේ.

c. නිපාත්‍යන්තෙ, මේ "සද්‍යඃ" ආදිය නිපාතනය කරණු ලැබේ. සද්‍යඃ, සමාන වූ කාලයෙහි (එකෙණෙහි) යන අර්ථයෙහි "සද්‍යඃ" යනුද; අද්‍ය මේදවසෙහි (අද) යන අර්ථයෙහි "අද්‍ය" යනු ද; සපදි අධුනා ඉදානීම් සම්ප්‍රති සාම්ප්‍රතම්, පවත්නා කාලයෙහි (දැන් යන අර්ථයෙහි) "සපදි-සාම්ප්‍රතම්" යනු ද පූර්වේද්‍යුඃ, පෙරදවසෙහි යන අර්ථයෙහි "පූර්වේද්‍යුඃ" යනු ද පරේද්‍යුඃ අපරේද්‍යුඃ

240. ප්‍රාදිරුපසර්ගාඃ. (ප්‍රාදිඃ 1, 1; උපසර්ගාඃ 1, 1;)

a. "ප්‍ර පරා අප සම් අනු අව නිර් (නිස්) දුර් (දුස්) වි ආඞ් නි අධි අපි අති සු උත් අභි ප්‍රති පරි උප *ශ්‍රත් අන්තර් ආවිර්" අයං ගණඃ උපසර්ග-සංඥකඃ.

b. අව්‍යයාත් පරස්‍යා විභක්තේර්ලුග්භවති, න ශබ්දනිර්දේශෙ, †"ආපශ්චෙති වක්තව්‍යම්" අව්‍යයානාං න ච ලිඞ්ගාදිනියමඃ, උක්තං ච:—

"සදෘශං ත්‍රිෂු ලිඞ්ගෙෂු සර්වාසු ච විභක්තිෂු,
වචනෙෂු ච සර්වෙෂු යන්න ව්‍යෙති තදව්‍යයම්"

උක්තාන්‍යලිඞ්ගාන්‍යව්‍යයානි

ඉති අව්‍යයප්‍රක්‍රියා.

අන්‍යෙද්‍යුඃ, අනික් දවසෙහි යන අර්ථයෙහි "පරෙද්‍යුඃ-අන්‍යෙද්‍යුඃ" යනුද; ආශු ශීඝ්‍රම් ඣටිති තූෂ්ණීම්, ශීඝ්‍රභාවාර්ථයෙහි "ආශු තූෂ්ණීම්" යනුද; යර්හි, යම්කලෙක්හි යන අර්ථයෙහි "යර්හි" යනුද; තර්හි; එකල්හි යන අර්ථයෙහි "තර්හි" යනුද; ජොෂම් මෞනම්, තූෂ්ණීම්භාවයෙහි "ජොෂම් මෞනම්" යනු ද වේ.

240. (උපසර්ග සංඥ සූත්‍ර යි.) ප්‍රාදිඃ, "ප්‍ර" යන මේ ආදිය උපසර්ගාඃ, උපසර්ග නම් වේ.

a. ප්‍ර-ආවිර්, "ප්‍ර-ආවිර්" යන; අයං ගණඃ, මේ ගණය; උපසර්ග සංඥකඃ, උපසර්ග නම් වේ.

b. අව්‍යයාත්, පරස්‍යාඃ, අව්‍යය ශබ්දයා කෙරෙන් පර වූ; විභක්තේඃ, විභක්තියට; ලුග්භවති, ලුක් වේ. ශබ්දනිර්දේශෙ; ශබ්දඛණ්ඩයෙන් රූපනිර්දේශය ඇති තන්හි; න, ලුක් නො වේ. ආපශ්ච ඉති, (අව්‍යයන් කෙරෙන් පර) "ආප්" ප්‍රත්‍යයට ද ලුක් වේ යයි වක්තව්‍යම්, කියයුතුයි. (එසේවුවත්) අව්‍යයානාම්, අව්‍යය ශබ්දයන්ගේ; ලිඞ්ගාදිනියමඃ, ලිඞ්ගවිභක්ත්‍යාදි නියමයෙක්; නච, නැත්තේ ද වේ. (එහෙයින් නො කියයුතු යි,) තත් ච; ඒ ලිඞ්ගාදි නියමයක් නැතිබවද; උක්තම්, කියන ලදී. (එනම්):-

---

* මේ "ශ්‍රත්" ආදි තුන බොහෝ ව්‍යාකරණයන්හි උපසර්ගසංඥයෙහි නොලැබේ.

† "ආපශ්චෙති වක්තව්‍යම්" යන්න බොහෝ සාරස්වතයන්හි අවිද්‍යමානයි.

යත්, යමක්; ත්‍රිෂු ලිඞ්ගෙෂු, ලිඞ්ගත්‍රයෙහිද; සර්වාසු විභක්තිෂු ච, සියලු විභක්තීන්හිද; සර්වෙෂු වචනෙෂු ච, සියලු වචනයන්හිද; සදෘශම්, සමාන වූයේ; න ව්‍යෙති, ව්‍යය නොවේද හෙවත් වෙනස් නොවේද; තත්, එය; අව්‍යයම්, අව්‍යය නම් වේ.

අලිඞ්ගානි, අලිඞ්ග වූ; අව්‍යයානි, අව්‍යයයෝ; උක්තානි, කියන ලද්දාහු. අව්‍යයප්‍රක්‍රියා, අව්‍යයප්‍රක්‍රියාව; ඉති, මෙතෙකින් සමාප්තයි.

භාෂාවිෂයෙහි පවත්නා අව්‍යයශබ්ද සමූහයද පදත්වයට පමුණුවා ගැණීම පිණිස ඔවුන් කෙරෙන්ද විභක්තියෙදීම කරණු ලැබේ. එහෙත් ඒ අව්‍යයන් කෙරෙන් පර විභක්තීන්ට මෙහි "ලුක්" ශබ්දයෙන් ලොප් කිරීම නියමිතයි. "අවාපෙ‍ය්‍යාඃ" යන තන්හි මෙන් ශබ්දමාත්‍රය ගතයුතු තන්හි ලොප් නොවේයයිද නිර්දිෂ්ටයි. "මේ "අවාපෙ‍ය්‍යාඃ" යන්නෙන් "අව අපි" යන ශබ්දමය ගණු ලැබේ. එබැවින් ඉන් පර වූ "ඔස්" විභක්තිය ලොප් නොවිය. තවද- "අව්‍යයාදාප්සුපඃ" යන පාණිනීය සූත්‍රය ඇසුරුකොට මෙහිද "ආපශ්චෙති වක්තව්‍යම්"යි කියනලදී. එහෙත් අව්‍යයන්ද පදත්වයට පමුණුවා ගැණීමට විභක්තියෙදීම අර්ථසහිත වුවත් ඔවුන්ගේ ලිඞ්ගභාගීත්වයක් නැති බැවින් "ආප්" ප්‍රත්‍යය යෙදීම අනර්ථකයයි භාෂ්‍යකාරයන් විසින් කියනලදී. මෙහිද ඊට අනුව "අව්‍යයානාම්" යනාදිය නිර්දිෂ්ටයි.

මෙකී අව්‍යයශබ්ද වනාහි බොහෝ ව්‍යාකරණයන්හි "ස්වර් ආදි ගණය චාදිගණය ප්‍රාදිගණය ච්විප්‍රත්‍යයාදිගණය"යි චතුර්විධ කොට කියත්. එහි ස්වර් ආදිගණය හා ච්විප්‍රත්‍යයාදිගණය වාචක වේ. (අර්ථය කියන්නේ) වේ, චාදිය හා ප්‍රාදිය ද්‍යෝතක (අර්ථය බබුලුවන්නේ) වේ, මොවුන් අතුරෙන් ප්‍රාදිගණය උපසර්ග නම්ද අන්‍ය වූ ගණත්‍රය නිපාත නම්ද වේ. එහි "උප සමීපෙ සෘජ්‍යන්තෙ උච්චාර්යන්තෙ ක්‍රියාවාචකස්‍ය ශබ්දස්‍යෙති=උපසර්ගාඃ" යනු නිරුක්ති හෙයින් ක්‍රියාවාචක ශබ්දයාගේ ආදීයෙහි යොදා අර්ථද්‍යෝතකත්වයෙන් කියනු ලබන්නේ උපසර්ග නම්, ධාතුහු වනාහි අනෙකාර්ථ වෙති, උපසර්ගයෝ ඒ ධාතු පිළිබඳ ලීනාර්ථයන් ප්‍රකාශකරන්නෝ වෙති. බොහෝ තන්හි එක උපසර්ගයක්ම නොව උපසර්ග කීපයක් එකට යෙදීද අර්ථද්‍යෝතක වෙති. එනම්—"ව්‍යවහාර සුව්‍යවහාර සමභිව්‍යාහාර" යනාදී වශයෙනි, මේ උපසර්ගයන්ගේ ද්‍යෝතකත්වය වනාහි:-

"ධාත්වර්ථං බාධතෙ කශ්චිත් කශ්චිත්තමනුවර්තතෙ,
තමෙව විශිනෂ්ට්‍යන්‍යඃ උපසර්ගගතිස්ත්‍රිධා"

යන මෙයින් නිර්දිෂ්ට ගතිත්‍රයෙන් යුක්ත වේ. මේ ගතිත්‍රය නම්– ධාතුව පිළිබඳ ප්‍රසිද්ධාර්ථබාධකත්වයද, තත්ප්‍රසිද්ධාර්ථානුවර්තිත්වයද තත්ප්‍රසිද්ධාර්ථවිශෙෂිත්වයද වේ. "ආගමනම් අවස්ථිතිඃ අනුතාපඃ" යනු ඊට පිළිවෙළින් උදාහරණයි. මෙහි "ගමනම්" යන්නෙහි ප්‍රසිද්ධ වූ "යෑම" යන අර්ථය "ආ" උපසර්ගයෙන් පෙරළා "ඒම" යන අර්ථයද "අව" යන උපසර්ගයෙන් 'ස්ථිතිඃ" යන්නෙන් ප්‍රසිද්ධ වූ "සිටීම" යන අර්ථයමද, "අනු" යන උපසර්ගයෙන් "තාපඃ" යන්නෙහි ප්‍රසිද්ධ වූ "තැවීම" යන අර්ථයම වෙනස්කොට "නැවත තැවීම" යන අර්ථයද ප්‍රකාශ කරණුලැබේ. සියලු උප සර්ගයන්ගේම ගතිය මෙසේයි.

"නිශ්චයෙන පතන්ත්‍යනෙකෙෂ්වර්ථෙෂ්විති=නිපාතාඃ" යනු "නිපාත" ශබ්දයාගේ නිරුක්ති බැවින් නිශ්චයෙන් අනෙකාර්ථ යන්හි වැටෙන්නෝ නිපාතයෝයි. නිපාතයන් අතුරෙන් ඇතැම් කෙනෙක් අර්ථද්‍යොතකවූවෝද (අර්ථය බබුලුවන්නෝද) ඇතැම් කෙනෙක් අර්ථවාචකවූවෝද (අර්ථය කියන්නෝද) ඇතැම් කෙනෙක් අනර්ථකවූවෝද (අර්ථරහිතවූවෝද) ඇතැම් කෙනෙක් ආගමවූවන් මෙන් අන්‍යයන් හා එකතුව අර්ථවාචකවූවෝද වෙත්. ඒ බැවිː—

"කෙප්‍යෙෂාං ද්‍යොතකාඃ කෙපි වාචකාඃ කෙප්‍යනර්ථකාඃ,
ආගමා ඉව කෙපි ස්‍යුඃ සම්භූයාර්ථස්‍ය වාචකාඃ"

යන්නෙන් නිර්දිෂ්ටයි. මේ උපසර්ග හා නිපාත ලිඞ්ගවිභක්ත්‍යාදි වශයෙන් ව්‍යය නොව එකලෙසින් පවත්නා බැවින් අව්‍යය නම් වෙත්. පාණිනීන් විසින් මේ අව්‍යයසංඥවෙහි ලා "තද්ධිතශ්චා සර්වවිභක්තිඃ, ක්ත්වාතොසුන්කසුනඃ, අව්‍යයීභාවශ්ච" යන සූත්‍රයෝද හදුරණ ලද්දහ. එබැවින් සාර්වවිභක්තික නොවූ "තස් ත්‍ර" ආදි තද්ධිතප්‍රත්‍යයාන්තයෝද, "ක්ත්වා" ප්‍රත්‍යයාදි කෘදන්තයෝද අව්‍යයීභාවසමාසයද අව්‍ය නම් වෙත්.

අව්‍යයප්‍රක්‍රියාර්ථ ව්‍යාඛ්‍යාව.

සාරාර්ථචන්ද්‍රිකා

සාරසවත සන්නය.

ද්විතීය භාගය.

විද්‍යොදය පරිවෙණාධිපති
කහවේ ශ්‍රී සුමඞ්ගල රතනසාරාභිධාන
ප්‍රධාන නායක මාහිමියන් වහන්සේ
විසින් ලියනලදී.

වෛද්‍ය ශිෂ්‍ය ඩී. ඩබ්ලිව්. ගුණවර්ධන
විසින්

ජිනාලඞ්කාර යන්ත්‍රාලයේ මුද්‍රණය කරවා
ප්‍රසිද්ධ කරණලදී.

2481
1937

a අධුනා ලිඞ්ගවිශෙෂවිජිඥාපයිෂයා ස්ත්‍රීප්‍රත්‍යයාඃ ප්‍රස්තූයන්තෙ.

241. ආබතඃ ස්ත්‍රියාම් (ආප් 1, 1; අතඃ 5, 1; ස්ත්‍රියාම් 7, 1;)

b අකාරාන්තාත් ස්ත්‍රියාං වර්තමානාදාප්‍රත්‍යයො භවති. ජායා මායා ශ්‍රද්ධා මෙධා ධාරා-ඉත්‍යාදි.

c "අජාදෙශ්චාබ්වක්තව්‍යඃ"

d "අජාශ්වා කොකිලා බාලා වත්සාදෞ ත්‍රිඵලාදිකෙ,
ඒඩාදෙරපවාදශ්ච මජාදේර්ග්‍රහණං පාඨක්."

ඒ ඒ ශබ්දයන්ගේ විභක්ත්‍යන්තස්වරූප නිරූපණය කොට ඉක්බිති ස්ත්‍රීත්වයෙහි තත්තත්ප්‍රත්‍යය භෙදයෙන් පවත්නා ශබ්ද ලක්ෂණ සංලක්ෂණය කරන්නා වූ ආචාර්‍යයීවරයෝ "අධුනා ලිඞ්ග විශෙෂ" යනාදිය කීහු.

a අධුනා, දැන් (අව්‍යයප්‍රක්‍රියාවට අනතුරුව); ලිඞ්ගවිශෙෂ විජිඥාපයිෂයා, (ස්ත්‍රී) ලිඞ්ගභෙද විශෙෂයෙන් දන්වනු කැමැත්තෙන්; ස්ත්‍රීප්‍රත්‍යයාඃ, ස්ත්‍රීප්‍රත්‍යයයෝ; ප්‍රස්තූයන්තෙ, පටන්ගණු ලැබෙත්.

241 ස්ත්‍රියාම්, ස්ත්‍රීඅර්ථයෙහිවූ; අතඃ, අකාරාන්තයාකෙරෙන්; ආප්, ආප්ප්‍රත්‍යය වේ.

b ස්ත්‍රියාං වර්තමානාත්, ස්ත්‍රීඅර්ථයෙහි පවත්නාවූ; අකාරාන්තාත්, අකාරාන්තයා කෙරෙන්; ආප්ප්‍රත්‍යයඃ භවති, ආප්ප්‍රත්‍යය වේ. ජායා, "ජාය" ශබ්දයා කෙරෙන් ස්ත්‍රී අර්ථයෙහි ආප්ප්‍රත්‍යය කළ කල්හි "ජායා" යනු වේ; (භාර්‍යයාවයි). මායා, "මාය" ශබ්දයා කෙරෙන් ස්ත්‍රීඅර්ථයෙහි ආප්ප්‍රත්‍යය කළ කල්හි "මායා" යනු වේ. (රැවටීමයි). ශ්‍රද්ධා, "ශ්‍රද්ධ" ශබ්දයා කෙරෙන් ආප්ප්‍රත්‍යය කළ කල්හි "ශ්‍රද්ධා" යනු වේ. (ඇදහීමයි). මෙධා, "මෙධ" ශබ්දයෙන් ආප්ප්‍රත්‍යය කළ කල්හි "මෙධා" යනු වේ, (ධාරණප්‍රඥාවයි) ධාරා, "ධාර" ශබ්දයෙන් ආප්ප්‍රත්‍යය කළ කල්හි "ධාරා" යනු වේ, (ජලධාරාදියයි). ඉත්‍යාදි, මේ ආදිය වේ.

c අජාදෙශ්ච, අජශබ්දාදිය කෙරෙන් ද; ආප්, ආප්ප්‍රත්‍යය; වක්තව්‍යඃ, කිය යුතුයි.

d අජා, "අජා" ශබ්දය; අශ්වා, "අශ්වා" ශබ්දය; කොකිලා, "කොකිලා" ශබ්දය; බාලා, "බාලා" ශබ්දය; වත්සාදෞ, "වත්සා" ශබ්දය යන මේ ආදිගණයෙහි ද; ත්‍රිඵලාදිකෙ, ත්‍රිඵලාදිගණ

38

a * අජාදෙශවති චකාරග්‍රහණාච්ඡුද්‍රාකන්‍යකෙන්‍යාදෞ ජාතිවාචකත්‍වෙන ප්‍රථමවයොවාචකත්‍වෙන ච ඊප් ප්‍රාප්තඃ, සොජාදිත්‍වාන්නභවතීති සූචිතම්, අජා එඩකා කොකිලා බාලා ශූද්‍රා ගණිකා ඉත්‍යාදි.

යෙහි ද; ඊබාදෙඃ, ඊප්ප්‍රත්‍යයාදීහුගේ; අපවාදඅර්ථම්, වැළැක්ම පිණිස; පෘථක්, වෙන් වසයෙන්; අජාදෙඃ ග්‍රහණම්, අජාදිගණ යාගේ ගැණීම වේ.

a අජාදෙශව ඉති, "අජාදෙශව" යන තන්හි; චකාරග්‍රහණාත්, චකාරග්‍රහණයෙන්; (මෙසේ ප්‍රකාශකරණලදී. එනම්):- ශූද්‍රා කන්‍යකෙන්‍යාදෞ, "ශූද්‍රා කන්‍යකා" යනාදියෙහි; ජාතිවාච කත්‍වෙන, ජාතිවාචකබැවින්ද; ප්‍රථමවයොවාචකත්‍වෙන ච, ප්‍රථම වයස වාචකබැවින්ද; ඊප්, ඊප්ප්‍රත්‍යය; ප්‍රාප්තඃ, පැමිණියේවේ. සඃ, ඒ ඊප්ප්‍රත්‍යය; අජාදිත්‍වාත්, අජාදිය බැවින්; නභවතීති, නොවේ යයි; සූචිතම්, ප්‍රකාශකරණලදී. අජා, "අජ" ශබ්දයා කෙරෙන් ස්ත්‍රී අර්ථයෙහි ආප්ප්‍රත්‍යය කළකල්හි "අජා" යනුවේ. (එළිය යනුයි.) "එඩක, කොකිල, බාල, ශූද්‍ර, ගණික" ශබ්දයන් කෙරෙන් ආප්ප්‍රත්‍යය කළකල්හි "එඩකා, කොකිලා, බාලා, ශූද්‍රා, ගණිකා" යනු වේ. ඉත්‍යාදි, මේ ආදිය වේ. (එඩකා, තිරළුය; කොකිලා, කොවුල්ය; බාලා, ලඳුරිය; ශූද්‍රා, ශූද්‍ර ජාතිය; ගණිකා, වෛශ්‍යාස්ත්‍රිය;)

මෙහි කී අජාදිය අකාරාන්තවත්ම වෙන්කොට කියනලද්දේ "අජා, එඩකා, අශ්වා, කොකිලා, ශූද්‍රා" යනාදියෙහි ජාතිවාචකත්‍ව යෙන් "ජාතෙරයොපධාත්" යන සූත්‍රයෙන් වන්නාවූ ඊප්ප්‍රත්‍ය යද, "බාලා කන්‍යකා වත්සා." යනාදියෙහි ප්‍රථමවයොවාචකත්‍ව යෙන් "ප්‍රථමවයොවාචිනොත ඊඩ්වක්තව්‍යඃ" යන්නෙන් වන්නාවූ ඊප්ප්‍රත්‍යයද, "ත්‍රිඵලා" ශබ්දාදියෙහි සමාහාරද්විගුත්‍වයෙන් "ඊප් සමාහාරෙ ගුණශ්ච" යන්නෙන් වන්නාවූ ඊප්ප්‍රත්‍යයද, "ගණිකා" යන තන්හි පුංයොගත්‍වයෙන් "පුංයොගෙ ච" යන සූත්‍රයෙන් වන් නාවූ ඊප්ප්‍රත්‍යයද, ප්‍රතිෂෙධකිරීම පිණිසයි. මෙහි කී ත්‍රිඵලාදිය නම් "ත්‍රිඵලා සංඵලා භස්ත්‍රාඵලා අජිනඵලා ශණඵලා පිණ්ඩඵලා" යනාදියයි, ඉන් "ත්‍රිඵලා" යන තන්හි සමාහාරත්‍වජාතිත්‍ව දෙකෙන්ම පැමිණියහැකි ඊප්ප්‍රත්‍යයද 'සංඵලා'' ආදියෙහි ජාතිත්‍වයෙන් පැමිණිය හැකි ඊප්ප්‍රත්‍යයද ප්‍රතිෂිද්ධයි.

---

* මේ වාක්‍යය බොහෝ පොත්වල නොදක්නා ලැබේ. මෙහි චග්‍රහණයෙන් ආප්ප්‍රත්‍යය සමුච්චයකිරීම විනා මෙබඳු අර්ථයක් නොහැඟේ. මේ අර්ථ පාඨග් ග්‍රහණයෙන් සූචිතයි. විමසිය යුතුයි.

242. කාප්‍යතඃ. (කාශි 7, 1; අනඃ 6, 1;)

a ස්ත්‍රියාං කාපි පරෙ පූර්වස්‍යාකාරස්‍ය ඉකාරො භවති, කන්‍යකාදෞ න භවති. කරෙතීති=කාරිකා, පචතීති=පාචිකා, පඨතීති=පාඨිකා.

b වෂ්ටි භාගුරිරල්ලොපමවාප්‍යොරුපසර්ගයොඃ,
ආපං චෛව හලන්තානාං යථා වාචා නිශා දිශා.

අවගාහ්‍ය-වගාහ්‍ය, අපිහිතම්-පිහිතම්, අපිධානම්-පිධා නම්.

---

242 කාපි, "කාප්" ප්‍රත්‍යය පරකල්හි, හෙවත් කයන්තෙන් යුක්ත ආප්ප්‍රත්‍යය පරකල්හි; අතඃ, අකාරයට ඉකාරය වේ.

a ස්ත්‍රියාං, ස්ත්‍රීඅර්ථයෙහි වූ; කාපි පරෙ, "කාප්" ප්‍රත්‍යය පර කල්හි; පූර්වස්‍ය අකාරස්‍ය, පූර්වඅකාරයට; ඉකාරඃ භවති, ඉකාරය වේ. කන්‍යකාදෞ, කන්‍යකා ශබ්දාදියෙහි; නභවති, නොවේ. කාරෙතීති, කෙරේනුයි; කාරිකා, "කාරිකා" නම් වේ. (කරන්නී යයි). පචතීති, පිසානුයි; පාචිකා, "පාචිකා" නම් වේ; (පිසන්නී යයි) පඨතීති, කියානුයි; පාඨිකා, "පාඨිකා" නම් වේ. (කියන්නී යයි). (මෙහි පුංලිඞ්ගවිෂයෙහි "කාරක" ආදි වශයෙන් සිටි රූප කෙරෙන් ස්ත්‍රීඅර්ථයෙහිවූ ආප්ප්‍රත්‍යය කයන්ත හා යුක්තවූ කල්හි "කාප්" ප්‍රත්‍යයයි කියනු ලැබේ. ඒ පරනිමිත්තෙන් පූර්ව අකාරයට ඉකාරව "කාරිකා" යනාදිය වේ. මෙහි කී කයන්ත වූකලි ප්‍රත්‍යය ස්ථ කකාරයක්ම වියයුතුයි. එබැවින් "ශක්නොතීති-ශකා" යනාදියෙහි මෙහි ඉකාරය නොවේ. මෙහි කයන්ත ධාතුස්ථ බැවිනි.

b භාගුරිඃ, භාගුරි නම් ආචාර්‍ය්‍යතෙමේ; අවාප්‍යොඃ උපසර්ගයොඃ "අව අපි" යන උපසර්ගදෙදෙනාගේ; අල්ලොපං, අකාරලොපය; වෂ්ටි, කැමැති වේ. හලන්තානාම්, හලන්තශබ්දයන් සම්බන්ධව; ආපං ච එව, "ආප්" ප්‍රත්‍යයද; වෂ්ටි, කැමැති වේ; යථා, එනම්; වාචා, "වාච්" ශබ්දයා කෙරෙන් ආප්ප්‍රත්‍යය වීමෙන් "වාචා" යනුද, නිශා "නිශ්" ශබ්දයා කෙරෙන් ආප්ප්‍රත්‍යය වීමෙන් "නිශා" යනුද; දිශා, "දිශ්" ශබ්දයාකෙරෙන් "ආප්" ප්‍රත්‍යය වීමෙන් "දිශා" යනුද වේ. (මේ ශ්ලොකයෙහි පූර්වාර්ධය අව්‍යයප්‍ර ක්‍රියාව පිළිබඳවද අපරාර්ධය මේ ස්ත්‍රීප්‍රත්‍යය පිළිබඳව ද කියනලදී.)

243. හ්‍රස්වො වා. (ඍසඃ 1, 1; වා 1, 1;)

a ඞ්‍යාම් කාපි පරෙ තරාදෞ ච පූර්වස්‍ය වා හ්‍රස්වො භවති (තරතමරූපකල්පාඃ තරාදයඃ). වෙණ්‍යෙව=වෙණිකා-වෙණීකා, නද්‍යෙව=නදිකා-නදීකා; අතිශයෙන ප්‍රශස්‍යා ඉති=ශ්‍රෙයසී, *අතිශයෙන ශ්‍රෙයසී ඉති=ශ්‍රෙයසිතරා-ශ්‍රෙයසීතරා, "තරතඃ පූර්වස්‍ය පුංවත්" ශ්‍රෙයස්තරා; විදුෂිතරා-විදුෂීතරා-විද්වත්තරා, භවතිතරා-භවතීතරා-භවත්තරා; සතිතරා-සතීතරා-සත්තරා: නෞකාදෞ නභවති, නෞකා.

අවගාහ්‍ය වගාහ්‍ය, "අවගාහ්‍ය" යන තන්හි "අව" උපසර්ගයාගේ අකාරලොපයෙන් "වගාහ්‍ය" කියාද; අපිහිතම්- පිහිතම්, "අපිහිතම්" යන තන්හි "අපි" උපසර්ගයාගේ අකාරලොපයෙන් "පිහිතම්" කියාද; අපිධානම්-පිධානම් "අපිධානම්" යන තන්හිද "අපි" උපසර්ගයාගේ අකාරලොපයෙන් "පිධානම්" කියාද වේ. (මේ භාගුරිමත වසයෙනි).

243 වා, විකල්පයෙන්; හ්‍රස්වඃ, කාප්ප්‍රත්‍යය හා තරාදිය පරකල්හි) පූර්වයට හ්‍රස්ව වේ.

a ඞ්‍යාම්, ඞ්‍යර්ථයෙහි; කාපි පරෙ, කාප්ප්‍රත්‍යයපරකල්හිද; තරාදෞ ච, තරප්‍රත්‍යයාදිය පරකල්හි ද; පූර්වස්‍ය, පූර්වයට; වා, විකල්පයෙන්; හ්‍රස්වඃ භවති, හ්‍රස්ව වේ. තරතමරූපකල්පාඃ, "තර තම රූප කල්ප" යන ප්‍රත්‍යයයෝ; තරාදයඃ, තරාදීහු වෙත්. වෙණී එව කෙශරචනාවම, නොහොත් එනම් නදියම; වෙණිකා, (ඊකාරයට හ්‍රස්වවීමෙන්) "වෙණිකා" කියාද; වෙණීකා, (විකල්පයෙන් හ්‍රස්ව නොවීමෙන්) "වෙණීකා" කියාද වේ; නදී එව, නදියම; නදිකා, හ්‍රස්වත්වයෙන් "නදිකා" කියාද; නදීකා, (හ්‍රස්ව නොවීමෙන්) 'නදීකා" කියාද වේ. අතිශයෙන, අතිශයින් ප්‍රශස්‍යා ඉති, පැසසිය යුත්තී නුයි; ශ්‍රෙයසී, "ශ්‍රෙයසී" නම් වේ. අතිශයෙන ශ්‍රෙයසී, ඉතා අතිශයින් පැසසියයුත්තී නුයි; ශ්‍රෙයසිතරා (හ්‍රස්ව පක්ෂයෙහි) "ශ්‍රෙයසිතරා" කියාද; ශ්‍රෙයසීතරා, (විකල්පයෙන් හ්‍රස්වනුවූපක්ෂයෙහි) "ශ්‍රෙයසීතරා" කියාද වේ. තරතඃ, තර ප්‍රත්‍යය පරකල්හි; පූර්වස්‍ය, පූර්වයට; පුංවත්, පුංවත් වේ. ශ්‍රෙයස්තරා, (එකල්හි) "ශ්‍රෙයස්තරා" යනු වේ. විදුෂිතරා-විදුෂීතරා-විද්වත්තරා. ('අතිශයෙන විදුෂී" යන වාක්‍යයෙහි) හ්‍රස්වවීමෙන් "විදුෂිතරා" කියාද, හ්‍රස්ව නොවීමෙන් "විදුෂීතරා" කියාද, පුංවත් වීමෙන් "විද්වත්තරා" කියාද වේ. (අතිශයින් පණ්ඩිතවූ ස්ත්‍රිය යන අර්ථයි). භවතිතරා-භවතීතරා-භවත්තරා, ("අතිශයෙන භවතී" යන වාක්‍යයෙහි) එසේම "භවතිතරා" කියාද "භවතීතරා" කියාද, 'භවත්තරා' කියාද වේ; (අතිශයින් පිණැත්තී යන අර්ථයි). සතිතරා-සතීතරා-සත්තරා, ("අතිශයෙන සතී" යන වාක්‍යයෙහි "සතිතරා" කියාද, "සතීතරා" කියාද, "සත්තරා" කියාද වේ. (අතිශයින් පතිව්‍රතාස්ත්‍රිය හෝ සාධ්වී යන අර්ථයි) මෙහි පුංවත්වූ තන්හි තර ප්‍රත්‍යයෙන් පූර්වයෙහි ඒ ඒ ශබ්දයන්ගේ පුංලිඞ්ග විෂයෙහි ශබ්ද ප්‍රකෘතිහු ශෙෂ වෙත්.)

* මේ සම්භරතන්හි ශ්‍රෙයසී එව - ශ්‍රෙයසිතරා"යි දක්නා ලැබේ.

a *"ආබන්තස්‍යානාබන්තස්‍යාපි කප්‍රත්‍යයෙ පරෙ බහුව්‍රීහෞ වා" බහුමාලාකඃ-බහුමාලකඃ, සුසොමපාකඃ-සුසොමපකඃ, වාග්‍රහණාදෙවෙයං විවක්ෂා. නිශවයෙන පතන්ත්‍යනෙකෙෂ්වර්ථෙෂ්විති=නිපාතාඃ, නිපාතානාමනෙකාර්ථත්වාත්, උක්තං හි:-

---

a බහුව්‍රීහෞ, බහුව්‍රීහිසමාසයෙහි; කප්‍රත්‍යයෙ පරෙ, කප්‍රත්‍යය පරකල්හි; ආබන්තස්‍ය, ආප්ප්‍රත්‍යයාන්තයටද; අනාබන්තස්‍ය අපි, ආප්ප්‍රත්‍යයාන්ත නුවූවහුටද; වා, විකල්පයෙන්; (හ්‍රස්වවේ). බහුමාලාකඃ-බහුමාලකඃ, ("බහ්ව්‍යො මාලා යස්‍යාසෞ" යන වාක්‍යයෙහි) විකල්පයෙන් හ්‍රස්ව නොවීමෙන් "බහුමාලාකඃ" යනුද, හ්‍රස්ව වීමෙන් "බහුමාලකඃ" යනුද වේ. සුසොමපාකඃ-සුසොමපකඃ, ("සුෂ්ඨු සොමපා යස්‍යාසෞ" යන වාක්‍යයෙහි) හ්‍රස්ව නොවීමෙන් "සුසොමපාකඃ" යනු ද හ්‍රස්වවීමෙන් "සුසොමපකඃ" යනු ද වේ. යහපත් සොමරස පානය කරන්නෙක් ඇත්තේ යන අර්ථයි.) වාග්‍රහණාත් එව, ("හ්‍රස්වො වා" යන සූත්‍රයෙහි) වාශබ්දග්‍රහණයෙන්ම; ඉයං විවක්ෂා, මේ විවක්ෂාව (කියනුකැමැත්ත) වේ. නිශවයෙන, නිශවයෙන්; අනෙකෙෂු අර්ථෙෂු, නොයෙක් අර්ථයන්හි; පතන්තීති, වැටෙත් නුයි; නිපාතාඃ, නිපාත නම් වෙත්. නිපාතානාම්, (ඒ) නිපාතයන් තමා; අනෙකාර්ථත්වාත්. (මෙකී නිර්වචනයෙන්) නොයෙක් අර්ථ ඇති බැවිනි; උක්තං හි, (ඒ) කියන ලද්දේමැයි:-

* මෙය බොහෝ සාරස්වතයන්හි නොදක්නා ලැබේ. සිද්ධාන්තකෞමුදියෙහි "ආපොන්‍යතරස්‍යාම්" යන සූත්‍රයෙන් කප්ප්‍රත්‍යයපරකල්හි ආප්ප්‍රත්‍යයාන්තයට හ්‍රස්ව වේයයි කියා "බහුමාලාකඃ-බහුමාලකඃ" යි උදාහරණ කරණ ලදී. විමසා දතයුතුයි.

a නිපාතාශ්චෝපසර්ගාශ්ච ධාතවශ්චෙති තෙ ත්‍රයඃ, අනෙකාර්ථාඃ ස්මෘතාඃ සර්වෙ පාඨස්තෙෂාං නිදර්ශනම්.

244. නෲණ ඊප් (නෲණඃ 5, 1; ඊප් 1, 1;)

b නකාරාන්තාදෘකාරාන්තාදණ්ණන්තාච්ච ස්ත්‍රියාමීප්ප්‍රත්‍යයො භවති. දණ්ඩිනී, කරිණී, මාලිනී; (ඊපි රාඥඃ අලොපො වක්තව්‍යඃ) රාඥී, "ශ්වාදෙඃ" (172. ප්‍ර. සූ.) ශුනී, කර්ත්‍රී, හර්ත්‍රී. ඖපගවී.

---

a සර්වෙ, සියලු; නිපාතාශ්ච, නිපාතයෝද; උපසර්ගාශ්ච, උපසර්ගයෝද; ධාතවශ්ච ඉති, ධාතුහුද යන; තෙ ත්‍රයඃ, ඒ කොටස් තුණ; අනෙකාර්ථාඃ, නොයෙක් අර්ථ ඇත්තාහු; ස්මෘතාඃ, දන්නා ලද්දාහ; තෙෂාං, ඔවුන්ට; පාඨඃ, (උච්චාරණ) පාඨසමූහය; නිදර්ශනං, නිදසුන්වේ.

"තරතඃ පූර්වස්‍ය පුංවත්" යනාදියද, "ආබන්තස්‍ය" යනාදියද "හ්‍රසෙච්චා වා" යන සූත්‍රයෙහි වාශබ්දයෙන් විවක්‍ෂිත විය. ඒ නිපාතයන්ගේ අනෙකාර්ථත්වයෙනි, ඒ දක්වනුපිණිස "නිශ්ච යෙත" යනාදියද, "නිපාතාශ්චෝපසර්ගාශ්ච" යනාදියද කියන ලදී. භාෂාවන්හි විද්‍යමානවූ නිපාත උපසර්ග ධාතු යන තුන් කොටස නානාර්ථ බැවින් උච්චාරණ විෂයෙහි පවත්නා තන්ත්‍ර භෙදාත්මක ශබ්දද නානාර්ථ වෙත්. එබැවින් ඒ ශබ්ද සමූහ තෙමේම ඊට නිදර්ශන වේ. නවද ස්ත්‍රීඅර්ථයෙහි ආප්ප්‍රත්‍යය යෙදෙන තැන් සාමාන්‍යයෙන් දක්වා ඉක්බිති ඊප්ප්‍රත්‍යය යෙදෙන තැන් දක්වනු පිණිස "නෲණ ඊප්" යනාදීය කීහු.

244 නෲණඃ, නකාරාන්තය ඍකාරාන්තය අණ්ප්‍රත්‍යයාන්තය යන මොහු කෙරෙන්; ඊප්, (ස්ත්‍රීඅර්ථයෙහි) ඊප්ප්‍රත්‍යය වේ.

නකාරාන්තාත්, නකාරාන්තයා කෙරෙන් ද; ඍකාරාන්තාත්, ඍකාරාන්තයා කෙරෙන් ද; අණන්තාත් ච, අණ්ප්‍රත්‍යයාන්තයා කෙරෙන් ද; ස්ත්‍රියාං, ස්ත්‍රීඅර්ථයෙහි; ඊප්ප්‍රත්‍යයඃ භවති, ඊප් ප්‍රත්‍යය වේ. "දණ්ඩිනී" යන තන්හි "දණ්ඩින්" යන නකාරාන්තයා කෙරෙන් ස්ත්‍රීඅර්ථයෙහි ඊප්ප්‍රත්‍යයයි. "කරිණී, මාලිනී" යන තන්හිද "කරින් මාලින්" යන නකාරාන්තයන් කෙරෙන් ඊප්ප්‍රත්‍යයයි. (දණ්ඩිනී, දඬුඇත්තිය; කරිණී, ඇතින්නිය; මාලිනී, මාලාකාර ස්ත්‍රිය;) ඊපි, ඊප්‍රත්‍යය පරකල්හි; රාඥඃ, රාජන් ශබ්දයාගේ; අලොපඃ, අකාරලොපය; වක්තව්‍යඃ කියයුතුයි. "රාඥී" යන

245. යස්‍ය ලොපඃ. (යස්‍ය 6, 1; ලොපඃ 1, 1;)

a ඉශ්ච අශ්ච යඃ, තස්‍ය ලොපො භවති ස්වරෙ යකාරෙ ච පරෙ. (විභක්තිස්වරං යුප්‍රත්‍යයං ච වර්ජයිත්වාන්‍යස්මින් ස්වරෙ යකාරෙ ච පරෙ ඉති ශෙෂඃ. තෙන-දෙවෙ, වාතායුඃ, ඖෂ්ණායුඃ ඉත්‍යත්‍ර න භවති. සමාසතද්ධිතස්ත්‍රීප්‍රත්‍යයෙෂ්වයං විධිර්වෙදිතව්‍යඃ).

තන්හි "රාජන්" යන නකාරාන්තයා කෙරෙන් ඊප්ප්‍රත්‍යයයි, ("රාජපත්නී" යන අර්ථයි). "ශ්වාදෙඃ" යන සූත්‍රයෙන් වකාරයට උකාරය වේ. "ශුනී" යන තන්හි "ශ්වන්" යන නකාරාන්තයා කෙරෙන් ඊප්ප්‍රත්‍යයයි. ("ශුනඛී" යන අර්ථයි). "කර්ත්‍රී" යන තන්හි "කර්තෲ" යන ඍකාරාන්තයා කෙරෙන් ඊප්ප්‍රත්‍යයයි; (කරන්නී යන අර්ථයි). "හර්ත්‍රී" යන තන්හි "හර්තෲ" යන ඍකාරාන්තයා කෙරෙන් ඊප්ප්‍රත්‍යයයි; (හරණකාරක චෞරස්ත්‍රී යන අර්ථයි). "ඖපගවී" යන තන්හි "ඖපගව" යන "අණ්" ප්‍රත්‍යයාන්තයාකෙරෙන් ඊප්ප්‍රත්‍යයයි. (උපගුපුත්‍රී යන අර්ථයි).

245 යස්‍ය, ඉවර්ණයට හා අවර්ණයට; ලොපඃ, (ස්වරය හෝ යකාරය පරකල්හි) ලොප් වේ.

a ඉශ්ච, ඉවර්ණයද; අශ්ච, අවර්ණයද; යඃ, "ය" නම් වේ. තස්‍ය, ඕහට (ඉවර්ණඅවර්ණ දෙකට); ස්වරෙ, ස්වරයාපරකල්හිද; යකාරෙ ච පරෙ, යකාරයාපරකල්හිද; ලොපඃ භවති, ලොප්වේ. විභක්ති ස්වරං, විභක්තිසම්බන්ධි ස්වරය ද; යුප්‍රත්‍යයං ච, යුප්‍රත්‍යයද; වර්ජයිත්වා, හැර; අන්‍යස්මින්, එයින් අන්‍යවූ; ස්වරෙ, ස්වරයක්ද; යකාරෙ, යකාරයක්ද; පරෙ ඉති, පරකල්හි යයි; ශෙෂඃ, දතයුතුයි. තෙන, එහෙයින්; දෙවෙ වාතායුඃ ඖෂ්ණායුඃ ඉති, "දෙවෙ වාතායුඃ ඖෂ්ණායුඃ" යන; අත්‍ර, මෙහි; න භවති, අවර්ණ ලොපය නොවේ. සමාසතද්ධිතස්ත්‍රීප්‍රත්‍යයෙෂු, සමාසතද්ධිත ස්ත්‍රීප්‍රත්‍යයන් විෂයෙහි; අයං විධිඃ, මේ විධිය; වෙදිතව්‍යඃ, දතයුතුයි. "ණිතො වා" යන සූත්‍රයෙන් මෙහි වායන්ත අනුවර්තනය වන බවද, එහි ව්‍යවස්ථාවාචකත්වයෙන් මේ "විභක්තිස්වරං" යනාදිය විවක්‍ෂිතයයිද ඇතැම් ටීකාවන්හි කියනලදී. මෙහි "දෙවෙ" යන තන්හි "දෙව" ශබ්දයා කෙරෙන් පරවූ ස්වරය නිවිභක්තිස්වරය බැවින් ද "වාතායුඃ ඖෂ්ණායුඃ" යන තන්හි ඊප්‍රත්‍යය බැවින්ද යථොක්ත ලොපය නොවීය (මෙතැන් පටන් වාර්තිකයෝ යථොක්ත වාශබ්දයාගේ ව්‍යවස්ථා භාවයෙන්ම යුප්‍රත්‍යය නොවන තැන් කීහු.)

a “ස්වස්‍රාදිනාම්මන්නන්තානාං සඞ්ඛ්‍යාවාචිනාං ච නෛප් වක්තව්‍යඃ”

b ස්වසා තිස්‍රශ්චතස්‍රශ්ච නනාන්දා දුහිතා තථා,
යාතා මාතෙති සප්තෛතෙ ස්වස්‍රාදය උදාහෘතාඃ.

c ස්වසා දුහිතා සීමා පඤ්චත්‍යාදි. “පාදන්තාත්සත්‍රියාමීබ් වා වක්තව්‍යඃ” ද්විපදී-ද්විපාත්, “ඍචි පාදන්තාද්‍යබෙව වක්තව්‍යො න ඊප්” “පාදඃ පත්” (ප්‍ර: සූ:) **ද්විපදා, ඍක්.**

---

a ස්වස්‍රාදීනාං, “ස්වසෘ” ශබ්දාදීන් සම්බන්ධව ද; මන්නන්තානාං, මන්භාගාන්තශබ්දයන් සම්බන්ධවද; සඞ්ඛ්‍යාවාචිනාං ච, සඞ්ඛ්‍යා වාචක ශබ්දයන් සම්බන්ධව ද; ඊප්, ඊප්ප්‍රත්‍යය; නවක්තව්‍යඃ, නොකියයුතුයි.

b ස්වසා, ස්වසෘශබ්දයද; තිස්‍රශ්ච, “තිසෘ” ආදෙශයද; චතස්‍රශ්ච, “චතසෘ” ආදෙශයද; නනාන්දා, “නනාන්දෘ” ශබ්දයද; දුහිතා, “දුහිතෘ” ශබ්දයද; තථා, එසේම; යාතා, “යාතෘ” ශබ්දයද; මාතා ඉති, “මාතෘ” ශබ්යද යන; එතෙ සප්ත, මේ සත; ස්වස්‍රාදයඃ, “ස්වසෘ” ශබ්දාදීහු යයි; උදාහෘතාඃ, ගෙණහැර දක්වන ලද්දාහ.

මෙහි පූර්වොක්ත “නුණ ඊප්” යන සූත්‍රයෙහි කී ඍකාරාන්ත නකාරාන්තයන් අතුරෙන් ඍකාරාන්තවූ මේ “ස්වසෘ” ශබ්දාදිය කෙරෙන්ද නකාරාන්තවූ මන්භාගාන්ත “සීමන්” ශබ්දාදිය කෙරෙන් හා “පඤ්චන්” ආදි නකාරාන්ත සඞ්ඛ්‍යාවාචකයන් කෙරෙන්ද ඊප්ප්‍රත්‍යය නොවේ යයි කියන ලදී. මෙය පාණිනීන් විසින් “න ෂට් ස්වස්‍රාදිභ්‍යඃ” යන සූත්‍රයෙන් ෂට්සංඥක ෂකාරාන්ත නකාරාන්ත සංඛ්‍යාශබ්දයන් කෙරෙන් හා ස්වසෘශබ්දාදිය කෙරෙන් ද, “මනඃ” යන සූත්‍රයෙන් මන්භාගාන්තයාකෙරෙන්ද ඞීප් ටාප් (ඊප් ආප්) ප්‍රත්‍යයදෙක නොවේයයි කියනලදී. මන්භාගාන්තයා කෙරෙන් ඩාප්ප්‍රත්‍යය වේයයිද කියනලදී.

c “ස්වසා, දුහිතා” යනු ස්වසෘශබ්දාදිය කෙරෙන් ඊප්ප්‍රත්‍යය නොවීමට උදාහරණයි; “සීමා” යනු මන්භාගාන්තයාකෙරෙන් ඊප්ප්‍රත්‍යය නොවීමට උදාහරණයි. “පඤ්ච” යනු නකාරාන්තසංඛ්‍යා ශබ්දයා කෙරෙන් ඊප්ප්‍රත්‍යය නොවීමට උදාහරණයි. ඉත්‍යාදි, මේ ආදිය වේ. (පූර්වොක්ත පාණිනීය සූත්‍ර ක්‍රමයෙන් මෙහි “ආප්”

a “අන්නන්තාද් බහුව්‍රීහෙර්ඩාබ් වා වාච්‍යඃ” බහුසීමා බහුසීමෙ බහුසීමාඃ, පක්ෂෙ-බහුසීමා බහුසීමානෞ බහුසීමානඃ, බහුයජ්වා බහුයජ්වෙ බහුයජ්වාඃ, පක්ෂෙ-බහුයජ්වා බහුයජ්වානෞ බහුයජ්වානඃ.

b “උපධාලොපිනො න්‍යන්තාද් බහුව්‍රීහෙර්ඩීබ් වා”- බහුරාඥී බහුරාඥ්‍යෞ, පක්ෂෙ ඩාප්-බහුරාජා බහුරාජෙ, ඩාපොප්‍යභාවෙ බහුරාජා බහුරාජානෞ. “සඞ්ඛ්‍යාදෙර්දිම්න ඊප්” ද්විදාම්නී.

ප්‍රත්‍යයද නොවන සේ ගතයුතුයි.) පාදන්තාත්, (කරණලද සමාස ඇති) පාත්ශබ්දාන්තයා කෙරෙන්; ස්ත්‍රියාම්, ස්ත්‍රීඅර්ථයෙහි; ඊප්, ඊප්ප්‍රත්‍යය; වා, විකල්පයෙන්; වක්තව්‍යඃ, කියයුතුයි. ද්විපදී-ද්විපාත්, ඊප්ප්‍රත්‍යයවූ පක්ෂයෙහි “ද්විපදී” යනුද, නුවූපක්ෂයෙහි “ද්විපාත්” යනුද වේ. (එනම් ඡන්දොභෙදයයි.) ඍචි, ඍග්වෙදවිෂයෙහි; පාදන්තාත්, “පාත්” ශබ්දාන්තයා කෙරෙන්; ආප්එව, ආප් ප්‍රත්‍යයම; වක්තව්‍යඃ, කියයුතුයි; න ඊප්, ඊප්ප්‍රත්‍යය නොවේ. “පාදඃ පත්” යන සූත්‍රයෙන් පාත්ශබ්දයට “පත්” ආදෙශ වේ. ද්විපදා, (“ද්වෞ පාදෞ යස්‍යාඃ සා” යන වාක්‍යයෙහි) “ද්විපදා” යනු වේ. ඍක්, ඍග්විශෙෂයයි.

a අන්නන්තාත්, අන්භාගාන්තවූ; බහුව්‍රීහෙඃ, බහුව්‍රීහි සමාසයා කෙරෙන්; ඩාප්, ඩාප්ප්‍රත්‍යය; වා, විකල්පයෙන්; වාච්‍යඃ, කියයුතුයි. බහුසීමා, (“බහ්ව්‍යඃ සීමානො යස්‍යාඃ සා” යන වාක්‍යයෙහි) ස්ත්‍රීඅර්ථයෙහි ඩාප්ප්‍රත්‍යය වීමෙන් “බහුසීමා” යනු වේ. ද්විවචන බහුවචන දෙක්හි “බහුසීමෙ බහුසීමාඃ” යනු වේ. පක්ෂෙ, විකල්පයෙන් ඩාප්ප්‍රත්‍යය නුවූ පක්ෂයෙහි; බහුසීමා බහුසීමානෞ බහුසීමානඃ, එකද්විබහුවචනයන්හි “බහුසීමා බහුසීමානෞ බහුසීමානඃ” යනු වේ. (“බහුසීමා” යනු බොහෝ ඉම් ඇති නගරියක් යන අර්ථයි.) (පාණිනීය ක්‍රමයෙන් මෙහි “ඩාප්” ප්‍රත්‍යය කෙවල “සීමන්” ශබ්දයා කෙරෙන්ද වේ.) බහුයජ්වා, (“බහවො යජ්වානො යස්‍යාඃ සා” යන වාක්‍යයෙහි) ස්ත්‍රීඅර්ථයෙහි ඩාප්ප්‍රත්‍යයවීමෙන් “බහුයජ්වා” යනු වේ. බහුයජ්වෙ බහුයජ්වාඃ, ද්විවචන බහුවචන දෙක්හි “බහුයජ්වෙ බහුයජ්වාඃ” යනු වේ. පක්ෂෙ, ඩාප්ප්‍රත්‍යය නුවූපක්ෂයෙහි; බහුයජ්වා බහුයජ්වානෞ බහුයජ්වානඃ, එකද්වි බහුවචනයන්හි “බහුයජ්වා බහුයජ්වානෞ බහුයජ්වානඃ” යනුවේ. (බහුයජ්වා” යනු බොහෝ යාගකරුවන් ඇති නගරියයි.)

b උපධාලොපිනඃ, උපධාසංඥලොපය ඇත්තාවූ; අන්නන්තාත් අන්භාගාන්තවූ; බහුව්‍රීහෙඃ, බහුව්‍රීහි සමාසයා කෙරෙන්; වා, විකල්ප

246 ෂටව්‍රිතඃ. (ෂට්‍රි තඃ 5, 1;)

a ෂකාර ටකාර උකාර ඍකාරානුබන්ධාච්ච ස්ත්‍රියාමීප් ප්‍රත්‍යයො භවති. (ෂ් ච ට් ච උශ්ච ඍශ්ච එෂාං සමාහාරඃ= ෂටවෘ, ෂටවෘ ඉත් යස්‍ය සො=ෂටව්‍රිත්, තස්මාත් ෂටව්‍රිතඃ.

යෙන්; ඊප්, ඊප්ප්‍රත්‍යය වේ. බහුරාඥී, ("බහවො රාජානො යස්‍යාඃ සා" යන වාක්‍යයෙහි) ඊප්ප්‍රත්‍යය වීමෙන් "බහුරාඥී" යනු වේ. ද්විවචනයෙහි "බහුරාඥ්‍යෞ" යනු වේ. පක්‍ෂෙ, ඊප්ප්‍රත්‍යය නුවූ පක්‍ෂයෙහි; ඩාප්, ඩාප්ප්‍රත්‍යය වේ. එහි එකවිවචනයන්හි 'බහුරාජා බහුරාජෙ" යනු වේ. ඩාපඃ අපි, ඩාප්ප්‍රත්‍යයාගේ ද; අභාවෙ, නොවීමෙහි; "බහුරාජා බහුරාජනෞ" යනු වේ. ("බහුරාඥී යනු බොහෝ රජුන් ඇති නගරියයි.) සංඛ්‍යාදෙඃ, සංඛ්‍යාශබ්ද යක් ආදි කොට ඇත්තාවූ; දාම්නඃ, දාමන් ශබ්දයාකොරෙන්; ඊප්, ඊප් ප්‍රත්‍යය වේ. ද්විදාම්නී, ("ද්වෙ දාමනී යස්‍යාඃ සා" යන වාක්‍ය යෙහි) ඊප්ප්‍රත්‍යය වීමෙන් "ද්විදාම්නී යනු වේ. ("ද්විදාම්නී" යනු රැහැන් දෙකක් ඇති බෙනුවයි)

246 ෂටව්‍රිතඃ, ෂකාරය ටකාරය උකාරය ඍකාරය යන මොවුන් ඉත්කොට ඇත්තනු කොරෙන් (ස්ත්‍රීඅර්ථයෙහි ඊප් ප්‍රත්‍යය වේ.)

a ෂකාර ටකාර උකාර ඍකාරානුබන්ධාච්ච, ෂකාර ටකාර උකාර ඍකාර යන මොවුන් අනුබන්ධකොට ඇත්තහු කොරෙන්ද; ස්ත්‍රියාම්, ස්ත්‍රී අර්ථයෙහි; ඊප්ප්‍රත්‍යයඃ භවති, ඊප්ප්‍රත්‍යය වේ. (ෂ් ච, "ෂ්" යන්නද; ට් ච, "ට්" යන්නද; උශ්ච උයන්නද; ඍශ්ච, "ඍ" යන්නද (යන); එෂාං, මොවුන්ගේ; සමාහාරඃ; සමාහාරය (එක්කොට ගැන්ම) ෂටවෘ "ෂටවෘ" නම් වේ. ෂටවෘ, "ෂටවෘ" යන මේ සමාහාරය; ඉත්, ඉත්වූයේ; යස්‍ය ඉති, යමක් හුගේනුයි; ෂටව්‍රිත්, (එය) "ෂටව්‍රිත්" නම් වේ. තස්මාත් ෂටව්‍රිතඃ, ඒ "ෂටව්‍රිත්" යන්නහු කොරෙනි.)

සමාසතද්ධිතකෘදන්තයන්හි ෂකාර ටකාර උකාර ඍකාරයන් ඉත්කොට ඇත්තාවූ ප්‍රත්‍යයන්ගෙන් නිපන් නාමයන් කොරෙන් ස්ත්‍රීඅර්ථයෙහි ඊප්ප්‍රත්‍යය වේ. ඔවුන්ගේ විශෙෂජ්ඥානය වනාහි ඒ සමාසතද්ධිතප්‍රක්‍රියාදීන්ගේ පඨනයෙන් පෙර සුකර නොවේ. මෙහිදී තල්ලක්‍ෂ්‍යලක්‍ෂණක්‍රමොද්ග්‍රහණය පමණක් දතයුතු වේ.

a ෂ්-වරාකී, ට්-කුරුචරී, උ-ගොමතී, ("ධාතොරුදිතො න"-පණීධවත්, උඛාස්‍රත්.) ඍ-

247. අප්‍යයොරාන්නිත්‍යම්.

(අප්‍යයොඃ 6, 2, ආත් 5, 1; නිත්‍යම් 1, 1;)

b අප්‍රත්‍යයයප්‍රත්‍යයසම්බන්ධිනොකාරාත්පරස්‍ය ශතුර්නිත්‍යං නුමාගමො භවති ඊකාරෙ ඊපි ච පරෙ. පචන්ති පඨන්ති දීව්‍යන්ති.

a ෂ්, ෂකාරඉත්ප්‍රත්‍යයාන්තයාකොරෙන් ඊප්ප්‍රත්‍යයට උදාහරණ නම්; වරාකී, "වරාකී" යනු වේ. ට්, ටකාර ඉත්ප්‍රත්‍යයාන්තයා කොරෙන් ඊප්ප්‍රත්‍යයට උදාහරණ නම්; කුරුචරී, "කුරුචරී" යනු වේ. උ, උකාරඉත්ප්‍රත්‍යයාන්තයාකොරෙන් ඊප්ප්‍රත්‍යයට උදාහරණ නම්; ගොමතී, "ගොමතී" යනු වේ. (උදිතඃ, උකාරය ඉත්කොට ඇත්තාවූ; ධාතොඃ, ධාතුහුකොරෙන්; න, ඊප්ප්‍රත්‍යය නොවේ. පණීධවත් උඛාස්‍රත්, "පණීධවත්, උඛාස්‍රත්" යනු ඊට උදාහරණයි.) ඍ, ඍකාර ඉත්ප්‍රත්‍යයාන්තයා කොරෙන් ඊප් ප්‍රත්‍යයට උදාහරණ කියනු ලැබේ (එහි):

247 අප්‍යයොඃ, අප්ප්‍රත්‍යය යප්ප්‍රත්‍යය දෙක සම්බන්ධිවූ; ආත්, ආකාරයාකොරෙන් පරවූ (ශතෘප්‍රත්‍යයට); නිත්‍යම්, නිත්‍යයෙන් "නුම්" ආගම වේ.

b ඊකාරෙ, ඊකාරය ද; ඊපි ච, ඊප්ප්‍රත්‍යය ද; පරෙ, පරකල්හි; අප්‍රත්‍යයයප්‍රත්‍යයසම්බන්ධිනඃ, අප්ප්‍රත්‍යය යප්ප්‍රත්‍යය සම්බන්ධිවූ; අකාරාත් පරස්‍ය, අකාරයා කොරෙන්පරවූ; ශතුඃ, ශතෘ ප්‍රත්‍යයට; නිත්‍යම්, නිත්‍යයෙන්; නුමාගමඃ භවති, "නුම්" ආගම වේ. පචන්තී, "පචත්" ශබ්දයා කොරෙන් ඊප්‍රත්‍යය කළකල්හි "පචන්තී" යනුද; පඨන්තී, "පඨත්" ශබ්දයා කොරෙන් ඊප්ප්‍රත්‍යය කළකල්හි "පඨන්තී" යනුද; දීව්‍යන්තී, "දීව්‍යත්" ශබ්දයා කොරෙන් ඊප් ප්‍රත්‍යය කළකල්හි "දීව්‍යන්තී" යනු ද වේ. (මේ ඍකාරඉත්ප්‍රත්‍යයාන්තයා කොරෙන් ඊප්ප්‍රත්‍යයට උදාහරණයි.)

මෙහි "වරාකී" යන තන්හි "වෘ" ධාතුවෙන් ෂකාරයඉත් කොට ඇති "ෂාක" ප්‍රත්‍යයව නිපන් "වරාක" ශබ්දයාකොරෙන්

248. වාදීපොඃ ශතුඃ.

(වා 1, 1; ආත් 5, 1; ඊපොඃ 7, 2; ශතුඃ 6, 1;)

a අවර්ණාන්තස්‍යරස්‍ය ශතුර්වා නුමාගමො භවති ඊකාරෙ ඊපි ච පරෙ. තුදතී-තුදන්තී.

249 නදාදෙඃ. (නදාදෙඃ 5, 1;)

ඉත්ත්වයෙන් ඊප්ප්‍රත්‍යයයි. "කුරුචරී" යන තන්හි "කුරු" පූර්ව "චර" ධාතුවෙන් "කුරුෂු (දෙශෙෂු) චරති" යන වාක්‍යයෙහි "ට" ප්‍රත්‍යයෙන් නිපන් "කුරුචර" ශබ්දයා කෙරෙන් ටකාරඉත්ත්ව යෙන් ඊප්ප්‍රත්‍යයයි. "ගොමතී" යන තන්හි "ගො" ශබ්දයා කෙරෙන් "ගාවඃ සන්ත්‍යස්‍යාඃ" යන වාක්‍යයෙහි 'මතු" ප්‍රත්‍යයෙන් නිපන් "ගොමත්" ශබ්දයා කෙරෙන් උකාරඉත්ත්වයෙන් ඊප් ප්‍රත්‍යයයි. "පර්ණධ්වත්, උඛාස්‍රත්" යන දෙක "පර්ණ, උඛා" යන ශබ්දවන් උපපදකොට ඇති "ධ්වන්සු, ස්‍රන්සු" යන උකාරානුබන්ධ ධාතුවයෙන් "ක්විප්" ප්‍රත්‍යයව ධාතුස්වරූපයෙන් නිපන් බැවින් ඔවුන් කෙරෙන් උකාරඉත්ධාතුත්වයෙන් යථොක්ත ඊප්ප්‍රත්‍යය නොවේ. "පචන්තී, පඨන්තී" යන දෙතන්හි "පච, පඨ" යන ධාතුවයෙන් "අප් කර්තරි" යන සූත්‍රයෙක් ' අප්" ප්‍රත්‍යය සම්බන්ධි අකාරයා කෙරෙන් පර ශතෘප්‍රත්‍යය බැවින් නිත්‍යයෙන් "නුම්" ආගමයි. "දීව්‍යන්තී" යන තන්හි "දිව්" ධාතුවෙන් "දිවාදෙර්‍යඃ" යන සූත්‍රයෙන්වූ "ය" ප්‍රත්‍යය සම්බන්ධි අකාරයා කෙරෙන් පර "ශතෘ" ප්‍රත්‍යය බැවින් නිත්‍යයෙන් "නුම්" ආගමයි.

248. ඊපොඃ, ඊකාරය ඊප්ප්‍රත්‍යය යන දෙක පරකල්හි; ආත්, (අප්ප්‍රත්‍යයෙන් අන්‍ය) අවර්ණාන්තයා කෙරෙන් පරවූ; ශතුඃ, ශතෘප්‍රත්‍යයට; වා, විකල්පයෙන්; නුම්, නුම් ආගම වේ.

a ඊකාරෙ, ඊකාරය පරකල්හි ද; ඊපිච පරෙ, ඊප්ප්‍රත්‍යය පර කල්හි ද; අවර්ණාන්තස්‍ය, අවර්ණයාකෙරෙන් පරවූ; ශතුඃ, ශතෘ ප්‍රත්‍යයට; වා, විකල්පයෙන්; නුමාගමඃ භවති, නුම් ආගම වේ. "තුදතී-තුදන්තී" යනු ඊට උදාහරණයි. (මේ "තුදතී" යන තන්හි දකාරස්ථ අකාරය "අප්කර්තරි" යන සූත්‍රයෙන්වූ "අප්" ප්‍රත්‍යය සම්බන්ධි අකාරය නොවේ. ඒ "තුදාදෙරඃ" යන සූත්‍රයෙන්වූ අප්‍රත්‍යය වේ එබැවින් ඔහු කෙරෙන් පර "ශතෘ" ප්‍රත්‍යයට විකල්පයෙන් නුම් ආගමයි.)

249. නදාදෙඃ, "නද" ශබ්දාදිගණයා කෙරෙන් (ස්ත්‍රීඅර්ථයෙහි ඊප්ප්‍රත්‍යය වේ.

a නදාදෙර්ගණාත් ස්ත්‍රියාමීප්ප්‍රත්‍යයො භවති. නදී, ගෞරී, ගෞතමී. නදාදිරාකෘතිගණඃ. තෙන-චතුර්ථී, පඤ්චමී, ද්වාදශී, පෞර්ණමාසී, ඉත්‍යාදි "ඊප්‍යනඩුහො වාම් වක්තව්‍යඃ". අනඩ්වාහී-අනඩුහී.

---

a නදාදෙර්ගණාත්, නදාදිගණයාකෙරෙන්; ස්ත්‍රියාම්, ස්ත්‍රීඅර්ථ යෙහි; ඊප්ප්‍රත්‍යයඃ භවති, ඊප්ප්‍රත්‍යය වේ. "නදී" යන තන්හි "නද" ශබ්දයා කෙරෙන් ස්ත්‍රීඅර්ථයෙහි ඊප්ප්‍රත්‍යයයි. "ගෞරී, ගෞතමී" යන තන්හි "ගෞර, ගෞතම" ශබ්දයන් කෙරෙන් ඊප්ප්‍රත්‍යයයි. නදාදිඃ, නදාදිය; ආකෘතිගණඃ, ආකාරයෙන් ගත යුතු ශබ්දගණයයි; *තෙන, එහෙයින්, චතුර්ථී, "චතුර්ථ" ශබ්දයා කෙරෙන් ඊප්ප්‍රත්‍යයවීමෙන් "චතුර්ථී" යනුද; පඤ්චමී ද්වාදශී පෞර්ණ මාසී, 'පඤ්චම ද්වාදශ පෞර්ණමාස" ශබ්දයන් කෙරෙන් ඊප්ප්‍රත්‍යය වීමෙන් "පඤ්චමී ද්වාදශී පෞර්ණමාසී" යනුද වේ. ඉත්‍යාදි, මේ ආදිය වේ. ඊපි, ඊප්ප්‍රත්‍යය පරකල්හි; අනඩුහඃ, "අනඩුහ්" ශබ්දය සම්බන්ධව; වා, විකල්පයෙන්; ආම්, ආම්ආගම; වක්තව්‍යඃ, කියයුතුයි. "අනඩ්වාහී-අනඩුහී" යනු ඊට උදාහරණයි. (මෙහි "අනඩ්වාහී" යන තන්හි විකල්පයෙන් "ආම්" ආගමයි.)

---

* මුග්ධබොධටීකාවෙහි නදාදිය දක්වන්නාහු:-

"නදෙ මද්‍රගවරශෙමගුරෙ ගෞර වෙල හංස ප්ලවාඃ,
දරකන්දරනකාරාසතරුණාඃ කණ සාකිණෞ.

බදරාම්ලකෞ සූදහරීතක විසිතාසාඃ,
ශවො දෙවො ධාතකශ්ච මාතාමහපිතාමහෞ.

ද්‍රොණඃ සුවර්ණාණකෞ පාත්‍ර කොෂාතකාපුටාඃනටඃ,
කාමාටමාංවටො නාටො නටො හොටපටෞ ශඨඃ.

වරාටඃ ශෂ්කුලඃ සූචඃ ශවො මණ්ඩලකුණ්ඩලෞ,
ලොහිතානණ්ඩාථ කුෂ්මාණ්ඩ මඨපුෂ්කල පිප්පලාඃ.

කදලඃ කදලඃ පිණ්ඩකාතලෞ ශල්ලකො වෘෂඃ,
අනඩුත් සූමිකොලෞ ච පිශඞ්ගානාසවෙතසාඃ.

මාලතඃ කම්සුජෞ ච විල්වමණ්ඩපකොකයාඃ,
ගඩුලො මිතම්ණෙඩෞ ච සූෂමඃ පෘථුවඃ පෘථුඃ.

සාමෙයා මනුෂ්‍යා මත්ස්‍යශ්ච මූකාශො ගවයො හයඃ,
මහත් වෘහත් හරඃ ශෘඞ්ගඃ එතද්‍රෑ නාදදයඃ."

(එතද්ගිතානාන්‍යෙනකොපි ගෞරාදෞ පඨිතාඃපුනඃ)-යනු කීහ.

a "හායනාමයසි ච" ද්විහායනී, චතුර්හායණී, "පුරුෂාච්ච පරිමාණේ" ද්විපුරුෂී-ද්විපුරුෂා වා, පරිඛා.

250. *ඉන්ද්‍රාදේරානීප්. (ඉන්ද්‍රාදේඃ 5, 1; ආනීප් 1, 1;)

b ඉන්ද්‍රාදේර්ගණාත්ස්ත්‍රියාමානීප්ප්‍රත්‍යයො භවති. (ඉන්ද්‍රාදේරිත්‍යාදිශබ්දා දින්ද්‍ර බ්‍රහ්මන් රුද්‍ර භව ශර්ව මෘඩ වරුණාදයඃ) ඉන්ද්‍රාණී, "බ්‍රහ්මන් ශබ්දස්‍ය නලොපො වාච්‍යඃ" බ්‍රහ්මාණී, රුද්‍රාණී, භවානී, ශර්වාණී, මෘඩානී, වරුණානී.

a වයසි, වයසක් වාච්‍යතන්හි; හායනාත් ච, (සංඛ්‍යාවක් පූර්ව කොට ඇති) හායන ශබ්දයාකෙරෙන් ද ඊප්ප්‍රත්‍යය වේ; ද්විහායනී ("ද්වෞ හායනෞ යස්‍යාඃ සා" යන වාක්‍යයෙහි) "ද්විහායනී" යනු වේ. (අවුරුදුදෙකක් වයසැති ස්ත්‍රියයි.) චතුර්හායණී, ("චත්වාරො හායනා යස්‍යාඃ සා" යන වාක්‍යයෙහි) "චතුර්හායණී" යනු වේ. (අවුරුදුහතරක් වයසැති ස්ත්‍රියයි.) පරිමාණේ, ප්‍රමාණයක්වාච්‍යතන්හි; පුරුෂාත්, (සංඛ්‍යාවක් පූර්වකොට ඇති) පුරුෂශබ්දයාකෙරෙන්; වා, විකල්පයෙන් ඊප්ප්‍රත්‍යය වේ. ද්විපුරුෂී, ("ද්වෞ පුරුෂෞ යස්‍යාඃ සා" යන වාක්‍යයෙහි) "ද්විපුරුෂී" යනුද; ද්විපුරුෂා වා, විකල්පයෙන් "ද්විපුරුෂා" යනුද වේ. පරිඛා, (පුරුෂ ප්‍රමාණ දෙකක්ඇති) දිය අගලයි. (මෙහි 'හායන" ශබ්දයා කෙරෙන් හා 'පුරුෂ"ශබ්දයා කෙරෙන් ඊප්ප්‍රත්‍යය වන් ම සංඛ්‍යාපූර්වබහුව්‍රීහි සමාසයාකෙරෙන්ම වේ.)

250 ඉන්ද්‍රාදේඃ, ඉන්ද්‍රාදිගණයාකෙරෙන්; ආනීප්, (ස්ත්‍රීඅර්ථයෙහි) ආනීප්ප්‍රත්‍යය වේ.

b ඉන්ද්‍රාදේඃ ගණාත්, ඉන්ද්‍රාදිගණයාකෙරෙන්; ස්ත්‍රියාම්,ස්ත්‍රීඅර්ථයෙහි; ආනීප්ප්‍රත්‍යයඃ භවති, "ආනීප්" ප්‍රත්‍යය වේ. (ඉන්ද්‍රාදේඃ ඉති, "ඉන්ද්‍රාදේඃ" යන මෙහි; ආදිශබ්දාත්, ආදිශබ්දයෙන්; ඉන්ද්‍ර, ඉන්ද්‍රශබ්දය; බ්‍රහ්මන්, "බ්‍රහ්මන්" ශබ්දය; රුද්‍ර "රුද්‍ර" ශබ්දය; භව, "භව" ශබ්දය; ශර්ව, "ශර්ව" ශබ්දය; මෘඩ, "මෘඩ"

† මේ සූත්‍රය ඇතැම් කෙනෙක් "ඉන්ද්‍රාදෙරානීප්ච" යනුවෙන් දක්වා "ඉන්ද්‍රාදේඃ, ඉන්ද්‍රාදිගණයා කෙරෙන්; ආන්, "ආන්" ආගමද; ඊප්ච, ඊප්ප්‍රත්‍යයද වේයයි" අර්ථ කියත්. සමහරු මෙහි චග්‍රහණයෙන් මාතුලාදියෙන් පරව විකල්පයෙන් "ආනීප්" ප්‍රත්‍යය වේයයිද කියත්.

a "මාතුලොපාධ්‍යායාර්යක්ෂත්‍රියාචාර්යාත්වා" මාතුලානී-මාතුලී, උපාධ්‍යායානී-උපාධ්‍යායී, "අර්යක්ෂත්‍රියාභ්‍යාං වා ස්වාර්ථේ" අර්යාණී-අර්යා, ක්ෂත්‍රියාණී-ක්ෂත්‍රියා, ආචාර්යාණී.

ශබ්දය; වරුණාදයඃ, "වරුණ" ශබ්දය යන මේ ආදීහු (ගණ ලැබෙත්). ඉන්ද්‍රාණී "ඉන්ද්‍ර" ශබ්දයා කෙරෙන් "ආනීප්" ප්‍රත්‍යය කළ කල්හි "ඉන්ද්‍රාණී" යනු වේ. (ඉන්ද්‍රපත්නියයි). බ්‍රහ්මන්ශබ්දස්‍ය, "බ්‍රහ්මන්" ශබ්දයාගේ; නලොපඃ, නකාරලොපය; වාච්‍යඃ, කිය යුතුයි "බ්‍රහ්මාණී, රුද්‍රාණී භවානී, ශර්වාණී, මෘඩානී, වරුණානී" යන තන්හි "බ්‍රහ්මන්, රුද්‍ර, භව, ශර්ව, මෘඩ, වරුණ" ශබ්දයන් කෙරෙන් "ආනීප්" ප්‍රත්‍යයයි. "බ්‍රහ්මාණී" යනු බ්‍රහ්ම පත්නියයි. "රුද්‍රාණී මෘඩානී" යනු ශිවපත්නියයි. "වරුණානී" යනු වරුණ දෙවපත්නියයි.

a මාතුල. "මාතුල" ශබ්දය; උපාධ්‍යාය, 'උපාධ්‍යාය" ශබ්දය; අර්ය, "අර්ය" ශබ්දය; ක්ෂත්‍රිය, "ක්ෂත්‍රිය" ශබ්දය; ආචාර්ය, "ආචාර්ය' ශබ්දය යන මොහු කෙරෙන්; වා, විකල්පයෙන් 'ආනීප්" ප්‍රත්‍යය වේ. මාතුලානී-මාතුලී, මාතුල ශබ්දයාකෙරෙන් 'ආනීප්' ප්‍රත්‍යයවූ කල්හි "මාතුලානී" යනුද විකල්පයෙන් නුවූතන්හි' "මාතුලී" යනුද වේ (මාතුලපත්නියයි). උපාධ්‍යායානී-උපාධ්‍යායී, "උපාධ්‍යාය" ශබ්දයා කෙරෙන් "ආනීප්" ප්‍රත්‍යයවූ තන්හි"උපාධ්‍යායානී" යනුද, විකල්පයෙන් නුවූතන්හි 'උපාධ්‍යායී' යනු ද වේ. (උපාධ්‍යාය පත්නියයි) අර්යක්ෂත්‍රියාභ්‍යාං, "අර්යක්ෂත්‍රිය ශබ්ද දෙකෙන්; ස්වාර්ථේ, ස්වාර්ථයෙහි හෙවත් ස්වකීය ස්ත්‍රීත්වයෙහි; වා, විකල්පයෙන් "ආනීප්" ප්‍රත්‍යය වේ. අර්යාණී-අර්යා, 'අර්ය" ශබ්දයා කෙරෙන් "ආනීප්' ප්‍රත්‍යය වූතන්හි "අර්යාණී' යනු ද විකල්පතන්හි "අර්යා" යනුද වේ. (වෛශ්‍යජාතියස්ත්‍රියයි) ක්ෂත්‍රියාණී-ක්ෂත්‍රියා "ක්ෂත්‍රිය" ශබ්දයා කෙරෙන් "ආනීප්" ප්‍රත්‍යය වූතන්හි "ක්ෂත්‍රියාණී යනුද විකල්පතන්හි "ක්ෂත්‍රියා" යනුද වේ. (ක්ෂත්‍රියස්ත්‍රියයි). ආචාර්යාණී, යන තන්හි "ආචාර්ය" ශබ්දයා කෙරෙන් "ආනීප්' ප්‍රත්‍යයයි. (ආචාර්යපත්නියයි).

මෙහි ඉන්ද්‍රාදිගණයට "ඉන්ද්‍ර වරුණ භව ශර්ව රුද්‍ර මෘඩ හිම අරණ්‍ය යව යවන මාතුල උපාධ්‍යාය අර්ය ක්ෂත්‍රිය ආචාර්ය" යන මොහු ඇතුළත් වෙත්. එහි "ඉන්ද්‍ර" ශබ්දය පටන් "යවන" ශබ්දය අවසන් කොට ඇත්තවුන් කෙරෙන් නිත්‍යයෙන්ද

a “හිමාරණ්‍යයොර්මහත්වෙ” මහද්ධිමං=හිමානී, මහදරණ්‍යමරණ්‍යානී, “යවාද්දොෂෙ” දුෂ්ටො යවඃ=යවානී, “යවනාල්ලිප්‍යාම්” යවනානාං ලිපිඃ=යවනානී.

b “ඞීප්සමාහාරෙ ගුණශ්ච” ත්‍රයාණාං සමාහාරඃ=† ත්‍රයී “පුංයොගෙ ච” ශූද්‍රස්‍ය භාර්‍ය්‍යා=ශූද්‍රී, ගණකී. “ගොපාලිකාදීනාං න” ගොපාලිකා, පාශුපාලිකා. “සූර්‍ය්‍යාද්දෙවතායාං චාප්” සූර්‍ය්‍යස්‍ය ස්ත්‍රී දෙවතා=සූර්‍ය්‍යා, අන්‍යා=සූරී

“මාතුල” ශබ්දාදිය කෙරෙන් විකල්පයෙන්ද ‘ආනීප්’ ප්‍රත්‍යය වේයයි කියනලදී. එහිද “ඉන්ද්‍ර වරුණ භව ශර්ව රුද්‍ර මෘඩ මාතුල උපාධ්‍යාය ආචාර්‍ය්‍ය” යන මොවුන්කෙරෙන් පුංයොගයෙහි ද, “ආර්‍ය්‍ය ක්ෂත්‍රිය” දෙකෙන් පුංයොගරහිත ස්වකීයස්ත්‍රීත්වයෙහිද වේ. තවද “මාතුල-සූර්‍ය්‍යාචා” යන මෙහි චශබ්දයාගේ ව්‍යවස්ථාවෙන් පුංයොගයෙහි “ආචාර්‍ය්‍ය” ශබ්දයා කෙරෙන් නිත්‍යයෙන් ආනීප් ප්‍රත්‍යය වේ. පුංයොගරහිත තන්හි ආප්ප්‍රත්‍යයව ‘ආචාර්‍ය්‍යා’ කියාද වේ. මාතුලාදියෙන් විකල්පයෙන් “ආනීප්” ප්‍රත්‍යය වේ. මාතුලොපාධ්‍යාය ශබ්ද දෙකෙන් ඊප්ප්‍රත්‍යයද විකල්පව “මාතුලා, උපාධ්‍යායා” යනුද වේ. චන්ද්‍රකීර්තිටීකාවෙහි සූර්‍ය්‍ය ශබ්දයා කෙරෙන්ද ආනීප් ප්‍රත්‍යය කොට ‘සූර්‍ය්‍යාණී’ කියාද දක්නා ලැබේ. “හිම” ශබ්දාදියෙන් “ආනීප්” ප්‍රත්‍යය යෙදෙන තැන් දක්වනු පිණිස “හිමාරණ්‍යයොඃ” යනාදිය කීහු.

a මහත්වෙ, මහත්බවක් වාච්‍යතන්හි; හිමාරණ්‍යයොඃ, “හිම අරණ්‍ය” ශබ්දදෙක සම්බන්ධව “ආනීප්” ප්‍රත්‍යය වේ. මහත් හිමම්, මහත්වූ පින්න; හිමානී. “හිමානී” නම් වේ. මහත් අරණ්‍යම්, මහත්වූ වනය; අරණ්‍යානී, “ආරණ්‍යානී” නම් වේ. දොෂෙ, දොෂයක් වාච්‍යතන්හි; යවාත්, “යව” ශබ්දයාකෙරෙන් “ආනීප්” ප්‍රත්‍යය වේ. දුෂ්ටඃ, දුෂ්ටවූ; යවඃ, යවධාන්‍යය; යවානී, “යවානී” නම් වේ. ලිප්‍යාම්, ලිපියක් (අක්ෂරවින්‍යාසයක්) වාච්‍යතන්හි; යවනාත්, “යවන” ශබ්දයා කෙරෙන් “ආනීප්” ප්‍රත්‍යය වේ. යවනානාම්, යවනුන්ගේ; ලිපිඃ, ලිඛිතාක්ෂරවින්‍යාසය; යවනානී. “යවනානී” නම් වේ. (මෙහි “හිම” ශබ්දාදිය කෙරෙන් “ආනීප්” ප්‍රත්‍යයයි).

b සමාහාරෙ, සමාහාරාර්ථයෙහි; ඊප්, “ඊප්” ප්‍රත්‍යයද; ගුණඃ ච, නාමින්ස්වරයට ගුණද වේ. ත්‍රයාණාම්, තුන්දෙනෙකුන්ගේ;

* “ත්‍රයී” යන්න ඇතැම් පොත්වල “අයට්” ප්‍රත්‍යයාන්ත “ත්‍රය” ශබ්දයා කෙරෙන් ඒකාරාන්තත්වයෙන් “ෂටඩ්‍රිතඃ” යන සූත්‍රයෙන් ඊප්ප්‍රත්‍යය කොට සිද්ධ කෙරෙත්.

251. ජාතෙරයොපධාත්. (ජාතෙඃ 5, 1; අයොපධාත් 5, 1;)

a ජාතිවාචිනො ‘යකාරොපධාදකාරාන්තාත්ස්ත්‍රියාමීප්ප්‍රත්‍යයො භවති (අස්ත්‍රීවිෂයාදිති වාච්‍යම්. තෙන මක්ෂිකා බලාකා ඉත්‍යාදෞ න.)

සමාහාරඃ, සමාහෘතිය (එක්කොට නැණීම); ත්‍රයී, “ත්‍රයී” නම් වේ. පුංයොගෙ ච, පුංයොගයෙහි ද (පුරුෂයෙකුගේ යොගය ඇති කල්හිද (ඊප්ප්‍රත්‍ය වේ) ශූද්‍රස්‍ය, ශූද්‍රයාගේ, භාර්‍ය්‍යා, භාර්‍ය්‍යා තොමෝ; ශූද්‍රී, ශූද්‍රි නම් වේ. ගණකී, ගණකයාගේ භාර්‍ය්‍යාව “ගණකී” නම් වේ. (මෙහි පුංයොගයෙහි ඊප්ප්‍රත්‍යයයි) ගොපාලිකාදීනාම්, ‘ගොපාලිකා” ශබ්දාදීන් සම්බන්ධව; න, (පුංයොගයෙහිද) ඊප්ප්‍රත්‍යය නොවේ. ගොපාලිකා ගොපල්ලාගේ භාර්‍ය්‍යාව ‘ගොපාලිකා” නම් වේ. පාශුපාලිකා, පසුපල්ලාගේ භාර්‍ය්‍යාව “පසුපාලිකා” නම් වේ. (මේ පිළිබඳව සිද්ධාන්තකෞමුදියෙහි “පාලකාන්තාන්න” යනු කීහු පාලකශබ්දය අන්තකොට ඇත්තනු කෙරෙන් පුංයොගයෙහි ඊප්ප්‍රත්‍යය නොවේ. යනු එහි භාවයයි.) සූර්‍ය්‍යාත්, සූර්‍ය්‍යශබ්දයා කෙරෙන්; දෙවතායාම්, දෙවතාර්ථයක් වාච්‍යතන්හි (පුංයොගයෙහි); ආප් ච, ආප්ප්‍රත්‍යය ද වේ. (චශබ්දයෙන් දෙවතාවාචක නොවන තන්හි ඊප්ප්‍රත්‍යය ද වේ.) සූර්‍ය්‍යස්‍ය, සූර්‍ය්‍යයාගේ; ස්ත්‍රී, ස්ත්‍රීතොමෝ; දෙවතා, දෙවතා වූවා; සූර්‍ය්‍යා, “සූර්‍ය්‍යා” නම් වේ. අන්‍යා, අන්‍ය වූවා හෙවත් දෙවතා නුවූවා; සූරී, “සූරී” නම් වේ. (“යලොපශ්ච” යන සූත්‍රයෙන් මෙහි යකාර ලොපයයි. මෙහි ඒ සූත්‍රය තද්ධිතයෙහි දක්නාලැබේ.)

251 ජාතෙඃ, (අකාරාන්ත) ජාතිවාචක ශබ්දයා කෙරෙන් ඊප් ප්‍රත්‍යය වේ. අයොපධාත්, යකාරය උපධාකොට ඇත්තනු කෙරෙන් නොවේ.

a අයකාරොපධාත්, යකාරය උපධාසංඥකොට නැත්තාවූ; අකාරාන්තාත්, අකාරාන්තවූ; ජාතිවාචිනඃ, ජාතිවාචකශබ්දයා කෙරෙන්; ස්ත්‍රියාම්, ස්ත්‍රීඅර්ථයෙහි; ඊප්ප්‍රත්‍යයඃ භවති, ඊප්ප්‍රත්‍යය වේ. අස්ත්‍රීවිෂයාත් ඉති, ස්ත්‍රීලිඞ්ගය විෂයකොට නැත්තනු කෙරෙන් යයි, හෙවත් නිත්‍යස්ත්‍රීලිඞ්ගවර්ජිතයා කෙරෙන් යයි; වාච්‍යම්, කියයුතුයි. තෙන, එහෙයින්; මක්ෂිකා බලාකා ඉත්‍යාදෞ, “මක්ෂිකා බලාකා” යනාදියෙහි; න, නොවේ. (“මක්ෂිකා” ශබ්දාදිය ජාතිවචනවූව ද නියතස්ත්‍රීලිඞ්ග බැවින් ඊප්ප්‍රත්‍යය නොවේ.)

a "ගවය හය මුකය මත්ස්‍ය මනුෂ්‍යාණාං න නිෂෙධඃ" ගවයී ඉත්‍යාදි. සූකරී හංසී කුක්කුටී බ්‍රාහ්මණී. අයකාරො පධග්‍රහණාත් ක්‍ෂත්‍රියා වෛශ්‍යා.

---

a ගවය හය මුකය මත්ස්‍ය මනුෂ්‍යාණාම්, "ගවය හය මුකය මත්ස්‍ය මනුෂ්‍ය" යන මේ ශබ්දයන් සම්බන්ධව; නනිෂෙධඃ, ප්‍රතිෂෙධ නොවේ, හෙවත් ඊප්ප්‍රත්‍යය වේ ගවයී ඉත්‍යාදි, (එහෙයින්) "ගවයී" යනාදිය වේ. (මේ "ගවය" ශබ්දාදීන්ගේ උපධාසංඥය යකාරය වුවද මොවුන් කෙරෙන් ඊප්ප්‍රත්‍යය වේ.) "සූකරී" යන තන්හි ජාතිවාචකත්වයෙන් ස්ත්‍රීඅර්ථයෙහි ඊප්ප්‍රත්‍යයයි. "හංසී කුක්කුටී බ්‍රාහ්මණී" යන තන්හි ද එසේයි. අයකාරොපධග්‍රහණාත්, යකාරය උපධාසංඥකොට නැත්තක් ගැණීමෙන්; ක්‍ෂත්‍රියා වෛශ්‍යා, "ක්‍ෂත්‍රියා වෛශ්‍යා" යනු වේ. හෙවත් "ක්‍ෂත්‍රියා වෛශ්‍යා" යන තන්හි ඊප්ප්‍රත්‍යය නොවේ.

මෙහි කී ජාතිලක්‍ෂණ දක්වන්නාවූ වෛයාකරණයෝ:-

"ආකෘතිග්‍රහණා ජාතිර්ලිඞ්ගානාං ච න සර්වභාක්,
සකෘදාඛ්‍යාතනිර්ග්‍රාහ්‍යා ගොත්‍රං ච චරණෛඃ සහ"

යනු කීහු. මෙහි භාවය-අවයවසංස්ථානයෙන් දැනගැණීම ඇත්තී හෝ අවයවසංස්ථාන දැනගැණීමට කාරණවූවා ජාති නම් වේ. (යම් ශබ්දයක භින්නපදාර්ථ ඇතත් ඒ භින්නපදාර්ථයන් අවයව සටහනෙන් එකාකාරකොට දතහැකි නම් ඒ භින්නපදාර්ථයන් ඇති ශබ්දය ජාතියයි කියනු ලැබේ.) එනම් මනුෂ්‍ය ගො මෘග හංසාදීන්ගේ අවයවසටහනෙන් ලකුණුකරණු ලබන්නාවූ මනුෂ්‍යත්ව ගොත්ව මෘගත්ව හංසත්වාදියයි හෙවත් මිනිස්බැව් ආදියයි. මේ සාමාන්‍ය ජාතිලක්‍ෂණයි. මෙසේ ලක්‍ෂණවශයෙන් ගත්කල මනුෂ්‍යාදි ඒ ඒ ජාතිවලට ඇතුලත්ව පවත්නා ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණාදි ශබ්ද අවයවසටහන් වශයෙන් එකාකාර බැවින් පෘථග්ජාතිත්වයෙන් තොර වේ. එබැවින් ඒ ක්‍ෂත්‍රියබ්‍රාහ්මණාදිය ද වෙන් වෙන් වශයෙන් මනුෂ්‍යාදි සාමාන්‍ය ජාතිපදාර්ථයට ඇතුලත් පෘථග්ජාතියයි දක්වනු පිණිස "ලිඞ්ගානාං ච න සර්වභාක්" යනු කීහු. යමක් මනුෂ්‍යාදිය පිළිබඳ ආකාරසාම්‍යයෙන් යුක්තවූවත් සර්වලිඞ්ග භජනය නො කෙරේ නම් හෙවත් පුල්ලිඞ්ග ස්ත්‍රීලිඞ්ගවය භජනය කෙරේ නම් ඒ ක්‍ෂත්‍රියබ්‍රාහ්මණාදිය ද ජාතියයි කියනු ලැබේ යනු එහි භාවයයි පූර්වොක්ත අවයවසටහනින්

a "ශූද්‍රාජ්ජාතෞ න" ශූද්‍රස්‍ය ජාතිඃ ශූද්‍රා. "මහත්පූර්වාත්තු ඊප්" මහාශූද්‍රී, ආභීරජාතිඃ. "පුංයොගෙ ච" මහාශූද්‍රස්‍ය" භාර්‍යා=මහාශූද්‍රී.) "ප්‍රථමවයොවාචිනොනතඊප් වක්තව්‍යඃ" (කන්‍යාශබ්දනත) කුමාරී, කිශෝරී, බාලකී. ප්‍රථමවයොග්‍රහණාද්-වෘද්ධා ස්ථවිරා ඉත්‍යාදෞ න (වධූටී, චිරණ්ටී, ඉත්‍යත්‍ර ඊප්භවත්‍යෙව.) අද්ග්‍රහණාච්ඡුඃ.

නිශ්චය කොට දැනගැණීමත් සර්වලිඞ්ගභජනය නොකිරීමත් මේ ලක්‍ෂණයෙන් යුක්තවිය යුතුයයි දැක්වීම පිණිස "සකෘදාඛ්‍යාතනිර්ග්‍රාහ්‍යා" යනු කීහු. යමක් ඇඳින ගැණීම එක්පිඬක ලා එක්වරක් උපදෙස් දුන්කල්හි නැවත අන්පිඬක දුටුවත් ඒ උපදෙශයෙන් එය නිශ්චය කොට ගතහැකි නම් ඒ ජාතිය යනු එහි භාවයයි. කුක්කුට සූකරාදි ඒ ඒ කොටස් එකවරක් උපදෙස් දී හැඳින්නීමෙන් පසු අන් කොටසකදී දුටුවත් වෙන්කොටගත හැකි බැවින් ජාති වෙත්. යමක් සියලුලිඟු භජනය නොකළත් එසේ නිශ්චය කොට ගත නොහැකි නම් ඒ ජාති නොවේ. ඒ දෙවදත්තාදි සංඥ ශබ්දයෝයි. ඒ ඒ කොටස්වල ගොත්‍රවශයෙන් වෙනස්වූවන්ද වෛදෙකාදෙශ (ඒ ඒ ශිල්ප) වශයෙන් වෙන්වූවන්ද ආකාරලක්‍ෂණයෙන් භෙදයක් නැති බැවිනුත් සියලුලිඟු භජනය කරණ බැවිනුත් පූර්වලක්‍ෂණ වශයෙන් පෘථග්ජාතිත්වයට ඇතුලත් නොවේ. එබැවින් ඔවුන්ද පෘථග්ජාතිත්වයට ඇතුලත් කරගැණීමට ලක්‍ෂණාන්තරයක් වශයෙන් "ගොත්‍රං ච චරණෛඃ සහ" යනු කීහු. ඒ ඒ ජාතිවලට ඇතුලත් දරුමුනුබුරු පරම්පරාවෝ ද කඨාදිවෛදෙකාදෙශයකින් යුත් කොටස්ද පෘථග්ජාති වෙත්ය යනු එහි භාවයයි. මෙහි "ආකෘති ග්‍රහණා ජාතිඃ" යන ලක්‍ෂණයෙන් "කුක්කුටී, සූකරී" යනාදියද, "ලිඞ්ගානාං ච න සර්වභාක්" යන්නෙන් "බ්‍රාහ්මණී වෘෂලී" යනාදිය ද, "ගොත්‍රං ච චරණෛඃ සහ" යන තන්හි ගොත්‍රලක්‍ෂණයෙන් ගාර්ගී' පෛතෘස්වසෙයී" යනාදියද, "චරණෛඃ" යන්නෙන් "කඨී, බහ්වෘචී" යනාදියද ගණු ලැබේ.

a (ජාතෞ, ජාතිවාචකතන්හි; ශූද්‍රාත්, "ශූද්‍ර" ශබ්දයා කෙරෙන්; න, ඊප්ප්‍රත්‍යය නොවේ. ශූද්‍රස්‍ය, ශූද්‍රයාගේ; ජාතිඃ, ශූද්‍රා, "ශූද්‍රා" නම් වේ. මහත්පූර්වාත්තු, මහත්ශබ්දය පූර්වකොට ඇති "ශූද්‍ර" ශබ්දයා කෙරෙන් වනාහි; ඊප්, ඊප්ප්‍රත්‍යය වේ. මහාශූද්‍රී, (එකල්හි) "මහාශූද්‍රී" යනු වේ. ආභීරජාතිඃ, ගොපොලුජාතියයි. ("මෙහි ජාතිවාචකවූවත් මහත් ශබ්දය පූර්වකොට ඇති බැවින් ඊප් ප්‍රත්‍යය වේ.) පුංයොගෙ ච, පුංයොගයක් ඇතිකල්හිද ඊප්

252. ස්වාඞ්ගාච්ච. (සිද්ධාන්ත 5, 1; චං 1, 1;)

a ස්වාඞ්ගවාචිනො වා ස්ත්‍රියාමීප්ප්‍රත්‍යයො භවති. සුමුඛී-සුමුඛා, මෘගාක්ෂී--මෘගාක්ෂා, තන්වඞ්ගී-තන්වඞ්ගා.

ප්‍රත්‍යය වේ. මහාශූද්‍රස්‍යාගේ; භාර්‍ය්‍යා, භාර්‍ය්‍යාතොමෝ; මහාශූද්‍රී, "මහාශූද්‍රී" නම් වේ. (මෙහි පුංයොගත්වයෙන් ඊප්ප්‍රත්‍යයයි.) ප්‍රථමවයොවාචිනඃ, ප්‍රථමවයස වාචකාවූ; අතඃ, අකාරාන්ත ශබ්දයා කෙරෙන්; ඊප්, ඊප්ප්‍රත්‍යය; වක්තව්‍යඃ, කියයුතුයි. කන්‍යාශබ්දයත්, "කන්‍යා" ශබ්දයා කෙරෙන්: න, නොවේ. "කුමාරී" යන තන්හි "කුමාර" ශබ්දයා කෙරෙන් ප්‍රථමව යොවාචකත්වයෙන් ඊප්ප්‍රත්‍යය යයි. "කිශොරී, කලභී" යන තන්හිද එසේයි. ප්‍රථමවයොග්‍රහණයත්, ප්‍රථමවයස ගැණීමෙන්; වෘද්ධා ස්ථවිරා ඉත්‍යාදෞ, "වෘද්ධා ස්ථවිරා" යන මේ ආදියෙහි; න, (චරමවයස වාචක බැවින්) ඊප්ප්‍රත්‍යය නොවේ. වධූටී චිරණ්ටී ඉත්‍යත්‍ර, "වධූටී චිරණ්ටී" යන මෙහි; ඊප් "ඊප්" ප්‍රත්‍යය; භවති එව, වේමය. අද්‍ග්‍රහණයත්, අකාරාන්තයා කෙරෙන් යයි ගැණීමෙන්; ශිශුඃ, 'ශිශු" නම් වේ, හෙවත් "ශිශු" යන්නෙන් පරව ඊප්ප්‍රත්‍යය නොවේ.

මෙහි ප්‍රථමවයොවාචක ශබ්දයන් කෙරෙන් ඊප්ප්‍රත්‍යය වේයයි සාමාන්‍යයෙන් කිවත් 'වධූටී, චිරණ්ටී" යන තන්හි ඊප් ප්‍රත්‍යය වීමෙන් මධ්‍යවයොවාචකශබ්දයන් කෙරෙන්ද වනබැව් හැගේ ඒ සඳහා සිද්ධාන්තකෞමුදියෙහි 'වයස්‍යචරම ඉතිවාච්‍යම්" යනු කීහු. චරමවයස නොවන තන්හි යයි කියයුතු වේ. යනු එහි භාවයයි. ප්‍රාණීන්ගේ වයස බෙදන්නාහු සමහර තන්හි ත්‍රිභෙද කොටද සමහරතන්හි චතුර්භේද කොටද දක්වත්. එය:-

"පිතා රක්ෂති කෞමාරෙ භර්තා රක්ෂති යෞවනෙ,
පුත්‍රස්තු ස්ථාවිරෙ භාවෙ න ස්ත්‍රී ස්වාතන්ත්‍ර්‍යමර්හති"

යන්නෙන්ද:-

"ආද්‍යෙ වයසි නාධීතං ද්විතීයෙ නාර්ජිතං ධනම්,
තෘතීයෙ න තපස්තප්තං චතුර්ථෙ කිං කරිෂ්‍යති"

යන්නෙන් ද ප්‍රකාශිතයි. මෙහි පූර්වශ්ලොකයෙන් වයස්හුගේ ත්‍රිභෙදය ද ද්විතීයශ්ලොකයෙන් චතුර්භේදය ද නිර්දිෂ්ටයි.

252 ස්වාඞ්ගාත්, ස්වාඞ්ගවාචක ශබ්දයා කෙරෙන්; වා, විකල්පයෙන් (ස්ත්‍රීඅර්ථයෙහි) ඊප්ප්‍රත්‍යය වේ.

a ස්වාඞ්ගවාචිනඃ, ස්වාඞ්ගවාචක ශබ්දයා කෙරෙන්; ස්ත්‍රියාම්, ස්ත්‍රීඅර්ථයෙහි; වා, විකල්පයෙන්; ඊප්ප්‍රත්‍යයඃ භවති, ඊප්ප්‍රත්‍යය වේ.

a (සුෂ්ඨු ආ සමන්තාද්ඞ්ගං=ස්වාඞ්ගම්, ස්වස්‍ය ප්‍රාණිනොඞ්ගං ස්වාඞ්ගමිත්‍යුක්තෙ කතඞ්ගාඞ්ගිභාවෙතාදෘශාදෙරපි ස්වාඞ්ගත්වං ස්‍යාත්. අතඃ ස්වාඞ්ගලක්ෂණමාහ:-

**b "ප්‍රාණිස්ථමද්‍රවං මූර්තං ස්වාඞ්ගං ස්‍යාදවිකාරජම්,
තත්‍ර දෘෂ්ටමතත්ථං චෙත් තේනාං තමවිධ තාදෘශී"**

සුමුඛී-සුමුඛා, ("සුෂ්ඨු මුඛං යස්‍යාඃ සා" යන වාක්‍යයෙහි) ඊප්ප්‍රත්‍යය වූ තන්හි 'සුමුඛී' යනුද විකල්පයෙන් නොවූ තන්හි "සුමුඛා" යනුද වේ. (සොඳුරු මූව ඇත්තියයි) මෘගාක්ෂී-මෘගාක්ෂා, ("මෘගස්‍යෙව අක්ෂිණී යස්‍යාඃ සා" යන වාක්‍යයෙහි) 'මෘගාක්ෂී" යනුද, විකල්පයෙන් "මෘගාක්ෂා" යනුද වේ. (මුවෙකුගේ වැනි දෑස්ඇත්තියයි.) තන්වඞ්ගී-තන්වඞ්ගා, ('තනු කෘශං අඞ්ගං යස්‍යාඃ සා" යන වාක්‍යයෙහි) "තන්වඞ්ගී" යනුද, විකල්පයෙන් "තන්වඞ්ගා" යනුද වේ. (කෘශවූ මධ්‍යප්‍රදෙශ ඇත්තියයි.) (මෙහි "මුඛ අක්ෂින් අඞ්ග" යන ශබ්දයන් ස්වාඞ්ගවාචක ශබ්ද බැවින් විකල්පයෙන් ඊප්ප්‍රත්‍යය යයි, මෙතැන්පටන් මෙහි "ස්වාඞ්ග" යන්නෙහි නිර්වචන හා තල්ලක්ෂණ ද දැක්වීම පිණිස "සුෂ්ඨු" යනාදිය හා "ප්‍රාණිස්ථං" යනාදියද කීහු.)

a සුෂ්ඨු, මනාකොට; ආ, "ආ" යි සේයි; සමන්තාත්, හාත්පස්හිවූ; අඞ්ගං, අවයවය; ස්වාඞ්ගම්, ස්වාඞ්ග නම් වේ. ස්වස්‍ය, "ස්වස්‍ය" යයි සේයි; ප්‍රාණිනඃ, ප්‍රාණියෙකුගේ; අඞ්ගම්, අවයවයද; ස්වාඞ්ගම්, "ස්වාඞ්ග" නම් වේ. ඉති උක්තෙ, මෙසේ කී කල්හි; අඞ්ගාංගීභාවෙන, අවයවිය අවයව ඇත්තාය යන දෙදෙනාගේ භාවයෙන්; ඥතාදෙඃ අපි, ඥතාදීහුගේද; ස්වාඞ්ගත්වං ස්‍යාත්, ස්වාඞ්ගභාවය වන්නේය. අතඃ, එහෙයින්; ස්වාඞ්ගලක්ෂණම්, ස්වාඞ්ගලක්ෂණය; ආහ, කියයි:-

b ප්‍රාණිස්ථං, ප්‍රාණියෙකු කෙරෙහි පිහිටියාවූ, හෙවත් සචෙතන ශරීරයෙහි පවත්නාවූ; අද්‍රවම්, ද්‍රවරහිතවූ (දියගතිරහිතවූ;) මූර්තිම්, ආකාරවත්වූ (කාඨින්‍යාදිස්පර්ශ විශෙෂ ඇත්තාවූ); අවිකාරජම්, (ධාතුවෛෂම්‍යාදි) විකාරයකින් හට නොගත්තාවූ (යමක් වේ නම් එය;) ස්වාඞ්ගං ස්‍යාත්, ස්වාඞ්ග නම් වන්නේය. තත්‍ර, ඒ ප්‍රාණියෙකු කෙරෙහි; දෘෂ්ටම්, (පූර්වයෙහි) දක්නාලද්දක්; අතත්ථං චෙත්, ඒ ප්‍රාණියෙකුකෙරෙහි නොපිහිටියේ නමුත්, හෙවත් අප්‍රාණියෙකුකෙරෙහි පිහිටියේ නමුත් (අද්‍රවාදිගුණ යුක්ත නම්) ස්වාඞ්ග

a පූර්වාඞ්ගස්‍ය ප්‍රත්‍යුදාහරණානි:- සුමුඛා ශාලා, අප්‍රාණිස්ථත්වාත්. සුස්වේදා, ද්‍රවත්වාත්. සුඥානා, අමූර්තත්වාත්. සුශෝථා, විකාරජත්වාත්.

වේ. තමත්, ඒ ප්‍රාණියෙකු කෙරෙහි පිහිටියක් මෙන්; තාදෘශි, ඒ ප්‍රාණියෙකු වැන්නෙකු කෙරෙහි; ස්ථිතං ච, සිටියේද (අද්‍රවාදි ගුණ යුක්තවූයේ) ස්වාඞ්ග නම් වේ.

මෙහි 'ස්වාඞ්ගාච්ච" යන සූත්‍රයෙන් ස්වාඞ්ගාවාචකශබ්දයා කෙරෙන් විකල්පයෙන් ඊප්ප්‍රත්‍යය වේයයි කීහු. ස්වාඞ්ග නම් ප්‍රාණියෙකු පිළිබඳ අවයවයෝයි, එකල්හිදු අඞ්ගාඞ්ගිභාවසම්බන්ධයෙන් දෙහාදි අඞ්ගයන් ද ඇතුලත්වනබැවින් තන්නිරාකරණය කොට මේ වක්ෂ්‍යමාණලක්ෂණවලින් යුත් අඞ්ග පමණක් ස්වාඞ්ග යයි වෙන්කොට ගැණීම පිණිස "ප්‍රාණිස්ථම්" යනාදිය කීහු. ද්‍රව රහිතවූ ද ආකාරසහිතවූ ද ශොථාදිවිකාරයකින් හටනොගත්තාවූ ද සචෙතන ශරීරයෙක්හි පිහිටි යම් අවයවයක් වේනම් ඒ ස්වාඞ්ග වේ යනු පූර්වාඞ්ගයෙහි භාවයයි. මේ කීමෙන් ප්‍රාණිස්ථ අවයව පමණක් ස්වාඞ්ගත්වයට ඇතුලත්වන බැවින් උක්තප්‍රකාර ලක්ෂණවලින්ද යුක්ත නම් අප්‍රාණිස්ථ අවයව ද ස්වාඞ්ගත්වයට ඇතුලත් කරගැණීම පිණිස උත්තරාඞ්ගය කියනලදී. අප්‍රාණියෙකු කෙරෙහි පිහිටි අවයවයක් වුවත් පෙර ප්‍රාණියෙකු කෙරෙහි දක්නාලද්දේ නම් එයද, ප්‍රාණය නැති නුමුත් ප්‍රාණියෙකු වැනි යමක්කෙරෙහි ප්‍රාණියෙකුගේ අවයවයක් මෙන් යමක් පිහිටියේ නම් ඒද පූර්වෝක්තලක්ෂණවලින් ද යුක්ත නම් ස්වාඞ්ග වේ යනු එහි භාවයයි. මෙකී ලක්ෂණවලින් යුත් අවයවවාචක ශබ්දයන් කෙරෙන් විකල්පයෙන් ඊප්ප්‍රත්‍යය වේ.

a පූර්වාඞ්ගස්‍ය, (ශ්ලොකයාගේ) පූර්වාඞ්ගයට; ප්‍රත්‍යුදාහරණානි, විරුද්ධොදාහරණ කියනුලැබෙත්. සුමුඛා, යහපත් මුඛයක් (මාරයක්) ඇත්තාවූ; ශාලා, ශාලාවයි. අප්‍රාණිස්ථත්වාත්, (මෙහි ස්වාඞ්ගාවාචක මුඛය තමා) අප්‍රාණියෙකු කෙරෙහි පිහිටි බැවින් ඊප්ප්‍රත්‍යය නොවීය. සුස්වෙදා, ඉතා බහඇන්තියයි; ද්‍රවත්වාත්, (මෙහි ස්වෙදය තමා) ද්‍රවබැවින් ඊප්ප්‍රත්‍යය නොවීය. සුඥානා, යහපත් ඥානය ඇත්තිය; අමූර්තත්වාත්, (මෙහි ඥානය තමා) ආකාර රහිත බැවින් ඊප්ප්‍රත්‍ය නොවීය. සුශොථා, ඉතා ශොථ ඇත්තිය; විකාරජත්වාත්, (මෙහි ශොථය තමා) විකාරයෙන් උපන් බැවින් ස්වාඞ්ග නොවේයයි ඊප්‍රත‍්‍යය නොවීය.

a උත්තරාඞ්ගස්‍යොදාහරණානි:- සුකේශී-සුකේශා වා රථ්‍යා, අප්‍රාණිස්ථස්‍යාපි ප්‍රාණිනි දෘෂ්ටත්වාත්. සුස්තනී-සුස්තනා වා ප්‍රතිමා, ප්‍රාණිවත් ප්‍රාණිසදෘශෙ ස්ථිතත්වාත්.

b ස්වාඞ්ගත්වෙපි වාශබ්දස්‍ය ව්‍යවස්ථිතත්වාත් ඔෂ්ඨාදිෂු විකල්පඃ, වදනාදිෂු න වක්තව්‍යඃ, බිම්බොෂ්ඨී බිම්බොෂ්ඨා, චාරුකර්ණී චාරුකර්ණා, සමදන්තී-සමදන්තා, පද්මවදනා මෘගනයනා.

---

a උත්තරාඞ්ගස්‍ය, උත්තරාඞ්ගයට; උදාහරණානි, උදාහරණ කියනු ලැබෙත්. සුකෙශී, යහපත් කෙස් ඇත්තිය; සුකෙශා වා, "සුකෙශා" කියා හෝ වේ. රථ්‍යා, වීථියයි. අප්‍රාණිස්ථස්‍ය අපි, (මෙහි කෙශය තමා) අප්‍රාණියෙකු කෙරෙහි පිහිටි නුමුත්; ප්‍රාණිනි, ප්‍රාණියකු කෙරෙහි; දෘෂ්ටත්වාත් (පෙර) දක්නාලද බැවින් ඊප්ප්‍රත්‍යය වීය. සුස්තනී, යහපත් පයොධර යුග්මයක් ඇත්තිය; සුස්තනා වා, විකල්පයෙන් "සුස්තනා" කියා ද වේ. ප්‍රතිමා, ප්‍රතිමාවයි. ප්‍රාණිවත්, ප්‍රාණියෙකුගේ (අවයවයක්) මෙන්; ප්‍රාණිසදෘශෙ, ප්‍රාණියකු වැනි ප්‍රතිමාව කෙරෙහි; ස්ථිතත්වාත්, පිහිටි බැවින් ඊප්ප්‍රත්‍යය ද වීය. (මෙහි "සුමුඛා" යන තන්හි ඊප්ප්‍රත්‍යය නොව "සුකෙශී" යන තන්හි වූයේ කෙසේද යත්? 'සුකෙශී" යන තන්හි කෙශය මෙහි අප්‍රාණිස්ථ වුවත් ඒ කෙශය ප්‍රාණියෙකු කෙරෙහි දක්නා ලද බැවින් ඊප් ප්‍රත්‍යය වීය. "සුමුඛා" යන තන්හි ශාලාව පිළිබඳ මුඛය ප්‍රාණියෙකු කෙරෙහි දක්නා ලද්දක් නොවන බැවින් ඊප්ප්‍රත්‍යය නොවීය.

b ස්වාඞ්ගත්වෙ අපි, (වක්ෂ්‍යමාණ ශබ්දයන්ගේ) ස්වාඞ්ගභාවය ඇති කල්හිද; වාශබ්දස්‍ය, සූත්‍රොක්ත වාශබ්දය තමා; ව්‍යවස්ථිතත්වාත්, ව්‍යවස්ථාකරණලද බැවින්; ඔෂ්ඨාදිෂු, ඔෂ්ඨශබ්දාදීන් විෂයෙහි; විකල්පඃ, (ඊප්ප්‍රත්‍යය) විකල්ප වේ. වදනාදිෂු, වදන ශබ්දාදියෙහි; න වක්තව්‍යඃ, නොකිය යුතුයි. බිම්බොෂ්ඨී-බිම්බොෂ්ඨා, (මෙහි ඔෂ්ඨාදිය බැවින්) ඊප්ප්‍රත්‍යය වූතන්හි "බිම්බොෂ්ඨී" යනුද විකල්පයෙන් නුවූතන්හි "බිම්බොෂ්ඨා" යනුද වේ. "චාරුකර්ණී-චාරුකර්ණා, සමදන්තී=සමදන්තා" යන තන්හිද එසේයි. "පද්මවදනා, මෘගනයනා" යන තන්හි වදනශබ්දාදිය බැවින් ඊප්ප්‍රත්‍යය නොවේ. 'බිම්බොෂ්ඨී-බිම්බොෂ්ඨා" යනු බිඹුපල වැනිතොල් ඇති සත්‍රියයි; "චාරුකර්ණී-චාරුකර්ණා" යනු මනොඥ වූ කර්ණද්වය ඇති සත්‍රියයි. "සමදන්තී-සමදන්තා" යනු සමවූදත් ඇති සත්‍රියයි.

a "නඛමුඛසංඥායාං නෙප්" ශූර්පණඛා, ගෞරමුඛා. "නාසිකාශබ්දාත් කෙවලාන්නෙප්" නාසිකා. "කෘදිකාරාද කෙතසිච් වා වක්තව්‍යඃ" අඞ්ගුලී අඞ්ගුලිඃ, ධූලී-ධූලිඃ, ආජී-ආජිඃ, අක්තින ඉති විශෙෂණාත්‍කෘතිඃ, හූතිඃ.

253. ඓච්ච මනවාදෙඃ. (ඞෙන් 1, 1; ච 1, 1; මනවාදෙඃ 5, 1;)

b මනවාදෙර්ගණාත් ස්ත්‍රියාමීප්ප්‍රත්‍යයො භවති ඓකාරාදෙශශ්ච. චකාරාත්මනොරෞරෞ වා. ආදිශබ්දාත්මනු අග්නි වෘෂාකපි පූතක්‍රතු කුසිත කුසිද ග්‍රාහ්‍යාඃ මනොර්භාර්යා= මනායී මනාවී අත්‍ර විකල්පෙන පක්ෂෙ මනුඃ. අග්නෙර්භාර්යා= අග්නායී. (පූතාඃ ක්‍රතවො යස්‍යෙති පූතක්‍රතුඃ) පූතක්‍රතොර්භාර්යා=පූතක්‍රතායී, ඉත්‍යාදි.

"පද්මවදනා" යනු පියුමක් වැනි මුහුණ ඇති ස්ත්‍රියයි. 'මෘග නයනා" යනු මෘගයකුගේ වැනි ඇස් ඇති ස්ත්‍රියයි.)

a සංඥායාම්, සංඥාවාචකනාමයෙහි; නඛමුඛයොඃ ච, "නඛමුඛ" ශබ්දදෙක සම්බන්ධව ද; නප්, ඊප්ප්‍රත්‍යය නොවේ. ශූර්පණඛා, ("ශූර්ප ඉව නඛා යස්‍යාඃ සා" යන වාක්‍යයෙහි "ශූර්පණඛා" යනු වේ. කුලුවැනි නිය ඇති එනම් රාවණභගිනියයි. ගෞරමුඛා ("ගෞරං මුඛං යස්‍යාඃ" සා යන වාක්‍යයෙහි) "ගෞරමුඛා" යනු වේ. ගෞර වර්ණ මුඛ ඇති එනම් ස්ත්‍රියයි. කෙවලාත්, හුදකලා වූ; නාසිකාශබ්දාත්, නාසිකා ශබ්දයා කෙරෙන්; නඊප්, ඊප්ප්‍රත්‍යය නොවේ. 'නාසිකා" යනු ඊට උදාහරණයි. අක්තිනඃ, කතිප්‍රත්‍යයාන්තය නොරකොට ඇත්තාවූ; කෘදිකාරාත්, කෘදන්ත ඉකාරයා කෙරෙන්; වා, විකල්පයෙන්; ඊප්, ඊප්ප්‍රත්‍යය; වක්තව්‍යඃ, කියයුතුයි. "අඞ්ගුලී-අඞ්ගුලිඃ" යන තන්හි කෘදන්ත ඉකාරය බැවින් ඊප්ප්‍රත්‍යය වීමෙන් "අඞ්ගුලී" යනුද, විකල්පයෙන් "අඞ්ගුලිඃ" යනුද වේ. 'ධූලී-ධූලිඃ, ආජී-ආජිඃ" යන තන්හිද එසේයි. අක්තිනඃ ඉති, කතිප්‍රත්‍යයාන්තයා කෙරෙන් නොවේ යයි; විශෙෂණාත්, වෙන්කොට කීමෙන්; කෘතිඃ හූතිඃ, "කෘතිඃ හූතිඃ" යනුවේ. (මෙහි කතිප්‍රත්‍යයාන්ත කෘදන්ත බැවින් ඊප් ප්‍රත්‍යය නොවේ.)

253. මනවාදෙඃ, මනුශබ්දාදිගණයා කෙරෙන් (ස්ත්‍රීඅර්ථයෙහි ඊප් ප්‍රත්‍යය වේ.) ඓත් ච, (ශබ්දාන්තයට) ඓකාරාදෙශ ද වේ.

b මනවාදෙර්ගණාත්, මනවාදිගණයා කෙරෙන්; ස්ත්‍රියාම්, ස්ත්‍රීඅර්ථයෙහි, ඊප්ප්‍රත්‍යයඃ භවති, ඊප්ප්‍රත්‍යය වේ. ඓකාරාදෙශශ්ච, ඓකාරාදෙශද වේ. චකාරාත්, චශබ්දග්‍රහණයෙන්; මනොඃ, මනු ශබ්දයාගේ, වෞ විසංඥයට; වා, විකල්පයෙන්; ඖ, ඖකාර දෙශ වේ. ආදිශබ්දාත්, ආදිශබ්දයෙන්; මනු, මනු ශබ්දය; අග්නි, අග්නි ශබ්දය, වෘෂාකපි, වෘෂාකපිශබ්දය; පූතක්‍රතු, පූතක්‍රතු ශබ්දය; කුසිත, කුසිත ශබ්දය; කුසිදඃ කුසිද ශබ්දය යන මොහු; ග්‍රාහ්‍යාඃ ගත යුතුයි. මනොඃ, මනුහුගේ; භාර්යා, භාර්යාතොමෝ; මනායී-මනාවී, "මනායී" යනුද "මනාවී" යනු ද වේ. අත්‍ර, මෙහි; විකල්පෙන, විකල්පයෙන්; පක්ෂෙ, පසෙක්හි; මනුඃ, මනු නම් වේ. අග්නෙඃ, අග්නිහගේ; භාර්යා, භාර්යාතොමෝ; අග්නායී, "අග්නායී" නම් වේ. පූතාඃ පවිත්‍රවූ; ක්‍රතවඃ යාගයෝ; යස්‍ය ඉති, යමකුගේ නුයි; පූතක්‍රතුඃ, පූතක්‍රතු නම් වේ. (ශක්‍රයායි. පූතක්‍රතොඃ, ශක්‍රයාගේ; භාර්යා, භාර්යාතොමෝ; පූතක්‍රතායී. පූතක්‍රතායී නම් වේ. ඉත්‍යාදි, මේ ආදිය වේ.

254. පතන්‍යාදයඃ. (පතන්‍යාදයඃ, 1, 3;)

a පතන්‍යාදයඃ ශබ්දා නිපාත්‍යන්තෙ. පාණිග්‍රහණකර්තා පතිඃ, තස්‍ය ස්ත්‍රී පත්නී; භර්තෘයොගෙ එව, අන්‍යත්‍ර ගවාං පතිඃ ස්ත්‍රී. සමානඃ පතිර්යස්‍යාඃ සා සපත්නී, භර්තෘයොගෙ එව; අන්තර්වත්නී, අන්‍යත්‍ර අන්තර්වතී; පතිවත්නී සභර්තෘකා; අන්‍යා පතිමතී. යති අශිශ්වී අසිපරනී යුවතී. ප්‍රථමං සූයෙර්ෂා සැවති යස්‍යා. සා සූඩි, ඌඪී, නාගබ්දස්‍ය ණිප් ප්‍රත්‍යයො භවති, "ණීපි පරෙ නුඩාගිභාවශ්ච" නාරී.

254. පතන්‍යාදයඃ, "පත්නී" ශබ්දාදීහු නිපාතනය කරණු ලැබෙත්.

a පතන්‍යාදයඃ ශබ්දාඃ, පත්නී ආදි ශබ්දයෝ; නිපාත්‍යන්තෙ, නිපාතනය කරණු ලැබෙත්. පාණිග්‍රහණකර්තා, හස්තග්‍රහණය කරන්නේ; පතිඃ, පති නම් වේ. තස්‍ය, ඔහුගේ; ස්ත්‍රී, ස්ත්‍රීතොමෝ; පත්නී. පත්නී නම් වේ. භර්තෘයොගෙ එව, ස්වාමියොග යෙහි ම මෙසේ වේ. අන්‍යත්‍ර, අන්තන්හි; (එසේ නොවේ'එනම්):- ගවාම්, ගෙරින්ගේ; පතිඃ, ස්වාමිවූ; ස්ත්‍රී, ස්ත්‍රීතොමෝ. (යන තන්හි භර්තෘයොග රහිත බැවින් "පති" කියා වේ. "පත්නී" කියා නොවේ). සමානඃ, සමානවූ; පතිඃ, ස්වාමි තෙම; යස්‍යාඃ, යම් ස්ත්‍රියකගේ ද; සා, ඕතොමෝ; සපත්නී, "සපත්නී' නම් වේ.

a දාරශබ්දෝ නිත්‍යං බහුවචනාන්තඃ පුංලිඞ්ගඃ, දාරාඃ, දාරාන්, දාරෛඃ, දාරේභ්‍යඃ, දාරේභ්‍යඃ, දාරාණාම්, දාරේෂු.

භර්තෘයොගෙ එව, ස්වාමියොගයෙහි ම මෙසේ වේ. අන්තර්වත්නී, ("අන්තර්ගර්භෝඅස්ත්‍යස්‍යාඃ") යන වාක්‍යයෙහි "අන්තර්වත්නී" යනු වේ. (ගැබිණියයි) අන්‍යත්‍ර, අන්තන්හි; අන්තර්වතී, "අන්තර්වතී" යනු වේ, පතිවත්නී, ("පතිරස්‍යා අස්ති" යන වාක්‍යයෙහි) 'පතිවත්නී" යනු වේ. සභර්තෘකා, ස්වාමියා සහිත ස්ත්‍රියයි. අන්‍යා, අන්‍යවූවා හෙවත් ස්වාමිරහිතවූවා; පතිමතී, "පතිමතී" නම වේ. සඛී, "සඛි" ශබ්දයා කෙරෙන් ඊප්ප්‍රත්‍යය නිපාතනය කොට "සඛී" යනු වේ (යෙහෙළියයි); අශිශ්වී, "නවිද්‍යතෙ ශිශුර්‍යස්‍යාඃ සා" යන වාක්‍යයෙහි) "ශිශු" ශබ්දයාකෙරෙන් ඊප්ප්‍රත්‍යය නිපාතනය කොට "අශිශ්වී" යනු වේ. (දරුවන් නැති ස්ත්‍රියයි). අඹිජරතී, ('අඹා ජරත් යස්‍යාඃ සා" යන වාක්‍යයෙහි) "අඹිජරත්" ශබ්දයා කෙරෙන් ඊප්ප්‍රත්‍යය නිපාතනය කොට "අඹිජරතී" යනු වේ. (අඹක් ජරව ඇති ස්ත්‍රියයි). යුවති "යුවති" ශබ්දයාකෙරෙන් ඊප්ප්‍රත්‍යය නිපාතනය කොට "යුවතී" යනු වේ. (තරුණියයි). ප්‍රථමං, පළමුකොට; සූර්‍ය්‍යඃ, සූර්‍ය්‍යතෙම; යස්‍යාං, යම්දිශාවෙක්හි; අභ්‍යුදෙති, ගමන්කෙරේද; සා, ඕතොමෝ; ප්‍රාචී, "ප්‍රාචී" නම් වේ. පෙරදිගයි. උදීචී, "උදඤ්චති සූර්‍ය්‍යෝයස්‍යාං සා" යන වාක්‍යයෙහි "උදච්" ශබ්දයෙන් ඊප්ප්‍රත්‍යය නිපාතනය කොට "උදීචී" යනු වේ. (උතුරුදිගයි). නෘශබ්දයස්‍ය, නෘශබ්දය සම්බන්ධව; ණීප් ප්‍රත්‍යයඃ භවති, ණීප්ප්‍රත්‍යය වේ. ණිපි පරෙ, ණීප්ප්‍රත්‍යය පර කල්හි; නුඃ, නෘශබ්දයට; වෘද්ධිඃ, වෘද්ධිය; වාච්‍යා, කියයුතුයි. "නාරී" යනු ඊට උදාහරණයි (මෙහි "පත්නී, සපත්නී" යන දෙතන්හි "පති" ශබ්දයා කෙරෙන් ඊප්ප්‍රත්‍යය හා නුට් ආගම ද විසංඥලොපය ද නිපාතනයෙන් සිඬයි. "අන්තර්වත්නී" යන තන්හි අන්තර්වත් ශබ්දයාකෙරෙන් ඊප්ප්‍රත්‍යය හා නුට් ආගමයි. "පතිවත්නී" යන තන්හි "පති" ශබ්දයා කෙරෙන් වත් ප්‍රත්‍යය නුට්ආගම ඊප්ප්‍රත්‍යය යන තුණම නිපාතනයෙන් සිඬයි. මෙකී නිපාතනයෙන් සිඬවූ තවත් බොහෝ නාම දක්නා ලැබෙත්. එනම් "භාජී, ගොණී, නාගී, ස්ථලී, කුණ්ඩී, කාලී, කුශී, කාමුකී, ඝටී, කබරී, නීලී" යනාදියයි.

a දාරශබ්දඃ, දාරශබ්දයතෙම, නිත්‍යං, සතතයෙන්; බහුවචනාන්තඃ, බහුවචනාන්තයි; පුංලිඞ්ගඃ, පුංලිඞ්ග වේ. "දාරාඃ දාරේෂු" යනු පිළිවෙළින් ප්‍රථමාදි බහුවචනයි. (මේ "දාර" ශබ්දය අර්ථ

255. වොතොගුණාත්. [වා 1, 1; ඔඃ 5; 1, ගුණාත් 5; 1;]

a උකාරාන්තාද්ගුණවාචිනො වා ස්ත්‍රියාමීප් ප්‍රත්‍යයො භවති. පට්වී-පටුඃ, මෘද්වී-මෘදුඃ, තන්වී-තනුඃ, "ඛරුසංයොගොපධාන්න" ඛරුඃ, පාණ්ඩුඃ.

වශයෙන් ස්ත්‍රී වාචක වුවත් ශබ්දරූප වශයෙන් පුංලිඞ්ග අකාරාන්ත ශබ්දයක් මෙන් ව්‍යවහෘත වේ. හෙද බහුත්වයෙහි පමණක් වේ.

255. ගුණාත්, ගුණවාචකවූ; ඔඃ, උකාරාන්තයාකෙරෙන්; වා, විකල්පයෙන්; ඊප්ප්‍රත්‍යය වේ.

a ගුණවාචිනඃ, ගුණවාචිවූ; උකාරාන්තාත්, උකාරාන්තයා කෙරෙන්; ස්ත්‍රියාම්, ස්ත්‍රීඅර්ථයෙහි; වා, විකල්පයෙන්; ඊප් ප්‍රත්‍යයඃ භවති, ඊප්ප්‍රත්‍යය වේ. පට්වී-පටුඃ, පටු ශබ්දයාකෙරෙන් ඊප්ප්‍රත්‍යය වූතන්හි "පට්වී" යනු ද, විකල්පයෙන් නුවතන්හි "පටු" යනු ද වේ. "මෘද්වී මෘදුඃ, තන්වී-තනුඃ" යන තන්හි "මෘදු, තනු' ශබ්දද්වයෙන් විකල්පයෙන් ඊප්ප්‍රත්‍යයයි ඛරුසංයොගොපධාත්, ඛරු ශබ්දයාකෙරෙන් හා සංයොගයක් උපධාසංඥ කොට ඇත්තනු කෙරෙන්; න, ඊප්ප්‍රත්‍යය නොවේ, "ඛරුඃ පාණ්ඩුඃ" යනු ඊට උදාහරණයි. (මෙහි "පාණ්ඩු" ශබ්දයාගේ උපධාසංඥය සංයොග සහිත බැවින් ඊප්ප්‍රත්‍යය නොවේ.) මෙහි කී ගුණවාචක ශබ්දයන්ගේ ලක්ෂණ දක්වන්නාවූ වෛයාකරණයෝ:-

"සත්වෙ නිවිශතෙපෛති පෘථග්ජාතිෂු දෘශ්‍යතෙ,
ආධෙයශ්චා ක්‍රියාජශ්ච සොසත්වප්‍රකෘතිර්ගුණඃ"

යනු කීහු. යමක් ද්‍රව්‍යාශ්‍රවයට පැමිණ නැවත ඉන් පහවේ ද එසේම අන්‍යද්‍රව්‍යයන්හි දකිනුත් ලැබේ ද, ඒ ගුණ නම් වේ. මෙසේ ගත්කල මෙකී ද්‍රව්‍යාශ්‍රයාපගමවයෙන් හා පෘථග්ද්‍රව්‍යයන්හි දක්මෙන් ගමන පවනාදිකම්දගුණභාවයට පැමිණිය හැකිවෙත්. එබැවින් තන්නිවාරණය පිණිස යමක් උත්පාද්‍ය හෝ අක්‍රියාජන්‍ය (ඇතැම දෙයක් අනිත්‍ය හෝ ඇතැම් දෙයක් නිත්‍ය) වේ නම් එපමණක් ගුණයයි කියනලදී. එනම්, පක්වඝටාදී ද්‍රව්‍යාශ්‍රිත රක්ත වර්ණාදිය උත්පාද්‍යත්වයෙන් අනිත්‍යගුණයි. ආකාශාදිය පිළිබඳ මහත්ත්වාදිය ක්‍රියාජන්‍ය නොවන බැවින් නිත්‍යගුණයි. ගමන

256. උත ඌඞ්. (උතඃ 5, 1; ඌඞ් 1, 1;)

a උකාරාන්තනාම්න ඌඞ්ප්‍රත්‍යයො භවති, පඞ්ගූඃ-පඞ්ගුඃ, වාමොරූඃ වාමොරුඃ, වාශබ්දග්‍රහණාත් රජ්ජ්වාදෞ න භවති, රජ්ජුඃ, ධෙනුඃ.

පචනාදිකර්මය වනාහි ද්‍රව්‍යාශ්‍රයත්වාදියෙන් යුක්තවූවත් සියලු තන්හි ම අනිත්‍යත්වයෙන් ම පවත්නා බැවින් ගුණවාච්‍යත්වයට නො පැමිණේ. තවද අවයවීද්‍රව්‍යය අවයවයෙහි ඇතුලත්වන නිසාත් අවයවවිනාශයෙන් ඒ අවයවිද්‍රව්‍යය ඉන් පහව යන නිසාත් ඒ ස්වභාවය නොයෙක් ද්‍රව්‍යයන්හි දෘශ්‍යමාන නිසාත් ඒ ද්‍රව්‍යයන් ඇතැම් දෙයක් අනිත්‍යත්වයෙන් හා ඇතැම් දෙයක් නිත්‍යත්වයෙන් ද පවත්නා නිසාත් ද්‍රව්‍යය ද ගුණත්වයට පැමිණෙන බැවින් තන්නිවාරණය පිණිස යථොක්ත ලක්‍ෂණවලින් යුක්තව ද්‍රව්‍ය භින්නවූයේ නම් ගුණයයි කියනලදී.

257. උතඃ, උකාරාන්තයාකෙරෙන්; ඌඞ්, (විකල්පයෙන්) ඌ ප්‍රත්‍යය වේ.

a උකාරාන්තාත්, උකාරාන්තයාකෙරෙන්; වා, විකල්පයෙන්; ඌඞ්ප්‍රත්‍යයඃ භවති, ඌඞ්ප්‍රත්‍යය වේ. පඞ්ගූඃ-පඞ්ගුඃ, ඌඞ්ප්‍රත්‍යය වීමෙන් "පඞ්ගූඃ" යනුද විකල්පයෙන් ඒ නොව "පඞ්ගුඃ" යනුද වේ; "වාමොරූඃ-වාමොරුඃ" යන තන්හිද එසේයි. වා ශබ්දාත්, වාශබ්දයෙන්; රජ්ජ්වාදෞ, "රජ්ජු" ශබ්දාදියෙහි; නභවති, නොවේ. "රජ්ජුඃ, ධෙනුඃ" යනු ඊට උදාහරණයි.

මේ සූත්‍රය මෙහි අවිස්තරත්වයෙන් නිර්දිෂ්ටයි. මෙය සවිස්තරත්වයෙන් දක්වන්නාවූ මුග්ධබොධාචාර්‍ය්‍යයෝ "උතොයුඞ්රජ්ජ්වාදෙර්නුප්‍රාණිජාතෙරූප්"යි සූත්‍රය රචනාකොට යකාරය උඞ් (උපධා) සංඥකොට ඇති ශබ්ද ද රජ්ජුශබ්දාදිය ද තොරකොට ඇත්තාවූ මනුෂ්‍යජාතිවාචක ශබ්දයාකෙරෙන් හා අප්‍රාණී ජාතිවාචක ශබ්දයා කෙරෙන් ස්ත්‍රීඅර්ථයෙහි ඌඞ්ප්‍රත්‍යය වේ යයි කීහු. එහි මනුෂ්‍යජාතිවාචකයා කෙරෙන් ඌඞ්ප්‍රත්‍යයට "කුරූඃ" යනු ද, අප්‍රාණීජාතිවාචකයාකෙරෙන් ඌඞ්ප්‍රත්‍යයට "කර්කන්ධූඃ" යනු ද උදාහරණ කරණලදී. 'අධ්වර්‍ය්‍යුඃ" යන තන්හියකාරය උඞ් (උපධා) සංඥ බැවින් නොවේයයි ද "රජ්ජුඃ, හනුඃ" යනාදියෙහි "රජ්ජු" ශබ්දාදිය බැවින් නොවේයයි ද කියනලදී. පසුව "වාම

257. යූනස්තිඃ. (යූනඃ 5, 1; තිඃ 1, 2,)

a යුවන්ශබ්දාත් ස්ත්‍රියාං තිප්‍රත්‍යයො භවති; යුවතිඃ, එතෙෂාං නාමත්වාත් ස්‍යාදයඃ, ආබන්තාත් "ආපඃ" (ප්‍ර. සූ.) ඉති, ඊබන්තාත් "හංසෙපඃ සෙලොපඃ" (ප්‍ර. සූ.) ඉති සිලොපඃ.

ඉති ස්ත්‍රීප්‍රත්‍යයප්‍රක්‍රියා.

ලක්‍ෂණශඵසහසහිතසංහිතොපමානාදූරොඃ" යන සූත්‍රයෙන් 'වාම ලක්‍ෂණ ශඵ සහ සහිත සංහිත' ශබ්දයන් කෙරෙන් හා උපමාන වාචකශබ්දයන් කෙරෙන් ද පර "ඌරු" ශබ්දයාකෙරෙන් ඌඞ් ප්‍රත්‍යය වේයයි කියා "වාමොරූඃ, රම්භොරූඃ"යි උදාහරණ කරණ ලදී. තැවත "තන්වාදෙඃ" යන සූත්‍රයෙන් "තනු" ශබ්දාදිය කෙරෙන් විකල්පයෙන් වේයයි කියා "තනූඃ-තනුඃ" යනාදිය උදාහරණ කරණලදී. එහි ටීකාවෙහි තනුශබ්දාදියට "තනු, වඤ්චු, රුරු, භීරු, කම්බු, පඞ්ගු, ප්‍රියඞ්ගු, ගණ්ඩු, කුහු, සරයු" යන මොහු ඇතුලත් කරණ ලද්දාහ. සිද්ධාන්තකෞමුදියෙහි "පඞ්ගොශ්ච' යන සූත්‍රයෙන් "පඞ්ගු" ශබ්දයා කෙරෙන් ද අවිකල්පයෙන් ඌඞ්ප්‍රත්‍යය වන බැව් කීහු; මුග්ධබොධටීකාවෙහි එහි ද විකල්පයෙන් වන බැව් කීහු.

257. යූනඃ, යුවන්ශබ්දයාකෙරෙන්; තිඃ, තිප්‍රත්‍යය වේ.

a යුවන්ශබ්දාත්, යුවන්ශබ්දයාකෙරෙන්; ස්ත්‍රියාම්, ස්ත්‍රීඅර්ථයෙහි; තිප්‍රත්‍යයඃ භවති, තිප්‍රත්‍යය වේ; 'යුවතිඃ" යනු ඊට උදාහරණයි. එතෙෂාං, මේ (ස්ත්‍රීප්‍රත්‍යයාන්තවූ) ශබ්දයන් කෙරෙන්; නාමත්වාත්, නාම බැවින්; ස්‍යාදයඃ, සිආදි විභක්ති වෙත්. ආබන්තාත්, ආප්ප්‍රත්‍යයාන්තයා කෙරෙන්; 'ආපඃ" ඉති, "ආපඃ" යන සූත්‍රයෙන් ද, ඊබන්තාත්, ඊප්ප්‍රත්‍යයාන්තයා කෙරෙන්; හංසෙපඃ සෙලොපඃ ඉති, "හංසෙපඃ සෙලොපඃ" යන සූත්‍රයෙන් ද; සිලොපඃ, සිවිභක්තිලොපය වේ. ස්ත්‍රීප්‍රත්‍යය ප්‍රක්‍රියා, ස්ත්‍රීප්‍රත්‍යයප්‍රක්‍රියාව; ඉති, මෙතෙකින් සමාප්තයි.

ස්ත්‍රීප්‍රත්‍යයප්‍රක්‍රියාවිව්‍යාඛ්‍යාව.

විභක්ත්‍යර්ථප්‍රක්‍රියාර්ථව්‍යාඛ්‍යාව.

a අථ විභක්ත්‍යර්ථා නිරූප්‍යන්තෙ, ක්‍රියාසිද්ධ්‍යුපකාරකං කාරකම්, තච්ච ෂඩ්විධම්.

b "කර්තා කර්ම ච කරණං සම්ප්‍රදානං තථෛව ච,
අපාදානාධිකරණ මිත්‍යාහුඃ කාරකාණි ෂට්.

c උක්තානුක්තතයා ද්වෙධා කාරකාණි භවන්ති ෂට්,
උක්තෙ තු ප්‍රථමෛව ස්‍යාදනුක්තෙ තු යථාක්‍රමම්,

d තානි විභක්තිරිත්‍යභිධීයන්තෙ.

විභක්තිරූපනිරූපණයෙන් අනතුරුව ඒ ඒ ප්‍රත්‍යයභෙදයෙන් නිපන් සත්‍රිලිඞ්ගවිශෙෂ දක්වා ඉක්බිති ඒ ඒ විභක්තීන්ගේ අර්ථභෙද දක්වන්නාහු 'අථ විභක්ත්‍යර්ථාඃ" යනාදිය කීහු.

a අථ, සත්‍රිප්‍රත්‍යයට අනතුරුව; විභක්ත්‍යර්ථාඃ, (කර්තෘකර්මාදිය පවසන) ප්‍රථමාදි විභක්තීන්ගේ අර්ථසමූහය; නිරූප්‍යන්තෙ, ප්‍රකාශ කරණු ලැබේ. ක්‍රියාසිද්ධ්‍යුපකාරකම්, ක්‍රියාසිද්ධියට උපකාරවන්නේ; කාරකම්, කාරක නම් වේ තත් ච, හෙද; ෂඩ්විධම්, සවැදෑරුම්වේ. (එනම්):—

b කර්තා, (ධාත්වර්ථය සිද්ධකරන්නාවූ) කර්තෘ ද; කර්ම ච, (ධාත්වර්ථය විඳින්නාවූ) කර්මය ද; කරණම්, (ධාත්වර්ථයට ඉවහල්වූ) කරණය ද; සම්ප්‍රදානම්, (ධාත්වර්ථය පිළිගැණීමට සුදුසුවූ) සම්ප්‍රදානය ද; අපාදානාධිකරණම් ඉති, (ධාත්වර්ථය පැවැත්මට ඉමවූ) අපාදානය හා (ධාත්වර්ථයට පිහිටවූ) අධිකරණය ද යන; ෂට්, මේ සය; කාරකාණි ආහුඃ, කාරකයයි කියත්.

c කාරකාණි ෂට්, මෙකී කාරක සය, උක්තානුක්තතයා, උක්තභාවයෙන් හා අනුක්තභාවයෙන්; ද්වෙධා භවන්ති, දෙපරිදි වෙත්. උක්තෙ තු, උක්තවූ තන්හි වනාහි; ප්‍රථමා එව ස්‍යාත්, ප්‍රථමාවිභක්තිය ම වන්නේය. අනුක්තෙ තු, අනුක්තකල්හි; යථාක්‍රමම්, පිළිවෙළින් (තෘතීයාදිනු) වෙත්. (මේ උක්තානුක්තභෙදය වක්‍ෂ්‍යමාණවූ "අභෙද්‍යොක්තෙ ප්‍රථමා" යන සූත්‍රවිවරණයෙහි පවසන්නෙමු).

d තානි, ඒ කාරකයෝ; විභක්තිඃ ඉති, විභක්තියයි; අභිධීයන්තෙ, ප්‍රකාශකරණු ලැබෙත්.

258 ලිඞ්ගාර්ථෙ ප්‍රථමා. (ලිඞ්ගාර්ථෙ 7, 1; ප්‍රථමා 1, 1;)

a ධාතුප්‍රත්‍යයාතිරික්තමර්ථවච්ඡබ්දරූපං ලිඞ්ගං, තස්‍යෛ වාර්ථෙ සත්තාමාත්‍රෙ ප්‍රථමා විභක්තිර්භවති. සකලකාරක භෙදශූන්‍යං වස්තු සත්තා. "ලිඞ්ගාර්ථෙ ප්‍රථමා" එතස්‍ය සූත්‍ර ස්‍යොමාන්‍යුදාහරණානි, උච්චෛඃ නීචෛරිත්‍යාදීනි, ලිඞ්ගාද යොපි ප්‍රථමාර්ථා ඉති කෙචිත්; ආදිශබ්දාල්ලිඞ්ගවචනපරිමාණමාත්‍රෙපි ප්‍රථමා-කාඤ්චනඃ, ශ්‍රීඃ, ඥානම්; වචනෙ-එකඃ, ද්වෞ, බහවඃ: පරිමාණෙ-ද්‍රොණඃ, ඛාරී, ආඪකම්.

මෙහි විභක්ත්‍යර්ථනිරූපණය කිරීමට පටන්ගෙණ විභක්ත්‍යර්ථ නම් (ප්‍රධාන වශයෙන්) කාරකාර්ථයයි දක්වන්නාහු පළමුකොට "කාරක" යන්නෙහි තත්වාර්ථය දක්වමින් ක්‍රියා සිද්ධියට උපකාරය යන අර්ථයෙන් කාරකයයි ද ඒ කාරක කර්ත්‍රාදි වශයෙන් සයක්යයි ද, තත්කාරකාර්ථ උක්තවූ කල්හි (ප්‍රත්‍යයාදියකින් කථිත කල්හි) ප්‍රථමාවිභක්තිය සෙවනය කෙරෙත් යයි ද උක්ත නුවූ කල්හි කර්ත්‍රාර්ථයෙහි තෘතීයා විභක්තිය ද, කර්මාර්ථයෙහි ද්විතීයාව ද යනාදීන් ඒ ඒ විභක්ති සෙවනය කෙරෙත්යයි ද කීහු. මෙහි ක්‍රියා සිද්ධියට උපකාරාර්ථයෙන් කාරකයයි කීමෙන් සම්බන්ධය කාරකත්වයට අන්තර්ගත නොවේ. කුමක් හෙයින්දයත්? සම්බන්ධයාගේ ක්‍රියාසිද්ධ්‍යුපකාරශක්තියක් නැති හෙයිනි, සියලු ක්‍රියාවෝම කර්තෘකර්මාදිකාරකයක් අපෙක්‍ෂාකොට පවතිත්. සම්බන්ධය වනාහි එබඳු අපෙක්‍ෂාවක් නොකෙරේ. "කාරුකෙණ කටඃ ක්‍රියතෙ" යන මෙහි "ක්‍රියතෙ" යන ක්‍රියාව "කාරුකෙණ" යන කර්ත්‍රාර්ථයාගේ ද "කටඃ" යන කර්මාර්ථයාගේ ද උපකාරයෙන් තදපෙක්‍ෂකව සිද්ධ වූයේ වේ. අන්‍ය වූ කරණාදිකයන්ගේ අපෙක්‍ෂාවෙන් ක්‍රියාවන්ගේ සිද්ධිය ද මෙසේ යි. ස රාඥඃ පුරුෂො භවති" යන මෙහි "භවති" යන ක්‍රියාවගේ සිද්ධියට "පුරුෂඃ" යන කර්තෘපදය උපකාර වේ. "රාඥඃ" යන සම්බන්ධයෙන් වනාහි "පුරුෂඃ" යන්නෙහි වෙන සක් මුත් ඉන් ක්‍රියාසිද්ධියට උපකාරයක් නොවේ. මෙහි සම්බන්ධය කාරකයෙන් තොරවූවත් විභක්ත්‍යර්ථනිරූපණයෙහි ලා සම්බන්ධාර්ථවිභාගය ද නිරූපණය කරණු ලැබේ, මෙහි පළමුකොට ප්‍රථමාර්ථ නිරූපණය කරන්නාහු "ලිඞ්ගාර්ථෙ ප්‍රථමා" යනාදිය කීහු.

258. ලිඞ්ගාර්ථෙ, ලිඞ්ගාර්ථයෙහි; ප්‍රථමා, ප්‍රථමාවිභක්තිය වේ.

a. ධාතුප්‍රත්‍යයාතිරික්තම්, ධාතුවෙන් හා ප්‍රත්‍යයෙන් තොරවූ; නොහොත් ධාතුප්‍රත්‍යය දෙකට වැඩිවූ; අර්ථවත්, අර්ථයෙන්

a * "අෂ්ටමුෂ්ටි භවෙත් කිඤ්චිත් කිඤ්චිදෂ්ටෞ ච පුෂ්කලම්,
පුෂ්කලානි ච චත්වාරි ආඪකං පරිකීර්තිතම්.
චතුර්භිරාඪකෛර්ද්‍රෝණඃ ඛාරී ෂොඩශභිශ්ච තෛඃ"

b තත් සත් බ්‍රහ්ම.

යුක්තවූ; ශබ්දරූපම්, ශබ්දස්වරූපය; ලිඞ්ගම්, ලිඞ්ග නම් වේ. තස්‍ය එව, ඒ ලිඞ්ගයාගේ ම; අර්ථේ, අභිධෙයාර්ථයෙහි; සන්මාත්‍රේ, විද්‍යමාන (ස්වභාව) මාත්‍රය වාච්‍යකල්හි; ප්‍රථමාවිභක්තිඃ භවති, ප්‍රථමා විභක්තිය වේ. සකලකාරකභෙදශූන්‍යම්, සියලු කාරක විශෙෂයන්ගෙන් ශූන්‍ය වූ; වස්තු, වස්තුව; සත්තා, සත්තා (විද්‍යමාන ස්වභාව) නම් වේ. ලිඞ්ගාර්ථේ ප්‍රථමා, "ලිඞ්ගාර්ථේ ප්‍රථමා" යන; එතස්‍ය සූත්‍රස්‍ය, මේ සූත්‍රයට; ඉමානි උදාහරණානි, මේ උදාහරණ වෙත්. (එනම්):-උච්චෛඃ නීචෛඃ ඉත්‍යාදීනි, "උච්චෛඃ නීචෛඃ" යනාදීහුයි. ලිඞ්ගාදයඃ අපි, ලිඞ්ගාදීහුද; ප්‍රථමාර්ථාඃ ඉති, ප්‍රථමාව අර්ථකොට ඇත්තාහුයයි; කෙචිත්, සමහරු (පාණිනීයාදීහු) කියත්. ආදි ශබ්දයෙන්, "ලිඞ්ගාදයඃ" යන්නෙහි ආදිශබ්දයෙන්; ලිඞ්ගවචනපරිමාණමාත්‍රේ අපි, ලිඞ්ගමාත්‍ර වචනමාත්‍ර පරිමාණමාත්‍ර යන මෙහිද; ප්‍රථමා, ප්‍රථමා විභක්තිය වේ. "කෘෂ්ණඃ ශ්‍රීඃ ඥානම්" යනු ලිඞ්ගමාත්‍ර ප්‍රථමාවට උදාහරණයි. වචනෙ, වචනමාත්‍රයෙහි ප්‍රථමාවට උදාහරණ නම්; එකඃ ද්වෞ බහවඃ, 'එකඃ ද්වෞ බහවඃ" යනු වේ. පරිමාණේ, පරිමාණමාත්‍රයෙහි ප්‍රථමාවට උදාහරණ නම්; ද්‍රෝණඃ ඛාරී ආඪකම්, "ද්‍රෝණඃ ඛාරී ආඪකම්" යනු වේ

a අෂ්ටමුෂ්ටි, අටමිටක්, කිඤ්චිත් භවෙත්, කිඤ්චිත් නම් වන්නේය; පුෂ්කලානි චත්වාරි ච, පුෂ්කල සතරක්; ආඪකං පරිකීර්තිතම්, ආඪකයයි ප්‍රකාශ කරණලදී. චතුර්භිඃ ආඪකෛඃ, ආඪකසතරකින්; ද්‍රෝණඃ, ද්‍රෝණයක් වේ. තෛඃ ෂොඩශභිඃ ච, ඒ ද්‍රෝණ සොළසකින්; ඛාරී, ඛාරියක් වේ. (මෙහි කී 'අෂ්ටමුෂ්ටි" යනාදි පද පරිමාණවාචකලිඞ්ගාර්ථ ප්‍රථමාවට උදාහරණයි).

b තත්, ප්‍රසිද්ධවූ; නොයෙකුත් ශාස්ත්‍රගෝචරවූ; සත්, විද්‍යමානවූ; නොහොත් අවිනාශි වූ හෝ ප්‍රධාන වූ; බ්‍රහ්ම, පරබ්‍රහ්ම තෙමේයි. (මේ "තත් සත් බ්‍රහ්ම" යන පදත්‍රය නපුංසකලිඞ්ගාර්ථ ප්‍රථමාවට උදාහරණයි). ‡

* මෙය සමහර පොත්වල දක්නා නොලැබේ.

‡ ඇතැම් පොත්වල "සත්, බ්‍රහ්ම" යන පදයන්හි ලිඞ්ගාර්ථ ප්‍රථමාවිභක්තිය ද "තත්" යනු එහි විශෙෂණයයි ද, සමහර තන්හි "බ්‍රහ්ම" යනු ලිඞ්ගාර්ථ ප්‍රථමා යයිද "තත්, සත්" යන දෙක එහි විශෙෂණයයිද කියත්.

මෙහි කී "ලිඞ්ගාර්ථේ ප්‍රථමා" යන සූත්‍රයෙහි "ලිඞ්ගාර්ථේ" යන්න ඇතැම් වෛයාකරණයෝ "ලිඞ්ගස්‍ය අර්ථඃ=ලිඞ්ගාර්ථඃ" කියා ද, සමහරු "ලිඞ්ගඤ්ච අර්ථශ්ච තයොඃ සමාහාරඃ=ලිඞ්ගාර්ථම්" කියා ද විග්‍රහයොජනාව කෙරෙත්. එහි ප්‍රථමවාක්‍යයෙන් ලිඞ්ගයාගේ අර්ථයෙහි කියාද, අනිකෙන් ලිඞ්ගමාත්‍රයෙහි හා අර්ථමාත්‍රයෙහි කියාද අර්ථ ගතයුතු වෙත්. "ලිඞ්ග" යන්නෙහි නිර්වචන දක්වන්නාහු 'ලිඞ්ගයතෙ විඥායතෙ ද්‍යෙයතෙ පුංස්ත්‍රීනපුංසකතයා ශබ්දඃ අනෙනෙති ලිඞ්ගම්' යනු කීහු. මෙයින් ශබ්දයෝ පුංස්ත්‍රීනපුංසකස්වභාවයෙන් ලකුණු කරණු ලැබෙත්නුයි දන්නා ලැබෙත්නුයි ලිඞ්ග නම් යනු එහි අර්ථයි. කෙවල ධාතුවට හා ප්‍රත්‍යයට අයිතිව ඒ දෙදෙනාගේ සඞ්ගතියෙන් පුංස්ත්‍රීනපුංසක ස්වභාවයෙන් සිද්ධවූ ශබ්ද ලිඞ්ගයෝයි. එහි කර්මාදි අර්ථාන්තර විරහිත ස්වාර්ථමාත්‍රය ලිඞ්ගාර්ථයි. "නාපදං ශාස්ත්‍රෙ ප්‍රයුඤ්ජීත" යන න්‍යායයෙන් පදනුවූවක් ශාස්ත්‍රයෙහි නොයොදන්නේ යයි කී බැවින් ඒ ලිඞ්ගය පදබවට පමුණුවා ශාස්ත්‍රයෙහි යොදා තදර්ථමාත්‍රය ප්‍රකාශකිරීම පිණිස ව්‍යවහෘතවූ ප්‍රථමාව ලිඞ්ගාර්ථයෙහි ප්‍රථමාවයි. සිද්ධාන්තකෞමුදියෙහි "ප්‍රාතිපදිකාර්ථලිඞ්ගපරිමාණවචනමාත්‍රෙ ප්‍රථමා"යි සූත්‍රය හදුරා ප්‍රාතිපදිකාර්ථමාත්‍රය ලිඞ්ගමාත්‍රය පරිමාණමාත්‍රය වචනමාත්‍රය යන මෙහි ප්‍රථමාව වේ යයි ප්‍රකාශිතයි. මෙහි ප්‍රාතිපදිකාර්ථග්‍රහණය "ස්වර් පුනර් උච්චෛඃ නීචෛඃ" යනාදි අලිඞ්ගයන් කෙරෙන් ද ප්‍රථමාවිභක්තිය වීම පිණිසයි.

යම්කලෙක්හි මෙකී ලිඞ්ගය කර්තෘකර්මාදි අර්ථවිශෙෂයකින් යුක්තවූවොත් එකල්හි තල්ලිඞ්ගාර්ථතිරොභාවයෙන් විද්‍යමාන ස්වභාවය වෙනස් වේ. මෙකී ප්‍රථමාවෙන් එබඳු වෙනසක් නොවන බැවින් මීට අවිශිෂ්ට පදාර්ථයයි ද ඇතැම් වෛයාකරණයෝ කියත්. මෙසේ අවිශිෂ්ට පදාර්ථසඞ්ඛ්‍යාත ලිඞ්ගාර්ථාදියෙහි ද වක්ෂ්‍යමාණවූ "ආමන්ත්‍රණෙ ච" යන සූත්‍රයෙන් ආමන්ත්‍රණාර්ථයෙහි ද "අභිහිතෙ ප්‍රථමා" යන සූත්‍රයෙන් උක්තාර්ථයෙහි ද ප්‍රථමා විභක්තිය වේ.*

* ඇතැම්හු මේ ප්‍රථමාවිභක්තිය ලිඞ්ගාර්ථයෙහි පමණක් වේයයි ද, ඇතැම්හු ලිඞ්ගාර්ථ උක්තාර්ථ යන දෙක්හිම වේයයි ද කියත්.

ශ්‍රීමත්පාදවාචාර්යයන් විසින් මේ ප්‍රථමාවිභක්තිය සඳහා "ලිඞ්ග සම්බොධනොක්තාර්ථෙ ප්‍රථමා" යි සූත්‍රය හදුරා ලිඞ්ගාර්ථ සම්බොධනාර්ථ උක්තාර්ථ යන

a * රවිරිව රාජතෙ රාජා රොෂාත්කුමාරී රෙරූයතෙ,
බොභුජ්‍යතෙ භුවං භූපාලඃ ප්‍රාගාසතාං රාමලක්ෂ්මණෞ.

a. රාජා, රජතෙම; රවිඃ ඉව, හිරු මෙන්; රාජතෙ, බබලයි, කුමාරී, කුමාරිතොමෝ; රොෂාත්, ක්‍රොධයෙන්; රෙරූයතෙ, අතිශයින් හඬයි. භූපාලඃ, රජතෙම; භුවම්, පෘථිවිය; බොභුජ්‍යතෙ, අතිශයින් පාලනය කෙරේ. රාමලක්ෂ්මණෞ, රාම ලක්ෂ්මණ

අර්ථත්‍රයෙහි ප්‍රථමාවිභක්තිය වේයයි කියන ලදී. සමහරු මේ ලිඞ්ගාර්ථ උක්තාර්ථය එකක්කොට සලකන්නේයයි සිතාම තට්ටීකාවෙහි "නහි ක්‍රියාරහිතං වාක්‍යමස්තීති න්‍යායාත් සර්වත්‍රෛව ක්‍රියාධ්‍යාහාරෙණ උක්තාර්ථත්වාත් ප්‍රථමා ප්‍රාප්තෞ කථං ලිඞ්ගාර්ථග්‍රහණමිති" යන්නෙන් ක්‍රියා රහිත වාක්‍යයක් නොමැත්තේය යන න්‍යායයෙන් සෑම තන්හිම ක්‍රියාධ්‍යාහාරයෙන් උක්ත ස්වභාවයෙන් ප්‍රථමාහුගේ පැමිණීම ඇති කල්හි ලිඞ්ගාර්ථග්‍රහණය (ලිඞ්ගාර්ථයෙහි ප්‍රථමාව වේයයි ගැණීම) කුමටදැයි චොදනාකොට තත්පරිහාරවශයෙන් "යත්‍ර අසමාප්තක්‍රියාපදං කර්ත්‍රාදි පදයුක්තං තත්‍රෛව ක්‍රියාධ්‍යාහාරඃ, යත්‍ර තු කෙවලො රූඪශබ්දඃ ප්‍රයුජ්‍යතෙ තත්‍ර තන්න්‍යායාවසරො නාස්තීති" යනු කියන ලදී. යම් තැනක වාක්‍ය සම්පූර්ණ නොකරන්නා වූ ක්‍රියාපදයක් කර්ත්‍රාදිපදයක් හා යුක්ත වේ නම් එහිම (අවශ්‍යයෙන්) ක්‍රියාධ්‍යාහාරය වේ. යම් තැනක කෙවල රූඪශබ්දයක් යොදනු ලැබේ නම් එහි ඒ න්‍යාය ආවශ්‍යක නොවේ යනු එහි අර්ථයි. මෙයින් ප්‍රකාශිතවූයේ ක්‍රියානපෙක්ෂක කෙවල රූඪශබ්දයන්හි ලිඞ්ගාර්ථප්‍රථමාව ද ක්‍රියාපෙක්ෂකයන්හි උක්තාර්ථප්‍රථමාව ද වන බවයි.

ලඝුභාෂ්‍යව්‍යාඛ්‍යාවෙහිද "ලිඞ්ගාර්ථෙ ප්‍රථමා" යන සූත්‍රවිවරණයෙහි "ස්වර්—අනන්තවාසී, විනිඃ, කුලම්" යනාදීන් උදාහරණ කොට "නනු විනිරිත්‍යාදාවස්තීත්‍යධ්‍යාහාර්‍ය්‍යෙ තෙ නාන්‍යොක්තෙ ඉති සිද්ධං ප්‍රථමා කිමනෙන" යනුවෙන් "විනිඃ" යනාදියෙහි "අස්ති" යනු අධ්‍යාහාර කොට එයින් "අන්‍යොක්තෙ" යනුවෙන් ප්‍රථමාව සිද්ධ නොවේ ද? මේ "ලිඞ්ගාර්ථෙ ප්‍රථමා" යන සූත්‍රයෙන් කිම්දැයි චොදනාකොට ඊට පරිහාරවශයෙන් "අධ්‍යාහාරෙණ ගෞරවාවෛයර්ථ්‍යාච්ච" යනු කීහු. අධ්‍යාහාරයෙන් වාක්‍යය මහත් වන බැවින් ව්‍යර්ථ බැවිනුත් මෙසේ "ලිඞ්ගාර්ථෙ ප්‍රථමා" යන සූත්‍රය උවමනාවේ යනු එහි අර්ථයි. සිද්ධාන්තචන්ද්‍රිකා ආශුබොධාදි ව්‍යාකරණයන්හිද ලිඞ්ගාර්ථ ආමන්ත්‍රණාර්ථ උක්තාර්ථ යන තුනෙහිම වෙන්වශයෙන් ප්‍රථමාව වේයයි කීහු.

* ඇතැම් සාරස්වතයන්හි මේ ශ්ලොකවලට මුලින් "අන්‍යොක්තෙ ප්‍රථමා" යන සූත්‍රය දක්නා ලැබේ. මෙහි මේ "රවිරිව රාජතෙ" යනාදී උදාහරණ විද්‍යමාන බැවින් ඒ යොග්‍යයයි ද හඟිමු.

a මනසි වචසි කායෙ පුණ්‍යපීයූෂපූර්ණා
ස්ත්‍රිභුවනමුපකාරශ්‍රෙණිභිඃ ප්‍රීණයන්තඃ,
පරගුණපරමාණූන් පර්වතීකෘත්‍ය නිත්‍යං
නිජහෘදි විකසන්තඃ සන්ති සන්තඃ කියන්තඃ.

b කුමාරාඃ ශෙරතෙ ස්වෛරං රෙරූයන්තෙ ච තාරකාඃ,
ජෙගීයන්තෙ ච ගීතඥා මෙම්‍රීයන්තෙ රුජාර්දිතාඃ.

259. ආමන්ත්‍රණෙ ච. (ආමන්ත්‍රණෙ 7, 1, ච 1, 1;)

දෙදෙන; ප්‍රාක්, පූර්වයෙහි; ආසතාං, වූහ. (මෙහි "රාජතෙ" යන ක්‍රියාවෙන් "රාජා" යනු ද "රෙරූයතෙ" යන ක්‍රියාවෙන් "කුමාරී" යනු ද "බොභුජ්‍යතෙ" යන ක්‍රියාවෙන් "භූපාලඃ" යනු ද "ආසතාම්" යන ක්‍රියාවෙන් 'රාමලක්ෂ්මණෞ" යනු ද උක්ත කර්ත්‍රර්ථයෙහි ප්‍රථමායි.)

a මනසි, සිතෙහිද, වචසි වචනයෙහිද; කායෙ, කයෙහිද; පුණ්‍යපීයූෂපූර්ණාඃ, පින් නැමති අමා පිරුණාවූ; ත්‍රිභුවනං, භුවනත්‍රය; උපකාරශ්‍රෙණිභිඃ, උපකාරරාශියෙන්; ප්‍රීණයන්තඃ, පිණවන්නාවූ; පරගුණපරමාණූන්, අන්‍යයන්ගේ ගුණ නැමති පරමාණු; පර්වතීකෘත්‍ය පර්වතයන් මෙන් (මහත්) කොට; නිත්‍යම්, නිතර; නිජහෘදි, ස්වකීය චිත්තයෙහි, විකසන්තඃ, ප්‍රකාශකරන්නාවූ; සන්තඃ, සජ්ජනයෝ; කියන්තඃ, කීදෙනෙක්; සන්ති, ඇත්තාහුද; (මෙහි "සන්ති" යන ක්‍රියාවෙන් "සන්තඃ" යනාදිය උක්ත කර්ත්‍රර්ථයෙහි ප්‍රථමායි)

b කුමාරාඃ, කුමාරයෝ; ස්වෛරං, සියකැමැත්තෙන්; ශෙරතෙ, හොවිත්; තාරකාඃ, තිරිසත්තු; රෙරූයන්තෙ ච, අතිශයෙන් වැලපෙත්; ගීතඥාඃ, ගී දන්නෝ; ජෙගීයන්තෙ ච, අතිශයෙන් ගයත්; රුජාර්දිතාඃ, රොගයෙන් පීඩිතවූවෝ; මෙම්‍රීයන්තෙ, අතිශයින් මියත්; (මෙහි "ශෙරතෙ" යන්නෙන් "කුමාරාඃ" යනුද; "රෙරූයන්තෙ" යන්නෙන් "තාරකාඃ" යනුද, "ජෙගීයන්තෙ" යන්නෙන් "ගීතඥාඃ" යනුද, "මෙම්‍රීයන්තෙ" යන්නෙන් "රුජාර්දිතාඃ" යනුද උක්තකර්ත්‍රර්ථයෙහි ප්‍රථමායි.)

259. ආමන්ත්‍රණෙ ච, ආමන්ත්‍රණාර්ථයෙහිද; ප්‍රථමා විභක්තිය වේ,

a අමන්ත්‍රණෙ අභිමුඛීකරණෙ ප්‍රථමා විභක්තිර්භවති.

b මාං සමුද්ධර ගොවින්ද ප්‍රසීද පරමෙශ්වර,
කුමාරෞ සෙවරමාසාථාං ක්ෂමධ්වං හොස්තපස්විනඃ,

260. හොසඃ, (හොසඃ 1, 3,)

c හොස් භගොස් අඝොස් එතෙ ශබ්දා නිපාත්‍යන්තෙ ධිවිෂයෙ (භවද්භගවදඝවච්ඡබ්දානාං හොස් භගොස් අඝොස් ඉත්‍යෙතච්ඡබ්දරූපත්‍රයං ක්‍රමෙණ නිපාත්‍යතෙ)

---

a ආමන්ත්‍රණෙ, "ආමන්ත්‍රණෙ" යයි සේයි, අභිමුඛීකරණෙ, අනභිමුඛවූවකු අභිමුඛකිරීමෙහි; ප්‍රථමාවිභක්තිඃ භවති, ප්‍රථමා විභක්තිය වේ.

d ගොවින්ද (භවත්) විෂ්ණුදෙවරාජය; මාං, මා; සමුද්ධර, (භව සාගරයෙන්) සමුද්ධරණය කරණු (ගොඩගණු) මැනව; පරමෙශ්වර, පරමෙශ්වරය (ඔබවහන්සේ); ප්‍රසීද, ප්‍රසන්නවනු මැනව; කුමාරෞ, එම්බා කුමාරවරු දෙදෙනෙනි; සෙවරං, සියකැමැත්තෙන් හෙවත් සැපසේ; ආසාථාං, හිඳිව්; හොඃ තපස්විනඃ, පින්වත් තපස් ඇත්තෙනි; ක්ෂමධ්වම්, ඉවසව්; (මෙහි "ගොවින්ද, පරමෙශ්වර" යන දෙක ආමන්ත්‍රණාර්ථ ප්‍රථමා එකවචනයි, "කුමාරෞ" යනු ද්විවචනයි. "තපස්විනඃ" යනු බහුවචනයි.)

260. හොඃ, හොස් සමාහාරයෙහි වූවෝ හෙවත් "හොස් භගොස් අඝොස්" යන මොහු ආමන්ත්‍රණාර්ථයෙහි නිපාතනය කරණුලැබෙත්.

c හොස් භගොස් අඝොස් එතෙ ශබ්දාඃ, "හොස් භගොස් අඝොස්" යන මේ ශබ්දයෝ; ධිවිෂයෙ, ධිසංඥවිෂයෙහි; නිපාත්‍යන්තෙ, නිපාතනය කරණුලැබෙත්; භවත් භගවත් අඝවත් ශබ්දානාං, "භවත් භගවත් අඝවත්" ශබ්දතුණට; හොස් භගොස් අඝොස් ඉති, "හොස් භගොස් අඝොස් යන; එතත් ශබ්දරූපත්‍රයම්, මේ ශබ්දරූපතුණ; ක්‍රමෙණ, පිළිවෙළින්; නිපාත්‍යතෙ, නිපාතනය කරණුලැබේ.

a ක්ෂමස්ව හො දුරාරාධ්‍ය භගොස්තුභ්‍යං නමොස්තුතෙ,
අධීෂ්ව භො මහාප්‍රාඥ ශාතයා ඝොඃ සර්වසම්මරම්.

261. ශෙෂාඃ කායෙති කර්තෘසාධනයොර්දානපාත්‍රෙ විශ්ලෙෂාවධෞ සම්බන්ධ ආධාරභාවයොඃ.

(ශෙෂාඃ 1, 3; කායෙති 7, 1; කර්තෘසාධනයොඃ 7, 2; දානපාත්‍රෙ 7, 1; විශ්ලෙෂාවධෞ 7, 1; සම්බන්ධෙ 7, 1; ආධාරභාවයොඃ 7, 2;)

b ශෙෂා විභක්තයො ද්විතීයාද්‍යා එෂ්වර්ථෙෂු භවන්ති, කායෙති කර්මකාරකෙ උත්පාද්‍යෙ ආශෙය සංඥායෙති විකායෙති ච ද්විතීයාවිභක්තිර්භවති.

---

a හොඃ දුරාරාධ්‍ය, එම්බා දුකසේ ආරාධනය කටහැක්ක; ක්ෂමස්ව, ඉවසව; භගොඃ, පිණැත්තෙනි; අස්තුතෙ, ස්තුති (වචන) රහිතවූ; තුභ්‍යම්, ඔබට; නමඃ, නමස්කාර වේවා; හොඃ මහ ප්‍රාඥ, එම්බා මහාපණ්ඩිතය; (ඔබවහන්සේ); අධීෂ්ව, හදාරණු මැනව; අඝොඃ, එම්බා පාපිෂ්ඨය; සර්වසම්මරං, සර්වනාශකවූ පාපය; ශාතය, නසව (මෙහි "හොඃ භගොඃ අඝොඃ" යනු මීට උදාහරණයි.)

මෙසේ ලිඞ්ගාර්ථයෙහි හා ආමන්ත්‍රණාර්ථයෙහි ප්‍රථමාව ලක්ෂ්‍ය ලක්ෂණවලින් නිරූපණය කොට ඉක්බිති ද්විතීයාදිවිභක්තීහු සාමාන්‍යයෙන් මේ මේ අර්ථයන්හි වෙත්යයි විධානය කරන්නාහු "ශෙෂාඃ කායෙති" යනාදි සූත්‍රය කීහු.

261. ශෙෂාඃ, ද්විතීයාදී සෙසු විභක්තීහු; කායෙති, කර්මකාරකයෙහි ද; කර්තෘසාධනයොඃ, කර්තෘකරණ කාරකවයෙහි ද; දානපාත්‍රෙ දානයට භාජනවූ සම්ප්‍රදානකාරකයෙහි ද; විශ්ලෙෂාවධෞ, වියොගයෙහි ඉමවූ අවධිකාරකයෙහි ද; සම්බන්ධෙ, සම්බන්ධාර්ථයෙහි ද; ආධාරභාවයොඃ, ආධාරකාරකය හා (ක්‍රියාලක්ෂණවූ, භාවය යන දෙක්හි ද (පිළිවෙළින්) වෙත්.

b ද්විතීයාද්‍යාඃ, ද්විතීයාව ආදිකොට ඇත්තාවූ; ශෙෂාඃ විභක්තයඃ, සෙසු විභක්තීහු; එෂු අර්ථෙෂු, මෙහි කර්මාදිඅර්ථයන්හි; භවන්ති, වෙත්; කායෙති, කායෙතිසඞ්ඛ්‍යාතවූ; කර්මකාරකෙ, කර්මකාරකයෙහි (වන්නාවූ); ද්විතීයාවිභක්තිඃ, ද්විතීයාවිභක්තිය; උත්පාද්‍යෙ, ඉපද

a "කර්තුරීප්සිතතමං කර්ම"

b කර්තුඃ ක්‍රියයා ආප්තුමිෂ්ටතමං කාරකං කර්මසංඥං ස්‍යාත්. හරිං භජති.

c "තථා යුක්තමානීප්සිතම්"

d ඊප්සිතතමවත් ක්‍රියයා යුක්තමනීප්සිතමපි කාරකං කර්මසංඥං ස්‍යාත්. තච්චානීප්සිතං ද්විවිධම්-ද්වේෂ්‍යමිතරච්ච. විෂං භුඞ්ක්තෙ, ග්‍රාමං ගච්ඡංස්තෘණං ස්පෘශති.

වියයුත්තෙහි ද; ආප්‍යෙ, පැමිණියයුත්තෙහි ද; සංස්කාර්‍යෙ, සංස්කාරකටයුත්තෙහි ද; විකාර්‍යෙ ච, විකාරකටයුත්තෙහි ද; භවති, වේ.

a කර්තුඃ, කර්තෘට; ඊප්සිතතමම්, අතිශයින් අභිමතවූයේ; කර්ම, කර්ම නම් වේ.

b කර්තුඃ, කර්තෘහු විසින්; ක්‍රියයා, ක්‍රියාවෙන්; ආප්තුං, පැමිණෙන්නට; ඉෂ්ටතමම්, අතිශයින් අභිමතවූ; කාරකම්, කාරකය; කර්ම සංඥං ස්‍යාත්, කර්ම නම් වන්නේය; හරිම්, ඊශ්වරයා; භජති, සේවනය කෙරේ; (මෙහි "හරිම්" යනු කර්තෘහුගේ භජනක්‍රියාවෙන් අතිශයින් අභිමත පදාර්ථය බැවින් ඊප්සිත කර්මයි.)

c තථා, එපරිද්දෙන්; හෙවත් පූර්වොක්ත ඊප්සිතය මෙන්; යුක්තම්, (කර්තෘහුගේ ක්‍රියාව සමග) යුක්තවූ; අනීප්සිතම, අනීප්සිතය ද හෙවත් ක්‍රියාවෙන් පැමිණෙන්නට නොකැමති පදාර්ථය ද, කර්ම නම් වේ; (අනීප්සිතය වුවත් ක්‍රියාව හා යුක්තවූවොත් කර්මය වේ යනු භාවයයි.)

d ඊප්සිතතමවත්, ඊප්සිතතමය මෙන්; ක්‍රියයා යුක්තම්, ක්‍රියාවෙන් යුක්තවූ; අනීප්සිතං කාරකම් අපි, ඊප්සිතනුවූ කාරකය ද; කර්මසංඥං ස්‍යාත්, කර්ම නම් වන්නේය; තත් අනීප්සිතං ච, ඒ අනීප්සිතය ද; හෙවත් ඒ කර්තෘක්‍රියාවෙන් ඊප්සා නොකරණලද්ද ද; ද්විවිධම්, දෙවැදෑරුම් වේ; (එනම්)-ද්වේෂ්‍යම්, ද්වේෂ්‍ය කර්ම යද; ඉතරත් ච, අන්‍යවූ අද්වේෂ්‍ය (ඖදාසීන්‍ය) කර්මය දැයි කියයි; විෂං, විෂ; භුඞ්ක්තෙ, අනුභව කෙරේ; (මෙහි විෂානුභවය අනීප්සිතව ද්වේෂයෙන් කරණලද්දක් බැවින් "විෂම්" යනු අනීප්සිත ද්වේෂ්‍යකර්මයි); ග්‍රාමං ගච්ඡන්, ගමට යන්නේ; තෘණම්, තණ; ස්පෘශති, ස්පර්ශකෙරේ; (මෙහි "ග්‍රාමම්" යන්න "ගච්ඡන්"

a තච්ච කර්මකාරකං චතුර්විධම්-උත්පාද්‍යම් ආප්‍යං සංස්කාර්‍යං විකාර්‍යං ච, උත්පත්ත්‍යභිමුඛමුත්පාද්‍යම්, යදභූත්වා භාවි තදුත්පාද්‍යං වා. යත් සිද්ධමෙව ප්‍රාප්‍යතෙ තදාප්‍යම්, සංස්කාරො නාම ප්‍රාක්තනකර්මජො ගුණඃ, කශ්චිද්ගුණාතිශයො වා ගුණාධානං වා මලාපකර්ෂො වා ඉති චතුර්විධඃ සංස්කාරඃ, සංස්කාරමර්හතීති=සංස්කාර්‍යම්. විකාරො නාම පූර්වාවස්ථා පරිත්‍යාගෙනාවස්ථාන්තරප්‍රාප්තිඃ.

b කටං කරොති කාරුකො රූපං පශ්‍යති චාක්ෂුෂඃ,
හව්‍යං ප්‍රාශ්නාති ධර්මිෂ්ඨඃ සොමං සුනොති සොමපාඃ.

යන කෘදන්ත ක්‍රියාව හා ඊප්සිතත්වයෙන් යුක්තවූයෙන් ඊප්සිත කර්ම වේ ඒ අතරවූ තෘණස්පර්ශය වනාහි ප්‍රසඞ්ගයෙන් වූ බැවින් "තෘණම්" යනු ඊප්සිත අනීප්සිතත්වයෙන් අන්‍ය වූ ඖදාසීන්‍යකර්මයි.

පූර්වොක්ත උත්පාද්‍යාදි චතුර්විධකර්මය නිර්වචනයයින් විස්තර කරන්නාහු "තච්ච කර්මකාරකම්" යනාදිය කීහු.

a. තත් කර්මකාරකං ච, ඒ කර්මකාරකය ද, චතුර්විධම් සිවුවැදෑරුම් වේ. (එනම්):-උත්පාද්‍යම්, උත්පාද්‍යකර්මය; ආප්‍යම්, ආප්‍යකර්මය; සංස්කාර්‍යම්, සංස්කාර්‍යකර්මය; විකාර්‍යං ච, විකාර්‍යකර්මය යන මේයි. උත්පත්ත්‍යභිමුඛම්, උත්පත්තියට සුදුස්ස හෙවත් ඉපදවිය යුත්ත; උත්පාද්‍යම්, උත්පාද්‍ය නම් වේ. යත්, යමක්; අභූත්වා, (පෙර) නොවී; භාවි, වනසුලු නම්; තත් වා, හෙද; උත්පාද්‍යම්, උත්පාද්‍ය නම් වේ. සිද්ධම් එව, සිද්ධවූම; යත්, යමක්; ප්‍රාප්‍යතෙ,(කර්තෘහුවිසින්) පැමිණෙනු ලැබේ නම්; තත්, එය; ආප්‍යම්, ආප්‍ය නම් වේ. සංස්කාරඃ නාම, සංස්කාර නම් (කෙසේදයත්); ප්‍රාක්තනකර්මජඃ, පූර්ව භව කර්මයෙන් උපන්නාවූ; ගුණඃ, ගුණය හෝ; කශ්චිද්ගුණාතිශයඃ වා, කිසියම් උත්කෘෂ්ට ගුණයක් හෝ; ගුණාධානං වා, ගුණපිහිටුවීම හෝ; මලාපකර්ෂඃ වා ඉති, කිලුටු හැරීම හෝ වේයයි; සංස්කාරඃ, සංස්කාරය; චතුර්විධඃ, සිවුවැදෑරුම්වේ. සංස්කාරං,(මෙකී චතුර්විධ) සංස්කාරයට; අර්හතීති, සුදුසුවේනුයි; සංස්කාර්‍යං, සංස්කාර්‍ය නම් වේ. විකාරඃ නාම, විකාර නම්; පූර්වාවස්ථාපරිත්‍යාගෙන; පූර්ව අවස්ථාව හැරීමෙන්, අවස්ථාන්තරප්‍රාප්තිඃ, අන්‍ය අවස්ථාවකට පැමිණීමයි.

b. කාරුකඃ, කලල්කරුතෙම; කටං, කලාල; කරොති, කෙරේ; චාක්ෂුෂඃ, ඇස් ඇත්තේ; රූපං, රූපය; පශ්‍යති, දකී, ධර්මිෂ්ඨඃ,

a කටාදිකමුත්පාද්‍යාදි චතුර්විධං කර්‍ම. ගුණාතිශයසංස්කාර්‍ය්‍යං යථා-ව්‍රීහීන් යවාන් වා ප්‍රොක්ෂති, ප්‍රොක්ෂණෙන ව්‍රීහිෂු කශ්චිද්ගුණාතිශයො ජන්‍යතෙ. ගුණාධානමලාපකර්ෂයොරුදාහරණම්-වස්ත්‍රං රජයති දෙවදත්තඃ, රජකො වස්ත්‍රං ක්ෂාලයති.

අතිශයින් දැහැමිවූයේ; රජ්‍යං, රජ්‍යයට; ප්‍රාපයති, පැමිණෙයි. සොමපඃ, සොමවල්ලිරසපානය කරන්නාවූ බ්‍රාහමණතෙම; සොමං, සොමලතාව; සුනොති, කඩයි.

a කටාදිකම්, කටාදිය; හෙවත් “කටං” යනාදි සතර; උත්පාද්‍යාදි, (යථොක්ත) උත්පාද්‍යාදිවූ; චතුර්විධං කර්‍ම, සිව්වැදෑරුම්වූ කර්‍මයයි. හෙවත් සිවුවැදෑරුම් කර්‍මයට උදාහරණයි. ගුණාතිශයසංස්කාර්‍ය්‍යම්, උත්කර්ෂගුණයුත් සංස්කාර්‍ය්‍ය කර්‍මය; යථා; මෙසේයි.(එනම් – ව්‍රීහීන්, වී හෝ; යවාන් වා, යව හෝ; ප්‍රොක්ෂති, පොලයි. ප්‍රොක්ෂණෙන, පොලාලීමෙන්; ව්‍රීහිෂු, වීවල; කශ්චිද්ගුණාතිශයඃ කිසියම් උත්කර්ෂගුණයක්; ජන්‍යතෙ, උපදවනු ලැබේ. ගුණාධානමලාපකර්ෂයොඃ, ගුණාධානමලාපකර්ෂ සංස්කාර්‍ය්‍යකර්‍මවයට; උදාහරණම්, උදාහරණ කියනු ලැබේ. (එනම්):- දෙවදත්තඃ, දෙවදත්තතෙම; වස්ත්‍රම්, වස්ත්‍රය; රජයති, රඳයි; හෙවත් සායම් කෙරේ. (මෙහි “වස්ත්‍රම්” යනු ගුණාධාන සංස්කාර්‍ය්‍ය කර්‍මයි.) රජකඃ, රජකතෙම; වස්ත්‍රම්, වස්ත්‍රය; ක්ෂාලයති, සෝදයි. (මෙහි “වස්ත්‍රම්” යනු මලාපකර්ෂසංස්කාර්‍ය්‍ය කර්‍මයි).

මෙහි කර්‍මවිවක්ෂාවෙහි ලා පළමුකොට “කර්තුරීප්සිතතමං කර්‍ම’ යන පාණිනීය සූත්‍රය හා වෘත්තිය ගෙණහැර දක්වා කර්තෘහට අතිශයින් කැමැති වූ පදාර්ථය කර්‍මයයි කීහු. කරණාදි අන්‍යකාරකද කර්තෘහට කැමැතිවූවත් තමන්ගේ ක්‍රියාවෙන් නිෂ්පාද්‍යපදාර්ථයවූ කර්‍මයම ඕහට අතිශයින් කැමැති බැවින් “ඊප්සිතතමම්”යි කීහු. යමක් එසේ කැමැති නුවූවත් ඔහුගේ ක්‍රියාව හා යුක්තවූවොත් හෙද කර්‍මය වේයයි දක්වනු පිණිස “තථායුක්තංචානීප්සිතම්” යන පාණිනීය සූත්‍රයද ගෙණහැර දක්වන ලදි. මේ අනීප්සිතය ද ද්වෙෂ්‍යය ඉතරයයි විවිධකොට කීහු. මේ සියල්ලම “හරිං භජති” යනාදි උදාහරණ වලින් සපයටයි.

මෙහි යථොක්ත කර්‍මත්වය විභාගකරන්නාහු උත්පාද්‍යාදි චතුෂ්කය හා ඔවුන්ගේ අර්ථවිභාගයද පලකොට “කටං කරොති” යනාදි උදාහරණද ගෙණහැර දැක්වූහ. එහි ‘කටං කරොති” යන

තන්හි “කරොති” යන ක්‍රියාවෙන් අනුපපන්නකටොත්පත්තිය වූ බැවින් “කටම්” යනු උත්පාද්‍ය කර්‍මයයි “ඝටං කරොති, සූත්‍රං ප්‍රසූයතෙ” යනාදිය ද මෙසේයි. “රූපං පශ්‍යති” යන තන්හි “රූපම්” යනු උත්පාද්‍යාදි ලක්ෂණවිරහිතව කර්තෘහුගේ දර්ශනක්‍රියාවෙන් පැමිණිය යුත්තක් වූ බැවින් ආප්‍යකර්‍මයි. “ග්‍රාමං ගච්ඡති” යනාදිය ද මෙසේයි. ‘ රජ්‍යං ප්‍රාපයති” යන තන්හි “රජ්‍යම්” යනු ප්‍රාක්තනකර්‍මජවූ අභිෂෙකාදි සංස්කාරයෙන් සිඩ බැවින් සංස්කාර්‍ය්‍යකර්‍මයි. “සුඛං ප්‍රාපයති” යනාදිය ද මෙසේ යි. “සොමං සුනොති” යන තන්හි “සොමම්” යනු සවන ක්‍රියාවෙන් අවස්ථාන්තරප්‍රාප්තිය වූ බැවින් විකාර්‍ය්‍ය කර්‍මයි. “කාෂ්ඨං දහති” යනාදිය ද මෙසේ යි.

යථොක්ත සංස්කාර්‍ය්‍යභෙදචතුෂ්කයෙන් ප්‍රාක්තනකර්‍මජ ගුණයට පමණක් උදාහරණ දක්වා අන්‍යභෙදත්‍රයට ද උදාහරණ දක්වන්නාහු “ව්‍රීහීන් යවාන් වා ප්‍රොක්ෂති” යනාදිය කීහු, මෙහි ප්‍රොක්ෂණ ක්‍රියාවෙන් ව්‍රීහ්‍යාදින්ගේ උත්කර්ෂගුණය සිඩ බැවින් “ව්‍රීහීන්” යනු ද “යවාන්” යනු ද ගුණාතිශය සංස්කාර්‍ය්‍ය කර්‍මයි. “වස්ත්‍රං රජයති” යන තන්හි රජන ක්‍රියාවෙන් වස්ත්‍රයෙහි කිසිද් ගුණයක් පිහිටි බැවින් “වස්ත්‍රම්” යනු ගුණධාන සංස්කාර්‍ය්‍ය කර්‍මයි “වස්ත්‍රං ක්ෂාලයති” යන තන්හි ක්ෂාලණ ක්‍රියාවෙන් වස්ත්‍රයාගේ මලාපකර්ෂය සිඩවූ බැවින් “වස්ත්‍රම්” යනු මලාපකර්ෂ සංස්කාර්‍ය්‍ය කර්‍මයි.

කර්‍මාර්ථය ව්‍යක්ත කරන්නා වූ ඇතැම් වෛයාකරණයෝ “ක්‍රියාව්‍යාප්‍යං කර්‍ම” යනු කීහු. ක්‍රියාවෙන් විශෙෂයෙන් පැමිණිය යුතු පදාර්ථය කර්‍මය වේ යනු එහි අර්ථයි. සමහරු “කර්තෘසමුද්දිෂ්ටං කර්‍ම” යනු කීහු. කර්තෘහු විසින් මනාකොට උද්දෙශකරණලද (සමන්වෙෂණය කරණලද හෝ අභිලාෂිතවූ) පදාර්ථය කර්‍මය වේ, යනු එහි අර්ථයි, සමහරු “යත් ක්‍රියතෙ තත් කර්‍ම” යනු කීහු. (කර්තෘහු විසින්) යමක් කරණු ලැබේ නම් ඒ කර්‍මය යනු එහි අර්ථයි. මෙහි කර්‍මාර්ථය විභාග කරන්නාවූ භර්තෘහරීන් විසින්:—

“නිර්වර්ත්‍යඤ්ච විකාර්‍ය්‍යඤ්ච ප්‍රාප්‍යඤ්චෙති ත්‍රිධා මතම්,
තත්‍රෙප්සිතතමං කර්‍ම චතුර්ධාන්‍යත්තු කල්පිතම්.

ඖදාසීන්‍යෙන යත් ප්‍රාප්‍යං යච්ච කර්තුරනීප්සිතම්,
සංඥාන්තරෛරනාඛ්‍යාතං යද්‍යච්චාප්‍යන්‍යපූර්වකම්.”

යනු කියන ලදී. එහි ඊප්සිතතමවූ කර්මය "නිර්වර්ත්‍ය විකාර්‍ය්‍ය ප්‍රාප්‍ය" වශයෙන් ත්‍රිවිධයයි දන්නා ලදී. අන්‍යවූ අනීප්සිතය වනාහි සිවුවැදෑරුම් යයි පිරිසිඳින ලදී. එනම්-උදාසීන භාවයෙන් යමක් පැමිණිය යුතු නම් එය ද, කර්තෘහට අනීප්සිත යමක් වේ නම් එයද, අපාදානාදී සංඥාවිශෙෂයෙන් අකථිත යමක් වේ නම් එය ද, (ආධාරාදි) අන්‍යසංඥාවක් පූර්වකොට ඇති යමක් වේ නම් එය ද, කියා අනීප්සිත භෙදය සිවුවැදෑරුම් වේ යනු මෙහි අර්ථයි. සමහරු මෙකී නිර්වර්ත්‍යාදිත්‍රයම පමණක් කර්ම විභාග යයි ද අන්‍ය විභාගයෝ ප්‍රාප්‍යකර්මයෙහිම ඇතුළත් යයි ද කීහු. නිර්වර්ත්‍යාදි කර්මත්‍රයෙහි ලක්ෂණ දක්වන්නාහු:—

"යදසජ්ජායතෙ සද්වා ජන්මනා යත් ප්‍රකාශතෙ,
තන්නිර්වර්ත්‍යං විකාර්‍ය්‍යන්තු කර්ම ද්වෙධා ව්‍යවස්ථිතම්.

ප්‍රකෘත්‍යුච්ඡෙදසම්භූතං කිඤ්චිත් කාෂ්ඨාදිභස්මවත්,
කිඤ්චිද්ගුණාන්තරොත්පත්ත්‍යා සුවර්ණාදිවිකාරවත්.

ක්‍රියාකෘතවිශෙෂාණාං සිද්ධිර්‍යත්‍ර න ගම්‍යතෙ,
දර්ශනාදනුමානාද්වා තත් ප්‍රාප්‍යමිති කථ්‍යතෙ".

යනු කීහු. අවිද්‍යමානවූ යමක් උපදී නම් හෝ විද්‍යමානවූවක් උත්පත්තියෙන් ප්‍රකට වේ නම් හෝ ඒ නිර්වර්ත්‍ය කර්ම නම් වේ. විකාර්‍ය්‍යකර්මය වූකලි දෙපරිද්දෙකින් වෙන් කරණලදී. එනම්:— ප්‍රකෘතිය නසාලීමෙන් හටගත් කිසිවක් වේ නම් ඒ එහි ප්‍රථම භාගයයි. එනම්:-කාෂ්ඨාදීන්ගේ භස්මය මෙනි. කිසිවක් අන්‍ය ගුණයක්හුගේ උත්පත්තියෙන් යුක්ත වේ නම් ඒ එහි විතීය භාගයයි එනම්:-සුවර්ණාදීන්ගේ විකෘති මෙනි. යම් තැනෙක්හි ක්‍රියාකෘත විශෙෂ සිද්ධියක් නො හැගේ නම් දර්ශනයෙන් හෝ අනුමානයෙන් සිඬ වූ එය ප්‍රාප්‍යකර්මයයි කියනු ලැබේ යනු එහි අර්ථයි. "කටං කරොති, පුත්‍රං ප්‍රසූයතෙ" යනු නිර්වර්ත්‍ය කර්මයට උදාහරණයි. මෙහි පූර්වයෙහි අවිද්‍යමාන වූ කටය "කරොති" යන කරණ ක්‍රියාවෙන් නිපන් බැවින් ද, පූර්වයෙහි අප්‍රකාශ වූ පුත්‍රයා ජන්මයෙන් ප්‍රකාශ බැවින් ද "කටම්, පුත්‍රම්" යනු නිර්වර්ත්‍යකර්මයි. "කාෂ්ඨං භස්ම කරොති, සුවර්ණං කුණ්ඩලං කරොති" යනු විකාර්‍ය්‍යකර්මවයට උදාහරණයි, මෙහි ප්‍රකෘතිස්ථ කාෂ්ඨය උච්ඡෙදයෙන් (නැසීමෙන්) විකෘතවූ බැවින් කාෂ්ඨය ද, තදුච්ඡෙදයෙන් උපන් ඵලය වූ භස්මය ද,

a අභිසර්වතසොඃ කාර්‍ය්‍යා*ධිගුපර්‍ය්‍යාදිෂු ත්‍රිෂු,
විතීයාම්‍රෙඩිතාන්තෙෂු තතො න්‍යත්‍රාපි දෘශ්‍යතෙ.

සුවර්ණය ගුණාන්තරාධානයෙන් විකෘත වූ බැවින් හෙ ද, තද්ගුණාන්තරාධානයෙන් උපන් ඵලයවූ කුණ්ඩලය ද, විකාර්‍ය්‍ය කර්මයි†. "රූපං පශ්‍යති" යනු ප්‍රාප්‍යකර්මයට උදාහරණයි. මෙහි රූපයාගේ විශෙෂ සිද්ධියක් නො හැඟෙන බැවින් නිර්වර්ත්‍ය හෝ විකාර්‍ය්‍ය නොවේ එහෙත් කර්තෘහුගේ දර්ශනක්‍රියාවෙන් පැමිණිය යුතු ඵලය බැවින් ප්‍රාප්‍යකර්මයි. "ග්‍රාමං ගච්ඡංස් තෘණං ස්පෘශති" යනු ඖදාසීන්‍යකර්මයට උදාහරණයි. මෙහි ග්‍රාමගමන මුත් තෘණ ස්පර්ශය කර්තෘහුගේ උද්දෙශ්‍යභාවයෙන් තොරව ක්‍රියාජන්‍ය සංයොග රූප ඵලත්වයෙන් සිඬ බැවින් "තෘණම්" යනු ඖදාසීන්‍ය කර්මයි. "අන්නං බුභුක්ෂුර්විෂං භුඞ්ක්තෙ" යනු අනීප්සිත (ද්වෙෂ්‍ය) කර්මයට උදාහරණයි. මෙහි අන්නභක්ෂණයෙහි කැමැත්ත ඇත්තහුගේ ක්‍රියාජන්‍යඵලය ද්වෙෂානුගත විෂානුභවය වූ බැවින් "විෂම්" යනු අනීප්සිත (ද්වෙෂ්‍ය) කර්මයි. "ගාං පයො දොග්ධි" යනු සංඥාන්තරානාඛ්‍යාත කර්මයට උදාහරණයි. මෙහි ඉෂ්ටත්වයෙන් වූ දොහන ක්‍රියාජන්‍ය ඵලය පයස බැවින් එය කර්මසංඥාසූත්‍රාඛ්‍යාතයි, "ගාම්" යන්න ක්‍රියාජන්‍යඵලය නොව තත්ඵලයට නිමිත්තත්වයෙන් එලඹ සිටි බැවින් කාරක සංඥා සූත්‍රොක්ත ලක්ෂණ භාවයෙන් තත්සංඥාන්තර්ගත කොට අනාඛ්‍යාත වේ. "හරිර්ජලධිමධිශෙතෙ" යනු අන්‍යපූර්වක කර්මයට උදාහරණයි. මෙහි ජලධිය පූර්වයෙහි ශයන ක්‍රියාවට ආධාරත්වයෙන් යුක්ත බැවින් ආධාරසංඥාව ද ලබා පසුව "අධි" යොගයෙන් කර්මත්වයට පැමිණි බැවින් අන්‍යපූර්වක කර්මයි. මෙහි කී නිර්වර්ත්‍යවිකාර්‍ය්‍ය ලක්ෂණවයට ඇතුළත් නොවන සියල්ලම ප්‍රාප්‍යකර්මය යනු මුග්ධබොධපිතාමතයි. මෙසේ කාරකත්වයෙන් විතීයාතිර්දෙශය කොට නැවත උපපදයොගයෙන් ෂෂ්ඨ්‍යර්ථාදියෙහි විතීයාව දක්වනු පිණිස වෘත්තිකාරයෝ "අභිසර්වතසොඃ" යනාදිය කීහු.

a අභිසර්වතසොඃ, "අභිතඃ සර්වතඃ" යන නිපාතදෙදෙනාගේ යොගයෙහි ද, ධික්, "ධික්" නිපාතයොගයෙහි ද; ආම්‍රෙඩිතාන්තෙෂු, ආම්‍රෙඩිතය අන්තකොට ඇත්තාවූ; නොහොත් සමීපාර්ථයෙහි කරණ ලද විත්වය ඇති; උපර්‍ය්‍යාදිෂු ත්‍රිෂු, උපරි ආදි තුන

* "ධික්" යනු ලුප්තවිභක්තික ස්‍යනාම්‍යන්ත පදයි. "ධිගුපර්‍ය්‍යාදිෂු" සමහර.
† මේ පූර්වාචාර්‍ය්‍යමතයි, නුමුත් "කාෂ්ඨ" යනු හා "සුවර්ණ" යනු විකාර්‍ය්‍ය කර්ම බව ද, "භස්ම" යනු හා "කුණ්ඩල" යනු විකෘත කර්ම බව ද හැඟෙයි.

a අභිතො ග්‍රාමං නදී වහති, සර්වතො ග්‍රාමං වනානි සන්ති, ධිග් දෙවදත්තම්.

b "උපර්‍ය්‍යධ්‍යධසඃ සාමීප්‍යෙ"

c එෂාං මෙ දෙශතඃ කාලතශ්ච සාමීප්‍යෙ.

d "තස්‍ය පරමාම්‍රෙඩිතම්."

ඇති කල්හි ද, හෙවත් "උපර්‍ය්‍යුපරි, අධ්‍යධි, අධොධඃ" යන මොවුන්ගේ යොගයෙහි ද; ද්විතීයා, ද්විතීයා විභක්තිය; ස්‍යාත්, සටයුතුයි. තතඃ අන්‍යත්‍ර අපි, එයින් අන්තන්හි ද; දෘශ්‍යතෙ, දක්නා ලැබේ. (වක්ෂ්‍යමාණවූ "අභිතොග්‍රාමම්" යනාදිය පිළිවෙළින් මීට උදාහරණයි)

a ග්‍රාමං අභිතඃ, ගමට සමීපයෙහි; නදී, ගඞ්ගානොමෝ; වහති, ගලා බසී. ග්‍රාමං සර්වතඃ, ග්‍රාමය සම්බන්ධි සියලු දිශාවන්හි, වනානි සන්ති, ආරණ්‍යයෝ වෙත් (මේ දෙතන්හි "ග්‍රාමම්" යනු "අභිතඃ සර්වතඃ" යන නිපාතයොගයෙහි ෂෂ්ඨ්‍යර්ථයෙහි ද්විතීයායි.) දෙවදත්තම්, දෙවදත්තයාට; ධික්, නින්ද වේවා. මෙහි "දෙවදත්තම්" යනු "ධික්" නිපාතයොගයෙහි ෂෂ්ඨ්‍යර්ථයෙහි ද්විතීයායි.) නැවත මෙහි "උපරි" ආදීන් සමීපාර්ථයෙහි ද්විර්වචන වන බැව් දක්වනු පිණිස "උපර්‍ය්‍යධ්‍යධසඃ සාමීප්‍යෙ" යන පාණිනීය සූත්‍රය ගෙණ හැර දක්වන ලදී.)

b උපර්‍ය්‍යධ්‍යධසඃ, "උපරි අධි අධස්" යන තුණ; සාමීප්‍යෙ, (මෙහි) සමීපභාවයෙහි ද්විර්වචන වෙත්.

c එෂාං, මේ "උපරි" ආදීන්නේ; දෙශතඃ, දෙශ වශයෙන් ද; කාලතඃ ච, කාල වශයෙන් ද; සාමීප්‍යෙ, සමීපභාවයෙහි; වෙසතඃ, ද්විරූප වෙත්, හෙවත් ද්විත්වය වේ. (සමීපභාවයෙහි ම ද්විත්වවූ මේ 'උපරි" ආදි තුන්දෙනාගේ යොගයෙහි ද්විතීයාව වේ. වීප්සාවෙහි ද්විත්ව වූ තන්හි ෂෂ්ඨීවිභක්තිය වේ* යනු මෙහි භාවයයි. ශ්ලොක යෙහි "ආම්‍රෙඩිතාන්තෙනාෂු" යන තන්හි කියන ලද "ආම්‍රෙඩිත" යනු මේ යයි දක්වනු පිණිස "තස්‍ය පරමාම්‍රෙඩිතම්" යන පාණිනීය සූත්‍රය හා තද්වෘත්තිය ද ගෙණ හැර දක්වන ලදි.)

d තස්‍ය, ඒ ද්විරූපයාගේ; පරම්, පරවූ රූපය; ආම්‍රෙඩිතම්, ආම්‍රෙඩිත නම් වේ.

---

* "උපර්‍ය්‍යුපරි බුද්ධීනාං චරන්ති" යනාදිය ඊට උදාහරණයි.

a. ද්විරුක්තස්‍ය පරං රූපමාම්‍රෙඩිතසංඥං ස්‍යාත්, උපර්‍ය්‍යුපරි පුරොහිතං යාචකාඃ පතන්ති, අධ්‍යධි ග්‍රාමං මෘගාශ්චරන්ති, අධොධො නගරං නිධානානි සන්ති.

b "පරිතඃ සමයා නිකෂා හා ප්‍රති යොගෙපි" පරිතඃ කෘෂ්ණං ගොපාඃ, "නිකෂා සමයා සාමීප්‍යෙ" සමයා ග්‍රාමං උපවනානි වර්තන්තෙ, නිකෂා ග්‍රාමං නිහතඃ ශත්‍රුඃ, හා කෘෂ්ණාභක්තම්. තස්‍ය ශොච්‍යතා ඉත්‍යර්ථඃ. බුභුක්ෂිතං න ප්‍රතිභාති කිඤ්චිත්.

---

a ද්විරුක්තස්‍ය, දෙවරක් කියන ලද්දහුගේ; පරං රූපම්, පරවූ රූපය; ආම්‍රෙඩිතසංඥං ස්‍යාත්, ආම්‍රෙඩිත නම් වන්නේය; පුරොහිතං උපර්‍ය්‍යුපරි, පුරොහිතයාගේ මතු සමීපයෙහි; යාචකාඃ, යාචකයෝ; පතන්ති, වැටෙත්. (මෙහි "උපර්‍ය්‍යුපරි" යන ද්විරුක්ත නිපාතයොගයෙහි "පුරොහිතම්" යනු ෂෂ්ඨ්‍යර්ථයෙහි ද්විතීයායි) ග්‍රාමං අධ්‍යධි, ගම සමීපයෙහි ඔබමොබ; මෘගාඃ, මෘගයෝ; චරන්ති, හැසිරෙත්. (මෙහි "අධ්‍යධි' යන ද්විරුක්ත නිපාතයොගයෙහි "ග්‍රාමම්" යනු ෂෂ්ඨ්‍යර්ථයෙහි ද්විතීයායි.) නගරං අධොධඃ, නුවරයට සමීපයෙහි; නිධානානි, නිධානයෝ; සන්ති, ඇත්තාහ. (මෙහි "අධොධඃ" යන ද්විරුක්ත නිපාතයොගයෙහි 'නගරම්" යනු ෂෂ්ඨ්‍යර්ථයෙහි ද්විතීයායි.) (ශ්ලොකයෙහි "තතොන්‍යත්‍රාපි දෘශ්‍යතෙ' යනු කී බැවින් "ධික්" යොගාදියෙන් අන්තන්හිද ද්විතීයාව වන බැව් දක්වන පිණිස "පරිතඃ සමයා" යනාදිය කීහු.)

b පරිතඃ සමයා නිකෂා හා ප්‍රතියොගෙ අපි, "පරිතඃ සමයා නිකෂා හා ප්‍රති" යන මේ අව්‍යය ශබ්දයන්ගේ යොගයෙහි ද ද්විතීයාව වේ. කෘෂ්ණං පරිතඃ, විෂ්ණුහු හාත්පස්හි; ගොපාඃ, ගොපල්ලෝ වෙත්. (මෙහි "කෘෂ්ණම්" යනු "පරිතස්' යන නිපාතයොගයෙහි ෂෂ්ඨ්‍යර්ථයෙහි ද්විතීයායි.) නිකාෂාසමයා, "නිකෂා සමයා" යන නිපාතද්වය; සාමීප්‍යෙ සමීපභාවයෙහි වේ. ග්‍රාමං සමයා, ගම සමීපයෙහි; උපවනානි, උයන්, වර්තන්තෙ, පවතිත්. ග්‍රාමං නිකෂා, ගම සමීපයෙහි; ශත්‍රුඃ, සතුරුතෙම; නිහතඃ, නසනලදී. (මේ දෙතන්හි "සමයා නිකෂා" යන නිපාතයොගයෙහි "ග්‍රාමම්" යනු ෂෂ්ඨ්‍යර්ථයෙහි ද්විතීයායි.) කෘෂ්ණාභක්තං, විෂ්ණුභක්ති නැත්තහුට; හා, ශොකයෙකි. තස්‍ය, ඔහට; ශොච්‍යතෙ ඉති,

a "ලක්ෂණෙත්ථම්භූතාඛ්‍යානභාගවීප්සාසු ප්‍රතිපර්‍ය්‍යනවඃ"

b එෂ්වර්ථෙෂු විෂයභූතෙෂු ප්‍රත්‍යාදයඃ කර්මප්‍රවචනීයසංඥාඃ ස්‍යුඃ.

c "කර්මප්‍රවචනීයයුක්තෙ ද්විතීයා"

d එතෙන යොගෙ ද්විතීයා ස්‍යාත්. ලක්ෂණෙ-වෘක්ෂං ප්‍රති පරි අනුවා විද්‍යොතතෙ විද්‍යුත්. ඉත්ථම්භූතාඛ්‍යානෙ-භක්තො විෂ්ණුං ප්‍රති පරි අනු වා, භාගෙ-ලක්ෂ්මීර්හරිං ප්‍රති පරි අනු වා, හරෙර්භාග ඉත්‍යර්ථඃ, වීප්සායාම්-වෘක්ෂං ප්‍රති පරි අනු වා සඤ්චරති,

---

ශොක කරණු ලැබේ යන; අර්ථඃ, අර්ථයි; (මෙහි "හා" යන නිපාත, යොගයෙහි "කෘෂ්ණාභක්තම්" යනු ෂෂ්ඨ්‍යර්ථයෙහි ද්විතීයායි.) බුභුක්ෂිතං, අනුභව කරණු කැමැත්තහුට; කිඤ්චිත්, කිසිවක්; නප්‍රතිභාති, නොවැටහේ. (මෙහි "බුභුක්ෂිතම්" යනු "ප්‍රති" යොගයෙහි ෂෂ්ඨ්‍යර්ථයෙහි ද්විතීයායි.

a ලක්ෂණෙත්ථම්භූතාඛ්‍යානවීප්සාසු,- ලක්ෂණ, ලක්ෂණාර්ථය; ඉත්ථම්භූතාඛ්‍යාන, ඉත්ථම්භූතාඛ්‍යානාර්ථය (කිමිත්ප්‍රකාරයකට පැමිණියේ යයි පැවසීමය); භාග; භාගාර්ථය (කොටස); වීප්සාසු වීප්සාර්ථය (භින්නවූ වස්තූන් සම්බන්ධ කොට කියනු කැමැත්තය) යන මෙහි; ප්‍රතිපර්‍ය්‍යනවඃ, "ප්‍රති පරි අනු" යන මොහු කර්මප්‍රවචනීය සංඥ වෙත්.

b එෂු අර්ථෙෂු, මේ ලක්ෂණාදි අර්ථයන්; විෂයභූතෙෂු, විෂයවූ කල්හි; ප්‍රත්‍යාදයඃ, ප්‍රති ආදීහු; කර්මප්‍රවචනීයසංඥාඃ ස්‍යුඃ, කර්මප්‍රවචනීය සංඥා ඇත්තෝ වන්නාහ.

c කර්මප්‍රවචනීයයුක්තෙ, කර්මප්‍රවචනීය සංඥයක් හා යුක්ත තන්හි; ද්විතීයා, ද්විතීයා විභක්තිය වේ.

d එතෙන යොගෙ, මේ කර්මප්‍රවචනීයසංඥය සමග යොගයෙහි; ද්විතීයා ස්‍යාත්, ද්විතීයා විභක්තිය වන්නීය. ලක්ෂණෙ, ලක්ෂණාර්ථයෙහි (උදාහරණ කියනු ලැබේ.) විද්‍යුත්, විදුලිය; වෘක්ෂං ප්‍රති, වෘක්ෂය ලකුණු කොට; විද්‍යොතතෙ, බබලා. පරි අනු වා, "වෘක්ෂං පරි, වෘක්ෂං අනු" කියා ද වේ. (වෘක්ෂය ලකුණු කොට යන අර්ථ මැයි.) ඉත්ථම්භූතාඛ්‍යානෙ, ඉත්ථම්භූතාඛ්‍යානාර්ථයෙහි (උදාහරණ කියනු ලැබේ.) විෂ්ණුං, විෂ්ණුහු කෙරෙහි;

භක්තඃ, භක්ති ඇත්තේය; හෙවත් භක්ත්‍යාකාරයට පැමිණියේය. පරි අනු වා, "විෂ්ණුං පරි, විෂ්ණුං අනු" කියා හෝ වේ. (එම අර්ථයි.) භාගෙ, භාගාර්ථයෙහි (උදාහරණ කියනු ලැබේ.) ලක්ෂ්මීඃ, ශ්‍රීදේවීතොමෝ; හරිං ප්‍රති, විෂ්ණුහුගේ කොටසක් වේ. පරි අනුවා, "හරිං පරි, හරිම් අනු" කියා හෝ වේ. (එම අර්ථයි.) හරෙඃ, විෂ්ණුහුගේ; භාගඃ ඉති, භාගය යන; අර්ථඃ, අර්ථයි. වීප්සායාම්, වීප්සාර්ථයෙහි) උදාහරණ කියනු ලැබේ.) වෘක්ෂං වෘක්ෂං ප්‍රති, වෘක්ෂයක් පාසා; සඤ්චරති, හැසිරේ. පරි අනුවා, "වෘක්ෂං වෘක්ෂං පරි, වෘක්ෂං වෘක්ෂම් අනු" කියා හෝ වේ. (එම අර්ථයි.)

මෙහි "ලක්ෂණ" යනාදි පාණිනීයොක්ති ගෙණ හැර දක්වා ලක්ෂණාදි අර්ථයන්හි පවත්නා ප්‍රති ආදීන්ට කර්මප්‍රවචනීය සංඥ කොට නැවත ඒ කර්මප්‍රවචනීය සංඥව ලැබූ ඔවුන්ගේ යොගයෙහි ද්විතීයාවිභක්තිය වේ යයි කීහු. "කර්මප්‍රවචනීය" සංඥහුගේ අන්වර්ථතාව නිර්වචනයින් දක්වන්නාවූ වෛයාකරණයෝ "කර්ම ක්‍රියාං ප්‍රොක්තවන්තඉති=කර්මප්‍රවචනීයාඃ" යනු කීහු. කර්මසඞ්ඛ්‍යාතවූ ක්‍රියාව ප්‍රකාශකළාහු කර්මප්‍රවචනීය නම් වෙත් යනු එහි අර්ථයි. ඔහු නම් යථොක්ත ප්‍රත්‍යාදීහුයි. මෙය "කර්මන්" ශබ්දොපපද "ප්‍ර" පූර්ව "වච්" ධාතුවෙන් භූතාර්ථකර්තෘකාරක "අනීයර්" ප්‍රත්‍යයව නිපන්නේ වේ. එබැවින් මේ කර්මප්‍රවචනීය සංඥකවූ ප්‍රත්‍යාදීහු සම්ප්‍රතික්‍රියාවක් නො කියත් තත්ක්‍රියාද්‍යොතක ද නොවෙත්, එහෙත් ඔහු ක්‍රියානිරූපිතසම්බන්ධ විශෙෂද්‍යොතකවූවෝ වෙත්. භර්තෘහරින් විසින් ද:-

"ක්‍රියායා ද්‍යොතකො නායං සම්බන්ධස්‍ය න වාචකඃ,
නාපි ක්‍රියාපදාක්ෂෙපී සම්බන්ධස්‍ය තු භෙදකඃ"යි

කියනලදී. මේ කර්මප්‍රවචනීයසංඥය තෙමේ "අනුභූයතෙ" යනාදියෙහි උපසර්ගයන් මෙන් ධාත්වර්ථය ප්‍රකාශ නොකරන්නේ වේ. ෂෂ්ඨීවිභක්තිය මෙන් සම්බන්ධය කියන්නේ ද නො වේ. "ප්‍රදෙශං විපරිලිඛති" යනාදියෙහි "වි" ආදීන් මෙන් ක්‍රියාන්තරයක් ආකර්ෂණය කරන්නේ ද නො වේ. වැලි කුමක් කෙරේ ද? යත්, ලක්ෂ්‍යලක්ෂණභාවාදි සම්බන්ධයට විශෙෂක වන්නේ වේ. හෙවත් සම්බන්ධ විශෙෂය ප්‍රකාශ කෙරේ. එනම් මෙහිද උදාහෘත "වෘක්ෂං ප්‍රති පරි අනු වා විද්‍යොතතෙ විද්‍යුත්" යන තන්හි වෘක්ෂය තෙමේ ලක්ෂණ ද, විද්‍යුත්තොමෝ ලක්ෂ්‍යද වේ. මේ දෙදෙනාගේ තල්ලක්ෂ්‍ය ලක්ෂණ භාවසම්බන්ධ විශෙෂය ප්‍රත්‍යාදීහු

a "කාලාධ්වනොර්නෛරන්තර්‍යෙ"

b අවිච්ඡින්නසංයොගත්වං නෛරන්තර්‍යම්. කාලාධ්වවාචක ශබ්දානාං නෛරන්තර්‍යෙ‍ර්ථෙ වාච්‍යෙ සති ද්විතීයා විභක්තිර්භවති, මාසමධීතෙ දෙවදත්තඃ. ක්‍රොශං පඨිතඃ, නෛරන්තර්‍යෙ ඉති කිම්? මාසස්‍ය ද්විරධීතෙ, ක්‍රොශස්‍යෛකදෙශෙ පඨිතඃ.

ප්‍රකාශ කෙරෙත්. "භක්තො විෂ්ණුං ප්‍රති පරි අනු වා" යන තන්හි විෂ්ණු තෙමේ විෂය ද භක්ත තෙමේ විෂයී ද වේ. එබැවින් මේ දෙදෙනාගේ විෂය විෂයිභාව සම්බන්ධ විශෙෂය ප්‍රත්‍යාදීහු ප්‍රකාශ කෙරෙත්. අන්තැන්හි ද මෙසේයි.

මෙහි ලක්ෂණාදි අර්ථචතුෂ්කයෙහි පවත්නා ප්‍රත්‍යාදියට කර්මප්‍රවචනීය සංඥා කොට තද්යොගයෙහි ද්විතීයාවට උදාහරණ ගෙණ හැර දක්වන ලද්දාහ. මුග්ධබොධයෙහි "අනුර්ලක්ෂණෙ" යනාදි පාණිනීය සූත්‍ර අසුරු කොට මෙකී ද්විතීයාවිධානයට විෂයවූ තැන් දක්වන්නාහු:-

"වීප්සෙත්ථම්භාවචිහ්නෙෂ්වභිර්භාගෙ පරිප්‍රතී,
අනුරෙෂු සහාර්ථෙ ච හීනෙනූපෙ මතාවිහ"

යනු කීහු. ද්විතීයා විධානයෙහි ලා වීප්සාර්ථ ඉත්ථම්භාවාර්ථ චිහ්නාර්ථයන්හි "අභි" යන්න ද, ඒ වීප්සාදි අර්ථයෙහි හා භාගාර්ථයෙහි "පරි ප්‍රති" යන දෙක ද, ඒ "වීප්සාඉත්ථම්භාවචිහ්නභාග" යන අර්ථ චතුෂ්කයෙහි හා සහාර්ථහීනාර්ථයෙහි "අනු" යන්න ද, හීනාර්ථයෙහි "උප" යන්න ද දන්නා ලද්දාහ යනු එහි අර්ථයි. මෙකී අර්ථයන්හි පවත්නා "අභි" ආදීන්ට කර්මප්‍රවචනීය සංඥාව ද ඔවුන්ගේ යොගයෙහි ද්විතීයාව ද වේ. මෙහි වීප්සාර්ථාදියෙහි උදාහරණ කියන ලද්දාහ. "විෂ්ණුමන්වර්ච්‍යතෙ භර්ගඃ" යනු සහාර්ථ "අනු" යොගයෙහි උදාහරණයි. භර්ගඃ, ඊශ්වරතෙම; විෂ්ණුම් අනු, විෂ්ණුහු සමග; අර්ච්‍යතෙ පුදනු ලැබේ." යනු එහි අර්ථයි. "ශක්‍රාදය උපාච්‍යුතම්" යනු හීනාර්ථ "උප" යොගයෙහි උදාහරණයි. "ශක්‍රාදයඃ, ශක්‍රාදි දෙවියෝ; අච්‍යුතම් අනු, විෂ්ණුට හීන වෙත් යනු එහි අර්ථයි. "අනු" යොගයෙහි ද මෙසේයි.

a කාලාධ්වනොඃ, කාලවාචක මාර්ගවාචක ශබ්ද දෙදෙනාගේ; නෛරන්තර්‍යෙ, නිරන්තරභාවය වාච්‍යකල්හි ද්විතීයාවිභක්තිය වේ.

b අවිච්ඡින්නසංයොගත්වම්, නුසුන් යෙදීම ඇති බව; නෛරන්තර්‍යම්, නෛරන්තර්‍ය (නිරන්තරභාව) නම් වේ. කාලාධ්වවාචක

a "කර්තෘසාධනයොස්තෘතීයා"

ශබ්දානාම්, කාලවාචක මාර්ගවාචක ශබ්දයන්ගේ; නෛරන්තර්‍යෙ අර්ථෙ, නිරන්තරභාවාර්ථය; වාච්‍යෙ සති, කියයුතු කල්හි; ද්විතීයා විභක්තිඃ භවති, ද්විතීයාවිභක්තිය වේ. දෙවදත්තඃ, දෙවදත්ත තෙමේ; මාසම්, මසක්මුළුල්ලෙහි; අධීතෙ, හදාරයි. ක්‍රොශම්, හඬසතක් පැතිර; පඨිතඃ, පඨිතයයි. නෛරන්තර්‍යෙ, නිරන්තරභාවාර්ථයෙහි යනු; කිම්, කිම?; මාසස්‍ය, මසකට; ද්විඃ, දෙවරක්; අධීතෙ, හදාරයි (යන තන්හි ද); ක්‍රොශස්‍ය, හඬසතක් සම්බන්ධිවූ; එකදෙශෙ, එක් පෙදෙසෙක්හි; පඨිතඃ පඨිතයයි; (යනතන්හි ද අවිච්ඡින්නසංයොග රහිත බැවින් ද්විතීයාව නොවන හෙයිනි).

මෙහි කියන ලද්දේ දිවස මාසාදි කාලවාචක ශබ්දයක් හෝ අධ්වක්‍රොශාදි මාර්ග වාචක ශබ්දයක් (ක්‍රියාගුණද්‍රව්‍යවලින්) අනන්තරව (අනතුරුව) යෙදුනොත් ඒ කාලමාර්ගවාචකශබ්දයන් කෙරෙන් ද්විතීයාවිභක්තිය වනබවයි. මෙහි "මාසමධීතෙ දෙවදත්තඃ" යන තන්හි "මාස" යන කාලවාචකශබ්දය "අධීතෙ" යන අධ්‍යයන ක්‍රියාවෙන් අනන්තරව යෙදුනු බැවින් "මාසම්" යි ද්විතීයා විය. "ක්‍රොශං පඨිතඃ" යන තන්හි මාර්ගවාචකවූ "ක්‍රොශ" ශබ්දය "පඨිත" යන ද්‍රව්‍යයෙන් අනන්තරව යෙදුනු බැවින් "ක්‍රොශම්" යි ද්විතීයා විය. "මාසස්‍ය ද්විරධීතෙ" යන තන්හි මසකට දෙවරක් මුත් මුළුල්ල අධ්‍යයන ක්‍රියාවෙන් අනන්තරව නොයෙදුන බැවින් ද්විතීයා නොව "මාසස්‍ය"යි ෂෂ්ඨී විය. "ක්‍රොශස්‍යෛකදෙශෙ පඨිතඃ" යන තන්හි පඨිතයෙන් ක්‍රොශයාගේ එක් දෙසක් මුත් මුළුල්ල නිරන්තරව නොයෙදුන බැවින් ද්විතීයා නොව "ක්‍රොශස්‍ය" යි ෂෂ්ඨීවිය.

වාර්තිකයෝ "ශෙෂාඃ කාර්යෙ" යනාදි සූත්‍රයෙහි "කාර්යෙ" යන්න මුල්කොට ද්විතීයාවිභක්තියට යොග්‍යස්ථානයන්ගෙන් බොහෝ තැන් දක්වා ඉක්බිති එහි "කර්තෘසාධනයොඃ" යන්න මුල් කොට තෘතීයාවිභක්තියට යොග්‍යස්ථාන දක්වන්නාහු "කර්තෘසාධනයොඃ" යනාදිය කීහු.

a කර්තෘසාධනයොඃ, කර්තෘසාධනදෙක්හි; තෘතීයා, තෘතීයා විභක්තිය වේ.

a කර්තරි ප්‍රධානෙ ක්‍රියාශ්‍රයෙ, සාධනෙ ච ක්‍රියාසිද්ධ්‍යුප කාරකෙ කරණෙර්ථෙ තෘතීයා විභක්තිර්භවති.

b ක්‍රියායාඃ පරිනිෂ්පත්තිර්යද්ව්‍යාපාරාදනන්තරම්,
විවක්ෂ්‍යතෙ යදා යත්‍ර කරණං තත් තදා ස්මෘතම්.

c භින්නඃ ශරෙණ රාමෙණ රාවණො ලොකරාවණඃ,
කරශ්‍රෙණ විදීර්ණොපි වානරෛර්යුධ්‍යතෙ පුනඃ.

---

a ප්‍රධානෙ, ප්‍රධානවූ; ක්‍රියාශ්‍රයෙ, ක්‍රියාවට ආශ්‍රය වූ; හෙවත් ක්‍රියාව කිරීම පිණිස පැවැත්තාවූ; කර්තරි, කර්තෘකාරකයෙහිද; සාධනෙ, "සාධනෙ" යයි යේයි; ක්‍රියාසිද්ධ්‍යුපකාරකෙ, ක්‍රියාසිද්ධියට උපකාරවූ; කරණෙර්ථෙ ච, කරණාර්ථයෙහි ද; තෘතීයාවිභක්තිඃ භවති, තෘතීයාවිභක්තිය වේ.

b යදා, යම්කලෙක්හි; යද්ව්‍යාපාරාත්, යම්ළුත්සාහයෙකින් හෙවත් යම්කාරකයක් සම්බන්ධවූ ක්‍රියායෙන්; අනන්තරම්, අනතුරුව; හෙවත් අන්‍යකාරකව්‍යවධාන රහිතව; යත්‍ර, යම්තැනෙක්හි, ක්‍රියායාඃ, ක්‍රියාහුගේ: පරිනිෂ්පත්තිඃ, සංසිද්ධිය; හෙවත් ආත්මලාභය; විවක්ෂ්‍යතෙ, විවක්ෂාකරණුලැබේ ද; තදා, එකල්හි; තත්, ඒකාරකය; කරණම්, කරණයයි; ස්මෘතම්, දන්නාලදී

c රාමෙණ, රාමයා විසින්; ලොකරාවණඃ, ලොකයා හඬවන්නාවූ; රාවණඃ. රාවණතෙම; ශරෙණ, ඊයෙන්; භින්නඃ, විදාරණය කරණ (පළන) ලදී; වානරෛඃ, වඳුරන්විසින්; කරශ්‍රෙණ, අතගින් හෙවත් නියෙන්; විදීර්ණඃ අපි, විදාරණයකරණලද්දේද; පුනඃ; නැවත; යුධ්‍යතෙ, (ඔවුන් හා) යුධ කෙරේ. (මෙහි "රාමෙණ" යනුද "වානරෛඃ" යනුද ක්‍රියාශ්‍රයත්වයෙන් ප්‍රධානව ක්‍රියාසිද්ධිය කළ බැවින් කර්ත්‍රර්ථයෙහි තෘතීයායි, "ශරෙණ" යනුද "කරශ්‍රෙණ" යනු ද යථොක්ත කර්තෘන් විසින් තමන්ගේ ක්‍රියාසිද්ධ්‍යුපකාරිත්වයෙන් විවක්ෂිත බැවින් කරණසාධනයෙහි තෘතීයායි).

කර්ත්‍රර්ථයෙහි හා සාධනාර්ථයෙහි තෘතීයාවිභක්තිය වේය යයි කියා තත්කර්තෘසාධනවයෙහි විශෙෂ දක්වන්නාහු "ප්‍රධානෙ" යනාදියද "ක්‍රියාසිද්ධ්‍යුපකාරකෙ" යනාදියද කීහු, අන්‍යකාරකයන්ට ප්‍රධානව ක්‍රියාසිද්ධිය කරන්නාවූ කර්ත්‍රර්ථයෙහි ද (ඒ කර්තෘහුගේ)

ක්‍රියා සිද්ධියට උපකාරවූ කරණාර්ථසඞ්ඛ්‍යාත සාධනයෙහිද තෘතීයාව වේ යනු එහි භාවයයි. මෙහි කී ක්‍රියාශ්‍රයත්වය කර්මාදි අන්‍ය කාරකයන්හි ද ඇතිවත්ම (අන්‍යකාරකප්‍රයොජකත්වයෙන්) ප්‍රධානවූ කර්තෘකාරකයෙහි යයි දක්වනු පිණිස "ප්‍රධානෙ" යනු කීහු. එහෙයින් පාණිනීයෙහිද "ස්වතන්ත්‍රඃ කර්තා"යි සූත්‍රය හදාරා ක්‍රියායෙහි ස්වාධීනත්වයෙන් විවක්ෂිතවූ අර්ථය කර්තෘයයි කීහු. එසේම අන්‍යකාරකයන්ගේ ද ක්‍රියාසිද්ධ්‍යුපකාරකත්වය ඇතිවත්ම බොහෝ කාරකයන් මධ්‍යයෙහි යම් වස්තුවක් අව්‍යවධානත්වයෙන් ක්‍රියා නිෂ්පත්තියයි විවක්ෂාකරණලද්දේ නම් එයම මෙහි සාධනයයි දක්වනු පිණිස "ක්‍රියායාඃ" යනාදි ශ්ලොකය කීහු. ඒ සඳහා පාණිනීයෙහි ද "සාධකතමඞ්කරණම්" යි සූත්‍රය හදාරා ක්‍රියාසිද්ධියෙහි ප්‍රකෘෂ්ටොපකාරවූයේ කරණයයි කීහු. යථොක්ත කර්තෘලක්ෂණ දක්වන්නාවූ ඇතැම් වෛයාකරණයෝ:-

"ප්‍රවෘත්තෞ ච නිවෘත්තෞ ච කාරකාණාං ය ඊශ්වරඃ,
ස කර්තා නාම විඥෙයඃ කාරකාණාං ප්‍රයොජකඃ."

යනු කීහු. කාරකයන්ගේ පැවැත්මෙහි හා නැවැත්මෙහි යමෙක් අධිපති වේ නම් කාරකයන් (ක්‍රියාවෙහි) මෙහෙයන්නාවූ හෙතෙම කර්තෘයයි දතයුතු වේ යනු එහි අර්ථයි මෙකී කර්තෘත්වය විභාග කරන්නාවූ බොහෝ වෛයාකරණයෝ "තත්‍ර තාවත් කර්තා ත්‍රිවිධඃ" යනාදීන් කීහු. එනම් එහි කර්තා තෙමේ පළමුකොට ත්‍රිවිධ වේ, එනම්-"ස්වතන්ත්‍රය ප්‍රයොජක" යයි කියායි. ස්වතන්ත්‍ර නම් ස්වාධීනත්වයෙන් ක්‍රියා සිද්ධිය කරන්නාවූ කර්තෘ තෙමේයි, ප්‍රයොජක නම් අන්‍යයෙකු ක්‍රියාවෙහි යොදන්නාවූ කර්තෘ තෙමේයි, එහි ප්‍රයොජක තෙමේ ද "ප්‍රෙෂක අධ්‍යෙෂක ආනුකූල්‍යභාගින්" යයි ත්‍රිවිධ වේ. ප්‍රභුත්වයෙන් අනෙකකු මෙහෙයන්නේ ප්‍රෙෂක නම් වේ. එනම්- "ගුරුඃ ශිෂ්‍යෙණ කාරයති" යන තන්හි ගුරුතෙම ප්‍රභුත්වයෙන් ශිෂ්‍යයා ක්‍රියාවෙහි මෙහෙයන්නේ හුයි ප්‍රෙෂක නම් වේ. අධ්‍යෙෂක නම් හීනත්වයෙන් මෙහෙයන්නේ වේ. එනම් "ශිෂ්‍යො ගුරුං භොජයති" යන තන්හි ශිෂ්‍යතෙමේ හීනත්වයෙන් ගුරුහු මෙහෙයන්නේ හුයි අධ්‍යෙෂක වේ. ප්‍රභුත්ව හීනත්වදෙකින් විරහිතව අනුකූලමාත්‍රභාවයෙන් (සහායභාවයෙන්) මෙහෙයන්නේ ආනුකූල්‍ය භාගින් නම් වේ, එනම් "ආනන්දයති පිතරං සත්පුත්‍රඃ" යන තන්හි සත්පුත්‍ර තෙමේ ප්‍රභුත්වයෙන් හා හීනත්වයෙන් ද විරහිතව පිතෘහු ක්‍රියායෙහි මෙහෙයන්නේ හුයි ආනුකූල්‍යභාගින් වේ. සමහරු

a "ප්‍රකෘත්‍යාදිභ්‍යඃ"

b ප්‍රකෘත්‍යාදිභ්‍යඃ ශබ්දේභ්‍යස්තෘතීයා ස්‍යාත්. ප්‍රකෘත්‍යා චාරුඃ, ප්‍රායෙණ අලසඃ, සුඛෙන යාති, ගොත්‍රෙණ ගාර්ග්‍යඃ, ගාර්ග්‍යස්‍ය ගොත්‍රමිත්‍යර්ථඃ.†

"ස්වතන්ත්‍රස්‍ය ප්‍රයොජකස්‍ය කර්මකර්තෘ" යයි ත්‍රිවිධ කොට කියත්. එහි කර්ම කර්තෘ නම් කර්මත්වයෙන් ද යුත් කර්තෘ තෙමේයි. එනම්- "ගම යති කෘෂ්ණං ගොකුලම්" යන තන්හි කෘෂ්ණ තෙමේ කිසිවෙකුගේ ප්‍රේරණයට යටත්වූ හෙයින් කර්මත්වයෙන් ද ගමනක්‍රියාව කරණ හෙයින් කර්තෘත්වයෙන් ද යුක්තවූයේ නුයි කර්මකර්තෘ වේ. නිරුත්සාහ යෙන් ක්‍රියා සිද්ධිය වන්නාවූ ඇතැම්තන්හි ද මේ කර්මකර්තෘත්වය ලැබේ. එනම්-'ස්වයමෙව භිද්‍යතෙ කාෂ්ඨම්" යන තන්හි ක්‍රියාසිද්ධිය නිරුත්සාහයෙන් බැවින් කර්මවූයේ ද කර්තෘවූයේ ද කාෂ්ඨය වේ. එහි විස්තර ආඛ්‍යාතයෙහි වක්ෂ්‍යමාණ බැවින් මෙහි ප්‍රකාශ නොක රන්නෙමු. යථොක්ත කරණසාධනය ද ආධ්‍යාත්මික බාහ්‍යත්ව යෙන් විවිධවේ, එහි ක්‍රියා සිද්ධිය කරන්නාවූ කර්තෘහු පිළිබඳවූවක් ම තත් ක්‍රියා 'සිද්ධියට උපකාරවූයේ නම් ආධ්‍යාත්මික වේ. පූර්වොක්ත "කරාග්‍රෙණ" යනු ආධ්‍යාත්මික කරණයි. "ශරෙණ" යනු බාහ්‍ය කරණයි, මෙකී සියලු කර්ත්‍රාදීහු ද අභිහිතතන්හි ප්‍රථමා විභක්ති යෙන් ද අනභිහිතතන්හි තෘතීයාවිභක්තියෙන් ද යුක්තවෙත්. අන්‍යවූ කරණාදිය ද එසේයි.

a ප්‍රකෘත්‍යාදිභ්‍යඃ ච, ප්‍රකෘති ශබ්දාදීන් කෙරෙන් ද තෘතීයා විභක්තිය වේ.

b ප්‍රකෘත්‍යාදිභ්‍යඃ ශබ්දේභ්‍යඃ, ප්‍රකෘති ආදි ශබ්දයන්කෙරෙන්; තෘතීයා ස්‍යාත්, තෘතීයා විභක්තිය වන්නේය. ප්‍රකෘත්‍යා, ස්වභාව යෙන්; චාරුඃ, මනොඥයි (විශිෂ්ටරූප ඇත්තේය.) ප්‍රායෙණ, බොහෝ සෙයින්; අලසඃ, අලසයි. සුඛෙන, සැපයෙන් හෙවත් සැපසේ; යාති, යෙයි. ගොත්‍රෙණ, ගොත්‍රයෙන්; ගාර්ග්‍යඃ ඉති, ගාර්ග්‍ය යන; අර්ථඃ, අර්ථයි.

මේ "ප්‍රකෘති" ආදි ශබ්දයන් කෙරෙන් ප්‍රථමාදි අන්‍යවිභක්තීන් ගේද පැමිණීම ඇතිවත්ම ඇතම් තන්හි තදපවාදයෙන් තෘතීයා

† "ගාර්ග්‍යමස්‍ය ගොත්‍රම්" යි එක පොතකවත් නොපෙණෙයි.

a "දානපාත්‍රෙ සම්ප්‍රදානකාරකෙ චතුර්ථී"

b සම්‍යක් ශ්‍රෙයොබුද්ධ්‍යා ප්‍රදීයතෙ යස්මෙ තත්සම්ප්‍රදාන කාරකම්. වෙදවිදෙ ගාං දදාති; අන්‍යත්‍ර රජ්ඤෙ දණ්ඩං දදාති, රජකස්‍ය වස්ත්‍රං දදාති.

විභක්තිය වේයයි මෙහි කියනලදී, එහි "ප්‍රකෘත්‍යා චාරුඃ" යන තන්හි ක්‍රියාහුගේ අශ්‍රවණයෙන් කර්තෘකරණයන්ගේ ලැබීමනැති කල්හි සම්බන්ධාර්ථයාගේ පැමිණීම ඇතිවත්ම 'කෘතඃ' යන ක්‍රියාන්තරයකට කරණත්වයෙන් "ප්‍රකෘත්‍යා"යි තෘතීයා විය. "ප්‍රායෙන අලසඃ" යන තන්හි ප්‍රථමාහුගේ පැමිණීම ඇති වත්ම "ඥාතඃ" යන ක්‍රියාන්තරාපෙක්ෂාවෙන් කරණත්වයට පැමිණ තෘතීයා විය, "සුඛෙන යාති" යන තන්හි ගමන ක්‍රියාවෙන් කර්මත්ව යට පැමිණෙත්ම එහි කරණත්වවිවක්ෂාවෙන් "සුඛෙන" යි තෘතීයා විය. "ගොත්‍රෙණ ගාර්ග්‍යඃ" යන තන්හි "ගොත්‍රම්" යි ප්‍රථමාහුගේ පැමිණීම ඇතිවත්ම "ඥායතෙ" යන ක්‍රියාන්තරාපෙක්ෂාවෙන් කරණත්වය විවක්ෂිතවූයේනුයි "ගොත්‍රෙණ"යි තෘතීයා විය. "සමෙ නෛති, විෂමෙණෛති, ද්විද්‍රොණෙන ධාන්‍යං ක්‍රීණාති" යනාදිය ද මෙසේයි. මෙසේ "ශෙෂාඃ" යනාදි සූත්‍රොක්ත "කර්තෘසාධනයොඃ" යන්න මුල්කොට තෘතීයාවිභක්තියට සුදුසුතැන් බොහොමයක් දක්වා ඉක්බිති "දානපාත්‍රෙ" යන්න මුල්කොට චතුර්ථී විභක්තියට යොග්‍යස්ථාන දක්වන්නාහු "දානපාත්‍රෙ" යනාදිය කීහු.

a දානපාත්‍රෙ; "දානපාත්‍රෙ" යයි සේයි (දානයට යොග්‍යවූ); සම්ප්‍රදානකාරකෙ, සම්ප්‍රදානකාරකයෙහි; චතුර්ථී, චතුර්ථී විභක්තිය වේ.

b සම්‍යක්, මනාකොට; ශ්‍රෙයොබුද්ධ්‍යා, කල්‍යාණාධ්‍යාසයෙන්; යස්මෙ, යමෙකුට; ප්‍රදීයතෙ, දෙනුලැබේ ද; තත්, ඒ; සම්ප්‍රදාන කාරකම්, සම්ප්‍රදානකාරක නම් වේ. වෙදවිදෙ, වෙදය දන්නහුට; ගාම්, ගොධනය; දදාති, දෙයි (යන තන්හි "වෙදවිදෙ" යනු සම්ප්‍රදානකාරකයෙහි චතුර්ථීයි). අන්‍යත්‍ර, අන්තන්හි හෙවත් සම්ප්‍රදානරහිත තන්හි, රාඥඃ, රජහට; දණ්ඩං දදාති, දඩ දෙයි (කියාද). රජකස්‍ය, රජකයාට; වස්ත්‍රං, වස්ත්‍රය; දදාති, දෙයි (කියාද වේ). මෙහි ශ්‍රෙයොබුද්ධ්‍යභාවයෙන් සම්ප්‍රදානනුවූයේ නුයි "රාඥඃ, රජකස්‍ය" යි ෂෂ්ඨී විය).

a දදාති දණ්ඩං පුරුෂො මහීපතෙ
නෛවාපි භක්ත්‍යා නච දානකාම්‍යයා,*
යද්දීයතෙ වාසනයා සුපාත්‍රෙ
තත්සම්ප්‍රදානං කථිතං කවීන්ද්‍රෛඃ.

b (අනභිහිතෙ ඉත්‍යෙව, දානීයො විප්‍රඃ) ක්වචිත්සම්‍යක් ශ්‍රෙයොබුද්ධ්‍යභාවෙපි චතුර්ථි, "ව්‍යාජෙන රඝවෙ කාරං" ඉති මහාකවිප්‍රයොගදර්ශනාත්. තච්ච සම්ප්‍රදානං ත්‍රිවිධම්-ප්‍රෙරකම නිරාකර්ත්‍රනුමන්තෘ චෙති.

---

a පුරුෂඃ, (රජ) පුරුෂතෙම; මහීපතෙඃ, රජහට; දණ්ඩං දදාති, දඬ දෙයි; භක්ත්‍යා අපි නව, (ඒ) භක්තියෙන්ද නොවේ; නච දානකාම්‍යයා, දෙනුකැමැත්තෙන් ද නොවේ. (එහෙයින් "මහීපතයෙ"යි සම්ප්‍රදානය නොව "මහීපතෙඃ" යි ෂෂ්ඨී විය). වාසනයා, ලාභාශාවෙන්; යත්, යමක්; සුපාත්‍රෙ, යම්ගුණභාජනවූ වෙකුට; දීයතෙ, දෙනු ලැබේ ද; කවීන්ද්‍රෛඃ, පණ්ඩිතොත්තමයන් විසින්, තත්, ඒ ගුණ භජනය, සම්ප්‍රදානං, සම්ප්‍රදානයයි; කථිතම්, කියනලදී.

මෙහි "දානපාත්‍රෙ" යනාදියෙහි සී සම්ප්‍රදානලක්‍ෂණ නිර්වචනනයින් දක්වන්නාහු "සම්‍යක්ශ්‍රෙයොබුද්ධ්‍යා" යනාදිය කීහු. මෙහි "දාන" නම් පූජාබුද්ධියෙන් හෝ අනුග්‍රහබුද්ධියෙන් යම් වස්තුවක් පිළිබඳ ස්වාධීනත්වය හැර පරාධීනත්වයෙන් අපුනර්ග්‍රහණය පිණිස දීමයි. කර්තෘහුගේ තද්දානක්‍රියාවට (ඒ දානය පිළිගැණීමට) යොග්‍යවූ කාරකය සම්ප්‍රදාන නම් වේ, "රඥෙ දණ්ඩං දදාති" යන තන්හි දණ්ඩදානය අපුනර්ග්‍රහණය පිණිස වුවත් ශ්‍රෙයොබුද්ධිරහිත බැවින් (පූජානුග්‍රහබුද්ධිරහිත බැවින්) තත්ප්‍රතිග්‍රාහක රජහුගේ සම්ප්‍රදානත්වය නොව 'රාඥඃ'යි ෂෂ්ඨී විය. "රජකස්‍ය වස්ත්‍රං දදාති" යන තන්හි වස්ත්‍රදානය කිසිවින්මාත්‍ර අනුග්‍රහබුද්ධියකින් වුවත් පුනර්ග්‍රහණය පිණිසවූ බැවින් තත්ප්‍රතිග්‍රාහක රජකයාගේ සම්ප්‍රදානත්වය නොව "රජකස්‍ය" යි ෂෂ්ඨී විය.

b අනභිහිතෙ ඉති එව, (ප්‍රත්‍යයාදියකින්) අනුක්ත කල්හිම යයි කියයුතු වේ. (උක්තකල්හි)-දානීයඃ, දානාහීවූයේ; විප්‍රඃ, බ්‍රාහමණතෙමේයි. (මෙහි "දානීයඃ" යන තන්හි සම්ප්‍රදාන කාරක "අනීය" ප්‍රත්‍යයෙන් "විප්‍රඃ" යනු උක්තසම්ප්‍රදානාර්ථයෙහි ප්‍රථමායි). ක්වචිත්, කිසිතන්හි; සම්‍යක්, මොනවට; ශ්‍රෙයොබුද්ධිඅභාවෙ

* "කාචාත්‍ර භක්තිර්නච දානකාම්‍යතා" සමහර.

a "ත්‍යාගෙන කර්මණා ව්‍යාප්තං ප්‍රෙරකං වා‍නුමන්තෘ ච, අනිරාකර්තෘ චෙත්‍යෙතත් සම්ප්‍රදානං ත්‍රිධා ස්මෘතම්.

b දෙහීති ප්‍රෙරයති තත්ප්‍රෙරකම්, යථා-බටවෙ භික්‍ෂාං දදාති; යත්තු ඉදමහං දදාමීත්‍යුක්තෙ'නුමන්‍යතෙ ඔමිත්‍යාහ තදනුමන්තෘ, යථා-ශිෂ්‍යඃ ගුරවෙ ගාං දදාති, යත්තු නානුමන්‍යතෙ න නිරාකරොති තදනිරාකර්තෘ, යථා-සූර්‍ය්‍යායාර්ඝ්‍යං දදාති.

අපි, කල්‍යාණාධ්‍යාසයක් නැති කල්හි ද; චතුර්ථී, චතුර්ථී විභක්තිය වේ. (එනම්)-ව්‍යාජෙන රඝවෙ කාරම් ඉති, "ව්‍යාජෙන රඝවෙ කාරම්" යන; මහාකවිප්‍රයොගදර්ශනාත්, මහාකවීන්ගේ ප්‍රයොග දක්නා හෙයිනි; (ව්‍යාජෙන, අපරාන්තමහීපාලව්‍යාජයෙන්; රඝවෙ, රඝුහට; කාරම්, බිලි දුන්නේය; යනු එහි අර්ථයි. මෙහි දාන ක්‍රියාව ශ්‍රෙයොබුද්ධි රහිතව ව්‍යාජසහගතවූ බැවින් සම්ප්‍රදානාර්හ නුවූවත් "රඝවෙ"යි චතුර්ථී විභක්තියෙන් යෙදීම මහාකවීන්ට අභිමත විය) තච්ච සම්ප්‍රදානම්, ඒ සම්ප්‍රදානයද; ත්‍රිවිධම්, තුන් වැදෑරුම් වේ. එනම්-ප්‍රෙරකම්, ප්‍රෙරක සම්ප්‍රදානය; අනිරාකර්තෘ, අනිරාකර්තෘ සම්ප්‍රදානය, අනුමන්තෘ ච ඉති, අනුමන්තෘ සම්ප්‍රදානය දැයි කියායි.

a ත්‍යාගෙන කර්මණා, ත්‍යාග ක්‍රියාවෙන්; ව්‍යාප්තම්, ව්‍යාප්තවූ (විශෙෂයෙන් පැමිණෙන ලද්දාවූ); එතත් සම්ප්‍රදානම්, මේ සම්ප්‍රදානය; ප්‍රෙරකං ච, ප්‍රෙරකය ද; අනුමන්තෘ ච, අනුමන්තෘ ද; අනිරාකර්තෘ ච ඉති, අනිරාකර්තෘ දැයි; ත්‍රිධා, තුන්පරිද්දෙකින්; ස්මෘතම්, දන්නාලදී. (මෙහි සම්ප්‍රදාන කාරකය ප්‍රෙරකාදි වශයෙන් ත්‍රිභෙද කොට දක්වා තල්ලක්‍ෂණ නිරුක්තිනයින් දක්වන්නාහු "දෙහීති" යනාදිය කීහු.

b දෙහීති, (මට) දෙවයි; ප්‍රෙරයති, (යමෙක් දානකර්තෘහු මෙහෙයාද; තත්, ඒ (ප්‍රෙරණය කරන්නේ); ප්‍රෙරකම්, ප්‍රෙරක නම් වේ. යථා, එනම්; බටවෙ, තාපසයාට නොහොත් කොලුවාට; භික්‍ෂාම්, භික්‍ෂාව; දදාති, දෙයි. (යනු ඊට උදාහරණයි); මෙහි "බටවෙ" යන්නෙහි සම්ප්‍රදානත්වය දාන කර්තෘහු ක්‍රියායෙහි මෙහෙයා ලත් බැවින් ප්‍රෙරක වේ. (තාපසයන්ගේ දෙවයි කියා මෙහෙයීම වනාහි වාක්සමාචාරයෙන් නොව කායසමාචාරයෙන් වේ). යත්තු, යම් සම්ප්‍රදානයක් තෙම වනාහි; ඉදම්, මෙය; අහම්, මම, දදාමි

a "ක්‍රියයා යමභිප්‍රෛති සොපි සම්ප්‍රදානම්"-පත්‍යෙ ශෙතෙ.

ඉති, දෙමියි; උකෙත, කී කල්හි; අනුමන්‍යතෙ, (දානකර්තෘහුගේ ප්‍රොත්සාහය පිණිස අනුමත කෙරේද; ඔම් ඉති, ඔම් කියා (යහපත්යයි); ආහ, කියාද; තත්, ඒ (සම්ප්‍රදානය); අනුමන්තෘ, අනුමන්තෘ නම් වේ. යථා, එනම්; ශිෂ්‍යඃ, ශිෂ්‍යතෙම; ගුරවෙ, ගුරුහට; ගාම්, ගොධනය; දදාති, දෙයි; (යනු ඊට උදාහරණයි මෙහි "ගුරවෙ" යන්නෙහි සම්ප්‍රදානත්වය ශිෂ්‍යයාගේ දානක්‍රියාවට අනුමතවීමෙන් ලත් බැවින් "අනුමන්තෘ" නම් වේ). යත්‍ර, යම් සම්ප්‍රදානකාරකයක් වනාහි; න අනුමන්‍යතෙ, අනුමත නොකෙරේද; නනිරාකරොති, නිවාරණයත් නොකෙරේද (දානක්‍රියාව නොවලක්වාද ; තත්, ඒ (සම්ප්‍රදානය); අනිරාකර්තෘ, අනිරාකර්තෘ නම් වේ. යථා, එනම්; සූර්‍ය්‍යාය, සූර්‍ය්‍යයාට; අර්ඝ්‍යම්. පූජෝපහාර ජලය; දදාති, දෙයි (යනු ඊට උදාහරණයි). මෙහි "සූර්‍ය්‍යාය" යන්නෙහි සම්ප්‍රදානත්වය කර්තෘහුගේ දානක්‍රියාව අනුමත නොකිරීමෙන් හා ඒ නිවාරණය නොකිරීමෙන්ද ලත් බැවින් "අනිරාකර්තෘ" නම් වේ.)

a ක්‍රියයා, ක්‍රියාවෙන්; යම්, යමෙකු; අභිප්‍රෛති, (කර්තෘතෙම) අභිප්‍රාය කෙරේද; සඃ අපි, හෙතෙමේ ද; සම්ප්‍රදානම්, සම්ප්‍රදාන නම් වේ. පත්‍යෙ ස්වාමියාට අභිමුඛව; හෙවත් ස්වාමියා අනුකූල කරන්නට (පක්ෂපාත කරන්ට); ශෙතෙ, ශයනය කෙරේ. (මෙහි පත්නියගේ "ශෙතෙ" යන ශයන ක්‍රියාවෙන් ස්වාමියාගේ අභිමුඛභාවය හෝ අනුකූලත්වය අභිප්‍රෙත බැවින් තත් ස්වමියා "පත්‍යෙ" යි සම්ප්‍රදාන විය.

මෙහි සම්ප්‍රදාන විෂයෙහි ඵලිතාර්ථය දක්වන්නාවූ සිද්ධාන්තකෞමුදී සරලාටීකාකාරයෝ "ස්වක්‍රියා යත්ක්‍රියොද්දෙශිකා තත් සම්ප්‍රදානමිති ඵලිතාර්ථඃ" යනු කීහු, (යම් කිසිවෙකුගේ ස්වකීය ක්‍රියාව යමෙකුගේ ක්‍රියාවක් උද්දෙශකොට ඇත්තී නම් තදුද්දිෂ්ටයා සම්ප්‍රදාන වේ යනු මෙහි ඵලිතාර්ථය (මූලු අදහස) යනු මෙහි අර්ථයි. මෙසේ කියා තත්ඵලිතාර්ථත්වය විස්තරකරන්නාහු "භවති ච පත්‍යෙ ශෙතෙ ඉත්‍යාදෞ පත්නීශයනං පතිශයනඵලකමිති පත්‍යුඃ සම්ප්‍රදානතා, අත්‍ර ක්‍රියා කර්මකොවෙති සම්ප්‍රදායවිදඃ" යනු කීහු. "පත්‍යෙ ශෙතෙ" යනාදියෙහි පත්නියගේ ශයනක්‍රියාව පතිහුගේ ශයන ක්‍රියාව ඵලකොට ඇති බැවින් පතිහුගේ සම්ප්‍රදානත්වය වේ. මෙහි කී මේ ක්‍රියාව නාම අකර්මකක්‍රියාවක්ම

a "විශ්ලෙෂාවධෞ පඤ්චමී"

b විශ්ලෙෂො විභාගස්තත්‍ර යොවධිශ්චලකො අචලකො වා විවක්ෂිතස්තත්‍රාපාදානෙ පඤ්චමී. (විශ්ලෙෂො නාම සංයොගපූර්වකො විභාගඃ, ආධාරාධෙයයොර්මධ්‍යෙ ආධාරත්වෙන ඥායමානඃ සොවධිඃ, ආධීයතෙනෙනාසෞ=ආධාරඃ, ආධාතුං යොග්‍ය ආධෙයඃ). ධාවතොශ්වාදපතත්, ගුහාතොවතරති ගඞ්ගා.

වියයුතුයයි සම්ප්‍රදාය දන්නෝ කීහු යනු මෙහි අර්ථයි, මින් ප්‍රකාශිතවූයේ කර්තෘහුගේ ක්‍රියාව යමෙකු පිළිබඳ ක්‍රියාවක් ඵලය කොට පවතී නම් තත්ක්‍රියාශ්‍රය පදාර්ථය සම්ප්‍රදානය වනබව ද, ඒ කර්තෘහුගේ ක්‍රියාව අකර්මකක්‍රියාවක් වියයුතු බව ද වේ.

මෙසේ "දානපාත්‍රෙ" යන්න මුල්කොට සම්ප්‍රදානයට යොග්‍යස්ථාන බොහොමයක් දක්වා ඉක්බිති "විශ්ලෙෂාවධෞ" යන්න මුල්කොට අවධිකාරකය විස්තර කරන්නාහු "විශ්ලෙෂාවධෞ" යනාදිය කීහු.

a විශ්ලෙෂාවධෞ, වියොගයෙහි ඉමවූ අවධිකාරකයෙහි; පඤ්චමී, පඤ්චමීවිභක්තිය වේ.

b විශ්ලෙෂඃ, විශ්ලෙෂ නම්; විභාගඃ, විච්ඡෙදයයි; හෙවත් පෘථග්භාවයයි. තත්‍ර, එහි; යඃ අවධිඃ, යම් ආශ්‍රයක් (ආධාරත්වයෙන් සිටි ඉමක් ; චලකයා, චලස්වභාවයෙන් හෝ; අචලකයාවා, අචලස්වභාවයෙන් හෝ; විවක්ෂිතඃ, විවක්ෂාකරණලද්දේ වේද; තත්‍රාපාදානෙ, ඒ (අවධිසඞ්ඛ්‍යාත) අපාදානකාරකයෙහි; පඤ්චමී, පඤ්චමීවිභක්තිය වේ. විශ්ලෙෂඃ නාම, විශ්ලෙෂ නම්; සංයොගපූර්වකඃ, සංයොගයක් (එකතුවීමක්) පූර්වකොට ඇත්තාවූ; විභාගඃ, විච්ඡෙදයයි. ආධාරාධෙයයොඃ මධ්‍යෙ, ආධාර ආධෙය දෙක අතුරෙන්; ආධාරත්වෙන, ආධාරභාවයෙන්; ඥායමානඃ, දන්නා ලබන්නාවූ; යඃ, යමක් වේද; සඃ, හෙතෙම; අවධිඃ, අවධි නම් වේ. අනෙන, මොහුවිසින්; ආධීයතෙ ඉති, දරණුලැබේනුයි; අසෞ, මෙතෙම; ආධාරඃ ආධාර නම් වේ. ආධාතුම්, දරාගන්නට; යොග්‍යඃ, යොග්‍යවූයේ; ආධෙයඃ, ආධෙය නම් වේ. ධාවතඃ, දුවන්නාවූ; අශ්වාත්, අශ්වයාකෙරෙන්; අපතත්, වැටුනේය. (මෙහි "අශ්වාත්" යනු වියොගයෙහි චලභාවයෙන් විවක්ෂිත හෙයින් චලාපාදානයි). ගඞ්ගා, ගඞ්ගානොමෝ; ගුහාතඃ, පර්වතයෙන්; අවතරති, ගලාබසී (මෙහි "ගුහාතඃ" යනු වියොගයෙහි

අචලභාවයෙන් විවක්ෂිතහෙයින් අචලාපාදානයි) ආධාරාධෙයත්ව යෙන් සංයොගවූ යම් වස්තුදෙකක් අතුරෙන් ආධාරයාකෙරෙන් ආධෙයයාගේ වෙන්වීම වේ නම් ඒ ආධාරවූ වස්තුව අවධි සඞ්ඛ්‍යාත අපාදානයයි ද ඔහුකෙරෙන් පඤ්චමීවිභක්තිය වේයයි ද ඒ වෙන්වීම ආධාරවස්තුහුගේ චලත්වයෙන් හා නිශ්චලත්වයෙන් යන ද්වෛවිධ්‍යයෙන් ම වේයයි ද යනු මෙහි ඵලිතාර්ථයි. මෙකී අවධිලක්ෂණ දක්වන්නාවූ භර්තෘහරීන්විසින්:-

"අපායෙ යදුදාසීනං චලං වා යදි වාචලං,
ධ්‍රුවමෙවාතදාවෙශාත් තදපාදානමුච්‍යතෙ.
පතතො ධ්‍රුව එවාශ්වො යස්මාදශ්වාත් පතත්‍යසෞ,
තස්‍යාප්‍යශ්වස්‍ය පතනෙ කුඩ්‍යාදි ධ්‍රුවමිෂ්‍යතෙ.
මෙෂාන්තරක්‍රියාපෙක්ෂමවධිත්වං පෘථක් පෘථක්,
මෙෂයොඃ ස්වක්‍රියාපෙක්ෂං කර්තෘත්වඤ්ච පෘථක් පෘථක්."

යනු කියනලදී. අපායසඞ්ඛ්‍යාත විශ්ලෙෂය සාධ්‍යකල්හි යම් ධ්‍රුවයක් (ස්ථිරවස්තුවක්) වේ නම් ඒ අපාදානයයි කියනුලැබේ. ඒ එහි විශ්ලෙෂජනකක්‍රියාවක්හුගේ අනුප්‍රවෙශය නැතිහෙයිනි, හෙ ද චල අචල උදාසීනයයි ත්‍රිවිධ වේ: (කෙසේදයත්)? වැටෙන්නාවූ යම් අශ්වයෙකු කෙරෙන් මෙතෙමේ වැටේ යයි කීකල්හි අශ්වතෙමේ ම ධ්‍රුවය වේ, ඒ අශ්වයාගේ ද වැටීමෙහිදී (ඔහුගේ වැටීමට ඉමවූ) භිත්ති ආදිය ධ්‍රුවයයි අභිමත වේ. එළුවන් දෙදෙනෙකු අතරවූ ක්‍රියාවන් අපෙක්ෂා කොට ඇත්තාවූ අවධිභාවය වනාහි වෙන් වෙන් වශයෙන් වේ. ඒ එළුවන් දෙදෙනාගේ ස්වකීය ක්‍රියාව අපෙක්ෂා කොට ඇත්තාවූ කර්තෘභාවය ද වෙන් වශයෙන් වේ යනු මෙහි අර්ථයි.

මේ ශ්ලොකත්‍රය "ධ්‍රුවමපායෙපාදානම්" යන පාණිනීය සූත්‍රය ඇසුරු කොට කියනලදී. මේ සූත්‍රයෙහි තාත්පර්‍ය්‍යාර්ථය නම් අපායසඞ්ඛ්‍යාත වියොග ජනකව්‍යාපාරය ආශ්‍රයකොට නැත්තාවූ ධ්‍රුවය අපාදානය යනුයි, මෙහි ධ්‍රුවය අපාදාන යයි කීමෙන් විශ්ලෙෂක්‍රියාජන්‍යකර්තෘහට අපාදානත්වය නොලැබේ. මෙහි ඒ විස්තර කරන්නාහු විශ්ලෙෂය ඇතිකල්හි තද්විශ්ලෙෂජනක ක්‍රියාශ්‍රයරහිත ධ්‍රුවය ම අපාදාන යයි කියා "පතතඃ"යනාදිය ඊට නිදර්ශන කළාහ, එනම් 'කුඩ්‍යාත්පතතොශ්වාද් මෛත්‍රඃ පතති" යන තන්හි මෛත්‍රයාගේ පතනයෙහි අශ්වයා ද, අශ්වයාගේ පතනයෙහි කුඩ්‍යාදිය ද ධ්‍රුවය වේ. සමහරතන්හි විශ්ලෙෂක්‍රියාශ්‍රය ඇති දෙකක් එකිනෙකට අවධි වන බවත් තද්විශ්ලෙෂයෙහි

a "සම්බන්ධෙ ෂෂ්ඨී"

b සම්බන්ධිනොර්මධ්‍යෙ යොප්‍රධානස්තත්‍ර ෂෂ්ඨී.

කර්තෘත්වය ද ලබන බවත් ප්‍රකාශකරණු පිණිස "මෙෂාන්තර" යනාදිය කීහු. එනම්-"මෙෂාවපසරතඃ" යනුවෙන් එළුවෝ දෙදෙනා වෙන් ව යෙත් කීකල්හි අපසරණ ක්‍රියාශ්‍රයෙන් එළුවන් දෙදෙනාගේ එකිනෙකට අවධිත්වය ද කර්තෘත්වය ද වේ. මෙකී අවධිය බොහෝ තන්හි චලාචල වශයෙන් ද්විවිධ යයි දක්නා ලැබේ. උදාසීන භෙදය ද ඇතම් තන්හි දක්නා ලැබේ. ඒ "රාජ්ඤෙධනං ගෘණාති විප්‍රඃ" යනාදියෙහි යයි සිතිය හැකි වේ. අවධියෙහි විෂයභෙද දක්වන්නාහු:-

"නිර්දිෂ්ටවිෂයං කිඤ්චිදුපාත්තවිෂයං තථා,
අපෙක්ෂිතක්‍රියඤ්චෙති ත්‍රිධාපාදානමිෂ්‍යතෙ"

යනු කීහු. කිසි අවධියෙක් දක්වනලද ක්‍රියාව විෂයකොට ඇත්තේ ද, කි වෙක් අධ්‍යාහාරකරණලද ක්‍රියාව විෂයකොට ඇත්තේ ද, කිසිවෙක් අපෙක්ෂාකරණලද (සිතාගන්නාලද) ක්‍රියාව විෂයකොට ඇත්තේ දැයි කියා අපාදානය තුන්පරිද්දෙකින් අභිමත වේ යනු මෙහි අර්ථයි මෙහි "වෘක්ෂාත් පත්‍රං පතති" යන තන්හි අපාදානාර්ථවූ "පතති" යන ක්‍රියාව නිර්දිෂ්ට බැවින් "වෘක්ෂාත්" යනු නිර්දිෂ්ටවිෂයාපාදානයි. "වලාහකාද් විද්‍යොතතෙ විද්‍යුත්" යන තන්හි "වලාහකාත්" යනු නිඃසරණ පූර්වක විද්‍යොතනාර්ථක්‍රියායොගයෙහි "නිඃසෘත්‍ය" යී අධ්‍යාහාර්‍ය්‍ය ක්‍රියාව විෂයකොට ඇති බැවින් උපාත්තවිෂයාපාදානයි. ගමනය කරන්නෙකු දැක "කුතො භවාන්"යී ප්‍රශ්න කිරීමෙහි යුක්තවූ "කුතඃ" යන අපාදානය "ආගතඃ" යනාදීන් අපෙක්ෂිත ගමනාර්ථ ක්‍රියාව විෂය කොට ඇති බැවින් අපෙක්ෂිත ක්‍රියාවිෂයාපාදානයි. (මෙසේ "විශ්ලෙෂාවධෞ" යන්න මුල් කොට අපාදානලක්ෂණ හා තද්යොග්‍යස්ථාන ස්වල්පයක් දක්වා නැවත "සම්බන්ධෙ" යන්න මුල්කොට සම්බන්ධලක්ෂණාදිය දක්වන්නාහු "සම්බන්ධෙ ෂෂ්ඨී" යනාදිය කීහු).

a සම්බන්ධ, සම්බන්ධාර්ථයෙහි; ෂෂ්ඨී, ෂෂ්ඨී විභක්තිය වේ.

b සම්බන්ධිනොඃ මධ්‍යෙ, සම්බන්ධය ඇත්තවුන් දෙදෙනෙකු අතුරෙන්; යඃ, යමෙක්; අප්‍රධානඃ, අප්‍රධාන වේ ද; තත්‍ර, එහි; ෂෂ්ඨී, ෂෂ්ඨී විභක්තිය වේ.

a "භෙද්‍යභෙදකයොඃ ශ්ලිෂ්ටිඃ* සම්බන්ධොන්‍යොන්‍යමුච්‍යතෙ,
ද්විෂ්ඨො යද්‍යපි සම්බන්ධඃ ෂෂ්ඨ්‍යුත්පත්තිස්තු භෙදකාත්.

b භෙද්‍යං විශෙෂ්‍යමිත්‍යාහුර්භේදකං තු විශෙෂණම්,
විශෙෂ්‍යස්තු ප්‍රධානං ස්‍යාදප්‍රධානං විශෙෂණම්.

c ප්‍රධානාප්‍රධානයොර්මධ්‍යෙ'ප්‍රධානෙ ෂෂ්ඨී, ක්‍රියාන්වයි ප්‍රධානං ක්‍රියානන්වය්‍යප්‍රධානම්.

d රාඥඃ ස පුරුෂො දෙයඃ පිත්‍රොරෙතත්ප්‍රපූජනම්,
ගුරූණාං වචනං පථ්‍යං කවීනාං රසවද්වචඃ

---

a භෙද්‍යභෙදකයොඃ, භෙද්‍යභෙදක දෙදෙනාගේ; අන්‍යොන්‍යං ශ්ලිෂ්ටිඃ, ඔවුනොවුන් පිළිබඳ එකතුවීම; සම්බන්ධඃ, සම්බන්ධ නමැයි; උච්‍යතෙ, කියනු ලැබේ. යදි ඉදින්; සම්බන්ධඃ, සම්බන්ධයතෙම; ද්විෂ්ඨඃ අපි, දෙදෙනකු කෙරෙහි පිහිටි නමුත්; ෂෂ්ඨ්‍යුත්පත්තිඃ තු, ෂෂ්ඨීවිභක්තිහුගේ උත්පත්තිය වනාහි; භෙදකාත්, භෙදකයා කෙරෙන් (විශෙෂණයා කෙරෙන්) වේ.

b භෙද්‍යම්, භෙද්‍යය, විශෙෂ්‍යම් ඉති, විශෙෂ්‍යයයි; අහුඃ, කියත්; භෙදකං තු, භෙදකය වනාහි; විශෙෂණම්, විශෙෂණයයි කියත්; විශෙෂ්‍යං තු විශෙෂ්‍යය වනාහි; ප්‍රධානං ස්‍යාත්, ප්‍රධාන වන්නේය; විශෙෂණම්, විශෙෂණය; අප්‍රධානම්, අප්‍රධාන වන්නේය.

c ප්‍රධාන අප්‍රධානයොඃ මධ්‍යෙ, ප්‍රධාන අප්‍රධාන දෙදෙනා අතුරෙන්; අප්‍රධානෙ, අප්‍රධානයා කෙරෙහි; ෂෂ්ඨී ෂෂ්ඨීවිභක්තිය වේ; ක්‍රියාන්වයි, ක්‍රියාව අනුව යන්නේ; ප්‍රධානම්, ප්‍රධාන වේ; ක්‍රියා අනන්වයි, ක්‍රියාව අනුව නොයන්නේ; අප්‍රධානම්, අප්‍රධාන වේ.

d සඃ, හෙතෙම; රාඥඃ, රජහුගේ; පුරුෂඃ, පුරුෂයයි; දෙයඃ, දතයුතු; එතත්, මෙය; පිත්‍රොඃ, මවුපිය දෙදෙනාගේ; ප්‍රපූජනම්, ප්‍රකෘෂ්ට පූජාව හෙවත් පූජොපකරණය වේ; ගුරූණාම්, ගුරුන් සම්බන්ධවූ; වචනම්, වචනය; පථ්‍යම්, හිතකර වේ; කවීනාම්, කවීන් සම්බන්ධවූ; වචඃ, වචනය; රසවත්, රසයුක්ත වේ හෙවත් මිහිරි වේ; (මෙහි "රාඥඃ පිත්‍රොඃ, ගුරූණාම්, කවීනාම්" යන තන්හි සම්බන්ධාර්ථයෙහි ෂෂ්ඨීයි.)

---

* ශ්ලිෂ්ටිඃ-සම්භර,

a සෙව්‍යසෙවකභාවසම්බන්ධඃ පූජ්‍යපූජකභාවසම්බන්ධො
බොධ්‍යබොධකභාවසම්බන්ධො වාච්‍යවාචකභාවසම්බන්ධ ඉති
සම්බන්ධශ්චතුර්විධඃ.

a සෙව්‍යසෙවකභාවසබන්ධඃ, සෙව්‍යසෙවකභාවසම්බන්ධය (සෙවනයකටයුත්තා හා සෙවනය කරන්නාය යන දෙදෙනා ලක්ෂණකොට ඇති සම්බන්ධය); පූජ්‍යපූජකභාවභාවසම්බන්ධඃ පූජ්‍යපූජකභාවසම්බන්ධය (පිදියයුත්ත හා පුදන්නාය යන දෙදෙනා ලක්ෂණකොට ඇති සම්බන්ධය); බොධ්‍යබොධකභාවසම්බන්ධඃ බොධ්‍යබොධකභාවසම්බන්ධය (අවබොධ කටයුත්තාය අවබොධ කරන්නාය යන දෙදෙනා ලක්ෂණ කොට ඇති සම්බන්ධය); වාච්‍යවාචකභාවසම්බන්ධඃ ඉති, වාච්‍යවාචකභාවසම්බන්ධය (කියයුත්තාය කියන්නාය යන දෙදෙනා ලක්ෂණකොට ඇති සම්බන්ධය කියා; සම්බන්ධඃ, (මෙහි කී) සම්බන්ධය; චතුර්විධඃ, සිවුවැදෑරුම් වේ.

මෙහි පළමුකොට "සම්බන්ධෙ ෂෂ්ඨී" යනුවෙන් සම්බන්ධාර්ථයෙහි ෂෂ්ඨී විභක්තිය වේයයි කියා තත් සම්බන්ධලක්ෂණ දක්වන්නාහු "භෙද්‍යභෙදකයොඃ" යනාදිය කීහු. එනම්- භෙද්‍යභෙදක ලක්ෂණවූ විශෙෂ්‍යවිශෙෂණ දෙකක්හුගේ එකතුවීම සම්බන්ධයයි ද ඒ සම්බන්ධය වනාහි එකිනෙකා (භෙද්‍යභෙදක දෙදෙනාම) පිළිබඳ යයි ද කියා නැවත ඒ සම්බන්ධය භෙද්‍යභෙදක දෙදෙනාම පිළිබඳ වුවත් ෂෂ්ඨී විභක්තිහුගේ පැමිණීම භෙදකයා (විශෙෂණයා) කෙරෙන්ම වේ යයි කීහු. පසුව 'භෙද්‍යං විශෙෂ්‍ය" යනාදියෙන් මෙහි කී "භෙද්‍ය" නම් විශෙෂ්‍යයයි ද "භෙදක" නම් විශෙෂණයයි ද එහි විශෙෂ්‍යය ප්‍රධානයයි ද විශෙෂණය අප්‍රධාන යයි ද කියා ඒ ප්‍රධානාප්‍රධාන ලක්ෂණ දක්වන්නාහු "ක්‍රියාන්වයි ප්‍රධානම්" යනාදිය කීහු. එනම් -"රාඥඃ පුරුෂො භවති" යනාදියෙහි "රජන්, පුරුෂ" දෙදෙනාගේ සෙව්‍යසෙවකභාවසම්බන්ධයෙහි "භවති" යන ක්‍රියාව අනුව යන්නාවූ පුරුෂපදාර්ථය ප්‍රධානයයි ද ඊට විශෙෂණව (එය වෙනස් කොට) සිටි රජපදාර්ථය ක්‍රියාව අනුව නොයන බැවින් අප්‍රධානයයි ද කීහු. නැවත "රාඥඃ" යනාදීන් සම්බන්ධයට උදාහරණ දක්වා මෙකී සම්බන්ධය වනාහි සෙව්‍ය සෙවක ලක්ෂණාදි වශයෙන් නානාප්‍රකාර වේ යයි දක්වනු පිණිස "සෙව්‍යසෙවකභාව" යනාදිය කීහු. එනම්- "රාඥඃ, පුරුෂඃ" යන තන්හි රජතෙමේ සෙවනය කටයුත්තේ ද පුරුෂතෙමේ සෙවනය කරන්නේ ද වේ. එබැවින් ඒ දෙදෙනාගේ සම්බන්ධය සෙව්‍ය

a "ආධාරෙ සප්තමී"

b **ආධාරො නාමාධිකරණම්, තත් ෂඩ්විධම්-ඖපශ්ලේෂිකං සාමීපිකමභිව්‍යාපකං වෛෂයිකං නෛමිත්තිකමෞපචාරිකං චෙති. ඖපශ්ලේෂිකං ත්‍රිවිධමිති කෙෂාඤ්චින්මතම්. යථා- එකදෙශවෘත්ති අභිව්‍යාප්‍යවෘත්ති ව්‍යසනවෘත්තීති.***

සෙවකභාවසම්බන්ධය වේ. මෙහි ති "පිත්‍රොඃ" යනාදි පූජ්‍යපූජක භාවසම්බන්ධාදිය ද මේ ක්‍රමයෙන් දතයුතුයි. මෙහි මෙය සෙව්‍ය සෙවකභාවාදිවශයෙන් චතුර්විධ යයි කීව ද "ජන්‍යජනක, අවයවාවයවී, ගුණගුණී, සමූහසමූහී, පාල්‍යපාලක, වාහ්‍යවාහක, ව්‍යාප්‍යව්‍යාපක" භාවාදිවශයෙන් බහුවිධ වේ.

"ශෙෂෙ ෂෂ්ඨී" යන පාණිනීයසූත්‍රය ඇසුරුකොට සම්බන්ධ ලක්ෂණ දක්වන්නාවූ භර්තෘහරීන්විසින්:-

"සම්බන්ධඃ කාරකෙභ්‍යොන්‍යඃ ක්‍රියාකාරකපූර්වකඃ,
අශ්‍රැතායාං ශ්‍රැතායාං වා ක්‍රියායාමභිධීයතෙ".

යනු කියනලදී-කර්තෘකර්මාදිකාරකයන්කෙරෙන් ව්‍යතිරික්තවූ ක්‍රියාකාරකදෙදෙනා පූර්වකොට ඇති පදාර්ථයතෙම සම්බන්ධ නම් වන්නේය. "රාඥඃ පුරුෂඃ" යනාදියෙහි ක්‍රියාව උච්චාරණය නොකරණලද කල්හි ද, "මාතුඃ සමයතීතෙ" යනාදියෙහි ක්‍රියාව උච්චාරණය කරණකල්හි ද (ඒ සම්බන්ධයතෙම) කියනුලැබේ යනු එහි අර්ථයි. මෙහි ප්‍රකාශිතවූයේ සම්බන්ධය කාරකයන් කෙරෙන් අනෙකක් බව ද එහෙත් එය ක්‍රියාකාරයන් පූර්වකොට ඇත්තක් බව ද එය ක්‍රියාවක්හුගේ උච්චාරණය ඇතත් නැතත් වන බව ද වේ. එනම්-'රාඥඃ පුරුෂඃ" යන තන්හි "රාඥඃ"යන්න කාරකයෙන් අන්‍යවූවත් එහි සම්බන්ධිත්වය වනාහි අශ්‍රැතවූ සෙවනාදික්‍රියාවක් හා තත් ක්‍රියාකාරකකර්තෘත්වාදියක් ද පූර්වකොට ඇතිවූයේ වේ. "මාතුඃ සමයතීතෙ" යන තන්හි සම්බන්ධිත්වය ශ්‍රැතවූ සමරණක්‍රියාව හා තත්කර්මත්වය ද පූර්වකොට වූයේ වේ. මෙසේ "සම්බන්ධ" යන්න මුල්කොට "සම්බන්ධලක්ෂණාදිය දක්වා නැවත "ආධාරභාවයොඃ" යන්න මුල්කොට ආධාර භාවලක්ෂණාදිය දක්වන්නාහු 'ආධාරෙ සප්තමී" යනාදිය කීහු.

a ආධාරෙ, ආධාරකාරකයෙහි; සප්තමී, සප්තමීවිභක්තිය වේ.

b ආධාරඃ නාම, ආධාර නම්; අධිකරණම්, අධිකරණයයි; තත් ඒ අධිකරණය; ෂඩ්විධම්, සවැදෑරුම් වේ. (එනම්)-ඖපශෙලෂිකම්

---

* ව්‍යඞ්ගවෘත්ති -සම්හර.

a **කටෙ ශෙතෙ කුමාරෝ'සෞ වටෙ ගාවඃ සුශෙරතෙ
තිලෙෂු විද්‍යතෙ තෛලං හෘදි බ්‍රහ්මාමෘතං පරම්.**

b **යුද්ධෙ සන්නහ්‍යතෙ ධීරොඞ්ගුල්‍යග්‍රෙ කරිණාං ශතම්
ගුහාන්තඃ පාදපාඃ සන්ති ගඞ්ගායාං වරවාලුකාඃ.**

ඖපශෙලෂිකාධිකරණය, (උපරිභාවයෙන් හෝ සමීප භාවයෙන් ආධෙයයාගේ සම්බන්ධය ඇති ආධාරය); සාමීපිකම්, සාමීපිකාධිකරණය (ආධෙයයාගේ සමීපභාවයෙහිවූ හෝ සමීපභාවය ඇති ආධාරය); අභිව්‍යාපකම්, අභිව්‍යාපකාධිකරණය (ආධෙයයෙන් හාත්පසින් පැතිරගන්නාලද ආධාරය); වෛෂයිකම්, වෛෂයිකාධිකරණය (ආධෙයයාගේ විෂයෙහිවූ හෙවත් අනන්‍යත්‍ර භාවයෙහිවූ ආධාරය); නෛමිත්තිකම්, නෛමිත්තිකාධිකරණය (ආධෙය යට හෙතුවූ හෝ ආධෙයය ඵලය කොට ඇති ආධාරය); ඖපචාරිකඤ්ච ඉති, ඖපචාරිකාධිකරණයයි; (ආධෙයයාගේ උපචාරයෙහිවූ හෝ උපචාරය ඇති ආධාරයයි කියායි); ඖපශෙලෂිකම්, (යථොක්ත) ඖපශෙලෂිකාධිකරණය; ත්‍රිවිධම් ඉති, තුන්වැදෑරුම් යයි; කෙෂාඤ්චිත්, කිසිවෙකුන්ගේ; මතම්, මතයයි අදහසයි); යථා එනම්; එකදෙශවෘත්ති, (ආධෙයයාගේ) එක් දෙසක් වැලඳ ගැණීම ඇත්තය; අභිව්‍යාප්‍යවෘත්ති, (ආධෙයය හා) සාකල්‍යයොගයෙන් ඇත්තය; ව්‍යසනවෘත්ති ඉති, (ආධෙයයෙන්) ආකූලව වැලඳගැණීම ඇත්තය; හෙවත් තන්හි තන්හි ආධෙයයාගේ වැලඳ ගැණීම ඇත්තය කියායි.

a අසෞ කුමාරඃ, මේ කුමාරතෙම; කටෙ, කළාලෙහි; (කළාලය වැලඳගෙණ); ශෙතෙ, ශයනය කෙරේ; (මෙහි "කටෙ" යනු ඖපශෙලෂිකාධාරයි); ගාවඃ, ගොධෙනූහු; වටෙ, නුගරුක සමීපයෙහි; සුශෙරතෙ, හොවිත්; (මෙහි "වටෙ" යනු සාමීපිකාධාරයි ; තිලෙෂු, තිලබීජයන්හි හෙවත් තිලබීජයන් පැතිර; තෛලම්, තෙල; විද්‍යතෙ, විද්‍යමාන වේ. (මෙහි "තිලෙෂු" යනු අභිව්‍යාපිකාධාරයි), හෘදි හෘදයවිෂයෙහි, අමෘතම්, මරණශූන්‍යවූ හෙවත් සුඛස්වරූපවූ; පරම්, උතුම්වූ, බ්‍රහ්ම, බ්‍රහ්මතෙම පවතී. (මෙහි "හෘදි" යනු වෛෂයිකාධාරයි.)

b ධීරඃ, ධෛර්‍ය්‍ය ඇත්තේ; යුද්ධෙ, යුද්ධය නිමිත්තකොට; සන්නහ්‍යතෙ, කවච දරයි; (මෙහි "යුද්ධෙ" යනු නෛමිත්තිකාධාරයි); අඞ්ගුල්‍යග්‍රෙ, ඇඟිලි අග හෙවත් ඇඟිලි අග උපචාර කොට;

කරිණාං ශතම්, ඇතුන් සියයක් පවතී; (මෙහි "අඞ්ගුල්‍යග්‍රෙ" යනු ඖපචාරිකාධාරයි), භූභෘත්සු, පර්වතයන්හි; පාදපාඃ, වෘක්ෂයෝ; සන්ති, ඇත්තාහ; (මෙහි "භූ භෘත්සු" යනු අභිව්‍යාප්‍යවෘත්ති ඖපශ්ලෙෂිකාධාරයි); ගඞ්ගායාම්, ගඞ්ගාවෙහි; වරවාලූකාඃ, උතුම් වැලි ඇත්තාහ (මෙහි "ගඞ්ගායාම්" යනු ව්‍යඤ්ජනවෘත්ති (ව්‍යඞ්ගවෘත්ති) ඖපශ්ලෙෂිකාධාරයි).

මෙසේ "ආධාරෙ සප්තමී" යනුවෙන් ආධාරකාරකයෙහි සප්තමී විභක්තිය වන බව ද නැවත ඒ ආධාරය පාණිනීයාදීන් විසින් කාරකයන්ගේ සංඥාවශයෙන් "අධිකරණ" යයි ව්‍යවහාරකළ බව ද ඒ අධිකරණය ඖපශ්ලෙෂිකාදි වශයෙන් සවැදෑරුම් බව ද, එහි ඖපශ්ලෙෂිකය මතාන්තර වශයෙන් තෙවැදෑරුම් බව ද කියා "කටෙ ශෙතෙ" යනාදි වශයෙන් උදාහරණ කරණලදී. "ආධීයතෙ සම්නාන්නිධී=ආධාරඃ" යනු නිර්වචන බැවින් යම් තැනෙක්හි (කර්තෘ කර්මවාරයෙන් ක්‍රියාව) දරණු ලැබේ නුයි (පිහිටානුයි) ඒ ආධාර වේ. එහි-යමෙක්හි අධෙයය හා උපශ්ලෙෂ ඇතිව (අනන්තර සංයොග ඇතිව) දරණු ලැබේ නම් ඒ ඖපශ්ලෙෂිකාධාරයයි කියනු ලැබේ. එනම්- "කටෙ ශෙතෙ" යන තන්හි "කටෙ" යනු ආධෙයවූ කර්තෘ හා අනන්තරසංයොග ඇතිව තත් ක්‍රියාව දරණු ලබන බැවින් ඖපශ්ලෙෂිකාධාරයි. යමෙක්හි ආධෙයය හා සංයොග රහිතව තත්සාමීප්‍යවර්තිත්වයෙන් දරණු ලැබේ නම් ඒ සාමීපිකාධාරයයි කියනු ලැබේ. එනම්- "වටෙ ගාවඃ සුශෙරතෙ" යන තන්හි 'වටෙ' යනු ගොසංඛ්‍යාත ආධෙයයවූ කර්තෘහුගේ ශයනක්‍රියාව සමීප වර්තිත්වයෙන් දරණු ලබන බැවින් සාමීපිකා වේ. යමෙක්හි ආධෙයය සර්වාවයවසම්බන්ධත්වයෙන් දරණු ලැබේ නම් ඒ අභිව්‍යාපිකාධාරයයි කියනු ලැබේ. එනම්- "තිලෙෂු විද්‍යතෙ තෛලම්" යන තන්හි තෛලසංඛ්‍යාත ආධෙය කර්තෘහුගේ විද්‍යමානත්වය සර්වාවයවසංයොගත්වයෙන් (සෑමතන්හි පැතිරීමෙන්) දරණු ලබන බැවින් "තිලෙෂු" යනු අභිව්‍යාපකාධාරයි; යමෙක්හි ආධෙයය විෂයකොට (ගොචරකොට) ඇත්තක්ව දරණු ලැබේ නම් ඒ වෛෂයිකාධාරයයි කියනු ලැබේ. එනම්- "හෘදි බ්‍රහම" යන තන්හි "හෘදි" යනු බ්‍රහම සඞ්ඛ්‍යාත ආධෙය කර්තෘහුගේ ප්‍රවෘත්තිය ඖපශ්ලෙෂිකාදි ලක්ෂණ විරහිතව විෂයභාවයෙන් දරණු ලබන බැවින් වෛෂයිකාධාරයි. යමෙක්හි ආධෙයයෙහි හෙතුවක්ව හෝ ආධෙයය ඵලයකොට ඇතිව දරණු ලැබේ නම් ඒ නෛමිත්තිකාධාරයයි කියනු ලැබේ. එනම්- "යුඬෙ සන්නහ්‍යතෙ ධීරඃ" යන තන්හි ආධෙයසඞ්ඛ්‍යාතවූ

ධීරයාගේ සන්නහනක්‍රියාව තන්නිමිත්තත්වයෙන් දරණුලබන බැවින් "යුඬෙ" යනු නෛමිත්තිකාධාරයි, යමෙක්හි අනිකක් සම්බන්ධ ආධෙය ක්‍රියාවක් ඖපචාරිකත්වයෙන් දරණුලැබේ නම් ඒ ඖපචාරිකාධාරයයි කියනුලැබේ. එනම්-"අඞ්ගුල්‍යග්‍රෙ කරිණාං ශතම්" යන තන්හි හුම්හුගේ ආධෙයත්වයෙන් අභාවයක සිටි කරිශතප්‍රවෘත්තිය ඖපචාරිකත්වයෙන් දරණුලබන බැවින් "අඞ්ගුල්‍යග්‍රෙ" යනු ඖපචාරිකාධාරයි, ඖපශ්ලෙෂිකාධිකරණය සම්බන්ධ භෙදත්‍රයෙන් එකදෙශවෘත්තිය "කටෙ ශෙතෙ" යන් තෙන් ප්‍රකාශිතයි. එනම්-එහි ආධෙයයෙන් කටය මුලුල්ලම නොව එක්දෙසක් වැළඳ ගැණීම ඇතිබැවින් "කටෙ" යනු එකදෙශවෘත්ති ඖපශ්ලෙෂිකයි. "භූභෘත්සු පාදපාඃ සන්ති" යන තන්හි පාදපසඞ්ඛ්‍යාතආධෙයයෙන් භූභෘත්හුගේ එක්දෙසක් නොව මුලුල්ලම වැළඳගැණීම ඇතිබැවින් "භූභෘත්සු" යනු අභිව්‍යාප්‍යවෘත්ති ඖපශ්ලෙෂිකයි, "ගඞ්ගායාං වරවාලූකාඃ" යන තන්හි වරවාලූකාසඞ්ඛ්‍යාත ආධෙයයෙන් ගඞ්ගාහුගේ එක්දෙසක්ද මුලුල්ලමද නොව තන්හි තන්හි වැළඳ ගැණීම ඇතිබැවින් "ගඞ්ගායාම්"යනු ව්‍යඤ්ජනවෘත්ති ඖපශ්ලෙෂිකයි. තවද 'ආධාරො "ධිකරණම්"යන පාණිනීයසූත්‍රය ඇසුරුකොට අධිකරණලක්ෂණ දක්වන්නාවූ භර්තෘහරීන් විසින්:-

"කර්තෘකර්මව්‍යවහිතාමසාක්ෂාද්ධාරයත් ක්‍රියාම්,
උපකුර්වත් ක්‍රියාසිද්ධෞ ශාස්ත්‍රෙ'ධිකරණං ස්මෘතම්"

යනු කියනලදී. යමෙක් කර්තෘකර්මයෙන් ව්‍යවධානවත්වූ එහෙයින්ම අප්‍රත්‍යක්ෂවූ ක්‍රියාව දරමින් ක්‍රියාසිද්ධියෙහි උපකාර වන්නේ නම් ඒ ශාස්ත්‍රවිෂයෙහි අධිකරණයයි දන්නාලදී යනු මෙහි අර්ථයි. "කුමාරඃ කටෙ ශෙතෙ" යන තන්හි 'කුමාරඃ"යන කර්තෘහුගෙන් ව්‍යවධානවත්වූ "ශෙතෙ" යන ශයනක්‍රියාව දරණ බැවින් "කටෙ" යනු අධිකරණයි. 'ස්ථාල්‍යාමොදනං පචති"යන තන්හි 'ඔදනම්" යන කර්මයෙන් ව්‍යවධානවත්වූ 'පචති' යන පචන ක්‍රියාව දරණබැවින් "ස්ථාල්‍යාම්" යනු අධිකරණයි. මෙහි අධිකරණය සිද්ධාන්තකෞමුදියෙහි "ඖපශ්ලෙෂික වෛෂයික අභිව්‍යාපක" යයි ත්‍රිභෙද කොට කීහු. මෙසේ අධිකරණයෙහි සප්තමී විභක්තිය කියා භාවසප්තමී නිර්දේශය කරන්නාහු "භාවෙ ච" යනාදිය කීහු.

a **"භාවෙ ච සප්තමී"**

b **ක්‍රියාලක්‍ෂණං භාවස්තත්‍රාපි සප්තමී, ප්‍රසිද්ධක්‍රියයා අප්‍රසිද්ධ ක්‍රියායා ලක්‍ෂණබොධනං භාවඃ, දෙවෙ වර්‍ෂති චෞර ආයාතඃ, පතත්‍යංශුමාලිනි පතිතොරාතිඃ.**

---

a භාවෙ ච, ක්‍රියාලක්‍ෂණවූ භාවය ඇතිකල්හිද; හෙවත් ප්‍රසිද්ධ ක්‍රියාව ඇත්තෙහි ද; සප්තමී, සප්තමීවිභක්තිය වේ.

b ක්‍රියාලක්‍ෂණම්, අප්‍රසිද්ධ ක්‍රියාහුගේ ලක්‍ෂණය හෙවත් අප්‍රසිද්ධ ක්‍රියාලක්‍ෂණයට ඉවහල්වූයේ; භාවඃ, භාව නම් වේ. තත්‍ර අපි, ඒ භාවාර්‍ථයෙහි ද; සප්තමී, සප්තමීවිභක්තිය වේ. ප්‍රසිද්ධක්‍රියයා, ප්‍රසිද්ධවූ ක්‍රියාවෙන්; අප්‍රසිද්ධක්‍රියායාඃ, අප්‍රසිද්ධවූ ක්‍රියාහුගේ; ලක්‍ෂණබොධනම්, ලකුණ දැනීමට ඉවහල්වූයේ; භාවඃ, භාවයයි. දෙවෙ වර්‍ෂති, වැස්ස වසිනකල්හි. චෞරඃ, චෞරතෙම; ආයාතඃ, ආයේය. අංශුමාලිනි, සූර්‍ය්‍යයා; පතති, අස්තයට යනකල්හි; අරාතිඃ ශත්‍රුතෙම; පතිතඃ, (යුද්ධයට අවුත්) වැටුනේය; හෙවත් නැසුනේය. (මෙහි "වර්‍ෂති" යන භාවාර්‍ථයෙහි 'දෙවෙ'' යනුද, "පතති ' යන භාවාර්‍ථයෙහි ''අංශුමාලිනි'' යනුද සප්තමීයි).

භාවසප්තමීනිර්දේශද්වාරයෙන් භාවලක්‍ෂණ දක්වන්නාහු "ක්‍රියාලක්‍ෂණම්" යනාදිය කීහු. ප්‍රසිද්ධවූ ක්‍රියාවකින් අප්‍රසිද්ධවූ ක්‍රියාවක්හුගේ තත්ත්වය ඇඟවීමෙහි ඒ ප්‍රසිද්ධක්‍රියාව ඇත්තහු කෙරෙන් ද (තද්විශෙෂණත්වයෙන් ඒ ප්‍රසිද්ධක්‍රියාවකෙරෙන්ද) සප්තමීවිභක්තිය වේය යනු මෙහි ඵලිතාර්‍ථයි. මෙහි ප්‍රසිද්ධක්‍රියාව ඇත්තහු කර්‍තෘ හෝ කර්‍මයද වියයුතුබැවින් මේ සප්තමීවිභක්ති යද කර්‍තෘාර්‍ථයෙහි හෝ කර්‍මාර්‍ථයෙහි වියයුතුයි). ''දෙවෙ වර්‍ෂති චෞරආයාතඃ''යන තන්හි සර්‍වජනප්‍රසිද්ධවූ දෙවවර්‍ෂණක්‍රියායෙන් අප්‍රසිද්ධවූ චෞරාගමන ක්‍රියාව ලක්‍ෂිතබැවින් ඒ ප්‍රසිද්ධක්‍රියාවත්වූ ''දෙව'' ශබ්දයාකෙරෙන්ද තද්විශෙෂණත්වයෙන් "වර්‍ෂත්" යන ඒ (භාව සඞ්ඛ්‍යාත) කෘදන්තක්‍රියාව කෙරෙන්ද සප්තමීවිභක්තිය විය. මෙහි ''දෙවෙ'' යන්න වර්‍ෂණක්‍රියායෙහි කර්‍තෘත්වයෙන් සිටි බැවින් කර්‍තෘාර්‍ථයෙහි සප්තමීයයි. ''පතත්‍යංශුමාලිනි'' යනාදියෙහි ද මෙසේයි.('ගොෂු දුහ්‍යමානාසු චෞරෛගතඃ' යනතන්හි 'ගොෂු යන්න ''දුහ්‍යමානාසු'' යන දෝහනක්‍රියායෙහි කර්‍මත්වයෙන් සිටි බැවින් කර්‍මාර්‍ථයෙහි සප්තමීයයි.) මෙසේ තත් තත් කාරකාර්‍ථ

261 විනාසහනමස්‍යුතෙනිර්ධාරණ ස්වාම්‍යාදිභිශ්ච.

(විනාසහනමස්‍යුතෙනිර්ධාරණස්වාම්‍යාදිභිඃ 3, 3; ච 1, 1;

a **එතෛරපි යොගෙ ද්විතීයාද්‍යා විභක්තයො භවන්ති. "විනා අන්තරෙණ අන්තරා" ඉත්‍යාදියොගෙ ද්විතීයා. විනා පාපං සර්‍වං ඵලති, අන්තරෙණාක්‍ෂිණී ජීවිතෙන කිම්, අන්තරා ත්වාං මාං මධුරිපු * රිත්‍යාදිපදද්ග්‍රාහ්‍යම්.**

සූචක ද්විතීයාදිවිභක්තීන් දක්වා නැවත අව්‍යයාදීන්ගේ උපපද යොගයෙන් විශෙෂාර්‍ථසූචකද්විතීයාදිවිභක්තීන් විධාන කරන්නාහු ''විනා'' යනාදී සූත්‍රය කීහු

261 විනාසහනමස්‍යුතෙනිර්ධාරණස්වාම්‍යාදිභිඃ ච,–විනා, විනා නිපාතාදිය; සහ, සහ නිපාතාදිය; නමස්, නමස් නිපාතාදිය; ස්‍යුතෙ, ස්‍යුත නිපාතාදිය; නිර්ධාරණ, නිර්ධාරණාර්‍ථාදිය; ස්වාම්‍යාදිභිඃ ච, ස්වාමින් ශබ්දාදිය යන මොවුන් හා යොගයෙහි ද (ද්විතීයාදීහු පිළිවෙළින් වෙත්.)

a එතෛඃ යොගෙ අපි, මේ ''විනා'' යනාදි නිපාතයන් හා යොග යෙහි ද; ද්විතීයාද්‍යා විභක්තයඃ, ද්විතීයාදි විභක්තිහු; භවන්ති, වෙත්. (එනම්–විනා අන්තරෙණ අන්තරා ඉති, ''විනා අන්තරෙ අන්තරා'' යන; ආදියොගෙ, මේ ආදීන් හා යොගයෙහි, ද්විතීයා, ද්විතීයා විභක්තිය වේ. පාපං විනා, පාපය නැතිකල්හි; සර්‍වම්, සියල්ල; ඵලති, පල දේ; (මෙහි ''පාපම්'' යනු විනා යොගයෙහි ෂෂ්ඨ්‍යර්‍ථයෙහි ද්විතීයායි); අක්‍ෂිණී අන්තරෙණ, ඇස්දෙක නැති කල්හි; ජීවිතෙන, ජීවිතයෙන්; කිම්, කිම;? (මෙහි ''අක්‍ෂිණී'' යනු ''අන්තරෙණ'' යන නිපාත යොගයෙහි ෂෂ්ඨ්‍යර්‍ථයෙහි ද්විතී යායි); ත්වාං මාම් අන්තරා, තාගේ හා මාගේ අතර; මධුරිපුඃ, විෂ්ණු තෙම පවතී. (මෙහි ''ත්වාං මාම්'' යනු ''අන්තරා'' යන නිපාතයොග යෙහි ෂෂ්ඨ්‍යර්‍ථයෙහි ද්විතීයායි. ආදි පදාත්, ආදි පදයෙන් හෙවත් මේ සූත්‍රයෙහි කී ආදිශබ්දයෙන්; ඉති, මෙසේ; (උපපද ද්විතීයාන්තය) ග්‍රාහ්‍යම්, ගත යුතුයි.

''ද්වන්ද්වාන්තෙ ශ්‍රූයමාණං පදං ප්‍රත්‍යෙකමභිසම්බධ්‍යතෙ'' යන න්‍යායයෙන් ද්වන්ද්වසමාසාන්තයෙහි උච්චාරණයකරණු ලබන පදය වෙන් වසයෙන් සම්බන්ධකරණු ලැබේයයි කී බැවින්

---

* ''මධවිත්‍යාදි''සිද පෙණෙයි, එහිද 'මධු' යන්නෙන් මධුසූදන සඞ්ඛ්‍යාත විෂ්ණුය යන අර්‍ථයි.

a "අධිශීඞ්ස්ථාසාං කර්ම" .

b අධිපූර්වාණාමෙෂාමාධාරඃ කර්ම ස්‍යාත්. අධිශෙතෙ අධිතිෂ්ඨති අධ්‍යාසෙත වා වෛකුණ්ඨං හරිඃ.

c "අභිනිවිශශ්ච"

මේ සූත්‍රයෙහි ආදි ශබ්දය ද 'විනා" ආදිය සමග වෙන් වසයෙන් යොදනු ලැබේ. එසේ යොදාගත් කල ප්‍රකාශිත තත්තදර්ථය නම් විනාදි යොගයෙහි ද්විතීයාව ද, සහාදි යොගයෙහි තෘතීයාව ද, නමස්ආදි යොගයෙහි චතුර්ථිය ද, ඍතෙ ආදි යොගයෙහි පඤ්චමිය ද, නිර්ධාරණාර්ථාදියෙහි ෂෂ්ඨිය ද, ස්වාමින්ශබ්දාදි යොගයෙහි සප්තමිය ද වේය යනුයි මෙහි (ටීකාවන්හි මෙසේ ඇතත් නිර්ධාරණාර්ථාදියෙහි හා සාම්‍යාදි යොගයෙහි ෂෂ්ඨීසප්තමී දෙකම වෙත්). ච ශබ්දයෙන් මෙකී යොගයන්හි මෙකී පිළිවෙළින් විතීයාදීහුම නොව අන්‍යවිභක්තිහු ද වෙත්. එනම්– "පාපෙන විනා, පාපාද්විනා" යනාදි වශයෙනි, මෙහි "විනා" යොගයෙහි තෘතීයාව හා පඤ්චමිය විය. මෙසේ මේ උපපදයොගත්වයෙන් විතීයාදි විධාන සූත්‍රයෙන් එක් එක් පදය ගෙණ විස්තරකරන්නාවූ වාර්තිකයෝ "විනා අන්තරෙණ' යනාදිය කීහු. තවද මේ විතීයාවිධාන විස්තරයෙහි ලා පාණිනීය සූත්‍ර කීපයක් ද ගෙණහැර දක්වනු කැමැත්තාහු වක්‍ෂ්‍යමාණ සූත්‍රත්‍රය හා වෘත්තිත්‍රය ද ඊට උදාහරණද කීහු.

a අධිශීඞ්ස්ථාසාම්, අධිපූර් "ශීඞ් ස්ථා. ආස්" යන ධාතූන්ගේ ආධාරය; කර්ම, කර්මය වේ.

b අධිපූර්වාණාම්, "අධි" යන උපසර්ගය පූර්වකොට ඇත්තාවූ; එෂාම්, මේ ' ශීඞ්" ධාත්වාදීන්ගේ; ආධාරඃ, ආධාරය; කර්ම ස්‍යාත්, කර්මසංඥ වන්නේය. හරිඃ, විෂ්ණුතෙම; වෛකුණ්ඨම්, ගරුඬ වාහනයෙහි; අධිශෙතෙ, ශයනය කෙරේ; අධිතිෂ්ඨති, සිටී; අධ්‍යාසෙත වා, හිඳී කියා හෝ (යෙදේ); (මෙහි ' අධි" පූර් "ශීඞ් ස්වප්නෙ, ස්ථා ගතිනිවෘත්තෞ, ආස්–උපවෙශනෙ" යන ධාතූන්ගේ යොගයෙහි "වෛකුණ්ඨම්" යනු ආධාරාර්ථයෙහි කර්මයි.)

c අභිනිවිශඃ ච, අභි නි පූර් "විශ්" ධාතුගේ ආධාරයද කර්මය වේ.

a අභිනිත්‍යෙතත්සඞ්ඝාතපූර්වස්‍ය විශතෙරාධාරඃ කර්ම ස්‍යාත්. ග්‍රාමං අභිනිවිශතෙ.

b "උපාන්වධ්‍යාඞ්වසඃ"

c උපාදිපූර්වස්‍ය වසතෙරාධාරඃ කර්ම ස්‍යාත්–ආවසථ්‍යං උපවසති, අනුවසති, අධිවසති, ආවසති.

d "සහාදියොගෙ තෘතීයා'ප්‍රධානෙ"

---

a අභිනි ඉති, "අභිනි' යන එතත්සඞ්ඝාත පූර්වස්‍ය, මේ (දෙදෙනාගේ) සංඝාතය පූර්වකොට ඇත්තාවූ; විශතෙඃ විශ්ධාතුහුගේ, ආධාරඃ, ආධාරය; කර්ම ස්‍යාත් කර්මය වන්නේය. ග්‍රාමම්, ගමෙහි; අභිනිවිශතෙ, ඇතුල්වේ. (මෙහි "අභි නි" පූර් 'විශ ප්‍රවෙශෙ" යන ධායොගයෙහි "ග්‍රාමම්" යනු ආධාරාර්ථයෙහි කර්මයි) මේ සූත්‍රයෙහි "අභිනි" දෙදෙනාගේ වන්ද්වසමාසයෙහි අල්පස්වරත්වයෙන් නියන්ත පූර්වයෙහි යෙදියයුතුවත්ම එසේ නොයොදා මෙසේ යොදනලද්දේ මේ දෙදෙනාගේ ප්‍රත්‍යෙකයොගයෙහි හෝ මීට විපරීතව යොගයෙහි හෝ මෙකී කර්මය නොවේයයි දක්වීම පිණිසයි).

b උපාන්වධ්‍යාඞ්වසඃ, "උප අනු අධි ආඞ්" යන මොවුන් පූර්වකොට ඇති "වස්" ධාතුහුගේ ආධාරය කර්මය වේ.

c උපාදි පූර්වස්‍ය, "උප" ආදි (මේ) උපසර්ගයන් පූර්වකොට ඇත්තාවූ; වසතෙඃ, වසධාතුහුගේ; ආධාරඃ, ආධාරය; කර්ම ස්‍යාත්, කර්මය වන්නේය. ආවසථ්‍යම්, ආවාසයෙහි; උපවසති, වෙසේ. "අනුවසති අධිවසති ආවසති" යනුද මෙම අර්ථයි. (මෙහි "ආවසථ්‍යම්" යනු "උප" යනාදීන් පූර්වකොට ඇති "වස–නිවාසෙ" යන ධාතුහුගේ යොගයෙහි ආධාරාර්ථයෙහි කර්මයි). 'අභිසර්වතසොඃ" යනාදීන් පූර්වොක්ත විතීයායොග ද මෙහි ඇතුළත් වෙති. මෙසේ "විනා" යනාදි සූත්‍රයෙහි "විනා" යන්න මුල්කොට ඇත්තවුන් සම්බන්ධි උපපදවිතීයාව දක්වා නැවත එහි "සහ" යන්න මුල්කොට ඇත්තවුන් හා යෙදෙන තෘතීයාවිභක්තිය දක්වන්නාහු, "සහාදියොගෙ" යනාදිය කීහු.

d සහාදියොගෙ, සහශබ්දාදීන් හා යොගයෙහි; අප්‍රධානෙ අප්‍රධානයාකෙරෙහි; තෘතීයා, තෘතීයා විභක්තිය වේ.

a සහ සදෘශං සාකං සාර්ධං සමමිති සහාදයඃ; සහ ශිෂ්‍යෙණාගතො ගුරුඃ, සදෘශශ්චෛත්‍රො මෛත්‍රෙණ, සාකං නයනාභ්‍යාං ශ්ලක්ෂ්ණෞ දන්තාඃ, සාර්ධං ධනිනා ධෘතඃ සාධුඃ, සමං ශිෂ්‍යාභ්‍යාමධීතෙ, සමං ශිෂ්‍යෙණ ගුරුණා භුජ්‍යතෙ.

---

a සහ සදෘශං සාකං සාර්ධං සමම් ඉති,' සහ සදෘශං සාකං සාර්ධං සමම්" යන මොහු; සහාදයඃ, සහාදීහුයි. ගුරුඃ, ගුරුතෙම; ශිෂ්‍යෙණ සහ,ශිෂ්‍යයා සමග; ආගතඃ, ආයේය.-(මෙහි "ශිෂ්‍යෙණ" යනු "සහ" යොගයෙහි තෘතීයායි) චෛත්‍රඃ, චෛත්‍රනම් තැනැත් තේ;මෛත්‍රෙණ සදෘශඃ, මෛත්‍රනම් තැනැත්තහු සමානයි.(මෙහි "මෛත්‍රෙණ" යනු "සදෘශ" යොගයෙහි තෘතීයායි). දන්තාඃ; දත්; නයනාභ්‍යාං සාකම් නෙත් දෙක සමග; ශ්ලක්ෂ්ණාඃ,ස්නිග්ධ වෙත් හෙවත් මනොඥ වෙත්. (මෙහි 'නයනාභ්‍යාම්" යනු "සාකම්" යන නිපාතයොගයෙහි තෘතීයායි). සාධුඃ, සත්පුරුෂ තෙම; ධනිනා සාර්ධම්, ධනවත්හු සමග; ධෘතඃ, ධරණලද්දේය, හෙවත් එක්කොට ගන්නාලද්දේය. (මෙහි "ධනිනා" යනු "සාර්ධම්" යන නිපාතයොගයෙහි තෘතීයායි). ශිෂ්‍යාභ්‍යාං සමම්, ශිෂ්‍යයන් දෙදෙනා සමග; අධීතෙ, හදාරයි. මෙහි "ශිෂ්‍යාභ්‍යාම්" යනු "සමම්" යන නිපාතයොගයෙහි තෘතීයායි). ගුරුණා, ගුරුහු විසින්; ශිෂ්‍යෙණ සමම්, ශිෂ්‍යයා සමග; භුජ්‍යතෙ, අනුභවකරණු ලැබේ).

මෙහි"සහ"ශබ්දාදීන්ගේ යොගය දෙදෙනෙකුසම්බන්ධවූවත් ඒ දෙතන්හිම තෘතීයාව නොව එකෙකුකෙරෙහි වේයයි දක්වනු පිණිස "අප්‍රධානෙ" යනු කීහු. එනම් ඒදෙදෙනාගෙන් අප්‍රධානයාකෙරෙහිම තෘතීයාව වේය යනුයි. ඒ ප්‍රධානත්වය හෝ අප්‍රධානත්වය කෙසේ වේදයත්? සහාදිසම්බන්ධය ඇතිදෙදෙ නෙකු අතුරෙන් යමෙක් අතිශයින් ක්‍රියාව ඇසුරුකෙරේ නම් ඒ ප්‍රධාන වේ. ඊට අනුකූලව පවත්නේ අප්‍රධානවේ එනම්–' සහ ශිෂ්‍යෙණාගතො ගුරුඃ'' යනතන්හි ආගමනක්‍රියායෙහි මුඛ්‍යත්ව යෙන් අතිශයින් ඒ ක්‍රියාව ඇසුරුකොට පැවැත්තේ ගුරුතෙමේයි. එබැවින් ගුරුතෙමේ ප්‍රධාන වේ. ශිෂ්‍යයා වනාහි ඊට අනුකූලව පැවැති බැවින් ගුරුහුට වඩා අප්‍රධාන වේ, එබැවින් අප්‍රධාන තන්හි තෘතීයායි. එසේම 'තිලෛඃ සහ මාෂාන් වපති"යි කී කල්හි කර්‍ෂකහට මුඛ්‍යත්වයෙන් අතිශයින් අභිමතවූයේ මාෂ වපනය බැවින් එහි "මාෂ" ශබ්දය ප්‍රධාන වේ. තිලවපනය වනාහි

a "අශිෂ්ටව්‍යවහාරෙ දාණඃ ප්‍රයොගෙ චතුර්ථ්‍යර්ථෙ තෘතීයා" දාස්‍යා සංයච්ඡතෙ කාමුකඃ, ධර්මේ තු භාර්‍ය්‍යායෛ සංයච්ඡති.

b "වාරණාර්ථයොගෙ තෘතීයා" අලං විවාදෙන.

එසේ මුඛ්‍යත්වයෙන් අනභිමත බැවින් "තිල" ශබ්දය අප්‍රධාන වේ. එබැවින් එහි සහ යොගයෙහි තෘතීයායි. යම්හෙයකින් මෙහි තිලවපනය කර්‍ෂකහට මුඛ්‍යත්වයෙන් අතිශයින් අභිමතවූවොත් එකල්හි 'මාෂ" ශබ්දය අප්‍රධානව "මාෂෛඃ සහ තිලාන් වපති" කියා වේ. ඇතැම්කෙනෙක් මේ සහාදීන්ගේ ශබ්ද සම්බන්ධය (ශබ්දවශයෙන් යෙදීම) ප්‍රධානයයිද, අර්ථසම්බන්ධය (අර්ථවශයෙන් යෙදීම) අප්‍රධානයයි ද කියත්. එනම් යථොක්ත උදාහරණයෙහි ගුරුහුගේ ආගමන ක්‍රියාව හා "සහ" ශබ්දයාගේ සම්බන්ධය ශබ්ද සම්බන්ධයයි ද, ශිෂ්‍යශබ්දය හා සම්බන්ධය අර්ථසම්බන්ධයයි ද කීහු. සමහර තන්හි "සහ" ශබ්දාදීන්ගේ යොගය නැතත් ඔවුන්ගේ අර්ථවිවක්‍ෂාව ඇති කල්හි තෘතීයාව වේයයි ද කීහු. එය "වෘද්ධො යූනා" යනාදි සූත්‍රනිර්දේශ හෙයින් යයි ද කීහු. එනම් මෙහි "යූනා" යනු සහාර්ථවිවක්‍ෂාවෙහි තෘතීයායි.

a අශිෂ්ටව්‍යවහාරෙ අශිෂ්ටයන්ගේ ව්‍යවහාරයෙහි; හෙවත් සංකීර්ණාචාර ඇත්තවුන්ගේ ක්‍රියායෙහි; දාණඃප්‍රයොගෙ, "දාණ්" ධාතුහුගේ ප්‍රයොගය ඇතිකල්හි; චතුර්ථ්‍යර්ථෙ, චතුර්ථීවිභක්ත්‍යර්ථ යෙහි; තෘතීයා, තෘතීයා විභක්තිය වේ. කාමුකඃ කාමුක තැනැත් තේ: දාස්‍යා, දාසියට; සංයච්ඡතෙ, (කැමැත්ත) දෙයි. (මෙහි අශිෂ්ට ව්‍යවහාරයෙහි "දාණ්" ධාතුයොගය බැවින් "දාස්‍යා" යනු චතුර්ථ්‍යර්ථෙ තෘතීයායි.) ධර්මේ තු, ධර්මව්‍යවහාරයෙහි වනාහි; (තෘතීයා නොව චතුර්ථිය වේ. එනම්) භාර්‍ය්‍යායෛ, භාර්‍ය්‍යාවට; සංයච්ඡති, කැමැත්ත දෙයි. (කියාවේ.)

මෙහි කී අශිෂ්ටව්‍යවහාරය නම් අන්‍යවාංශිකයෙකු විසින් අන්‍යවාංශිකස්ත්‍රියක් හා කරණලද ජාතිසම්භේදක්‍රියාවයි. "දාණ්" ධාතුව පරස්මෛපදීවූවත් අශිෂ්ටව්‍යවහාරයෙහි "සම්" පූර්ව "දාණ්" ධාතුව ආත්මනෙපදී වේ.

b වාරණාර්ථයොගෙ, නිෂේධාර්ථනිපාතයොගයෙහි; තෘතීයා, තෘතීයාවිභක්තිය වේ. විවාදෙන, විරුද්ධවාදයෙන්; අලම්, කම්

a "නමඃස්වස්තිස්වාහාස්වධාලංවෂඩ්යොගෙ චතුර්ථී"– නමො නාරායණාය, ස්වස්ති රාඥෙ, සොමාය ස්වාහා, පිතෘභ්‍යඃ ස්වධා, අලං මල්ලො මල්ලාය, වෂඩින්ද්‍රාය.

b "රුච්‍යර්ථානාම්ප්‍රියමාණඃ"

නැත. (මෙහි "අලම්' යන වාරණාර්ථනිපාතයොගයෙහි "විවාදෙත" යනු තෘතීයායි. "ප්‍රකෘත්‍යාදිභ්‍යශ්ච" යනාදියෙන් කී තෘතීයාභෙද ද මෙහි සහාදිවිධානයෙහි ඇතුළත් වෙති.) මෙසේ සූත්‍රොක්ත "සහ" යන්න ආදිකොට ඇත්තවුන්ගේ යොගයෙහි තෘතීයාව දක්වා නැවත "නමස්" යන්න ආදිකොට ඇත්තවුන්ගේ යොගයෙහි චතුර්ථිය දක්වන්නාහු "නමඃ ස්වස්ති" යනාදිය කීහු

a නමස්වස්තිස්වාහා ස්වධාලංවෂඩ්යොගෙ, "නමස් ස්වස්ති ස්වාහා ස්වධා අලං වෂට්' යන මේ නිපාතයන්ගේ යොගයෙහි; චතුර්ථී, චතුර්ථීවිභක්තිය වේ. නාරායණාය, විෂ්ණුහට; නමඃ, නමස්කාර වේවා. (මෙහි "නාරායණාය" යනු "නමස්" නිපාතයොගයෙහි චතුර්ථීයි). රාඥෙ, රජහට; ස්වස්ති යහපත වේවා; (මෙහි "රාඥෙ" යනු "ස්වස්ති" නිපාතයොගයෙහි චතුර්ථීයි). සොමාය, චන්ද්‍රයාට; ස්වාහා, "ස්වාහා" කියා පිදියයුතුයි; (මෙහි "සොමාය" යනු "ස්වාහා" යොගයෙහි චතුර්ථීයි) පිතෘභ්‍යඃ, පිතෘදෙවතාවුන්ට (ළඟිය මුතුන්මුත්තන්ට); ස්වධා, "ස්වධා' කියා පිදියයුතුයි. (මෙහි "පිතෘභ්‍යඃ" යනු 'ස්වධා" යොගයෙහි චතුර්ථීයි). මල්ලඃ, මල්ලතෙමේ; මල්ලාය, මල්ලයාට; අලම්, සමර්ථවේ. (මෙහි 'මල්ලාය' යනු 'අලම්" යොගයෙහි චතුර්ථීයි) ඉන්ද්‍රාය ශක්‍රයාට, වෂට්, "වෂට්" කියා පිදිය යුතුයි. (මෙහි "ඉන්ද්‍රාය" යනු "වෂට්" යොගයෙහි චතුර්ථීයි).

"නාරායණං නමස්කෘත්‍ය" යනාදී තන්හි "නමස්' යොගය ඇතත් චතුර්ථීවිභක්තිය නොව ද්විතීයාව වේ. ඒ උපපදවිභක්තෙඃ කාරකවිභක්තිර්ගරීයසී" යන න්‍යායහෙයිනි. එනම් උපපද වශයෙන් යෙදෙන විභක්තියට වඩා කාරක වශයෙන් යෙදෙන විභක්තිය ඉතා බලවත්යයි කී හෙයින් මෙහිද "නමස්කෘත්‍ය" යන පූර්වක්‍රියාවට "නාරායණ" ශබ්දයාගේ කර්මත්වය වීම බලවත් වේ. තවද මෙහි කී "අලම්" යන්නෙන් ශක්ත්‍යර්ථවූ "අලං ශක්ත ප්‍රභු සමර්ථ පර්‍ය්‍යාප්ත" යන මේ ආදීහු ගැණුලැබෙත්.

b රුච්‍යර්ථානාම්, රුචිය අර්ථකොට ඇති ධාතූන්ගේ යොගයෙහි; ප්‍රියමාණඃ, පිණවනුලබන අර්ථය (සම්ප්‍රදාන නම් වේ).

a රුච්‍යර්ථානාං ධාතූනාං ප්‍රයොගෙ ප්‍රියමාණොර්ථඃ සම්ප්‍රදානං ස්‍යාත්. හරයෙ රොචතෙ භක්තිඃ.

d "ඍතෙආදියොගෙ පඤ්චමී"–"ඍතෙ අන්‍යඃ ආරාත් ඉතරඃ අඤ්චූත්තරපදං දිග්වාචකඃ ශබ්දඃ ආහි ආච්" එතෙ ඍත ආදයඃ, අන්‍යශබ්දො නානාර්ථො ග්‍රාහ්‍යතෙ. ඍතෙ ඥානාන්න මුක්තිඃ, අන්‍යො කෘෂ්ණාද්විහාරඃ, ආරාද් වනාත්, ඉතරො ග්‍රාමාත්, "ඍතෙයොගෙ ද්විතීයාපි" ඥානම් ඍතෙ, චකාරා විනාදියොගෙ තෘතීයාපඤ්චම්‍යෞ ස්තඃ; විනා ඥානාත්, ඥානෙන විනා

---

a රුච්‍යර්ථානාං ධාතූනාම්, රොචනාර්ථධාතූන්ගේ; ප්‍රයොගෙ, ප්‍රයොගයෙහි; ප්‍රියමාණඃ අර්ථඃ, ප්‍රිය කරණු ලබන අර්ථය; සම්ප්‍රදානං ස්‍යාත්, සම්ප්‍රදාන නම් වන්නේය. භක්තිඃ, භක්ති තොමෝ; හරයෙ විෂ්ණුහට; රොචතෙ, රුචි කෙරේ. (මෙහි "හරයෙ" යනු රොචනාර්ථ ධාතුයොගයෙහි චතුර්ථීයි.)

මේ සූත්‍රය ද පාණිනියෙන් ගෙණ සංගෘහීතයි, මෙහි කියන ලද්දේ අන්‍යකර්තෘකවූ රොචනාර්ථධාතුයොගයෙහි තත්ප්‍රියමාණ කර්මය සම්ප්‍රදාන වේ යනුයි. මෙහි "භක්තිඃ"යි අනෙකක් කර්තෘ කොට ඇත්තාවූ "රොචතෙ" යන රොචනාර්ථධාතුක ක්‍රියා යොගය බැවින් තත්ප්‍රියමාණකර්මයවූ හරිශබ්දය සම්ප්‍රදාන විය. 'දෙවදත්තාය රොචතෙ මොදකඃ පථි" යන තන්හි මොදක සඞ්ඛ්‍යාත භොජන විශෙෂය විසින් පිණවනු ලබන්නහු දෙවදත්තයා බැවින් "දෙවදත්තායාය"යි සම්ප්‍රදාන විය. පථය වනාහි පිණවනු නොලබන බැවින් සම්ප්‍රදාන නොවිය. මෙසේ "නමස්" යන්න මුල්කොට ඇත්තවුන්ගේ යොගයෙහි සම්ප්‍රදාන ලක්ෂණ දක්වා "ඍතෙ" යනාදීන්ගේ යොගයෙහි පඤ්චමී හෙද දක්වන්නාහු "ඍත ආදි යොගෙ" යනාදිය කීහු.

b ඍත ආදියොගෙ, "ඍතෙ" යනාදී ශබ්දයන්ගේ යොගයෙහි; පඤ්චමී, පඤ්චමී විභක්තිය වේ ඍතෙ, 'ඍතෙ" යන නිපාතය; අන්‍යඃ, "අන්‍ය" ශබ්දය, ආරාත්, "ආරාත්" යන නිපාතය; ඉතරඃ, "ඉතර" ශබ්දය; අඤ්චූත්තරපදම්, අඤ්චු ධාතුව උත්තර පද කොට ඇත්තය; දිග්වාචකඃ ශබ්දඃ දිශාවාචක ශබ්දය; ආහි, "ආහි" ප්‍රත්‍යයාන්ත නිපාතය; ආච්, "ආච්" ප්‍රත්‍යයාන්ත නිපාතය (යන); එතෙ, මොහු; ඍත ආදයඃ, ඍතෙ යනාදීහුයි. අන්‍යශබ්දෙන,

අන්‍යශබ්දයෙන්; අන්‍යාර්ථාඃ, අන්‍යශබ්දයාගේ අර්ථ ඇත්තාහු; ගෘහ්‍යතෙන, ගණු ලැබෙත් ඥානාත් ඍතෙ, ඥානයෙන් වෙන්ව; නමුක්තිඃ, මොක්ෂයක් නැත්තේය. (මෙහි "ඥානාත්" යනු "ඍතෙ" යොගයෙහි පඤ්චමීයි). විහාරඃ, විහාරය නොහොත් බෞද්ධ දෙවාලය; ගෘහාත්, ගෘහයෙන්; අන්‍යඃ, අනෙකක් වේ. (මෙහි 'ගෘහාත්' යනු "අන්‍ය" යොගයෙහි පඤ්චමීයි). වනාත්, වනයෙන්; ආරාත්, දූර හෝ සමීපයයි. (මෙහි "වනාත්" යනු "ආරාත්" නිපාත යොගයෙහි පඤ්චමීයි) ග්‍රාමාත්, ගමින්; ඉතරඃ, වෙන්වූවක් වේ. (මෙහි "ග්‍රාමාත්" යනු ඉතර ශබ්ද යොගයෙහි පඤ්චමීයි). ඍතෙ යොගෙ, "ඍතෙ" යන නිපාත යොගයෙහි; ද්විතීයා ච, ද්විතීයාව ද වේ. ඥානම් ඍතෙ, ඥානය හැර. (මෙහි "ඥානම්" යනු "ඍතෙ" යොගයෙහි ද්විතීයායි) චකාරාත්, ච ශබ්දයෙන්; විනායොගෙ, "විනා" යන නිපාත යොගයෙහි, තෘතීයා පඤ්චම්‍යෞ ස්තඃ, තෘතීයා පඤ්චමී දෙදෙන වෙත්. ඥානාත් විනා, ඥානයෙන් වෙන්ව (යනුද); ඥානෙන විනා, 'ඥානෙන විනා" යනුද උදාහරණයි; එම අර්ථයි. (මෙහි "විනා" යොගයෙහි පඤ්චමිය හා තෘතීයායි).

මෙහි "ඍතෙ" යොගාදිය පිළිබඳව පාණිනියෙහි "අන්‍යාරාදි තරතේදික් ශබ්දාඤ්චූත්තරපදාජාහියුක්තෙ" යන සූත්‍රය හදුරණ ලදී. සිද්ධාන්තකෞමුදී සරලාටීකාවෙහි- මෙහි අන්‍යග්‍රහණය භෙදාර්ථක ශබ්ද මාත්‍රග්‍රහණය පිණිස යයි ද. ඉතරශබ්දග්‍රහණය ප්‍රපඤ්චය (විස්තර විශයෙන් දැක්වීම) පිණිස යයි ද කියනලදී, තද් විස්තරය නම් ඉතරග්‍රහණයෙන් නිපාතභින්නභෙදාර්ථක ශබ්ද යන්ගේ ගැණීමයි, එහෙයින් "ස්වාද් භින්නඃ" යනාදියෙහි භෙදාර්ථක "භින්න" ශබ්දයොගය හෙයින් පචමිය වේ. "ස්වඃ පටො න" යන තන්හි 'නඤ්' නිපාතය භින්නාර්ථවූවත් නිපාත බැවින් තද්‍යොගයෙහි පචමිය නොවිය. "පෘථක්" නිපාතාදිය වනාහි 'ස්වර්' ආදිය හෙයින් නිපාතත්වය නොවන්නෙන් තද්‍යොගයෙහි විකල්පයෙන් පචමිය වේ. "ප්‍රාක් ප්‍රත්‍යග්වා ග්‍රාමාත්, චෛත්‍රාත් පූර්වඃ ඵාල්ගුනඃ, දක්ෂිණාහි ග්‍රාමාත්, දක්ෂිණා ග්‍රාමාත්" යනු අංචූත්තර පදාදියොගයන්ට උදාහරණයි.

සූත්‍රොක්ත 'ඍතෙ" යනාදීන්ගේ යොගයෙහි පචමී විභක්තිය දක්වා නැවත නිර්ධාරණාර්ථාදියෙහි ෂෂ්ඨී විභක්තිය දක්වන්නාහු "නිර්ධාරණෙ" සූත්‍රාදිය කීහු.

*** a "නිර්ධාරණෙ ෂෂ්ඨීසප්තම්‍යෞ" නිර්ධාරණං ක්‍රියාගුණ ජාතිභිඃ සමුදායාත් පෘථක්කරණම්, තත්‍ර ෂෂ්ඨී සප්තමී ච. ක්‍රියා පරාණාං භගවදාරාධකඃ, ශ්‍රෙෂ්ඨඃ, ක්‍රියාපරෙෂු වා ; ගවාං කෘෂ්ණා සම්පන්නක්ෂීරා, ගොෂු වා ; එතෙෂාං ක්ෂත්‍රියඃ ශූර තමඃ, එතෙෂු වා.**

a නිර්ධාරණෙ, නිර්ධාරණාර්ථයෙහි නොහොත් නිර්ධාරණ යොගයෙහි; ෂෂ්ඨීසප්තම්‍යෞ, ෂෂ්ඨී සප්තමී දෙක වෙත්. නිර්ධාරණම්, නිර්ධාරණ නම්; ක්‍රියාගුණජාතිභිඃ, ක්‍රියා ගුණ ජාතිවලින් (විශිෂ්ටවූ එක්දෙසක්හුගේ); සමුදායාත්, (සවසපිත ජාත්‍යාදියෙන් විශිෂ්ටවූ) සමූහයකින්; පෘථක්කරණම්, වෙන් කිරීමයි. තත්‍ර, ඒ (සමූහවාචක) ශබ්දයෙහි; ෂෂ්ඨී, ෂෂ්ඨී විභක්තිය ද; සප්තමී ච, සප්තමී විභක්ති යද වේ. ක්‍රියාපරාණාම්, ක්‍රියාවන්හි තත්පරවූවන් අතුරෙන්; භගවදාරාධකඃ, පරමෙශ්වරාරාධනය කරන්නේ; ශ්‍රෙෂ්ඨඃ, ශ්‍රෙෂ්ඨ වේ. ක්‍රියාපරෙෂු වා, 'ක්‍රියාපරෙෂු" කියා සප්තමී හෝ වේ. (මෙහි 'ක්‍රියාපරාණාම්" යන තන්හි ද "ක්‍රියාපරෙෂු" යන තන්හි ද ක්‍රියාවිශිෂ්ටත්වයෙන් නිර්ධාරණයෙහි ෂෂ්ඨිය හා සප්තමී

* ඈනම් සාරස්වතයන්හි:-

"යතශ්ච නිර්ධාරණම්"

"ද්‍රව්‍යගුණක්‍රියාජාතිභිඃ සමුදායාත් පෘථක්කරණං යතඃ තත්‍ර ෂෂ්ඨීසප්තම්‍යෞ ස්තඃ. නවනාං මධ්‍යෙ යො දණ්ඩී ස ආයාතු, නවත්සු වා, ගවාං ගොෂු වා කෘෂ්ණා ගෞඃ සම්පන්නක්ෂීරා, ක්‍රියාපරාණාං භගවදාරාධකඃ ශ්‍රෙෂ්ඨඃ, ක්‍රියාපරෙෂු වා, එතෙෂාං එතෙෂු වා ක්ෂත්‍රියඃ ශූරතමඃ" යනු දක්නා ලැබේ.

"යතඃ ච, යම් සමූහයකින් ද; නිර්ධාරණම්, (යම් එක්දෙසක්හුගේ) වෙන් කිරීමක් වේ නම් ඒ සමූහවාචකයා කෙරෙන් ෂෂ්ඨී සප්තමී දෙක වෙත්" යනු මෙහි සූත්‍රාර්ථයි. "ද්‍රව්‍යගුණක්‍රියාජාතිභිඃ, ද්‍රව්‍යගුණක්‍රියාජාතිවලින් (විශිෂ්ට වූ එකදෙශයක්හුගේ); යතඃ සමුදායාත්, (සවසපිත ද්‍රව්‍යාදියෙන් විශිෂ්ටවූ යම් සමුදායකින්; පෘථක්කරණම්, වෙන්කිරීමක් වේ ද; තත්‍ර, එහි; ෂෂ්ඨී සප්තම්‍යෞ ස්තඃ, ෂෂ්ඨී සප්තමී දෙක වෙත්" යනු මෙහි වෘත්තියෙහි අර්ථයි. "නවනාං මධ්‍යෙ, නවතුන් අතරෙහි;යඃ, යමෙක් තෙම;දණ්ඩී, දඬු ඇත්තේ ද; සඃ, හෙතෙම; ආයාතු, ඒවා" යනු මේ යට කියන ලද උදාහරණවලින් වෙනස්වූ උදාහරණයෙහි අර්ථයි. සෙස්ස කීපරිදියි.

"යතශ්ච නිර්ධාරණම්" යනු පාණිනීය සූත්‍රයි. ඊට සිද්ධාන්තකෞමුදියෙහි "ජාති ගුණක්‍රියාසංඥාභිඃ සමුදායාදෙකදෙශස්‍ය පෘථක්කරණං යතස්තතඃ ෂෂ්ඨී සප්තම්‍යෞ ස්තඃ. නෘණාං නෘෂු වා බ්‍රාහ්මණඃ ශ්‍රෙෂ්ඨඃ, ගවාං ගොෂු වා කෘෂ්ණා බහුක්ෂීරා, ගච්ඡතාං ගච්ඡත්සු වා ධාවන්තඃ ශීඝ්‍රාඃ, ජාත්‍රාණාං ජාත්‍රෙෂු වා මෛත්‍රඃ පටුඃ"යි ව්‍යාඛ්‍යාතෝදාහරණ කරණලදී,මෙහි "ජාත්‍රාණාම් ජාත්‍රෙෂු" යනු සංඥා විශිෂ්ටත්වයෙනි,

යයි. ගවාම්, දෙනුන් අතුරෙන්; කෘෂ්ණා, කළුදෙන් තොමෝ; සම්පන්නක්ෂීරා, සමෘද්ධවූ කිරි ඇත්තීය හෙවත් බොහෝ කිරි ඇත්තීය. ගොෂු වා "ගොෂු" කියා සප්තමී හෝ වේ. (මෙහි "ගවාම්" යන තන්හි හා "ගොෂු" යන තන්හි ගුණවිශිෂ්ටත්වයෙන් නිර්ධාරණයෙහි ෂෂ්ඨිය හා සප්තමියයි). එතෙෂාම්, මෙවුන් අතුරෙන් හෙවත් මේ සජ්ජාතිකයන් අතුරෙන්; ක්ෂත්‍රියඃ, ක්ෂත්‍රියතෙම; ශූරතමඃ, අතිශයින් ශූර වේ. එතෙෂු වා, "එතෙෂු" කියා සප්තමී හෝ වේ. (මෙහි "එතෙෂාම්" යන තන්හි හා "එතෙෂු" යන තන්හි ජාතිවිශිෂ්ටත්වයෙන් නිර්ධාරණයෙහි ෂෂ්ඨිය හා සප්තමියයි).

මෙහි නිර්ධාරණය නිර්වචන නයින් විස්තරකරන්නාවූ ලඝු භාෂ්‍යකාරයෝ "නිතරාං ධාර්‍ය්‍යතෙ ජාතිගුණක්‍රියාසංඥාභිඃ පෘථක්කෘත්‍යාවධාර්‍ය්‍යතෙනෙන හෙතුනාසෞ නිර්ධාරණඃ" යනු කීහු. මේ හෙතුකොටගෙණ ජාතිගුණක්‍රියාසංඥාවලින් (විශිෂ්ටවූ) යමක් වෙන්කොට දරණුලැබේ නම් හේ නිර්ධාරණ යනු මෙහි අර්ථයි. තවත් "ජාතිගුණක්‍රියාසංඥාභිඃ සමුදායාදෙකදෙශස්‍ය පෘථක්කරණං නිර්ධාරණම්, තදස්ති සාධ්‍යත්වෙනාස්‍යෙති=නිර්ධාරණඃ" යනුද කීහු. ජාත්‍යාදී විශිෂ්ටත්වයෙන් සමූහයකින් එක්දෙසක්හුගේ වෙන්කිරීම සාධ්‍යත්වයෙන් යමක්හට ඇත්නම් ඒ නිර්ධාරණය යනු එහි අර්ථයි. මෙයින් නිර්ධාරණයෙහි හෙතුත්වය ප්‍රකාශිතයි. මෙසේ කියනලද්දේ ඇතම්තන්හි නිර්ධාරණාර්ථයෙහි ෂෂ්ඨී සප්තමී දෙක වෙත්යයි ප්‍රකාශිත බැවින් ස්වමතය තත්ප්‍රතිපක්ෂ බැව් දක්වනු පිණිසයි තත්ස්වමතය විස්තරකරන්නාහු නිර්ධාරණයෙහි–"නිර්ධාරණාශ්‍රය, නිර්ධාරණහෙතු, නිර්ධාර්‍ය්‍යමාණ" යයි තුණක් යුක්තබව ද, ඉන් නිර්ධාරණහෙතුහු කෙරෙන් හෝ නිර්ධාර්‍ය්‍යමාණයා කෙරෙන් යථොක්ත විභක්ති නොවන බවද, නිර්ධාරණාශ්‍රයා කෙරෙන් වනබවද කීහු. එනම්–"නෘණාං ද්විජඃ ශ්‍රෙෂ්ඨඃ" යන තන්හි "නෘණාම්" යනු නිර්ධාරණාශ්‍රයයි, "ද්විජඃ" යනු නිර්ධාර්‍ය්‍යමාණයි, "ශ්‍රෙෂ්ඨඃ" යනු නිර්ධාරණ හෙතුයි. නිර්ධාරණාර්ථයෙහි යයි කීකල්හි මින් කවරක්කෙරෙන් ෂෂ්ඨිය වේදැයි නොහැගෙන බවද, යොගයෙහියයි කීකල්හි නිර්ධාරණ හෙතුයොගයෙහි තදාශ්‍රයාකෙරෙන් ෂෂ්ඨිය වේයයි ගතහැකිබවද කීහු. තවද පූර්වොක්ත "විනා" යනාදි සූත්‍රයෙහි මෙන්ද සමාසාන්ත තෘතීයාන්ත ආදිශබ්දය එහි "නිර්ධාරණ" යන්න සමගද සම්බන්ධ බැවින් යොගයෙහි යයි කීම යුක්තයයි කීහු "විනා" යනාදි සූත්‍රක්‍රමයෙහි ලා මෙහි ප්‍රධානවශයෙන් ෂෂ්ඨී විභක්තියද එහි චශබ්දයෙන්

a "ස්වාම්‍යාදිභිශ්ච ෂෂ්ඨීසප්තම්‍යෞ භවතඃ" ගොෂු ස්වාමී, ගවාං ස්වාමී, ගවාමධිපතිඃ ගොෂ්වධිපතිඃ.

262. කර්තෘකාර්‍ය්‍යයොරක්තාදෞ කෘති ෂෂ්ඨී.

(කර්තෘකාර්‍ය්‍යයොඃ 7, 2; අක්තාදෞ 7, 1, කෘති 7, 1; ෂෂ්ඨී)

b කර්තරි කාර්‍ය්‍යෙ ච ෂෂ්ඨීවිභක්තිර්භවති ක්තාදිවර්ජිතෙ කෘදන්තෙ ශබ්දෙ ප්‍රයුජ්‍යමානෙ, ව්‍යාසස්‍ය කෘතිඃ, (ව්‍යාසකර්තෘකා කෘතිරිත්‍යර්ථඃ) භාරතස්‍ය ශ්‍රවණම්.

සප්තමියද ගතයුතුයි. "නිර්ධාරණ" යන්න හා සම්බන්ධ ආදිශබ්දයෙන් වක්ෂ්‍යමාණ හෙතු යොගාදිය ගතයුතුයි මෙසේ නිර්ධාරණාදියෙහි විහිත ෂෂ්ඨියද (සප්තමියද) දක්වා නැවත ස්වාම්‍යාදි යොගයෙහි සප්තමියද (ෂෂ්ඨියද) දක්වන්නාහු "ස්වාම්‍යාදිභිශ්ච" යනාදිය කීහු.

a ස්වාම්‍යාදිභිශ්ච, "ස්වාමින්" ශබ්දාදීන් හා යොගයෙහිද; ෂෂ්ඨීසප්තම්‍යෞ භවතඃ, ෂෂ්ඨී සප්තමී දෙක වෙත්. ගොෂු, ගොනුන් කෙරෙහි (හෙවත් ගොනුන්ගේ); ස්වාමී, හිමිතෙමේයි; ගවාම්, ගොනුන්ගේ; ස්වාමී, හිමිතෙමේයි; (මෙහි "ගොෂු ගවාම්" යනු "ස්වාමින්" යොගයෙහි සප්තමිය හා ෂෂ්ඨියයි) ගවාම්, ගොනුන්ගේ අධිපතිඃ, අධිපතිතෙමේයි "ගොෂු අධිපතිඃ" යනුද එම අර්ථයි. (මෙහි අධිපති යොගයෙහි ෂෂ්ඨිය හා සප්තමියයි). ("ස්වාමීශ්වරාධිපතිදායාද සාක්ෂිප්‍රතිභූප්‍රසූතෛශ්ච" යනු මේ පිළිබඳ පාණිනීය සූත්‍රයි. එබැවින් මෙහි ආදි ශබ්දයෙන් මේ ඊශ්වරාදීන්ගේ යොගයෙහිද "ගවාමීශ්වරඃ" යනාදි උදාහරණද ගතයුතුයි. (මෙසේ ස්වාම්‍යාදි යොගයෙහි සප්තමිය හා ෂෂ්ඨිය දක්වා නැවත කර්තෘකර්මාර්ථයන්හි ෂෂ්ඨිය දක්වන්නාහු "කර්තෘකාර්‍ය්‍යයොඃ" යනාදිය කීහු.

262 අක්තාදෞ ක්තප්‍රත්‍යයාදිය තොරකොට ඇත්තාවූ; කෘති, කෘදන්තය ඇති කල්හි කර්තෘකාර්‍ය්‍යයොඃ, කර්ත්‍රාර්ථ කර්මාර්ථ දෙක්හි, ෂෂ්ඨී, ෂෂ්ඨී විභක්තිය වේ.

b ක්තාදිවර්ජිතෙ, "ක්ත" ප්‍රත්‍යයාදියෙන් තොරවූ; කෘදන්තෙ ශබ්දෙ, කෘදන්ත ශබ්දයක්; ප්‍රයුජ්‍යමානෙ, ප්‍රයොගකරණු ලබන කල්හි; කර්තරි, කර්ත්‍රාර්ථයෙහිද; කාර්‍ය්‍යෙ ච, කර්මාර්ථයෙහිද; ෂෂ්ඨී විභක්තිඃ භවති, ෂෂ්ඨී විභක්තිය වේ. ව්‍යාසස්‍ය, ව්‍යාසඍෂිහුගේ; කෘතිඃ රචනාවයි (මෙහි "කෘති" යන "ක්ති" ප්‍රත්‍යයාන්ත කෘදන්ත

a "උභයප්‍රාප්තෞ කර්මණි"

b උභයෝඃ ප්‍රාප්තිර්යස්මින් කෘති තත්‍ර කර්මණ්‍යේව ෂෂ්ඨී ස්‍යාත්. චිත්‍රං ගවාං දෝහෝ'ගෝපේන.

යෝගයෙහි "ව්‍යාසස්‍ය' යනු කර්තෘඅර්ථයෙහි ෂෂ්ඨියයි) ව්‍යාසකර්තෘක වූ, ව්‍යාසයා කර්තෘකොට ඇත්තාවූ; කෘතිඃ ඉති, කෘතිය යන; අර්ථඃ, අර්ථයි; භාරතස්‍ය ශ්‍රවණම්, භාරතය ඇසීමයි; (මෙහි "ශ්‍රවණම්" යන "ල්‍යුට්' ප්‍රත්‍යයාන්ත කෘදන්ත යෝගයෙහි "භාරතස්‍ය" යනු කර්මාර්ථයෙහි ෂෂ්ඨියයි) මෙහි "කතාදේශ" යන්නෙන් ප්‍රකාශිත කතාදීහු නම්– "ක්ත ක්තවතු ශතෘ ශාන කවසු කාන කි උ ඉෂ්ණු උක ක්ත්වා කැප් තුම් ණම් (ඛලර්ථ ශීලාර්ථ) තෘච් ඛල් ල්‍යු" යන මේ ආදීහුයි. මෙකී කෘද්‍යොගයෙහි ෂෂ්ඨිය නොවේ. වක්ෂ්‍යමාණ "නලෝක" යනාදි පාණිනීය සූත්‍රයෙහි ද මේ ප්‍රකාශ වේ. මෙකී සාමාන්‍ය විධිය විශේෂකොට දක්වන්නාවූ වාර්තිකයෙහි "උභයප්‍රාප්තෞ කර්මණි" යන පාණිනීය සූත්‍රය හා තද්වෘත්තිය ද කීහු.

a උභයප්‍රාප්තෞ, කර්තෘ කර්මාර්ථ දෙදෙනාගේ පැමිණීම ඇති කල්හි; කර්මණි, කර්මාර්ථයෙහි ෂෂ්ඨී විභක්තිය වේ.

b යස්මින් කෘති, යම් කෘද්‍යොගයෙක්හි; උභයෝඃ, කර්තෘ කර්මාර්ථ දෙදෙනාගේ; ප්‍රාප්තිඃ, පැමිණීම වේ ද; තත්‍ර, එහි; කර්මණි එව, කර්මාර්ථයෙහිම; ෂෂ්ඨී ස්‍යාත්, ෂෂ්ඨී විභක්තිය වන්නීය. අගෝපේන, ගොපල්ලකු නුවූවෙකු විසින්; ගවාම්, දෙනුන්; දෝහඃ, දෙවීම; චිත්‍රම්, ආශ්චර්‍ය්‍ය වේ. (මෙහි "දෝහඃ" යන "ඝඤ්" ප්‍රත්‍යයාන්ත කෘද්‍යොගයෙහි කර්තෘකර්මාර්ථවයෙහිම "කර්තෘකර්මණෝඃ" යනාදි සූත්‍ර විධානයෙන් ෂෂ්ඨිය පැමිණෙත්ම මෙයින් කර්තෘඅර්ථයෙහි ප්‍රතිෂිද්ධව "ගවාම්"යි කර්මාර්ථයෙහි පමණක් විය).

මුග්ධබෝධයෙහි මෙය සවිශේෂත්වයෙන් විධානකරන්නාහු "ල්‍යභාවක්තාසත්‍ර්‍යණකසසේ සෙ වා" යන සූත්‍රය කීහු. තව්‍යප්‍රත්‍යයාදිකෘදන්තයක් හෝ භාවාර්ථක්තප්‍රත්‍යයාන්තයක් හෝ ස්ත්‍රීලිඞ්ගයෙහි කරණලද අප්‍රත්‍යයාන්තය හා ණකප්‍රත්‍යයාන්තය යන දෙක හැර අන්‍යවූ ස්ත්‍රීලිඞ්ග විහිත සකර්මක කෘදන්තයක් හෝ යොදනුලබන කල්හි කර්තෘඅර්ථයෙහි ෂෂ්ඨී විභක්තිය විකල්පයෙන් වේ යනු එහි අර්ථයි. ඊට:-

"ත්වයා මම ච කෘෂ්ණෝර්ච්‍යඃ සනාතනං හ්‍යත්‍ර ස යස්‍ය තු,
කෘෂ්ටෙඃ කෘතිර්හෘතිර්යේන චිකීර්ෂා යස්‍ය හෙදිකා."

a "ස්මෘතෞ ච කායෙෂු"

යනු උදාහරණ කරණලදී. මෙහි "ත්වයා මම ච කෘෂ්ණෝර්ච්‍යඃ" යන තන්හි "අර්ච්‍යඃ" යන ක්‍යපාදි "ණ්‍යත්" ප්‍රත්‍යයාන්ත කෘද්‍යොගයෙහි "මම" යනු කර්තෘඅර්ථයෙහි ෂෂ්ඨියයි "ත්වයා" යනු විකල්පයෙන් නුවූතැනි. "අත්‍ර ත්වයා මම ච සනාතනං" යන තන්හි "සනාතනම්" යන භාවාර්ථ "ක්ත" ප්‍රත්‍යයාන්ත කෘද්‍යොගයෙහිද එසේයි. "යස්‍ය කෘෂ්ටෙඃ කෘතිඃ" යන තන්හි 'කෘතිඃ' යනු අණක ප්‍රත්‍යය වර්ජිත ස්ත්‍රීවිහිත ක්ති ප්‍රත්‍යයාන්ත සකර්මක කෘද්‍යොගය බැවින් "යස්‍ය" යනු කර්තෘඅර්ථයෙහි ෂෂ්ඨියයි. "යෙන කෘෂ්ටෙඃ හෘතිඃ" යන තන්හි 'හෘතිඃ' යනු එවැනි කෘද්‍යොගයෙහිම "යෙන"යි විකල්පයෙන් තෘතීයායි. දෙතන්හිම "කෘෂ්ටෙඃ" යනු කර්මාර්ථයෙහි ෂෂ්ඨියයි. "යස්‍ය කෘෂ්ටෙඃ චිකීර්ෂා" යන තන්හි "චිකීර්ෂා" යන ස්ත්‍රී විහිත "අ" ප්‍රත්‍යයාන්ත කෘද්‍යොගය බැවින්ද "යස්‍ය කෘෂ්ටෙඃ හෙදිකා" යන තන්හි "හෙදිකා" යන ස්ත්‍රීවිහිත "ණක" ප්‍රත්‍යයාන්ත කෘද්‍යොගය බැවින්ද "යස්‍ය"යි නිත්‍යයෙන් කර්තෘඅර්ථයෙහි ෂෂ්ඨී විය. මේ කෘද්‍යොගයෙහි විහිත ෂෂ්ඨීවිධානයෙහි නා නා මත භෙද ඇති බැවින් මුග්ධබෝධ ටීකාවෙහි:-

"අස්ත්‍රීවිහිත කෘද්භිස්තු යෝගෙ ෂෂ්ඨී නියම්‍යතෙ,
එකදා තූභයප්‍රාප්තෞ කර්මණ්‍යේව න කර්තරි,
තව්‍යා'දීනාං ප්‍රයොගෙ තු ද්වයොරෙව හි නෙෂ්‍යතෙ
කර්තුර්විභාෂයා කෛශ්චිත් කර්මණෝපි තථෙෂ්‍යතෙ
ප්‍රධානෙ නියතා ෂෂ්ඨී ගුණෙ තූභයථා භවෙත්"

යනු කීහු. ස්ත්‍රීලිඞ්ග වර්ජිත තන්හි කරණලද කෘද්‍යොගයෙහි කර්මාර්ථයෙහි ෂෂ්ඨිය නියමිත වේ. ඇතැම්විට කර්තෘඅර්ථකර්මාර්ථවයෙහි ෂෂ්ඨිය පැමිණිකල්හි කර්මාර්ථයෙහිම ෂෂ්ඨිය වේ. කර්තෘඅර්ථයෙහි නොවේ. තව්‍යප්‍රත්‍යාදීන්ගේ යෝගයෙහි කර්තෘඅර්ථ කර්මාර්ථවයෙහිම ෂෂ්ඨිය අනභිමත වේ. කිසිවෙකුන් විසින් කර්තෘඅර්ථයෙහිද කිසිවෙකුන් විසින් කර්මාර්ථයෙහිද විකල්පයෙන් අභිමත වේ. (විකර්මකකර්තෘකාරක කෘද්‍යොගයෙහිවූ කර්මවයෙන්) ප්‍රධාන කර්මයෙහි ෂෂ්ඨිය නියතයයි ද අප්‍රධාන කර්මයෙහි අනියතයයි ද යනු මෙහි අර්ථයි. තවද සමහරු මෙකී විකර්මක කර්තෘකාරක කෘද්‍යොගයෙහි ප්‍රධාන අප්‍රධාන කර්මවයෙහිම ෂෂ්ඨිය වේයයි ද, සමහරු ප්‍රධාන කර්මයෙහිම යයිද, සමහරු අප්‍රධාන කර්මයෙහි යයි ද, කීහු. එබැවින් ප්‍රයොගානුසාරයෙන් දතයුතුයි.

a ස්මෘතෞ ච, ස්මරණාර්ථ ධාතුයෝගයෙහිද; කායෙෂු, කර්මාර්ථයෙහි ෂෂ්ඨිය වේ.

a ස්මෘත්‍යර්ථස්‍ය ධාතොඃ ප්‍රයුජ්‍යමානෙ ච කර්මණි ෂෂ්ඨී භවති, මාතුඃ ස්මරති (මාතරං ස්මරතීත්‍යපි චකාරාද්) ඉති ක්වාපි. මාතරං ස්මරති.

b **“නලොකාව්‍යයනිෂ්ඨාඛලර්ථතෘනාම්”**

---

a ස්මෘත්‍යර්ථ ධාතොඃ, ස්මරණාර්ථ ධාතුවක්; ප්‍රයුජ්‍යමානෙ ච, ප්‍රයොගකරනුලබන කල්හිද; කර්මණි, කර්මාර්ථයෙහි; ෂෂ්ඨී භවති, ෂෂ්ඨී විභක්තිය වේ (මාතරම්, මව; ස්මරතීති සිහිකෙරේ යන; අර්ථ, අර්ථයෙහි;) මාතුඃ ස්මරති, “මාතුඃ ස්මරති” යනු වේ. චකාරාත්, චකාරයෙන්; මාතරං ස්මෘති, ‘මාතරං ස්මරති” කියාද වේ. (මෙහි චකාරයෙන් “දය ඊශ” යන ධාතූන්ගේ යොගයෙහිද ෂෂ්ඨිය වේ. “සර්පිෂො දයතෙ, ජගතාමීශෙට” යනු ඊට උදාහරණයි. කතාදිකෘද්‍යොගයෙහි ෂෂ්ඨිය නොවේ යයි කීබැවින් තත් ප්‍රතිෂිධයන් දක්වනු පිණිස “නලොක” යනාදී පාණිනීය සූත්‍රාදිය කීහු.

b ලොකාව්‍යයනිෂ්ඨාඛලර්ථතෘණාම්,-ල (“ශතෘ, ශාන” ප්‍රත්‍යයාදි) ලාදෙශය; උ, (“ඉෂ්ණු’ ප්‍රත්‍යයාදි) උකාරාන්තය; උක, උක ප්‍රත්‍යය; අව්‍යය, (“ක්ත්වා ක්‍යප්” ප්‍රත්‍යයාදි) අව්‍යය; නිෂ්ඨා, (“ක්ත ක්තවතු” ප්‍රත්‍යය සඞ්ඛ්‍යාත) නිෂ්ඨාසංඥය; ඛලර්ථ, (‘ඛල්’ ප්‍රත්‍යයවූ) ඛලර්ථය; තෘණාම්, “තෘන්” ප්‍රත්‍යය යන මේ කෘදන්තයන්ගේ යොගයෙහි; න, කර්තෘ කර්මාර්ථ දෙක්හි ෂෂ්ඨිය) නොවේ.

c එෂාං යොගෙ, මේ ලාදෙශාදි කෘදන්තයන්ගේ යොගයෙහි; ෂෂ්ඨී නස්‍යාත්, ෂෂ්ඨීවිභක්තිය නොවන්නේය, ලාදෙශාඃ, ලාදෙශයෝ උදාහරණකරනු ලැබෙත්; (එනම්)-හරිඃ, විෂ්ණුතෙම; සෘෂ්ටිං, මැවීම; කුර්වන්, කරමින්; “කුර්වාණඃ” යනුද එම අර්ථයි; (මෙහි “කුර්වන්, කුර්වාණඃ” යන දෙක ලාදෙශවූ “ශතෘ, ශාන” ප්‍රත්‍යයාන්ත බැවින් තද්‍යොගයෙහි කර්මාර්ථයෙහි ෂෂ්ඨිය නොව “සෘෂ්ටිං”යි ද්විතීයාව විය.) උඃ, උකාරාන්තය උදාහරණකරනු ලැබේ. (එනම්) හරිං, විෂ්ණුහු; දිදෘක්ෂුඃ, දකිනුකැමැත්තේ (යනුද) හරිං, විෂ්ණුහු; අලංකරිෂ්ණුඃ වා, අලඞ්කාරකරණ සුලුවූයේ (යනුද වේ.) මෙහි “දිදෘක්ෂුඃ” යනු ‘උ’ ප්‍රත්‍යයාන්ත බැවින්ද “අලංකරිෂ්ණුඃ” යනු “ඉෂ්ණු” ප්‍රත්‍යයාන්ත බැවින්ද ෂෂ්ඨී නොව ‘හරිම්’ යි ද්විතීයා විය.) උකඃ, උකප්‍රත්‍යයාන්තය උදාහරණකරනුලැබේ. (එනම්) හරිඃ, විෂ්ණුතෙම; දෛත්‍යාන්, අසුරයන්; ඝාතුකඃ,

a එෂාං යොගෙ ෂෂ්ඨී නස්‍යාත් ලාදෙශාඃ-කුර්වන් කුර්වාණඃ සෘෂ්ටිං හරිඃ උඃ-හරිං දිදෘක්ෂුඃ, අලංකරිෂ්ණුර්වා, උකඃ-දෛත්‍යාන් ඝාතුකො හරිඃ, අව්‍යයම්-ජගත් සෘෂ්ට්වා, සුඛං කර්තුම්, නිෂ්ඨා-විෂ්ණුනා හතා දෛත්‍යාඃ, දෛත්‍යාන් හතවාන් විෂ්ණුඃ. ඛලර්ථඃ-ඊෂත්කරඃ ප්‍රපඤ්චො හරිණා, තෘන්-කර්තා ලොකාන්.

නසනසුලුය (යනුයි); (මෙහි ‘ඝාතුකඃ” යන “උක” ප්‍රත්‍යයාන්ත යොගය හෙයින් ෂෂ්ඨිය නොව “දෛත්‍යාන්’යි ද්විතීයා විය) අව්‍යයම්, අව්‍යය (ක්ත්වාදිය) උදාහරණ කරනුලැබේ. (එනම) ජගත්, ලොකය; සෘෂ්ට්වා, මවා; (යනුද) සුඛං, සැප කර්තුඃ, කරන්ට (යනුද වේ). මෙහි “සෘෂ්ට්වා’ යන “ක්ත්වා” ප්‍රත්‍යයාන්ත අව්‍යය හෙයින්ද, “කර්තුම්” යන ‘‘තුම්” ප්‍රත්‍යයාන්ත අව්‍යය හෙයින්ද ෂෂ්ඨී නොව “ජගත් සුඛම්” යි ද්විතීයා විය.) නිෂ්ඨා, නිෂ්ඨාසංඥක කෘදන්තය උදාහරණකරනුලැබේ. (එනම්) විෂ්ණුනා, විෂ්ණුහු විසින්; දෛත්‍යාඃ, අසුරයෝ; හතාඃ, නසනලද්දාහ; (යනුද) විෂ්ණුඃ, විෂ්ණුතෙම; දෛත්‍යාන්, අසුරයන්; හතවාන්, නැසුයේය (යනුද වේ). (මෙහි “හතාඃ” යන නිෂ්ඨාසංඥක ‘ක්ත” ප්‍රත්‍යයාන්තය හෙයින් ෂෂ්ඨී නොව “විෂ්ණුනා”යි තෘතීයාද, “හතවාන්” යන “ක්තවතු” ප්‍රත්‍යයාන්තය හෙයින් ‘‘දෛත්‍යාන්”යි ද්විතීයාද විය.) ඛලර්ථඃ, ඛලර්ථ කෘදන්තය උදාහරණ කරනුලැබේ. (එනම්) හරිණා, විෂ්ණුහු විසින්; ප්‍රපඤ්චඃ, විස්තරය; ඊෂත්කරඃ, අල්පප්‍රයාසයෙන් සිදකට හැකිවේ (යනුයි). මෙහි “ඊෂත්කරඃ” යන “ඛල්” ප්‍රත්‍යයාන්තය හෙයින් කර්ත්‍රර්ථයෙහි ෂෂ්ඨී නොව “හරිණා”යි තෘතීයා විය.) තෘන්, “තෘන්” ප්‍රත්‍යයාන්තය උදාහරණ කරනුලැබේ; (එනම්) ලොකාන්, ලොකයන්, කර්තෘ, කරණසුලුය (යනුයි); මෙහි “කර්තෘ” යන ශීලාර්ථ “තෘන්” ප්‍රත්‍යයාන්ත කෘදන්තය හෙයින් කර්මාර්ථයෙහි ෂෂ්ඨී නොව “ලොකාන්” යි ද්විතීයා විය.)

මෙහි විධිනුගේ අපවාදයක් වශයෙන් පාණිනීය ව්‍යාකරණයෙහි “ක්තස්‍ය ච වර්තමානෙ” යන සූත්‍රය හදරා වර්තමාන කාලික ‘ක්ත” ප්‍රත්‍යයාන්ත යොගයෙහි ද “අධිකරණවාචිනශ්ච” යන සූත්‍රය හදරා අධිකරණාර්ථය ප්‍රකාශකරන්නාවූ “ක්ත” ප්‍රත්‍යයාන්තයාගේ යොගයෙහි ද ෂෂ්ඨීවිභක්තිය වේ යයි කියා, රාඥාමම තො බුද්ධඃ පූජිතො වා” යනු ද “ඉදමෙෂමාසිතම්” යනු ද උදාහරණ කළාහ. “බුද්ධඃ, බුදුතෙම; රාඥාම, රජුන් විසින්; මතඃ, දන්නා

a "හෙතෞ තෘතීයා පඤ්චමී ච වක්තව්‍යා"– අනිත්‍යඃ ශබ්දඃ කෘතකත්වෙන කෘතකත්වාත් වා, "භයහෙතෞ පඤ්චමී" චෞරාද් බිභෙති, ව්‍යාඝ්‍රාත් ත්‍රස්‍යති, විද්‍යුත්පාතාච්චකිතඃ.

ලැබේ පූජිතඃ වා, පුදනුදු ලැබේ" යනුද, ඉදම්, මෙය; එෂාම්, මොවුන්විසින්; ආසිතම්, උන්තැනයි' යනුද එහි අර්ථයි. මෙහි "මතඃ පූජිතඃ" යන තන්හි වර්තමානකාලික "ක්ත" ප්‍රත්‍යය බැවින් තද්යෝගයෙහි "රාඥාම්" යනුද, "ආසිතම්" යන තන්හි අධිකරණයෙහි "ක්ත" ප්‍රත්‍යය බැවින් තද්යෝගයෙහි "එෂාම්" යනුද කර්ත්‍රර්ථයෙහි ෂෂ්ඨියි. සකර්මකධාතුන්කෙරෙන් අධිකරණයෙහි "ක්ත" ප්‍රත්‍යය වූ තන්හි වනාහි කර්තෘකර්මවයම අනුක්තබැවින් තද්යෝගයෙහි ඒ දෙතන්හිම ෂෂ්ඨිය වේයයි සිද්ධාන්තකෞමුදීටීකාවෙහි කියනලදී. එනම්–'ඉදමෙෂාං භුක්තමොදනස්‍ය" යන තන්හි සකර්මක "භුජ්" ධාතුහුකෙරෙන් අධිකරණයෙහි "ක්ත" ප්‍රත්‍යයව සිද්ධවූ 'භුක්තම්" යන්නහුගේ යොගයෙහි 'එෂාම්"යි කර්ත්‍රර්ථයෙහි ද "ඔදනස්‍ය"යි කර්මාර්ථයෙහිද ෂෂ්ඨී විය. "ඉදම්, මේ; එෂාම්, මොවුන් විසින්; ඔදනස්‍ය, ඔදනය; භුක්තම්, අනුභවකළතැනයි" යනු එහි අර්ථයි. තවද කෘදන්තයන්ගේ නිෂ්පත්තිවිශෙෂඥාන විරහිතව මෙකී කෘද්යෝගයෙහි සකලාර්ථනිශ්චය දතහැකි නොවේ මෙසේ කෘද්යෝගයෙහි ෂෂ්ඨිය දක්වා තවත් හෙත්වර්ථාදි ඒ ඒ අර්ථයන්හි යෙදෙන විභක්තිභෙද පාණිනීයානුසාරයෙන් දක්වන්නාවූ වාර්තිකයෝ "හෙතෞ" යනාදිය කීහු.

a හෙතෞ හෙත්වර්ථයෙහි; තෘතීයා, තෘතීයාවිභක්තිය ද; පඤ්චමී ච, පඤ්චමීවිභක්තියද; වක්තව්‍යා, කියයුතුයි, කෘතකත්වෙන, කෘත්‍රිමභාවය (ක්‍රියානිෂ්පන්නත්වය) හෙතුකොටගෙණ; ශබ්දඃ, ශබ්දයතෙම; අනිත්‍යඃ, අනිත්‍ය වේ. කෘතකත්වාත් වා, "කෘතකත්වාත්" කියා පඤ්චමී හෝ වේ. එමඅර්ථයි. භයහෙතෞ, බියට හෙතුවාච්‍යකල්හි; පඤ්චමී, පඤ්චමිය වේ. චෞරාත්. සොරහු හෙතුකොටගෙණ; බිභෙති, භීතවේ. ව්‍යාඝ්‍රාත්, ව්‍යාඝ්‍රයාහෙතුකොටගෙණ; ත්‍රස්‍යති, ත්‍රස්තවේ (භීතවේ). විද්‍යුත්පාතාත්. විදුලිවැටීම හෙතුකොටගෙණ; චකිතඃ, චකිතවිය (භීතවිය) (මෙහි "බිභෙති" යනාදි භයාර්ථක්‍රියා යොගයෙහි 'චෞරාත්' යනාදිය තද්භය හෙතුත්වයෙන් පඤ්චමී විය)

හෙත්වර්ථය වනාහි කාරණාර්ථය හා සමානාර්ථ ඇත්තක්මෙන් දෘශ්‍යමාන බැවින් තද්විශෙෂ දක්වන්නාවූ සිද්ධාන්තකෞමුදී තත්ත්වබොධිනී ටීකාකාරයෝ:–

a "ෂෂ්ඨී ච හෙතුප්‍රයොගෙ"

b හෙතුප්‍රයොගෙ හෙතෞ ද්‍යොත්‍යෙ ෂෂ්ඨී ස්‍යාත්. චකාරාත් සර්වාදියොගෙ තෘතීයාපි. අන්නස්‍ය හෙතොර්වසති, කස්‍ය හෙතොර්නාගතඃ, කෙන හෙතුනා වා නාගතඃ.

"ද්‍රව්‍යාදිවිෂයො හෙතුඃ කාරකං නියතක්‍රියම්,
අනාශ්‍රිතෙ තු ව්‍යාපාරෙ නිමිත්තං හෙතුරිෂ්‍යතෙ"

යනු කීහු. හෙතුතෙමේ ද්‍රව්‍යගුණක්‍රියාවන් විෂයකොට ඇත්තේ වේ. (කරණ) කාරකය නිශ්චිතවූ ක්‍රියාව ඇත්තේ වේ. ව්‍යාපාරය (ක්‍රියානිෂ්පත්තිය) අනාශ්‍රිතකල්හි වනාහි නිමිත්ත හෙතුයයි අභිමත වේ, යනු මෙහි අර්ථයි "දණ්ඩෙන ඝටඃ" යන තන්හි දණ්ඩහි ව්‍යාපාරත්වය ඇතත් නැතත් ප්‍රත්‍යක්ෂවශයෙන් ක්‍රියාසාධකත්වය හෝ ක්‍රියාජනකත්වය නැතිබැවින් කරණ නොවේ. ඝටසංඛ්‍යාත ද්‍රව්‍යය විෂයකොට ඇති හෙතුව වේ. "පුණ්‍යෙන ගෞරවර්ණඃ" යන තන්හි "පුණ්‍යෙන" යනු ගෞරවර්ණසංඛ්‍යාත ගුණය විෂය කොට ඇති හෙතුව වේ. මෙහිද පුණ්‍යයෙහි ක්‍රියාජනකත්වය නැත්තේ වේ. "පුණ්‍යෙන දෘෂ්ටො හරිඃ" යන තන්හි පුණ්‍යයෙහි හරිදර්ශන ස්වරූපක්‍රියාසාධකත්වය ඇතත් එහි දර්ශනව්‍යාපාරය නැතිබැවින් කරණ නොවේ. දර්ශනක්‍රියාව විෂයකොට ඇති හෙතුව වේ.

a හෙතුප්‍රයොගෙ, හෙතුශබ්දයාගේ ප්‍රයොගය ඇතිකල්හි; ෂෂ්ඨී ච, ෂෂ්ඨිවිභක්තිය ද වේ.

b හෙතුප්‍රයොගෙ, හෙතුශබ්දයාගේ ප්‍රයොගයෙහි; හෙතෞ, හෙත්වර්ථය; ද්‍යොත්‍යෙ, ප්‍රකාශවියයුතුකල්හි; ෂෂ්ඨී ස්‍යාත්, ෂෂ්ඨී විභක්තිය වන්නේය. චකාරාත්, චකාරයෙන්; සර්වාදියොගෙ, සර්වශබ්දාදීන්ගේ යොගයෙහි; තෘතීයාපි, තෘතීයාවද වේ. අන්නස්‍ය හෙතොඃ, ආහාරය හෙතුකොටගෙණ; වසති, වෙසේ; (යනතන්හි "අන්නස්‍ය" යනු හෙතුයොගයෙහි ෂෂ්ඨියි.) කස්‍ය හෙතොඃ, කවරෙකු හෙතුකොටගෙණ; නාගතඃ නායේද; (යනතන්හි "කස්‍ය" යනු හෙතුයොගයෙහි ෂෂ්ඨියි) කෙනහෙතුනා, කිනම් හෙතුවකින්; නාගතඃ වා නායේද කියාහෝ වේ (මෙහි සර්වාදිවූ "කිම්" ශබ්දය හා හෙතුයොගය බැවින් ඒ කිම්ශබ්දයාකෙරෙන් "කෙන" යි තෘතීයා විය). පාණිනියෙහි මේ පිළිබඳව "ෂෂ්ඨී හෙතුප්‍රයොගෙ, සර්වනාම්නස්තෘතීයා ච" යන සූත්‍රවය හඳුරණලදී. සිද්ධාන්තකෞමුදියෙහි "සර්වනාම්නස්තෘතීයා ච" යන සූත්‍රවෘත්තියෙහි "නිමිත්තපර්‍යායප්‍රයොගෙ සර්වාසාම්ප්‍රායො දර්ශනම්" යනු කීහු නිමිත්තපර්‍යාය

a "ඉත්ථම්භාවෙ තෘතීයා" කිඤ්චිත්ප්‍රකාරං ප්‍රාප්ත ඉත්ථම්භාවඃ; ශිෂ්‍යං පුත්‍රෙණ පශ්‍යති, සංසාරමසාරෙණ පශ්‍යති.

d "යෙනාඞ්ග විකාරඃ"

c යෙන විකෘතෙනාඞ්ගෙනාඞ්ගිනොඞ්ගවිකාරො ලක්ෂ්‍යතෙ තස්මාදඞ්ගාත්තෘතීයා විභක්තිර්භවති, අක්ෂ්ණා කාණඃ, පාදෙන ඛඤ්ජඃ, ශ්‍රවණෙන බධිරඃ, විකාරො ද්විවිධඃ-න්‍යූනත්වාශ්‍රිත ආධික්‍යාශ්‍රිතශ්ච, මුඛෙන ත්‍රිලොචනඃ, වපුෂා චතුර්භුජඃ.

ශබ්දයන් හා සර්වශබ්දාදීන්ගේ ප්‍රයොගය ඇතිකල්හි සියලු විභක්තීන්ගේ බොහෝසෙයින් දක්මම වේ යනු එහි අර්ථයි. "කිංනිමිත්තං වසති, කෙන නිමිත්තෙන වසති, කස්මෛ නිමිත්තාය වසති" යනාදිය ඊට උදාහරණයි මුග්ධබොධයෙහි "ත්‍රයාදයො ඨාංසෛර්නිකෙතඃ ප්‍රසජු සර්වාඃ" යන සූත්‍රය හදාරණලදී. නිමිත්තාර්ථශබ්දය හා එහාවිභක්තිකවූ ශබ්දයාකෙරෙන් තෘතීයාදි විභක්තිපස ද එබඳු සර්වනාමයක්කෙරෙන් නම් ප්‍රථමාදි සියලු විභක්ති ද වෙත් යනු එහි අර්ථයි.

a ඉත්ථම්භාවෙ, ඉත්ථම්භාවාර්ථයෙහි (කිසියම් ප්‍රකාරයකට පැමිණියෙකුගේ ලක්ෂණයෙහි); තෘතීයා, තෘතීයාවිභක්තිය වේ. කිඤ්චිත්ප්‍රකාරං ප්‍රාප්තඃ, කිසි ප්‍රකාරයකට පැමිණියේ; ඉත්ථම්භාවඃ, ඉත්ථම්භාව නම් වේ. ශිෂ්‍යම්, ශිෂ්‍යයා; පුත්‍රෙණ, පුත්‍රභාවයෙන් හෙවත් පුත්‍රභාවයට පමුණුවා; පශ්‍යති, බලයි; සංසාරම්, සංසාරය; අසාරෙණ, අසාරත්වයෙන් හෙවත් අසාරබවට පමුණුවා; පශ්‍යති, බලයි. (මෙහි ශිෂ්‍යයා හා සංසාරය පුත්‍රත්වයට හා අසාරත්වයට පමුණුවා දර්ශනය කළහෙයින් "පුත්‍රෙණ, අසාරෙණ"යි ඉත්ථම්භාවතෘතීයා විය).

b යෙන, (විකෘතවූ) යම් අවයවයකින්; අඞ්ගවිකාරඃ, ශරීරයාගේ වෙනස දන්නාලැබේ. නම් ඒ අවයවවාචකයා කෙරෙන් තෘතීයාව වේ.

c විකෘතෙන, විකෘතවූ (වෙනස්වූ); යෙන අඞ්ගෙන, යම් අවයවයකින්; අඞ්ගිනඃ, වයව ඇත්තහුගේ හෙවත් ශරීරහුගේ; අඞ්ගවිකාරඃ, අවයවවිකෘතිය; ලක්ෂ්‍යතෙ, දක්නාලැබේ ද; තස්මාත් අඞ්ගාත්, ඒ අවයවවාචකශබ්දය කෙරෙන්; තෘතීයා විභක්තිඃ භවති, තෘතීයා විභක්තිය වේ. අක්ෂ්ණා, ඇසින්; කාණඃ, කාණයි. (මෙහි විකෘතවූ ඇසින් කාණසඞ්ඛ්‍යාත අඞ්ගවිකාරය

a "ජනිකර්තුඃ ප්‍රකෘතිඃ"

b ජායමානස්‍ය කාර්‍ය්‍යස්‍යොපාදානමපාදානසංඥං භවති, තත්‍රාපාදානෙ පඤ්චමී. "යස්මාත් ප්‍රජාඃ ප්‍රජායන්තෙ තද්බ්‍රහ්මෙත්‍යභිධීයතෙ"

c "ආඞාදියොගෙ ච"

ලක්ෂිත බැවින් "අක්ෂ්ණා"යි තෘතීයා විය) පාදෙන, පයින්; ඛඤ්ජඃ, කොරයි. (මෙහි විකෘතවූ පාදයෙන් ඛඤ්ජ සඞ්ඛ්‍යාත අඞ්ගවිකාරය ලක්ෂිත බැවින් 'පාදෙන"යි තෘතීයා විය). ශ්‍රවණෙන, කණෙන්; බධිරඃ බිහිරියි. (මෙහි විකෘතවූ ශ්‍රවණයෙන් බධිරසඞ්ඛ්‍යාත අඞ්ගවිකාරය ලක්ෂිතබැවින් "ශ්‍රවණෙන"යි තෘතීයා විය) විකාරඃ, (මෙහි කී) විකාරය; ද්විවිධඃ, දෙවැදෑරුම් වේ. (එනම්)-න්‍යූනත්වාශ්‍රිතඃ, අඩුබවක් ඇසුරුකොළේද; ආධික්‍යාශ්‍රිතශ්ච, වැඩිබවක් ඇසුරුකොළේද කියායි. (මෙහි "අක්ෂ්ණා කාණඃ" යනාදියෙහි ලක්ෂිතවිකාරය අවයවන්‍යූනත්වයෙන් වූ බැවින් න්‍යූනත්වාශ්‍රිතයි) මුඛෙන, මුඛයෙන්; ත්‍රිලොචනඃ, නෙත්තුනක් ඇත්තේය. (ඊශ්වරතෙමේයි) වපුෂා, ශරීරයෙන්; චතුර්භුජඃ, අත්සතරක් ඇත්තේයි (විෂ්ණුතෙමේයි) මේ දෙතන්හි ලක්ෂිතවිකාරය අවයවයන්ගේ අධික භාවයෙන්වූ බැවින් ආධික්‍යාශ්‍රිතයි)

a ජනිකර්තුඃ, ජනන ක්‍රියාව සම්බන්ධි කර්තෘහුගේ; ප්‍රකෘතිඃ, ප්‍රකෘතිය හෙවත් මූලකාරණය අපාදාන නම් වේ.

b ජායමානස්‍ය, උපදින්නාවූ; කාර්‍ය්‍යස්‍ය, කාර්‍ය්‍යය සම්බන්ධිවූ හෙවත් වස්තුව සම්බන්ධිවූ; උපාදානං, මූලකාරණය; අපාදානසංඥං භවති, අපාදානසංඥ වේ. තත්‍ර අපාදානෙ, ඒ අපාදානයෙහි; පඤ්චමී, පඤ්චමී විභක්තිය වේ. යස්මාත්, යමක් කෙරෙන් හෙවත් යමක් මූලකාරණකොට; ප්‍රජාඃ, ප්‍රජාවෝ; ප්‍රජායන්තෙ, උපදිත් ද; තත්. ඒ මූලකාරණය; බ්‍රහ්ම ඉති, බ්‍රහ්මයයි; අභිධීයතෙ, ප්‍රකාශ කරණු ලැබේ. (මෙහි "ප්‍රජායන්තෙ" යන ජනන ක්‍රියාහුගේ කර්තෘ "ප්‍රජාඃ" යනුයි. ඊට මූලකාරණවූයේ බ්‍රහ්ම තෙමේයි. මෙහි තදපෙක්ෂක "යත්" ශබ්දයෙන් "යස්මාත්"යි අපාදාන පඤ්චමී විය).

c ආඞාදියොගෙ ච, "ආඞ්" ආදි උපසර්ගයන්ගේ යොගයෙහි ද පඤ්චමී විභක්තිය වේ.

a ආඞාදියොගෙ පඤ්චමීවිභක්තිර්භවති. ආඞ් මර්‍යාදායාමභිවිධෞ ච, අපපරී වර්ජනෙ, එතෙ ආඞාදයඃ. ආපාටලිපුත්‍රාද් වෘෂ්ටො දෙවඃ, ආබාලෙභ්‍යො හරිභක්තිඃ, ආදිශබ්දාත්පරි ත්‍රිගර්තෙභ්‍යො වෘෂ්ටො දෙවඃ, අපත්‍රිගර්තෙභ්‍යො වෘෂ්ටො දෙවඃ.

b "තාදර්ථ්‍යෙ චතුර්ථී වක්තව්‍යා"

c "සංයමාය ශ්‍රුතං ධත්තෙ නරො ධර්මාය සංයමම්,
ධර්මං මොක්ෂාය මෙධාවී ධනං දානාය භුක්තයෙ"

a ආඞාදියොගෙ, "ආඞ්" ආදි උපසර්ගයන්ගේ යොගයෙහි; පඤ්චමී විභක්තිඃ භවති, පඤ්චමී විභක්තිය වේ. මර්‍යාදායාම්, මර්‍යාදාර්ථයෙහිද (හරණු ලබන සීමාවෙහිද); අභිවිධෞ ච, අභිවිධ්‍යර්ථයෙහිද (ගණු ලබන සීමාවෙහිද) වූ; ආඞ්, "ආඞ්" යන්නද; වර්ජනෙ, වර්ජනාර්ථයෙහි (හැරීමෙහි) වූ; අපපරී, "අප පරි" යන දෙකද (යන); එතෙ, මොහු; ආඞාදයඃ, "ආඞ්" ආදීහුයි. ආපාටලිපුත්‍රාත්, පැලලුප් නුවර දක්වා; දෙවඃ, මෙඝය; වෘෂ්ටඃ, වැස්සේය. (මෙහි මර්‍යාදාර්ථ "ආඞ්" යොගයෙහි "පාටලිපුත්‍රාත්" යනු පඤ්චමීයි). ආබාලෙභ්‍යඃ, බාලයන්තෙක් හෙවත් බාලයන්පැකිර; හරිභක්තිඃ, විෂ්ණු භක්තිය වේ; (මෙහි අභිවිධ්‍යර්ථ "ආඞ්" යොගයෙහි "බාලෙභ්‍යඃ" යනු පඤ්චමීයි) ආදි ශබ්දාත්, ආදිශබ්දයෙන් (වක්ෂ්‍යමාණ උදාහරණ වෙත්, එනම්)-පරිත්‍රිගර්තෙභ්‍යඃ, ත්‍රිගර්තදෙශයන් හැර, දෙවඃ, මෙඝයතෙමේ; වෘෂ්ටඃ, වැස්සේය. "අපත්‍රිගර්තෙභ්‍යො වෘෂ්ටො දෙවඃ" යනුද මෙම අර්ථයි. (මෙහි වර්ජනාර්ථ "අප-පරි" යොගයෙහි "පරිත්‍රිගර්තෙභ්‍යඃ අපත්‍රිගර්තෙභ්‍යඃ" යනු පඤ්චමීයි).

b තාදර්ථ්‍යෙ, තදර්ථභාවයෙහි; හෙවත් (ක්‍රියාව යමක් ප්‍රයොජන කොට ඇති වේ නම්) තත් ප්‍රයොජනත්වයෙහි; චතුර්ථී, චතුර්ථී විභක්තිය, වක්තව්‍යා, කියයුතුයි.

c මෙධාවී, ප්‍රඥාඇත්තාවූ; නරඃ, මනුෂ්‍යතෙම; සංයමාය, ඉන්ද්‍රියනිග්‍රහය පිණිස; ශ්‍රුතම්, ශාස්ත්‍රය; ධත්තෙ, දරයි. ධර්මාය, ධර්මය පිණිස; සංයමම්, සංයමය (දරයි). මොක්ෂාය, මුක්තිය පිණිස; ධර්මම් ධර්මය දරයි; දානාය, දානය පිණිසද; භුක්තයෙ, අනුභවය පිණිසද; ධනම්, ධනය දරයි; (මෙහි "සංයමාය, ධර්මාය, මොක්ෂාය, දානාය, භුක්තයෙ" යනු තාදර්ථ්‍ය සම්ප්‍රදානයි).

a "ආශිෂි චතුර්ථී" රාඥෙ චිරං සෞභාග්‍යං භූයාත්

d * "ක්‍රුධද්‍රුහෙර්ෂ්‍යාසූයාර්ථානාං යම්ප්‍රති කොපඃ"

c ක්‍රුධාද්‍යර්ථානාම්ප්‍රයොගෙ යම්ප්‍රති කොපඃ ස සම්ප්‍රදාන සංඥඃ ස්‍යාත්, හරයෙ ක්‍රුධ්‍යති, ද්‍රුහ්‍යති, ඊර්ෂ්‍යති, අසූයති, ද්‍රුහාදයොපි කොපප්‍රභවා එව ගෘහ්‍යන්තෙ. "සොපසර්ගයොඃ ක්‍රුධද්‍රුහොඃ කර්මණි ද්විතීයා වක්තව්‍යා" ක්‍රූරමභි ක්‍රුධ්‍යති, මිත්‍රමභිද්‍රුහ්‍යති.

මුග්ධබොධටීකාවෙහි මෙකී තාදර්ථ්‍යය විස්තර කරන්නාහු "ස චාසෞ අර්ථශ්චෙති තදර්ථඃ, තස්‍ය භාවඃ තාදර්ථ්‍යම්, (එවඤ්ච) තස්‍යාර්ථො නිවෘත්තිර්‍යස්‍ය තදර්ථඃ, තදර්ථ එව තාදර්ථ්‍යම්, තාදර්ථ්‍යඤ්ච තාදර්ථ්‍යඤ්ච ඉත්‍යෙකශෙෂෙ තාදර්ථ්‍යම්, තස්මින්, යත් ප්‍රයොජනං තස්මාත්, යස්‍ය නිවෘත්තිර්‍යස්මාදපි චතුර්ථීත්‍යර්ථඃ' යනු කීහු. මෙහි ඒ අර්ථයාගේ භාවය යන අර්ථයෙහි වූ "තාදර්ථ්‍ය" ශබ්දයත් ඔහුගේ නිවෘත්තිය යන අර්ථයෙහිවූ "තාදර්ථ්‍ය" ශබ්දයත් එක ශෙෂකොට "තාදර්ථ්‍ය" ශබ්දය කීහු. මෙහි අර්ථනිශ්චයකරන්නාහු යමක් ප්‍රයොජන වේ නම් ඔහුකෙරෙන් ද යමක්හුගේ නැවැත්ම වේ නම් ඔහුකෙරෙන් ද චතුර්ථිය වේයයි කීහු. මෙහිදු ශාස්ත්‍රධාරණයෙහි ප්‍රයොජනය සංයමය බැවින් "සංයමාය" යි චතුර්ථී විය, සෙස්සද මෙසේයි.

a ආශිෂි, අභීෂ්ටවෘද්ධිප්‍රාර්ථනයෙහි; චතුර්ථී, චතුර්ථීවිභක්තිය වේ. රාඥෙ, රජහට; චිරං, බොහෝකලක්; සෞභාග්‍යම්, සුභගභාවය (ප්‍රියභාවය); භූයාත්, වේවා; (මෙහි "රාඥෙ" යනු අභීෂ්ටවෘද්ධි ප්‍රාර්ථනයෙහි චතුර්ථීයි).

b ක්‍රුධද්‍රුහෙර්ෂ්‍යාසූයාර්ථානාම්,- ක්‍රුධ, අමර්ෂාර්ථධාතුය; ද්‍රුහ, අපකාරාර්ථධාතුය; ඊර්ෂ්‍යා, අක්ෂමාර්ථධාතුය, අසූයාර්ථානාම්, දොෂාවිෂ්කරණාර්ථධාතුය යන මොවුන්ගේ යොගයෙහි; යංප්‍රති, යමෙකු පිළිබඳව හෙවත් යමෙකු විෂය කොට; කොපඃ, කොපයෙක් වේද (හේ සම්ප්‍රදාන නම් වේ).

c ක්‍රුධාද්‍යර්ථානං ප්‍රයොගෙ, ක්‍රොධාර්ථධාත්වාදීන්ගේ ප්‍රයොගයෙහි; යං ප්‍රති, යමෙකු පිළිබඳව; කොපඃ, කොපය වේද; සඃ,

---

* මේ පාණිනීය සූත්‍රයි; බොහෝ සාරස්වතයන්හි මෙහි 'ක්‍රුධාදියොගෙ චතුර්ථී' යනු දක්නාලැබේ. මෙහි ආදිශබ්දයෙන් "ක්‍රුධි ද්‍රුහි ඊර්ෂ්‍යා අසූයා ශ්ලාඝ හ්නුඞ් ස්ථා ශප් ධාරි ස්පෘහි" යන මොහුද ගණු ලැබෙත්.

a "ල්‍යබ්ලොපෙ කර්මණ්‍යධිකරණෙ ච පඤ්චමී වක්තව්‍යා" හර්ම්‍යාත් ප්‍රෙක්ෂ්‍යතෙ, ආසනාත් ප්‍රෙක්ෂ්‍යතෙ, හර්ම්‍යමාරුහ්‍ය ආසනෙ උපවිශ්‍ය ප්‍රෙක්ෂ්‍යත ඉත්‍යර්ථඃ.

b ල්‍යබර්ථො දෘශ්‍යතෙ යත්‍ර ල්‍යබන්තං නෛව දෘශ්‍යතෙ,
තත්‍රෛව හි ල්‍යබ්ලොපිත්වං ඥාතව්‍යම සදා බුධෛඃ.

හෙතෙම; සම්ප්‍රදානසංඥඃ ස්‍යාත්, සම්ප්‍රදාන නම් වන්නේය; හරයෙ, විෂ්ණුහට; ක්‍රුධ්‍යති, ක්‍රොධකෙරේ; ද්‍රුහ්‍යති, ද්‍රොහ (අපකාර) කෙරේ; ඊෂ්‍යති, ඊෂ්‍යා කෙරේ; හෙවත් ගුණනොයිවසයි; අසූයති, දොස්පහල කෙරේ; ද්‍රුහාදයඃ අපි; ද්‍රුහාදීහුද; කොපප්‍රභවාඃ එව, කොපය ප්‍රභවකොට (මූලොත්පත්තිස්ථාන කොට) ඇත්තාහුම; ගෘහ්‍යන්තෙ, ගණුලැබෙත්, සොපසර්ගයොඃ, උපසර්ගසහිතවූ; ක්‍රුධද්‍රුහොඃ යොගෙ, ක්‍රුධද්‍රුහධාතු දෙදෙනාගේ යොගයෙහි; ද්විතීයා, ද්විතීයා විභක්තිය; වක්තව්‍යා, කියයුතුයි. ක්‍රූරම්, ක්‍රූරයාට; අභික්‍රුධ්‍යති, ක්‍රොධකෙරේ; මිත්‍රම්, මිත්‍රයාට; අභිද්‍රුහ්‍යති, ද්‍රොහ කෙරේ; (යනු ඊට උදාහරණයි). මෙහි "අභි" උපසර්ගය පූර්ව බැවින් ("ක්‍රූරම්, මිත්‍රම්"යි ද්විතීයා විය)

මෙහි ක්‍රුධාද්‍යර්ථධාතූන්ගේ යොගයෙහි තද්ධාත්වර්ථ ප්‍රභව කොපයට යමෙක් විෂයවූයේ නම් ඒ සම්ප්‍රදානය වේයයිද ඒ ධාත්වර්ථ යන් කොපය මූලස්ථානකොට ඇතිවිය යුතු බවද ඉන් 'ක්‍රුධද්‍රුහ" ධාතුවයු උපසර්ගසහිතව යෙදූ තන්හි ද්විතීයාව වන බවද කීහු.

a ල්‍යබ්ලොපෙ, ල්‍යප්ප්‍රත්‍යය (පූර්වක්‍රියා) ලොපය ඇතිකල්හි; කර්මණි, කර්මාර්ථයෙහිද; අධිකරණෙ ච, ආධාරාර්ථයෙහිද; පඤ්චමී, පඤ්චමී විභක්තිය; වක්තව්‍යා, කියයුතුයි; හර්ම්‍යාත්, ප්‍රාසාදයෙන්; ප්‍රෙක්ෂ්‍යතෙ, දක්නාලැබේ; (මෙහි "ආරුහ්‍ය" යන ල්‍යබ්ලොප යෙහි "හර්ම්‍යාත්" යනු කර්මාර්ථපඤ්චමීයි); ආසනාත්, ආසනයෙන්; ප්‍රෙක්ෂ්‍යතෙ, දක්නාලැබේ; (මෙහි "උපවිශ්‍ය" යන ල්‍යබ්ලොප යෙහි "ආසනාත්" යනු ආධාරාර්ථපඤ්චමීයි); හර්ම්‍යං ආරුහ්‍ය, පහයට නැගී; ආසනෙ උපවිශ්‍ය, අස්නෙහි හිඳ; ප්‍රෙක්ෂ්‍යතෙ ඉති, දක්නා ලැබේ යන; අර්ථඃ, අර්ථයි.

b යත්‍ර, යම්තැනෙක්හි, ල්‍යබර්ථඃ, ල්‍යප්ප්‍රත්‍යයාගේ අර්ථය හෙවත් පූර්වක්‍රියාර්ථය; දෘශ්‍යතෙ, දක්නාලැබේද; ල්‍යබන්තම්, ල්‍යප්ප්‍රත්‍යයාන්තපදය; න එව දෘශ්‍යතෙ, නොදක්නා ලැබේද; තත්‍රෛව හි, ඒම; ල්‍යබ්ලොපිත්වම්, ල්‍යබ්ලොප ඇති බවයයි; සදා, සැම්කල්හි; බුධෛඃ, පණ්ඩිතයන් විසින්; ඥාතව්‍යම්, දතයුතුවේ;

a "නිමිත්තාත්කර්මයොගෙ සප්තමී ච වක්තව්‍යා"

b චර්මණි ද්වීපිනං හන්ති දන්තයොර්හන්ති කුඤ්ජරම්,
කෙශෙෂු චමරීං හන්ති සීම්නි පුෂ්කලකො හතඃ.

c (ගුදමෙඪ්‍රාන්තරාලාඞ්ගඃ සීමෙති ප්‍රොච්‍යතෙ බුධෛඃ,
පුෂ්කලො මෘගභෙදඃ ස්‍යාන්මතඃ සෞගන්ධ්‍යහෙතුකඃ.)

යම් වාක්‍යයෙක්හි ල්‍යප්ප්‍රත්‍යයාන්තයක් (පූර්වක්‍රියාවක්) තිබී ලොප්වූ කල්හි තත් පූර්වක්‍රියාවට කර්මවූ පදය හෝ ආධාරවූ පදය පඤ්චමිය වේ සකර්මකධාතු පූර්වක්‍රියා ලොපයෙහි කර්මාර්ථපඤ්චමියද, අකර්මකධාතු ක්‍රියාලොපයෙහි ආධාරාර්ථ පඤ්චමියද වේ. යම්තැනෙක්හි පූර්වක්‍රියාව නැතත් පූර්වක්‍රියාර්ථය ඇත්තේනම් ඒ ල්‍යබ්ලොපිත්වයයි.

a කර්මයොගෙ, කර්මයක් හා යොගවූකල්හි; නිමිත්තාත් නිමිත්තවාචක (ඵලවාචක) ශබ්දයා කෙරෙන්; සප්තමී ච, සප්තමී විභක්තියද; වක්තව්‍යා, කියයුතුයි.

b චර්මණි, සම නිමිත්තකොට; ද්වීපිනම්, දිවියා; හන්ති, නසයි; දන්තයොඃ, දත්දෙක නිමිත්තකොට; කුඤ්ජරම්, ඇතා; හන්ති, නසයි; කෙශෙෂු, කෙස් නිමිත්තකොට; චමරීම්, සෙමර ජාතිය; හන්ති, නසයි; සීම්නි, අණ්ඩකොෂය නිමිත්තකොට; පුෂ්කලකඃ ගන්ධමෘගයා; හතඃ, නසනලදී; (නොහොත්) සීම්නි, සීමාව නිමිත්තකොට; පුෂ්කලකඃ, ඵල; හතඃ, සිටුවනලදී.

c බුධෛඃ, පණ්ඩිතයන් විසින්; ගුදමෙඪ්‍රාන්තරාලාඞ්ගම්, ගුද ලිඞ්ග දෙක අතරවූ අවයවය; සීමා ඉති, සීමායයි; ප්‍රොච්‍යතෙ, කියනුලැබේ. පුෂ්කලඃ, පුෂ්කල නම්; මතඃ, මතයෙහි වූ; සෞගන්ධ්‍යහෙතුකඃ, සුගන්ධභාවයට හෙතුවූ; මෘගභෙදඃ ස්‍යාත්, මෘගවිශෙෂයක් වන්නේය.

කර්මයක් ක්‍රියාව හා සම්බන්ධවූ කල්හි තත් කර්මය යම් ඵලයක් සඳහා පවතී නම් තත් ඵලයා කෙරෙන් සප්තමී විභක්තිය වේ. මේ කර්මසම්බන්ධය වනාහි සමවාය සම්බන්ධ සංයොගසම්බන්ධයයි ද්විවිධ වේ. මෙහි "චර්මණි ද්වීපිනම්" යන තන්හි චර්මද්වීපිවයේ අවයවාවය විසමවායිත්වයෙන් සමවාය සම්බන්ධයි දන්තයොර්හන්ති කුඤ්ජරම්,

a ("*"විෂයෙ ච" තකේ චතුරඃ, විෂයො නාමාන්‍යත්‍රභාවඃ.) "ෂෂ්ඨීසප්තම්‍යෞ චානාදරෙ" බහූනාං ක්‍රොශතාං ගතශ්චෞරඃ, මාතාපිත්‍රොරුදතොඃ ප්‍රව්‍රජති පුත්‍රඃ, බහුෂ්ව සාධුෂු වදත්ස්වපි ස්වයමායසී යාති සාධුමාර්ගේණ, බහුෂු වදත්ස්වපි ස්වයමනායසී යාත්‍යසාධුමාර්ගේණ.

• කෙශෙෂු චමරීං හන්ති" යන තන්හිද එසේයි. "සීම්නි පුෂ්කලකො හතඃ" යන තන්හි අපර පක්ෂයෙහි කී අර්ථවශයෙන් සීමා පුෂ්කල ඤදෙදෙනාගේ සංයොගසම්බන්ධය වේ. මෙහි වාර්ත්තිකොක්තියෙන් හෙතවර්ථ තෘතීයාහුගේ හා තාදර්ථ්‍ය චතුර්ථීහුගේද අපවාදය වේ.

a විෂයෙ ච, විෂයාර්ථයෙහිද සප්තමීවිභක්තිය වේ. තකේ, තර්කවිෂයෙහි; චතුරඃ, දක්ෂයි; විෂයඃ නාම, විෂය නම්; අන්‍යත්‍රභාවඃ, (ආධෙයයෙන්) අන්තන්හි විමයි. අනාදරෙ, අනාදරාර්ථයෙහි; ෂෂ්ඨීසප්තම්‍යෞ ච, ෂෂ්ඨී සප්තමී දෙකද වෙත්. බහූනාම්, බොහෝ දෙනෙකුන්; ක්‍රොශතාම්, හඬද්දී හෙවත් හඬන්නාවූ බොහෝ දෙනෙකුන්ට අනාදර කොට; චෞරඃ, චෞරතෙම; ගතඃ, ගියේය. (මෙහි "බහූනාම්" යනු අනාදරාර්ථයෙහි ෂෂ්ඨී බහුවචනයි "ක්‍රොශතාම්" යනු තද්විශෙෂණයි). මාතාපිත්‍රොඃ, මව්පිය දෙදෙනා; රුදතොඃ, හඬද්දී හෙවත් හඬන්නාවූ මව්පිය දෙදෙනාට අනාදරකොට; පුත්‍රඃ, පුත්‍රතෙම; ප්‍රව්‍රජති, පැවිදිවෙයි. (මෙහි "මාතාපිත්‍රොඃ" යනු අනාදරාර්ථයෙහි ෂෂ්ඨී සප්තමී විවචනයි. "රුදතොඃ" යනු තද්විශෙෂණයි. බහුෂු අසාධුෂු, බොහෝ අසත්පුරුෂයන්; වදත්සු අපි, කියද්දීත්; හෙවත් කියන්නාවූ බොහෝ අසත්පුරුෂයන්ට අනාදර කොට; ආයසීඃ, ආයසීතෙම; ස්වයම් තෙමේම; සාධුමාර්ගේණ, යහපත් මාර්ගයෙන්; යාති, යෙයි. බහුෂු සාධුෂු, බොහෝ සත්පුරුෂයන්; වදත්සු අපි, කියද්දීත් හෙවත් කියන්නාවූ බොහෝ සත්පුරුෂයන්ට අනාදරකොට; අනායසීඃ, ආයසී නුවූයේ; ස්වයම්, තෙමේම; අසාධුමාර්ගේණ, අයහපත් මාර්ගයෙන්; යාති, යෙයි. (මෙහි "අසාධුෂු" යනුද "සාධුෂු" යනුද අනාදරාර්ථයෙහි සප්තමී බහුවචනයි. "වදත්සු" යනු තද්විශෙෂණයි).

මෙහි අනාදරාර්ථයෙහි ෂෂ්ඨී සප්තමී දෙදෙන වෙත්යයි අවිශෙෂයෙන් කීහු; සිද්ධාන්ත කෞමුදී වෘත්තියෙහි "අනාදරාධික්‍ය

* ආධාරභෙදයෙහි ලා වෛෂයිකාධාරයද පූර්වොක්තබැවින් මේ අයුක්ත ප්‍රාශ්නක්හයි මාධවීයීකායෙහි කියනලදී.

263 අන්‍යොක්තෙ ප්‍රථමා. (අන්‍යොක්තෙ7,1;ප්‍රථමා 1,1;)

a යදිදං කාර්‍ය්‍යාද්‍යන්‍යනාඛ්‍යාතෙන කෘතා චොක්තං භවති තදා ප්‍රථමා ප්‍රයොක්තව්‍යා. ඝටඃ ක්‍රියතෙ, ඝටඃ කාර්‍ය්‍යඃ.*

b ඡන්දසි ස්‍යාදිඃ සර්වත්‍ර, දධි ජුහොතීත්‍යස්මින්නර්ථෙ දධ්නා ජුහොති, පුනන්තු බ්‍රහ්මණස්පතිඃ, ව්‍රජතීර්විෂරජ්ජුඃ. †

භාවලක්ෂණෙ ෂෂ්ඨීසප්තම්‍යෞ ස්තඃ" යනු කීහු. අනාදරාර්ථය අධිකකොට ඇති පූර්වොක්ත භාවලක්ෂණය විද්‍යමානකල්හි ෂෂ්ඨී සප්තමී දෙක වේ යනු එහි අර්ථයි.

"ශෙෂාඃ කාර්‍යෙ" යනාදි සූත්‍රවිධානයෙන් කර්මාදිකාරකයන් හා සම්බන්ධය අනුක්තකල්හි ඒ ඒ තන්හි යෙදෙන විතීයාදි විභක්ති සමූහය දක්වා නැවත ඔවුන් ආඛ්‍යාත කෘදන්තාදියෙන් උක්තවූ කල්හි ප්‍රථමා විභක්තිය වේයයි දක්වනු පිණිස "අන්‍යොක්තෙ" යනාදිය කීහු.

263 අන්‍යොක්තෙ (ආඛ්‍යාත කෘදන්තාදි) අන්‍යකින් උක්ත කල්හි; ප්‍රථමා, ප්‍රථමා විභක්තිය වේ.

a යදිදං, යම් මේ; කාර්‍යාදි, කර්මකාරකාදිය; අන්‍යෙන, අන්‍යවූ; ආඛ්‍යාතෙන, ආඛ්‍යාතයෙන්ද; කෘතා ච, කෘදන්තයෙන්ද; උක්තං භවති, උක්තවේද (කියනලද්දේ වේද); තදා, එකල්හි; ප්‍රථමා, ප්‍රථමා විභක්තිය; ප්‍රයොක්තව්‍යා, ප්‍රයොගකටයුතුයි (යෙදියයුතුයි). ඝටඃ, කළය; ක්‍රියතෙ, කරණුලැබේ. (මෙහි "ක්‍රියතෙ" යන කර්මකාරක ආඛ්‍යාතක්‍රියාවෙන් "ඝටඃ" යනු උක්තකර්මාර්ථයෙහි ප්‍රථමායි). ඝටඃ, කළය; කාර්‍යඃ, කටයුතුයි; (මෙහි "කාර්‍යඃ" යන කර්මකාරක කෘදන්තයෙන් "ඝටඃ" යනු උක්තකර්මාර්ථයෙහි ප්‍රථමායි).

b ඡන්දසි, වෙදවිෂයෙහි; සර්වත්‍ර, සියලු අර්ථයන්හි; ස්‍යාදිඃ, සිවිභක්ත්‍යාදිය (විපර්‍යාසයෙන්) වේ හෙවත් අනියමයෙන් වේ. (එනම්) දධි, දී; ජුහොතීති, පුදයි යන; අස්මින් අර්ථෙ, මේ අර්ථයෙහි; දධ්නා ජුහොති, "දධ්නා ජුහොති" යනුවේ. (මෙහි 'දධ්නා' යනු කර්මාර්ථයෙහි තෘතීයායි). බ්‍රහ්මණස්පතිඃ, බ්‍රහ්මපතිහු; පුනන්තු,

* ඇතැම් පොත්වල මෙසේ "ප්‍රාප්තං උදකං යම්නි ප්‍රාප්තොදකො ග්‍රාමඃ"යි සමාසයෙන් උක්තකර්මයට උදාහරණයක්ද දක්නාලැබේ.

† බොහෝ පොත්වල කාරකප්‍රක්‍රියාව මෙතෙකින් අවසන්බව දක්නා ලැබේ.

ප්‍රක්ෂාලනය කෙරෙත්වා. (මෙහි "බ්‍රහ්මණස්පතීඃ" යනු ද්විතීයාර්ථයෙහි ප්‍රථමායි) ව්‍රජතීඃ, යන්නාවූ ගොධෙනූහු; විරෙජුඃ, බැබලූහ. (මෙහි "ව්‍රජතීඃ" යනු ප්‍රථමාර්ථයෙහි ද්විතීයායි). තවත් මෙසේ වෛදවිෂයෙහි බොහෝතන්හි අවිශෙෂයෙන් නොයෙක් අර්ථයන්හි නොයෙක් විභක්ති හා වචනද වෙත්).

"අන්‍යොක්තෙ ප්‍රථමා" යන සූත්‍රයෙන් කියනලද ප්‍රථමාව වනාහි ආඛ්‍යාත කෘදන්ත සමාස තද්ධිත යන සතරින් හා ඇතැම් නිපාතවලින් ද කර්මාදිය උක්තකල්හි වේ. එහි ආඛ්‍යාතයෙන් කර්මකාරකය හා කර්තෘකාරකය ද, කෘදන්තයෙන් කර්මාදිකාරක සයද, සමාසයෙන් කර්මාදි ෂට් කාරකය හා සම්බන්ධයද, තද්ධිතයෙන් කරණකාරක අවධිකාරකද්වය හැර අන්‍යකාරක චතුෂ්කය හා සම්බන්ධයද උක්තවේ. ඇතම් තන්හි ඇතැම් නිපාතවලින්ද උක්තවන්නාවූ කර්මකර්තෘ අර්ථයෝද දක්නාලැබෙත්. ආඛ්‍යාතාදියෙන් මෙකී කර්මාදීන්ගේ උක්තත්වය වක්ෂ්‍යමාණ උදාහරණානුසාරයෙන් දතයුතුයි.

ආඛ්‍යාතයෙන් උක්ත–

කර්ම–ඝටඃ ක්‍රියතෙ කුලාලෙන. කර්තෘ–ඝටං කරොති **කුලාලඃ.**

කෘදන්තයෙන් උක්ත–

කර්ම–ඝටඃ කෘතඃ කුලාලෙන සම්ප්‍රදාන–දානීයො **විප්‍රඃ.**
කර්තෘ–ඝටං කෘතවාන් **කුලාලඃ.** අපාදාන–උපාධ්‍යායො **ගුරුඃ.**
කරණ–පචනඃ අග්නිඃ. අධිකරණ–පචනී **ස්ථාලී.**

සමාසයෙන් උක්ත–

කර්ම–ප්‍රාප්තොදකො **ග්‍රාමඃ.** සම්ප්‍රදාන-දත්තභූමිර්**විප්‍රඃ.**
කර්තෘ–කෘතපූජො **භක්තඃ.** අපාදාන–නිර්ගතපක්ෂී **වෘක්ෂඃ.**
කරණ-ජිතනාවජාගඃ **ඛඩ්ගඃ.** අධිකරණ-වීරපුරුෂො **ග්‍රාමඃ.**

සම්බන්ධ-පීතාම්බරො **හරිඃ.**

තද්ධිතයෙන් උක්ත–

කර්ම–කෞඩ්කුමං **වස්ත්‍රම්.** සම්ප්‍රදාන–පචකඃ **පුරුෂඃ.**
කර්තෘ–මාථුරෙ **නරඃ.** අධිකරණ–දෘෂවතී **භූමිඃ**

සම්බන්ධ-ධනවාන් **පුරුෂඃ**

නිපාතයෙන් උක්ත–

කර්ම–**විෂවෘක්ෂොපි** සංවර්ධ්‍ය ස්වයං ඡෙත්තුමසාම්ප්‍රතම්.
කර්තෘ–ක්‍රමාදමුං **නාරද** ඉත්‍යබොධි සඃ.

මෙහි කර්මාදිකාරයන්හි නිපන් "ක්‍රියතෙ" යනාදි ආඛ්‍යාත ක්‍රියාදියෙන් "ඝටඃ" යනාදි කර්මාද්‍යර්ථයෝ උක්ත වෙත්, එනම්– "ක්‍රියතෙ" යන ආඛ්‍යාතක්‍රියාව කර්මකාරකයෙහි නිෂ්පන්න බැවින් ඉන් "ඝටඃ" යන කර්මයද, "කරොති" යන ආඛ්‍යාතක්‍රියාව කර්තෘකාරකයෙහි නිපන්බැවින් ඉන් "කුලාලඃ" යන කර්ත්‍රර්ථයද, ආඛ්‍යාතයෙන් උක්තයි.

"කෘතඃ" යන "ක්ත" ප්‍රත්‍යයාන්ත කෘදන්තය කර්මකාරකයෙහි නිපන්බැවින් ඉන් "ඝටඃ" යන කර්මාර්ථයද, එසේම "කෘතවාන්" යන "ක්තවතු" ප්‍රත්‍යයාන්ත කර්තෘකාරකකෘදන්තයෙන් "කුලාලඃ" යන කර්ත්‍රර්ථයද, "පච්‍යතෙනෙන" යන වාක්‍යයෙහි කරණකාරක "යුට්" ප්‍රත්‍යයෙන් නිපන් "පචනඃ" යන කෘදන්තයෙන් "අග්නිඃ" යන කරණාර්ථයද, "දීයතෙස්මෛ" යන වාක්‍යයෙහි සම්ප්‍රදානකාරක "අනීය" ප්‍රත්‍යයෙන් නිපන් "දානීයඃ" යන කෘදන්තයෙන් "විප්‍රඃ" යන සම්ප්‍රදානාර්ථයද "උප සමීපෙ ගත්වා අධීයතෙස්මාත්" යන වාක්‍යයෙහි අපාදානකාරක "ඝඤ්" ප්‍රත්‍යයෙන් නිපන් "උපාධ්‍යායඃ" යන කෘදන්තයෙන් "ගුරුඃ" යන අපාදානාර්ථයද, "පච්‍යතෙස්‍යාම්" යන වාක්‍යයෙහි අධිකරණකාරක "යුට්" ප්‍රත්‍යයෙන් නිපන් "පචනී" යන කෘදන්තයෙන් "ස්ථාලී" යන අධිකරණාර්ථයද කෘදන්තයෙන් උක්තයි.

"ප්‍රාප්තමුදකං යස්මින්" යන වාක්‍යයෙහි නිපන් "ප්‍රාප්තොදකඃ" යන කර්මාර්ථ බහුව්‍රීහිසමාසයෙන් "ග්‍රාමඃ" යන කර්මයද, "කෘතා පූජා යෙන" යන වාක්‍යයෙහි නිපන් "කෘතපූජඃ" යන කර්ත්‍රර්ථබහුව්‍රීහිසමාසයෙන් "භක්තඃ" යන කර්තෘද, "ජිතනාඃ ජාගො යෙන" යන වාක්‍යයෙහි නිපන් "ජිතනාවජාගඃ" යනකරණාර්ථ බහුව්‍රීහිසමාසයෙන් "ඛඩ්ගඃ" යන කරණයද, "දත්තා භූමිර්‍යස්මෛ" යන වාක්‍යයෙහි නිපන් "දත්තභූමිඃ" යන සම්ප්‍රදානාර්ථ බහුව්‍රීහිසමාසයෙන් "විප්‍රඃ" යන සම්ප්‍රදානයද "නිර්ගතාඃ පක්ෂිණො යස්මාත්" යන වාක්‍යයෙහි නිපන් "නිර්ගතපක්ෂී" යන අපාදානාර්ථබහුව්‍රීහිසමාසයෙන් "වෘක්ෂඃ" යන අපාදානයද, "වීරාඃ පුරුෂා යස්මින්" යන වාක්‍යයෙහි නිපන් "වීරපුරුෂඃ" යන

අධිකරණාර්ථබහුව්‍රීහිසමාසයෙන් "ග්‍රාමඃ" යන අධිකරණයද, 'පීතමම්බරං යස්‍ය" යන වාක්‍යයෙහි නිපන් "පීතාම්බරඃ" යන සම්බන්ධාර්ථබහුව්‍රීහිසමාසයෙන් "හරිඃ" යන සම්බන්ධයද උක්තයි.

"කුඞ්කුමෙන රක්තම්" යන වාක්‍යයෙහි කර්මාර්ථ "අණ්" ප්‍රත්‍යයෙන් නිපන් "කෞඞ්කුමම්" යන තද්ධිතයෙන් "වස්ත්‍රම්" යන කර්මයද, "මථුරායා ආගතො ජාතො වා" යන වාක්‍යයෙහි කර්ත්‍රර්ථ "අණ්" ප්‍රත්‍යයෙන් නිපන් "මාථුරඃ" යන තද්ධිතයෙන් "නරඃ" යන කර්තෘද, "පඤ්ච වෘද්ධ්‍යාදි දීයතෙස්මෛ" යන වාක්‍යයෙහි සම්ප්‍රදානාර්ථ "ක" ප්‍රත්‍යයෙන් නිපන් "පඤ්චකඃ" යන තද්ධිතයෙන් "පුරුෂඃ" යන සම්ප්‍රදානයද, "දෘෂද් උපලාඃ සන්ත්‍යස්‍යාම්" යන වාක්‍යයෙහි අධිකරණාර්ථ "වතු" ප්‍රත්‍යයෙන් නිපන් "දෘෂද්වතී" යන තද්ධිතයෙන් "භූමිඃ" යන අධිකරණයද "ධනමස්‍යාස්ති' යන වාක්‍යයෙහි සම්බන්ධාර්ථ "වතු" ප්‍රත්‍යයෙන් නිපන් "ධනවාන්" යන තද්ධිතයෙන් "පුරුෂඃ" යන සම්බන්ධයද උක්තයි.

"අසාම්ප්‍රතම්" යන කර්මාර්ථද්‍යොතක නිපාතයෙන් "විෂවෘක්ෂඃ" යනු උක්තකර්මයි. "ඉති" යන කර්ත්‍රර්ථද්‍යොතක නිපාතයෙන් "නාරදඃ" යනු උක්තකර්තෘයි. තවද මෙහි "සංවර්ධ්‍ය" යන පූර්වක්‍රියාවට "විෂවෘක්ෂම්"යි අනුක්තකර්මය වියයුතුවත්ම "අසාම්ප්‍රතම්" යන කර්මාර්ථද්‍යොතක නිපාතයාගේ ප්‍රාධාන්‍යාපෙක්ෂාවෙන් "විෂවෘක්ෂඃ"යි උක්තකර්මත්වයෙන් ප්‍රථමා විය. "අබොධි' යන කර්ත්‍රර්ථක්‍රියාවට "නාරද" ශබ්දය අනුක්තකර්මය වත්ම එහි කර්ත්‍රර්ථද්‍යොතක "ඉති' නිපාතයාගේ යොගයෙන් උක්තකර්ත්‍රර්ථයෙහි ප්‍රථමා විය. සකලප්‍රයොගයන්හි ම උක්තානුක්තත්වය ප්‍රධාන අප්‍රධානක්‍රියාවන් මධ්‍යයෙහි ප්‍රධානක්‍රියාහුගේ අපෙක්ෂාවෙන්ම වියයුතු වේ. එනම්-"පක්වමොදනං භුඞ්ක්තෙ" යන වාක්‍යයෙහි එකම ඔදනය තමා "පක්වම්" යන කර්මකාරකක්‍රියාවට උක්තත්වයෙන්ද "භුඞ්ක්තෙ' යන කර්තෘකාරකආඛ්‍යාතක්‍රියාවට අනුක්තත්වයෙන්ද කර්ම වේ. එහෙත් මෙහි "පක්වම්" යන්න අප්‍රධාන බැවින් තදපෙක්ෂකත්වයෙන් වියයුතු උක්තකර්මත්වයෙහි ප්‍රථමාව නොව "භුඞ්ක්තෙ" යන ප්‍රධානක්‍රියාපෙක්ෂකත්වයෙන් වියයුතු අනුක්තකර්මත්වයෙහි ද්විතීයාවම විය. "ඔදනඃ ;පක්වො භුජ්‍යතෙ" යනාදි යද මේ ක්‍රමයෙන් දතයුතුයි.

a කර්තා කර්ම ච කරණං සම්ප්‍රදානං තථෛව ච,
අපාදානාධිකරණමිත්‍යාහුඃ කාරකාණි ෂට්.

b ද්විතීයා කර්මණි ඥෙයා කර්තරි ප්‍රථමා යදා,
උක්තකර්තෘප්‍රයොගොයං න තදා යක්ප්‍රයුජ්‍යතෙ.

c තෘතීයා කර්තරි යදා කර්මණි ප්‍රථමා තදා,
උක්තකර්මප්‍රයොගොයං න තදා පරස්මෛපදම්.

d "ස්වතන්ත්‍රඃ කර්තා"

e ක්‍රියායාං ස්වාතන්ත්‍ර්‍යෙණ විවක්ෂිතොර්ථඃ කර්තා ස්‍යාත්, (ප්‍රධානීභූතධාත්වර්ථාශ්‍රයඃ කර්තා).

මෙසේ ෂට්කාරයෙන් හා සම්බන්ධයද ලක්ෂ්‍යලක්ෂණත්වයෙන් දක්වා ව්‍යාකරණීය සාමාන්‍ය නියමයක් ප්‍රකාශකරන්නාහු "කර්තා" යනාදි ශ්ලොකත්‍රය කීහු.

a මේ ශ්ලොකයෙහි අර්ථ කාරකයෙහි මුලදී ප්‍රකාශිතයි.

b යදා, යම්කලෙක්හි; කර්තරි, කර්ත්‍රර්ථයෙහි; ප්‍රථමා, ප්‍රථමා විභක්තිය වේද; (එකල්හි) කර්මණි, කර්මාර්ථයෙහි; ද්විතීයා, ද්විතීයා විභක්තිය; ඥෙයා, දතයුතුයි; අයම්, මේ; උක්තකර්තෘප්‍රයොගඃ, උක්තකර්තෘප්‍රයොගයයි; තදා, එකල්හි; යක්, (කර්මකාරක) යක් ප්‍රත්‍යය; නප්‍රයුජ්‍යතෙ, නොයොදනු ලැබේ.

c යදා, යම්කලෙක්හි; කර්තරි, කර්ත්‍රර්ථයෙහි; තෘතීයා, තෘතීයා විභක්තිය වේද; තදා, එකල්හි; කර්මණි, කර්මාර්ථයෙහි, ප්‍රථමා, ප්‍රථමා විභක්තිය (දතයුතුයි); අයම්, මේ; උක්තකර්මප්‍රයොගඃ, උක්තකර්මප්‍රයොගයයි; තදා, එකල්හි; න පරස්මෛපදම්, පරස්මෛපදය නොවේ; (හෙවත් ක්‍රියාව කර්තෘකාරක නොවේ).

මෙහි ප්‍රකාශිතවූයේ කර්තෘ කර්ම දෙදෙනාගේ උක්තානුක්තභාවය හා එහි විභක්ත්‍යාදිය යෙදෙන පිළිවෙළයි. මේ මෙසේ දක්වා තත්කර්තෘකර්මාදිය පාණිනීය ක්‍රමයෙන් විස්තරකරන්නාහු "ස්වතන්ත්‍රඃ" යනාදිය කීහු.

d ස්වතන්ත්‍රඃ, තමන් පිළිබඳ වශීකාරය ඇත්තේ; හෙවත් ධාතු පාතප්‍රධානීභූත ව්‍යාපාරය ඇසුරු කරන්නේ; කර්තා, කර්තෘ නම් වේ.

e ක්‍රියායාං, ක්‍රියායෙහි; ස්වාතන්ත්‍ර්‍යෙණ, ස්වාධීනත්වයෙන්; විවක්ෂිතඃ අර්ථඃ, විවක්ෂාකරණලද අර්ථය; කර්තා ස්‍යාත්, කර්තෘ නම්

a "සාධකතමං කරණම්"

b ක්‍රියාසිද්ධෞ ප්‍රකෘෂ්ටොපකාරකං කරණසංඥං ස්‍යාත්.

c "කර්තෘකරණයොස්තෘතීයා"

d අනභිහිතෙ කර්තරි කරණෙ ච තෘතීයා ස්‍යාත්.

e "අකථිතඤ්ච"

f අපාදානාදිවිශෙෂෛරවිවක්ෂිතං කාරකං කර්මසංඥං ස්‍යාත්.

g දුහ්‍යාච්පච්දණ්ඩ්රුධිප්‍රච්ඡි-චිබ්‍රෑශාසුජිමන්ථ්මුෂාම්,
කර්මයුක් ස්‍යාදකථිතං-තථා ස්‍යාන්නීහෘකෘෂ්වහාම්.

වන්නේය. (ප්‍රධානීභූතධාත්වර්ථාශ්‍රයඃ, ප්‍රධානවූ ධාත්වර්ථය ආශ්‍රය කොට ඇත්තේ; කර්තා, කර්තෘතෙමේයි.)

a සාධකතමම්, අතිශයින් ක්‍රියාසිද්ධියට මහල්වූයේ; කරණම්, කරණ නම් වේ.

b ක්‍රියාසිද්ධෞ, ක්‍රියාසිද්ධියෙහි; ප්‍රකෘෂ්ටොපකාරකම්, ප්‍රකර්ෂ යෙන් උපකාර කරන්නේ; කරණසංඥං ස්‍යාත්, කරණ නම් වන්නේය.

c කර්තෘකරණයොඃ, කර්තෘකාරක කරණකාරකදෙක්හි; තෘතීයා, තෘතීයා විභක්තිය වේ.

d අනභිහිතෙ, අනුක්තවූ; කර්තරි, කර්තෘකාරකයෙහිද; කර ණෙ ච කරණකාරකයෙහිද; තෘතීයා ස්‍යාත්, තෘතීයා විභක්තිය වන්නේය; (මෙහි කර්ත්‍රාදියෙහි විස්තර පූර්වොක්ත බැවින් මෙහි ප්‍රකාශ නොකරමු; තවද මෙසේ කර්ත්‍රාදිය දක්වා අකථිතකර්මය යද පාණිනීයානුසාරයෙන් ගෙණහැරදක්වන්නාහු 'අකථිතඤ්ච'' යනාදිය කීහු).

e අකථිතඤ්ච, අකථිතයද (අපාදානාදි විශෙෂයන් විසින් තත් තද් රූපයෙන් කියනුලබන්නේද) කර්ම නම් වේ.

f අපාදානාදිවිශෙෂෛඃ, අපාදානාදි කාරකවිශෙෂයන් විසින්; අවිවක්ෂිතං, විවක්ෂානොකරණලද්දවූ; කාරකම්, කාරකය; කර්ම සංඥං ස්‍යාත්, කර්ම නම් වන්නේය.

(මෙහි අකථිත කර්මය යෙදෙන තැන් දක්වන්නාහු "දුහ්‍යාච්" යනාදි ශ්ලොකය හා ඒ පිළිබඳ උදාහරණද කීහු).

g දුහ්, "දුහ-ප්‍රපූරණෙ "යනධාතුය; යාච්, "ටු-යාචෘ-යාච්ඤායාම්" යන ධාතුය; පච්, "ඩු-පචඃ-පාකෙ" යන ධාතුය; දණ්ඩ්, "දණ්ඩ-දණ්ඩග්‍රහණෙ" යන ධාතුය; රුධි, "රුධිර් ආවරණෙ" යන ධාතුය; ප්‍රච්ඡි, "ප්‍රච්ඡ-ඥීප්සායාම්" යන ධාතුය; චි, "චිඤ්-චයනෙ" යන ධාතුය; බ්‍රෑ, "බ්‍රෑඤ්-ව්‍යක්තායාං වාචි" යන ධාතුය; ශාසු, "ශාසු-අනුශිෂ්ටෞ" යන ධාතුය; ජි, 'ජි-ජයෙ" යන ධාතුය; මන්ථ්, "මන්ථ-විලොඩනෙ" යන ධාතුය; මුෂාම්, "මුෂ-ස්තෙයෙ" යන ධාතුය යන මොවුන්ගේ; කර්මයුක්, කර්මය හා යුක්තවන්නේ හෙවත් මුඛ්‍ය කර්මය හා ක්‍රියාවෙන් සම්බන්ධකරණු ලබන්නේ; අකථිතං ස්‍යාත්, අකථිතකර්ම නම් වන්නේය නී, "ණීඤ්-ප්‍රාපණෙ" යන ධාතුය; හෘ, "හෘඤ්-හරණෙ" යන ධාතුය; කෘෂ්, "කෘෂ-විලෙඛනෙ" යන ධාතුය; වහාම්' "වහ-ප්‍රාපණෙ" යන ධාතුය; යන මොවුන්ගේද; තථා, එසේම මුඛ්‍ය කර්මය හා යුක්තවන්නේ; ස්‍යාත්, (අකථිතකර්මය) වන්නේය.

a දුහාදීනාං මාදශානාං තථා නීප්‍රභෘතීනාං චතුර්ණාං කර්මණා යද්‍යුජ්‍යතෙ තදෙවාකථිතං කර්මෙති පරිගණනං කර්තව්‍යමිත්‍යර්ථඃ.

---

a දුහාදීනාම්, දුහ ධාතුව ආදිකොට ඇත්තාවූ; මාදශානාම්, මාදශධාතූන්ගේද, තථා, එසේම; නීප්‍රභෘතීනාම්, නීධාතුව ආදි කොට ඇත්තාවූ; චතුර්ණාම්, චතුර්ධාතූන්ගේද (ධාතු සතරදෙනා ගේද); කර්මණා, කර්මය හා; යත්, යමක්; යුජ්‍යතෙ, යුක්තවේද (ක්‍රියාවෙන් සම්බන්ධකරණු ලැබේද); තත්, ඒ; අකථිතං කර්ම ඉති, අකථිතකර්මයයි; පරිගණනං කර්තව්‍යං ඉති, නියමකොට ගිණීම කටයුතුය යන; අර්ථඃ, අර්ථයි.

මෙහි දුහාදි ද්විකර්මධාතූන් සම්බන්ධි මුඛ්‍ය කර්මය හා යුක්ත වන්නාවූ අමුඛ්‍ය කර්මය අර්ථවශයෙන් අපාදානාදි ලක්ෂණ යුක්තවේ; එහෙත් ඒ අපාදානාදි සංඥාවලින් අවිවක්ෂිත හෙයින් අපාදානාදිය නොව කර්මය වේ. ඒ "විවක්ෂාතඃ කාරක විභක්තයො නානා භව න්තීති ශාබ්දිකාඃ" යනු අපොපදෙශ බැවිනි. විවක්ෂා වශයෙන් කාරකවිභක්තීහු වෙනස්වෙත්යයි ශබ්දශාස්ත්‍රඥයෝ කියත් යනු එහි අර්ථයි; ඒ කර්මය වනාහි අපාදානාදි සංඥානතරයෙන් අකථිත හෙයින් අකථිතකර්මයයි ද කියනු ලැදබි.

a ගාං දොග්ධි පයඃ, බලිං යාචතෙ වසුධාම්, අවිනීතං විනයං යාචතෙ, තණ්ඩුලානොදනං පචති, ගර්ගාන් ශතං දණ්ඩයති, ව්‍රජමවරුණද්ධි ගාම්, මාණවකං පන්ථානං පෘච්ඡති, වෘක්ෂමවචිනොති ඵලානි, මාණවකං ධර්මං බ්‍රූතෙ, ශාස්ති වා, ශතං ජයති දෙවදත්තම්, සුධාං ක්ෂීරනිධිං මථ්නාති, දෙවදත්තං ශතං මුෂ්ණාති, ග්‍රාමමජාං නයති, හරති, කර්ෂති, වහති වා, අර්ථනිබන්ධනෙයං සංඥා, බලිං භික්ෂතෙ වසුධාම්, මාණවකං ධර්මං භාෂතෙ, අභිධත්තෙ, වක්තීත්‍යාදි.

---

a ගාම්, ගොධෙනුව, හෙවත් ගොධෙනුවගෙන් හෝ ගොධෙනුවගේ; පයඃ, කිරි; දොග්ධි, දෙවී; (මෙහි "ගාම්" යනු අකථිත කර්මයි). බලිම්, බලිනම් අසුරයා හෙවත් බලිනම් අසුරයාගෙන්; වසුධාම්, පෘථිවිය; යාචතෙ, ඉල්වයි; (මෙහි "බලිම්" යනු අකථිත කර්මයි) විනයම්, හික්මීම හෙවත් හික්මීම පිණිස; අවිනීතම්, නොහික්මුනහු; යාචතෙ, යාච්ඤාකෙරේ; (මෙහි 'විනයම්" යනු අකථිත කර්මයි). තණ්ඩුලාන්, සහල් හෙවත් සහලින්; ඔදනම්, බත; පචති, පිසයි; (මෙහි "තණ්ඩුලාන්" යනු අකථිත කර්මයි); ගර්ගාන්, ගර්ගයන් හෙවත් ගර්ගයන්ගෙන්; ශතම්, සියයක්; දණ්ඩයති, දඩගණී; (මෙහි "ගර්ගාන්" යනු අකථිත කර්මයි). ව්‍රජම්, ගාල; හෙවත් ගාලෙහි; ගාම්, ගොධෙනුව; අවරුණද්ධි, ආවරණය කෙරේ; (මෙහි "ව්‍රජම්" යනු අකථිත කර්මයි). මාණවකම්, මාණවකයා; හෙවත් මාණවකයා පිණිස; පන්ථානම්, මාර්ගය; පෘච්ඡති, විචාරයි; (මෙහි "මාණවකම්" යනු අකථිත කර්මයි). වෘක්ෂම්, වෘක්ෂය; හෙවත් වෘක්ෂයෙන්; ඵලානි, ඵලයන්; අවචිනොති කඩා රැස් කෙරේ. (මෙහි 'වෘක්ෂම්" යනු අකථිත කර්මයි). මාණවකම්, මාණවකයා; හෙවත් මාණවකයා පිණිස; ධර්මම්, ධර්මය; බ්‍රූතෙ, කියයි; ශාස්ති වා, අනුශාසනාකෙරේ කියා හෝ වේ. (මෙහි "මාණවකම්" යනු අකථිත කර්මයි). දෙවදත්තම්, දෙවදත්තයා හෙවත් දෙවදත්තයාගෙන්; ශතම්, සියයක්; ජයති, දිනයි. (මෙහි 'දෙවදත්තම්" යනු අකථිත කර්මයි). ක්ෂීරනිධිම්, ක්ෂීරසාගරය; හෙවත් ක්ෂීරසාගරයෙහි; සුධාම්, සුධාභොජනය; මථ්නාති, විලොඩනය කෙරේ (කලඹයි); (මෙහි 'ක්ෂීරනිධිම්" යනු අකථිත කර්මයි). දෙවදත්තම්, දෙවදත්තයා; හෙවත් දෙවදත්තයාගෙන්; ශතම්, සියය; මුෂ්ණාති, චෞර්‍ය්‍යයෙන් පැහැරගණී; (මෙහි "දෙවදත්තම්" යනු අකථිත කර්මයි). ග්‍රාමම්, ගම; හෙවත් ගමෙහි; අජාම්, එළුවා; නයති, පමුණුවයි (යවයි); හරති, හරී; කර්ෂති, අදී; වහතිවා,

a "අකර්මකධාතුභිර්යොගෙ දෙශඃ කාලො භාවො ගන්තව්‍යොධ්වා ච කර්මසංඥඃ ස්‍යාදිති වාච්‍යම්"–කුරූන් ස්වපිති, මාසමාසෙත, ගොදොහමාසෙත, ක්‍රොශමාසෙත.

පමුණුවයි කියා හෝ වේ (මෙහි "ග්‍රාමම්" යනු අකථිත කර්මයි). ඉයං සංඥා, මේ සංඥා තොමෝ; අර්ථනිබන්ධනා, අර්ථය කරුණු කොට ඇත්තී වේ. (එහෙයින් වක්ෂ්‍යමාණ උදාහරණදවේ) එනම්, බලිම්, බලිනම් අසුරයාගෙන්; වසුධාම්, පෘථිවිය; භික්ෂතෙ, ඉල්වයි. (මෙහි "බලිම්" යනු අකථිත කර්මයි) මාණවකම්, මාණවකයාට; ධර්මම්, ධර්මය; භාෂතෙ කියයි. (මෙහි "මාණවකම්' යනු අකථිත කර්මයි). "අභිධත්තෙ වක්ති" යනුද වේ, එම අර්ථයි; ඉත්‍යාදි, මේ ආදියවේ.

යථොක්ත අකථිතකර්මය වනාහි දුහාදි ද්විකර්මකධාතුන්ගේ යොගයෙහි ම ලැබෙන්නේ වේ. ද්විකර්මකධාතුවක් පිළිබඳ කර්මය යෙන් එකක් කර්තෘහු විසින් ක්‍රියොපාත්ත ඵලාශ්‍රයෙන් විවක්ෂිත බැවින් මුඛ්‍යකර්මය වේ. අනෙක ඒ මුඛ්‍ය කර්මය සමග හෝ ක්‍රියාව සමග යුක්තව ඊට නිමිත්තත්වයෙන් අපාදාන සම්ප්‍රදානාධිකරණාදි ලක්ෂණ සහගතව පවත්නේ වේ. එහෙත් ඒ අපාදානාදියෙන් අවිවක්ෂිත බැවින් අකථිතද වේ. එනම්–"ගාං දොග්ධි පයඃ" යන තන්හි දොහනක්‍රියොපාත්ත ඵලත්වයෙන් විවක්ෂිතවූයේ පයස බැවින් ඒ මුඛ්‍යකර්මයි. ගොපදාර්ථය වනාහි අපාදාන සම්බන්ධ සහගත නිමිත්තමාත්‍රොපාත්ත බැවින් අමුඛ්‍ය කර්මයි. එය අපාදානාදිත්වයෙන් අවිවක්ෂිත බැවින් අපාදාන සංඥාදිවශයෙන් අකථිතයි. සෙසේස ද මෙසේයි. තවද මෙහි ද්විකර්මකධාතුන්ට විහිතවූ සංඥාව අර්ථය කරුණු කොට (මුල්කොට) ඇත්තීයයි කියා තදර්ථවූ අන්‍යධාතුන්ගේද ගැණීම කටයුතු බැව් "බලිං භික්ෂතෙ වසුධාම්" යනාදි උදාහරණවලින් ස්ඵුට කළාහ. එහෙත් එහි "නී, වහ" ධාතුවය එකාර්ථ වන්ම "භාරං වහති" යනාදි ඇතම් තන්හි විලක්ෂණාර්ථද වියහැකි බැවින් ඒ ධාතුවයම සංග්‍රහ කළාහ.

a අකර්මකධාතුභිඃ යොගෙ, අකර්මකධාතූන් හා යොගයෙහි; දෙශඃ, දෙශවාචක ශබ්දයද; කාලඃ, කාලවාචක ශබ්දයද; භාවඃ, භාවවාචක ශබ්දයද; ගන්තව්‍යඃ අධ්වා ච, යායුතුවූ මාර්ගවාචක ශබ්දයද; කර්මසංඥඃ ස්‍යාත් ඉති, කර්මසංඥාවත්නේයයි; වාච්‍යම්, කියයුතුයි; කුරූන්, කුරුදෙශයන්හි; ස්වපිති, ශයනය කෙරේ. (මෙහි "ස්වප්' යන අකර්මකධාතුයොගයෙහි "කුරූන්" යනු දෙශවාචකශබ්ද බැවින් කර්මයි). මාසම්, මසක්; ආසෙත, හිඳී; (මෙහි

a "ගතිබුද්ධිප්‍රත්‍යවසානාර්ථශබ්දකර්මාකර්මකාණාමණි කර්තා ස ණෞ"

b ගත්‍යාද්‍යර්ථානාං ශබ්දකර්මකාණාමකර්මකාණාඤ්චාණෞ යඃ කර්තා ස ණෞ කර්ම ස්‍යාත්.

c ශත්‍රූනගමයත් ස්වර්ගං වේදාර්ථං ස්වානබොධයත්
ආශයච්චාමෘතං දේවාන් වේදමධ්‍යාපයද්විධිම්,
ආසයත් සලිලෙ පෘථ්වීං යඃ ස මෙ ශ්‍රීහරිර්ගතිඃ

'ආස්" යන අකර්මකධාතුයොගයෙහි "මාසම්" යනු කාලවාචක ශබ්දබැවින් කර්මයි) ගොදොහම්, ගොධෙනුව දෙවීමෙහි; ආසෙත, හිඳී; (මෙහිද 'ආස්" යන අකර්මක ධාතුයොගයෙහි "ගොදොහම්" යනු භාවවාචක ශබ්ද බැවින් කර්මයි) ක්‍රොශම්, ගව්සතක්; ආසෙත, හිඳී (මෙහිද "ආස්" යන අකර්මකධාතුයොගයෙහි "ක්‍රොශම්" යනු ගන්තව්‍යමාර්ගවාචක ශබ්ද බැවින් කර්මයි). මෙහි කී දෙශවාචක ශබ්ද නම් කුරුපාංචාලාදිහු වෙත්. ග්‍රාමාදි ප්‍රදෙශමාත්‍රයෝ නො වෙත්. මාර්ගවාචක ශබ්ද නම් යාහැකියයි ප්‍රසිද්ධ න්‍යූනමාර්ගයෝ වෙත්.

a ගති, ගමනාර්ථධාතුය; බුද්ධි, අවබොධාර්ථ ධාතුය; ප්‍රත්‍යවසානාර්ථ, භක්ෂණාර්ථධාතුය; ශබ්දකර්ම, ශබ්දය කර්ම (කාරක) කොට ඇති ධාතුය; අකර්මකාණාම්, අකර්මකධාතුය යන මොවුන්ගේ; අණි, (ප්‍රයොජ්‍යයෙහි) ණි (ඤ්) ප්‍රත්‍යය රහිතක 'හි; කර්තා, (යම්) කර්තෘ පදයක් වේද; ණෞ, ණි (ඤ්) ප්‍රත්‍යය ඇතිකල්හි; සඃ, ඒ කර්තෘ තෙම (කර්මසංඥ වේ).

b ගත්‍යාද්‍යර්ථානාම්, ගමනාදිය අර්ථකොට ඇති ධාතුන්ගේද; ශබ්දකර්මකාණාම්, ශබ්දය කර්ම (කාරක) කොට ඇති ධාතුන්ගේද; අකර්මකාණාංච, අකර්මකධාතූන්ගේද; අණෞ ණි (ඤ්) ප්‍රත්‍යය රහිතකල්හි; යඃ කර්තා, යම්කර්තෘ කෙනෙක්වේද; ණෞ, ණි (ඤ්) ප්‍රත්‍යය ඇතිකල්හි; සඃ, හෙතෙම; කර්මස්‍යාත්, කර්මය වන්නේය.

c යඃ ශ්‍රීහරිඃ, යම් ශ්‍රීවිෂ්ණුකෙනෙක් තෙම; ශත්‍රූන්, සතුරන්; ස්වර්ගම්, ස්වර්ගයට; අගමයත්, යැවීද; ස්වාන්, ස්වකීයයන් ලවා; වේදාර්ථම්, වේදාර්ථය; අබොධයත්, අවබොධකරවීද; දෙවාන්, දෙවියන් ලවා; අමෘතම්, අමෘතය; ආශයත් ච, අනුභව කරවීද; විධිම්, බ්‍රහ්මයා ලවා; වේදම්, වේදය; අධ්‍යාපයත්, හැදෑරවීද; පෘථ්වීම්, පෘථිවිය; සලිලෙ, ජලයෙහි; ආසයත්, උපවෙශනය කැරවීද; සඃ, හෙතෙම; මෙ, මාගේ; ගතිඃ, ගතිය (ප්‍රතිෂ්ඨාව) වේ,

a ගෞණෙ කර්මණි දුහ්‍යාදෙඃ ප්‍රධානෙ නීහෘකෘෂ්වහාම්,
බුද්ධිභක්ෂාර්ථයොඃ ශබ්දකර්මණාඤ්ච නිජෙච්ඡයා
ප්‍රයොජ්‍යකර්මණ්‍යන්‍යෙෂාං ණ්‍යන්තානාං ලාදයො මතාඃ.

b ගෞර්දුහ්‍යතෙ පයඃ, අජා ග්‍රාමං නීයතෙ, බොධ්‍යතෙ මාණවකං ධර්මඃ, මාණවකො ධර්මමිති වා, දෙවදත්තෙන ග්‍රාමං ගම්‍යතෙ.

ප්‍රයොජ්‍යප්‍රත්‍යය රහිතකල්හි මෙකී ගමනාර්ථධාත්වාදීන්ගේ යම් කර්තෘපදයක් වේ නම් එය ප්‍රයොජ්‍යසහිතවූකල්හි කර්මය වේ, එහි ප්‍රයොජකවූ අන්‍යකර්තෘකෙනෙක් ද යෙදේ. "ශත්‍රවඃ ස්වර්ගම් ගච්ඡන්, ස්වා වේදාර්ථමබුධ්‍යන්ත, දෙවා අමෘතමශ්නන්, විධිර්වේදම ධ්‍යෛත, සලිලෙ පෘථ්වී ආසෙත" යනු යථොක්ත උදාහරණයන්ගේ ප්‍රයොජ්‍යරහිතාවස්ථායි. මෙහි "ශත්‍රවඃ, දෙවාඃ, විධිඃ, පෘථ්වී",යන කර්තෘපදයෝ ප්‍රයොජ්‍යසහිතාවස්ථායෙහි "ශත්‍රූන්" යනාදීහු කර්ම වූහ. "හරිඃ"යි ප්‍රයොජකවූ කර්තෘ පදයක්ද යුක්තාවිය.

a දුහ්‍යාදෙඃ, (ද්වාදශසංඛ්‍යක) දුහාදිධාතුගණයාගේ; ගෞණෙ කර්මණි, අප්‍රධානකර්මයෙහිද; නීහෘකෘෂ්වහාම්, 'නී හෘ කෘෂ් වහ්' යන ධාතූන්ගේ; ප්‍රධානෙ, ප්‍රධානකර්මයෙහිද; බුද්ධිභක්ෂාර්ථයොඃ, (ණ්‍යන්තවූ) බුද්ධ්‍යර්ථභක්ෂණාර්ථ දෙදෙනාගේ හා; ශබ්දකර්මණාඤ්ච, (ණ්‍යන්තවූ) ශබ්දය කර්මකාරක කොට ඇත්තවුන්ගේත්; නිජෙච්ඡයා, සියකැමැත්තෙන්ද (කැමැතිපරිද්දෙන්ද); ණ්‍යන්තානාම්, ණ්‍යන්තවූ; අන්‍යෙෂාම් අන්‍යධාතූන්ගේ; ප්‍රයොජ්‍යකර්මණි, ප්‍රයොජ්‍යකර්මයෙහිද; ලාදයඃ, ලාදීහු (ආඛ්‍යාතක්‍රියාදිහු); මතාඃ, දන්නාලද්දූහ.

b ගෞ, ගොධෙනුතොමෝ; පයඃ, කිරි; දුහ්‍යතෙ, දෝනා ලැබේ. අජා, එළුතොමෝ; ග්‍රාමම්; ගමට, නීයතෙ, පමුණුවනු ලැබේ. මාණවකම්, මාණවකයා; ධර්මඃ, ධර්මයතෙම; බොධ්‍යතෙ අවබොධකරවනු ලැබේ. වා, නොහොත්; මාණවකඃ, මාණවක තෙම, ධර්මම් ඉති, ධර්මය (අවබොධකරවනු ලැබේ කියාවේ). දෙවදත්තඃ, දෙවදත්තතෙම; ග්‍රාමම්, ගමට; ගම්‍යතෙ, යවනු ලැබේ.

උක්තකර්මාවස්ථාවෙහි ද්විකර්මකධාත්වාදීන්ගේ කර්මවයම උක්ත වේද නැතහොත් ප්‍රධාන කර්මය හෝ අප්‍රධාන කර්මය උක්තවේ දැයි සැකසහිත බැවින් තන්නිවාරණය පිණිස "ගෞණෙ" යනාදිය කීහු. එනම්-උක්තකර්මාවස්ථාවෙහි දුහාදිධාතූන්ගේ කර්මව, යෙන් අප්‍රධානකර්මය හා නී ආදිධාතූන්ගේ කර්මවයෙන් ප්‍රධාන

a "අකර්මකාණාං කාලාදිකර්මණාං කර්මණි භාවෙ ච ලකාර ඉෂ්‍යතෙ" මාසො මාසං වා ආස්‍යතෙ දෙවදත්තෙන, ණිජන්තානාමනුප්‍රයොජ්‍යෙ ප්‍රත්‍යයඃ, මාසමාස්‍යතෙ මාණවකඃ.

කර්මයද උක්තවේ, ප්‍රයොජ්‍යප්‍රත්‍යයාන්විතවූ බුධ්‍යර්ථ භක්ෂණාර්ථ ධාතූන්ගේ හා ශබ්දකර්මකධාතූන්ගේ කර්මවයෙන් එකක් වක්තෘ විවක්ෂාවශයෙන් උක්ත වේ. ඉන් අන්‍යවූ ප්‍රයොජ්‍යප්‍රත්‍යයාන්විත ධාතූන්ගේ කර්මයෙන් ප්‍රයොජ්‍යකර්මය උක්ත වේ. යනු එහි භාව යයි. මෙහි කී "ගෞර්දුහ්‍යතෙ පයඃ" යන තන්හි "දුහ්‍යතෙ" යන කර්මකාරකක්‍රියාව දුහාදිගණයෙහි බැවින් ඉන් "ගෞඃ" යි අප්‍රධානකර්මය උක්තව ප්‍රථමා විය. "පයඃ" යි ප්‍රධානකර්මය අනුක්තව ද්විතීයා විය. "අජා ග්‍රාමං නීයතෙ" යන තන්හි "නීයතෙ" යන කර්මකාරකක්‍රියාව න්‍යාදිගණයෙහි බැවින් ඉන් "අජා" යි ප්‍රධානකර්මය උක්තව ප්‍රථමා විය. "ග්‍රාමම්" යි අප්‍රධානකර්මය අනුක්තව ද්විතීයා විය. 'බොධ්‍යතෙ මාණවකං ධර්මඃ, මාණවකො ධර්මමිති වා" යන තන්හි "බොධ්‍යතෙ" යන ප්‍රයොජ්‍යසහිත කර්මකාරකක්‍රියාව බුධ්‍යර්ථධාතුනිෂ්පන්න බැවින් ඉන් වක්තෘවිවක්ෂා වශයෙන් පක්ෂයෙක්හි "ධර්මඃ" යි ප්‍රධානකර්මය ද, පක්ෂයෙක්හි "මාණවකඃ" යි අප්‍රධානකර්මයද උක්තව ප්‍රථමා විය. "දෙවදත්තො ග්‍රාමං ගම්‍යතෙ" යන තන්හි "ගම්‍යතෙ" යන ප්‍රයොජ්‍යසහිත කර්මකාරක ක්‍රියාව බුධ්‍යර්ථධාත්වාදියෙන් භින්නවූ "ගම්" ධාතු නිෂ්පන්න බැවින් ඉන් "දෙවදත්තඃ" යි ප්‍රයොජ්‍යකර්මය උක්තවිය– "බලිර්යාච්‍යතෙ වසුධාම්, අවිනීතං විනයො යාච්‍යතෙ, තණ්ඩුලා ඔදනං පච්‍යතෙන, ගර්ගාඃ ශතං දණ්ඩ්‍යතෙන, ව්‍රජොවරුධ්‍යතෙ ගාම්, මාණවකඃ පන්ථානං පෘච්ඡ්‍යතෙ, වෘක්ෂොවචීයතෙඵලානි, මාණවකොධර්මමුච්‍යතෙ, ශිෂ්‍යතෙ වා, ශතං ජීයතෙ දෙවදත්තඃ, සුධාංක්ෂීරනිධිර්මථ්‍යතෙ, දෙවදත්තඃ ශතං මුෂ්‍යතෙ, ග්‍රාමමජා හ්‍රියතෙ, කෘෂ්‍යතෙ, උහ්‍යතෙ වා" යනු ශෙෂවූ ද්විකර්මක ධාතූන්ට උදාහරණයි. "භොජ්‍යතෙ මාණවක මොදනඃ, ඔදනං මාණවකො වා" යනු භක්ෂණාර්ථ ධාතුයොගයෙහි උදාහරණයි. "පාඨ්‍යතෙ මාණවකඃ වෙදඃ, මාණවකො වෙදමිති වා" යනු ශබ්ද කර්මකධාතුයොගයෙහි උදාහරණයි.

a කාලාදිකර්මණාම්, කාලාදිය කර්මකොට ඇත්තාවූ; අකර්මකාණාම්, අකර්මකධාතූන්ගේ; ලකාරඃ, ලකාරය හෙවත් ආඛ්‍යාතය; කර්මණි, කර්මාර්ථයෙහිද; භාවෙච, භාවාර්ථයෙහිද; ඉෂ්‍යතෙ, අභිමත වේ. දෙවදත්තෙන, දෙවදත්තයාවිසින්; මාසඃ, මසක්තෙම; ආස්‍ය

a "තත්ප්‍රයොජකො හෙතුශ්ච"

b කර්තුඃ ප්‍රයොජකඃ කර්තෘසංඥො හෙතුසංඥශ්ච ස්‍යාත්.

c ස්වාර්ථං පරිත්‍යජ්‍ය අන්‍යාර්ථාභිධායිත්වමුපසර්ජනත්වම්,* ක්‍රියාජන්‍යඵලශාලිත්වං කර්මත්වම්, සාක්ෂාත්සම්බන්ධෙන ක්‍රියා

තෙ, හිඳිනු ලැබේ. (මෙහි "මාසඃ" යනු කර්මාර්ථාවස්ථාවෙහි උක්ත ප්‍රථමායි.) දෙවදත්තෙන, දෙවදත්තයා විසින්, මාසම්, මසක්; ආස්‍යතෙ, හිඳිමයි. (මෙහි 'මාසම්" යනු අනුක්තකර්මාර්ථයෙහි ද්විතීයායි.) ණිජන්තානාම්, ණිච්ප්‍රත්‍යයාන්ත කාලාදි කර්මකධාතූන් කෙරෙන් වනාහි; ප්‍රයොජ්‍යෙ, ප්‍රයොජ්‍ය කර්මයෙහි, ප්‍රත්‍යයඃ, (ආඛ්‍යාතාදි) ප්‍රත්‍යය වේ. මාණවකඃ, මාණවකතෙම; මාසම්, මසක්; ආස්‍යතෙ, හිඳුවනු ලැබේ. (මෙහි 'මාණවකඃ" යනු ප්‍රයොජ්‍යවූ උක්තකර්මයි. "මාසම්" යනු අනුක්ත කර්මයි.)

මෙහි කියනලද්දේ "අකර්මකධාතුභියෝගෙ" යනාදින් ප්‍රකාශිත දෙශකාලාදි කර්මය වන කල්හි ඒ අකර්මකධාතුවෙන් කර්මාර්ථයෙහි හා භාවාර්ථයෙහිද ක්‍රියාවන්ගේ සිද්ධිය වන බවද කර්මාර්ථයෙහි සිද්ධවූ ක්‍රියාවෙන් ඒ දෙශකාලදිකර්ම උක්තවනබවද, භාවාර්ථයෙහි සිද්ධවූ ක්‍රියාවෙන් අනුක්ත වන බවද, ණිච් (ප්‍රයොජ්‍ය) ප්‍රත්‍යයාන්තවූ එබඳු කර්මකාරකක්‍රියාවෙන් තත්ප්‍රයොජ්‍යකර්මය උක්තවන බවද වේ. මෙහි "මාස ආස්‍යතෙ දෙවදත්තෙන" යන තන්හි කාලකර්මාපෙක්ෂක අකර්මක "ආස්" ධාතුවෙන් කර්මාර්ථයෙහි ක්‍රියාව සිද්ධව ඉන් "මාසඃ"යි කර්මය උක්ත විය. "මාසමාස්‍යතෙ දෙවදත්තෙන" යන තන්හි එසේම භාවාර්ථයෙහි නිපන් "ආස්‍යතෙ" යන ක්‍රියාවෙන් "මාසම්" යි කර්මය අනුක්ත විය, "මාසමාස්‍යතෙ මාණවකඃ" යන තන්හි "ආස්‍යතෙ" යන ක්‍රියාව ණිච්ප්‍රත්‍යයාන්තව කර්මාර්ථයෙහි නිපන් බැවින් ඉන් "මාණවකඃ" යන ප්‍රයොජ්‍ය කර්මය උක්ත විය.

a තත්ප්‍රයොජකඃ, ඒ කර්තෘ ක්‍රියායෙහි මෙහෙයන්නේ; හෙතුශ්ච, හෙතු නම්ද ච ශබ්දයෙන් කර්තෘ නම්ද වේ.

b කර්තුඃ ප්‍රයොජකඃ, කර්තෘ මෙහෙයන්නේ; කර්තෘසංඥඃ, කර්තෘ සංඥා ඇත්තේද; හෙතුසංඥශ්ච, හෙතුසංඥා ඇත්තේද; ස්‍යාත්, වන්නේය.

c ස්වාර්ථං පරිත්‍යජ්‍ය, ස්වකීයාර්ථය හැර; අන්‍යාර්ථාභිධායිත්වම්, අන්‍යවූ අර්ථයක් පවසනසුලුබව; උපසර්ජනත්වම්, උපසර්ජනභාව

* "උපසර්ජන" යනු සමාසයෙහි ප්‍රථමානිර්දිෂ්ටපදයට නමෙකි, මෙහි ප්‍රකාශිතවූයේ උපසර්ජනයෙක්හි අර්ථයයි හැඟේ.

න්වයිත්වං මුඛ්‍යත්වම්, පරම්පරාසම්බන්ධෙන ක්‍රියාන්වයිත්වං ගෞණත්වම්.

ඉති කාරකප්‍රක්‍රියා සම්පූර්ණා.

යයි. ක්‍රියාජන්‍ය ඵලශාලිත්වම්, ක්‍රියායෙන් ඉපදවියයුතු ඵලයෙන් යුතුබව; කර්මත්වම්, කර්මභාවයයි. සාක්ෂාත්සම්බන්ධෙන, ප්‍රත්‍යක්ෂ සම්බන්ධයෙන් (අව්‍යවධානව යෙදීමෙන්); ක්‍රියාන්වයිත්වම්, ක්‍රියාව අනුව යන සුලුබව; මුඛ්‍යත්වම්, මුඛ්‍යභාවයයි; පරම්පරාසම්බන්ධෙන, පරම්පරාසම්බන්ධයෙන් (ව්‍යවධානව යෙදීමෙන්) ක්‍රියාන්වයිත්වම්, ක්‍රියාව අනුව යන සුලුබව, ගෞණත්වම්, ගෞණ (අප්‍රධාන) භාවයයි– ඉති, මෙතෙකින්, කාරකප්‍රක්‍රියා, කාරකප්‍රක්‍රියාව; සම්පූර්ණා, සම්පූර්ණ වේ.

මෙහි කී "ක්‍රියාජන්‍යඵලශාලිත්වම්" යනාදියෙන් පූර්වෝක්ත කර්මත්වය හා එහි මුඛ්‍යාමුඛ්‍යත්වය ප්‍රකාශිතයි. එනම්–"ගාං දොග්ධි පයඃ" යන තන්හි "පයඃ" යනු ක්‍රියාජන්‍ය ඵලයෙන් යුක්ත බැවින් කර්මත්වයයි. එය අනෙකකින් අව්‍යවධානව "දොග්ධි" යන ක්‍රියාව අනුගත බැවින් මුඛ්‍යද වේ, "ගාම්" යන්න "පයඃ" යන්නෙන් ව්‍යවධානව ක්‍රියානුගත බැවින් අමුඛ්‍ය වේ.

කාරකප්‍රක්‍රියාර්ථව්‍යාඛ්‍යාව.

---

a අථාර්ථවද්විභක්තිවිශිෂ්ටානාං පදානාං සමාසො නිරූප්‍යතෙ.

264. සමාසශ්චාන්වයෙ නාම්නාම්.

(සමාසඃ 1, 1; ච 1; අන්වයෙ 7, 1; නාම්නාම් 6, 3,)

b නාම්නාමන්වයයොග්‍යත්වෙ සත්‍යෙව සමාසො භවති, ච ශබ්දාත්තද්ධිතොපි, තතො "භාර්‍ය්‍යා පුරුෂස්‍ය" ත්‍යාදෞ සමාසො නභවති.

තද්තද්විභක්ත්‍යර්ථසමර්ථනාකාංක්ෂායෙන් කාරකප්‍රක්‍රියාව දක්වා නැවත ඒ ඒ විභක්ත්‍යන්තපදවලින් යුත් වාක්‍යයන්හි අන්‍යෝන්‍යසම්බන්ධය ඇත්තවුන්ගේ විභක්තිලොපාදියෙන් ඓක පද්‍ය කොට සංක්ෂෙපත්වයෙන් භාෂාවෙහි ලියන කියන ක්‍රමය දක්වනු පිණිස සමාසප්‍රක්‍රියාව නිරූපණය කරණු කැමැත්තානු "අථාර්ථවද් විභක්තිවිශිෂ්ටානාම්" යනාදිය කීහු.

a අථ, (කාරකප්‍රක්‍රියාවට) අනතුරුව; අර්ථවත්, ලිඞ්ගාර්ථාදි අර්ථ ඇත්තාවූ ද; විභක්තිවිශිෂ්ටානාම්, ප්‍රථමාදිවිභක්තිවලින් වෙනස් කරණලද්දාවූ ද; (නොහොත්) අර්ථවද්විභක්තිවිශිෂ්ටානාම්, අර්ථයෙන් යුක් විභක්තියෙන් වෙනස්කරණලද්දාවූ; පදානාම්, පදයන්ගේ; සමාසඃ, සමාසය (සංක්ෂෙපවිධානය); නිරූප්‍යතෙ, ප්‍රකාශකරණුලැබේ.

264 නාම්නාම්, නාමපදයන්ගේ; අන්වයෙ, අභිප්‍රෙතාර්ථසම්බන්ධය ඇතිකල්හි; සමාසඃ ච, සමාසය ද වේ.

b නාම්නාම්, නාමපදයන්ගේ; අන්වයයොග්‍යත්වෙ, අභිප්‍රෙතාර්ථ සම්බන්ධයට යොග්‍යභාවය; සති එව, ඇතිකල්හි ම; සමාසඃ භවති, සමාසය වේ. චශබ්දාත්, චශබ්දයෙන්; තද්ධිතඃ අපි, තද්ධිතයද (එසේ) වේ. තතඃ, එහෙයින් (අභිප්‍රෙතසම්බන්ධය ඇති කල්හියයි කීහෙයින්); භාර්‍ය්‍යා පුරුෂස්‍ය ඉති, "භාර්‍ය්‍යා පුරුෂස්‍ය" යන; ආදෞ, මේ ආදියෙහි; සමාසඃ නභවති, සමාසය නොවේ.

මෙහි කියනලද්දේ නාමපද දෙකක්හුගේ හෝ බොහෝ නාමපදයන්ගේ අන්‍යෝන්‍යසම්බන්ධය ඇති කල්හිම සමාසය හෝ තද්ධිතය වන බවයි. "දෙවදත්තස්‍ය භාර්‍ය්‍යා, පුරුෂස්‍ය වස්ත්‍රම්, යන වාක්‍යයෙහි "භාර්‍ය්‍යා පුරුෂස්‍ය" යන දෙක අන්‍යෝන්‍ය

සම්බන්ධ රහිත බැවින් සමාස නොවේ. 'වස්ත්‍රමුපගෝරපත්‍යං චෛත්‍රස්‍ය'' යන වාක්‍යයෙහි "උපගු" ශබ්දය "වස්ත්‍ර'' ශබ්දය සමග මුත් "අපත්‍ය" ශබ්දය සමග සම්බන්ධය නැති බැවින් "උපගු" ශබ්දයා කෙරෙන් අපත්‍යාර්ථයෙහි තද්ධිත "අණ්" ප්‍රත්‍යය නොවේ. මෙහි කී අන්වය වනාහි ව්‍යපෙක්ෂාභාවලක්ෂණ ඒකාර්ථීභාවලක්ෂණ වශයෙන් දෙවැදෑරුම් වේ (ස්වාර්ථපර්‍යවසායිපදයන්ගේ ආකාංක්ෂායෙන් එක්වීමට යෝග්‍යභාවය ඇතිකල්හි) එකිනෙකට අපෙක්ෂකභාවය ලක්ෂණකොට ඇත්තේ ව්‍යපෙක්ෂාභාව ලක්ෂණයි. "රාඥඃ පුරුෂඃ'' යනාදිය මෙනි මෙහි අන්‍යෝන්‍ය අපෙක්ෂකත්වය ඇති බැවින් "රාජපුරුෂඃ"යි සමාස වේ. (විශිෂ්ටකාර්‍ය්‍යස්වරූපයෙන්) ඒකාර්ථවද්භාවය ලක්ෂණකොට ඇත්තේ ඒකාර්ථීභාව ලක්ෂණයි. "වෘෂභ" ශබ්දාදිය මෙනි, මෙහි "වෘෂ" ශබ්දය සුකෘතාදිවාචක ද, "භ" ශබ්දය නක්ෂත්‍රවාචක ද වේ. විශිෂ්ටකාර්‍ය්‍යරූපත්වයෙන් දෙදෙනාගේ එක්වීමෙහි බලීවර්දසඞ්ඛ්‍යාත ඒකාර්ථීභාවයක් ප්‍රකාශ වේ. මෙකී අපෙක්ෂාව වනාහි ප්‍රතියෝගපද කාරක පදයන් ගෙන් අන්‍යවූ පදයන් සම්බන්ධව පවත්නාකල්හි සමාස නොවේ. එනම්– "ඍද්ධස්‍ය රාඥෝ මාතඞ්ගාඃ" යන තන්හි "ඍද්ධ" ශබ්දයාගේ ද සාපෙක්ෂකත්වය ඇතත් එය "රාජන් මාතඞ්ග" ශබ්දයන් හා ප්‍රතියෝගි (වෙන්වෙන්වශයෙන් යෙදෙන) පදයක් හෝ කාරක පදයක් නොවන බැවින් ඒ දෙක සමාසව "ඍද්ධස්‍ය රාජමාතඞ්ගාඃ"යි නොවේ. "රාමස්‍ය නාමමහිමා'' යන තන්හි "රාම" ශබ්දය "නාමන්" ශබ්දය හා 'මහිමන්' ශබ්දය සමග ප්‍රතියෝගි පදයක් බැවින් තදපෙක්ෂක "නාමන්, මහිමන්" ශබ්දදෙදෙනාගේ සමාසය විය, "කෘෂ්ණමාශ්‍රිතමනාඃ" යන තන්හි "කෘෂ්ණම්" යන්න කාරකයෙක් බැවින් තදපෙක්ෂක "ආශ්‍රිත" ශබ්දය "මනස්" ශබ්දය හා සමාස විය. "වාණේන භින්නහෘදයඃ" යන තන්හි ද "වාණේන" යනු කාරකපදයක් බැවින් තදපෙක්ෂක 'භින්න" ශබ්දය "හෘදය" ශබ්දය හා සමාස විය.

තවද මෙකී සමාසසංඥාව නිර්වචනයයින් දක්වන්නාහු "සමානි ඒකීභූතානි පදානි අර්ථා වා ආසතෙ යස්මින් සඃ=සමාසඃ, සම්මෙකාමර්ථමාසයන්ති දීපයන්ත්‍යස්මින් සමුදායෙ ඉති වා=සමාසඃ, සංශ්ලිෂ්ටානි ඒකීභූතානි පදානි ආස්‍යන්තෙ උච්චාර්‍ය්‍යන්තෙ යස්මින්නිති වා=සමාසඃ, 'සමානාං සංශ්ලිෂ්ටානාං පදානාමෙකාර්ථාමාපන්නානාමාසනමුච්චාරණමිති වා=සමාසඃ'' යනාදිය කීහු. එක්වූ පද හෝ අර්ථ යම්තැනෙක්හි ඇතුළත්වෙත්නම් හෙද යම් සමුදා

a සච ෂඩ්විධඃ, අව්‍යයීභාවස්තත්පුරුෂො ද්වන්ද්වො බහුව්‍රීහිඃ කර්මධාරයො ද්විගුශ්චෙති. *

b පූර්වපදප්‍රධානොව්‍යයීභාවඃ, ද්විගුතත්පුරුෂෞ පරපදප්‍රධානෞ, ද්වන්ද්වකර්මධාරයෞ උභයපදප්‍රධානෞ, බහුව්‍රීහිරන්‍යපදප්‍රධානඃ, තස්‍ය ක්‍රියාභිසම්බන්ධාත්, උභයපදප්‍රධානො බලවාන්, ඉදමෙකස්මින් සමසිතෙ පදෙ, නොපසර්ජනසමාසප්‍රාප්තිස්ත විෂයම්, නිෂාදස්ථපතිං යාජයෙදන්‍යත්‍ර තත්පුරුෂකර්මධාරය ප්‍රාප්තෞ සත්‍යාං නිර්ණයමාහ.

යෙක්හි එක් අර්ථයක් ප්‍රකාශකෙරෙත්නම් හෙද, යම්තැනෙක්හි එකතුවූ පද උච්චාරණය කරණුලැබෙත් නම් හෝ, එකතුවූ පද යන්ගේ උච්චාරණය කිරීම හෝ සමාස නම් වේ යනු එහි භාවයයි මෙකී සමාසය විශෙෂනාම වශයෙන් සවැදෑරුම්යයි දක්වන්නාහු "සච ෂඩ්විධඃ" යනාදිය කීහු.

a සඃ ච, ඒ සමාසය ද; ෂඩ්විධඃ, සවැදෑරුම් වේ. (එනම්) අව්‍යයීභාවඃ, අව්‍යයීභාවසමාසය; තත්පුරුෂඃ, තත්පුරුෂසමාසය, ද්වන්ද්වඃ, ද්වන්ද්වසමාසය; බහුව්‍රීහිඃ, බහුව්‍රීහිසමාසය; කර්මධාරයඃ, කර්මධාරයසමාසය; ද්විගුඃ ච ඉති, ද්විගුසමාසය දැයි කියායි.

b අව්‍යයීභාවඃ, අව්‍යයීභාවසමාසය; පූර්වපදප්‍රධානඃ, පූර්වපදය ප්‍රධානකොට ඇත්තේ වේ. ද්විගුතත්පුරුෂෞ, ද්විගුතත්පුරුෂ සමාස දෙක; පරපදප්‍රධානෞ, පරපදය ප්‍රධානකොට ඇත්තෝ වෙත්; ද්වන්ද්වකර්මධාරයෞ, ද්වන්ද්වකර්මධාරයසමාස දෙක; උභයපදප්‍රධානෞ ච, පද දෙකම ප්‍රධානකොට ඇත්තෝ වෙත්. බහුව්‍රීහිඃ, බහුව්‍රීහිසමාසය; අන්‍යපදප්‍රධානඃ, අන්‍යපදය ප්‍රධානකොට ඇත්තේ වේ. තස්‍ය; ඒ පූර්වපදාර්ථාදිය; ක්‍රියාභිසම්බන්ධාත්, ක්‍රියාව හා විශෙෂයෙන් සම්බන්ධවීම හෙතුකොටගෙණ ඔවුන්ගේ ප්‍රධා

* "අව්‍යයස්‍ය අව්‍යයෙන වා භවනං සොව්‍යයීභාවඃ, ස එවාග්‍රිමඃ පුරුෂඃ ප්‍රධානං යස්‍යාසෞ තත්පුරුෂඃ ද්වන්ද්වායන්තෙ උභයපදාර්ථා යෙනාසෞ ද්වන්ද්වඃ, බහුසමාසාතිරික්තානං ව්‍රීහිඃ ප්‍රධානං යස්මින්නසෞ බහුව්‍රීහිඃ, කර්මභේදකං ධාරයතීති කර්මධාරයඃ, ද්වාභ්‍යාං ගච්ඡතීති ද්විගුඃ'' යන මේ වාක්‍යයෝද ඇතැම් සාරස්වතයන්හි දක්නා ලැබෙත් නුමුත් මෙය බොහෝ පොත්වල නැති බැවිනුත් මෙහි ඇතැම් වාක්‍යයන් බොහෝ ප්‍රසන්න වෛයාකරණයන්ට අනභිමත බැවිනුත් මෙහි ඇතුළත් නොකෙළෙමු.

නත්වය වේ. උභයපදප්‍රධානඃ, පද දෙකම ප්‍රධානකොට ඇතිසමාසය; බලවාන්, බලවත් වේ. ඉදම්, මේ (උභයපදප්‍රධානය බලවත්යයි කීම); සමසිතෙ, සමාසකරණලද්දවූ, එකස්මින් පදෙ, එක් පද යෙක්හි; අනෙකසමාසප්‍රාප්තිඃ, නොයෙක් සම සයන්ගේ පැමිණීම වේ නම්; තද්විෂයම්, ඒ විෂය කොට ඇත්තේ වේ. නිෂාදස්ථපතිම්, නිෂාදස්ථපතියා (චණ්ඩාලාධිපයා) ලවා; යාජයෙත් ඉති, පුදවත් නේය යන; අත්‍ර, මෙහි; තත්පුරුෂකර්මධාරයප්‍රාප්තෞ සත්‍යාම්, තත්පුරුෂකර්මධාරය සමාසදෙදෙනාගේ පැමිණීම ඇතිකල්හි; නිර්ණයම්, නිශ්චය; ආහ, කියයි.

මෙහි ෂට්සමාසයන්ගේ ලක්ෂණ සැකෙවින් මෙසේයි:- එනම්, යම් සමාසයෙක්හි ස්වාර්ථප්‍රධානත්වයෙන් පූර්වවූ අව්‍යය ශබ්ද යක් උත්තරපදයක් හා අන්වයභාවයෙන් සමාසවීමෙන් අව්‍යය නොවූ උත්තරපදයාගේද අව්‍යයත්වය වේනම් ඒ සමාසය අව්‍යයී භාව සමාස නම් වේ. එනම් "අධිස්ත්‍රි" යන තන්හි "අධි" යන අව්‍යය ශබ්දය ස්වකීය ආධාරාර්ථප්‍රධානත්වයෙන් "ස්ත්‍රී" ශබ්දය හා සම්බන්ධවීමෙන් සමාසව අනව්‍යයවූ ඒ "ස්ත්‍රී" ශබ්දයාගේද අව්‍යයත්වයවූ බැවින් අව්‍යයීභාවසමාසයි. යම්සේ "තත්පුරුෂ" ශබ්දයෙහි ඉදිරියෙහි සිටි (පරව සිටි) පුරුෂපදාර්ථය ප්‍රධානවේද, එසේම යම් සමාසයෙක්හි පරපදය ප්‍රධාන වේ නම් ඒ තත් පුරුෂසමාස නම් වේ. යම් සමාසයකින් පූර්වොත්තර පදවය උභයපදාර්ථප්‍රධානත්වයෙන් ද්වන්ද්වයක් මෙන් සාරණුලැබේ නම් ඒ ද්වන්ද්වසමාසයයි කියනු ලැබේ යම්සේ 'බහුව්‍රීහි" යන්නෙන් සමස්තපදයන්ගෙන් අන්‍යවූ පුරුෂාදිඅර්ථයක් ගම්‍යමාන වේද එමෙන් යම් සමාසයෙක්හි සමස්‍යමානපදයන්ගෙන් අන්‍යවූවක් ගම්‍යමාන වේනම් ඒ බහුව්‍රීහි සමාසයයි කියනුලැබේ. යම්සේ එකම කර්මපදාර්ථය තෙමේ ක්‍රියාව හා ප්‍රයොජනය යන දෙක දරාද එමෙන් යම් සමාසයක් එකාර්ථයෙන් නාමද්වයක් දරානම් ඒ කර්මධාරයයි කියනුලැබේ. එනම් "නීලොත්පලම්" යන තන්හි එකම උත්පලාර්ථය තෙමේ ගුණසූචනවිශෙෂණත්ව යෙන් සිටි "නීල" ශබ්දය හා තද්විශෙෂ්‍ය 'උත්පල" ශබ්දයද යන දෙකම දරන්නේ වේ. තත්පුරුෂකර්මධාරය යන ලක්ෂණ ද්වයෙන් පැමිණෙන සමාසය ද්විගු නම් වේ. එනම් "පඤ්චගු' යන තන්හි පරපදයවූ "ගො" යන පදයාගේ ප්‍රධානත්වයෙන් තත් පුරුෂලක්ෂණද නාමද්වයෙහි එකාර්ථත්වයෙන් කර්මධාරය ලක්ෂණද ඇත්තේ වේ.

෧ (* සමානාධිකරණව්‍යධිකරණයෝර්මධ්‍යෙ සමානාධිකරණො බලවාන්, එකවිභක්ත්‍යන්තත්වමෙකාර්ථනිෂ්ඨත්වං වා සාමානාධිකරණ්‍යම්, නීලච තදුත්පලං ච නීලොත්පලං, භින්නවිභක්ත්‍යන්තත්වං භින්නාර්ථනිෂ්ඨත්වං වා වෛයධිකරණ්‍යම්) ඓකපද්‍යමෛකස්වර්‍ය්‍යමෙකවිභක්තිකත්වං ච සමාසප්‍රයොජනම්.

මෙහි සමාසයන් සම්බන්ධවූ ඒ ඒ පදයන්ගේ ප්‍රධානත්ව යෙන් ලක්ෂණ දක්වන්නාහු "පූර්වපදප්‍රධානඃ" යනාදිය කීහු. මොවුන්ගේ ප්‍රධානත්වය ලැබෙන්නේ සාක්ෂාත් ක්‍රියාන්විතත්වය පරිද්දෙනි. එනම් අව්‍යයීභාව සමාසවූ පදයන්හි පූර්වවූ අව්‍යය ශබ්දයාගේ අර්ථය ක්‍රියාව හා සම්බන්ධවන බැවින් අව්‍යයීභාව සමාසය පූර්වපදප්‍රධාන වේ. ද්විගුසමාසයෙහි හා තත්පුරුෂසමාස යෙහි පරව සිටි පදය ක්‍රියාව හා සම්බන්ධවන බැවින් පරපද ප්‍රධාන වේ. ද්වන්ද්වසමාසයෙහි හා කර්මධාරය සමාසයෙහි පද ද්වයම ක්‍රියාව හා සම්බන්ධවන බැවින් උභයපදප්‍රධාන වේ. බහු ව්‍රීහිසමාසයෙහි සමස්‍යමානපද නොව ඉන් ගම්‍යමානවූ අන්‍ය පදය ක්‍රියාව හා සම්බන්ධවන බැවින් ඒ අන්‍යපදප්‍රධාන වේ. යම් එක සමාසයෙක්හි සමාස කීපයක් කිරීමට සම්බන්ධය ඇතත් බලවද්භාව හෙතුවෙන් උභයපදප්‍රධාන සමාසය වේ. එනම් "නිෂාදස්ථපතිම්" යන තන්හි ' නිෂාදානාං ස්ථපතිඃ" කියා තත්පුරුෂ සමාසය හා "නිෂාදශ්ච ස ස්ථපතිශ්ච" කියා කර්ම කර්මධා රය සමාසයද යන දෙකම වියහැකිවූවත් ඉන් උභයපදප්‍රධානවූ කර්මධාරය සමාසය වේ. †

෧ සමානාධිකරණව්‍යධිකරණයොඃ මධ්‍යෙ සමානාධිකරණ භින්නාධිකරණ සමාසදෙක අතුරෙහි; සමානාධිකරණඃ, සමානාධි කරණ සමාසය; බලවාන්, බලවත් වේ. (මෙයින්ද "නිෂාදස්ථ පතිඃ" යන තන්හි කර්මධාරය සමාසය වියයුතු බව ප්‍රකාශිතයි.) එකවිභක්ත්‍යන්තත්වම්, එක විබත්ක් අන්තකොට ඇති බවද; එකාර්ථනිෂ්ඨත්වං වා, එක අර්ථයකින් නිෂ්ඨාවීම ඇති බවද; සාමානාධිකරණ්‍යම්, සාමානාධිකරණභාවයයි; නීලච තත්, නිල් වූයේත් එමය; උත්පලච, උපුල්වූයේත් එමය යන වාක්‍යයෙහිවූ;

---

* මේ වාක්‍යය බොහෝ පොත්වල නොපැණේ.

† සමාසාවසානයෙහි සමාසය පිළිබඳ විස්තරයක් ප්‍රකාශකරන්නෙමු.

a අධි-ස්ත්‍රි ඉති ස්ථිතෙ ස්ත්‍රීශබ්දාද්විභක්තිරෙකවචනම්, ස්ත්‍රී ෂ්වධිකෘත්‍ය භවතීති විග්‍රහෙ- අන්‍යයොන්‍යාර්ථසම්බන්ධඃ* පදසමුදායො විග්‍රහඃ, වාක්‍යමිති යාවත්. "ස්‍යාදෙත සමාසෙ'ව්‍යයස්‍ය පූර්වනිපාතො වක්තව්‍යඃ"

265. පූර්වෙව්‍යයෙව්‍යයීභාවඃ.

(පූර්වෙ 7, 1: අව්‍යයෙ 7, 1; අව්‍යයීභාවඃ 1,1,)

නීලොත්පලම්, "නීලොත්පලම්" යන්න ඊට නිදර්ශනයි. (මෙය එකවිභක්ත්‍යන්තත්වය හා එකාර්ථ නිෂ්ඨත්වය ඇති බැවින් සමානාධිකරණ සමාසයයි) භින්නවිභක්ත්‍යන්තත්වම්, වෙන්වෙන්වූ විභක්ති අන්තකොට ඇතිබවද; භින්නාර්ථනිෂ්ඨත්වං වා, වෙන් වෙන්වූ අර්ථයන්ගෙන් නිෂ්ඨාවීම් ඇතිබවද; වෛයධිකරණ්‍යම්, භින්නාධිකරණභාවයයි; ("රාඥඃ පුරුෂඃ" යන වාක්‍යයෙහි වූ "රාජපුරුෂඃ" යන්න ඊට නිදර්ශනයි. එනම් මෙහි විභක්ති දෙකක් ඇතිබැවින්ද අර්ථයන් ඇතිබැවින්ද භින්නාධිකරණ වේ.) ඓකපද්‍යම්, එකපදභාවයද; ඓකස්වර්‍යම්, එකස්වර (එකොච්චාරණ) භාවයද; එකවිභක්තිකත්වං ච, එක විභක්තියක් ඇතිබවද; සමාසප්‍රයොජනම්, සමාසයාගේ ප්‍රයොජනයි.

a අධි ස්ත්‍රි ඉති, "අධි-ස්ත්‍රි" කියා; ස්ථිතෙ, සිටිකල්හි; ස්ත්‍රී ශබ්දාත්, ස්ත්‍රීශබ්දයා කෙරෙන්; විභක්තිරෙකවචනම්, විභක්ති එක වචනයවේ. (පසුව) ස්ත්‍රීෂ්වධිකෘත්‍ය† භවතීති, "ස්ත්‍රීෂ්වධිකෘත්‍ය භවති" යන (ස්ත්‍රිය අධිපතිකොට වේය යන); විග්‍රහෙ, විග්‍රහයෙහි වක්ෂ්‍යමාණාකාරයෙන් සමාස වේ. අන්‍යයොග්‍ය, අන්‍යොන්‍ය සම්බන්ධයට යොග්‍යවූ; අර්ථසම්බන්ධඃ, අර්ථසම්බන්ධය (අර්ථාවබොධය) කරන්නාවූ; පදසමුදායඃ, පද සමූහය; විග්‍රහඃ, විග්‍රහ නම් වේ. වාක්‍යමිති යාවත්, වාක්‍යයයිද අර්ථාන්තරයෙක් වේ. සමාසෙ කෘතෙ, සමාසකළ කල්හි; අව්‍යයස්‍ය, අව්‍යයශබ්දයාගේ; පූර්වනිපාතඃ, පූර්වනිපාතය; (මුලවැටීම) වක්තව්‍යඃ, කියයුතුයි.

265 පූර්වෙ, පූර්වපදය; අව්‍යයෙ, අව්‍යය ශබ්දයක්වූකල්හි (එන්නාවූ අන්‍යොන්‍යසම්බන්ධය); අව්‍යයීභාවඃ, අව්‍යයීභාවනම් (සමාස) වන්නේය.

---

* "අර්ථසම්පීකඃ" සමහර. † "ස්ත්‍රියාම්" සමහර.

a අව්‍යයෙ පූර්වපදෙ සති සොව්‍යයීභාවසංඥඃ සමාසො භවති. ඉති සමාසසංඥායාම්:-

266. සමාසප්‍රත්‍යයයොඃ. (සමාසප්‍රත්‍යයයොඃ 7, 2;)

b සමාසෙ වර්තමානායා විභක්තෙඃ ප්‍රත්‍යයෙ ච පරෙ ලුග් භවති. නාමසංඥායාං ස්‍යාදිර්විභක්තිර්භවති. අධිස්ත්‍රි සි ඉති ස්ථිතෙ.

267. ස නපුංසකම්. (සඃ 1, 1; නපුංසකම් 1, 1;)

c සොව්‍යයීභාවඃ සමාසො නපුංසකලිඞ්ගො භවති. නපුංසකත්වාද්ධ්‍රස්වත්වම්.

---

a අව්‍යයෙ, අව්‍යය ශබ්දයක්; පූර්වපදෙ සති, පූර්වපදව ඇති කල්හි; යඃ අන්‍යඃ; යම් අන්‍යොන්‍ය සම්බන්ධයක් වේද; සඃ, හෙතෙමේ; අව්‍යයීභාවසංඥකඃ, අව්‍යයීභාවනම් වූ; සමාසඃ භවති, සමාසය වේ. ඉති, මෙසේ; සමාසසංඥායාම් සමාසසංඥා ඇති කල්හි; (වක්ෂ්‍යමාණාකාරයෙන් වේ.)

266 සමාසප්‍රත්‍යයයොඃ, සමාස ප්‍රත්‍යය යන දෙක ඇති කල්හි; (විභක්තිලොපය වේ.)

b සමාසෙ, සමාසයෙහි; වර්තමානායාඃ, පවත්නාවූ; විභක්තෙඃ, විභක්තියට; ලුග්භවති, (ලුක් යන්නෙන්) ලොප් වේ. ප්‍රත්‍යයෙ පරෙ ච, ප්‍රත්‍යය පරකල්හිද විභක්තියට ලොප් වේ. නාමසංඥායාම්, ("කෘත්තද්ධිතසමාසාශ්ච" යනුවෙන් නාමසංඥාව ඇතිකල්හි; ස්‍යාදිඃ විභක්තිඃ භවති, සි ආදි විභක්ති වේ. (එකල්හි) අධිස්ත්‍රි සි ඉති, "අධිස්ත්‍රි සි" කියා; ස්ථිතෙ, සිටිකල්හි; (වක්ෂ්‍යමාණාකාරයෙන් වේ)

මෙහි සමාසවූ පදයන්ගේ විභක්ති ද යම් පදයක් කෙරෙන් යම් ප්‍රත්‍යයක් පරවූවොත් ඒ පදයේ විභක්තිය ද ලොප් වෙත්. ඒ ලොප්වූ පසු ඊට නාමසංඥා වේ. ඉන්පසු ඒ නාමයා කෙරෙන් "තස්මාත්" යනාදි සූත්‍රයෙන් වක්ෂ්‍යමාණ වශයෙන් ස්‍යාදි විභක්ති වේ.

367 සඃ, ඒ අව්‍යයීභාව සමාසයතෙම; නපුංසකම්, නපුංසක ලිඟු වේ.

c සඃ අව්‍යයීභාවඃ සමාසඃ, ඒ අව්‍යයීභාව සමාසයතෙම; නපුංසක ලිඞ්ගඃ භවති, නපුංසකලිඟු ඇත්තේ වේ. නපුංසකත්වාත්,

268. අව්‍යයීභාවාත්. (අව්‍යයීභාවාත් 5, 1;)

a අව්‍යයීභාවාත් පරස්‍යා විභක්තේර්ලුග්භවති. අධිස්ත්‍රි ගෘහකාර්‍යම්. රායමතික්‍රාන්තමතිරි-කුලම්. නාවමතික්‍රාන්ත මතිනු-ජලම්.

b "අත්‍යාදයඃ ක්‍රාන්තාද්‍යර්ථෙ ද්විතීයයා"

c ක්‍රාන්තාද්‍යර්ථෙ වර්තමානා අත්‍යාදයො ද්විතීයයා සහ සමස්‍යන්තෙ ස තත්පුරුෂසංඥකඃ සමාසො භවති. "හ්‍රස්වාදෙශෙ සන්ධ්‍යක්ෂරාණාමිකාරොකාරෞ ච වක්තව්‍යෞ."

නපුංසකලිඟු බැවින්; හ්‍රස්වත්වම්, ("නපුංසකස්‍ය" යන සූත්‍රයෙන්) හ්‍රස්වභාවය වේ.

268 අව්‍යයීභාවාත්, (අකාරාන්ත නොවූ) අව්‍යයීභාව සමාසයා කෙරෙන් පර විභක්තීන්ට ලොප් වේ.

a අව්‍යයීභාවාත් පරස්‍යාඃ, (අකාරාන්ත නොවූ) අව්‍යයීභාව සමාසයා කෙරෙන් පරවූ; විභක්තෙඃ, විභක්තියට; ලුක් භවති, (ලුක් යන්නෙන්) ලොප් වේ. අධිස්ත්‍රි, ("ස්ත්‍රියමධිකෘත්‍ය භවති" යන පූර්වෝක්ත විග්‍රහයෙහි) "අධිස්ත්‍රි" යනු වේ. ගෘහකාර්‍යම්, ("අධිස්ත්‍රි" යනු) ගෙහි කටයුතුයි. රායම්, ධනය; අතික්‍රාන්තම්, ඉක්මවූයේ (යන අර්ථයෙහි); අතිරි, "අතිරි" නම් වේ. කුලම්, කුලයයි; නාවම්, නැව; අතික්‍රාන්තම්, ඉක්මවූයේ යන අර්ථයෙහි); අතිනු, "අතිනු" නම් වේ; ජලම්, ජලයයි.

b අත්‍යාදයඃ, "අති" ශබ්දාදීහු; ක්‍රාන්තාද්‍යර්ථෙ, අතික්‍රාන්තාදි (ඉක්මවූයේය යනාදී) අර්ථයෙහි; ද්විතීයයා, ද්විතීයාව සමග තත්පුරුෂ සමාස වෙත්.

c ක්‍රාන්තාද්‍යර්ථෙ, අතික්‍රාන්තාදි අර්ථයෙහි; වර්තමානාඃ, පවත්නාවූ; අත්‍යාදයඃ, අතිශබ්දාදීහු; ද්විතීයයා සහ, ද්විතීයා විභක්තිය සමග; සමස්‍යන්තෙ, සමාසකරණුලැබෙත්ද; සඃ, හෙතෙම; තත්පුරුෂසංඥකඃ, තත්පුරුෂ නම්වූ; සමාසඃ භවති, සමාසය වේ; හ්‍රස්වාදෙශෙ, හ්‍රස්වාක්ෂරයක් ආදේශ්‍යමානකල්හි; සන්ධ්‍යක්ෂරාණාම්, සන්ධ්‍යක්ෂරයන්ට; ඉකාරොකාරෞ ච, ඉකාර උකාර දෙකද; වක්තව්‍යෞ, කියයුතුයි. (මෙහි 'අතිරෛ, අතිනෞ" කියා සිටි තන්හි "ඓ ඖ" දෙකට හ්‍රස්වාදෙශයෙන් ඉකාර උකාර දෙක වීමෙන් 'අතිරි අතිනු" යනු සිඩයි.)

a "යථා’සාදෘශ්‍යෙ"

b යථාශබ්දො’සාදෘශ්‍යෙ වර්තමානඃ සමස්‍යතෙ සොව්‍යයීභාවඃ සමාසො භවති. (යොග්‍යතා, වීප්සා, පදාර්ථාන තිවෘත්තිඃ, සාදෘශ්‍යං, චෙති යථාර්ථාඃ) ශක්තිමනතික්‍රම්‍ය කරෙතීති = යථාශක්ති කරෙති, අසාදෘශ්‍යෙ කිම් ?. යථා හරිඃ තථා හරඃ.

c කුම්භස්‍ය සමීපමිති විග්‍රහෙ සමාසාදි පූර්වවත්, "අව්‍යයීභාවාත්" ඉති ප්‍රාප්තෙ;-

---

a අසාදෘශ්‍යෙ, සමාන භාවාර්ථ රහිත තන්හි පවත්නාවූ; යථා, "යථා" ශබ්දය අව්‍යයීභාව සමාස කරණු ලැබේ.

b යථාශබ්දඃ, "යථා" ශබ්දයතෙම; අසාදෘශ්‍යෙ, සමානභාවාර්ථ රහිත තන්හි; වර්තමානඃ, පවත්නේ; සමස්‍යතෙ, සමාසකරණු ලැබේ ද; සඃ, හෙතෙම; අව්‍යයීභාවඃ සමාසඃ භවති, අව්‍යයීභාව සමාස නම් වේ. යොග්‍යතා, අනුරූපභාවය; වීප්සා, (පදාර්ථයන්) ව්‍යාප්ත කොට (සම්බන්ධ කොට) කියනු කැමැත්තය, පදාර්ථාන තිවෘත්තිඃ, පදාර්ථයන් නොඉක්ම පැවැත්මය; සාදෘශ්‍යං ච ඉති, සමානභාවය ද යන මොහු; යථාර්ථාඃ, යථා ශබ්දයාගේ අර්ථයෝයි. (මෙහි සමානභාවාර්ථය හැර අනිත් තුන් තන්හි යථා ශබ්දය සමාස වේ.) ශක්තිම්, සාමර්ථ්‍යය; අනතික්‍රම්‍ය, නොඉක්ම; කරෙතීති, කෙරේය යන වාක්‍යයෙහි; යථාශක්ති කරෙති, "යථාශක්ති කරෙති' යනු වේ. (මෙහි "යථා" ශබ්දය අනතික්‍රමණාර්ථයි.) අසාදෘශ්‍යෙ, සමානභාවාර්ථ රහිත තන්හිය යනු; කිම්, කිම? හරිඃ, විෂ්ණුතෙම; යථා, යම්බඳු වේද; හරඃ, ඊශ්වරතෙම; තථා, එබඳු වේ. (යන තන්හි යථාශබ්දය සමානාර්ථ බැවින් සමාස නොවන හෙයිනි.) මෙහි යථා ශබ්දය හරිහුගේ සමානත්වය ප්‍රකාශකෙරේ. එබැවින් ඒ හරි ශබ්දය හා සමාස නොවිය. "රූපස්‍ය යොග්‍යම්" යන වාක්‍යයෙහි වූ "යථාරූපම්" යන තන්හි "යථා" ශබ්දය යොග්‍යතාර්ථයි. 'විෂ්ණුං විෂ්ණුං ප්‍රති" යන වාක්‍යයෙහි වූ "යථා විෂ්ණු" යන තන්හි යථාශබ්දය වීප්සාර්ථයි.)

c කුම්භස්‍ය සමීපං ඉති, "කුම්භස්‍ය සමීපම්" යන (කුම්භයාගේ සමීපය යන); විග්‍රහෙ, විග්‍රහයෙහි; සමාසාදි, සමාසාදිය; පූර්වවත්, පෙර මෙනි. (මෙහි ආදිශබ්දයෙන් විභක්තිලොපාදිය ගණු ලැබේ.) අව්‍යයීභාවාත් ඉති, "අව්‍යයීභාවාත්" යන සූත්‍රයෙන්;

269. අතො'මනතඃ. (අතඃ 5, 1; අම් 1, 1; අනතඃ 6, 1;)

a අකාරාන්තාදව්‍යයීභාවාත් පරස්‍ය විභක්තෙරම් භවති අයං මධ්‍යස්ථො (තථා ච පාණිනීයෙ:- "නාව්‍යයීභාවාදතොම්ත්වපඤ්චම්‍යාඃ"- අදන්තාදව්‍යයීභාවාත්සුපො න ලුක්, තස්‍ය තු පඤ්චමීං විනාමාදෙශඃ ස්‍යාත්) උපකුම්භං වර්තතෙ, උපකුම්භං පශ්‍ය

270. වා ටාඞ්‍යොඃ. (වා 1, 1; ටාඞ්‍යොඃ 6, 2;)

ප්‍රාප්ත, ලොපය පැමිණිසල්කි; (මධ්‍යමාණ සූත්‍රයෙන් විහිත කාර්‍ය්‍යය වේ)

269 අතඃ, අකාරාන්ත අව්‍යයීභාව සමාසයා කෙරෙන් පරවූ; අනතඃ (ඔයි විභක්තියට වූ) අත් යන්න නොරකොට ඇති විභක්ති යට; අම්, අම් ආදෙශ වේ.

a අකාරාන්තාත් අව්‍යයීභාවාත්, අකාරාන්ත අව්‍යයීභාව සමාසය, කෙරෙන්; පරස්‍ය, පරවූ; විභක්තෙඃ, විභක්තියට; අම්භවති, අම් ආදෙශ වේ. අයං මධ්‍යස්ථා, අත් යන්න හැරයි. පාණිනීයෙ, පාණිනීය ව්‍යාකරණයෙහි; තථා ච, එසේ ද සූත්‍රවාසනිකාරණලදී. (එනම්) අතඃ, අකාරාන්ත වූ; අව්‍යයීභාවාත්, අව්‍යයීභාව සමාසයා කෙරෙන් පර විභක්තීන්ට; න, ලොප් නොවේ. අපඤ්චම්‍යාස්තු, පඤ්චමිය නොරකොට ඇති විභක්තියට වනාහි; අම්, අම් ආදෙශ වේ. (යනු එහි සූත්‍රාර්ථයි.) අදන්තාත්, අකාරාන්ත වූ; අව්‍යයීභාවාත්, අව්‍යයීභාව සමාසයා කෙරෙන් පර වූ; සුපඃ, සුප්සංඥයට (විභක්තියට); නලුක්, (ලුක් යන්නෙන්) ලොප් නොවේ. තස්‍ය තු, ඒ සුප්‍යන්තට වනාහි; පඤ්චමීං විනා, පඤ්චමිය හැර; ආමාදෙශඃ ස්‍යාත්, අම් ආදෙශ වන්නේය (යනු එහි වෘත්තියෙහි අර්ථයි.) උපකුම්භම්, කුම්භයාගේ සමීපය; වර්තතෙ පවතී; (මෙහි "උපකුම්භම්" යනු ප්‍රථමායි.) උපකුම්භම්, කුම්භයාගේ සමීපය; පශ්‍ය, බලව; (මෙහි "උපකුම්භම්" යනු ද්විතීයායි.)

270 ටාඞ්‍යොඃ, (අකාරාන්ත අව්‍යයීභාව සමාසයා කෙරෙන් පර) ටා විභක්ති ඞි විභක්ති දෙකට; වා, විකල්පයෙන් අම් ආදෙශ වේ.

අකාරාන්තාදව්‍යයීභාවාත් පරයොෂ්ටාඞි ඉත්‍යෙතයොර්වා අම් භවති. ("අතොමනතඃ, වා ටාඞ්‍යොඃ" අත්‍ර අත් ටා ඞි එතත් පඤ්චම්‍යාස්තෘතීයාසප්තම්‍යොර්විවචනබහුවචනයොරප්‍යුප ලක්ෂණම්, තෙන විවචනබහුවචනයොරපි වා අම් භවති, නලුක්, පඤ්චම්‍යාස්තු අම්ලුගභාවප්‍රතිෂෙධඃ. උපකුම්භෙන කෘතං- උපකුම්භං කෘතම්; උපකුම්භං දෙහි, (අනත ඉති විශෙෂණාත්) උපකුම්භාදානය, උපකුම්භං දෙශඃ, උපකුම්භෙ නිධෙහි- උපකුම්භං නිධෙහි.

---

a අකාරාන්තාත් අව්‍යයීභාවාත් පරයොඃ, අකාරාන්ත අව්‍යයීභාව සමාසයා කෙරෙන් පරවූ; ටාඞි ඉති, ටාඞි යන; එතයොඃ, මේ විභක්ති දෙකට; වා, විකල්පයෙන්; අම් භවති, අම් ආදෙශ වේ. අතොමනතඃ වා ටාඞ්‍යොඃ අත්‍ර, "අතොමනතඃ වා ටාඞ්‍යොඃ, යන මේ සූත්‍රවයෙහි; අත් ටා ඞි එතත්, "අත් ටා ඞි" යන මෙය, පඤ්චම්‍යාඃ, පඤ්චමී විභක්තිය සම්බන්ධවූ ද; තෘතීයාසප්තම්‍යොඃ; තෘතීයාසප්තමී විභක්ති දෙක සම්බන්ධ වූ ද; විවචන බහුවචනයොඃ අපි, විවචන බහුවචන දෙකට ද; උපලක්ෂණම්, උපලක්ෂණ වේ. (විවචන බහුවචන දෙක සමීපකොට ගැණීම ලකුණුකොට ඇත්තේය.) තෙන එහෙයින්; විවචනබහුවචනයොඃ අපි, විවචන බහුවචන දෙකටද; වා, විකල්පයෙන්; අම් භවති, අම් ආදෙශ වේ. නලුක්, ලොප් නොවේ. පඤ්චම්‍යාස්තු, පඤ්චමිය සම්බන්ධව වනාහි; අම්ලුගභාව, අම් ආදෙශය ලොපය යන දෙදෙනාගේ; නිෂෙධඃ, ප්‍රතිෂෙධය වේ. උපකුම්භෙන, කුම්භයාගේ සමීපයෙන්; කෘතම්, කරණලදී. උපකුම්භං කෘතම්, "උපකුම්භං කෘතම්" යනුද එම අර්ථයි. (මෙහි "උපකුම්භෙන" යනු ටා විභක්තියට විකල්පයෙන් "අම්" ආදෙශනොවූතැනි "උපකුම්භම්" යනු "අම්" වූ තැනි.) උපකුම්භං, කුම්භයාගේ සමීපයට; දෙහි, දෙව; (මෙහි "උපකුම්භම්" යනු චතුර්ථීයි.) අනතඃ ඉති, අත් යන්න නොරකොට ඇත්තහුට යයි; විශෙෂණාත්, වෙන්කොට කීමෙන්; උපකුම්භාත් "උපකුම්භාත්" යනු වේ. උපකුම්භාත්, කුම්භයාගේ සාමීපයෙන්; ආනය, ගෙණෙව; (මෙහි "අත්" යන්න බැවින් අම් ආදෙශ නොවීය.) උපකුම්භං, කුම්භයාගේ සමීපයෙහි වූ, දෙශඃ, ප්‍රදෙශයයි. (මෙහි "උපකුම්භම්" යනු ෂෂ්ඨීයි.) උපකුම්භෙ කුම්භයාගේ සමීපයෙහි; නිධෙහි, නිදන්කරව; උපකුම්භං නිධෙහි, "උපකුම්භං නිධෙහි" යනුද එම අර්ථයි. (මෙහි "උපකුම්භෙ" යනු විකල්පයෙන් ඞි විභක්තියට "අම්" ආදෙශ නොවූ තැනි. "උපකුම්භම්" යනු "අම්" වූ තැනි.)

a "අවධාරණාර්ථෙ යාවති ච"

b අවධාරණාර්ථෙ යාවච්ඡබ්දෙ ප්‍රයුජ්‍යමානෙ අව්‍යයපූර්වපද භාවෙපි සොන්වයඃ සොව්‍යයීභාවසංඥකඃ සමාසො භවති)* යාවන්ත්‍යමත්‍රාණි තාවතො බ්‍රාහ්මණානාමන්ත්‍රයස්වෙති යාවද මත්‍රමාමන්ත්‍රයස්ව

මෙහි පූර්වෝක්ත "අව්‍යයීභාවාත්" යන සූත්‍රයෙන් අකාරාන්ත නොවූ අව්‍යයීභාව සමාසයා කෙරෙන් පර විභක්තීන්ට ලොපයද පසුව අකාරාන්තවූ අව්‍යයීභාව සමාසයා කෙරෙන් පරවූ පඤ්චමී "අත්" යන්න තොරකොට ඇති විභක්තීන්ට "අම්" ආදෙශද නිත්‍යවශයෙන් විධාන කොට නැවත "වා ටාඞෙබ්‍යඃ" යන සූත්‍රයෙන් "ටා ඞි" දෙකට යථොක්ත අම් ආදෙශයාගේ විකල්පනය ද කීහ. මේ සූත්‍රයන්හි "අත් වා ඞී" යි එකවචන නිර්දේශය කළත් තද්‍රූපලක්‍ෂණත්වයෙන් ඔවුන්ගේ ද්විවචන බහුවචනයෝ ද ඇතුළත් වෙත්. තවද මෙසේ එකවචනත්වයෙන් දක්වනලද්දේ අව්‍යයීභාවසමාසය එකවචනය යන අන්‍යතර මත වශයෙන් යයි ඇතැම් ටීකාකාරයෝ කියත්. නුමුත් එය "නාව්‍යයීභාවාදතොම් ත්වපඤ්චම්‍යාඃ" "තෘතීයාසප්තම්‍යොර්බහුලම්" යන පාණිනීය සූත්‍රයන්හි "අපඤ්චම්‍යාඃ, තෘතීයා සප්තම්‍යොඃ" යි විභක්තිනාමනිර්දේශයෙන් ද්විවචන ද බහුවචන ද දතයුතු වෙත්.

a අවධාරණෙ, අවධාරණාර්ථයෙහි පවත්නාවූ; යාවති ච, "යාවත්" ශබ්දය ප්‍රයොගකරණුලබනකල්හිද අව්‍යයීභාවසමාසය වේ.

b අවධාරණෙ, අවධාරණාර්ථයෙහි පවත්නාවූ; යාවච්ඡබ්දෙ, "යාවත්" ශබ්දය; ප්‍රයුජ්‍යමානෙ, ප්‍රයොගකරණු ලබන කල්හි; අව්‍යය පූර්වපදභාවෙ අපි, අව්‍යය ශබ්දයක් පූර්වපදව නැති කල්හිත්; යඃ අන්වයඃ, යම් අන්‍යොන්‍ය සම්බන්ධයක් වේද; සඃ, හෙතෙම; අව්‍යයීභාවසංඥකඃ, අව්‍යයීභාව නම්වූ; සමාසඃ භවති,

* මේ පාඨය බොහෝ පොත්හි නො පෑණෙ. තවද මෙහි ඇතැම් පොත්හි "යාවදවධාරණෙ" යන පාණිනීය සූත්‍රය හා "අවධාරණෙ යාවච්ඡබ්දා නිත්‍යං සමස්‍යතෙ" යන තදාශ්‍රිත වෘත්තිපාඨයද දක්නා ලැබේ, මෙහි "අවධාරණාර්ථෙ යාවති ච" යන්න ප්‍රමාණ බැවින් මේ උචිතතා නොවේ යයි හැඟේ. අවධාරණෙ, අවධාරණාර්ථයෙහි වූ: යාවත් යාවත් ශබ්දය සමාස කරණුලැබේ" යනුද- "අවධාරණෙ, අවධාරණාර්ථයෙහිවූ; යාවත්, යාවත් ශබ්දය, නිත්‍යං, නිත්‍යයෙන්; සමස්‍යතෙ, සමාසකරණු ලැබේ."- යනුද එහි අර්ථයි.

a "ආඞ් මර්‍යාදාභිවිධ්‍යොඃ"

b මර්‍යාදායාමභිවිධෞ ච ආඞ් වා සමස්‍යතෙ. පාටලිපුත්‍රං මර්‍යාදීකෘත්‍ය ආපාටලිපුත්‍රම්. බාලානභිව්‍යාප්‍ය ආබාලම්. තෙන විනෙති මර්‍යාදා, තෙන සහෙත්‍යභිවිධිඃ.

සමාසය වේ. අමත්‍රාණි, පාත්‍රයෝ; යාවන්ති, යම් පමණ වෙත් ද; තාවතඃ, එපමණ; බ්‍රාහ්මණාන්, බමුණන්ට; ආමන්ත්‍රයස්ව ඉති, (භොජනය පිණිස) ආමන්ත්‍රය කරව යන අර්ථයෙහි; යාවද මත්‍රමාමන්ත්‍රයස්ව, "යාවදමත්‍රම ආමන්ත්‍රයස්ව" යනු වේ.

"යාවත්" යන්න අව්‍ය ශබ්දයක් වත්ම අර්ථනිර්ණය පිණිස මේ කීහ. එනම් අවධාරණාර්ථවූ "යාවත්" ශබ්දය පූර්වපදව යෙදී අන්වය ඇතිකල්හි අව්‍යයීභාව සමාසය වන බවයි. තවද තද්ධිත "වතු" ප්‍රත්‍යයාන්ත "යාවත්" ශබ්දය අව්‍යයශබ්දයක් නුවූවත් එය අවධාරණාර්ථව පූර්වපදව යෙදී අන්වය ඇතිකල්හි අව්‍යයීභාවසමාසය වේ යනු මෙහි වෘත්තිකමතයයි. පාණිනීය මතය නම් "යාවත්" යන අවධාරණාර්ථ අව්‍යය ශබ්දය හා මේ සමාසය වන බවයි. අව්‍යය ශබ්දය හා එසේ සමාසවූ තන්හි විග්‍රහවාක්‍යයෙහි "යාවන්ති" යනාදීන් තද්ධිතාන්ත "යාවත්" ශබ්දය අස්වපදවිග්‍රහ වශයෙන් යොජිතයයි තදාශ්‍රිත ටීකාකාරයෝ කීහු. සමහර තන්හි මෙහි චශබ්දයෙන් අශාවාර්ථ "තිර්" යන්නද ගතයුතු බැව් කීහු.

a මර්‍යාදාභිවිධ්‍යොඃ, මර්‍යාද අභිවිධි දෙක්හි පවත්නාවූ; ආඞ්, ආඞ් යන්න අව්‍යයීභාවසමාස කරණු ලැබේ.

b මර්‍යාදායාම්, මර්‍යාදාර්ථයෙහිද; අභිවිධෞ ච, අභිවිධ්‍යර්ථයෙහි ද පවත්නාවූ; ආඞ්, ආඞ් යන්න; වා, විකල්පයෙන්; සමස්‍යතෙ (අව්‍යයීභාව) සමාස කරණුලැබේ. පාටලිපුත්‍රං, පැලලුප්නුවර; මර්‍යාදීකෘත්‍ය ඉති, මර්‍යාද කොට (හරිණුලබනසීමාව කොට) යන අර්ථයෙහි; ආපාටලිපුත්‍රම්, "ආපාටලිපුත්‍රම්" යනු වේ; බාලාන්, බාලයන්; අභිව්‍යාප්‍ය ඉති, පැතිර යන අර්ථයෙහි; ආබාලම්, "ආබාලම්" යනු වේ. තෙන විනා ඉති, එයින් වෙන්කොට (ගණුලබන්නේ) නුයි; මර්‍යාද, මර්‍යාදායි. තෙන සහ ඉති, ඒ සීමාව සමග (ගණුලබන්නේ නුයි; අභිවිධිඃ, අභිවිධියයි. (මෙහි "ආඞ්" යන්න පඤ්චමී විභක්ත්‍යන්තයක් සමග සමාස වේය යනු පාණිනීය වචනයි).

a "පාරෙ මධ්‍යෙ ෂෂ්ඨ්‍යා වා"

b පාරමධ්‍යශබ්දෞ ෂෂ්ඨ්‍යා වා සමස්‍යෙතෙ, එදන්තෞ නිපාත්‍යෞ සූත්‍රාත්.

c "ප්‍රථමානිර්දිෂ්ටං සමාස උපසර්ජනම්"

d සමාසශාස්ත්‍රෙ ප්‍රථමානිර්දිෂ්ටමුපසර්ජනසංඥං ස්‍යාත්.

e "උපසර්ජනං පූර්වම්"

f සමාසෙ උපසර්ජනං ප්‍රාක් ප්‍රයොජ්‍යම්. ගඞ්ගායාඃ පාරෙ ඉති= පාරෙගඞ්ගං- ගඞ්ගාපාරෙ, ගඞ්ගායා මධ්‍යෙ ඉති= මධ්‍යෙගඞ්ගං- ගඞ්ගාමධ්‍යෙ,* මක්ෂිකාණාමභාවො නිර්මක්ෂිකං වර්තතෙ.)

ඉති අව්‍යයීභාවඃ.

---

a පාරෙමධ්‍යෙ, "පාරෙමධ්‍යෙ" යන නිපාත දෙක; ෂෂ්ඨ්‍යා, ෂෂ්ඨීවිභක්ත්‍යන්තය සමග; වා, විකල්පයෙන් සමාස කරණු ලැබේ.

b පාරමධ්‍යශබ්දෞ, "පාරමධ්‍ය" යන ශබ්ද දෙක; ෂෂ්ඨ්‍යා, ෂෂ්ඨී විභක්තිය සමග; වා, විකල්පයෙන්; සමස්‍යෙතෙ, සමාස කරණු ලැබෙත්. සූත්‍රාත්, (මෙහි පාණිනීය) සූත්‍රවශයෙන්; එදන්තෞ, එකාරාන්තවූ; නිපාත්‍යෞ, නිපාත දෙකක් වෙත්. ("පාරමධ්‍ය" ශබ්ද දෙක එකාරාන්තබවයෙන් නිපාතනය කොට සූත්‍රොක්තයි).

c සමාසෙ, සමාස ශාස්ත්‍රයෙහි; ප්‍රථමානිර්දිෂ්ටම්, ප්‍රථමාවිභක්තියෙන් දක්වනලද්දේ; උපසර්ජන නම්, උපසර්ජන නම් වේ.

d සමාස ශාස්ත්‍ර, සමාසවිධායකශාස්ත්‍රයෙහි; ප්‍රථමානිර්දිෂ්ටම්, ප්‍රථමාවිභක්තියෙන් දක්වන ලද්දේ; උපසර්ජනසංඥං ස්‍යාත්, උපසර්ජන නම්, වන්නේය.

e උපසර්ජනම්, උපසර්ජන සංඥය; පූර්වම්, පූර්වකොට යෙදිය යුතුයි.

f සමාසෙ, සමාසයෙහි; උපසර්ජනම්, උපසර්ජන සංඥය; ප්‍රාක් ප්‍රයොජ්‍යම්, පූර්වයෙහි යෙදියයුතුයි. ගඞ්ගායාඃ, ගඞ්ගාහුගේ; පාරෙ

---

* මේ පාණිනීය සූත්‍ර හා තදාශ්‍රිත මාතකාදුදාහරණ බොහෝ පොත්වල නොපෑණෙත්.

271. අමාදෞ තත්පුරුෂඃ. (අමාදෞ 7, 1; තත්පුරුෂඃ 1, 1;)

a ද්විතීයාද්‍යන්තෙ පූර්වපදෙ සති යොඅන්වයඃ ස තත්පුරුෂ සංඥකඃ සමාසො භවති. ("ද්විතීයා ශ්‍රිතාතීතපතිතගතාත්‍යස්ත ප්‍රාප්තාපන්නෛඃ" අන්වයෙ සති සමස්‍යතෙ ස තත්පුරුෂඃ. කෘෂ්ණං ශ්‍රිතඃ=කෘෂ්ණශ්‍රිතඃ, ග්‍රාමං ප්‍රාප්තඃ=ග්‍රාමප්‍රාප්තඃ (අන්වයෙ ඉති කිම්? පශ්‍ය කෘෂ්ණං ශ්‍රිතස්ත්වං සාධූන්). දෘෂත්‍රාණ ජිතනං=දෘත්‍රවජිතනං, යූපාය දාරු=යූපදාරු, වෘකෙභ්‍යො භයං=වෘකභයම්, රාඥඃ පුරුෂඃ=රාජපුරුෂඃ, අක්ෂෙෂු ශෞණ්ඩඃ=අක්ෂශෞණ්ඩඃ.

ඉති, පරතෙර යන අර්ථයෙහි; පාරෙගඞ්ගම්, "පාරෙගඞ්ගම්" යනුද; ගඞ්ගාපාරෙ, "ගඞ්ගාපාරෙ" යනුද වේ. ගඞ්ගායාඃ, ගඞ්ගාහුගේ; මධ්‍යෙ ඉති, මැද යන අර්ථයෙහි; මධ්‍යෙගඞ්ගම්, "මධ්‍යෙගඞ්ගම්" යනුද; ගඞ්ගාමධ්‍යෙ, "ගඞ්ගාමධ්‍යෙ" යනුද වේ. (මෙහි "පාරෙගඞ්ගම්, මධ්‍යෙගඞ්ගම්" යන දෙතන්හි "පාරෙ මධ්‍යෙ" යන දෙක ප්‍රථමානිර්දිෂ්ට බැවින් උපසර්ජන සංඥාව ලබා මුලින් යෙදුනේ වේ). මක්ෂිකාණාම්, මැස්සන්ගේ; අභාවඃ, නොවීම; නිර්මක්ෂිකම්, "නිර්මක්ෂිකම්" යනු වේ. නිර්මක්ෂිකම්, මැස්සන් රහිතව; වර්තතෙ, පවතී. අව්‍යයීභාවඃ, අව්‍යයීභාව සමාසය; ඉති, මෙතෙකින් සමාප්තයි.

අව්‍යයීභාවසමාසාර්ථව්‍යාඛ්‍යාවයි.

271 අමාදෞ, අම්විභක්තිප්‍රත්‍යයාන්තාදිය (පූර්වපදව) ඇති කල්හි (යම් අන්වයක් වේ නම් එය); තත්පුරුෂඃ, තත්පුරුෂ සමාස නම් වේ.

a ද්විතීයාද්‍යන්තෙ, ද්විතීයාදි විභක්ත්‍යන්තයක්; පූර්වපදෙ සති පූර්වපදව ඇතිකල්හි; යඃ අන්වයඃ, යම් අන්‍යොන්‍යසම්බන්ධයක් වේද; සඃ, හේ; තත්පුරුෂසංඥකඃ, තත්පුරුෂනම්වූ; සමාසඃ භවති, සමාසය වේ. ශ්‍රිත, "ශ්‍රිත" ශබ්දය; අතීත, "අතීත" ශබ්දය; පතිත, "පතිත" ශබ්දය; ගත, "ගත" ශබ්දය; අත්‍යස්ත, "අත්‍යස්ත"

ශබ්දය; ප්‍රාප්ත, "ප්‍රාප්ත" ශබ්දය; ආපන්නෝ, "ආපන්න" ශබ්දය යන මොවුන් සමග; ද්විතීයා, ද්විතීයාන්තය සමාසකරණු ලැබේ. අන්වයෙ සති, අන්‍යෝන්‍ය සම්බන්ධය ඇතිකල්හි; සමස්‍යතෙ, (මේ "ශ්‍රිත" යනාදීන් සමග ද්විතීයාව සමාසකරණු ලැබේද; සඃ, හෙතෙම; තත්පුරුෂඃ, තත්පුරුෂ නම් වේ. කෘෂ්ණං, විෂ්ණුනු; ශ්‍රිතඃ, සේවනය කෙළේ; කෘෂ්ණශ්‍රිතඃ, "කෘෂ්ණශ්‍රිත" නම් වේ. ග්‍රාමම්, ගමට; ප්‍රාප්තඃ, පැමිණියේ; ග්‍රාමප්‍රාප්තඃ, "ග්‍රාමප්‍රාප්ත" නම් වේ. (ද්විතීයා තත්පුරුෂ සමාසයි). අන්වයෙ ඉති, අන්‍යෝන්‍ය සම්බන්ධය ඇතිකල්හිය යනු; කිම්, කිම?; පශ්‍ය; තෝ; සාධුන්, සත්පුරුෂයන්; ශ්‍රිතඃ, සේවනය කෙළේ; කෘෂ්ණම්, විෂ්ණුනු; පශ්‍ය, බලව (යන තන්හි අන්‍යෝන්‍ය සම්බන්ධ රහිතබැවිනි) මෙහි "කෘෂ්ණම්" යන ද්විතීයාන්තය "ශ්‍රිතඃ" යන්න හා සම්බන්ධ නොවේ. එබැවින් ඒ දෙක සමාස නොවේ). දාත්‍රෙණ, දෑයෙන්; ඡින්නම්, කපන ලද්දේ; දාත්‍රච්ඡින්නම්, 'දාත්‍රච්ඡින්න" නම් වේ. (තෘතීයා තත්පුරුෂයි). යූපාය, යාගස්තම්භය හෝ ජයස්තම්භය පිණිසවූ; දාරු, දැවය; යූපදාරු, "යූපදාරු" නම් වේ. (චතුර්ථී තත්පුරුෂයි). වෘකෙභ්‍යඃ, වෘකයන් කෙරෙන්වූ; භයම්, බිය; වෘකභයම්, "වෘකභය' නම් වේ. (පඤ්චමී තත්පුරුෂයි). රාඥඃ, රජහුගේ; පුරුෂඃ, පුරුෂතෙම; රාජපුරුෂඃ, "රාජපුරුෂ" නම් වේ. (ෂෂ්ඨී තත්පුරුෂයි) අක්ෂෙෂු, පසැටයන් විෂයෙහි හෙවත් ද්‍යූතසාධනපාසයන් විෂයෙහි; ශෞණ්ඩඃ, දක්ෂවූයේ; අක්ෂශෞණ්ඩඃ, "අක්ෂශෞණ්ඩ" නම් වේ. (සප්තමී තත්පුරුෂයි).

මෙහි "ද්විතීයාශ්‍රිතාතීත" යනාදි පාණිනීය සූත්‍රය ගෙණහැර දක්වා ද්විතීයා තත්පුරුෂසමාසයට සුදුසු තැන් ස්වල්පයක් ප්‍රකාශකරණලදී. සිද්ධාන්තකෞමුදියෙහි තෘතීයාතත්පුරුෂ සමාසය විධාන කරන්නාහු 'තෘතීයා තත්කෘතාර්ථෙන ගුණවචනෙන" යන සූත්‍රය දක්වා "ශඞ්කුලයා ඛණ්ඩඃ=ශඞ්කුලාඛණ්ඩඃ, ධාන්‍යෙනාර්ථො=ධාන්‍යාර්ථඃ' යි උදාහරණ කරණලදී, තෘතීයා විභක්තිය ඒ තෘතීයාන්තයකින් කරණලද ගුණයක් ප්‍රකාශකළ ශබ්දයක් සමගද හෙවත් පළමුවෙන් ගුණයක් ප්‍රකාශ කොට පසුව ද්‍රව්‍යවාචකවූ ශබ්දයක් සමගද, අර්ථශබ්දය සමගද සමාස වේ යනු සූත්‍රයෙහි භාවයයි. මෙහි "ශඞ්කුලයා" යන තෘතීයාන්තය ඉන් කරණලද ගුණවාචකවූ "ඛණ්ඩ" ශබ්දය සමග සමාසවීමෙන් පූගච්ඡේදකාස්ත්‍රසංඛ්‍යාත (ගිරය යන) ද්‍රව්‍යයක් ප්‍රකාශවේ. "ධාන්‍යෙන" යන තෘතීයාව "අර්ථ" ශබ්දය හා සමාස විය තවද

"අක්ෂ්ණා කාණඃ" යන තන්හි කාණත්වය "අක්ෂ්ණා" යන තෘතීයාන්තයෙන් (ඇසින්) කරණලද ගුණවචනයක් නොවන බැවින් සමාස නොවේ. තවත් "පූර්වසදෘශසමොනාර්ථකලහනිපුණමිශ්‍රශ්ලක්ෂ්ණෛඃ" යන සූත්‍රය හදාරා "පූර්ව, සදෘශ, සම, ඌනාර්ථ, කලහ, නිපුණ, මිශ්‍ර ශ්ලක්ෂ්ණ" යන මේ ශබ්දයන් සමග ද තෘතීයාන්තය සමාස වේයයි කියනලදී "මාසපූර්වඃ, මාතෘසදෘශඃ, පිතෘසමඃ, මාෂොනම්, වාක්කලහඃ, ආචාරනිපුණඃ, ගුඩමිශ්‍රඃ, ආචාරශ්ලක්ෂ්ණඃ" යනු ඊට උදාහරණයි. තවත් "කර්තෘකරණෙ කෘතා බහුලම්" යන සූත්‍රයෙන් කර්ත්‍රර්ථයෙහි හා කරණාර්ථයෙහි තෘතීයාන්තය කෘදන්තය සමග බහුල වශයෙන් සමාසවේයයි කියනලදී. "හරිණා ත්‍රාතො=හරිත්‍රාතඃ, නඛෛර් භින්නො=නඛභින්නඃ" යනාදිය ඊට උදාහරණයි. මෙහි බහුල ග්‍රහණයෙන් "දාත්‍රෙණ ලූනවාන්" යනාදියෙහි මෙන් ඇතැම් කෘදන්තයන් සමග සමාස නොවේයයි කියනලදී. කෘත්‍යාර්ථ කෘදන්තයන් සමග වනාහි අධිකාර්ථවචනයෙහි සමාස වේ, අධිකාර්ථවචන නම් ස්තුති නින්දා පිණිස ආරොපිතාර්ථ වචනයි. "කාකපෙයා නදී" යනු ඊට උදාහරණයි. මෙහි කවුඩන් විසින් පියහැකියයි කීමෙන් පූර්ණමහත්වය හැඟෙන බැවින් ස්තුත්‍යර්ථය ආරොපණය කරණලදී. "වාතච්ඡෙද්‍යම්" යන තන්හි වාතයෙන් කැඩියහැකියයි කීමෙන් දුර්බලත්වය හැඟෙන බැවින් නින්දාර්ථය ආරොපණය කරණලදී.

"චතුර්ථී තදර්ථාර්ථබලිහිතසුඛරක්ෂිතෛඃ" යන සූත්‍රයෙන් චතුර්ථීතත්පුරුෂසමාසය විධාන කරණලදී. චතුර්ථ්‍යන්තය තදර්ථ (ඒ චතුර්ථ්‍යන්තයට ඵලයවූ) ශබ්දය හා, අර්ථ, බලි, හිත, සුඛ, රක්ෂිත, යන මේ ශබ්දයන් සමග ද සමාස වේ යනු මෙහි භාවයයි "යූපදාරු, ද්විජාර්ථඃ, භූතබලිඃ, ගොහිතම්, ගොසුඛම්, ගොරක්ෂිතම්" යනු උදාහරණයි.

"පඤ්චමී භයෙන" යන සූත්‍රය හදාරා භයවාචක ශබ්දය සමග පඤ්චම්‍යන්තය සමාස වේයයි කියන ලදී. "චෞරභයම් වෘකභීතඃ" යනාදිය ඊට උදාහරණයි. තවත් "අපෙතාපොඪමුක්තපතිතාපත්‍රස්තෛරල්පශඃ" යන සූත්‍රයෙන් "අපෙත, ආපොඪ, මුක්ත, පතිත, අපත්‍රස්ත" යන මේ ශබ්දයන් සමගද කිසිතැනෙක්හි පඤ්චමී විභක්ත්‍යන්තය සමාස වේයයි කියනලදී. "සුඛාපෙතඃ, කල්පනාපොඪඃ, චක්‍රමුක්තඃ, ස්වර්ගපතිතඃ, තරඞ්ගාපත්‍රස්තඃ" යනු ඊට උදාහරණයි.

a "ක්වචිදමාද්‍යන්තස්‍ය පරත්වම්" අග්නෞ ආහිත ඉත්‍යාහිතාග්නිඃ, පූර්වං භූත ඉති=භූතපූර්වඃ.

"යාජකාදිභිශ්ච" යන සූත්‍රයෙන් "යාජක" ශබ්දාදිය සමගද ෂෂ්ඨී තත්පුරුෂ සමාසය වේයයි කියා "බ්‍රාහ්මණයාජකඃ දේවපූජකඃ" යනාදිය උදාහරණ කරණලදී. පසුව "නනිර්ධාරණෙ" යන සූත්‍රයෙන් නිර්ධාරණාර්ථයෙහි ෂෂ්ඨීය සමාස නොවේයයි කියා "නෘණාං ද්විජඃ ශ්‍රෙෂ්ඨඃ" යනාදිය දක්වනලදී. තවත් "පූරණගුණසුහිතාර්ථසදව්‍යයතව්‍යසමානාධිකරණෙන" යන සූත්‍රයෙන් "පූරණාර්ථ, ගුණාර්ථ, සුහිතාර්ථ, (ශබ්ද හා) ("කුර්වන්, කුර්වාණ" යනාදී) සත් සංඥනතය, (කෘදන්ත) අව්‍යයය, තව්‍යසංඥය, සමානාධිකරණ ශබ්දය" යන මොවුන් සමගද ෂෂ්ඨී විභක්තිය සමාස නොවේයයි කියා "සතාං ෂෂ්ඨඃ, කාකස්‍ය කාර්ෂ්ණ්‍යම්, ඵලානාං සුහිතඃ, ද්විජස්‍ය කුර්වන් කුර්වාණො වා, බ්‍රාහ්මණස්‍ය කෘත්වා, බ්‍රාහ්මණස්‍ය කර්තව්‍යම්, තක්ෂකස්‍ය සර්පස්‍ය" යනාදිය උදාහරණ කරණලදී. මෙහි කී ගුණවාචක ශබ්දයන්ගේ ප්‍රතිෂෙධය නිත්‍ය නොවේ. එනම් "අර්ථගෞරවම්" යනාදියෙහි දක්නාලද බැවිනි. "තක්ෂකාෂ්‍ය සර්පස්‍ය" යන තන්හි "තක්ෂකස්‍ය" යන්න "සර්පස්‍ය" යන්නට සමානාධිකරණ බැවින් මේ සමාස නොවේ. තවත් ෂෂ්ඨී තත්පුරුෂ සමාසයාගේ ප්‍රතිෂෙධස්ථාන බොහෝ වෙත්.

"සප්තමීශෞණ්ඩෛඃ" යන සූත්‍රයෙන් "ශෞණ්ඩ" ශබ්දාදිය සමග සප්තමී විභක්තිය සමාස වේයයි කියා "අක්ෂශෞණ්ඩඃ, ඊශ්වරාධීනඃ"යි උදාහරණ කරණලදී. තවත් "සිද්ධශුෂ්කපක්වබන්ධෛශ්ච" යන සූත්‍රයෙන් "සිද්ධ, ශුෂ්ක, පක්ව, බන්ධ" යන ශබ්දයන් සමගද සප්තමීවිභක්තිය සමාස වේයයි කියා "සාංකාශ්‍යසිද්ධඃ, ආතපශුෂ්කඃ, ස්ථාලීපක්වඃ, චක්‍රබන්ධඃ"යි උදාහරණ කරණලදී. මෙසේ මේ තත්පුරුෂ සමාසය පිළිබඳව පාණින්‍යාදියෙහි තවත් බොහෝ විශෙෂවිභාග ඇතත් ග්‍රන්ථභූයස්ත්වභීතියෙන් ඒ ප්‍රකාශ නොකරමු.

a ක්වචිත්, කිසිතැනෙක්හි; අමාද්‍යන්තස්‍ය, අමාදිවිභක්ත්‍යන්තයාගේ; පරත්වම්, පරභාවය වේ; අග්නෞ, ගින්නෙහි; ආහිතඃ ඉති, පිහිටුවනලද්දේය යන අර්ථයෙහි (සප්තම්‍යන්තයාගේ පරභාවයෙන්); ආහිතාග්නිඃ, "ආහිතාග්නිඃ" යනු වේ; පූර්වම්, පළමුකොට; භූතඃ ඉති, වූයේ යන අර්ථයෙහි (විතීයාන්තයාගේ පරත්වයෙන්); භූතපූර්වඃ, "භූතපූර්වඃ" යනු වේ.

a "පිශාචාදෙඃ සභාදීනාං නපුංසකත්වං වා" පිශාචානාං සභා ඉති=පිශාචසභම්-පිශාචසභා, ගෘහස්ථූණම්-ගෘහස්ථූණා, ශශෝර්ණම්-ශශෝර්ණා, "භින්නපදෙ ණත්වාභාවස්තථාපි සමාසෙ ක්වචිදෙකපදත්වං ණත්වහෙතුඃ" ශරාණාං වනං=ශරවණම්. ආම්‍රාණාං වනං=ආම්‍රවණම්, ත්‍රීණි නයනානි යස්‍යාසෞ=ත්‍රිනයනඃ,* "පානස්‍ය වා" සුරායාඃ පානං=සුරාපානම්-සුරාපාණම්.

---

a පිශාචාදෙඃ, "පිශාච"ශබ්දාදියෙන්පරවූ; සභාදීනාම් "සභා" ශබ්දාදීන්ගේ; නපුංසකත්වම්, නපුංසකලිඞ්ගභාවය; වා, විකල්පයෙන් වේ. පිශාචානාම්, පිශාචයන්ගේ; සභා ඉති සභාවනුයි; පිශාචසභම්, නපුංසකත්වය වූ පක්ෂයෙහි "පිශාචසභම්" යනුද; පිශාචසභා, විකල්පයෙන් නුවූපක්ෂයෙහි "පිශාචසභා" යනුද වේ. ගෘහස්ථූණම්-ගෘහස්ථූණා. ("ගෘහස්‍ය ස්ථූණා" යන වාක්‍යයෙහි) නපුංසකත්වයවූ පක්ෂයෙහි "ගෘහස්ථූණම්" යනුද, නුවූපක්ෂයෙහි "ගෘහස්ථූණා" යනුද වේ. (ගෘහයාගේ ස්තම්භය යන අර්ථයි). ශශෝර්ණම්-ශශෝර්ණා, ("ශශස්‍ය ඌර්ණා" යන වාක්‍යයෙහි) නපුංසකත්වයවූ පක්ෂයෙහි "ශශෝර්ණම්" යනුද, නුවූපක්ෂයෙහි "ශශෝර්ණා" යනුද වේ. (සාවාගේ ලොමය යන අර්ථයි.) භින්නපදෙ, නිමිත්තවත් පදයෙන් අන්‍යවූ පදයෙහි; ණත්වාභාවඃ, ණකාරභාවය නොවේ. තථාපි, එසේවුවත්; සමාසෙ, සමාසවිෂයෙහි; ඒකපදත්වම්, ඒකපදභාවය; ක්වචිත්, කිසි ප්‍රයොගයෙක්හි; ණත්වහෙතුඃ, ණකාරභාවයට කාරණු වේ. ශරාණාම්, ශර (බට) තෘණයන්ගේ; වනම්, වනය; ශරවණම්, ශරවණ නම් වේ. ආම්‍රාණාම්, ආම්‍ර (අඹ) වෘක්ෂයන්ගේ; වනම්, වනය; ආම්‍රවණම්, ආම්‍රවණ නම් වේ. (මෙහි භින්නපදවුවත් සමාසයෙහි ඒකපදත්වයෙන් පූර්වපදයෙහි රකාරය නිමිතිකොට ණත්වය විය) ත්‍රීණිනයනානි, නෙත් තුණක්; යස්‍ය, යමෙකුගේද; අසෞ, මෙතෙම; ත්‍රිනයනඃ, ත්‍රිනයන නම් වේ. (මෙහි ඒකපදත්වය හා නිමිති ඇතත් ක්වචිද්ග්‍රහණයෙන් ණත්වය නොවිය). පානස්‍ය, පානශබ්දය සම්බන්ධව හෙවත් "පාන" ශබ්දයාගේ නකාරයට; වා, විකල්පයෙන් ණත්වය වේ. සුරායාඃ, සුරාහුගේ; පානම්, බීම; සුරාපානම්, "සුරාපාන" නම්ද; සුරාපාණම්, විකල්පයෙන් ණත්වයවූ පක්ෂයෙහි "සුරාපාණ" නම්ද වේ.

---

* මෙහි ඇතම් පොත්වල "සංඥායාං වා" යනු දක්වා "ත්‍රිනයනඃ-ත්‍රිණයනඃ"යි දක්නා ලැබේ. නමුත් "ක්ෂුභ්නාදිෂු ච" යන පාණිනිය සූත්‍රයෙන් මෙහි ණත්වය ප්‍රතිෂිද්ධ බැවි බොහෝ වෛයාකරණයන් විසින් ප්‍රකාශිතයි, "ත්‍රිනෙත්‍ර" ශබ්දය නම් ණත්වයෙන් "ත්‍රිණෙත්‍ර" කියාද දක්නා ලැබේ.

272. නඤ්. (නඤ් 7, 1;)

a නඤ් පූර්වපදෙ සති යොඤ්වයඃ ස තත්පුරුෂසංඥකඃ සමාසො භවති.

b ("නඤ්"-නඤ්සුබන්තෙන සමස්‍යතෙ. නඤ උභයාර්ථත්වං ප්‍රසිද්ධම්)

c "උභෞ නඤෞ සමාඛ්‍යාතෞ පර්‍ය්‍යුදාසප්‍රසජ්‍යකෞ, පර්‍ය්‍යුදාසඃ සදෘග්ග්‍රාහී ප්‍රසජ්‍යස්තු නිෂෙධකෘත්.

d ප්‍රාධාන්‍යන්තු විධෙර්‍යත්‍ර ප්‍රතිෂෙධෙ'ප්‍රධානතා, පර්‍ය්‍යුදාසඃ ස විඥෙයො යත්‍රොත්තරපදෙන නඤ්.

---

272. නඤ්, නඤ් නිපාතය (පූර්වපදව) ඇති කල්හි තත්පුරුෂ සමාසය වේ.

a නඤ්, නඤ් නිපාතය; පූර්වපදෙ සති, පූර්වපදවූ කල්හි; යඃ අන්‍යඃ, යම් අන්‍යොන්‍ය සම්බන්ධයක් වේද; සඃ, හෙතෙම; තත් පුරුෂසංඥකඃ, තත්පුරුෂ නම්වූ; සමාසඃ භවති, සමාසය වේ.

d නඤ්, නඤ්නිපාතය විභක්ත්‍යන්තය හා සමාස කරණු ලැබේ-නඤ්, නඤ්නිපාතය; සුබන්තෙන, සුබන්තය සමග; සමස්‍යතෙ සමාසකරණුලැබේ. නඤඃ, නඤ්නිපාතයාගේ; උභයාර්ථත්වම්, අර්ථද්වයක් ඇතිබව; ප්‍රසිද්ධම්, (වක්ෂ්‍යමාණාකාරයෙන්) ප්‍රකටයි. (එනම්):-

c පර්‍ය්‍යුදාසප්‍රසජ්‍යකෞ, පර්‍ය්‍යුදාසාර්ථ ප්‍රසජ්‍යකාර්ථවූ (හෙවත් නිෂෙධ්‍යවර්ජිතයෙන් විශිෂ්ටාර්ථස්වරූපවූද ප්‍රතිෂෙධයට පැමිණ තත්සදෘශානපෙක්ෂත්වයෙන් නිෂෙධාර්ථස්වරූපවූද); උභෞ නඤෞ, නඤ්නිපාත දෙකක්; සමාඛ්‍යාතෞ, ප්‍රකාශකරණලද්දාහ. පර්‍ය්‍යුදාසඃ, පර්‍ය්‍යුදාස නම්; සදෘග්ග්‍රාහී (උත්තරපදාර්ථප්‍රතික්ෂෙපයෙන්) තත්සදෘශාර්ථයක් ගන්නේ වේ. ප්‍රසජ්‍යස්තු, ප්‍රසජ්‍යනම්, නිෂෙධකෘත් (ක්‍රියාභිසම්බන්ධයෙන්) ප්‍රතිෂෙධ කරන්නේ වේ.

b යත්‍ර, යම්තැනෙක්හි; විධෙඃ, විධිහුගේ; ප්‍රාධාන්‍යං තු, ප්‍රධාන භාවය වේද; ප්‍රතිෂෙධෙ, ප්‍රතිෂෙධයෙහි; අප්‍රධානතා, අප්‍රධාන භාවය වේද; යත්‍ර, යම්තැනෙක්හි; නඤ්, නඤ්නිපාතය; උත්තර පදෙන, උත්තරපදාර්ථය හා සම්බන්ධ වේද; සඃ, හෙතෙම; පර්‍ය්‍යුදාසඃ, පර්‍ය්‍යුදාසයයි, විඥෙයඃ, දතයුතුයි.

a අප්‍රාධාන්‍යං විධෙර්‍යත්‍ර ප්‍රතිෂෙධෙ ප්‍රධානතා, ප්‍රසජ්‍යප්‍රතිෂෙධො'යං ක්‍රියයා සහ යත්‍ර නඤ්.

b නබ්‍රාහ්මණො'බ්‍රාහ්මණඃ.

---

a යත්‍ර, යම්තැනෙක්හි; විධෙඃ, විධිහුගේ; අප්‍රාධාන්‍යම් අප්‍රධාන භාවය වේද; ප්‍රතිෂෙධෙ, ප්‍රතිෂෙධයෙහි; ප්‍රධානතා, ප්‍රධාන භාවය වේද; යත්‍ර, යම්තැනෙක්හි; නඤ්, නඤ්නිපාතය; ක්‍රියයා සහ, ක්‍රියාව සමග සම්බන්ධ වේද; අයම්, මේතෙම; ප්‍රසජ්‍යප්‍රතිෂෙධඃ, ප්‍රසජ්‍යප්‍රතිෂෙධයයි දතයුතුයි.

b නබ්‍රාහ්මණඃ, බමුණුනුවූයේ; හෙවත් බමුණෙකු සමානවූයේ; අබ්‍රාහ්මණඃ, අබ්‍රාහ්මණ නම් වේ.

මෙහි කියනලද්දේ පර්‍ය්‍යුදාස ප්‍රසජ්‍යවශයෙන් නඤ්නිපාතයාගේ වෛවිධ්‍යයයි. එහි පර්‍ය්‍යුදාස වෘත්තියෙහි නඤ්නිපාතය තමන් හා සමස්‍යමාන උත්තරපදාර්ථය ප්‍රතික්ෂෙප කොට තත් සදෘශාර්ථයක් ගන්නේයයිද, ප්‍රසජ්‍යවෘත්තියෙහි නඤ්නිපාතය ක්‍රියාසම්බන්ධයෙන් විධිහුගේ ප්‍රතිෂෙධය කරන්නේයයිද කියා එය වැඩිවශයෙන් විස්තර කරන්නාහු "ප්‍රාධාන්‍යන්තු" යනාදිය කීහු. එනම්:- යම්තැනෙක්හි නඤ්නිපාතය උත්තරපදය හා සම්බන්ධ වීමෙන් ඒ උත්තරපදාර්ථය ප්‍රතික්ෂෙපකොට (අර්ථාන්තර විධාන කරණයෙන්) විධිහුගේ ප්‍රධානත්වයද (එහෙයින්ම) ප්‍රතිෂෙධයෙහි අප්‍රධානත්වයද වේනම් එහි නඤ්නිපාතය පර්‍ය්‍යුදාසයයිද, යම්තැනක නඤර්ථය ක්‍රියාව හා සම්බන්ධව (උත්තර පදයාගේ අභාවකරණයෙන්) ප්‍රතිෂෙධයෙහි ප්‍රධානත්වයද (එහෙයින්ම අර්ථාන්තරවිධ්‍යභාවයෙන්) විධිහුගේ අප්‍රධානත්වයද වේ නම් එහි නඤ්නිපාතය ප්‍රසජ්‍යප්‍රතිෂෙධයයි ද කීහු. "අබ්‍රාහ්මණමානය" යන තන්හි නඤර්ථය ආනයන ක්‍රියාව හා සම්බන්ධ නොව 'බ්‍රාහ්මණ" යන උත්තරපදය හා සම්බන්ධවීමෙන් අර්ථාන්තරයක්වූ තත්සදෘශ ක්ෂත්‍රියාද්‍යර්ථවිධානයෙන් විධිහුගේ ප්‍රධානත්වයද ආනයනක්‍රියාහුගේ අභාවය නොකිරීමෙන් ප්‍රතිෂෙධයෙහි අප්‍රධානත්වයද වේ. "ඉණ්තත්‍යකර්තරි" යන සූත්‍රයෙහි "අකර්තරි' යන තන්හි "කර්තරි න භවති" යනුවෙන් නඤර්ථය ක්‍රියාව හා සම්බන්ධව අභාවකරණයෙන් ප්‍රතිෂෙධයෙහි ප්‍රධානත්වයද "කර්තරි" යන උත්තරපදය හා සම්බන්ධ නොවීමෙන් හෝ අර්ථාන්තරවිධානාභාවයෙන් විධිහුගේ අප්‍රධානත්වයද වේ. මේ ක්‍රමයෙන් නඤ්නිපාතය උත්තරපදය හා සම්බන්ධව ඉන්

273. නා. (න 1, 1; අ 1, 1;)

a සමාසෙ සති නඤොකාරාදෙශො භවති නාකාදිවජ්ජම්.

b (නාක නක්‍ර භ්‍රූණහත්‍යා නබ නපුංසක නක්‍ෂත්‍ර නකුල නාසත්‍ය නමුචි ඉත්‍යාදි-නාක නමුචි නකුල නාගර නාසිකා නමෙරු නනාසති නහසිනානතරිය නක්‍ර නබ නග නද නගාද නවෙද නාසත්‍ය නාපිත නහුෂ නක්‍ෂත්‍ර ඉත්‍යෙත නාකාදයඃ. කෙචනචිද්ගණිතාඃ, උභයථාපි නාකාදෞ න භවති.)*

අර්ථාන්තරයක් ප්‍රකාශකරන්නාවූ සියලු තන්හිම පර්‍යුදාසයයි ද ක්‍රියාව හා සම්බන්ධව අභාවය ප්‍රකාශකරන්නාවූ තන්හි ප්‍රසජ්‍යයයි ද කියනුලැබේ.

273. න, (සමාසයෙහි) නඤ්නිපාතය; අ, අකාරාදෙශ වේ.

a සමාසෙ සති, සමාසය ඇතිකල්හි; නඤඃ, නඤ්නිපාතයට; අකාරාදෙශඃ භවති, අකාරාදෙශ වේ; නාකාදිවජ්ජම්, "නාක" ශබ්දාදිය හැරයි.

b නාක, (න අකං දුඃඛං අස්මින් යන වාක්‍යයෙහිවූ) "නාක" ශබ්දය; නක්‍ර, (නක්‍රාමති" යන වාක්‍යයෙහිවූ) "නක්‍ර" ශබ්දය, නග, ("නගච්ඡති" යන වාක්‍යයෙහිවූ) "නග" ශබ්දයද; නභූන පාත්, ("භ්‍රූණං නපාතයති" යන වාක්‍යයෙහිවූ) "නභූනපාත්" යන තන්හි "නපාත්" ශබ්දය; නබ, ("න ඛං ඡිද්‍රමස්‍ය" යන වාක්‍යයෙහිවූ) 'නබ" ශබ්දය, නපුංසක, ("න ස්ත්‍රී පුමාන්" යන වාක්‍යයෙහිවූ) 'නපුංසක" ශබ්දය; නක්‍ෂත්‍ර, ("නක්‍ෂරති" යන වාක්‍යයෙහිවූ) "නක්‍ෂත්‍ර" ශබ්දය; නකුල, ("න කුලමස්‍ය" යන වාක්‍යයෙහිවූ) "නකුල" ශබ්දය; නාසත්‍ය, ("න අසත්‍ය" යන වාක්‍යයෙහිවූ) "නාසත්‍ය" ශබ්දය; නමුචි ඉත්‍යාදි, ("නමුචති" යන වාක්‍යයෙහිවූ) "නමුචි" ශබ්දය යන මේ ආදිය (නාකාදියයි).

---

* මෙහි කී මේ නාකාදිගණය බොහෝ ව්‍යාකරණයන්හි දක්වනලද නාකාදියට වෙනස්ව දක්නාලැබේ. ඇතැම් සාරස්වතයන්හි මෙහි "නර" ශබ්දයද දක්නාලැබේ. මුග්ධබොධටීකාවෙහි:-

"නාකො නවෙද නකුලශ්ච නක්‍රො නාසත්‍ය නක්‍ෂත්‍ර නපාච්ච නභ්‍රාට්,
නපුංසකං චෛව නමුචිර්නඛශ්ච නාදෙශමෙතෙෂු වදන්ති ධීරාඃ"යි.

නාකාදිය ප්‍රකාශිතයි. අන්‍යවූ බොහෝ තන්හිද මෙසේයි. විමසිය යුතුයි.

274. අන් සවරෙ. (අන් 1, 1; සවරෙ 7, 1;)

a සමාසෙ සති නඤො'නාදෙශො භවති සවරෙ පරෙ. (අනාදෙශො'පදන්තවමාව්‍යඃ, තෙන "ඩණ්න" ඉති න ම්තවම්). අශවාදනෙ‍ය්‍යාතාශවඃ, ධර්මෙණ විරුද්ධො'ධර්මඃ, ග්‍රහණස්‍යාභාවො'ග්‍රහණම්.

b (තදන්‍ය තම්රුද්ධතද්භාවෙෂු නඤ් වර්තතෙ, තස්මාදන්‍යස්තදන්‍යඃ, තෙන විරුද්ධඃ තද්විරුද්ධඃ, තස්‍ය අභාවස්තද්භාවඃ, තදන්‍යශ්ච තම්රුද්ධශ්ච තද්භාවශ්ච තදන්‍යතම්රුද්ධතද්භාවාඃ, තෙෂු නඤ් වර්තතෙ.)

ඉති තත්පුරුෂඃ.

නාක-නක්‍ෂත්‍රඃ ඉති, "නාක නමුචි නකුල නාගර නාසිකා නමෙරු නනාසති නහසි නානතරිය නක්‍ර නබ නග නද නගාද නවෙද නාසත්‍ය නාපිත නහුෂ නක්‍ෂත්‍ර" යන; එතෙ, මොහු; නාකාදයඃ, නාකාදිහුයයි; කෙනචිත්, කිසිවෙකු විසින්; ගණිතාඃ, ගණිනලද්දුහ. උභයථා අපි, මේ දෙපරිද්දෙන්ම වූ; නාකාදෞ, නාකාදියෙහි; නභවති, අකාරාදෙශ නොවේ.

274 සවරෙ, සවරයා පරකල්හි; අන්, (නඤ්නිපාතයට) අන් ආදෙශ වේ.

a සවරෙ පරෙ, සවරයාපරකල්හි; සමාසෙ සති, සමාසය ඇතිකල්හි; නඤඃ, නඤ්නිපාතයට; අනාදෙශඃ භවති, අන් ආදෙශ වේ; අනාදෙශඃ, අන්ආදෙශය; අපදන්තවත්, අපදන්තයක් මෙන්; වාච්‍යඃ, කියයුතුයි; තෙන, එහෙයින්; ඩණනඃ ඉති, "ඩණනා හ්‍රස්වාද්විඃ සවරෙ" යන සූත්‍රයෙන්; නම්ත්වම්, ද්විත්ව නොවේ. අශවාත්, අශ්වයාකෙරෙන්; අන්‍යඃ, අනෙකෙක් වූයේ; අනශ්වඃ, අනශ්ව නම් වේ; ධර්මෙණ, ධර්මයෙන්; විරුද්ධඃ, විරුද්ධවූයේ; අධර්මඃ, අධර්ම නම් වේ; ග්‍රහණස්‍ය, ගැණීම්හුගේ; අභාවඃ, නොවීම; අග්‍රහණම්, අග්‍රහණ නම් වේ.

b තදන්‍යතම්රුද්ධතද්භාවෙෂු, තදන්‍යතම්රුද්ධතද්භාවාර්ථයන්හි; නඤ්, නඤ්නිපාතය; වර්තතෙ, පවතී; තස්මාත්, ඔහු කෙරෙන්; අන්‍යඃ, අන්‍යවූයේ; තදන්‍යඃ, තදන්‍ය නම් වේ, තෙන, එයින්, විරුද්ධඃ, විරුද්ධවූයේ; තම්රුද්ධඃ, තම්රුද්ධ නම් වේ; තස්‍ය, ඔහුගේ; අභාවඃ, නොවීම; තද්භාවඃ, තද්භාව නම් වේ; තදන්‍යශ්ච, තදන්‍යය ද;

274. චාර්ථේ ද්වන්ද්වඃ. (පාණි 7, 1; චන්ද්‍රඃ 1, 1;)

a **සමුච්චයාන්වාචයේතරේතරයෝගසමාහාරාශ්චාර්ථාඃ— තත්‍රේශ්වරං ගුරුං ච භජස්වෙති ප්‍රත්‍යේකමේකක්‍රියාසම්බන්ධ සමුච්චයේ සමාසො නාස්ති, බටො භික්ෂාමට ගාඤ්චානයෙති ක්‍රමේණ ක්‍රියාද්වයසම්බන්ධේ න්වාචයෙ ච සමාසො නාස්ති, පරස්පරමසම්බන්ධාත්. ඉතරේතරයෝගෙ සමාහාරෙ ච චාර්ථෙ ද්වන්ද්වසමාසො භවති.**

තද්විරුද්ධඃ ච, තද්විරුද්ධයද; තදභාවඃ ච, තදභාවයද; තදන්‍යතද්විරුද්ධ තදභාවාඃ, "තදන්‍යතද්විරුද්ධතදභාව" නම් වෙත්. තෙහු, ඒ තදන්‍ය තද්විරුද්ධතදභාවයන්හි; නඤ්, නඤ්නිපාතය; වර්තතෙ, පවතී; තත් පුරුෂඃ, තත්පුරුෂසමාසය; ඉති, මෙතෙකින් සමාප්තයි.

මෙහි ස්වරයා පරකල්හි නඤ්නිපාතයට "අන්" ආදේශය නියමිතයි. හෙද "නාක" යනාදිය හැරයි. "අන්" ආදේශය අප්‍රධානය මෙන් ගැණීමෙන් එහි නකාරයට විත්ව නොවේ. එනම් 'ඩණනඃ" යනාදි සූත්‍රයෙන් නියමිත විත්වය ප්‍රධාන "ඩ" ආදියට වේයයි කී බැවිනි. මෙහි "නඤ්" නිපාතය තදන්‍යාදි අර්ථ තුණෙහි වන බැව් කී නුමුත් බොහෝ තන්හි:-

"තත්සාදෘශ්‍යමභාවශ්ච තදන්‍යත්වං තදල්පතා,
අප්‍රාශස්ත්‍යං විරෝධශ්ච නඤර්ථාඃ ෂට් ප්‍රකීර්තිතාඃ"

යනුවෙන් "තත්සදෘශ තදභාව තදන්‍ය තදල්ප අප්‍රශස්ත තද්විරුද්ධ" වශයෙන් නඤර්ථ සයක්යයි ප්‍රකාශිතයි. "අබ්‍රාහ්මණඃ අපාපම් අසටඃ අනුදරී අකෙශී අසුරඃ" යනු පිළිවෙළින් උදාහරණයි. මෙහි බ්‍රාහ්මණසදෘශවූයේ "අබ්‍රාහ්මණ" යයිද; පාපයාගේ අභාවය "අපාප" යයිද, සටයෙන් වෙන්වූයේ 'අසට" යයිද; අල්ප උදරය ඇත්තී "අනුදරී"යයිද. ප්‍රශස්ත නොවූ කෙස්ඇත්තී "අකෙශී" යයිද, සුරවිරොධීවූයේ "අසුර" යයිද, කියනුලැබේ. මෙහි අභාවාර්ථතන්හි ප්‍රසජ්‍යාර්ථද අන්තන්හි පර්‍යුදාසාර්ථද වේ. මෙසේ තත්පුරුෂ සමාසය දක්වා ද්වන්ද්වසමාසය දක්වන්නාහු "චාර්ථේ" යනාදිය කීහු.

තත්පුරුෂසමාසාර්ථව්‍යාඛ්‍යාව.

———:———

275. චාර්ථේ, චකාරයාගේ අර්ථයෙහි; ද්වන්ද්වඃ, ද්වන්ද්වසමාසය වේ.

a සමුච්චය, වෙන්වසයෙන් එකක්‍රියාභිසම්බන්ධ ලක්ෂණවූ සමුච්චය; අන්වාචය, අන්‍යොන්‍යක්‍රියාභිසම්බන්ධලක්ෂණවූ අන්වාචය;

ඉතරේතරයෝග, (අන්‍යොන්‍යසම්බන්ධාවයවප්‍රාධාන්‍යයෙන් ක්‍රියාන්වයලක්ෂණවූ) ඉතරේතරයෝගය; සමාහාරඃ, (සංහතිප්‍රාධාන්‍යයෙන් ක්‍රියාන්වය ලක්ෂණවූ) සමාහාරය යන මොහු; චාර්ථාඃ, චකාරයාගේ අර්ථයෝයි. තත්‍ර, ඔවුන් අතුරෙහි; ඊශ්වරම්, ඊශ්වරයාද; ගුරුං ච, ගුරුහුද; භජස්වඉති, භජනය කරව යන මෙහි; ප්‍රත්‍යෙකම්, වෙන් වෙන් වශයෙන්; එකක්‍රියාසම්බන්ධෙ, එක් ක්‍රියාවක් හා සම්බන්ධය ඇති; සමුච්චයෙ, සමුච්චයාර්ථයෙහි; සමාසඃ නාස්ති, සමාසය නැත්තේය. බටො, මාණවකය; භික්ෂාම්, භික්ෂාවට; අට, යව; ගාඤ්ච ගොධෙනුව ද; ආනය ඉති, ගෙණෙව යන මෙහි; ක්‍රමේණ, පිළිවෙළින්; ක්‍රියාද්වයසම්බන්ධෙ, ක්‍රියාදෙකක්හුගේ සම්බන්ධය ඇත්තාවූ; අන්වාචයෙ ච, අන්වාචයාර්ථයෙහිද. සමාසඃ නාස්ති, සමාසය නැත්තේය. (කුමක්හෙයින්දයත්?) පරස්පරම්, එකිනෙකට; අසම්බන්ධාත්, සම්බන්ධ නැතිහෙයිනි. ඉතරේතරයොගෙ ච, ඉතරේතරයොගවූ ද; සමාහාරෙ ච, සමාහාරවූ ද; චාර්ථෙ, චකාරාර්ථයෙහි; ද්වන්ද්වසමාසඃ භවති, ද්වන්ද්වසමාසය වේ.

මෙහි චාර්ථයෙහි ද්වන්ද්වසමාසය වේයයි කියා චකාරයාගේ අර්ථසතරක්යයිද, ඉන් ඉතරේතරයොගාර්ථයෙහි හා සමාහාරාර්ථයෙහි පවත්නේ සමාස වේයයිද, අන්‍යවූ අර්ථවයයෙහි සමාස නොවේයයිද කීහු. එහි සමුච්චය නම්-අන්‍යොන්‍යනිරපෙක්ෂකවූ කීපයක් වෙන් වෙන් වශයෙන් එක් ක්‍රියාවෙක්හි සම්බන්ධකරගැණීමයි. එනම් "ඊශ්වරං ගුරුං ච භජස්ව" යන තන්හි චකාරය "ඊශ්වරං භජස්ව ගුරුං ච භජස්ව" යනුවෙන් එකම භජනක්‍රියාවඅන්‍යොන්‍යනිරපෙක්ෂකවූ ඊශ්වරගුරුවය හා වෙන් වෙන් වශයෙන් යෙදුනබැවින් සමුච්චයාර්ථයි. මෙහි සමාස නොවේ. (මෙකී සමුච්චය සම්බන්ධය වනාහි ක්‍රියායෙහි පමණක් නොව ද්‍රව්‍යගුණයන්හි ද දක්නාලැබේ, එනම්- "රාජ්ඤෙ ගජශ්චාශ්වශ්ච" යන තන්හි රාජ සංඛ්‍යාත එකද්‍රව්‍යයෙහි "ගජශ්ව" සංඛ්‍යාත ද්‍රව්‍යවයේ සමුච්චය යි, "පටඃ ශුක්ලො රක්තශ්ච" යන තන්හි "පට" සංඛ්‍යාත එකද්‍රව්‍යයෙහි "ශුක්ල රක්ත" සංඛ්‍යාත ගුණවයේ සමුච්චයයි "රක්තඃ පටඃ කම්බලශ්ච" යන තන්හි "රක්ත" සංඛ්‍යාත ගුණයෙහි "පටකම්බල" සංඛ්‍යාතද්‍රව්‍යවයේ සමුච්චයයි. යම්තැනක චකාරයඅන්‍යොන්‍යනිරපෙක්ෂකාවයවවයක් ක්‍රියාවයක් හා සම්බන්ධකෙරේ නම් ඒ අන්වාචයයි. ඒ එකක්හුගේ ප්‍රධානත්වයෙන් හා අන්‍යයාගේ තදනුෂඞ්ගිකත්වයෙනි. එනම්- "බටො භික්ෂාමට ගාඤ්චානය"

a. "ද්වන්ද්වෙල්පස්වරප්‍රධානෙකාරොකාරාන්තානාං පූර්වනිපාතො වක්තව්‍යඃ" පටුශ්ච ගුප්තශ්ච=පටුගුප්තෞ. (ඉතරෙතරයොගෙ ද්විවචනම්, උක්තාර්ථානාමප්‍රයොගඃ) අග්නිශ්ච මාරුතශ්ච=අග්නිමාරුතෞ, භොක්තා ච භොග්‍යශ්ච=භොක්තෘභොග්‍යෞ, ධවශ්ච ඛදිරශ්ච=ධවඛදිරෞ.

යන තන්හි චකාරය අන්‍යොන්‍යනිරපෙක්ෂකවූ භික්ෂාගොපදාර්ථය "අට ආනය" යනක්‍රියාවය හා සම්බන්ධකළබැවින් අන්වාචයාර්ථයි. මෙහි භික්ෂාටනයාගේ ප්‍රධානත්වය හා ගවානයනයාගේ තදනුෂඞ්ගිත්වයද වේ. මෙහි ද සමාස නොවේ. යම් තැනෙක්හි චකාරයතෙමේ අන්‍යොන්‍යසාපෙක්ෂකම්ලිතයන් අවයවප්‍රධානත්වයෙන් එක්ක්‍රියාවක් හා සම්බන්ධකෙරේ නම් ඒ ඉතරෙතරයොගාර්ථයි. යම් තැනෙක චකාරයතෙමේ අන්‍යොන්‍යසාපෙක්ෂකයන් සමූහප්‍රධානත්වයෙන් එක් ක්‍රියාවක් හා සම්බන්ධකෙරේ නම් ඒ සමාහාරාර්ථයි. වක්ෂ්‍යමාණ "පටුශ්ච ගුප්තශ්ච" යනාදිය ඉතරෙතරයොගාදියට උදාහරණයි.

a. ද්වන්ද්ව, ද්වන්ද්වසමාසයෙහි; අල්පස්වර, අල්පස්වරශබ්දය; ප්‍රධාන, ප්‍රධානශබ්දය; ඉකාරොකාරාන්තානාම්, ඉකාරාන්තශබ්දය හා උකාරාන්තශබ්දය යන මොවුන්ගේ; පූර්වනිපාතඃ, පූර්වයෙන් හෙළීම; වක්තව්‍යඃ, කියයුතුයි. පටුශ්ච, නිපුණවූයේද; ගුප්තශ්ච, රක්ෂිතවූයේද (යනතන්හි); පටුගුප්තෞ, "පටුගුප්තෞ" යනු වේ. ඉතරෙතරයොගෙ, ඉතරෙතරයොගාර්ථයෙහි; ද්විවචනම්, ද්විවචනයි. උක්තාර්ථානාම්, (ඉතරෙතරයොගාදිවශයෙන්) කියනලද අර්ථ ඇති චකාරයන්ගේ; අප්‍රයොගඃ, අප්‍රයොගය වේ. අග්නිශ්ච, ගින්නද; මාරුතශ්ච, වාතයද (යනතන්හි); අග්නිමාරුතෞ, "අග්නිමාරුතෞ" යනු වේ. භොක්තා ච, අනුභවකරන්නේ ද; භොග්‍යශ්ච, අනුභවකටයුත්තේද; භොක්තෘභොග්‍යෞ, "භොක්තෘභොග්‍යෞ" යනු වේ. ධවශ්ච, දෑවරුකද; ඛදිරශ්ච, කිහිරිරුකද; ධවඛදිරෞ, "ධවඛදිරෞ" යනු වේ.

ද්වන්ද්වසමාසයෙහි සමස්‍යමානපදයන් අතුරෙන් පූර්වයෙන් යෙදියයුතු පදයන් දක්වීම පිණිස "ද්වන්ද්වෙල්පස්වර" යනාදිය කීහු. එනම් "ධවඛදිරෞ" යන තන්හි අල්පස්වරශබ්දයාගේ පූර්වනිපාතයයි. "තාපසපර්වතෞ" යනතන්හි "තාපස" ශබ්දය "පර්වත" ශබ්දයට වඩා ප්‍රධාන බැවින් ප්‍රධානශබ්දයාගේ පූර්ව

a "දෙවතාද්වන්ද්වෙ පූර්වපදස්‍ය වා දීර්ඝො වක්තව්‍යඃ" වාග්‍රහණාත් ක්වචින්න භවති. "අග්නිමාරුතෞ ඉත්‍යාදෞ.

b "අග්න්‍යාදෙඃ සොමාදීනාං ෂත්වං වක්තව්‍යම්"–අග්නිශ්ච සොමශ්ච=අග්නීෂොමෞ, ඉන්ද්‍රශ්ච වෘහස්පතිශ්ච=ඉන්ද්‍රාවෘහස්පතී, සූර්‍ය්‍යාචන්ද්‍රමසෞ.

නිපාතයයි. "භොක්තෘභොග්‍යෞ" යන තන්හි ද එසේයි. "හරිහරෞ" යන තන්හි ඉකාරාන්තයාගේ පූර්වනිපාතයයි. "පටුගුප්තෞ" යන තන්හි උකාරාන්තයාගේ පූර්වනිපාතයයි. තවත් සමහරතන්හි ස්වරයක් ආදිකොට ඇති අකාරාන්ත ශබ්දයන්ගේ ද පූර්වනිපාතය කියනලදී. "ඊශකෘෂ්ණෞ" යනු ඊට උදාහරණයි. ඇතම්තන්හි බොහෝ ශබ්දයන් පිළිබඳ ද්වන්ද්වසමාසයෙහි අනියමයෙන් වේයයි කියා "ඉන්ද්‍රාශ්වරථාඃ" කියාද "අශ්වරථෙන්ද්‍රාඃ" කියාද උදාහරණ කරණලදී. මෙහි කී "පටුගුප්තෞ" යනාදිය ඉතරෙතරයොගාර්ථසමාස බවද එබැවින් ද්විවචනබවද කීහු. ඉතරෙතරයොගසමාහාරභෙදයෙහි ලක්ෂණ දක්වන්නාවූ ඇතැම් වෛයාකරණයෝ:–

"යත්‍ර ද්විත්වං බහුත්වඤ්ච ස ද්වන්ද්ව ඉතරෙතරඃ,
සමාහාරඃ ස විඥෙයො යත්‍රෛකත්වං නපුංසකම්"

යනු කීහු. යම් ද්වන්ද්වසමාසයෙක්හි ද්විවචනභාවය හෝ බහුවචනභාවය වේ නම් ඒ ඉතරෙතරයොගද්වන්ද්වයයිද, යම් ද්වන්ද්වසමාසයෙක්හි එකවචනභාවය හා නපුංසකත්වය වේනම් ඒ සමාහාරයයිද දතයුතුය යනු එහි අර්ථයි. ඉතරෙතරයොගයාගේ අවයව ප්‍රාධාන්‍යයෙන් පදදෙකක්හුගේ ඉතරෙතරයොගයෙහි ද්විවචන ද බොහෝපදයන්ගේ ඉතරෙතරයොගයෙහි බහුවචන ද වේ.

a දෙවතාද්වන්ද්ව, දෙවතාර්ථවාචකද්වන්ද්වසමාසයෙහි; පූර්වපදස්‍ය, පූර්වපදයට; වා, ව්‍යවස්ථිතවිභාෂාවශයෙන්; දීර්ඝඃ වක්තව්‍යඃ, දීර්ඝය කියයුතුයි. වාග්‍රහණාත්, වාශබ්දග්‍රහණයෙන්; ක්වචිත්, කිසි තැනෙක්හි; නභවති, දීර්ඝ නොවේ. (එනම්) අග්නිමාරුතෞ ඉත්‍යාදෞ, "අග්නිමාරුතෞ" යනාදියෙහි (දීර්ඝනොවේ).

b අග්න්‍යාදෙඃ, අග්නිශබ්දාදියකෙරෙන් පරවූ; සොමාදීනාම්, "සොම" ශබ්දාදීන්ගේ සකාරයට; ෂත්වම්, මූර්ධන්‍යෂකාරභාවය;

a "ඒකවද්භාවො වා සමාහාරෙ වක්තව්‍යඃ" සමාහාරස්‍යෛකත්වාත් සමාහාරෙ ඒකවද්භාවඃ සිද්ධ එව, තර්හි වාග්‍රහණං කිමර්ථම්? වාග්‍රහණාත් ක්වචිද්ඉතරෙතරයොගෙ ඒකවචනං, ක්වචිද්බහුනාමිතරෙතරයොග එකවචනම්, ශශාශ්ච කුශාශ්ච පලාශාශ්ච=ශශකුශපලාශාඃ-ශශකුශපලාශම්.

වක්තව්‍යම්, කියයුතුයි. අග්නිශ්ච, අග්නිදෙවතෙමේද; සෝමශ්ච" සෝමදෙවතෙමේද; අග්නීෂොමෞ, "අග්නීෂොමෞ" යනු වේ. ඉන්ද්‍රශ්ච, ශක්‍රතෙමේද; බෘහස්පතිශ්ච, සුරගුරුතෙමේද; ඉන්ද්‍රාබෘහස්පතී, "ඉන්ද්‍රාබෘහස්පතී" යනු වේ. සූර්‍ය්‍යාචන්ද්‍රමසෞ, ("සූර්‍ය්‍යශ්ච චන්ද්‍රමාශ්ච" යන වාක්‍යයෙහි) "සූර්‍ය්‍යාචන්ද්‍රමසෞ" යනු වේ. (සූර්‍ය්‍යතෙමේ ද චන්ද්‍රතෙමේ ද යන අර්ථයි).

මෙහි දෙවතාර්ථවාචක ශබ්දමයක් ද්වන්ද්වසමාසවූකල්හි පූර්වපදාන්තස්වරයට කිසිතැනෙක්හි දීර්ඝවේයයි කියා "අග්නීෂොමෞ" යනාදිය උදාහරණ කරණලදී. මෙහි වාශබ්දයාගේ ව්‍යවස්ථිත විකල්පාර්ථයෙන් "අග්නිමාරුතෞ, අග්නිවායූ, වායවග්නී, බ්‍රහ්ම ප්‍රජාපතී" යනාදියෙහි දීර්ඝ නොවේ. සිද්ධාන්තකෞමුදියෙහි "ඊද ග්නෙඃ සොමවරුණයොඃ" යන සූත්‍රයෙන් "සොම, වරුණ" ශබ්ද දෙක පරකල්හි "අග්නි" ශබ්දාන්තයට ඊකාරාදෙශ වනබවද "අග්නෙඃ ස්තුත්ස්තොමසොමාඃ" යන සූත්‍රයෙන් "අග්නි" ශබ්දයා කෙරෙන් පර "ස්තුත්, ස්තොම, සොම" ශබ්දයන්ගේ සකාරයට මූර්ධන්‍යෂකාරය වන බවද කියා "අග්නිෂ්ටුත්, අග්නිෂ්ටොමඃ, අග්නීෂොමෞ, අග්නීවරුණෞ" යි උදාහරණකරණලදී.

a සමාහාරෙ, සමාහාරද්වන්ද්වයෙහි; ඒකවද්භාවඃ, එකක්මෙන් වීම, හෙවත් ඒකවචනභාවය; වා, ව්‍යවස්ථිතවිභාෂාවශයෙන්; වක්තව්‍යඃ, කියයුතුයි. සමාහාරස්‍ය, සමාහාරය තමා; ඒකත්වාත්, එකක්බැවින්; සමාහාරෙ, සමාහාරයෙහි; ඒකවද්භාවඃ, ඒකවචනභාවය; සිද්ධඃ එව, සිද්ධමැයි. තර්හි, එසේ ඇතිකල්හි; වාග්‍රහණම්, වාශබ්දග්‍රහණය; කිමර්ථම්, කුමක්පිණිසද?; වා ග්‍රහණාත්, වාශබ්දග්‍රහණයෙන්; ක්වචිත්, කිසිතැනෙක්හි; ද්වයොඃ අපි, දෙදෙනෙකුගේද; ඉතරෙතරයොගෙ, ඉතරෙතරයොගයෙහි; ඒකවචනම්, ඒකවචන වේ. ක්වචිත්, කිසිතැනෙක්හි; බහූනාම්, බොහෝනාමයන්ගේද; ඉතරෙතරයොගෙ, ඉතරෙතරයොගයෙහි; ඒකවචනම්, ඒකවචන වේ. ශශාශ්ච, සාවෝද; කුශාශ්ච, කුශ

තණද; පලාශාශ්ච, කොලද, ශශකුශපලාශාඃ, "ශශකුශපලාශාඃ" යනුද; ශශකුශපලාශම්, විකල්පයෙන් සමාහාරයෙහි ඒකත්වනපුංසකත්වයවූ පක්ෂයෙහි "ශශකුශපලාශම්" යනුද වේ.

සමාහාරය තමා සමුදායප්‍රධානත්වයෙන් එකක් බැවින් එහි ඒකවද්භාවය පැමිණිකල්හි විකල්පය පිණිස "ඒකවද්භාවො වා" යනාදිය දක්වා ඉතරෙතරයොගයෙහි ද ඒකත්වය වේයයි කීහු. සමහරු සියලුම ද්වන්ද්වසමාසය විකල්පයෙන් ඒකවචනවත් වේයයි කියා ඉතරෙතරයොගයෙහි ද ඒකවද්භාවය වේයයි කීහු. සිද්ධාන්තකෞමුදියෙහි "ද්වන්ද්වශ්ච ප්‍රාණිතූර්‍ය්‍යසෙනාඞ්ගානාම්" යන සූත්‍රයෙන් පාණිපාදාදි ප්‍රාණ්‍යඞ්ගශබ්දයන්ගේ ද, මාර්දඞ්ගික පාණවිකාදි තූර්‍ය්‍යාඞ්ග ශබ්දයන්ගේ ද රථිකාශ්වාරොහාදි සෙනාඞ්ග ශබ්දයන්ගේද ද්වන්ද්වසමාසය (නිත්‍යයෙන්) ඒකවචනවේයයි කියා "පාණිපාදම්, මාර්දඞ්ගිකපාණවිකම්, රථිකාශ්වාරොහම්"යි උදාහරණ කරණලදී. තවත් බොහෝ සූත්‍ර හදුරා අනුවාදයෙහි (සිද්ධාන්තයෙහි) චරණවාචක (වෙදෛකදෙශග්‍රන්ථ හදුරණ මූනිවාචක) ශබ්දයන්ගේද, යජුර්වේදවිහිතයාගවාචකශබ්දයන්ගේද, අධ්‍යයනයෙන් ප්‍රත්‍යාසන්න නම් ඇති ශබ්දයන්ගේද, අප්‍රාණික ජාති වාචකයන්ගේද, ග්‍රාමභින්න නදීදෙශවාචක භින්නලිඞ්ගයන්ගේද, ක්ෂුද්‍රජන්තුවාචකශබ්දයන්ගේද, අන්‍යොන්‍ය විරොධීන්ගේද අවභිෂ්කෘත ශූද්‍රවාචක ශබ්දයන්ගේද, ගවාශ්වශබ්දාදීන්ගේද ද්වන්ද්වසමාසය ඒකවචන වේයයි කියනලදී. "කඨකාලාපම්, අර්කාශ්වමෙධම්, පදකක්‍රමකම්, ධානාශෂ්කුලි, ගඞ්ගාශොණම්, යූකාලික්ෂම්, අහිනකුලම්, තක්ෂායස්කාරම්, ගවාශ්වම්" යනු පිළිවෙළින් උදාහරණයි. පසුව "විභාෂා වෘක්ෂමෘගතෘණධාන්‍යව්‍යඤ්ජනපශුශකුන්‍යශ්වවඩවපූර්වාපරාධරොත්තරාණාම්" යන සූත්‍රය හදුරා "වෘක්ෂ, මෘග, තෘණ, ධාන්‍ය, ව්‍යඤ්ජන, පශු, ශකුනී" වාචකශබ්දයන්ගේද "අශ්ව වඩව පූර්වාපර අධරොත්තර" යන මොවුන්ගේද විකල්පයෙන් ඒකත්වය හා නපුංසකත්වය වන බව කීහු. "ප්ලක්ෂන්‍යග්‍රොධම්-ප්ලක්ෂන්‍යග්‍රොධාඃ, රුරුපෘෂතම්- රුරුපෘෂතාඃ, කුශකාශම්-කුශකාශාඃ, ව්‍රීහියවම්-ව්‍රීහියවාඃ, දධිඝෘතම්-දධිඝෘතෙ ගොමහිෂම්-ගොමහිෂාඃ, ශුකවකම් ශුකවකාඃ, අශ්වවඩවම්- අශ්වවඩවෞ, පූර්වාපරම්- පූර්වාපරෙ, අධරොත්තරම්-අධරොත්තරෙ' යනු පිළිවෙළින් උදාහරණයි, පූර්වයෙහි ද මෙහි ද කී ශබ්දයන් අතුරෙන් "ඵලසෙනාවනස්පතිමෘගශකුනික්ෂුද්‍රජන්තුධාන්‍යතෘණ" වාචකයන්ගේ වනාහි බහුත්වය ප්‍රකෘතිකොට

a "අන්‍යාදීනාං විභක්තිලොපෙ කර්මව්‍යතිහාරෙ පූර්වපදස්‍ය සාගමො භවති" (අන්‍යොන්‍යමෙකක්‍රියාකරණං කර්මව්‍යතිහාරඃ) අන්‍යශ්ච අන්‍යශ්ච=අන්‍යොන්‍යම්, (විප්‍රා නමන්ති) පරශ්ච පරශ්ච=පරස්පරම්. පරස්පරමිත්‍යත්‍ර කස්කාදිත්වාත්විසර්ගොපධ්මානීයාභාවඃ.

ඇති ද්වන්ද්වයම එකවචන වේ, එබැවින් මෙහි කී "ප්ලක්ෂන්‍යග්‍රොධම්" යනාදී තද්වාචකසමාසයන්ගේ වාක්‍යයෝ "ප්ලක්ෂශ්ච න්‍යග්‍රොධශ්ච" යනාදීන් බහුවචන කොට යෙදිය යුතුයි. එබැවින්ම ඔවුන්ගේ එකත්වය නොවූ පක්ෂයෙහි "ප්ලක්ෂන්‍යග්‍රොධාඃ" යනාදීන් බහුවචන වේ. තවත් විරුද්ධාර්ථ අද්‍රව්‍යවාචකශබ්දයන්ගේ ද විකල්පයෙන් එකත්වය කියා "ශීතොෂ්ණම්-ශීතොෂ්ණෙ" යනාදිය උදාහරණ කරණලදී. "න දධිපයආදීනි" යන සූත්‍රයෙන් 'දධිපයස්" ආදිය එකවචන නොවේයයි කියා "දධිපයසී, සර්පිර්මධුනී" යනාදිය දක්වන ලදී.

a කර්මව්‍යතිහාරෙ, කර්මව්‍යතිහාරාර්ථයක් වාච්‍යකල්හි; අන්‍යාදීනාම්, අන්‍යශබ්දාදීන්ගේ; විභක්තිලොපෙ, විභක්තිලොපය කළකල්හි; පූර්වපදස්‍ය, පූර්වපදයට; සාගමඃ භවති, "සක්" ආගමවේ. අන්‍යොන්‍යම්, ඔවුනොවුන්; එකක්‍රියාකරණම්, එකජාතිය ක්‍රියා කිරීම; කර්මව්‍යතිහාරඃ, කර්මව්‍යතිහාර නම් වේ. අන්‍යශ්ච, අන්‍යවූයේද; අන්‍යශ්ච, අන්‍යවූයේද; අන්‍යොන්‍යම්, අන්‍යොන්‍යම් යනු වේ. විප්‍රාඃ, බ්‍රාහ්මණයෝ; අන්‍යොන්‍යම්, එකිනෙකා; නමන්ති, වඳිත්. පරශ්ච, පර (අන්‍ය) වූයේද; පරශ්ච, පරවූයේද; පරස්පරම්, "පරස්පරම්" යනු වේ. පරස්පරම් ඉති අත්‍ර, "පරස්පරම්" යන මෙහි; කස්කාදිත්වාත්, කස්කාදිය බැවින්; විසර්ගොපධ්මානීයාභාවඃ, විසර්ගඋපධ්මානීය දෙදෙනාගේ නොවීම වේ.

මෙහි කර්මව්‍යතීහාර නම් එකිනෙකා එකජාතීයක්‍රියාකරණයයි කීහු. එනම්-යම් කිසිවෙක් තෙම යම් කර්මයකින් අනෙකකු සම්බන්ධකරගණීද ඒ අන්‍යතෙමේත් ඔහු තජ්ජාතීය ක්‍රියාවෙන්ම සම්බන්ධ කෙරේ නම් ඒ කර්මව්‍යතිහාරසඞ්ඛ්‍යාත එකජාතීයක්‍රියාකරණයයි "අන්‍යොන්‍යං විප්‍රා නමන්ති" යන තන්හි එක් බමුණෙකු විසින් අනිත් බමුණෙකු නමස්කාර ක්‍රියාවෙන් සම්බන්ධකර ගැණීමද, ඒ අනිකාවිසිනුත් ඒ නමස්කාරක්‍රියාවෙන්ම පූර්වයෙහි තත්ක්‍රියාව කළහු සම්බන්ධකරගැණීමද ප්‍රකාශ වේ. මෙබඳු

276. එකත්වෙ ද්විගුද්වන්ද්වෞ. (එකත්වෙ 7, 1; ද්විගුද්වන්ද්වෞ 1,2;)

a එකත්වෙ වර්තමානෞ ද්විගුද්වන්ද්වෞ නපුංසකලිඞ්ගෞ භවතඃ.

ඉති ද්වන්ද්වඃ.

---

277. සඞ්ඛ්‍යාපූර්වො ද්විගුඃ. (සඞ්ඛ්‍යාපූර්වඃ 1, 1; ද්විගුඃ 1, 1;)

b සඞ්ඛ්‍යාපූර්වඃ සමාසො ද්විගුර්නිගද්‍යතෙ.

278. සමාහාරෙන ඊප් ද්විගුඃ.

(සමාහාරෙ 7 1; අතඃ 5, 1; ඊප් 1, 1; ද්විගුඃ 1, 1;)

තන්හි අන්‍යාදි ශබ්දද්වයක් ද්වන්ද්වසමාස කොට පූර්වපදයෙහි විභක්තිය ලොප්කළකල්හි එහි ආගමවශයෙන් සල්සකාරයවේ. ඊට විසර්ගාදෙශ හා විසර්ගයට උපධ්මානීයාදෙශාදියද කොට ඇති කළකල්හි 'අන්‍යොන්‍යම්" යනු වේ. 'පරස්පරම්" යන තන්හි පකාරපරතිම්හෙතන් සකාරයට විසර්ගය හා විසර්ගයට උපධ්මානීය විය හැකිවුවත් එය "කස්ක" ශබ්දාදියට ඇතුළත් බැවින් නොවේ.

276 එකත්වෙ, එකත්වයෙහි පවත්නාවූ, ද්විගුද්වන්ද්වෞ, ද්විගුසමාස ද්වන්ද්වසමාස දෙක නපුංසක ලිඞ්ග වෙත්.

a එකත්වෙ වර්තමානෞ, එකවචනභාවයෙහි පවත්නාවූ ද්විගුද්වන්ද්වෞ, ද්විගුසමාසද්වන්ද්වසමාස දෙක; නපුංසකලිඞ්ගෞ භවතඃ, නපුංසකලිඞ්ග වෙත්. (ද්වන්ද්වසමාසය හෝ ද්විගුසමාසය සමාහාරත්වයෙන් එකත්වයෙහි පවත්නාකල්හි නපුංසකලිඞ්ග වේ.) ද්වන්ද්වඃ, ද්වන්ද්වසමාසය; ඉති මෙතෙකින් සමාප්තයි.

ද්වන්ද්වසමාසාර්ථව්‍යාඛ්‍යාවයි.

---

277 සඞ්ඛ්‍යාපූර්වඃ, සඞ්ඛ්‍යාවාචකශබ්දයක් පූර්වකොට ඇතිසමාසය; ද්විගුඃ, ද්විගු නම් වේ.

b සඞ්ඛ්‍යාපූර්වඃ, සඞ්ඛ්‍යාශබ්දයක් පූර්වකොට ඇත්තාවූ; සමාසඃ, සමාසය; ද්විගුර්නිගද්‍යතෙ, ද්විගුයයි කියනු ලැබේ.

278 සමාහාරෙ, රැසිකරණාර්ථයෙහි; ද්විගුඃ, ද්විගුසමාසය වේ. අතඃ, අකාරාන්තද්විගුසමාසයාකෙරෙන්; ඊප්, ඊප්ප්‍රත්‍යය වේ.

a සමාහාරෙඵ්ථ ද්විගුඃ සමාසො භවති, තතොකාරාන්තා දීප්ප්‍රත්‍යයො භවති. දශානාං ග්‍රාමාණාං සමාහාරඃ=දශග්‍රාමී, පඤ්චානාමග්නීනාං සමාහාරඃ ඉති=පඤ්චාග්නි, පඤ්චානාං ගවාං සමාහාරඃ=පඤ්චගු, (නපුංසකත්ව හ්‍රස්වත්වම්) ත්‍රිඵලෙති රූඪිතඃ. "පාත්‍රාද්‍යන්තා ද්විගුර්නෙබන්තඃ" පඤ්චානාං පාත්‍රාණාං සමාහාරඃ=පඤ්චපාත්‍රම්, ද්විභුවනම්, ත්‍රිභුවනම්, චතුෂ්පථම්.**

ඉති ද්විගුඃ.

—0—

a සමාහාරෙ අර්ථෙ, සමාහාරාර්ථයෙහි; ද්විගුඃ සමාසඃ භවති, ද්විගුසමාසය වේ. අකාරාන්තාත්, අකාරාන්තවූ. තතඃ, ඒ ද්විගු සමාසයාකෙරෙන්; ඊප්ප්‍රත්‍යයඃ භවති, ඊප්ප්‍රත්‍යය වේ. දශානාං ග්‍රාමාණාම්, දසයක්වූ ග්‍රාමයන්ගේ; සමාහාරඃ, එක් (ක්‍රියායෙහි ඇතුලත්) කොට ගැන්ම; දශග්‍රාමී, "දශග්‍රාමී" නම් වේ. පඤ්චානාමග්නීනඃ, අග්නි පසක්; සමාහෘතාඃ ඉති, එක්කොට ගන්නා ලද්දහුය යන අර්ථයෙහි; පඤ්චාග්නි, "පඤ්චාග්නි" නම් වේ. පඤ්චානාං ගවාම්, ගෙරින් පස්දෙනෙකුන්ගේ; සමාහාරඃ, එක්කොටගැන්ම; පඤ්චගු, "පඤ්චගු" නම් වේ. නපුංසකත්වාත්, නපුංසකලිඞ්ග බැවින්; හ්‍රස්වත්වම්, හ්‍රස්වභාවය වේ. ත්‍රිඵලා ඉති, "ත්‍රිඵලා" යන පදය; රූඪිතඃ, රූඪි වශයෙන් (ලොකප්‍රසිද්ධිවශයෙන්) සිද්ධයි පාත්‍රාද්‍යන්තඃ, පාත්‍රශබ්දාදිය අන්තකොට ඇත්තාවූ; ද්විගුඃ, ද්විගුසමාසය; නර්බන්තඃ, ඊප්ප්‍රත්‍යයාන්ත නොවේ. (එහෙයින්) පඤ්චානාං පාත්‍රාණාම්, පාත්‍රයන්පස්දෙනෙකුන්ගේ; සමාහාරඃ, එක්කොට ගැන්ම; පඤ්චපාත්‍රම්, "පඤ්චපාත්‍ර" නම් වේ ද්විභුවනම්, ("ද්වයොර් භුවනයොඃ සමාහාරඃ" යන වාක්‍යයෙහි) "ද්විභුවනම්" යනු වේ, (භුවනදෙකක්හුගේ එක්කොට ගැන්ම යන අර්ථයි). ත්‍රිභුවනම්, ("ත්‍රයාණං භුවනානාං සමාහාරඃ" යන වාක්‍යයෙහි) "ත්‍රිභුවන" නම් වේ. (ලෝතුණක්හුගේ එක්කොට ගැන්ම යන අර්ථයි). චතුෂ්පථම්, ("චතුර්ණාං පථාං සමාහාරඃ" යන වාක්‍යයෙහි) "චතුෂ්පථ" නම් වේ (මාගීයතරක්හුගේ එක්කොට ගැන්ම යන අර්ථයි). ද්විගුඃ ද්විගුසමාසය; ඉති, මෙතෙකින් සමාප්තයි.

මෙහි සඞ්ඛ්‍යාපූර්වසමාසය ද්විගුයයිද, ඒ ද්විගුසමාසය සමාහාරාර්ථයෙහි වේයයිද, ඒ සමාහාරාර්ථයෙහිවූ අකාරාන්ත ද්විගුසමාසයා

* මෙහි "ද්විභුවනම්, චතුෂ්පථම්" යනු ඇතම් පොත්වල දක්නා නොලැබේ.

279. බහුව්‍රීහිරන්‍යාර්ථෙ. (බහුව්‍රීහිඃ 1, 1; අන්‍යාර්ථෙ 7, 1;)

a අන්‍යපදාර්ථෙ ප්‍රධානෙ යඃ සමාසඃ ස බහුව්‍රීහිසංඥකො භවති. බහු ධනං යස්‍ය සඃ=බහුධනඃ, අස්ති ධනං යස්‍ය සොස්තිධනඃ, (අව්‍යයත්වාදස්ත්‍යාදීනාං ක්‍ෂුචිනිපාතඃ, අන්‍යපදප්‍රාධාන්‍යාද් බහුව්‍රීහිඃ, අනන්තරඞ්ගං යස්‍යාසාවනන්තරඞ්ගඃ, වජ්‍රිරඞ්ගඃ, උෂ්ණෙඩ්ඩර්මූර්ධඃ)

කෙරෙන් ඊප්ප්‍රත්‍යය වේ යයි ද අකාරාන්තවූවත් "පාත්‍ර" ශබ්දාදිය අන්තකොට ඇත්තහුකෙරෙන් ඊප්ප්‍රත්‍යය නොවේයයිද කියනලදී. (ඊප්ප්‍රත්‍යය වූතන්හි ස්ත්‍රීලිඞ්ග ද අන්තන්හි නපුංසකලිඞ්ග ද සමාහාරාර්ථයෙහි ධ්‍රැයේ එකවචන ද වේ.) මෙහි ද්විගුසමාසය බොහෝ පොත්වල ත්‍රිවිධයයි කියනලදී. එනම් තද්ධිතාර්ථයෙහිද සමාහාරාර්ථයෙහිද උත්තරපදයක් පරකල්හිද වේයයි කියායි එහි තද්ධිතාර්ථයෙහි වන්නාවූ ද්විගුසමාසය තද්ධිතප්‍රත්‍යයමාත්‍රයාගේ අර්ථය විෂයතන්හි ද වාච්‍යතන්හිද කියා දෙවැද්දැරුම් වේ. එනම්' ද්වයෙ මාත්‍රොරපත්‍යම්" යන වාක්‍යයෙහි අපත්‍යාර්ථ තද්ධිත "අණ්" ප්‍රත්‍යය වීමෙන් පෙර "ද්විමාතෘ"යි ද්විගුසමාස වේ. පසුව ඉන් පරව ඒ "අණ්" ප්‍රත්‍යය කොට වෘද්ධ්‍යාදිය කළකල්හි "ද්වෛමාතුර" යනු වේ. "පඤ්චභිර්ගෝභිඃ ක්‍රීතඃ" යන වාක්‍යයෙහි පැමිණිය යුතුවූ තද්ධිතප්‍රත්‍යය නොකොට ඒ අර්ථයාගේ වාච්‍යත්වයෙන් සමාසකළකල්හි "පඤ්චගු" යි සිද්ධ වේ. "දශග්‍රාමී, ත්‍රිභුවනම්', යනාදිය සමාහාරාර්ථයෙහි ද්විගුසමාසයි. "පඤ්චගවධනඃ" යනු උත්තරපදපරද්විගුසමාසයි, මෙහි "ධන" යන්න උත්තරපදයි, ඒ පර නිමිත්තෙන් "පඤ්චගව" යි ද්විගුසමාස යි. මෙහි "පාත්‍ර" ශබ්දාදිය තොරකොට ඇති අකාරාන්තද්විගුසමාසයා කෙරෙන් "ඊප්" ප්‍රත්‍යය දක්නා ලැබේ. මෙහි එය රූඪිවශයෙන් යයි කියනලදී. සූත්‍රලක්ෂණයෙන් වෙනස්ව භාෂාව්‍යවහාරයෙහි ආයේ "රූඪි" නාම වේ. හෙද ශිෂ්ටසම්මතත්වයෙන් ගණුලැබේ.

ද්විගුසමාසාර්ථව්‍යාඛ්‍යාවයි.

—

279 අන්‍යාර්ථෙ, (සමස්‍යමානපදයෙන්) අන්‍යවූ පදයන්ගේ අර්ථයෙහි (යම් අර්ථයක් වේනම් එය) බහුව්‍රීහිඃ, බහුව්‍රීහිසමාස නම් වේ.

a අන්‍යපදාර්ථෙ ප්‍රධානෙ, අන්‍යපදයාගේ අර්ථය ප්‍රධානකල්හි (අර්ථය ඇත්තාවූ); යඃ සමාසඃ, යම් සමාසයක්වේද; සඃ, ඒ සමාසය

තෙම්; බහුව්‍රීහිසඥකඃ භවති, බහුව්‍රීහි නම් වේ. බහු, බොහෝවූ; ධනම්, ධනය; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; බහුධනඃ, 'බහුධන" නම් වේ. ධනම්, ධනය; යස්‍ය, යමෙකුට: අස්ති, ඇත්තේද; සඃ, හෙතෙම: අස්තිධනඃ, අස්තිධන" නම් වේ. අව්‍යයනිපාත් අව්‍යය බැවින්: අස්ත්‍යාදීනාම්, "අස්ති" ශබ්දාදීන්ගේ; පූර්වනිපාතඃ, පූර්වයෙහි වැටීම වේ. අන්‍යපදප්‍රාධාන්‍යාත් අන්‍යපදාර්ථයාගේ ප්‍රධාන භාවයෙන්; බහුව්‍රීහිඃ, බහුව්‍රීහිසමාසයි. අන්තර්, මධ්‍යයෙහිවූ; අඞ්ගම් අවයවය; යස්‍ය, යමෙකුගේද; අසෞ, මෙතෙම; අන්තරඞ්ගඃ, "අන්තරඞ්ග" නම් වේ. බහිරඞ්ගඃ, ("බහිරඞ්ගං යස්‍යාසෞ' යන වාක්‍යයෙහි) "බහිරඞ්ග" නම් වේ. (බහිඃ' පිටතවූ; අඞ්ගම් අවයවය, යස්‍ය යමෙකුගේද; අසෞ, මෙතෙම, බහිරඞ්ගඃ, "බහිරඞ්ග" නම් වේ යනු අර්ථයි.) උච්චෛර්මුඛඃ; ("උච්චෛර් මුඛං යස්‍යාසෞ" යන වාක්‍යයෙහි) 'උච්චෛර්මුඛ" නම් වේ (උච්චෛඃ, උස්ව; මුඛම්, මුඛය; යස්‍ය, යමෙකුගේද; අසෞ, මෙතෙම, උච්චෛර්මුඛඃ, උච්චෛර්මුඛ" නම් වේ යනු අර්ථයි).

සමස්‍යමානපදයන්ගෙන් අනෙකක්හුගේ අර්ථයක් අපෙක්‍ෂා කොට ඒ අන්‍යපදප්‍රධානත්වයෙන් කරණුලබන සමාසය බහුව්‍රීහි සමාස නම් වේ. ඒ අපෙක්‍ෂ්‍යමාණ අන්‍යපදාර්ථය වනාහි ද්විතීයා තෘතීයාදි විභක්තිවශයෙන් ගම්‍යමාන කර්මකර්ත්‍රාදි අර්ථසමූහය වේ මෙහි ඒ පිළිවෙළින් උදාහරණ නැතත් සිද්ධාන්තකෞමුදී බොහෝ ව්‍යාකරණයන්හි- "ප්‍රාප්තෝදකෝ ග්‍රාමඃ, ඌඪරථෝනඩ්වාන්, උපහෘතපශූ-රුද්‍රඃ, උද්ධෘතෞදනා ස්ථාලී, පීතාම්බරෝ-හරිඃ, වීරපුරුෂෝ ග්‍රාමඃ" යි දක්නාලැබේ. "ප්‍රාප්තමුදකං යං ග්‍රාමම්, ඌඪෝ රථෝ යේනානඩුහා, උපහෘතඃ පශූර්‍යස්මෛ රුද්‍රාය, උද්ධෘත ඕදනෝ යස්‍යාඃ ස්ථාල්‍යාඃ, පීතම්බරං යස්‍ය හරේඃ, වීරාඃ පුරුෂා යස්මින් ග්‍රාමේ" යනු මෙහි වාක්‍ය යෝජනායි. මෙහිකී "ග්‍රාමඃ, අනඩ්වාන්" යනාදීහු "ප්‍රාප්තං උදකම්, ඌඪඃ රථඃ" යනාදීන්ගේ අර්ථයන්ගෙන් අන්‍ය බැවින් අන්‍යපදාර්ථයෝයි. ඔවුහු කර්මකර්ත්‍රාද්‍යර්ථයන්හි කළබැවින් කර්මකර්ත්‍රාදි අර්ථයෝද වෙත් උක්තත්වයෙන් එහි ප්‍රථමාවිභක්තදෑවී තවද මේ සමාසයෙහි අපෙක්‍ෂමාණ අන්‍යපදාර්ථය යම් ලිඞ්ගඇත් තක්වේනම් සමස්‍යමානපදයද තල්ලිඞ්ගවේ. මේ සමාසය වනාහි තුල්‍යාධිකරණ භින්නාධිකරණ වශයෙන් දෙවැදෑරුම්වේ. එනම්

a ("තේන සහේති තුල්‍යයෝගේ"-සහ තේන තෘතීයාන්තේන සමස්‍යතේ ස තුල්‍යයෝගබහුව්‍රීහිඃ, "සහාදේඃ සාදිඃ" ඉති වක්‍ෂ්‍යමාණේන සකාරඃ, පුත්‍රේණ සහ වර්තමානඃ=සපුත්‍රඃ, "ශා වෙති" යෝගේන. සහපුත්‍රෝ වා ගතඃ, තුල්‍යයෝගාභාවෙ නං ප්‍රාසීසම්, කර්මණා සහවර්තමානඃ=සකර්මකඃ, සලොමකඃ)*

යම්තැනක සමස්‍යමානපදයන්ගේ එකවස්තු ප්‍රවෘත්තියෙන් හෝ එකාර්ථිත්වයෙන් එකවිභක්ත්‍යන්ත වේනම් ඒ තුල්‍යාධිකරණයි. "ප්‍රාප්තං උදකං" යනාදිය මෙනි. යම්තැනක සමස්‍යමාන පදයන්ගේ එකවස්තු ප්‍රවෘත්ත්‍යාද්‍යභාවයෙන් භින්න විභක්ත්‍යන්ත වේනම් ඒ භින්නාධිකරණයි. වක්‍ෂ්‍යමාණ "කරධනඃ" යනාදිය මෙනි. "ධනං කරේ යස්‍ය" යනු මෙහි වාක්‍යයෝජනායි. මෙහි එකවස්තුප්‍රවෘත්ත්‍යාද්‍යභාවයෙන් ප්‍රථමාසප්තමී වශයෙන් භින්න විභක්තිය බැවින් භින්නාධිකරණයි. මේ සමාසය ත්‍රිපදත්වයෙන්ද දක්නාලැබේ. එනම් "නීලමුත්පලං වපුර්යස්‍යාසෞ=නීලෝත්පලවපුඃ=කෘෂ්ණ" යනාදිවශයෙනි. ඇතම් තන්හි බහුපදත්වයෙන්ද දක්නාලැබේ. එනම් "ආරූඪා වෘද්ධා බහවෝ වානරා යං සඃ=ආරූඪවෘද්ධබහුවානරෝ=වෘක්‍ෂඃ" යනාදිවශයෙනි. මේ සමාසය පඨමාර්ථයෙහි නොවේයයි බොහෝ වෛයාකරණයන්ගේ මතයයි. සමහරු වක්‍ෂ්‍යමාණ "සපුත්‍රඃ" යනාදිය ප්‍රථමාර්ථයයි කියත්.

a තුල්‍යයෝගෙ, (ගමනාදීන්) තුල්‍යවූවක් (සමානවූවක් සමග යෝගයෙහි පවත්නාව; සහ ඉති, "සහ" යන අව්‍යය; තේන, ඒ (තෘතීයාන්තයක්) හා බහුව්‍රීහිසමාසය වේ.

සහ ඉති එනත්, "සහ" යන මේ අව්‍යය; තෘතීයාන්තේන, තෘතීයාන්තය සමග; සමස්‍යතෙ, සමාස කරණුලැබේද; සඃ, හෙතෙම්; තුල්‍යයෝගබහුව්‍රීහිඃ, තුල්‍යයෝගබහුව්‍රීහි නම් වේ. සහාදේඃ සාදිඃ ඉති, "සහාදේඃ සාදිඃ" කියා; වක්‍ෂ්‍යමාණේන, පසුව කියනුලබන්නාවූ සූත්‍රයෙන්; සකාරඃ, (සහ ශබ්දයට) සකාරය වේ. පුත්‍රේණ සහ, පුත්‍රයා සමග; වර්තමානඃ, පවත්නේ; සපුත්‍රඃ, "සපුත්‍ර" නම් වේ. සඃ, සකාරය; වා ඉති, විකල්පයයි. කෙවිත්, සමහරු කියත්. (එනම් -සහපුත්‍රෝ වා, "සහපුත්‍ර" කියා හෝ වේ. සහපුත්‍රඃ, පුත්‍රයා සහිතවූයේ; ආගතඃ, ආයේය;

* මේ පාණිනීයසූත්‍රවෘත්ත්‍යාදිය බොහෝ සාරස්වතයන්හි නොදක්නාලැබේ.

a "තස්‍ය ප්‍රධානස්‍යෛකදෙශො විශෙෂණතයා යත්‍ර ඥායතෙ ස තද්ගුණසංවිඥානො බහුව්‍රීහිඃ" ලම්බෞ කර්ණෞ යස්‍ය ස ලම්බකර්ණඃ.

b "බහුව්‍රීහෞ විශෙෂණසප්තම්‍යන්තයොඃ පූර්වනිපාතො වක්තව්‍යඃ" ධනං කරෙ යස්‍ය ස=කරධනඃ, මතිඃ කෘෂ්ණෙ යස්‍ය ස=කෘෂ්ණමතිඃ, බුද්ධිර්ධර්මෙ යස්‍ය ස=ධර්මබුද්ධිඃ, කණ්ඨෙ හාරො යස්‍ය ස=කණ්ඨහාරඃ කරෙ කඞ්කණං යස්‍ය ස=කරකඞ්කණඃ, භුවනෙ කීර්තිර්‍යස්‍යාසෞ=භුවනකීර්තිඃ.

තුල්‍යයොගෙ වා නම්, තුල්‍යයොග තන්හි යයි කීම; ප්‍රායිකනම්, බෙහෙවින් වේ ගෙවත් විකල්ප වේ. (එනම් - කර්මණා සහ, කර්මයෙන් විද්‍යමානව; වර්තමානඃ, පවත්නේ; සකර්මකඃ, "සකර්මක" නම් වේ. සලොමකඃ, ("ලොම්නා සහ වර්තමානඃ" යන වාක්‍යයෙහි) "සලොමක" නම්වේ. ලොම්නා සහ, ලොමයෙන් විද්‍යමානව; වර්තමානඃ, පවත්නේ; සලොමකඃ, "සලොමක" නම් වේ. (මෙහි "සහ" ශබ්දය තුල්‍යයොගාර්ථ නොව විද්‍යමානාර්ථවත්ම බහුව්‍රීහි සමාස වේ. විද්‍යමානවූ කර්මය ඇත්තේ, විද්‍යමානවූ ලොම් ඇත්තේ යන අර්ථයි. "සපුත්‍රඃ ආගතඃ" යන තන්හි "සපුත්‍රඃ" යන්නෙන් ගම්‍යමානවූ "පිතෘ" යන අන්‍යපදාර්ථයද "පුත්‍ර" ශබ්දයද එක ගමනක්‍රියායෙහි යුක්තබැවින් තුල්‍යයොගයි)

a තස්‍ය ප්‍රධානස්‍ය, ඒ ප්‍රධානපදයවූ "පුරුෂ" ශබ්දාදීහුගේ; එකදෙශඃ, (හස්තපාදාදි) එක් අවයවයක්; යත්‍ර, යම්සමාසයෙක්හි; විශෙෂණතයා, විශෙෂණභාවයෙන්; ඥායතෙ, දන්නාලැබේද (හැඟේද); සඃ, හෙතෙම; තද්ගුණසංවිඥානඃ, තද්ගුණසංවිඥාන නම් වූ; බහුව්‍රීහිඃ, බහුව්‍රීහි නම්වේ. (එසේ නොහැඟේනම් අතද්ගුණසංවිඥානයි.) ලම්බෞ, එල්බෙන්නාවූ; කර්ණෞ, කන්දෙක; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; ලම්බකර්ණඃ, "ලම්බකර්ණ" නම් වේ. මෙහි "ලම්බකර්ණ" යන සමස්තපදයන්ගෙන් ගම්‍යමාන ප්‍රධානපදයවූ පුරුෂසඞ්ඛ්‍යාත අන්‍යපදයාගේ කර්ණසඞ්ඛ්‍යාත එකදෙශයක් ලම්බමානගුණය කරණකොටගෙණ විශෙෂණභාවයෙන් හැඟෙනබැවින් තද්ගුණසංවිඥානයි. "අතික්‍රාන්තසාගරඃ, බහුධනඃ" යනාදියෙහි එසේ එකදෙශයක් වෙන්ව නොහැඟෙන බැවින් අතද්ගුණසංවිඥයි.)

b බහුව්‍රීහෞ, බහුව්‍රීහිසමාසයෙහි; විශෙෂණසප්තම්‍යන්තයොඃ, විශෙෂණසප්තම්‍යන්ත දෙදෙනාගේ; පූර්වනිපාතඃ, පූර්වයෙහි වැටීම,

a "ප්‍රහරණාර්ථෙභ්‍යඃ පරෙ නිෂ්ඨාසප්තම්‍යෞ" "ක්තක්තවතූ නිෂ්ඨා"-ක්තක්තවතූ ප්‍රත්‍යයෞ නිෂ්ඨාසංඥෞ ස්තඃ. චක්‍රං පාණෞ යස්‍ය ස=චක්‍රපාණිඃ, දණ්ඩං පාණෞ යස්‍ය ස-දණ්ඩපාණිඃ. අස්‍යුද්‍යතඃ-උද්‍යතාසිරිත්‍යපි භවති.

වක්තව්‍යඃ, කියයුතුයි. ධනම්, ධනය; කරෙ, අතෙහි; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; කරධනඃ, "කරධන" නම් වේ. කෘෂ්ණෙ, විෂ්ණුහු කෙරෙහි; මතිඃ, මතිය; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; කෘෂ්ණමතිඃ, "කෘෂ්ණමති" නම් වේ. ධර්මෙ, ධර්මය කෙරෙහි; බුද්ධිඃ, බුද්ධිය; යස්‍ය, යමෙකුගේ ද; සඃ, හෙතෙම; ධර්මබුද්ධිඃ, "ධර්මබුද්ධි" නම් වේ. කණ්ඨෙ, බොටුවෙහි; හාරඃ, මුතුහර; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; කණ්ඨහාරඃ, "කණ්ඨහාර" නම් වේ. කරෙ, අතෙහි; කඞ්කණම්, වලල්ල; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; කරකඞ්කණඃ, "කරකඞ්කණ" නම් වේ. භුවනෙ, ලොකයෙහි; කීර්තිඃ, කීර්තිය; යස්‍ය යමෙකුගේද; අසෞ, මෙතෙම; භුවනකීර්තිඃ, "භුවනකීර්ති" නම් වේ. (මේ උදාහරණයන්හි සප්තම්‍යන්තයාගේ පූර්වනිපාතයයි. "බහුධන, ලම්බකර්ණ" යනාදීයෙහි විශෙෂණපදයාගේ පූර්වනිපාතයයි.)

a ප්‍රහරණාර්ථෙභ්‍යඃ, (චක්‍රදණ්ඩාදි) ප්‍රහරණාර්ථවාචකශබ්දයන් කෙරෙන්; නිෂ්ඨාසප්තම්‍යෞ, නිෂ්ඨාප්‍රත්‍යයාන්ත සප්තම්‍යන්ත දෙක; පරෙ, පරව යෙදෙත්; ක්තක්තවතූ, "ක්තක්තවතූ" ප්‍රත්‍යය දෙක; නිෂ්ඨා, නිෂ්ඨා නම් වේ. ක්තක්තවතූ ප්‍රත්‍යයෞ, "ක්තක්තවතූ" ප්‍රත්‍යය දෙක; නිෂ්ඨාසංඥෞ ස්තඃ, නිෂ්ඨාසංඥා ඇත්තෝ වෙත්. චක්‍රං, චක්‍රායුධය; පාණෞ, අතෙහි; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; චක්‍රපාණිඃ, "චක්‍රපාණි" නම් වේ දණ්ඩම්, දණ්ඩ; පාණෞ, අතෙහි; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; දණ්ඩපාණිඃ, "දණ්ඩපාණි" නම් වේ. (මෙහි චක්‍රාදිප්‍රහරණාර්ථයන්කෙරෙන් සප්තම්‍යන්තයාගේ පරව යෙදීමයි.) අස්‍යුද්‍යතඃ, ("උද්‍යතොසිර්‍යෙන සඃ" යන වාක්‍යයෙහි, "අස්‍යුද්‍යතඃ" යනු වේ. (උද්‍යතඃ, උද්‍යොග කරණලද්දාවූ නොහොත් උස්කරණලද්දාවූ; අසිඃ, කඩුව; යෙන, යමෙකු විසින්ද; සඃ, හෙතෙම; අස්‍යුද්‍යතඃ, "අස්‍යුද්‍යත" නම් වේ. යනු අර්ථයි. මෙහි නිෂ්ඨාසංඥ "ක්ත" ප්‍රත්‍යයාන්තයාගේ පරව යෙදීමයි.) උද්‍යතාසිඃ ඉති අපි, "උද්‍යතාසිඃ" කියාද; භවති, වේ.

a "ප්‍රියස්‍ය වා," ප්‍රියගුඩඃ-ගුඩප්‍රියඃ "නෙන්ද්වාදිභ්‍යඃ" -ඉන්ද්වාදිභ්‍යඃ ශබ්දේභ්‍යඃ සප්තම්‍යන්තස්‍ය පූර්වනිපාතො න-ඉන්දුඃ ශෙඛරෙ යස්‍ය සඃ=ඉන්දුශෙඛරඃ, පද්මං නාභෞ යස්‍ය සඃ=පද්මනාභඃ, කපිධ්වජඃ.

b "ප්‍රජාමෙධයොරසුක්"- සුප්‍රජාඃ, දුර්මෙධාඃ. "ධර්මාදනිච් කෙවලාත්"-කෙවලාත් පූර්වපදතඃ පරො යො ධර්මශබ්දස්තදන්තාද් බහුව්‍රීහෙරනිච් ප්‍රත්‍යයඃ ස්‍යාත්. කල්‍යාණධර්මා, සුධර්මා. කෙවලාත් කිම්? පරමඃ ස්වො ධර්මො යස්‍ය සඃ=පරමස්වධර්මඃ.

---

a ප්‍රියස්‍ය, "ප්‍රිය" ශබ්දයාගේ පූර්වනිපාතය; වා, විකල්පයෙන් වේ. ප්‍රියගුඩඃ, ("ප්‍රියො ගුඩො යස්‍ය සඃ" යන වාක්‍යයෙහි) 'ප්‍රිය' යන විශෙෂණ ශබ්දය පූර්ව යෙදීමෙන් "ප්‍රියගුඩ" නම්ද; ගුඩප්‍රියඃ, විකල්පයෙන් පරව යෙදීමෙන් "ගුඩප්‍රිය" නම්ද වේ. ප්‍රියඃ ප්‍රියවූ; ගුඩඃ, උක්සකුරු; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; ප්‍රියගුඩඃ, "ප්‍රියගුඩ" නම්ද; ගුඩප්‍රියඃ, "ගුඩප්‍රිය" නම්ද වේ යනු අර්ථයි. ඉන්ද්වාදිභ්‍යඃ, "ඉන්දු" ශබ්දාදිය කෙරෙන්. න සප්තම්‍යන්තයාගේ පූර්වනිපාතය නොවේ-ඉන්ද්වාදිභ්‍යඃ ශබ්දේභ්‍යඃ, ඉන්දු ආදි ශබ්දයන් කෙරෙන්; සප්තම්‍යන්තස්‍ය, සප්තම්‍යන්තයාගේ; පූර්වනිපාතඃ, පූර්වයෙහි වැටීම; න, නොවේ. ඉන්දුඃ, චන්ද්‍රලෙඛාව; ශෙඛරෙ, ශිඛායෙහි; යස්‍ය, යමෙකුගේද; අසෞ, මේතෙම; ඉන්දුශෙඛරඃ, "ඉන්දුශෙඛර" නම් වේ. පද්මම්, පියුම; නාභෞ, නාභියෙහි; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; පද්මනාභඃ, "පද්මනාභ" නම්වේ. (මෙහි සමාසාන්තයෙහි අප්‍රත්‍යයයි.) කපිධ්වජඃ, ("කපිර්ධ්වජෙ යස්‍ය සඃ" යන වාක්‍යයෙහි) "කපිධ්වජ" නම් වේ. (ධ්වජෙ, ධ්වජයෙහි; කපිඃ, කපිරූපය; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; කපිධ්වජඃ, "කපිධ්වජ" නම් වේ යනු අර්ථයි. (මෙහි සප්තම්‍යන්තයාගේ පූර්වනිපාතය නොවීය.)

b ප්‍රජාමෙධයොඃ, (බහුව්‍රීහිසමාසාන්තයෙහි "නඤ්දුඃසු" යන මොවුන්කෙරෙන්පරවූ) "ප්‍රජා මෙධා," ශබ්දදෙකසම්බන්ධව; අසුක්, 'අසුක්" ප්‍රත්‍යය වේ. සුප්‍රජාඃ, ("සුෂ්ඨු ප්‍රජා යස්‍ය සඃ" යන වාක්‍යයෙහි) "සුප්‍රජස්" නම්ද; දුර්මේධාඃ, (දුෂ්ඨු මෙධා යස්‍ය සඃ' යන වාක්‍යයෙහි) "දුර්මේධස්" නම්ද වේ. (සුෂ්ඨු යහපත්වූ; ප්‍රජා ප්‍රජාතොමෝ; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; සුප්‍රජාඃ, "සුප්‍රජස්" නම් වේ. දුෂ්ඨු, නපුරුවූ; මෙධා, ප්‍රඥාව; යස්‍ය, යමෙකුගේද;සඃ,හෙ

a "ජායායා නිඞාදෙශො බහුව්‍රීහෞ වක්තව්‍යො යලොපශ්ච"-ලක්ෂ්මීජානිඃ. "උත්පූතිසුසුරභිභ්‍යො ගන්ධශබ්දස්‍යෙකාරාන්තාදෙශො බහුව්‍රීහෞ වක්තව්‍යඃ"-උද්ගන්ධිඃ පූතිගන්ධිඃ, සුගන්ධිඃ, සුරභිගන්ධිඃ.

තෙම; දුර්මේධාඃ, "දුර්මේධස්', නම් වේ යනු අර්ථයි. මෙහි "අසුක්" ප්‍රත්‍යයේ "උක්" යන කොටස ඉත්සංඥයි.) කෙවලාත්, හුදකලා පදයක්කෙරෙන් පරවූ; ධර්මාත්, "ධර්ම" ශබ්දයාකෙරෙන්; අනිච්, "අනිච්" ප්‍රත්‍යය වේ.-කෙවලාත්, හුදකලාවූ; පූර්වපදතඃ, පූර්වපදයක් කෙරෙන්; පරඃ, පරවූ; යා ධර්මශබ්දඃ, යම් "ධර්ම" ශබ්දයක් වේද; තදන්තාත්, ඒ ධර්මශබ්දය අන්තකොට ඇත්තාවූ; බහුව්‍රීහෙඃ, බහුව්‍රීහි සමාසයාකෙරෙන්; අනිච්ප්‍රත්‍යය ස්‍යාත්, "අනිච්" ප්‍රත්‍යය වන්නේය, කල්‍යාණධර්මා, ("කල්‍යාණො ධර්මො යස්‍ය සඃ" යන වාක්‍යයෙහි) "කල්‍යාණධර්මන්" නම්ද; සුධර්මා, "සුෂ්ඨු ධර්මො යස්‍ය සඃ" යන වාක්‍යයෙහි) "සුධර්මන්" නම්ද වේ. (කල්‍යාණඃ; ශුභයුක්තවූ; ධර්මඃ, ධර්මය; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම, කල්‍යාණධර්මා, "කල්‍යාණධර්මන්" නම් වේ. සුෂ්ඨු, යහපත්වූ; ධර්මඃ, ධර්මය; යස්‍ය, යමෙකුගේද; සඃ හෙතෙම; සුධර්මා, 'සුධර්මන්" නම් වේ යනු අර්ථයි.) කෙවලාත්, හුදකලා පදයක් කෙරෙන් පර ධර්මශබ්දයා කෙරෙන්ය යනු; කිම්, කිම ? පරමඃ, උතුම්වූ; ස්වඃ, ස්වකීයවූ; ධර්මඃ, ධර්මය; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; පරමස්වධර්මඃ; 'පරමස්වධර්ම" නම් වේ (යන මෙහි පදදෙකක් කෙරෙන් පර ධර්ම ශබ්දය බැවින් "අනිච්" නොවනහෙයිනි. "අනිච්" ප්‍රත්‍යයේ "ඉච්" යන කොටස ඉත්සංඥයි.)

a බහුව්‍රීහෞ, බහුව්‍රීහිසමාසයෙහි; ජායායාඃ 'ජායා" ශබ්දයාගේ අන්තයට; නිඞාදෙශඃ, නිඞ්ආදෙශයද; යලොපශ්ච, (ජායා ශබ්දයාගේ) යකාරලොපයද; වක්තව්‍යඃ, කියයුතුයි. ලක්ෂ්මීජානිඃ, ("ලක්ෂ්මීර්ජායා යස්‍ය සඃ" යන වාක්‍යයෙහි) "ලක්ෂ්මීජානිඃ" නම් වේ. ලක්ෂ්මීඃ, ශ්‍රීදෙවී තොමෝ; ජායා, පත්නී වූවා; යස්‍ය යමෙකුගේ ද; සඃ, හෙතෙම; ලක්ෂ්මීජානිඃ, 'ලක්ෂ්මීජානි" නම් වේ යනු අර්ථයි. ("නිඞ්" ආදෙශයාගේ ඉත්ඞකාරය අන්ත්‍යාදෙශාර්ථයි) බහුව්‍රීහෞ, බහුව්‍රීහිසමාසයෙහි; උත්පූතිසුසුරභිභ්‍යඃ, "උත්පූති සුසුරභි" යන මොවුන්කෙරෙන් පරවූ; ගන්ධශබ්දස්‍ය, ගන්ධශබ්දයට; ඉකාරාන්තාදෙශඃ, ඉකාරාන්තාදෙශය; වක්තව්‍යඃ, කියයුතුයි;

a "ආගන්තුකස්‍යෛකවචනාන්තස්‍ය වා"-සුගන්ධිඃ-ආපණඃ, සුගන්ධො වා, "අල්පාඛ්‍යායාං ච"-අල්පපර්‍ය්‍යායො ගන්ධශබ්දඃ, සූපො ගන්ධොලෙපො යස්මින් තත් සූපගන්ධි-භොජනම්. ඝෘතගන්ධි, චෙති කෙචිත්. සූපගන්ධම්, ඝෘතගන්ධම්, "උපමානාච්ච" පද්මස්‍යෙව ගන්ධො යස්‍යෙති= පද්මගන්ධිඃ, මතාන්තරෙ විකල්පඃ.

උද්ගන්ධිඃ, ("උද්ගතො ගන්ධො යස්‍ය සඃ" යනවාක්‍යයෙහි) "උද්ගන්ධි" නම් ද; පූතිගන්ධිඃ, ("පූතිගීන්ධො යස්‍ය සඃ" යන වාක්‍යයෙහි) "පූතිගන්ධි" නම්ද; සුගන්ධිඃ, ("සුෂ්ඨු ගන්ධො යස්‍ය සඃ" යන වාක්‍යයෙහි) "සුගන්ධි" නම්ද; සුරභිගන්ධිඃ, ("සුරභිගීන්ධො යස්‍ය සඃ" යන වාක්‍යයෙහි) "සුරභිගන්ධි" නම්ද වේ. උද්ගතඃ, උඩට නැගුනාවූ; ගන්ධඃ, ගන්ධයතෙම; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; උද්ගන්ධිඃ, "උද්ගන්ධි" නම්වේ. පූතිඃ, කුණුවූ; ගන්ධඃ, ගන්ධය; යස්‍ය, යමෙකුගේ ද; සඃ, හෙතෙම; පූතිගන්ධිඃ, "පූතිගන්ධි" නම්වේ. සුෂ්ඨු, යහපත්වූ; ගන්ධඃ, ගන්ධයතෙම; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; සුගන්ධිඃ, "සුගන්ධි" නම්වේ. සුරභිඃ, මනහරවූ; ගන්ධඃ, ගන්ධයතෙම, යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; සුරභිගන්ධිඃ, 'සුරභිගන්ධි" නම් වේ යනු අර්‍ථයි.

a ආගන්තුකස්‍ය, ආගන්තුකවූ; හෙවත් (අමුතුවෙන්) පැමිණෙපුලුවූ; එකවචනාන්තස්‍ය, එකවචනාන්තවූ ගන්ධශබ්දය සම්බන්ධව; වා, විකල්පයෙන් ඉකාරය වේ. සුගන්ධිඃ, යහපත් ගඳ ඇත්තාවූ; ආපණඃ, ආපණයයි; සුගන්ධඃ වා, විකල්පයෙන් "සුගන්ධ" නම්ද වේ. (මෙහි ආපණයෙහි ගන්ධය ආගන්තුක බැවින් විකල්පයෙන් ඉකාරය විය.). අල්පාඛ්‍යායාං ච, අල්පාර්‍ථකථනය ඇතිකල්හිද ගන්ධශබ්දාන්තයට ඉකාරය වේ. ගන්ධශබ්දඃ, ගන්ධශබ්දයතෙම; අල්පපර්‍ය්‍යායඃ, අල්පශබ්දය හා සමානාර්‍ථඇත්තේ වේ. ගන්ධඃ, ගන්ධයයි සේයි; අල්පඃ ස්වල්පවූ; සූපඃ, සූපයතෙම; යස්මින්, යම් භොජනයෙක්හිද; තත්, ඒ (භොජනය); සූපගන්ධි, 'සූපගන්ධි" නම් වේ. භොජනම්, භොජනයයි. ඝෘතගන්ධි, ("ඝෘතමල්පං ගන්ධො යස්මින් තද්" යන වාක්‍යයෙහි) "ඝෘතගන්ධි" නම් වේ. ගන්ධඃ, ගන්ධයයිසේයි. අල්පම්, ස්වල්පවූ; ඝෘතම්, ඝෘතය; යස්මින්, යම්තැනෙක්හිද; තත් එය; ඝෘතගන්ධි, "ඝෘතගන්ධි" නම් වේ යන අර්‍ථයි) වා ඉති, (මෙහි ඉකාරය) විකල්පයයි;

a "ඌධසොʼනඞ්"-ඌධොන්තස්‍ය බහුව්‍රීහෙරනඞාදෙශඃ ස්‍යාත්ස්ත්‍රියාම්. කුණ්ඩොධ්නී-ගෞඃ. පුංසි තු කුණ්ඩොධා ගොගණඃ.

b "ධනුෂශ්ච"-ශාර්ඞ්ගං ධනුර්‍යස්‍ය සඃ=ශාර්ඞ්ගධන්වා, "සංඥායාං වා"-ශතධන්වා-ශතධනුඃ.

කෙචිත්, සමහරු කියත්; 'සූපගන්ධම් ඝෘතගන්ධම්, (එකල්හි) "සූපගන්ධ ඝෘතගන්ධ" නම් වේ. (සිද්ධාන්තකෞමුදියෙහි "සූපස්‍ය ගන්ධො ලෙශො යස්මින් තත්-සූපගන්ධි"යි භින්නාධිකරණවශයෙන් මෙහි වාක්‍යයොජනාව කරණලදි.) උපමානාත් ච, උපමානපදයක් කෙරෙන් පරවූ "ගන්ධ" ශබ්දාන්තයටද ඉකාරය වේ. පද්මස්‍ය ඉව, පද්මයාගේ වැනිවූ; ගන්ධඃ, ගන්ධය තෙම්; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; පද්මගන්ධිඃ, "පද්මගන්ධි" නම් වේ. මතාන්තරෙ, මතභෙදයෙහි; විකල්පඃ, විකල්ප වේ.

a ඌධසඃ, ඌධස්ශබ්දාන්තබහුව්‍රීහිසමාසයට; අනඞ්, "අනඞ්" ආදෙශ වේ. ස්ත්‍රියාම්, ස්ත්‍රීපදාර්‍ථයක් වාච්‍යකල්හි; ඌධොන්තස්‍ය, "ඌධස්" ශබ්දය අන්තකොට ඇත්තාවූ; බහුව්‍රීහෙඃ, බහුව්‍රීහිසමාසාන්තයට; අනඞ් ආදෙශඃ ස්‍යාත්, "අනඞ්" ආදෙශය වන්නේය. කුණ්ඩොධ්නී, (කුණ්ඩමිවොධො යස්‍යාඃ සා" යන වාක්‍යයෙහි) "කුණ්ඩොධ්නී" නම් වේ. ගෞඃ ගොධෙනුවයි. (කුණ්ඩඃ ඉව, කලයක් වැනිවූ; ඌධඃ, කිරිබුරුල්ල; යස්‍යාඃ, යම්ධෙනුවකගේද; සා, ඕතොමෝ; කුණ්ඩොධ්නී, "කුණ්ඩොධ්නී" නම් වේ. යනු අර්‍ථයි. (මෙහි "කුණ්ඩ" ශබ්දය උපමානයි, ඔහු කෙරෙන් පර "ඌධස්" ශබ්දයාගේ සකාරයට "අනඞ්" වීමෙන් "කුණ්ඩොධන්" යනු වේ, ඉන්පරව ස්ත්‍රීඅර්‍ථයෙහි "ඞීප්" ප්‍රත්‍යය හා උපධාලොපයද වූ කල්හි "කුණ්ඩොධ්නී"යි සිද්ධයි). පුංසි තු, පුංලිඞ්ගයෙහි වනාහි; කුණ්ඩොධා, "කුණ්ඩොධස්" නම් වේ. ගොගණඃ, ගොගණයයි ("කුණ්ඩා ඉවොධසො යස්‍ය සඃ" යනු එහි වාක්‍යයොජනායි).

b ධනුශ්ච, "ධනුස්" ශබ්දයාගේ අන්තයටද "අනඞ්" ආදෙශ වේ. ශාර්ඞ්ගම්, ශෘඞ්ගජනවූ; ධනුඃ, දුන්න; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; ශාර්ඞ්ගධන්වා, "ශාර්ඞ්ගධන්වන්" නම් වේ. (මෙහි බහුව්‍රීහිසමාස බැවින් "ධනුස්" ශබ්දයාගේ සකාරයට "අනඞ්" ආදෙශයි). සංඥායාම්, සංඥාවාචක කල්හි; වා, ("අනඞ්" ආදෙශය)

280. පුංවචා. (පුංවත් 1, 1; මං 1, 1,)

a **සමාසෙ සති සමානාධිකරණෙ පූර්‍වස්‍ය ස්ත්‍රීලිඞ්ගස්‍ය පුංවචා භවති. වාග්‍රහණාත් කල්‍යාණීප්‍රිය ඉත්‍යාදෞ නභවති. පුංවද්භාවාදීබාපොර්නිවෘත්තිඃ.**

281. අන්‍යාතෙඹ් (අන්‍යාතෙඹ් 7, 1;)

b **ස්ත්‍රීලිඞ්ගස්‍යාන්‍යාතෙඹ් වර්තමානස්‍ය හ්‍රස්වො භවති, රූපවද්භාර්‍යඃ.**

විකල්පයි. ශතධන්වා, ("ශතං ධනූංෂි යස්‍ය සඃ" යන වාක්‍යයෙහි අනඞ් ආදෙශ වීමෙන්) "ශතධන්වන්" නම්ද; ශතධනුඃ, විකල්පයෙන් "ශතධනුස්" නම්ද වේ.

280 මං ව්‍යවස්ථිතවිභාෂාවශයෙන්; පුංවත්, (සමානාධිකරණ උක්තපුංසකස්ත්‍රීලිඞ්ගයාගේ රූපය) පුංලිඞ්ග මෙන් වේ.

a සමානාධිකරණෙ, තුල්‍යාධිකරණවූ; සමාසෙ සති, සමාසය ඇතිකල්හි; පූර්වස්‍ය, පූර්වවූ; ස්ත්‍රීලිඞ්ගස්‍ය, (උක්තපුංසක) ස්ත්‍රීලිඞ්ග ශබ්දයාගේ රූපය; වා, ව්‍යවස්ථිතවිභාෂාවශයෙන්; පුංවත් භවති, පුංලිඞ්ග මෙන් වේ. වාග්‍රහණාත්, වාශබ්දග්‍රහණයෙන්; කල්‍යාණීප්‍රිය ඉත්‍යාදෞ, "කල්‍යාණීප්‍රියඃ" යනාදියෙහි; නභවති, පුංවත් නොවේ. පුංවද්භාවාත්, පුංවත් වීමෙන්; ඊබාපොඃ, "ඊප් ආප්" ප්‍රත්‍යය දෙදෙනාගේ; නිවෘත්තිඃ, නැවැත්ම වේ.

281 අන්‍යාතෙඹ්, අන්‍යාර්ථයෙහි පවත්නාවූ ස්ත්‍රීලිඞ්ගශබ්දයට හ්‍රස්ව වේ.

b අන්‍යාතෙඹ්, අන්‍යාර්ථයෙහි; (ගෞණත්වයෙහි); වර්තමානස්‍ය, පවත්නාවූ; ස්ත්‍රීලිඞ්ගස්‍ය, ස්ත්‍රීලිඞ්ගශබ්දයට; හ්‍රස්වඃ භවති හ්‍රස්ව වේ. රූපවද්භාර්‍යඃ, ("රූපවතී භාර්‍යා යස්‍ය සඃ" යන වාක්‍යයෙහි "රූපවද්භාර්‍ය" නම් වේ. (රූපවතී, විශිෂ්ටරූප ඇත්තාවූ හෙවත් සෞන්දර්‍යයුක්තවූ; භාර්‍යා, භාර්‍යා තොමෝ; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; රූපවද්භාර්‍යඃ "රූපවද්භාර්‍ය" නම් වේ යනු අර්ථයි.)

පුංස්ත්‍රීලිඞ්ගවශයෙහි එකාර්ථත්වයෙන් පවත්නා යම්ශබ්දයක් ක්‍රිත්‍යස්ත්‍රීලිඞ්ගශබ්දයක් හා තුල්‍යාධිකරණවිශෙෂණස්ත්‍රීලිඞ්ගතවූ

"යඞ්මානින්තත්වශස්තරශ්දෞ චාරූපෙ"-එතිවාචරතීති= එතායතෙ, (පතත්‍යාදිත්වාන්නෙනා න) පණ්ඩිතමානිනී, පටව්‍යාභාවඃ පටුතා, පටුත්වම්, අලපාහෙත්‍යාදෙශීති=අලපශඃ, පටුතරා' පටුතමා, පටුකලපා, පටුදෙශ්‍යා, පටුදෙශීයා, අරූපෙ කිම්? ශුභ්‍රාරූප්‍යා.

යෙන් පූර්ව යෙදී සමාසවූකල්හි ඒ පූර්වපදය සමානාධිකරණ සමාස විෂයෙහි ව්‍යවස්ථිතවිභාෂාවශයෙන් පුංවත්වන බව "පුංවචා" යන සූත්‍රයෙන් ප්‍රකාශිතයි. ව්‍යවස්ථිතවිභාෂාවශයෙන් යයි කීහෙයින් වක්ෂ්‍යමාණ "කල්‍යාණීප්‍රියඃ" යනාදියෙහි නොවේ. පුංවත්වූ කල්හි ස්ත්‍රීත්වයෙහි යෙදෙන "ආප් ඊප්" ප්‍රත්‍යයන්ගේ වැලැක්ම වේ. මෙහි කී උක්තපුංසකලක්ෂණ 172 173 වෙනි පිටුවල ප්‍රකාශිතයි. තවද "අන්‍යාතෙඹ්" යන සූත්‍රයෙන් කියන ලද්දේ අන්‍යාර්ථ සමාසයෙහි පරපදය ස්ත්‍රීප්‍රත්‍යයාන්තයක් වුවොත් ඒ ස්ත්‍රීප්‍රත්‍යය හ්‍රස්වවන බවයි. ඒ අන්‍යපදය පුංලිඞ්ගයක් හෝ නපුංසකලිඞ්ගයක් වුවොත් පමණයි. (මේ හ්‍රස්වත්වය බොහෝ වෛයාකරණයන්ට අභිමත නොවේ. කුමක්හෙයින්ද යත්? අන්‍යාර්ථසමාසය අන්‍යාර්ථප්‍රධානත්වයෙන් අන්‍යපදයෙහි ලිඞ්ග ලැබීමෙන්ම ඒ සිද්ධවන බැවිනි). "රූපවද්භාර්‍යඃ" යන තන්හි වාක්‍යයෙහි 'භාර්‍යා' යන නිත්‍යස්ත්‍රීලිඞ්ගය හා තුල්‍යාධිකරණවිශෙෂණත්වයෙන් ස්ත්‍රීලිඞ්ගය ලබා "රූපවතී" යි සිටි රූපය පුංවත්වීමෙන් "රූපවත්" කියාද, පරපදයවූ "භාර්‍යා" ශබ්දයෙහි "ආප්" ප්‍රත්‍යය හ්‍රස්වව "භාර්‍ය" කියාද වීමෙන් පසුව නාමත්වාදිය සැලකල්හි "රූපවද්භාර්‍යඃ" යනු වේ. සෙසුතන්හිද මෙසේයි.

a යඞ්මානින්තත්වශස්තරශ්දෞ ච - යඞ්, "යඞ්" ප්‍රත්‍යය; මානින්, "මානින්" ශබ්දය; ත, "තා" ප්‍රත්‍යය; ත්ව, "ත්ව" ප්‍රත්‍යය; ශස්, "ශස්" ප්‍රත්‍යය, තරාදෞ ච, තරප්‍රත්‍යයාදිය යන මේ පරකල්හිද; (උක්තපුංසකස්ත්‍රීලිඞ්ග ශබ්දය පුංවත් වේ). අරූපෙ, රූප්‍යප්‍රත්‍යය පරකල්හි නොවේ. එනීඉව' කර්බුර වර්ණ ඇත්තියක් මෙන්; ආචරතීති, හැසිරේනුයි; එතායතෙ, "එතායතෙ" යනු වේ. පතත්‍යාදිත්වාත්, "පතති" ශබ්දාදිය බැවින්වූ; නඃ, නකාරය; න, නොවේ. (මෙහි "යඞ්" ප්‍රත්‍යය පරනිමිත්තෙන් පුංවද්භාවයයි, මෙහි "එත" ශබ්දයකොරෙන් ඊප් ප්‍රත්‍යයවූකල්හි "පත්නී" ආදියට ඇතුලත් බැවින් නිපාතනයෙන්

තකාරයාට වූ නකාරයාගේද නැවැත්මවිය, ඒ ඊට නිමිතිවූ ඊප් ප්‍රත්‍යය පුංවද්භාවයෙන් නැවතුනබැවිනි. පණ්ඩිතමානිනී, ("ආත්මානං පණ්ඩිතාං මන්‍යතෙ යා සා" යන වාක්‍යයෙහි "පණ්ඩිතමානිනී" නම් වේ. (යා, යම් ස්ත්‍රියක්තොමෝ; ආත්මානං, තමා; පණ්ඩිතාං, පණ්ඩිතවූවක (කොට); මන්‍යතෙ, සිතාද, සා, ඕතොමෝ; පණ්ඩිතාං, පණ්ඩිතවූවක (කොට); "පණ්ඩිතමානිනී" නම්වේ යනු අර්ථයි. (මෙහි පණ්ඩිතමානිනී, "මානින්" ශබ්දය පර නිමිත්තෙන් පුංවද්භාවයයි). පටුත්වං, දක්ෂ ස්ත්‍රියගේ; භාවඃ, ස්වභාවය; පටුතා, "පටුතා" නම්ද; පටුත්වම්, "පටුත්ව" නම්ද වේ. (මෙහි "තා, ත්ව" ප්‍රත්‍යයන් පරනිමිත්තෙන් පුංවද්භාවයයි). අල්පාභ්‍යඃ, (ස්ත්‍රීන්) ස්වල්පදෙනෙකුන්ට, දෙහිනි, දෙව යන අර්ථයෙහි; අල්පශඃ, "අල්පශඃ" යනුවේ. (මෙහි "ශස්" ප්‍රත්‍යය පරනිමිත්තෙන් පුංවද්භාවයයි) පටුතරා, ('ඉයමනයොරතිශයෙන පටුවී" යන වාක්‍යයෙහි 'පටුතරා" නම් වේ. (ඉයං, මෝතොමෝ, අනයොඃ, මොවුන්දෙදෙනාඅතුරෙන්, අතිශයෙන, අතිශයින්; පටුවී, දක්ෂවූවා, පටුතරා, "පටුතරා" නම්වේ යනු අර්ථයි). පටුතමා, ("ඉයමාසාමතිශයෙන පටවී" යන වාක්‍යයෙහි) 'පටුතමා" යනු වේ. (ඉයං, මෝතොමෝ, ආසාම්, මොවුන් අතුරෙන්; අතිශයෙන, අතිශයින්; පටවී, දක්ෂවූවා; පටුතමා "පටුතමා" නම්වේ යනු අර්ථයි) පටුකල්පා පටුදෙශ්‍යා පටුදෙශීයා; ("ඊෂදූනා පටුවී" යන වාක්‍යයෙහි) "පටුකල්පා" යනුද, පටුදෙශ්‍ය" යනුද, "පටුදෙශීයා" යනුද වේ. (ඊෂත් ඌනා, මදක් ඌනවූ; පටුවී, දක්ෂස්ත්‍රීතොමෝ; පටුකල්පා, "පටුකල්පා"නම්ද; පටුදෙශ්‍යා, "පටුදෙශ්‍යා" නම්ද; පටුදෙශීයා, "පටුදෙශීයා" නම්ද වේ යනු අර්ථයි). මෙහි "තර, තම, කල්ප, දෙශ්‍ය, දෙශීය"ප්‍රත්‍යයන් පරනිමිතෙතන් පුංවත්භාවයයි). අරූප්‍ය, "රූප්‍ය" ප්‍රත්‍යය පරකල්හි නොවේ යනු; කිම්, කිම?; ශුභ්‍රාරූප්‍යා, „ශුභ්‍රාරූප්‍යා,, යන තන්හි පුංවද්භාවය නොවනහෙයිනි. ("ශුභ්‍රායා භූතපූර්වෝ ගෞඃ "ශුභ්‍රාරූප්‍යඃ'- ශුභ්‍රායාඃ, ශුභ්‍රවර්ණිතැනැත්තියගේ, භූතපූර්වඃ, පෙර වූ, ගෞඃ, ගෙරිතෙම; ශුභ්‍රාරූප්‍යඃ, "ශුභ්‍රාරූප්‍ය" නම් වේ යනු වාක්‍යය හා අර්ථයි) මෙහි කී තරාදීන් ප්‍රකාශකරන්නාවූ වෛයාකරණයෝ:-

'තරස්තමශ්ච රූපශ්ච චතරං චතමං තථා,
ඉෂ්ඨයස්සු ඉමන් කල්පෞ දෙශ්‍යො දෙශීය ඉත්‍යපි;
චහුඃ පාශශ්චරෙ රූප්‍යශ්චශස්-වෛතෙ තරාදයඃ" ඉති

a "ප්‍රියාදෞ න"-"ප්‍රියා භක්තිඃ මනොඥා සුභගා දුර්භගා ක්ෂාන්තා කල්‍යාණී චපලා වාමනා සචිවා සමා වාමා කාන්තා බාලා තනයා දුහිතා ස්වසා" ඉති ප්‍රියාදයඃ, එෂු පරෙෂු භාෂිතපුංස්කස්‍ය ස්ත්‍රීප්‍රත්‍යයාන්තස්‍ය න පුංවත්.

b "ඌප්‍රත්‍යයාන්තස්‍ය ච න පුංවත්"- වාමොරූභාර්‍යඃ, "අභාෂිතපුංස්කස්‍ය ච න පුංවත්"-ගඞ්ගාභාර්‍යඃ, "කොපධපූරණීසංඥානාං ච න පුංවත්"-පාචකීභාර්‍යඃ, පඤ්චමීභාර්‍යඃ දත්තාභාර්‍යඃ.

කිනු. "අතිශයෙන ශුභ්‍රා=ශුභ්‍රරූපා, අනයොරතිශයෙන කා= කිතතරාම්, ආසාමතිශයෙන කා=කිතතමාම්, අතිශයෙන ලඝ්වී= ලඝිෂ්ඨා, ලඝීයසී, ලඝව්‍යා භාවො=ලඝිමා, ඊෂදූනා ශුභ්‍රා=චහු ශුභ්‍රා" කුත්සිතා ශුභ්‍රා=ශුභ්‍රපාශා, භූතපූර්වා ශුභ්‍රා= ශුභ්‍රචරී" යනු මෙහි නොකී උදාහරණයි. මෙහි "චහුශුභ්‍රා" යන තන්හි "චහු" ප්‍රත්‍යය පරනුවූ බැවින් පුංවත් නො වේ.

a ප්‍රියාදෞ, "ප්‍රියා" ශබ්දාදිය පරකල්හි; න, පූර්වයට පුංවත් නොවේ. ප්‍රියා—ස්වසා ඉති, "ප්‍රියා භක්ති මනොඥා ශුභගා දුර්භගා ක්ෂාන්තා කල්‍යාණී චපලා වාමනා සචිවා . සමා වාමා කාන්තා බාලා තනයා දුහිතෘ ස්වසෘ" යන මොහු; ප්‍රියාදයඃ, 'ප්‍රියා" ශබ්දාදීහු වෙත්. එෂු පරෙෂු, මොවුන් පරකල්හි; භාෂිතපුංස්කස්‍ය, භාෂිතපුංස්කාවූ; ස්ත්‍රීප්‍රත්‍යයාන්තස්‍ය, ස්ත්‍රීප්‍රත්‍යයාන්තයට; න, පුංවත් නොවේ.

b ඌප්‍රත්‍යයාන්තස්‍ය ච, ඌප්‍රත්‍යයාන්තයටද; නපුංවත්, පුංවත් නොවේ. වාමොරූභාර්‍යඃ, "වාමොරූභාර්‍යඃ" යනු ඊට උදාහරණයි. ('වාමොරූර්භාර්‍යා යස්‍ය සඃ" යන වාක්‍යයෙහි; වාමොරූභාර්‍යඃ, "වාමොරූභාර්‍ය" නම් වේ. වාමොරූඃ, මනොඥ ඌරූ යුගමයක් ඇත්තාවූ; භාර්‍යා, භාර්‍යාතොමෝ; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; වාමොරූභාර්‍යඃ, "වාමොරූභාර්‍ය" නම්වේ. යනු අර්ථයි, මෙහි ඌප්‍රත්‍යයබැවින් පුංවත්නොවීය.) අභාෂිතපුංස්කස්‍ය ච, උක්තපුංස්කනොවන්නාවූ ස්ත්‍රීප්‍රත්‍යයාන්තයටද, නපුංවත්, පුංවත් නොවේ. ගඞ්ගාභාර්‍යඃ, "ගඞ්ගාභාර්‍යඃ" යනු ඊට උදාහරණයි. ("ගඞ්ගා භාර්‍යා යස්‍ය ස ගඞ්ගාභාර්‍යඃ"-ගඞ්ගා, ගඞ්ගාතොමෝ; භාර්‍යා, භාර්‍යාවූවා; යස්‍ය, යමෙකුටද; සඃ, හෙතෙම, ගඞ්ගාභාර්‍යඃ, ගඞ්ගාභාර්‍ය" නම් වේ.) කොපධපූරණී

a **"ජාතිවාචකාත්ස්වාඞ්ගවාචකාද්‍ය ඊප් තදන්තස්‍ය න පුංවද්මානිනි"-බ්‍රාහ්මණීභාර්‍ය්‍යඃ, සුකෙශීභාර්‍ය්‍යඃ අමානිනීති කිම්? බ්‍රාහ්මණමානිනී.**

සංඥතාං ච,-කොපධ (තද්ධිත කයන්තකින් හෝ "අක" ප්‍රත්‍යය කයන්තෙන්) කකාරය උපධාසංඥකොට ඇත්තය; පූරණී, (තිථ්‍යාදි) පූරණීප්‍රත්‍යයාන්තය; සංඥතාං ච, සංඥවාචකශබ්දය යන මොවුන්ටද; නපුංවත්, පුංවත් නොවේ. පාචිකාභාර්‍ය්‍යඃ, ("පාචිකා භාර්‍ය්‍යා යස්‍ය සඃ" යන වාක්‍යයෙහි) "පාචිකාභාර්‍ය්‍යඃ" නම් වේ. පාචිකා, පිසන්නාවූ; භාර්‍ය්‍යා, භාර්‍ය්‍යාතොමෝ; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; පාචිකාභාර්‍ය්‍යඃ, "පාචිකාභාර්‍ය්‍යඃ" නම් වේ යනු අර්ථයි) පඤ්චමීභාර්‍ය්‍යඃ, (පඤ්චමී භාර්‍ය්‍යා යස්‍ය සඃ" යන වාක්‍යයෙහි "පඤ්චමීභාර්‍ය්‍යඃ" නම් වේ. පඤ්චමී, පස්වෙනිවූ ස්ත්‍රීතොමෝ; භාර්‍ය්‍යා භාර්‍ය්‍යාවූවා; යස්‍ය, යමෙකුටද; සඃ, හෙතෙම; පඤ්චමීභාර්‍ය්‍යඃ, "පඤ්චමීභාර්‍ය්‍යඃ" නම් වේ. යනු අර්ථයි.) දත්තාභාර්‍ය්‍යඃ, ("දත්තා භාර්‍ය්‍යා යස්‍ය සඃ" යන වාක්‍යයෙහි "දත්තාභාර්‍ය්‍යඃ" නම් වේ; දත්තා, දත්තා නම් ස්ත්‍රීතොමෝ; භාර්‍ය්‍යා, භාර්‍ය්‍යාවූවා; යස්‍ය, යමෙකුටද; සඃ, හෙතෙම; දත්තාභාර්‍ය්‍යඃ, "දත්තාභාර්‍ය්‍යඃ" නම් වේ යනු අර්ථයි. මෙහි "පාචකී" යන්න කකාරය උපධාකොට ඇති බැවින්ද, "පඤ්චමී" යන්න පූරණීප්‍රත්‍යයාන්තබැවින්ද, "දත්තා" යන්න සංඥවාචකබැවින්ද පුංවත් නොවිය.)

a ජාතිවාචකාත්, ජාතිවාචකශබ්දයාකෙරෙන්ද; ස්වාඞ්ගවාචකාත්, ස්වාඞ්ගවාචකශබ්දයාකෙරෙන්ද; යඃ ඊප්, යම් ඊප්ප්‍රත්‍යයක් වේද; අමානිනි, "මානින්" ශබ්දය වර්ජිතයා පරකල්හි; තදන්තස්‍ය, ඒ අන්තකොට ඇත්තහුට; නපුංවත්. පුංවත්නොවේ. බ්‍රාහ්මණීභාර්‍ය්‍යඃ, (බ්‍රාහ්මණී භාර්‍ය්‍යා යස්‍ය සඃ" යන වාක්‍යයෙහි) "බ්‍රාහ්මණීභාර්‍ය්‍යඃ" නම්වේ. බ්‍රාහ්මණී, බැමිණීතොමෝ; භාර්‍ය්‍යා, භාර්‍ය්‍යාවූවා; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; බ්‍රාහ්මණීභාර්‍ය්‍යඃ, ."බ්‍රාහ්මණීභාර්‍ය්‍යඃ" නම් වේ යනු අර්ථයි.) සුකෙශීභාර්‍ය්‍යඃ, ("සුකෙශීභාර්‍ය්‍යා යස්‍ය සඃ" යන වාක්‍යයෙහි "සුකෙශීභාර්‍ය්‍යඃ" නම්වේ. සුකෙශී, යහපත්කෙස්ඇත්තී; භාර්‍ය්‍යා, භාර්‍ය්‍යාවූවා; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; සුකෙශීභාර්‍ය්‍යඃ, "සුකෙශීභාර්‍ය්‍යඃ" නම් වේ යනු අර්ථයි මෙහි "බ්‍රාහ්මණී" යනු ජාතිවාචකබැවින්ද, "සුකෙශී" යනු ස්වාඞ්ග

a **"යුට්වර්ජිතරකතවිකාරාණ්වර්ජිතතද්ධිතාන්තස්‍ය න පුංවත්"-මෛථිලීජායඃ. යුට්වර්ජිතරකතවිකාරාණ්වර්ජිතස්‍යෙති කිම්? වෛයාකරණභාර්‍ය්‍යඃ, කාෂායකන්ථඃ, හෛමමුද්‍රිකඃ. වාග්‍රහණාදියං විවක්ෂා.**

වාචකබැවින්ද පුංවත් නොවිය. අමානිනීති, මානින් ශබ්දවර්ජිතයා පරකල්හිය යනු; කිම්, කිම?; බ්‍රාහ්මණමානිනී, ("ආත්මානං බ්‍රාහ්මණීං මන්‍යතෙ යා සා" යන වාක්‍යයෙහිවූ "බ්‍රාහ්මණමානිනී" යන තන්හි පුංවත් වන බැවිනි-යා, යම් ස්ත්‍රියක් තොමෝ; ආත්මානං, තමා; බ්‍රාහ්මණීං, බැමිණියක් කොට); මන්‍යතෙ සිතාද; සා, ඕතොමෝ; බ්‍රාහ්මණමානිනී, "බ්‍රාහ්මණමානිනී" නම් වේ යනු අර්ථයි.)

b යුට්වර්ජිත, "ඉට්, උට්" ආගමවශයෙන් තොරකරණලද්දාවූද; රකතවිකාරාණ්වර්ජිත, රකත, අණ්විකාරාණ් දෙකෙන් තොරකරණලද්දාවූද; තද්ධිතාන්තස්‍ය, (වෘද්ධියට හෙතුවූ) තද්ධිතාන්තයට, නපුංවත්, පුංවත්නොවේ. මෛථිලීජායඃ, ("මෛථිලී ජායා යස්‍ය සඃ" යන වාක්‍යයෙහි "මෛථිලීජායඃ" නම් වේ-මෛථිලී, මිථිලායෙහිවූ, ජායා, භාර්‍ය්‍යාතොමෝ; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; මෛථිලීජායඃ, "මෛථිලීජායඃ" නම් වේ යනු අර්ථයි, (මෙහි "මෛථිලී" යන්න වෘද්ධියට හෙතුවූ භාවාණ් තද්ධිත "අණ්" ප්‍රත්‍යයෙන් නිපන් බැවින් පුංවත් නොවේ) යුට්වර්ජිතරකතවිකාරාණ් වර්ජිතස්‍ය ඉති, "ඉට්, උට්" වර්ජිතවූ හෝ රකතවිකාරාණ්වර්ජිත තද්ධිතාන්තයට යනු; කිම්, කිම?; වෛයාකරණභාර්‍ය්‍යඃ කාෂායකන්ථඃ හෛමමුද්‍රිකඃ, වෛයාකරණභාර්‍ය්‍යඃ, කාෂායකන්ථඃ, හෛමමුද්‍රිකඃ" යන තන්හි පුංවත් වනබැවිනි. (වෛයාකරණී භාර්‍ය්‍යා යස්‍ය සඃ= වෛයාකරණභාර්‍ය්‍යඃ"-වෛයාකරණී, ව්‍යාකරණ දන්නාවූ; භාර්‍ය්‍යා, භාර්‍ය්‍යාතොමෝ; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; වෛයාකරණභාර්‍ය්‍යඃ, "වෛයාකරණභාර්‍ය්‍යඃ" නම් වේ. "කාෂායී කන්ථා යස්‍ය සඃ=කාෂායකන්ථඃ'-කාෂායී, කාෂායවර්ණයෙන් රඳන ලද්දාවූ; කන්ථා, මහතලද දිරූ වත්කඩ; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; කාෂායකන්ථඃ, 'කාෂායකන්ථඃ" නම් වේ. "හෛමී මුද්‍රිකා යස්‍ය ස-හෛමමුද්‍රිකඃ' හෛමී, ස්වර්ණවිකාරයක්වූ හෙවත් ස්වර්ණයෙන් කරණලද්දාවූ; මුද්‍රිකා, මුද්ද; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; හෛමමුද්‍රිකඃ "හෛමමුද්‍රිකඃ" නම් වේ. වාග්‍රහණාත්, ("පුංවද්වා") යන සූත්‍රයෙහි වාග්‍රහණයෙන්; ඉයං, මේතොමෝ; විවක්ෂා, කියනුකැමැත්තයි.

282. ගෝඃ (ගෝඃ 6,1;)

a ගෝශබ්දස්‍යාන්‍යාර්ථෙ වර්තමානස්‍ය හ්‍රස්වෝ භවති. පඤ්චගාවෝ යස්‍යාසෞ=පඤ්චගුඃ.

b "සඞ්ඛ්‍යාසුව්‍යාඝ්‍රාදිපූර්වස්‍ය පාදශබ්දස්‍යාකාරස්‍ය ලොපඃ" සහස්‍රං පාදා යස්‍යාසෞ=සහස්‍රපාත්, ශෝභනෞ පාදෞ යස්‍ය සෝ=සුපාත්, ව්‍යාඝ්‍රස්‍ය පාදාවිව පාදෞ යස්‍යාසෞ=ව්‍යාඝ්‍රපාත්, "පාදඃ පත්" ද්විපදඃ, ද්විපදා, ද්විපදී, ත්‍රිපදී. "නද්‍යාදිභ්‍යාඊප්".

මෙහි කියනලද්දේ වෘද්ධියට හේතුවූ තද්ධිතාන්තයට පුංවත් නොවන බව හා එහෙත් 'ඉට්, උට්" ආගම සහිත තත්හිද රක්තාර්ථ විකාරාර්ථතත්හිද පුංවත් වන බවයි "වෛයාකරණී" යන්න ඉට් සහිත බැවින්ද; 'කාෂායී" යන්න රක්තාර්ථ බැවින්ද 'හෛමී" යන්න විකාරාර්ථ බැවින්ද පුංවත්විය.

282 ගෝඃ, (අන්‍යාර්ථයෙහි පවත්නා) "ගෝ" ශබ්දාන්තයට හ්‍රස්ව වේ.

a අන්‍යාර්ථෙ වර්තමානස්‍ය, අන්‍යාර්ථයෙහි පවත්නාවූ; ගෝ ශබ්දස්‍ය, ගෝශබ්දයට; හ්‍රස්වඃ භවති, හ්‍රස්ව වේ. පඤ්ච ගාවඃ, ගෙරිනු පස්දෙනෙක්; යස්‍ය, යමෙකුගේද; අසෞ, මෙතෙම; පඤ්චගුඃ, "පඤ්චගු" නම් වේ. (මෙහි අන්‍යාර්ථසමාස සබැවින් ගෝ ශබ්දාන්ත ඔකාරයට හ්‍රස්වත්වයෙන් උපකාරවිය).

b සඞ්ඛ්‍යාසුව්‍යාඝ්‍රාදිපූර්වස්‍ය,-සඞ්ඛ්‍යා, සඞ්ඛ්‍යාවාචකශබ්දය, සු, සු උපසර්ගය; ව්‍යාඝ්‍රාදි, ව්‍යාඝ්‍රශබ්දාදිය යන මොවුන්; පූර්වස්‍ය, පූර්ව කොට ඇත්තාවූ; පාදශබ්දස්‍ය, "පාද"ශබ්දයාගේ; අකාරස්‍ය, අකාරයට; ලොපඃ, ලොප් වේ. සහස්‍රං පාදාඃ, පා දහසක්, යස්‍ය, යමෙකුගේද; අසෞ, මෙතෙම; සහස්‍රපාත්, "සහස්‍රපාත්" නම් වේ ශෝභනෞ, සොබනාවූ; පාදෞ' පාදෙක; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; සුපාත් "සුපාත්" නම් වේ. ව්‍යාඝ්‍රස්‍ය ඉව, ව්‍යාඝ්‍රයෙකුගේ වැනිවූ; පාදෞ, පා දෙක; යස්‍ය, යමෙකුගේද; අසෞ, මේතෙම; ව්‍යාඝ්‍රපාත්, "ව්‍යාඝ්‍රපාත්" නම් වේ. පාදඃ පත්, "පාදඃ පත්" යන සූත්‍රයෙන් "පාත්" ශබ්දයට (ශස්ආදි ස්වරයා පරකල්හි) "පත්" ආදෙශවේ 'ද්විපදඃ" යනු. ද්විතීයා බහුවචනයි; "ද්විපදා" යනු තෘතීයා එකවචනයි. ද්විපදී ත්‍රිපදී, ස්ත්‍රීලිඞ්ගප්‍රථමාඑකවචනයෙහි "ද්විපදී ත්‍රිපදී"යනු වේ. නද්‍යාදිභ්‍යාත්,

283. ටාඩකාඃ. (ටාඩකාඃ 1, 3;)

a සමාසෙ සති ට අ ඩ ක ඉත්‍යෙතෙ ප්‍රත්‍යයා භවන්ති,

b "ටශ්ච තත්පුරුෂෙ ඥෙයො හ්‍යකාරො ද්වන්ද්ව එව ච,
ඩකාරස්තු බහුව්‍රීහෞ කකාරො'නියමො මතඃ"

c (අවිඥෙය්‍යා මහිමා යස්‍ය සො 'විඥෙය්‍යමහිමඃ.)*

නද්‍යාදිය බැවින්; ඊප්, "ඊප්" ප්‍රත්‍යයයි.(මෙහි කී ව්‍යාඝ්‍රශබ්දාදිය උපමානත්වයෙන් වියයුතුයි. හෙද හස්ත්‍යාදිය හැරයයි මුග්ධබොධයෙහි කියනලදී. එහි ටීකාවෙහි හස්ත්‍යාදිය දක්වත්නාහු:-

,,කසති කපොලඃ කාණ්ඩාලො ගණ්ඩාලො ගණිකාමහාත්,
දාසී කුශූල ඉත්‍යෙතෙ හස්ත්‍යාදෞ පරිකීර්තිතාඃ"

යනු කීහු පාණිනීමතයෙහි "කුද්දාල, අජ, අශ්ව, ගණ්ඩ,කපොත" යන මොහුද ඇතුලත් වෙත්.

213 ටාඩකාඃ, (සමාසාන්තයෙහි) "ට අ ඩ ක" යන මේ ප්‍රත්‍යයෝ වෙත්.

a සමාසෙ සති; සමාසය ඇතිකල්හි; ට අ ඩ ක ඉති, "ටඅඩක" යන; එතෙ ප්‍රත්‍යයාඃ භවන්ති, මේ ප්‍රත්‍යයයෝ වෙත්.

b ටඃ, ටප්‍රත්‍යය; තත්පුරුෂෙ ච, තත්පුරුෂසමාසයෙහිද; අකාරඃ, අප්‍රත්‍යය; ද්වන්ද්ව එවච, ද්වන්ද්වසමාසයෙහිද; ඩකාරස්තු, ඩප්‍රත්‍යය වනාහි; බහුව්‍රීහෞ, බහුව්‍රීහි සමාසයෙහිද; ඥෙයඃ, දතයුතුයි. කකාරඃ, කප්‍රත්‍යය; අනියමඃ, නියමරහිතයයි; මතඃ, දන්නාලදී.

c අවිඥෙය්‍යඃ, නොසිතියහැකිවූ; මහිමා, මහත්වය; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; අවිඥෙය්‍යමහිමඃ, "අවිඥෙය්‍යමහිම" නම් වේ.

මෙහි කී ටාදිප්‍රත්‍යයෝ තත්පුරුෂාදිවශයෙන් වෙත්යයි නියම කොට කීවත් බොහෝ ටීකාදියෙහි යථායොගවශයෙන්

---

* මේ උදාහරණය බොහෝ පොත්වල නොපැණේ. මෙය ට ප්‍රත්‍යයයෙන් හා ටි [illegible] ලොපයෙන් සිද්ධයයිද එය බහුසම්මතනොවේයයිද "අවිඥාතමහිමා" යනු බහුසම්මත යයිද චන්ද්‍රකීර්තිටීකාමතයි.

284. නො වා. (නඃ 6, 1; වා 1, 1;)

a නාන්තස්‍ය පදස්‍ය ටෙර්ලොපො වා භවති ස්වරෙ යකාරෙ ච පරෙ. වාග්‍රහණාත්ක්වචින්න භවති, කිංතූපධාලොපශ්ච. අහ්නෝ මධ්‍යං= මධ්‍යාහ්නඃ, ද්වයොරහ්නොඃ සමාහාරො= ද්ව්‍යහ්නඃ, "රාත්‍රාහ්නාහාඃ පුංසි"- එතෙ පුංස්යෙව ස්‍යුඃ, සර්වරාත්‍රඃ, සර්වාහ්නඃ, ත්‍ර්‍යහඃ.

වෙත්යයි ප්‍රකාශිතයි. ටප්‍රත්‍යයෙහි ඉත්සංඥ ටකාරය ඊප් ප්‍රත්‍යය වීම පිණිසද, ඩප්‍රත්‍යයෙහි ඩකාරය ටිසංඥලොපය පිණිසද වේ.

284 නඃ, (සමාසයෙහි) නකාරාන්තපදයාගේ ටිසංඥයට; වා, ව්‍යවස්ථිතවිභාෂාවශයෙන් ලොප් වේ.

a ස්වරෙ, ස්වරයා පරකල්හි ද; යකාරෙ ච පරෙ, යකාරය පර කල්හි ද; නාන්තස්‍ය පදස්‍ය, නකාරාන්තපදයාගේ; ටෙඃ, ටිසංඥයට; වා, ව්‍යවස්ථිතවිභාෂාවශයෙන්; ලොපඃ භවති, ලොප් වේ; වාග්‍රහණාත්, වාශබ්දග්‍රහණයෙන්; ක්වචිත්, කිසිතැනෙක්හි; න භවති, ලොප් නොවේ. කිංතු, වැලි එකෙක් ඇත; එනම්,-උපධා ලොපශ්ච, (ටිසංඥලොපය නුවූතන්හි) උපධාලොපයද වේ. අහ්නඃ දවස සම්බන්ධිවූ; මධ්‍යං, මධ්‍යය; මධ්‍යාහ්නඃ, "මධ්‍යාහ්න" නම්වේ. ද්වයොඃ අහ්නොඃ, දවස්දෙකක්හුගේ; සමාහාරඃ, සමාහාරය; ද්ව්‍යහ්නඃ, "ද්ව්‍යහ්න" නම් වේ (මෙහි ටප්‍රත්‍යය හා උපධාලොපයයි.) රාත්‍රාහ්නාහාඃ, 'රාත්‍ර, අහ්න, අහ" යන මොහු; පුංසි පුංලිඞ්ග යෙහි වෙත්. එතෙ, මේ "රාත්‍ර" යනාදීහු; පුංසි එව, පුංලිඞ්ග යෙහිම; ස්‍යුඃ, වන්නාහ. සර්වරාත්‍රඃ, ("රාත්‍රෙඃ සර්වඃ" යන වාක්‍ය යෙහි) "සර්වරාත්‍රඃ" යනු වේ. (රාත්‍රෙඃ, රාත්‍රිය සම්බන්ධිවූ; සර්වඃ, සියල්ල; සර්වරාත්‍රඃ, "සර්වරාත්‍ර" නම් වේ. මෙහි අප්‍රත්‍යයයි) සර්වාහ්නඃ, ("අහ්නඃ සර්වඃ" යන වාක්‍යයෙහි) "සර්වාහ්නඃ" යනුවේ. (අහ්නඃ, දවසසම්බන්ධිවූ; සර්වඃ, සියල්ල; සර්වාහ්නඃ, "සර්වාහ්න" යනු වේ; ටප්‍රත්‍යයයි) ත්‍ර්‍යහඃ, "ත්‍රයාණාමහ්නාං සමාහාරඃ" යන වාක්‍යයෙහි "ත්‍ර්‍යහඃ" යනු වේ. (ත්‍රයාණාං අහ්නාං, දවස්තුනක් හුගේ; සමාහාරඃ, සමාහාරය; ත්‍ර්‍යහඃ, "ත්‍ර්‍යහ" නම් වේ. මෙහි ඩප්‍රත්‍යයයි මෙහි ඩයන්න ඉත් සංඥබැවින් "අහන්" ශබ්ද යාගේ ටිසංඥයවූ "අන්" යන්නට ලොප්වී "ත්‍ර්‍යහඃ" යි සිඬයි.

a "කවීනාං රාජා ඉති=කවිරාජඃ, ටකාර ඊබර්ථඃ, කවි රාජී. "ෂ්ටච්ත්‍රිතඃ" රාඥං පූඃ ඉති=රාජපුරම්, අප්‍රත්‍යයඃ වාක් ච මනශ්ච=වාඞ්මනසම්. "චොඃ කුඃ" "ඤමෙ ඤමා වා" දක්ෂි ණස්‍යාං දිශි පන්ථා ඉති=දක්ෂිණාපථඃ, අහශ්ච රාත්‍රිශ්ච=අහො රාත්‍රම්, "අහොරාත්‍රමිත්‍යත්‍ර නපුංසකත්වං වා වක්තව්‍යම්"- අහොරාත්‍රඃ, ඩප්‍රත්‍යයඃ- ද්වෞ ච ත්‍රයශ්ච=ද්විත්‍රාඃ. පඤ්චෂාඃ, (බහුත්වාවචක්ෂායාං බහුවචනං ජස්) බහවො රාජානො යස්‍යාං සා=බහුරාජා, නගරී. (අත්‍ර විලොපෙ කෘතෙ "ආබන්ත සඤ් යාඞ්" ඉත්‍යාප්. කප්‍රත්‍යයඃ-බහ්වඃ කත්‍රීයො යස්‍යසෞ=බහු කත්‍රීකො-ගෘහඃ.

ඉති බහුව්‍රීහිඃ.

---

a කවීනාම්, කවීන්ගේ; රාජා ඉති, රජතුයි; කවිරාජඃ, "කවිරාජ" නම් වේ. (තත්පුරුෂයි) ටකාරඃ, (මෙහිවූ ටප්‍රත්‍යයෙහි) ටකාරය; ඊබර්ථඃ (ස්ත්‍රීඅර්ථයෙහි) ඊප්ප්‍රත්‍යය ප්‍රයොජන කොට ඇත්තේය. කවිරාජී, (ඒ ඊප්ප්‍රත්‍යය කළකල්හි) "කවිරාජී" නම් වේ. "ෂ්ටච්ත්‍රිතඃ" යනු එහි සූත්‍රයි. රාඥං, රජුන්ගේ; පූඃ ඉති, පුරය නුයි; රාජ පුරම්, "රාජපුර" නම් වේ; (තත්පුරුෂයි). අප්‍රත්‍යයඃ, අප්‍රත්‍යය කියතුලැබේ. (එනම්)-වාක් ච, වචනය ද; මනශ්ච, සිතද; වාඞ්මන සම්, "වාඞ්මනස" නම් වේ; (ද්වන්ද්වසමාසයි). "චොඃ කුඃ" යන සූත්‍ර යෙන් ("වාච්" ශබ්දයාගේ) චකාරයට කකාරයද; "ඤමෙ ඤමාවා" යන සූත්‍රයෙන් කකාරයට ඞකාරයද විය. දක්ෂිණස්‍යාං දිශි, දකුණුදිග; පන්ථාඃ ඉති, මාර්ගය නුයි; දක්ෂිණාපථඃ, "දක්ෂිණාපථ" නම් වේ; (තත්පුරුෂයි). අහශ්ච, දවලද; රාත්‍රිශ්ච, රාත්‍රියද; අහො රාත්‍රම්, "අහොරාත්‍ර" නම් වේ. (ද්වන්ද්වසමාසයි). අහොරාත්‍රම් ඉත්‍යත්‍ර, "අහොරාත්‍රම්" යන මෙහි; නපුංසකත්වම්, නපුංසකලිඞ්ගභාවය; වා වක්තව්‍යම්, විකල්පයෙන් කිය යුතුයි. අහොරාත්‍රඃ, (විකල්පයෙන් නපුංසකලිඞ්ග නුවූතන්හි) "අහොරාත්‍රඃ" යනු වේ. ඩප්‍රත්‍යයඃ; ඩප්‍රත්‍යය කියතුලැබේ. (එනම්)-ද්වෞ ච, දෙකද; ත්‍රයශ්ච, තුනද, ද්විත්‍රාඃ, "ද්විත්‍රාඃ" යනු වේ. (ද්වන්ද්වසමාසයි). පඤ්චෂාඃ, ('පඤ්ච ච ෂට්ච" යන වාක්‍යයෙහි) "පඤ්චෂාඃ" යනු වේ. (පඤ්ච ච, පහද; ෂට්ච, සයද; පඤ්චෂාඃ, "පඤ්චෂාඃ" යනු වේ. බහුත්වවිවක්ෂායාම්, බහුවචන භාවය කියනුකැමැත්තෙහි; බහුවචනම්, බහුවචනයවූ; ජස්,

285. කර්මධාරයස්තුල්‍යාර්ථෙ.

(කර්මධාරයඃ 1, 1; තුල්‍යාර්ථෙ 7, 1;)

a **පදද්වයතුල්‍යාර්ථෙ එකාර්ථනිෂ්ඨත්වෙ සති කර්මධාරය සංඥකඃ සමාසො භවති නීලඤ්ච තදුත්පලඤ්ච=නීලොත්පලම්, රක්තා චාසෞ ලතා ච=රක්තලතා, පුමාංශ්චාසෞ කොකිලශ්ච=පුංස්කොකිලඃ, "පුංසඃ ඛපෙ ඛ්‍යාවර්ජිතෙ අම්පරෙ සංයොගාන්තස්‍යාලොපො වක්තව්‍යඃ"- තෙන පුංඛ්‍යානං, පුංක්ෂීරං ඉති භවති.**

ඉති කර්මධාරයඃ.

"ජස්" විභක්තියයි. බහවඃ, බොහෝවූ; රාජානඃ, රජවරු; යස්‍යාං, යම් නගරියෙක්හිද; සා, ඕතොමෝ; බහුරාජා, "බහුරාජා" නම් වේ. නගරී. නගරියයි. අත්‍ර, මෙහි; ටිලොපෙ කෘතෙ, ටියංශලොපය කළකල්හි; ආබතඃ ස්ත්‍රියාම් ඉති, "ආබතඃ ස්ත්‍රියාම්" යන සූත්‍රයෙන්; ආප්, ආප්ප්‍රත්‍යයයි. කප්‍රත්‍යයඃ, කප්‍රත්‍යය කියනු ලැබේ. (එනම්)-බහවඃ, බොහෝවූ; කර්තාරඃ කර්තෘහු; යස්‍ය, යමෙක්හටද; අසෞ, මෙතෙම; බහුකර්තෘකඃ, "බහුකර්තෘක" නම් වේ. යාගඃ, යාගයයි. බහුව්‍රීහිඃ, බහුව්‍රීහිසමාසය; ඉති, (මෙතෙකින් සමාප්තයි). මෙහි 'චිත්‍රාඃ" යන තන්හි "චිත්‍ර" යන ශබ්ද දෙදෙනාගේ සමාසත්වයෙන් ද්විවචන වියයුතුවුවත් ඒ දෙදෙනාගේ සමවායයෙන් පව සඞ්ඛ්‍යාව ඝටිතහෙයින් බහුවචනයි. "පචෂාඃ" යන තන්හිද එසේයි.)

බහුව්‍රීහිසමාසාර්ථව්‍යාඛ්‍යාවයි.

---

285 තුල්‍යාර්ථෙ, (සමස්‍යමාන විශෙෂණවිශෙෂ්‍ය දෙදෙනාගේ) සමානාර්ථය ඇතිකල්හි; (යම් අන්වයක් වේනම් එය); කර්මධාරයඃ, කර්මධාරය සමාස නම් වේ.

a පදද්වයතුල්‍යාර්ථෙ, පදදෙකක්හුගේ සමානාර්ථයවූ; එකාර්ථ නිෂ්ඨත්වෙ සති, එක් අර්ථයකින් නිෂ්ඨාභාවය ඇතිකල්හි; කර්ම ධාරයසංඥකඃ, කර්මධාරය නම්වූ; සමාසඃ භවති, සමාසය වේ, නීලඤ්ච තත්, නිල්වූයේත් එමය; උත්පලඤ්ච, උපුල්වූයේත්

එමනුයි; නීලොත්පලම්, "නීලොත්පල" නම් වේ. රක්තා ච අසෞ, රතුවූවාත් ඕතොමෝය; ලතා ච, ලතාවූවාත් ඕතොමෝනුයි; රක්තලතා, "රක්තලතා" නම්වේ. පුමාන් ච අසෞ, පුරුෂවූයේත් මෙ තෙමේය; කොකිලශ්ච, කොවුල්වූයේත් මෙතෙමේනුයි; පුංස්කොකිලඃ, "පුංස්කොකිල" නම් වේ. අම්පරෙ, "අම්" ප්‍රත්‍යාහාරය පරකොට ඇත්තාවූ; ඛ්‍යාවර්ජිතෙ, "ඛ්‍යා" යන්නෙන් තොරකරණලද්දවූ; ඛපෙ, "ඛප" ප්‍රත්‍යාහාරය පරකල්හි; පුංසඃ, "පුංස්" ශබ්දයාගේ; සංයොගාන්තස්‍ය, සංයොගාන්තයට; අලොපඃ ලොප්නොවීම, වක්තව්‍යඃ, කියයුතුයි. තෙන, එහෙයින්; පුංඛ්‍යානම් පුංක්ෂීරම් ඉති, "පුංඛ්‍යානම්, පුංක්ෂීරම්" කියා; භවති, වේ. ("පුංසඃ ඛ්‍යානං=පුංඛ්‍යානම්" පුංසඃ, පුරුෂයාගේ; ඛ්‍යානම්, කීම; පුංඛ්‍යානම්, "පුංඛ්‍යාන" නම් වේ. "පුංසඃ ක්ෂීරං=පුංක්ෂීරම්" පුංසඃ, පුරුෂයාගේ; ක්ෂීරම්, (ක්‍රයවික්‍රයාදිවශයෙන් ස්වාධීනවූ) කිර; පුංක්ෂීරම්, "පුංක්ෂීර" නම් වේ). කර්මධාරයඃ, කර්මධාරය සමාසය; ඉති, මෙතෙකින් සමාප්තයි

සමස්‍යමාන පදදෙකක්හුගේ සමානාර්ථභාවයෙන් එකාර්ථ නිෂ්ඨත්වය ඇතිකල්හි කර්මධාරය සමාසය වේ. "නීලොත්පලම්" යනතන්හි භ්‍රමරාදිසාධාරණස්වරූපයෙන් ප්‍රතිපන්නවූ නීලාර්ථය උත්පලාර්ථයෙහි ද, රක්තාදිසාධාරණස්වරූපයෙන් ප්‍රතිපන්නවූ උත්පලාර්ථය නීලාර්ථයෙහිද පිහිටිබැවින් පදද්වයේ තුල්‍යාර්ථතාව වේ. "පුංස්කොකිලඃ" යන තන්හි "සංයොගාන්තස්‍ය ලොපඃ" යනුවෙන් පැමිණිය හැකි සකාරලොපයාගේ නිෂෙධය පිණිස "පුංසඃ" යනාදිය කීහු. එනම්:-අම්ප්‍රත්‍යාහාරය පරකොට ඇති "ඛප" ප්‍රත්‍යාහාරය පරකල්හි "පුංස්" ශබ්දයාගේ සකාරයට ලොප් නොවේ, එහෙත් "ඛ්‍යා" යන්න පරකල්හි ලොප්වේ යනු එහි භාවයයි. "පුංඛ්‍යානම්" යනතන්හි "ඛ්‍යා" යන්න පරබැවින් සකාරලොපය විය. "පුංක්ෂීරම්" යන තන්හි "ඛප්" ප්‍රත්‍යාහාර ක යන්නෙන් පරව සිටි අකුර "අම්" ප්‍රත්‍යාහාරයට ඇතුලත් නොවන ෂයන්න බැවින් සකාරලොපය විය. තවද මේ කර්මධාරය සමාසයෙහිද පූර්වපදයට බහුව්‍රීහිසමාසයෙහි කීපරිද්දෙන් පුංවත් වේ. "රක්තලතා" යනු එසේ පුංවත්වූතැනි

කර්මධාරයසමාසාර්ථව්‍යාඛ්‍යාවයි.

286. නාම්නශ්ච කෘතා සමාසඃ.

(නාම්නඃ 6, 1; ච 1, 1; කෘතා 3, 1; සමාසඃ 1, 1;)

a ප්‍රාදෙරුපසර්ගස්‍ය නාම්නශ්ච කෘදන්තෙන සමාසඃ ස තත්පුරුෂසංඥකො භවති. (චකාරාත් කුශබ්දස්‍යාව්‍යයස්‍ය ඌරීඋරරීශබ්දයොශ්ච ච්විප්‍රත්‍යයාන්තාදෙශ්ච කෘදන්තෙන සමාසස්තත්පුරුෂො භවති) ප්‍රකෘෂ්ටො වාදඃ=ප්‍රවාදඃ කුම්භකාරඃ.

මෙසේ අව්‍යයීභාවාදිසමාසයන් ලක්ෂ්‍යලක්ෂණවශයෙන් දක්වා නැවත ඒ සමාසයන්ගේ විශෙෂවිභාග දක්වන්නාහු "නාම්නශ්ච කෘතා සමාසඃ" යනාදිය කීහු.

286 නාම්නශ්ච, නාමපදයක්හුගේද(චශබ්දයෙන් ප්‍රාදීහුගේද); කෘතා, කෘදන්තයක් හා (අන්‍යොන්‍යසම්බන්ධය වේ නම් එය); සමාසඃ, (තත්පුරුෂ) සමාස නම් වේ.

a ප්‍රාදෙඃ උපසර්ගස්‍ය, ප්‍රාදිඋපසර්ගයාගේද; නාම්නශ්ච, නාමපදයාගේද; කෘදන්තෙන, කෘදන්තයක් සමග කරණුලබන්නාවූ; සමාසඃ, (යම්) සමාසයක් වේද; සඃ, හෙතෙම; තත්පුරුෂසංඥකඃ භවති, තත්පුරුෂ නම් වේ. චකාරාත්, (මෙහි) චශබ්දයෙන්; අව්‍යයස්‍ය, අව්‍යයවූ; කුශබ්දස්‍ය, "කු" ශබ්දයාගේද; ඌරීඋරරීශබ්දයොඃ, "ඌරීඋරරී" ශබ්දදෙදෙනාගේද; ච්විප්‍රත්‍යයාන්තාදෙශ්ච, ච්විප්‍රත්‍යයාන්තශබ්දාදීහුගේද; කෘදන්තෙන, කෘදන්තයක් හා කරණුලබන්නාවූ; සමාසඃ, සමාසය තෙමේ; තත්පුරුෂඃ භවති, තත්පුරුෂ නම් වේ. ප්‍රකෘෂ්ටඃ, උත්කෘෂ්ටයුක්තවූ; වාදඃ, වාදය; ප්‍රවාදඃ, "ප්‍රවාද" නම් වේ. කුම්භකාරඃ, ("කුම්භං කරොති" යන වාක්‍යයෙහි) "කුම්භකාර" නම් වේ. (කුම්භම්, කළය; කරොති, කෙරේනුයි; කුම්භකාරඃ, "කුම්භකාර" නම් වේ යනු අර්ථයි)

මෙහි කි ප්‍රාදිඅව්‍යයක් හෝ නාමපදයක් යම්කිසි කෘදන්තයක් සමග පරපදප්‍රධානත්වයෙන් සමාසවූ කල්හි ඒ තත්පුරුෂ නම් වේ යයි කීහු. මෙය පූර්වොක්ත තත්පුරුෂසමාසයාගේ විශෙෂයක්වශයෙන් කියනලදි. මෙහි "ප්‍රවාදඃ" යන තන්හි "ප්‍ර" යන උපසර්ගය "වාද" යන කෘදන්තය සමගද, "කුම්භකාරඃ" යන තන්හි "කුම්භ" යන නාමය "කාර" යන කෘදන්තය සමගද තත්පුරුෂසමාසයි. "ව්‍යාඝ්‍රඃ, කච්ඡපඃ, සොමපා" යනාදියද මෙසේයි. "කු" ශබ්දයාගේ සමාසභාවය පසුව කියනුලැබේ. "ඌරීකෘත්‍ය, උරරීකෘත්‍ය" යන තන්හි "ඌරී, උරරී" ශබ්දයන්ගේ "කෘත්‍ය" යන කෘදන්තය හා තත්පුරුෂසමාසයි. "ද්වරීකෘත්‍ය, ශුක්ලීකෘත" යනාදියෙහි "ද්වරී, ශුක්ලී" යන "ච්වි" ප්‍රත්‍යයාන්තයන්ගේ "කෘත්‍ය, කෘත" යන කෘදන්තයන් හා තත්පුරුෂසමාසයි.

287. සහාදෙඃ සාදිඃ. (සහාදෙඃ 6, 1; සාදිඃ 1, 1;)

a සමාසෙ සති සහාදීනාං සාදිර්භවති. (සහසංතිරසාං සධ්‍රි සමිතිරයඃ) සහ අඤ්චතීති=සධ්‍ර්‍යඞ්, සමඤ්චතීති=සම්‍යඞ්, තිරො අඤ්චතීති=තිර්‍යඞ්, ක්විනභවති, සහචරතීති=සහචරඃ.

b "කුගතිප්‍රාදයඃ"–කුශබ්දෘ ගතිසංඥාඃ ප්‍රාදයශ්ච සමර්ථෙනාන්‍යෙන සමස්‍යන්තෙ ස තත්පුරුෂඃ.

287 සහාදෙඃ, "සහ" ශබ්දාදීයට; සාදිඃ, සකාරාදිය වේ.

a සමාසෙ සති, සමාසය ඇතිකල්හි; සහාදීනාම්, "සහ" ශබ්දාදීන්ට; සාදිඃ භවති, සකාරාදිය වේ. ("සපුත්‍රඃ" යනාදීන්හි සහ ශබ්දයට සකාරාදෙශයි,) (තවත්)–සහසංතිරසාම්, "සහ, සම්, තිරස්" යන මොවුන්ට; සධ්‍රිසමිතිරයඃ "සධ්‍රි, සමි තිරි" යන මොහු වෙත්. සහ අඤ්චතීති, සමග යේනුයි; සධ්‍ර්‍යඞ්, "සධ්‍ර්‍යච්" නම් වේ. සමඤ්චතීති, එකතුවීමට යේනුයි; සම්‍යඞ්, "සම්‍යච්" නම් වේ තිරඃ අඤ්චතීති, සරසට යේනුයි; තිර්‍යඞ් "තිර්‍යච්" නම් වේ. ක්විත්, කිසිතැනෙක්හි; නභවති, සකාරය නොවේ. (එනම්)– සහ චරතීති, සමග හැසිරේනුයි; සහචරඃ, "සහචර" නම් වේ. (මෙහි "අච්" යන ක්විබන්ත කෘදන්තය සමග "සහ, සම්, තිරස්" යන අව්‍යයන්ගේ තත්පුරුෂසමාසයි. මෙහි "සහ, සම්, තිරස්" යන තුණට පිළිවෙළින් "සධ්‍රි, සමි, තිරි" යන තුණ ආදෙශයි.

b කුගතිප්‍රාදයඃ, (අව්‍යයවූ) කුශබ්දය ගතිසංඥශබ්දය ප්‍රාදි උපසර්ගය යනමොහු තත්පුරුෂසමාස කරණුලැබෙත්. කුශබ්දඃ, කුශබ්දයද; ගතිසංඥඃ, ගතිසංඥශබ්දයෝද; ප්‍රාදයශ්ච, ප්‍රාදිඋපසර්ගයෝද; සමර්ථෙන, සංයුක්තාර්ථයක් සමග; අන්වයෙ, අන්‍යොන්‍ය සම්බන්ධය ඇතිකල්හි, සමස්‍යන්තෙ, සමාසකරණුලැබෙත්ද; සඃ, හෙතෙම; තත්පුරුෂඃ, තත්පුරුෂ නම් වේ.

"නාම්නශ්ච කෘතා සමාසඃ" යන සූත්‍රොක්තවිධිය විස්තර කරණුපිණිස මේ "කුගතිප්‍රාදයඃ" යන පාණිනීය සූත්‍රය කීහු.

288. කොඃ කද්වාදිඃ. (කොඃ 6, 1; කද්වාදිඃ 1, 1;)

a කුශබ්දස්‍ය කුත්සිතෙෂදර්ථයොර්වර්තමානස්‍ය කත් කව කා ඉත්‍යෙතෙ ආදෙශා භවන්ති තත්පුරුෂෙ, නතු බහුව්‍රීහෞ (බහුව්‍රීහෞ තු-කුත්සිතා විද්‍යා යස්‍යාසෞ=කුවිද්‍යඃ කුත්සිතා උෂ්ට්‍රා යස්‍ය සඃ=කුෂ්ට්‍රඃ, කුත්සිතඃ පන්ථා යස්මින්නගරෙසෞ-කුපථො-දෙශඃ.) කුත්සිතමන්නං කදන්නම්.

මෙහි කී "ගති" සංඥය පාණිනීයෙහි "ඌර්‍යාදිච්විඩාචශ්ච" යනාදීන් කීහු. එනම්-ක්‍රියායොගයෙහි වූ ඌරී, උරරී, තන්ථී, තාලී; ආතාලී, වෙතාලී, ධූලී, ධූසී, ශකලා, සංශකලා" යනාදීහුද, "කෘඤ්, භූ, අස්" යන මේ ධාතුයොගයෙහි "ච්වි, ඩාච්" ප්‍රත්‍යයාන්තයෝද ගතිසංඥ වෙත් යනුයි. තවත් ගතිසංඥයෝ බොහෝ වෙත්. "ඌරී කෘත්‍ය, ශුක්ලීකෘත්‍ය, පටපටාකෘත්‍ය" යනාදිය මෙකී ගතිසංඥයන්ගේ සමාසයට උදාහරණයි. මෙහි "ශුක්ලී" යන තන්හි 'ච්වි" ප්‍රත්‍යයද "පටපටා" යනතන්හි 'ඩාච්" ප්‍රත්‍යයද වේ.

288 කොඃ, (අව්‍යයවූ) කුශබ්දයට; කද්වාදිඃ "කත්" ආදි ආදෙශ වේ.

a කුත්සිතෙෂදර්ථයොඃ වර්තමානස්‍ය, නින්දිතාර්ථ අල්පාර්ථදෙක්හි පවත්නාවූ; කුශබ්දස්‍ය, කුශබ්දයට; තත්පුරුෂෙ, තත්පුරුෂ සමාසයෙහි; කත්කවකා ඉති, "කත්කව කා" යන; එතෙ ආදෙශාඃ භවන්ති, මේ ආදෙශයෝ වෙත්. බහුව්‍රීහෞ, බහුව්‍රීහිසමාසයෙහි නතු, නොවෙත්. බහුව්‍රීහෞ තු, බහුව්‍රීහිසමාසයෙහි වනාහි කුත්සිතා, නින්දිතවූ; විද්‍යා, විද්‍යාතොමෝ; යස්‍ය, යමෙකුගේද, අසෞ, මෙතෙම; කුවිද්‍යඃ, "කුවිද්‍ය" නම් වේ. කුත්සිතාඃ, නින්දිතවූ; උෂ්ට්‍රාඃ, ඔටුවෝ; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; කුෂ්ට්‍රඃ; "කුෂ්ට්‍ර" නම් වේ කුත්සිතඃ, නින්දිතවූ; පන්ථාඃ, මාර්ගය; යස්මින්, යම්තැනෙක්හිද; අසෞ, මෙතෙම, කුපථඃ ,,කුපථ" නම් වේ· දෙශා, දෙශයයි. (යන මෙහි බහුව්‍රීහිසමාසබැවින් යථොක්ත ,,කත්" ආදි ආදෙශ නුවූහ). කුත්සිතම්, නින්දිතවූ; අන්නම්, ආහාරය; කදන්නම්, "කදන්න" නම් වේ. (මෙහි 'කු" ශබ්දයට 'කත්" ආදෙශයි).

a ඊෂදර්ථෙ- "කොඃ කාකවකදුෂ්ණෙ"- කු ඊෂදුෂ්ණං=කොෂ්ණම් කවොෂ්ණම්-කදුෂ්ණං, කු ඊෂත් ලවණං=කාලවණම්, "පුරුෂෙ වා". කාපුරුෂඃ-කුපුරුෂඃ.

b "විභාෂා පුරුෂෙ කා ස්‍යාන්නිත්‍යමෙව භසෙ පරෙ,
අචි ත්‍රිරථවදෙ කොඃ කත් කාක්ෂෙ වා පුරුෂෙ පථි,
ඊෂදර්ථෙ ච වාච්‍යෙ ස්‍යුරග්න්‍යාවුෂ්ණෙ කාකත්කවාඃ.*

---

a ඊෂදර්ථෙ, අල්පාර්ථයෙහි කුශබ්දයට උදාහරණ කියනුලැබේ). උෂ්ණෙ උෂ්ණශබ්දය පරකල්හි; කොඃ, කුශබ්දයට; කාකවකත්; "කා කව කත්" යන අදෙශයෝ වෙත්. කු, "කු" යයි සේයි; ඊෂත්උෂ්ණම් මදක් උණුසුම්වූයේ; කොෂ්ණම්, "කොෂ්ණ" නම් වේ. කු, "කු" යයි සේයි ඊෂත් ලවණම්, මදක් ලුණුරස; කාලවණම්, "කාලවණ" නම් වේ. පුරුෂෙ, පුරුෂශබ්දය පරකල්හි; වා, විකල්පයෙන් "කා" ආදෙශ වේ. කාපුරුෂඃ, කුපුරුෂඃ, ("කුත්සිතඃ පුරුෂඃ" යන වාක්‍යයෙහි) 'කාපුරුෂ" නම්ද 'කුපුරුෂ' නම්ද වේ. (නින්දිතපුරුෂයා යන අර්ථයි).

b පුරුෂෙ, පුරුෂශබ්දය පරකල්හි; විභාෂා, විකල්පයෙන්; කාස්‍යාත්, (කුත්සිතාර්ථ) කුශබ්දයට කා ආදෙශ වන්නේය. භසෙ පරෙ, (අන්‍යවූ) භසප්‍රත්‍යාහාරවර්ණයක් පරකල්හි; නිය මෙව' නිත්‍යයෙන් වන්නේය. අචි, ස්වරයා පරකල්හිද; කොඃ, කුශබ්දයට; කත් කත්ආදෙශ වන්නේය; අක්ෂෙ අක්ෂ ශබ්දය පරකල්හිද; ඊෂදර්ථෙ, අල්පාර්ථයක් වාච්‍යතන්හි; පුරුෂෙ වා, පුරුෂශබ්දය පරකල්හිද; පථි, පථින්ශබ්දය පරකල්හිද; වාච්‍යෙ ච, (ඊෂදර්ථය) වාච්‍ය (අන්) තන්හිද; කා, කාදෙශය (නිත්‍යයෙන්) වේ. අග්නෞ අග්නිශබ්දය පරකල්හිද; උෂ්ණෙ, උෂ්ණශබ්දය පරකල්හිද; කාකත්කවාඃ, (ඊෂදර්ථ කුශබ්දයට, "කා කත් කව" යන මොහු; ස්‍යුඃ, වන්නාහ.

සිද්ධාන්තකෞමුදියෙහි මෙකී කුශබ්දයට ආදෙශවිධානය හා උදාහරණකරන්නාහු-"කොඃ කත්තත්පුරුෂෙචි' යන සූත්‍රයෙන් තත්පුරුෂසමාසයෙහි ස්වරයා පරකල්හි කුශබ්දයට "කත්"ආදෙශ වේයයි කියා "කදශ්වඃ, කදන්නම්" යනාදීයද, "රථවදයොශ්ච"

*මේ ගාථාව බොහෝ පොත්වල දක්නා නොලැබේ.

a "කුත්සිතාසත්‍රයඃ=කත්ත්‍රයඃ, කද්‍රථඃ කවදඃ, කාක්‍ෂඃ, කාපථඃ,-කුපථඃ.

b "ෂෂ උත්වං දතෘදශධාසූත්තරපදාදෙඃ ෂ්ටුත්වං ච" ධා ප්‍රත්‍යයෙ වා භවතීති වාච්‍යම්, බහුවචනං ජස්, "ජස්ශසොර්ලුක්" "නාම්නො නොලොපශධෞ" ෂඩ්භිරධිකා දශ=ෂොඩශ, ෂට්ප්‍රකාරමිති=ෂොඪා, ධාප්‍රත්‍යයෙ වා වාච්‍යමිති විකල්පාත් ෂකාරස්‍යොත්වාභාවෙ "ෂොඪඃ" ඉති ෂස්‍ය ඩත්වම්. ෂඩ්ඪා "සංඛ්‍යායාඃ ප්‍රකාරෙ ධා" "අව්‍යයාද් විභක්තෙර්ලුක්" ෂඩ් දන්තා යස්‍ය ඉති විග්‍රහෙ "විභක්තිලොපෙ කෘතෙ දන්තස්‍ය දතෘ"-ෂොඩන්.

යන සූත්‍රයෙන් "රථවද" ශබ්දදෙක පරකල්හිද වේයයි කියා "කද්‍රථඃ, කද්වදඃ" යනුද, "තෘණෙ ච ජාතෞ" යන සූත්‍රයෙන් ජාතිවාචක කල්හි තෘණශබ්දය පරකල්හිද වේයයි කියා "කත්තෘණම්" යනුද, "කා පථ්‍යක්‍ෂයොඃ" යන සූත්‍රයෙන් "කාපථඃ, කාක්‍ෂඃ" යනුද, 'ඊෂදර්ථෙ" යන සූත්‍රයෙන් අල්පාර්ථයෙහි කුශබ්දයට කාදෙශ වේයයි කියා "කාජලම්, කාමලම්" යනුද, "විභාෂා පුරුෂෙ" යන සූත්‍රයෙන් "පුරුෂ" ශබ්දය පරකල්හි විකල්පයෙන් කාදෙශ වේයයි කියා "කාපුරුෂඃ-කුපුරුෂඃ" යනුද, "කවං චොෂ්ණෙ" යන සූත්‍රයෙන් උෂ්ණශබ්දය පරකල්හි "කව කා කත්" ආදෙශ වෙත්යයි කියා කවොෂ්ණම්, කොෂ්ණම්, කදුෂ්ණම්" යනුද උදාහරණ කළාහු. භාෂාවිෂයෙහි මින් පිටත් බොහෝතැන්වලද මේ ආදෙශයෝ දක්නාලැබෙත්.

a කුත්සිතාඃ, නින්දිතවූ; ත්‍රයඃ, තුණ; කතත්‍රයඃ, "කතත්‍රයඃ" යනු වේ. කද්‍රථඃ, ("කුත්සිතො රථඃ" යන වාක්‍යයෙහි) "කද්‍රථ" නම් වේ. (නින්දිතවූ රථය යන අර්ථයි) කවදඃ, ("කුත්සිතො වදඃ" යන වාක්‍යයෙහි) "කවද', නම් වේ. (නින්දිත වචන කියන්නේය යන අර්ථයි). කාක්‍ෂඃ, "කුත්සිතොක්‍ෂඃ', යන වාක්‍යයෙහි "කාක්‍ෂ" නම් වේ. (නින්දිතවූ අක්‍ෂය යන අර්ථයි.) කාපථඃ-කුපථඃ, "කුත්සිතඃ පන්ථාඃ" යන වාක්‍යයෙහි "කාපථ" නම්ද "කුපථ" නම්ද වේ. (නින්දිතවූ මාර්ගය යන අර්ථයි). මෙහි "කාක්‍ෂ" යන තන්හි "අක්‍ෂ" ශබ්දය රථාවයවවක්‍රාර්‍ථයි. "කු" ශබ්දයා "අක්‍ෂි" ශබ්දය හා බහුව්‍රීහිසමාස වීමෙන්ද "කාක්‍ෂ" සි සිද්ධයි. (මෙහි කී "ප්‍රවාදඃ,

---

කුපුරුෂඃ, කදන්නම්" යනාදියෙහි පූර්වපදය පරපදය හා තුල්‍යාධිකරණත්වයෙන් පවත්නාතන්හි කර්මධාරය සමාසයයි ඇතැම් වෛයාකරණයන්ගේ මතයයි)

b දතෘදශධාසු, "දතෘ දශ ධා" යන මොවුන් පරකල්හි; ෂෂ, ෂෂ් ශබ්දයාගේ අන්ත්‍යෂකාරයට; උත්වම්, උකාරබවවේ. උත්තරපදාදෙඃ, උත්තරපදයාගේ ආදියට; ෂ්ටුත්වම්, ෂ්ටුත්වයද වේ. ධාප්‍රත්‍යයෙ, (මෙහි කී) ධාප්‍රත්‍යය පරකල්හි; වා භවතීති, විකල්පයෙන් වේයයි; වාච්‍යම්, කියයුතුයි. බහුවචනම්, බහුවචනවූ; ජස්, "ජස්" විභක්තිය වේ. "ජස්ශසොර්ලුක්" යන සූත්‍රයෙන් මෙහි "ජස්" විභක්තියට ලොප්වේ. "නාම්නොනොලොපශධෞ" යන සූත්‍රයෙන් 'දශන්" ශබ්දයාගේ නකාරලොපය වේ. ෂඩ්භිඃ අධිකාඃ දශ, සයකින් වැඩිවූ දශය; ෂොඩශ, "ෂොඩශ" යනුවේ. ෂට්ප්‍රකාරම් ඉති, සපරිදි යන අර්ථයෙහි; ෂොඪා, "ෂොඪා" යනුවේ. ධාප්‍රත්‍යයෙ, ධාප්‍රත්‍යය පරකල්හි; වා වාච්‍යම් ඉති, විකල්පයෙන් කියයුතුය යන; විකල්පාත්, විකල්පයෙන්; ෂස්‍ය, ෂකාරයට; උත්වාභාවෙ, උකාරභාවය නැතිකල්හි; ෂොඪඃ ඉති "ෂොඪඃ" යන සූත්‍රයෙන්; ෂස්‍ය, ෂකාරයට, ඩත්වම්, ඩකාරභාවය වේ. ෂඩ්ඪා, (එකල්හි) "ෂඩ්ඪා" යනු වේ. "සංඛ්‍යායාඃ ප්‍රකාරෙ ධා"යන සූත්‍රයෙන් මෙහි ධාප්‍රත්‍යයයි. "අව්‍යයාද් විභක්තෙර්ලුක්" යන සූත්‍රයෙන් මෙහි විභක්තිලොපයද වේ. ෂඩ් දන්තා යස්‍ය ඉති, "ෂඩ් දන්තා යස්‍ය" යන; විග්‍රහෙ, විග්‍රහයෙහි; විභක්තිලොපෙ කෘතෙ, විභක්තිලොපය කළකල්හි; දන්තස්‍ය, දන්තශබ්දයට; දතෘ, "දතෘ" යන ආදෙශය වේ. ෂොඩන්, (එකල්හි) "ෂොඩන්" යනුවේ.

මෙහි "ෂොඩශ" යන තන්හි "ෂෂ්" ශබ්දයාගේ අන්ත්‍ය ෂකාරයට උකාරයද "දශන්" ශබ්දයේ දයන්නට ඩයන්නදවේ, "ෂොඪා" යනතන්හි "ධා" ප්‍රත්‍යයෙහි ධකාරයට ඪකාරයදවේ, "ෂොඩන්" යන තන්හි "දන්ත" ශබ්දයට වූ "දතෘ" ආදෙශයාගේ දකාරයට ඩකාරයද වේ. "ෂඩ්ඪා" යනතන්හි ධාප්‍රත්‍යය පරකල්හි විකල්පයයි කීමෙන් "ෂෂ්" ශබ්දයාගේ ෂකාරයට 'ෂොඪඃ" යන සූත්‍රයෙන් ඩකාරයද ඒ හා යොගයෙහි ධකාරයට ඪකාරයද වේ. මෙහි "ෂෂ උත්වම්" යනාදියෙහි "ෂ්ටුත්වම්" යන්නෙන් ෂකාරටවර්ගදෙකම ප්‍රකාශිතවුවත් මෙහි පදසිද්ධිවශයෙන් ටවර්ගීය "ඩඪ" යන දෙක විය.

a "තද්බෘහතොඃ කරපත්‍යොශ්චෞරදෙවතයොඃ සුට් තලොපශ්ච"-බෘහතාං පතිඃ=බෘහස්පතිඃ, තත් කරඃ=තස්කරඃ. "මහතෂ්ටෙරාකාරො භවති සමානාධිකරණෙ"-මහාංශ්චාසෞ ඊශ්වරශ්ච=මහෙශ්වරඃ.

b "දිවො ද්‍යාවා"- ද්‍යෞශ්ච භූමිශ්ච= ද්‍යාවාභූමී, ආකෘතිගණොයම්. "සිද්ධං ශබ්දරූපමුපලභ්‍ය තදනුසාරෙණාදෙශවිධානං ක්‍රියතෙ යත්‍ර ස ආකෘතිගණඃ"

---

a චෞරදෙවතයොඃ, චෞරත්වදෙවතාත්වදෙක්හි කරපත්‍යොඃ, "කරපති" ශබ්දදෙක පරකල්හි; තද්බෘහතොඃ, "තද්බෘහත්" ශබ්දදෙදෙනාගේ, තලොපශ්ච, තකාරලොපයද; සුට්, (කරපති ශබ්දදෙක සම්බන්ධව) "සුට්" ආගමද වේ. බෘහතාම්, මහතුන්ගේ; පතිඃ, ස්වාමිතෙම; බෘහස්පතිඃ, "බෘහස්පති" නම් වේ. (එනම් දෙවතෙමෙයි) තත්, එය; කරඃ, කරන්නේ; තස්කරඃ, "තස්කර" නම් වේ. (චෞරතෙමෙයි.) සමානාධිකරණෙ, සමානාධිකරණ පදයා පරකල්හි; මහතඃ, මහත්ශබ්දයාගේ; ටෙඃ, ටිසංඥයට; ආකාරඃ භවති, ආකාරය වේ. මහාන්ස්ච අසෞ, මහත්වූයේත් මෙතෙමේය; ඊශ්වරශ්ච, ඊශ්වරවූයේත් මෙතෙමේ නුයි; මහෙශ්වරඃ, "මහෙශ්වර" නම් වේ. (මෙහි "බෘහස්පතිඃ" යන තන්හි "බෘහත්‍යාවාචඃ පතිඃ" කියා ද වාක්‍යය දක්නාලැබේ, ඒ බහුසම්මතයි. මෙහි "බෘහතී" ශබ්දය වාගර්ථයි. තවද "මහත්" ශබ්දයාගේ ටිසංඥයට නියමිතවූ ආකාරය "බහුව්‍රීහිකර්මධාරය" යන සමාසද්වයයෙහි වේ.)

b දිවඃ, 'දිව්' ශබ්දයට; ද්‍යාවා, "ද්‍යාවා" යන ආදෙශය වේ. ද්‍යෞඃ ච, අහසද; භූමිඃ ච, භූමියද; ද්‍යාවාභූමී, "ද්‍යාවාභූමී" යනු වේ. අයම්, මේ; ආකෘතිගණඃ, ආකෘතිගණයයි:- සිද්ධං, සිද්ධවූ; ශබ්දරූපං උපලභ්‍ය, ශබ්දරූපයක් ලබා; තදනුසාරෙණ, ඒ අනුසාරයෙන්; ආදෙශවිධානම්, ආදෙශ විධානය; යත්‍ර, යම් ශබ්දගණයෙක්හි; ක්‍රියතෙ, කරනුලැබේද; සඃ, ඒ; ආකෘතිගණඃ, ආකෘතිගණ නම් වේ. (මෙහි තී "සනාදෙඃ සාදිඃ" යන සූත්‍රයෙන් පූර්වපදවූ සන ශබ්දාදියට වූ සකාරාදිහුගේ අකාරය ලබා ඒ අනුසාරයෙන් සමාසවිෂයෙහි පූර්වපදයන්ට බොහෝතන්හි ඒ ඒ ආදෙශ කොට සිද්ධකටයුතුගණය ආකෘතිගණයයි.)

289. අලුක් ක්වචිත්. (අලුක් 1, 1; කවචිත් 7, 1;)

a ක්වචිත් සමාසෙ තද්ධිතෙ කෘදන්තෙපි විභක්තීනාමලුග්භවති. කෘච්ඡ්‍රාන්මුක්තඃ, අප්සු යොනිර්යස්‍ය සොප්සුයොනිඃ. උරසි ලොමානි යස්‍යාසෞ=උරසිලොමා, හෘදි ස්පෘශති=හෘදිස්පෘක්, කණ්ඨෙකාලඃ, වාචොයුක්තිඃ, දිශොදණ්ඩඃ, පශ්‍යතොහරඃ, ඉත්‍යාදි.

---

289 ක්වචිත්, කිසිතන්හි; අලුක්, (සමාසාදියෙහි විභක්තීන්ට) ලොප් නොවේ

a ක්වචිත්, කිසිතන්හි; සමාසෙ, සමාසයෙහි ද; තද්ධිතෙ, තද්ධිතයෙහි ද; කෘදන්තෙපි, කෘදන්තයෙහි ද; විභක්තීනා, විභක්තීයට; අලුක් භවති, ලොප්නොවීම වේ. කෘච්ඡ්‍රාන්මුක්තඃ, දුකින් මිදුනේය. (මෙහි පූර්වපදයට පඤ්චමීවිභක්තීහුගේ ලොප්නොවීමයි) අප්සු ජලයෙහි; යොනිඃ, උත්පත්තිය; යස්‍ය, යමෙකුගේ ද; සඃ, හෙතෙම; අප්සුයොනිඃ, "අප්සුයොනි" නම් වේ. (මෙහි පූර්වපදයට සප්තමීවිභක්තීහුගේ අලොපයයි). උරසි, ළෙහි; ලොමානි, ලෝම යෝ; යස්‍ය, යමෙකුගේ වෙද්ද; අසෞ, මෙතෙම; උරසිලොමා, "උරසිලොමන්" නම් වේ. (මෙහි සප්තමීවිභක්තීහුගේ අලොපයයි) හෘදි, හෘදයෙහි; ස්පෘශති, ස්පර්ශකෙරේනුයි; හෘදිස්පෘක් "හෘදිස්පෘක්" නම් වේ. (මෙහිද එසේයි) කණ්ඨෙකාලඃ, ("කණ්ඨෙ කාලො යස්‍ය සඃ" යන වාක්‍යයෙහි "කණ්ඨෙකාල" නම් වේ. කණ්ඨෙ, බොටුවෙහි; කාලඃ, කාලවර්ණය; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; කණ්ඨෙකාලඃ, "කණ්ඨෙකාල" නාම වේ යනු අර්ථයි. (මෙහිද එසේයි) වාචොයුක්තිඃ, වචනයාගේ යුක්තිය; (මෙහි පූර්වපදයට ෂෂ්ඨිවිභක්තීහුගේ අලොපයයි. දිශොදණ්ඩඃ, දිශාවට අනාදරයෙන් කරණ දඬුය; (මෙහි පූර්වපදයට ෂෂ්ඨිවිභක්තීහුගේ අලොපයයි). පශ්‍යතොහරඃ, බලා ඉන්දදී පැහැරගන්නේය. (මෙහි ද එසේයි). ඉති ආදී, මේ ආදිය වේ.

මේ සූත්‍රවෘත්තියෙහි "කෘදන්තෙ" යන්නෙන් කෘදන්තයෙහි ද විභක්තිලොපය නොවේයයි කීනමුත් එය බහුසම්මත නොවේ. කුමක්හෙයින්ද? යත් කෘදන්තයෙහි විභක්තිලොපය වියයුතු තැන් හෝ නොවිය යුතු තැන් "නාමනශ්ච කෘතා සමාසඃ" යන

a **"සමාසෙ සමානාධිකරණෙ ශාකපාර්ථිවාදීනාං මධ්‍යපදලොපො වක්තව්‍යඃ" ශාකප්‍රියශ්චාසෞ පාර්ථිවශ්ච=ශාකපාර්ථිවඃ දෙවපූජකශ්චාසෞ බ්‍රාහ්මණශ්ච=දෙවබ්‍රාහ්මණඃ.**

සූත්‍රවිධියෙන් කළ තත්පුරුෂ සමාසයට ඇතුළත් බැවිනි. එහෙයින් එය "සමාසෙ" යන්නෙන්ම නියමිතයි. මෙහි කී "හෘදිස්පෘක් පශ්‍යතොහරඃ" යනුද කෘදන්තතත්පුරුෂසමාසයි. තද්ධිතයෙහි- "අමුෂ්‍යාපත්‍යම්" යන වාක්‍යයෙහි "අමුෂ්‍ය" යන ෂෂ්ඨීවිභක්ත්‍යන්තයා කෙරෙන් "ආයනණ්" ප්‍රත්‍යයව විභක්තිලොපය නොව "ආමුෂ්‍යායණඃ"යි සිඩයි. මෙසේ සිඩවූ තවත් බොහෝ පද දක්නා ලැබෙත් තවද මේ අලුක්සමාසය පිළිබඳ සිඩාන්තකෞමුදියෙහි ප්‍රකරණයක් වශයෙන් බොහෝ සූත්‍ර දක්වා විස්තර කරණ ලදී. එහි 'පඤ්චම්‍යාඃ ස්තොකාදිභ්‍යඃ" යන සූත්‍රයෙන් උත්තර පදයක් පරකල්හි 'ස්තොක" ශබ්දාදියෙන් පර පඤ්චමී විභක්තිනුගේද, "ඕජඃසහොම්භස්තමසස්තෘතීයායාඃ" යන සූත්‍රයෙන් "ඕජස්, සහස්, අම්භස්, තමස්" ශබ්දයන්කෙරෙන් පර තෘතීයා විභක්තිනුගේද, "වෛයාකරණාඛ්‍යායාං චතුර්ථ්‍යාඃ" යන සූත්‍රයෙන් ව්‍යාකරණය පිළිබඳ නාමයක් ගම්‍යමානකල්හි චතුර්ථීවිභක්තිහුගේද, 'හලදන්තාත්සප්තම්‍යාඃ සංඥායාම්" යන සූත්‍රයෙන් සංඥවක් ගම්‍යමානකල්හි හලන්තයාකෙරෙන් හා අකාරාන්තයා කෙරෙන් පර සප්තමීවිභක්තිහුගේ ද, "ෂෂ්ඨ්‍යා ආක්‍රොශෙ" යන සූත්‍රයෙන් ආක්‍රොශයක් ගම්‍යමානකල්හි ෂෂ්ඨී විභක්තිහුගේද ලොපය නොවේයයි ප්‍රධානවශයෙන් කියා ඊට අනුගත තවත් බොහෝ සූත්‍ර හඳුරණ ලද්දාහ. "ස්තොකාන්මුක්තඃ, -ඕජසාකෘතම්, සහසාකෘතම්, අම්භසාකෘතම්, තමසාකෘතම්,- ආත්මනෙපදම්, පරස්මෛපදම්,- ඛවිසාරඃ, මධ්‍යෙගුරුඃ,- චෞරස්‍ය කුලම්" යනාදී බොහෝ උදාහරණද දක්වනලද්දාහ.

a සමානාධිකරණෙ සමාසෙ, තුල්‍යාධිකරණසමාසයෙහි; ශාකපාර්ථිවාදීනාම්, "ශාකපාර්ථිව" ශබ්දාදීන්ගේ; මධ්‍යපදලොපඃ, මධ්‍යයෙහි පවත්නාවූ පදයාගේ ලොපය; වක්තව්‍යඃ කියයුතුයි. ශාකප්‍රියශ්ච අසෞ ශාකවර්ගය ප්‍රිය කොට ඇත්තේත් මෙතෙමේය; පාර්ථිවශ්ච, පෘථිවීශ්වරවූයේත් මෙතෙමේ නුයි; ශාකපාර්ථිවඃ, "ශාකපාර්ථිව" නම් වේ. දෙවපූජකඃ ච අසෞ, දෙවියන් පුදන්නේත් මෙතෙමේය; බ්‍රාහ්මණශ්ච, බ්‍රාහ්මණවූයේත් මෙතෙමේ නුයි; දෙවබ්‍රාහ්මණඃ, "දෙවබ්‍රාහ්මණ" නම වේ. (මෙහි

290. ආදෙශ්ච ද්වන්ද්වෙ. (ආදෙඃ 6, 1; ච 1, 1; ද්වන්ද්වෙ 7, 1;)

a **ද්වන්ද්වසමාසෙ සති ආදිපදස්‍ය ලොපො භවති. මාතා ච පිතා ච=පිතරෞ, දුහිතා ච පුත්‍රශ්ච=පුත්‍රෞ, ශ්වශ්‍රූශ්ච ශ්වශුරශ්ච=ශ්වශුරෞ.**

"ශාකප්‍රිය" යන බහුව්‍රීහිසමාසාන්තය 'පාර්ථිව" යන්න හා සමානාධිකරණබැවින් එහි මධ්‍යපදයවූ "ප්‍රිය" ශබ්දයාගේද, "දෙවපූජක" යන තත්පුරුෂසමාසාන්තය "බ්‍රාහ්මණ" යන්න හා සමානාධිකරණ බැවින් එහි මධ්‍යපදය වූ 'පූජක" ශබ්දයාගේද ලොපයයි. සමහරු මෙහි "සහාදෙඃ සාදිඃ" යන සූත්‍රයෙන් "ශාකප්‍රිය" යන්නට "ශාක" යනාදෙශද "දෙවපූජක" යන්නට "දෙව" යනාදෙශද කියත්.)

290 ද්වන්ද්වෙ, ද්වන්ද්වසමාසයෙහි; ආදෙශ්ච, ආදිපදයාගේද ලොපය වේ.

a ද්වන්ද්වසමාසෙ සති, ද්වන්ද්වසමාසය ඇතිකල්හි; ආදිපදස්‍ය, ආදිපදයට; ලොපඃ භවති, ලොප් වේ. මාතා ච, මව්තොමෝද; පිතා ච, පියතෙමේද; පිතරෞ "පිතරෞ" යනුවේ. දුහිතා ච, දුහිතෘතොමෝ ද; පුත්‍රශ්ච, පුත්‍රතෙමේද; පුත්‍රෞ, "පුත්‍රෞ" යනු වේ. ශ්වශ්‍රූඃ ච, නැන්දනී තොමෝද; ශ්වශුරඃ ච, මාමා ද; ශ්වශුරෞ, "ශ්වශුරෞ" යනු වේ.

මෙකී ආදිපදලොපසමාසය බොහෝ ව්‍යාකරණයන්හි එකශෙෂසමාසයයි කියත්. සිඩාන්තකෞමුදියෙහි එකවිභක්තික සරූපයන්ගේ හා සමානාර්ථවූ විරූපයන්ගේද එකශෙෂයකියත්, "රාමශ්ච රාමශ්ච' යන වාක්‍යයෙහි පූර්වපදය ලොප්ව අපරපදය ශෙෂවීමෙන් "රාමෞ" කියාද, "රාමශ්ච රාමශ්ච රාමශ්ච" යන තන්හි පදමයක් ලොප්ව "රාමාඃ" කියාද වේ. මේ සරූපයන්ගේ එකශෙෂයයි. "වක්‍රදණ්ඩශ්ච කුටිලදණ්ඩශ්ච" යන වාක්‍යයෙහි ශබ්දවය ව්‍යඤ්ජනවශයෙන් විරූපවූවත් අර්ථවශයෙන් සරූප බැවින් එකක් ශෙෂව "වක්‍රදණ්ඩෞ" කියා හෝ 'කුටිලදණ්ඩෞ" කියා හෝ වේ. මේ විරූපයන්ගේ එකශෙෂයයි. මෙකී එකශෙෂයෙහි ශෙෂවියයුතු පදයන් දක්වන්නාහු "වෘද්ධො යූනා තල්ලක්ෂණශ්චෙදෙව විශෙෂඃ" යනාදීන් බොහෝ සූත්‍ර කීහු. එනම්-ඉදින් වෘද්ධයුවනිමිත්තකවූ විරූපභාවයක් වේනම් ඉන් වෘද්ධවය නිමිති

291. ඍතාං ද්වන්ද්වෙ. (ඍතාං 6, 3; ද්වන්ද්වෙ 7, 1;)

a ඍකාරාන්තානාං ද්වන්ද්වසමාසෙ සති පූර්වපදස්‍ය වා ආකාරො භවති. මාතා ච පිතා ච=මාතාපිතරෞ.

කොට ඇත්තේ ශෙෂ වේ යුවත්වය නිමිතිකොට ඇත්තේ ලොප් වේ, යනු කීහු. "ගාර්ග්‍යශ්ච ගාර්ග්‍යායණශ්ච=ගාර්ග්‍යෞ" යන තන්හි වෘද්ධත්වයෙන් "ගාර්ග්‍ය" ශබ්දය ශෙෂ වේ. මෙහි වෘද්ධයුවභෙදය ගොත්‍රවාචක ප්‍රත්‍යයභෙදයෙනි. "පුමාන් ස්ත්‍රියා" යන සූත්‍රයෙන් පුංවාචකශබ්දය ඒ පුංවාචකශබ්දයෙන්ම කරණලද ස්ත්‍රීප්‍රත්‍යයාදිවිශෙෂඇති ස්ත්‍රීවාචකශබ්දයක් හා සහොක්තියෙහි (සමාස කොට කීමෙහි පුංවාචකශබ්දය ශෙෂ වේ. එනම් "හංසශ්ච හංසී ච=හංසෞ" යන තන්හි පුංවාචක "හංස" ශබ්දය ශෙෂවේ. තවත් බොහෝ සූත්‍ර දක්වා අනපුංසක ශබ්දයක් හා සහොක්තියෙහි එයින්ම කරණලද විරූපභාවය ඇති නපුංසකශබ්දයක් වේ නම් ඒ ශෙෂ වේ. එහි විකල්පයෙන් එකවචනද වේ. එනම් "ශුක්ලශ්ච ශුක්ලා ච ශුක්ලී ච=ශුක්ලානි-ශුක්ලං වා, කෘතා ච කෘතඤ්ච=කෘතානි-කෘතං වා" යනු උදාහරණයි මෙහි නපුංසකලිඞ්ගයාගේ ශෙෂත්වයද විකල්පයෙන් එකවචනත්වයද විය. "භ්‍රාතෘස්වසෘ" ශබ්දද්වයෙන් 'භ්‍රාතෘ" ශබ්දයද, "පුත්‍රදුහිතෘ" දෙකෙන් "පුත්‍ර" ශබ්දයද, "මාතෘපිතෘ" දෙකෙන් "පිතෘ" ශබ්දයද, "ශ්වශ්‍රූශ්වශුර" දෙකෙන් "ශ්වශුර" ශබ්දයද ශෙෂ වේ අනිකක් හා ත්‍යත්ශබ්දාදීන්ගේ සහොක්තියෙහි "ත්‍යත්" ශබ්දාදීහු ශෙෂවෙත්. එනම්-'ස ච දෙවදත්තශ්ච" යන තන්හි "තෞ" යනු වේ. 'ත්‍යත්' ශබ්දාදීන්ගේ සහොක්තියෙහි පරවූ ශබ්දය ශෙෂවේ, එනම්-"ස ච යශ්ච" යනතන්හි "යෞ" යනු වේ. පූර්වයද ශෙෂවේයයි භාෂ්‍යයෙහි කියනලදී. මෙහි විශෙෂ තවත් බොහෝ වෙත්

291 ඍතාං, (විද්‍යායොනිකෘතසම්බන්ධය ඇති) ඍකාරාන්තයන්ගේ; ද්වන්ද්වෙ, ද්වන්ද්වසමාසයෙහි පූර්වපදාන්තයට ආකාරය වේ.

a ඍකාරාන්තානාම්, ඍකාරාන්තශබ්දයන්ගේ; ද්වන්ද්වසමාසෙ සති, ද්වන්ද්වසමාසය ඇතිකල්හි; පූර්වපදස්‍ය, පූර්වපදාන්තයට; ආකාරඃ භවති, ආකාරය වේ. මාතා ච, මව්තොමෝ ද; පිතා ච, පිය තෙමේද; මාතාපිතරෞ. "මාතාපිතරෞ" යනු වේ. (මේ යොනිකෘතසම්බන්ධයයි, "හොතාපොතාරෞ" යනු විද්‍යාකෘතසම්බන්ධයි.)

a "ද්වන්ද්වෙ සර්වාදිත්වං වා"-වර්ණාශ්ච ආශ්‍රමාශ්චෙතරෙ ච=වර්ණාශ්‍රමෙතරෙ-වර්ණාශ්‍රමෙතරාඃ.

b "ව්‍යධිකරණෙ බහුව්‍රීහෞ මධ්‍යපදලොපො වක්තව්‍යඃ" කුමුදස්‍ය ගන්ධ ඉව ගන්ධො යස්‍ය සඃ=කුමුදගන්ධිඃ. (උපමානාත්පරස්‍ය ගන්ධශබ්දස්‍යෙකාරො භවති) හංසස්‍ය ගමනමිව ගමනං යස්‍යාඃ සා=හංසගමනා.

292. දික්සඞ්ඛ්‍යෙ සංඥායාම්.

(දික්සඞ්ඛ්‍යෙ 1, 2; සංඥායාම් 7, 1;)

c දිශාවාචකසඞ්ඛ්‍යාවාචකශබ්දාවුත්තරපදතුල්‍යාර්ථෞ සංඥායාං සමස්‍යෙතෙ ස කර්මධාරයඃ.

---

a ද්වන්ද්වෙ, ද්වන්ද්වසමාසයෙහි; සර්වාදිත්වම්, සර්වාදිබව හෙවත් සර්වනාමබව; වා, විකල්පයෙන් වේ. වර්ණාශ්ච, චතුර්වර්ණයෝ ද; ආශ්‍රමාශ්ච, ආශ්‍රමයෝද; ඉතරෙ ච, අන්‍යයෝද (යන තන්හි); වර්ණාශ්‍රමෙතරෙ, (සර්වනාමත්වයෙන්) "වර්ණාශ්‍රමෙතරෙ" යනුද; වර්ණාශ්‍රමෙතරාඃ, විකල්පයෙන් සර්වනාමත්වය නොව "වර්ණාශ්‍රමෙතරාඃ" යනු ද වේ.

b ව්‍යධිකරණෙ, භින්නාධිකරණවූ; බහුව්‍රීහෞ, බහුව්‍රීහිසමාසයෙහි; මධ්‍යපදලොපඃ, මධ්‍යපදයාගේ ලොපය; වක්තව්‍යඃ, කිය යුතුයි. කුමුදස්‍ය කුමුදපුෂ්පයාගේ; ගන්ධඃ ඉව, ගන්ධය වැනිවූ; ගන්ධඃ, ගන්ධයතෙම; යස්‍ය, යමෙකුගේද; සඃ හෙතෙම; කුමුදගන්ධිඃ, "කුමුදගන්ධි" නම් වේ. (මෙහි-උපමානාත් පරස්‍ය, උපමානවාචක ශබ්දයාකෙරෙන් පරවූ; ගන්ධශබ්දස්‍ය, ගන්ධශබ්දයාගේ අන්තයෙහි; ඉකාරඃ භවති, ඉකාරය වේ. හංසස්‍ය, හංසයාගේ; ගමනං ඉව, ගමන වැනිවූ; ගමනං, ගමන; යස්‍යාඃ, යම් ස්ත්‍රියකගේද; සා, ඕතොමෝ; හංසගමනා, "හංසගමනා" නම් වේ (මේ දෙතන්හි "ගන්ධ, ගමන" යන මධ්‍යපදයන්ගේ ලොපයයි.)

292 දික්සඞ්ඛ්‍යෙ, (උත්තරපදතුල්‍යාර්ථවූ) දිග්වාචක සංඛ්‍යාවාචකශබ්ද දෙක; සංඥායාම්, සංඥාර්ථයෙහි සමාස කරණු ලැබෙත් නම් (ඒ සමාසය කර්මධාරය නම් වේ.)

c දිග්වාචක සඞ්ඛ්‍යාවාචක ශබ්දෞ, දිශාවාචක සඞ්ඛ්‍යාවාචක ශබ්ද දෙක; උත්තරපදතුල්‍යාර්ථෞ, උත්තරපදය හා සමානාර්ථ

a ("සංඥායාමිති පදෙන නිත්‍යසමාසො දර්ශිතඃ, අවිග්‍රහො නිත්‍යසමාසඃ, අන්‍යස්වපදවිග්‍රහොපි භවති, විග්‍රහො ද්විවිධඃ-එකඃ ස්වපදවිග්‍රහ එකොඃස්වපදවිග්‍රහොපි භවති-අස්ව පදෙන සමාසව්‍යතිරික්තෙනාපි පදෙන විග්‍රහො වාක්‍යං යත්‍ර ස නිත්‍යඃ, තෙන-ලම්බෞ කර්ණෞ යස්‍ය ස=ලම්බකර්ණඃ, දධ්නා ජිතමිති ස්වපදවිග්‍රහඃ, අස්වපදවිග්‍රහො නිත්‍යඃ, යස්මින් සමාසාවබොධකං වාක්‍යං න තිෂ්ඨති සොපි නිත්‍යඃ). දක්ෂිණාග්නිඃ, සප්තග්‍රාමාඃ.

ඉති සමාසප්‍රක්‍රියා.

ඇත්තාහු; සංඥායාම්, සංඥාවක් ගම්‍යමානකල්හි; සමස්‍යතෙ, සමාසකරණුලැබෙත්ද; සඃ, හෙතෙම, කර්මධාරයඃ, කර්මධාරය නම් වේ.

a සංඥායාම්ඉතිපදෙන, "සංඥායාම්" යනපදයෙන්; නිත්‍යසමාසඃ, නිත්‍යසමාසය; දර්ශිතඃ, දක්වනලදී. නිත්‍යසමාසඃ, නිත්‍යසමාසය; අවිග්‍රහඃ, විග්‍රහරහිත වේ. අස්වපදවිග්‍රහඃ අස්වපදවිග්‍රහවූ (ස්වකීය පදභින්නවූවකින් කරණලදවිග්‍රහඇත්තාවූ); අන්‍යඃතු අපි, අන්‍යවූ නිත්‍යසමාසයක් ද; භවති, වේ. විග්‍රහඃ, විග්‍රහය; ද්විවිධඃ, දෙවැදෑරුම් වේ. (එනම්-එකඃ, එකක්; ස්වපදවිග්‍රහඃ, ස්වකීයපදයෙන් කරණ විග්‍රහය වේ. එකඃ, එකක්; අස්වපදවිග්‍රහඃ අපි භවති, ස්වකීයපද භින්නවූවකින් කරණවිග්‍රහයද වේ අස්වපදෙන "අස්ව පදෙන" යයි සේයි; සමාසව්‍යතිරික්තෙන අපි, සමස්‍යමානපදයන් ගෙන් අන්‍යවූද; පදෙන, පදයකින්; විග්‍රහඃ, "විග්‍රහ" යයි සේයි; වාක්‍යම්, වාක්‍යය (ස්වාර්ථාවබොධක පදසමූහය;) යත්‍ර, යම් සමාස යෙක්හි වේද; සඃ, හෙතෙම; නිත්‍යඃ, නිත්‍යසමාස නම් වේ. තෙන, එහෙයින්; ලම්බෞ කර්ණෞ යස්‍ය ස ලම්බකර්ණඃ, 'ලම්බෞ කර්ණෞ යස්‍ය සඃ" යන වාක්‍යයෙහි "ලම්බකර්ණඃ" යනු වේ, දධ්නා ජිතනාම් ඉති, "දධ්නා ජිතනාම්" යනු; ස්වපදවිග්‍රහඃ, ස්ව පදවිග්‍රහයි. අස්වපදවිග්‍රහඃ, අස්වපදවිග්‍රහසමාසය; නිත්‍යඃ, නිත්‍ය වේ. යස්මින්, යම් සමාසයෙක්හි; සමාසාවබොධකං, සමාසාර්ථය අවබොධ කරන්නාවූ; වාක්‍යං, වාක්‍යය; නතිෂ්ඨති, නොසිටීද; සඃ අපි, ඒ සමාසයද;.නිත්‍යඃ, නිත්‍ය වේ. දක්ෂිණාග්නිඃ සප්තග්‍රාමාඃ, "දක්ෂිණාග්නිඃ, සප්තග්‍රාමාඃ" යනු ඊට උදාහරණයි. ("දක්ෂිණාග්නි" යනු එනම් අග්නිවිශෙෂයයි. "සප්තග්‍රාමාඃ" යනු එනම් දෙශවිශෙෂයි.) සමාසප්‍රක්‍රියා, සමාසප්‍රක්‍රියාව; ඉති, මෙතෙකින් සමාප්තයි

"දික්සංඛ්‍ය සංඥායාම්" යන සූත්‍රයෙන් කියනලද්දේ දිශා වාචකසංඛ්‍යාවාචක ශබ්ද සංඥාර්ථයක් ගම්‍යමානකල්හි උත්තරපද තුල්‍යාර්ථත්වයෙන් (විග්‍රහරහිතව) කර්මධාරයසමාස වන බවයි. "දක්ෂිණාග්නිඃ" යන තන්හි "දක්ෂිණ" යන දිග්වාචකශබ්දය "අග්නි" ශබ්දය හා තුල්‍යාර්ථත්වයෙන් සමාසයි, ඉන් තත්සංඥක අග්නිය ප්‍රකාශිතයි. "සප්තග්‍රාමාඃ" යන තන්හි එසේම "සප්තන්" යන සංඛ්‍යාවාචකශබ්දය "ග්‍රාම" ශබ්දය හා සමාසයි. ඉන් තත් සංඥක ග්‍රාමවිශෙෂ ප්‍රකාශිතයි). මේ සමාසයෝ විග්‍රහරහිතවෙත්. මෙහි විග්‍රහරහිතත්වය ප්‍රකාශ කරන්නාහු "සංඥායාමිති පදෙන" යනාදිය කීහු. එනම් සංඥාර්ථයෙහි යයි කීමෙන් නිත්‍යසමාසය වේ යයිද නිත්‍යසමාසය විග්‍රහරහිතත්වයෙන් හා අස්වපදවිග්‍රහත්ව යෙන් ද්විවිධ වේයයිද, ඒ විග්‍රහයද ස්වකීය සමස්‍යමානපදවලින්, හෝ සමස්‍යමානපදයන්ගෙන් අන්‍යවූ පදයන්ගෙන් කරණලද්දේ වේයයි දෙවැදෑරුම් බවද කීහු. මෙහි කී "දක්ෂිණාග්නිඃ සප්ත ග්‍රාමාඃ" යනු විග්‍රහරහිතත්වයෙන් නිත්‍යසමාසයි. "ලම්බකර්ණඃ" යනු අස්වපදවිග්‍රහත්වයෙන් නිත්‍යසමාසයි. එනම්-වාක්‍යයෙහි යොජිත "යස්‍ය" යන්න සමස්‍යමානපදයන්ගෙන් අතිකක් බැවිනි. අව්‍යයීභාවසමාසයද අස්වපදවිග්‍රහනිත්‍යසමාසයි. "දධ්නා ජිතනාං= දධ්‍යජිතනාම්" යනාදිය ස්වපදවිග්‍රහත්වයෙන් අනිත්‍යසමාසයි.

මෙහි දක්වනලද ෂට්සමාසය ප්‍රධානවශයෙන් චතුර්විධයයි පාණිනීයාදියෙහි ප්‍රකාශිතයි. එනම් "අව්‍යයීභාව තත්පුරුෂ බහුව්‍රීහි ද්වන්ද්ව" යන මොහුයි. එහි කර්මධාරයසමාසය තත්පුරුෂ විශෙෂයක්යයිද, ද්විගුසමාසය ඒ කර්මධාරය විශෙෂයක්යයිද කීහු. මේ ෂට්සමාසය ප්‍රභෙදවශයෙන් දක්වන්නාවූ ඇතැම් වෛයා කරණයෝ:-

"ෂට් සමාසාශ්ච සංක්ෂෙපාදෂ්ටාවිංශතිධා පුනඃ,
නිත්‍යානිත්‍යත්වයොගෙන ලුගලුක්ත්වෙන ච ද්විධා.
තත්‍රාෂ්ටධා තත්පුරුෂඃ සප්තධා කර්මධාරයඃ,
සප්තධා ච බහුව්‍රීහිර්ද්විගුරුභාෂිතො ද්විධා.
ද්වන්ද්වශ්චතුර්විධො ඥෙයොඃව්‍යයීභාවො ද්විධා මතඃ,
තෙෂාං පුනඃ සමාසානාං ප්‍රාධාන්‍යං ස්‍යාච්චතුර්විධම්."

යනු කීහු. සංක්ෂෙපයෙන් සමාස සයක්බවද, ඒ සය ප්‍රභෙද වශයෙන් විසිඅටක් බවද, නිත්‍යානිත්‍යවශයෙන් හෝ ලුක්අලුක් වශයෙන් දෙවැදෑරුම් බවද-තත්ප්‍රභෙදයෙහි තත්පුරුෂසමාසය අටවැදෑරුම් බවද, කර්මධාරය හා බහුව්‍රීහිසමාසය සත්වැදෑරුම් බවද, ද්විගුසමාසය දෙවැදෑරුම් බවද, ද්වන්ද්වය සිව්වැදෑරුම් බවද,

අව්‍යයීභාවය දෙවැදෑරුම්බවද, ඒ සියලුම සමාසයන්ගේ ප්‍රධානත්වය සිව්වැදෑරුම් බවදයනු එහි භාවයයි. එහි තත්පුරුෂ සමාසයාගේ අෂ්ටවිධත්වය නම්-ප්‍රථමාදි සප්තවිභක්තීන්ගේ පූර්වත්වයෙන් හතක්ද නඤ්පූර්වත්වයෙන් එකක්දැයි වේ. එහි 'පූර්වං කායස්‍ය=පූර්වකායඃ" යනාදියෙහි පූර්වපදය ප්‍රථමාව බැවින් ප්‍රථමාපූර්වක තත්පුරුෂයි. මෙසේ ප්‍රථමාවෙන් "පූර්ව, අපර, අධර උත්තර" යනාදීශබ්දයෝ පූර්ව යෙදෙත්. අනිත් උදාහරණ මෙහි කී "කෘෂ්ණශ්‍රිතඃ" යනාදිය මෙති. කර්මධාරයාගේ සප්තවිධත්වය නම් "විශේෂණ පූර්වපදය, විශේෂ්‍යපූර්වපදය, විශේෂණෝභයපදය, උපමාන පූර්වපදය, උපමානෝත්තරපදය, සම්භාවනාපූර්වපදය, අවධාරණ පූර්වපදය" කියායි. "නීලොත්පලම්, ගොගර්භිණී, ශීතොෂ්ණම්, ශඞ්ඛපාණ්ඩුරඃ, නරසිංහඃ, ගුණබුද්ධිඃ, ගුණධනම්" යනු පිළිවෙළින් උදාහරණයි. මෙහි උපමාන පූර්වපදසමාසාදියෙහි "ශඞ්ඛ ඉව පාණ්ඩුරඃ නරඃ සිංහ ඉව, ගුණ ඉති බුද්ධිඃ, ගුණ එව ධනම්" යි විග්‍රහ වාක්‍යයෝ යෙදියයුතුයි. බහුව්‍රීහිසමාසයාගේ සප්තවිධත්වය නම්- 'ද්විපද, බහුපද, සඞ්ඛ්‍යෝත්තරපද, සඞ්ඛ්‍යෝභය..ද සහ පූර්වපද, ව්‍යතිහාර ලක්ෂණ, දිගන්තරාල ලක්ෂණ" යනුයි. ද්විපදබහුපදත්වය පෙර කියනලදී. "උප සමීපෙ දශානාං යෙ සන්ති තෙ=උපදශාඃ" යනු සඞ්ඛ්‍යෝත්තරපදයි. "ද්වෞ වා ත්‍රයො වා=ද්විත්‍රාඃ" යනු සඞ්ඛ්‍යෝභයපදයි. සහපූර්වපදය පෙර කියනලදී. "කෙශෙෂු කෙශෙෂු ගෘහීත්වා ඉදං යුද්ධං ප්‍රවෘත්තං=කෙශාකෙශි" යනු ව්‍යතිහාර ලක්ෂණයි. "දක්ෂිණස්‍යාඃ පූර්වස්‍යාශ්ච දිශො යදන්තරාලං සා=දක්ෂිණපූර්වා" යනු දිගන්තරාල ලක්ෂණයි. ද්විගුසමාසයාගේ ද්විවිධත්වය පෙර කියනලදී. ද්වන්ද්වසමාසය චතුර්විධයයි කී නුමුත් පෙර කී සමාහාරෙතරයොගවශයෙන් දෙවැදෑරුම්බැව් පෙණේ. චතුර්විධ වන්නේ චකාරාර්ථයි. එය ද්විවිධයයි ගත්කල සමාස ප්‍රභේද සවිස්සකි, අව්‍යයීභාවසමාසයාගේ ද්විවිධත්වය නම්- "නාම පූර්වපද, අව්‍යය පූර්වපද" වශයෙනි. 'ශාකස්‍ය ලෙශඃ=ශාකප්‍රති" යනු නාමපූර්වපදයි. අව්‍යයපූර්වපදය පෙර කියනලදී. සමාසයන්ගේ නිත්‍යාදි භෙදනම්- 'ප්‍රකර්ෂෙණ වරඃ=ප්‍රවරඃ" යනාදිය නිත්‍යයි. "රාජපුරුෂඃ" යනාදිය අනිත්‍යයි. "කෘෂ්ණශ්‍රිතඃ" යනාදිය ලුක්ත සමාසයි. "කණ්ඨෙකාලඃ" යනාදිය අලුක්තසමාසයි.

සමාසයන්ගේ ඒ ඒ පදයන් සම්බන්ධ ප්‍රධානත්වය ප්‍රකාශ කරන්නාවූ බොහෝ වෛයාකරණයෝ අව්‍යයීභාවසමාසය පූර්වපදාර්ථප්‍රධානයයිද, තත්පුරුෂය උත්තරපදාර්ථප්‍රධානයයිද, ද්වන්ද්වය උභයපදාර්ථප්‍රධානයයිද, ද්විගුසමාසය සඞ්ඛ්‍යාපූර්වාන්‍යාර්ථ ප්‍රධානයයිද, බහුව්‍රීහිසමාසය අන්‍යපදාර්ථප්‍රධානයයිද, විශේෂණපූර්වකර්මධාරය උත්තරපදාර්ථප්‍රධානයයිද, විශේෂ්‍ය පූර්වකර්මධාරය පූර්වපදාර්ථප්‍රධානයයිද කීහු.

සමාසප්‍රක්‍රියාර්ථව්‍යාඛ්‍යා නිමි.

අථ තද්ධිතො නිරූප්‍යතෙ.

293 අපත්‍යෙ'ණ්. (අපත්‍යෙ 7, 1; අණ් 1, 1;)

b නාම්නො 'පත්‍යෙ'ර්ථෙ'ණ්ප්‍රත්‍යයො භවති. "උපගොරපත්‍යං පුමාන්"ති විග්‍රහෙ "උපගොඃ-අණ්" ඉති ස්ථිතෙ:- "සමාසප්‍රත්‍යයයොඃ" (318. ප්‍රඃ සූඃ) ඉති ෂෂ්ඨීලොපඃ, ණකාරො වෘද්ධ්‍යර්ථ ඤබර්ථශ්ච.

අන්‍යොන්‍යසම්බන්ධය ඇත්තාවූ ඒ ඒ විභක්ත්‍යන්තපදයන්ගේ විභක්තිලොපාදියෙන් ඓකපද්‍ය කොට භාෂාවෙහි ලියන කියන ක්‍රමයවූ සමාසප්‍රක්‍රියාව දක්වා නැවත ඇතැම් තන්හි සමස්‍යමානපද කිපයකින් ගම්‍යමාන අර්ථයන් ප්‍රත්‍යවත් කිරීමෙන් එකපදයක් කොට ලියන කියන විධිය පවසනු වස් "අථතද්ධිතො නිරූප්‍යතෙ" යනාදිය කීහු.

a අථ' සමාසප්‍රක්‍රියාවට අනතුරුව; තද්ධිතඃ, තද්ධිතප්‍රත්‍යය සමූහය; නිරූප්‍යතෙ, ප්‍රකාශකරණු ලැබේ.

293 අපත්‍ය, අපත්‍යාර්ථයෙහි (දරුය යන අර්ථයෙහි); අණ්, (ෂෂ්ඨී විභක්ත්‍යන්ත නාමයා කෙරෙන්) "අණ්" ප්‍රත්‍යය වේ.

b නාම්නඃ, (ෂෂ්ඨ්‍යන්ත) නාමයා කෙරෙන්; අපත්‍යෙ අර්ථෙ, අපත්‍යාර්ථයෙහි; අණ්ප්‍රත්‍යයඃ භවති, අණ්ප්‍රත්‍යය වේ. උපගොරපත්‍යං පුමාන් ඉති, "උපගොරපත්‍යං පුමාන්" යන; (උපගොඃ, උපගුනම් තැනැත්තහුගේ; අපත්‍යම්, දරුතෙම; පුමාන් ඉති, පුරුෂවූයේ නුසියන); විග්‍රහෙ, විග්‍රහවාක්‍යයෙහි; උපගොඃ අණ් ඉති, "උපගොඃ-අණ්" කියා; ස්ථිතෙ සිටිකල්හි; සමාසප්‍රත්‍යයයොඃ ඉති, 'සමාසප්‍රත්‍යයයොඃ" යන සූත්‍රයෙන්; ෂෂ්ඨීලොපඃ, ෂෂ්ඨීවිභක්තිලොපය වේ. ණකාරඃ, (අණ් ප්‍රත්‍යයාගේ) ණකාරය; වෘද්ධ්‍යර්ථඃ, වෘද්ධිය ප්‍රයොජනකොට ඇත්තේද; ඤබර්ථශ්ච, ඤප් ප්‍රත්‍යය ප්‍රයොජනකොට ඇත්තේද වේ.

"තස්‍ය සමාසස්‍ය හිතො, යද්වා තෙෂාං පූර්වොක්තානාං නාමාදීනාමර්ථාන්තරප්‍රකාශනෙන හිතඃ තද්ධිතඃ" යනුවෙන් ටීකාකාරයො"තද්ධිත" ශබ්දයාගේ අර්ථය ප්‍රකාශකෙරෙත්, පූර්වොක්ත සමාසාර්ථයට හිතවූයේ හෝ පූර්වොක්ත නාමාදීන්ගේ අර්ථභෙදයක් ප්‍රකාශකිරීමෙන් යුක්තවූයේ හෝ තද්ධිතය යනු එහි අර්ථයි.

294. ආදිස්වරස්‍ය ඤ්ණිති ච වෘද්ධිඃ.

(ආදිස්වරස්‍ය 6, 1; ඤ්ණිති 7; 1; ච 1, 1; වෘද්ධිඃ 1, 1;)

a ස්වරාණාං මධ්‍යෙ ය ආදිස්වරස්තස්‍ය වෘද්ධිර්භවති ඤිති ණිති ච තද්ධිතෙ පරතඃ. උකාරස්‍යෞකාරො වෘද්ධිඃ.

295. වො'ව්‍යස්වරෙ. (වොඃ 6, 2; අව් 1, 1; යස්වරෙ 7, 1;

b උවර්ණස්‍යෞකාරස්‍ය ච අව් භවති ස්වරෙ යකාරෙ ච පරෙ. "කෘත්තද්ධිතසමාසාශ්ච" ති නාමත්වම්. නාමත්වාත්ස්‍යාදයඃ; ඖපගවඃ. වසිෂ්ඨස්‍යාපත්‍යං=වාසිෂ්ඨඃ. ගෞතමස්‍යාපත්‍යං=ගෞතමඃ. "ශිවාදිභ්‍යශ්ච ත්‍යණ් වක්තව්‍යඃ"- අන්‍යථා ඉඤ්ඃ ප්‍රාප්තිඃ. ශිවස්‍යාපත්‍යං=ශෛවඃ, විදෙහස්‍යාපත්‍යං=වෛදෙහඃ.

මෙහි "උපගොඃ අපත්‍යම්" යන වාක්‍යයෙහි සමාසත්වයෙන් හෝ භින්නපදත්වයෙන් පදවයකින් ගතයුතු අර්ථය එකපදයකින් ගැණීම පිණිස "අපත්‍ය" යන්න වෙනුවට "අණ්" ප්‍රත්‍යය නියම කරණලදී. එකල්හි ඒ ප්‍රත්‍යයෙහි අපත්‍යාර්ථය ඇති බැවින් "උක්තාර්ථානාමප්‍රයොගඃ" යන න්‍යායයෙන් "අපත්‍ය" ශබ්දය අප්‍රයොගකරණලදී. හෙවත් ලොප් කරණලදී. පසුව "උපගොඃ" යනතන්හි ෂෂ්ඨීවිභක්තියද ලොප් වේ, එකල්හි "උපගු-අ"කියා සිටි' පසුව වක්ෂ්‍යමාණ සූත්‍රවලින් වෘද්ධ්‍යාදිය කටයුතුයි.

294 ඤ්ණිති ච, ඤකාරය ඉත්කොට ඇත්තක් හෝ ණකාරය ඉත්කොට ඇත්තක්ද පරකල්හි; ආදිස්වරස්‍ය, (ස්වරයන් අතුරෙන්) ආදිස්වරයට; වෘද්ධිඃ, වෘද්ධි වේ.

a ඤිති, ඤකාරය ඉත්කොට ඇත්තාවූද; ණිති ච, ණකාරය ඉත්කොට ඇත්තාවූද; තද්ධිතෙ පරතඃ, තද්ධිතප්‍රත්‍යය පරකල්හි; ස්වරාණාං මධ්‍යෙ, ස්වරයන් අතුරෙහි; යඃ ආදිස්වරඃ, යම්ආදිස්වරයක් වේද; තස්‍ය, ඕහට; වෘද්ධිඃ භවති, වෘද්ධි වේ. (එහෙයින්)උකාරස්‍ය, (මෙහි) උකාරයට; ඖකාරඃ, ඖකාරය; වෘද්ධිඃ, වෘද්ධි වේ. ("අණ්" ප්‍රත්‍යයෙහි ණකාරය ඉත්බැවින් "උපගු" ශබ්දයෙහිආදි ස්වරයවූ උකාරයට ඖකාරය වෘද්ධිවීමෙන් "ඖපගු අ" කියාවේ).

295 යස්වරෙ, යකාරය හෝ ස්වරය පරකල්හි; වොඃ, උවර්ණ ඔකාරදෙකට; අව්, "අව්" ආදෙශවේ.

b ස්වරෙ, ස්වරයා පරකල්හිද: යකාරෙ ච පරෙ, යකාරය පරකල්හිද; උවර්ණස්‍ය, උවර්ණයටද; ඔකාරස්‍ය ච, ඔකාරයටද;

296. ඍත උරණ්. (ඍතඃ 6, 1; උර් 1, 1; අණි 7, 1;)

a මාතෘශබ්දස්‍ය ඍකාරස්‍ය උර් භවති අණි පරෙ. "ෂොඪඃ" "ද්විනාමදෙකභෙව" ඉති සූත්‍රනිර්දේශාත්සච්ඡිද්‍රපදෙනෙනාපි ඛ්‍යානාං ඤමා එෂටව්‍යාඃ. ෂණ්ණාං මාතෘණාමපත්‍යං= ෂාණ්මාතුරඃ, තිසෘණාං මාතෘණාමපත්‍යං= ත්‍රෛමාතුරඃ. ද්වයොර්මාත්‍රොරපත්‍යං= ද්වෛමාතුරඃ.

අව් භවති, අව් ආදෙශ වේ. කෘතතද්ධිතසමාසාශ්ච ඉති, 'කෘතතද්ධිතසමාසාශ්ච" යනුවෙන්; නාමත්වම්, නාමභාවය වේ. නාමත්වාත්, නාමභාවයෙන්; ස්‍යාදයඃ, සි ආදි විභක්තීහු වෙත්. ඖපගවඃ, (එකල්හි) "ඖපගවඃ" යනු වේ. ('ඖපගවඃ" යනු උපගුහුගේ පුත්‍රතෙමේයි; දුහිතෘවක් වාච්‍යකල්හි "ඖපගවී" යනු වේ). වසිෂ්ඨස්‍ය, වසිෂ්ඨයාගේ; අපත්‍යම්, දරුතෙම; වාසිෂ්ඨඃ, "වාසිෂ්ඨ" නම් වේ. ගොතමස්‍ය, ගොතම නම් තැනැත්තහුගේ, අපත්‍යං, දරුතෙම; ගෞතමඃ, "ගෞතම" නම් වේ. ශිවාදිභ්‍යශ්ච ඉති, "ශිව" ශබ්දාදීන් කෙරෙන්ද "අණ්" වේ යයි පාණිනීයූක්ත බැවින්; අණ්, (මෙහි) අණ්ප්‍රත්‍යය; වක්තව්‍යඃ, ("ශිව") ශබ්දාදීන් කෙරෙන්ද කියයුතුයි. "ඉඤ්" ප්‍රත්‍යයාගේ; ප්‍රාප්තිඃ, පැමිණීම; අන්‍යථා, මෙයින් අන්පරිද්දෙකින් වේ; හෙවත් මින් අන්තන්හි වේ. ශිවස්‍ය, "ශිව" නමැත්තහුගේ; අපත්‍යම්, පුත්‍රතෙම; ශෛවඃ, "ශෛව" නම් වේ. විදෙහස්‍ය, "විදෙහ" නම් රජහුගේ; අපත්‍යම්, පුත්‍රතෙම; වෛදෙහඃ, ' වෛදෙහ නම් වේ.

පූර්වයෙහි "ඖපගු-අ" කියා තුබූ තන්හි "වොව්‍යස්වරෙ" යන සූත්‍රයෙන් ස්වරයා පරනිමිත්තෙන් ගකාරස්ථ උකාරයට "අව්" ආදෙශ කොට ස්වරරූසකළ කල්හි "ඖපගව" කියා වේ. පසුව නම්වත් කොට වක්තෘවිවක්ෂා වශයෙන් ස්‍යාදිවිභක්ති යෙදූ කල්හි "ඖපගවඃ" යනාදී වශයෙන් වේ. සෙසු තන්හිද මේ ක්‍රමයෙන් දතයුතුයි. තවද මෙහි වාක්‍යයෙහි "පුත්‍ර, දුහිතෘ" ආදි ශබ්දයක් නොගෙණ "අපත්‍ය" ශබ්දයම ගන්නාලද්දේ ස්ත්‍රී පුරුෂවයට සාම්‍යයෙනි.

296. අණි, "අණ්" ප්‍රත්‍යයපරකල්හි; ඍතඃ, ("මාතෘ" ශබ්දයාගේ) ඍකාරයට; උර්, "උර්" ආදෙශ වේ.

a අණිපරෙ, "අණ්" ප්‍රත්‍යය පරකල්හි; මාතෘසබ්දස්‍ය, මාතෘ ශබ්දයාගේ; ඍකාරස්‍ය, ඍකාරයට; උර් භවති, "උර්" ආදෙශ වේ

297. අත ඉඤ් නෘෂෙඃ. (අතඃ 5,1; ඉඤ් 1,1; අනෘෂෙඃ 5,1;

a අකාරාන්තාන්නාම්නො 'නෘෂිශබ්දාදපත්‍යාර්ථෙ ඉඤ් ප්‍රත්‍යයො භවති, "යස්‍ය ලොපඃ" දෙවදත්තස්‍යාපත්‍යං=දෛවදත්තිඃ, ශ්‍රීධරස්‍යාපත්‍යං=ශෛ්‍රධරිඃ, දශරථස්‍යාපත්‍යං=දාශරථිඃ, පුරන්දරස්‍යාපත්‍යං= පෞරන්දරිඃ, ක්වචිදෘෂිශබ්දාදපි භවති, තෙන-ඖද්දාලකිඃ.

"ෂොඪඃ" යන සූත්‍රයෙන් ෂකාරයට ඪකාරය වේ. ණත්වමදෙශතො ඉති, "ණත්වමදෙශතො" යන; සූත්‍රනිර්දේශාත්, සූත්‍රනිර්දේශයෙන්; ක්වචිත්, කිසියම් ප්‍රයොගයෙක්හි; අපදාන්තෙ අපි, පදාන්තරහිත තන්හිද; ඛ්‍යසානාම්, ඛ්‍යසප්‍රත්‍යාහාරාක්ෂරයන්ට; ඤමාඃ, ඤමප්‍රත්‍යාහාරාක්ෂරයෝ; එෂ්ටව්‍යාඃ, කැමැතිවිය යුත්තාහ. ෂණ්ණාං මාතෘණාං, මාතෘන් සදෙනෙකුන්ගේ; අපත්‍යම්, පුත්‍රතෙම; ෂාණ්මාතුරඃ, "ෂාණ්මාතුර" නම් වේ. තිසෘණාං මාතෘණාම්, මාතෘන් තුන් දෙනෙකුන්ගේ; අපත්‍යං, පුත්‍රතෙම; ත්‍රෛමාතුරඃ, "ත්‍රෛමාතුර" නම් වේ. ද්වයොඃ මාත්‍රොඃ, මාතෘන් දෙදෙනෙකුගේ; අපත්‍යම්, පුත්‍රතෙම; ද්වෛමාතුරඃ, "ද්වෛමාතුර" නම් වේ.

"ෂාණ්මාතුරඃ" යන තන්හි "අණ්" ප්‍රත්‍යය පරනිමිත්තකොට මාතෘශබ්දස්ථ ඍකාරයට "උර්" ආදේශයි, තවද මෙහි පූර්වවූ "ෂෂ්" ශබ්දයාගේ අන්ත්‍ය ෂකාරයට ආදේශවූ ඪකාරයට පදාන්තය මෙන් සලකා "වාවසානෙ" යන සූත්‍රයෙන් ටකාරය හා ටකාරයට "ඤමෙ ඤමා වා" යන සූත්‍රයෙන් ණකාරයද විය. මෙහි අපදාන්තයමෙන් සැලකීම "ණත්වමදෙශතො" යන සූත්‍රයෙහි "ණත් මදෙශතො" යන තන්හි අපදාන්ත තකාරයට ණකාරය කොට නිර්දේශ කළ හෙයින් යයි කීහු. "ත්‍රෛමාතුරඃ" යනාදියෙහි "ත්‍රි, ද්වි ශබ්දයන්ගේ ඉකාරයට ඓකාරය වෘද්ධි විය.

297 අනෘෂෙඃ, ඍෂිවාචකශබ්ද තොරකොට ඇත්තාවූ; අතඃ, අකාරාන්තනාමයාකෙරෙන්; ඉඤ්, "ඉඤ්" ප්‍රත්‍යය වේ.

a අනෘෂිශබ්දාත්, ඍෂිවාචකශබ්ද තොරකොට ඇත්තාවූ; අකාරාන්තාත් නාම්නඃ, අකාරාන්ත නාමයාකෙරෙන්; අපත්‍යෙ අර්ථෙ, අපත්‍යාර්ථයෙහි; ඉඤ්ප්‍රත්‍යයඃ භවති, "ඉඤ්" ප්‍රත්‍යයවේ. 'යස්‍යලොපඃ" යන සූත්‍රයෙන් අකාරලොපය වේ. දෙවදත්තස්‍ය, දෙවදත්තයාගේ; අපත්‍යම්, පුත්‍රතෙම; දෛවදත්තිඃ, "දෛවදත්ති" නම් වේ. ශ්‍රීධරස්‍ය, ශ්‍රීධරයාගේ (විෂ්ණුහුගේ); අපත්‍යම්,

a "බාහ්වාදෙශ්ච"* බාහ්වාදෙඃ පර ඉඤ්ප්‍රත්‍යයො භවත්‍ය පත්‍යෙර්ථෙ. බාහොරපත්‍යං= බාහවිඃ, උපබින්දොරපත්‍යමෞපබින්දවිඃ, කෘෂ්ණස්‍යාපත්‍යං= කාෂ්ණිඃ, උඩුලොම්නොපත්‍යමෞඩුලොමිඃ, "නොවා" අග්නිශර්මණොපත්‍යමාග්නිශර්මිඃ,

පුත්‍රතෙම; ශෛ්‍රධරිඃ, "ශෛ්‍රධරි" නම් වේ. දසරථස්‍ය, දසරථ රජහුගේ; අපත්‍යම්, පුත්‍රතෙම; දාශරථිඃ, "දාශරථි" නම් වේ. පුරන්දරස්‍ය, පුරන්දරයාගේ (ශක්‍රයාගේ); අපත්‍යම්, පුත්‍රතෙම; පෞරන්දරිඃ, "පෞරන්දරි" නම් වේ. ක්වචිත්, කිසිතැනෙක්හි; ඍෂි ශබ්දාත් අපි, ඍෂිවාචකශබ්දයා කෙරෙන්ද; භවති, "ඉඤ්' ප්‍රත්‍යය වේ. තෙන, එහෙයින්; ඖද්දාලකිඃ, "උද්දාලකස්‍යාපත්‍යම්" යන වාක්‍යයෙහි "ඖද්දාලකි" නම් වේ. "උද්දාලක" නම් ඍෂිහුගේ පුත්‍රයාය යන අර්ථයි.

මෙහි පූර්වෝක්ත "අණ්" ප්‍රත්‍යය සාමාන්‍යවිධි වශයෙන්ද මේ "ඉඤ්" ප්‍රත්‍යය විශෙෂවිධි වශයෙන්ද කියනලදී. එනම්:- ඍෂිවාචක ශබ්දවර්ජිතවූ (ඍෂිවාචකශබ්දසමානවූ) අකාරාන්තනාම කෙරෙන් "ඉඤ්' ප්‍රත්‍යය වේයයි සූත්‍රොක්තයි. මෙහි "අතඉඤ්"යි යොගවිභාගත්වයෙන් "වෛදිඃ, ගාර්ගිඃ; ඖද්දාලකිඃ" යනාදි වශයෙන් ඍෂිවාචකවූ ඇතැම්තන්හිද "ඉඤ්" ප්‍රත්‍යය වේයයි ප්‍රසාදටීකායෙහි කියනලදී. තවත් "වාවාඩ්‍යාඃ" යන සූත්‍රයෙන් මණ්ඩූකප්ලුතිවශයෙන් වාශබ්දය අනුවර්තනය වන බවද, ඒ වාශබ්දයාගේ ව්‍යවස්ථාවාචකත්වයෙන් "ශිව" ශබ්දාදියකෙරෙන් "ඉඤ්" ප්‍රත්‍යය නොව "අණ්" ප්‍රත්‍යය වන බවද එහි කියත්. ලඝුභාෂ්‍යයෙහි යොගත්‍රයක් කොට මේ සූත්‍රයෙහි අරුත් පළ කෙරෙත්. එනම්:- අකාරාන්තනාමයාකෙරෙන් "අණ්" ප්‍රත්‍යය වේයයි කියා එක් යොගයක්ද, එසේම අකාරාන්තනාමයා කෙරෙන් "ඉඤ්" ප්‍රත්‍යයද වේයයි එක් යොගයක්ද, ඍෂිසදෘශ මනුෂ්‍යවාචක අකාරාන්තයාකෙරෙන් "ඉඤ්" ප්‍රත්‍යය වේයයි එක් යොගයක් වේ.

a බාහ්වාදෙශ්ච, "බාහු" ශබ්දාදියකෙරෙන්ද "ඉඤ්" ප්‍රත්‍යය වේ. අපත්‍යෙ අර්ථෙ, අපත්‍යාර්ථයෙහි; බාහ්වාදෙඃ පරඃ, "බාහු" ශබ්දාදීයෙන් පරව; ඉඤ්ප්‍රත්‍යයඃ භවති, 'ඉඤ්" ප්‍රත්‍යය වේ. බාහොඃ, බාහුනැමැත්තහුගේ; අපත්‍යම්, පුත්‍රතෙම; බාහවිඃ, 'බාහවි" නම් වේ. උපබින්දොඃ, "උපබින්දු" නාමැත්තහුගේ; අපත්‍යම්, පුත්‍රතෙම; ඖපබින්දවිඃ, "ඖපබින්දවි" නම් වේ. කෘෂ්ණස්‍ය

* "බාහ්වාදිභ්‍යශ්ච"- සම්භර.

298. ණ්‍යායනණෙයණ්ණීයා ගර්ගනඩාත්‍රිස්ත්‍රී පිතෘෂ්වස්‍රාදෙඃ.

(ණ්‍යායනණෙයණ්ණීයාඃ 1, 3; ගර්ගනඩාත්‍රිස්ත්‍රීපිතෘෂ්වස්‍රාදෙඃ 5, 1;)

a ගර්ගාදෙර්නඩාදෙරත්‍ර්‍යාදෙඃ ස්ත්‍රීලිඞ්ගාත් පිතෘෂ්වස්‍රාදෙශ්ච ණ්‍ය ආයනණ් එයණ් ණීය ඉත්‍යෙතෙ ප්‍රත්‍යයා භවන්ති අපත්‍යෙඊර්ථෙ යථාසඞ්ඛ්‍යං, * ගර්ගස්‍යාපත්‍යං=ගාර්ග්‍යඃ, වත්සස්‍යාපත්‍යං=වාත්ස්‍යඃ. ජමදග්නෙරපත්‍යං=ජාමදග්න්‍යඃ, සොමස්‍යාපත්‍යං=සෞම්‍යඃ, නඩස්‍යාපත්‍යං=නාඩායනඃ, චරස්‍යාපත්‍යං= චාරායණඃ, චන්ද්‍රස්‍යාපත්‍යං= චාන්ද්‍රායනඃ, "අලුක් ක්වචිත්" අමුෂ්‍යාපත්‍යමාමුෂ්‍යායණඃ, "යස්‍ය ලොපඃ" අත්‍රෙරපත්‍යමාත්‍රෙයඃ, මෘකණ්ඩස්‍යාපත්‍යං= මාර්කණ්ඩෙයඃ, කපෙරපත්‍යං= කාපෙයඃ, ගඞ්ගායා අපත්‍යං= ගාඞ්ගෙයඃ, මහ්‍යා අපත්‍යං= මාහෙයඃ "ක්වචිත්ස්ත්‍රීලිඞ්ගාදණ් භවති"- භූමෙරපත්‍යං= භෞමඃ.

"කෘෂණ" නමැත්තහුගේ; අපත්‍යම්, පුත්‍රතෙම; කාර්ෂ්ණිඃ, "කාර්ෂ්ණි" නම් වේ. උඩුලොමිනඃ, "උඩුලොමන්" නමැත්තහුගේ; අපත්‍යම්, පුත්‍රතෙම; ඖඩුලොමිඃ, "ඖඩුලොමි" නම් වේ. "නොවං" යන සූත්‍රයෙන් මෙහි විසංඥලොපයයි අග්නිශර්මණඃ, "අග්නිශර්මන්" නමැත්තහුගේ; අපත්‍යම, පුත්‍රතෙම; ආග්නිශර්මිඃ, "ආග්නිශර්මි" නම් වේ. (මෙහි කී "බාහු" ශබ්දාදියනම්- "බාහු උපබාහු උපවාකු නිවාකු ශිවාකු වටාකු උපබින්දු වෘෂලී වෘකලා චූඩා බලාකා මූෂිකා කුශලා ජගලා ධ්‍රැවකා ධ්‍රැවකා සුමිත්‍රා දුර්මිත්‍රා පුෂ්කරසද් අනුහරත් දෙවශර්මන් අග්නිශර්මන් භද්‍රශර්මන් සුශර්මන් කුනාමන් සුනාමන් පඤ්චන් සප්තන් අෂ්ටන්" යන මේ ආදියයි.)

298 ගර්ගනඩාත්‍රිස්ත්‍රීපිතෘෂ්වස්‍රාදෙඃ,- ගර්ග "ගර්ග" ශබ්දාදිය; නඩ; "නඩ" ශබ්දාදිය; අත්‍රිස්ත්‍රී "අත්‍රි" ශබ්දාදිය හා ස්ත්‍රීලිඞ්ගශබ්දය, පිතෘෂ්වස්‍රාදෙඃ, පිතෘෂ්වසෘ ශබ්දාදිය යන මොහු කෙරෙන්; ණ්‍යා යන ණෙයණ්ණීයාඃ,- ණ්‍ය "ණ්‍ය" ප්‍රත්‍යය; ආයනණ්, "ආයනණ්" ප්‍රත්‍යය; එයණ්, "එයණ්" ප්‍රත්‍යය; ණීයාඃ, "ණීය" ප්‍රත්‍යය යන මොහු (අපත්‍යාර්ථයෙහි පිළිවෙළින්) වෙත්

a අපත්‍යෙඅර්ථෙ, අපත්‍යාර්ථයෙහි; ගර්ගාදෙඃ, ගර්ගාදිගණයා කෙරෙන්ද; නඩාදෙඃ, නඩාදිගණයාකෙරෙන්ද; අත්‍ර්‍යාදෙඃ, අත්‍ර්‍යාදිගණයාකෙරෙන් හා; ස්ත්‍රීලිඞ්ගාත්, ස්ත්‍රීලිඞ්ගශබ්දයා කෙරෙන්ද;

* "චකාරාත් පිතෘෂ්වස්‍රාදෙරෙයණ්ප්‍රත්‍යයො භවති" යනු ඇතැම්පොත්වල දක්නාලැබේ.

පිතෘෂ්වස්‍රාදෙඃ ච, පිතෘෂ්වස්‍රාදිගණයාකෙරෙන්ද; ණ්‍ය, "ණ්‍ය" ප්‍රත්‍යය; ආයනණ්, "ආයනණ්" ප්‍රත්‍යය; එයණ්, "එයණ්" ප්‍රත්‍යය; ණීයඃ ඉති, "ණීය" ප්‍රත්‍යය යන; එතෙ ප්‍රත්‍යයාඃ, මේ ප්‍රත්‍යයෝ; යථා සඞ්ඛ්‍යත, පිළිවෙළින්, භවන්ති, වෙත්. ගර්ගස්‍ය, "ගර්ග" නම් මුනිහුගේ; අපත්‍යම්, පුත්‍රතෙම; ගාර්ග්‍යඃ, "ගාර්ග්‍ය" නම් වේ. වත්සස්‍ය, "වත්ස" නම මුනිහුගේ; අපත්‍යං, පුත්‍රතෙම; වාත්ස්‍යඃ, "වාත්ස්‍ය" නම් වේ. ජමදග්නෙඃ, "ජමදග්නි" නම් මුනිහුගේ; අපත්‍යම්, පුත්‍රතෙම, ජාමදග්න්‍යඃ, "ජාමදග්න්‍ය" නම් වේ. සොමස්‍ය, සොමයා ගේ (චන්ද්‍රයාගේ), අපත්‍යං, පුත්‍රතෙම; සෞම්‍යඃ, "සෞම්‍ය" නම් වේ. (මේගර්ගාදියයි, මෙහි ණ්‍යප්‍රත්‍යයයි)-නඩස්‍ය, "නඩ" නැමැත් තහුගේ; අපත්‍යම්, පුත්‍රතෙම; නාඩායනඃ "නාඩායන" නම් වේ. චරස්‍ය, "චර" නමැත්තහුගේ; අපත්‍යම්, පුත්‍රතෙම; චාරායණඃ, "චාරායණ" නම් වේ. චන්ද්‍රස්‍ය, චන්ද්‍රයාගේ; අපත්‍යම්, පුත්‍රතෙම' චාන්ද්‍රායණඃ, "චාන්ද්‍රායණ" නම් වේ. "අලුක් ක්වචිත්" යන සූත්‍රයෙන් කිසිතැනෙක්හි විභක්තිලොපයනොවේ. අමුෂ්‍ය, (ප්‍රඛ්‍යාතවූ) අසවලාගේ; අපත්‍යම්, පුත්‍රතෙම; ආමුෂ්‍යායණඃ, "ආමුෂ්‍යායණ'; නම් වේ. (මේ නඩාදියයි. මෙහි"ආයනණ්"ප්‍රත්‍යයයි.) "යස්‍යලොපඃ" යන සූත්‍රයෙන් ඉකාරලොපය වේ. අත්‍රෙඃ, "අත්‍රි" නම් මුනිහුගේ; අපත්‍යම්, පුත්‍රතෙම; ආත්‍රෙයඃ, "ආත්‍රෙය" නම් වේ. මෘකණ්ඩස්‍ය, "මෘකණ්ඩ" නම් මුනිහුගේ; අපත්‍යම්; පුත්‍රතෙම; මාර්කණ්ඩෙයඃ "මාර්කණ්ඩෙය"නම් වේ. කපෙඃ, කපිහුගේ; අපත්‍යම්, පුත්‍රතෙම; කාපෙයඃ, 'කාපෙය" නම් වේ (මේ අත්‍ර්‍යාදියයි මෙහි 'එයණ්" ප්‍රත්‍යයයි.) ගඞ්ගායාඃ, ගඞ්ගාහුගේ; අපත්‍යම්, පුත්‍රතෙම; ගාඞ්ගෙයඃ, "ගාඞ්ගෙය" නම් වේ. මහ්‍යාඃ, මහිහුගේ; අපත්‍යම්, පුත්‍රතෙම, මාහෙයඃ, 'මාහෙය" නම් වේ. (මේ ස්ත්‍රීලිඞ්ගයා කෙරෙන් එයණ් ප්‍රත්‍යයයි)ක්වචිත්,කිසිතැනෙක්හි;ස්ත්‍රීලිඞ්ගාත්,ස්ත්‍රීලිඞ්ගයාකෙරෙන්; අණ් භවති,' අණ්"ප්‍රත්‍යය වේ. (එනම්)- භූමෙඃ, භූමිහුගේ; අපත්‍යම්, පුත්‍රතෙම; භෞමඃ, "භෞම" නම් වේ.

මෙහි ගර්ගාදිගණයාකෙරෙන් "ණ්‍ය" ප්‍රත්‍යයද, නඩාදිගණයා කෙරෙන් 'ආයනණ්" ප්‍රත්‍යයද, අත්‍ර්‍යාදිගණයාකෙරෙන් හා ස්ත්‍රීලිඞ්ගයා කෙරෙන් "එයණ්" ප්‍රත්‍යයද පිතෘෂ්වස්‍රාදියකෙරෙන් "ණීය" ප්‍රත්‍යයද වේ. එහි 'ගර්ග වත්ස අජ අගස්ති පුලස්ති චමස රෙභ අග්නිවෙශ ශඞ්ඛ ශක ධනඤ්ජය" යනාදිය ගර්ගාදියයි. "නඩ තර චීප කාශ්‍යප දණ්ඩින් හස්තින් බදර අශ්වල දණ්ඩ්‍ය"

a “මාතෘපිතෘභ්‍යාං ස්වසා”–මාතෘපිතෘභ්‍යාං ශබ්දාභ්‍යාං පරස්‍ය ස්වසෘශබ්දස්‍ය ෂකාරඃ ස්‍යාත්සමාසෙ සති. පිතුඃ ස්වසා=පිතෘෂ්වසා, පිතෘෂ්වසුරපත්‍යං=පෛතෘෂ්වස්‍රීයඃ. මාතුඃ ස්වසා=මාතෘෂ්වසා, මාතෘෂ්වසුරපත්‍යං=මාතෘෂ්වස්‍රීයඃ.

b “ඪකි ලොපඃ” පිතෘෂ්වසුරන්තස්‍ය ලොපඃ ස්‍යාද්ඪකි, (අත එව ඪක්).

c “ආයනෙනයීනීයියඃ ඵඪඛඡඝාං ප්‍රත්‍යයාදීනාම්”–ප්‍රත්‍යයාදිභූතානාං ඵාදීනාං ක්‍රමාදායනාදය ආදෙශාඃ ස්‍යුඃ. (ආයන් එය් ඊන් ඊය් ඉය් එතෙ ආයනාදයඃ).

යනාදිය තඩාදියයි. “අති ශුභ්‍ර පූරු මෘකණ්ඩු පාණ්ඩු කද්‍රූ බ්‍රහ්ම කුමාරිකා රොහිණී” යනාදිය අභ්‍යාදියයි. මේ ප්‍රත්‍යයන්ගේ ණකාරය වෘද්ධිය පිණිසයි.

a මාතෘපිතෘභ්‍යාම්, “මාතෘපිතෘ” ශබ්දයන් කෙරෙන් පරවූ; ස්වසා, “ස්වසෘ” ශබ්දයාගේ ආදිසකාරයට මූර්ධන්‍ය ෂකාරය වේ. (මෙහි “ස්වසා” යනු වෛදිකප්‍රයොගවශයෙන් ෂෂ්ඨ්‍යර්ථයෙහි ප්‍රථමායි) මාතෘපිතෘභ්‍යාං ශබ්දාභ්‍යාං පරස්‍ය, “මාතෘපිතෘ” ශබ්දදෙකෙන් පරවූ; ස්වසෘශබ්දස්‍ය, “ස්වසෘ” ශබ්දයාගේ ආදියට; සමාසෙ සති, සමාසය ඇති කල්හි; ෂකාරඃ ස්‍යාත්, ෂකාරය වන්නේය. පිතුඃ, පියාගේ; ස්වසා, සහොදරිය; පිතෘෂ්වසා, “පිතෘෂ්වසෘ” නම් වේ. පිතෘෂ්වසුඃ, පියාගේ සහෝදරියගේ (නැන්දනියගේ); අපත්‍යම්, පුත්‍රතෙම; පෛතෘෂ්වස්‍රීයඃ, “පෛතෘෂ්වස්‍රීයඃ” නම් වේ. මාතුඃ, මවගේ; ස්වසා, සහොදරිය; මාතෘෂ්වසා, “මාතෘෂ්වසෘ” නම් වේ. මාතෘෂ්වසුඃ, මවගේ සහෝදරියගේ (කුඩාමවගේ); අපත්‍යම්, පුත්‍රතෙම; මාතෘෂ්වස්‍රීයඃ, “මාතෘෂ්වස්‍රීය” නම් වේ. (මෙහි “ඡීය” ප්‍රත්‍යයයි)

b ඪකි, ‘ඪක්” ප්‍රත්‍යය පරකල්හි; ලොපඃ, “පිතෘෂ්වසෘ” ශබ්දාන්තයට ලොප් වේ. ඪකි, “ඪක්” ප්‍රත්‍යය පරකල්හි; පිතෘෂ්වසුඃ, “පිතෘෂ්වසෘ” ශබ්දයාගේ; අන්තස්‍ය, අන්ත ඍකාරයට; ලොපඃ, ස්‍යාත්, ලොප්වන්නේය. අතඃ එව, එහෙයින්ම හෙවත් ඪක් ප්‍රත්‍යය පරකල්හි යයි ඥාපකහෙතුවෙන්ම; ඪක්, “ඪක් ප්‍රත්‍යය වේ.

c ප්‍රත්‍යයාදීනාම්, ප්‍රත්‍යයන්ගේ ආදිවර්ණවූ; ඵඪඛඡඝාම්, ඵඪ ඛඡඝ” යන මොවුන්ට; ආයනෙනයීනීයියඃ, “ආයන් එය්, ඊන් ඊය්

a “කිති ච”–කිති තද්ධිතෙ පරෙ අචාමාදෙරචො වෘද්ධිඃ ස්‍යාත්. පෛතෘෂ්වසෙයඃ. “මාතෘෂ්වසුශ්ච” –පිතෘෂ්වසුර්‍යදුක්තං තදස්‍යාපි ස්‍යාත්. මාතෘෂ්වසෙයඃ

ඉය්” යන මොහු වෙත්. ප්‍රත්‍යයාදිභූතානාං, ප්‍රත්‍යයන්ගේ ආදි වර්ණවූ; ඵාදීනාම්, ඵකාරාදීන්ට; ක්‍රමාත්, පිළිවෙළින්; ආයනාදයඃ ආදෙශාඃ ස්‍යුඃ, ආයන් ආදි ආදෙශයෝ වන්නාහ. ආයන් එය් ඊන් ඊය් ඉය් එතෙ, “ආයන්-ඉය්” යන මොහු; ආයනාදයඃ, “ආයන්” යනාදිහුයි.

a කිති ච, කයන්න ඉත්කොට ඇති තද්ධිතයා පරකල්හිද ආදි ස්වරයට වෘද්ධිවේ. කිති තද්ධිතෙ පරෙ, කයන්න ඉත්කොට ඇති තද්ධිතයා පරකල්හි; අචාම්, ස්වරයන් අතුරෙන්; ආදෙඃ අචඃ, ආදිස්වරයට; වෘද්ධිඃ ස්‍යාත්, වෘද්ධි වන්නේය. පෛතෘෂ්වසෙයඃ, (එකල්හි) “පෛතෘෂ්වසෙය” නම් වේ. (විග්‍රහව හා අර්ථ පෙර මෙනි). මාතෘෂ්වසුඃ ච, “මාතෘෂ්වසෘ” ශබ්දය සම්බන්ධ කාර්‍ය්‍යයද “පිතෘෂ්වසා” ශබ්ද සම්බන්ධ කාර්‍ය්‍යය මෙනි. පිතෘෂ්වසුඃ, ‘පිතෘෂ්වසෘ” ශබ්දය සම්බන්ධව; යත් උක්තම්, යමක් කියනලද්දේද; තත්, එය; අස්‍ය අපි, මේ “මාතෘෂ්වසෘ” ශබ්දයටද; ස්‍යාත්, වන්නේය. “මාතෘෂ්වසෙයඃ” යනු ඊට උදාහරණයි.

මෙහි “පෛතෘෂ්වසෙයඃ මාතෘෂ්වසෙයඃ” යන පදයන්ගේ සිද්ධියෙහි “ඪකි ලොපඃ” යන පාණිනීය සූත්‍රය ගෙණ හැරදක්වා “ඪක්” ප්‍රත්‍යය පරකල්හි යථොක්තශබ්දාන්තයට ලොපය නියමිතයි. එහෙයින්ම මෙහි ශබ්දකෙරෙන් මේ සූත්‍රයෙන්ම ‘ඪක්” ප්‍රත්‍යය වූ බවද දන්වනලදී. පසුව “ආයනෙනයී” යනාදි සූත්‍රයෙන් ප්‍රත්‍යයන්ගේ ආදි වර්ණවූ ස්වර රහිත ඵකාරාදීන්ට ‘ආයන්” ආදි ආදෙශයෝද වෙත්යයි කියනලදී. මෙහි කී “ඪක්” ප්‍රත්‍යයේ කයන්න ඉත්සංඥයි. “ඪ” යන්නෙහි ආදිභාගයවූ “ඪ්” යන්නට මේ සූත්‍රයෙන් “එය්” ආදෙශ කොට “ඪ” යන්නෙහි සිටි “අ” යන්න හා යෙදූකල “එය ’ යනු වේ. පසුව “කිති ච” යන්නෙන් වෘද්ධි කළ කල්හි “පෛතෘෂ්වසෙය” යනාදිය වේ. මෙහි කී ප්‍රත්‍යයාදි “ඵ ඪ ඛ ඡ ඝ” යන මොහු නම් පාණිනීය සූත්‍රොක්ත “ඵක්, ඪක්, ඛ, ඡණ්, ඝ” යනාදි ප්‍රත්‍යයන්ගේ ඵාදිහුයි. මෙහි ස්වර රහිත “ඵ, ඪ, ඛ, ඡ, ඝ” යන මොවුන්ට “ආයන්, එය්, ඊන්,

a “මාතෘපිතෘභ්‍යාං පිතරි ඩාමහච්”-ආභ්‍යාං පරෙ ඩාමහච් ප්‍රත්‍යයෝ භවති. මාතුඃ පිතා=මාතාමහඃ, පිතුඃ පිතා=පිතාමහඃ.*

299 ලුක් බහුත්වෙ ක්වචිත්.

(ලුක් 1, 1; බහුත්වෙ 7, 1; ක්වචිත් 7, 1;)

b අපත්‍යෙ’ර්ථෙ උත්පන්නස්‍ය ප්‍රත්‍යයස්‍ය බහුත්වෙ සති ක්වචිදෘෂිවිෂයෙ’නෘෂිවිෂයෙ ච ලුග් භවති. ගර්ගස්‍යාපත්‍යානි පුමාංසඃ=ගර්ගාඃ. (බහුත්වවිවක්ෂායාං ජස්) අත්‍රෙරපත්‍යානි=අත්‍රයඃ, “එඞ ජසි” විදෙහස්‍යාපත්‍යානි=විදෙහාඃ.

ජ්‍ය්, ඉය්” යන මොහු පිළිවෙළින් ආදෙශ වෙත්. “නාඩායනඃ, පෛතෘෂ්වසෙයඃ, කුලීනඃ, පෛතෘෂ්වස්‍රීයඃ, ක්ෂත්‍රියඃ” යනු පිළිවෙළින් මෙකී ප්‍රත්‍යයන්ට උදාහරණයි.

a පිතරි, පිත්‍රර්ථයෙහි, මාතෘපිතෘභ්‍යාම්, “මාතෘපිතෘ” ශබ්ද දෙකෙන් පරව; ඩාමහච්, “ඩාමහච්” ප්‍රත්‍යය වේ. ආභ්‍යාං පරඃ, මේ “මාතෘ පිතෘ” ශබ්ද දෙකෙන් පරව; ඩාමහච් ප්‍රත්‍යයඃ භවති, “ඩාමහච්” ප්‍රත්‍යය වේ. (මෙහි ඩයන්න හා චයන්න ඉත්සංඥයි. “ආමහ” ශෙෂයි. මාතුඃ, මවගේ; පිතා, පියතෙම; මාතාමහඃ, “මාතාමහ” නම් වේ. පිතුඃ, පියාගේ, පිතා, පියතෙම; පිතාමහඃ, “පිතාමහ” නම් වේ.

299 බහුත්වෙ, බහුවචනභාවය ඇතිකල්හි; ක්වචිත්, කිසි තැනෙක්හි; ලුක්, (අපත්‍යාර්ථප්‍රත්‍යයන්ට) ලොප් වේ (මෙහි “ලුක්” යන්නෙන් ලොපය ඇතිබැවින් ඒ ප්‍රත්‍යය නිමිතිකොට ඇති වෘද්ධ්‍යාදිය නොවේ.)

b බහුත්වෙ සති, බහුවචන භාවය ඇතිකල්හි; ක්වචිත්, කිසි තැනෙක්හි; ඍෂිවිෂයෙ, ඍෂිවාචක ශබ්දවිෂයෙහිද; අනෘෂිවිෂයෙච, ඍෂිවාචකරහිත ශබ්දවිෂයෙහිද; අපත්‍යෙ අර්ථෙ උත්පන්නස්‍ය, අපත්‍යාර්ථයෙහි උපන්නාවූ; ප්‍රත්‍යයස්‍ය, ප්‍රත්‍යයට; ලුක් භවති, ලොප් වේ. ගර්ගස්‍ය, ගර්ගමුනිහුගේ; අපත්‍යානි, දරුවෝ; පුමාංසඃ, පුරුෂ වූවාහු; ගර්ගාඃ, “ගර්ගා” නම් වෙ[illegible]. (මෙහි “ණ්‍ය” ප්‍රත්‍යයලොපයයි). බහුත්වවිවක්ෂායාම්, බහුවචනභාවය කියනු කැමැත්තෙහි, ජස්, “ජස්” විභක්තියයි. ආත්‍රෙ:, “අත්‍රි” නම්

* “මාතෘපිතෘභ්‍යාං ස්වසා” යනු ආදිකොට ඇති මේ පාණිනිය සූත්‍ර වෘත්‍යාදිය බොහෝ පොත්වල නොපැණේ.

a “භෘගවත්‍රිකුත්සාඞ්ගිරොවසිෂ්ඨගොතමදෙශතුල්‍යාඛ්‍යක්ෂත්‍රියෙභ්‍යඃ පරස්‍ය ප්‍රත්‍යයස්‍ය ලුග්භවති” =භාගවාඃ, කුත්සාඃ, වසිෂ්ඨාඃ.

300. දෙවතෙදමර්ථෙ. (දෙවතෙදමර්ථෙ) 7, 1;

මුනිහුගේ; අපත්‍යානි, පුත්‍රයෝ; අත්‍රයඃ, “අත්‍රි” නම් වෙත්. (මෙහි “එයණ්” ප්‍රත්‍යයලොපයයි) “එඞ ජසි” යන සූත්‍රයෙන් “ජස්” පරකල්හි ඉකාරයට එකාරයයි; විදෙහස්‍ය, විදෙහරජහුගේ; අපත්‍යානි, පුත්‍රයෝ; විදෙහාඃ, “විදෙහ” නම් වෙත්; (මෙහි “අණ්” ප්‍රත්‍යයලොපයයි).

a භෘග්වත්‍රි-ක්ෂත්‍රියෙභ්‍යඃ,=භෘගු, “භෘගු” ශබ්දය; අත්‍රි, “අත්‍රි” ශබ්දය; කුත්ස, “කුත්ස” ශබ්දය; අඞ්ගිරස්, “අඞ්ගිරස්” ශබ්දය; වසිෂ්ඨ, “වසිෂ්ඨ” ශබ්දය; ගොතම, “ගොතම” ශබ්දය; දෙශතුල්‍යාඛ්‍ය, දෙශයක් හා සමාන නම් ඇති ශබ්දය; ක්ෂත්‍රියෙභ්‍යඃ, ක්ෂත්‍රියවාචකශබ්දය යන මොවුන් කෙරෙන්; පරස්‍ය, පරවූ, ප්‍රත්‍යයස්‍ය, ප්‍රත්‍යයට; ලුග්භවති. (“ලුක්” යන්නෙන්) ලොප් වේ; භාගවඃ, (“භෘගොරපත්‍යානි” යන වාක්‍යයෙහි) “භාගවඃ” යනු වේ; (“භෘගු” නම් මුනිහුගේ පුත්‍රයෝ යන අර්ථයි). කුත්සාඃ, (“කුත්සස්‍යාපත්‍යානි” යන වාක්‍යයෙහි) ‘කුත්සාඃ” යනු වේ; (“කුත්ස” නමැත්තහුගේ පුත්‍රයෝ යන අර්ථයි). වසිෂ්ඨාඃ, (“වසිෂ්ඨස්‍යාපත්‍යානි” යන වාක්‍යයෙහි) “වසිෂ්ඨාඃ’ යනු වේ; (“වසිෂ්ඨ” මුනිහුගේ පුත්‍රයෝ යන අර්ථයි).

සූත්‍රොක්ත අපත්‍යාර්ථප්‍රත්‍යයන්ගේ ලොපය සිද්ධවන්නාවූ තැන් ස්වල්පයක් දක්වනු පිණිස මේ “භෘග්වත්‍රි” යනාදිය කියනලදී. මෙහි කී “දෙශතුල්‍යාඛ්‍යශබ්ද නම් “අඞ්ග, වඞ්ග, කලිඞ්ග” යනාදි ශබ්දයෝයි. “අඞ්ගස්‍ය රාඥෙපත්‍යානි= අඞ්ගාඃ” යනාදීන් එහි වාක්‍යයෝ යෙදිය යුතුයි. මෙහි “අඞ්ග” යනාදී රාජනාමයෝ තද්දෙශතුල්‍ය වෙත්. ක්ෂත්‍රියවාචකශබ්ද නම් ප්‍රසිද්ධවූ “රඝු, ඉක්ෂ්වාකු” යනාදීහුයි. “රඝොරපත්‍යානි=රඝවඃ” යනාදීහු එහි වාක්‍යයෝයි. තවත් මෙසේ “යස්ක, ලභ්‍ය, විද, පුත්‍ර යනාදි බොහෝ ශබ්දකෙරෙන් පර අපත්‍යාර්ථප්‍රත්‍යයන්ට ලොප් වේ. මේ ලොපය ස්ත්‍රීඅර්ථවූවොත් නොවේ.

300 දෙවතෙදමර්ථෙ, දෙවතාර්ථයෙහි හා ඉදම්ශබ්දාර්ථයෙහි (මෙය යන අර්ථයෙහි) ද (යථොක්තප්‍රත්‍යයෝ වෙත්).

a දෙවතාර්ථෙ ඉදමර්ථෙ චොක්තාඃ ප්‍රත්‍යයා භවන්ති. ඉන්ද්‍රො දෙවතාස්‍යෙත්‍යෛන්ද්‍රං හවිඃ, සොමො දෙවතාස්‍යෙති= සෞම්‍යං-හවිඃ, දෙවදත්තස්‍යෙදං=දෛවදත්තං- වස්ත්‍රම්.

301. ක්වචිද්වයොඃ. (ක්වචිත් 7, 1; වයොඃ 6, 2;)

b ක්වචිත්පූර්වොත්තරපදයොරාදෙරචො වෘද්ධිර්භවති ඤිති ණිති ච තද්ධිතෙ පරෙ, අග්නිමරුතෞ දෙවතෙ යස්‍ය තදාග්නිමාරුතං-කර්ම, සුෂ්ඨු හෘදයං යස්‍යාසෞ=සුහෘත්, සුහෘදො භාවඃ=සෞහාර්දම්. අත්‍ර භාවෙණ් වක්තව්‍යඃ.*

---

a දෙවතාර්ථෙ, දෙවතාර්ථයෙහිද; ඉදමර්ථෙ ච, ඉදම්ශබ්දාර්ථයෙහිද; උක්තාඃ ප්‍රත්‍යයාඃ භවන්ති, කියනලද ප්‍රත්‍යයෝ වෙත්. ඉන්ද්‍රඃ, ශක්‍රතෙම; දෙවතා, දෙවිවූයේ; අස්‍ය ඉති, මොහුටනුයි; ඓන්ද්‍රං, "ඓන්ද්‍ර" නම් වේ. හවිඃ, හවනීයසෘතයයි. සොමඃ, සොමතෙම; දෙවතා, දෙවිවූයේ; අස්‍ය ඉති, මොහුටනුයි; සෞම්‍යම්, "සෞම්‍ය" නම් වේ. හවිඃ, හවනීයසෘතයයි. (මෙහි දෙවතාර්ථයෙහි "අණ්" ප්‍රත්‍යයයි.) ඉදම්, මෙය; දෙවදත්තාර්ථම්, දෙවදත්තයා පිණිසනුයි; දෛවදත්තම්, "දෛවදත්ත" නම් වේ; වස්ත්‍රම්, වස්ත්‍රයයි. (මෙහි ඉදමර්ථයෙහි "අණ්" ප්‍රත්‍යයයි අග්නිදේවතාස්‍ය= ආග්නෙයඃ ශ්‍රීදේවතාස්‍ය=ශ්‍රායම්" යනාදී බොහෝ පද මේ ක්‍රමයෙන් සිද්ධකටහැකි වෙත්. තවද මේ තද්ධිත පුංලිඞ්ගාපෙක්ෂායෙහි "ඓන්ද්‍රඃ" යනාදිවශයෙන්ද; ස්ත්‍රීලිඞ්ගාපෙක්ෂායෙහි "ඓන්ද්‍රී" යනාදිවශයෙන්ද වෙත්.

301 ක්වචිත්, කිසිතැනෙක්හි; වයොඃ, (පූර්වොත්තරපද) දෙක්හිම ආදිස්වරූපයට වෘද්ධි වේ.

b ක්වචිත්, කිසිතැනෙක්හි; පූර්වොත්තරපදයොඃ, පූර්වොත්තර පදදෙක්හිම; ආදෙඃ අචඃ ආදිස්වරයට; ඤිති, ඤයන්න ඉත් කොට ඇත්තාවූද; ණිතිච, ණයන්න ඉත්කොට ඇත්තාවූද;

---

* "සුෂ්ඨු භාවඃ සෞෂ්ඨවම්, අත්‍ර සුෂ්ඨු අව්‍යයම්. එවමෙව අව්‍යයං තිෂ්ඨති, සුභගස්‍ය භාවඃ සෞභාග්‍යම්" යන පාඨයද ඇතැම් පොත්වල දක්නා ලැබේ. මෙයෝහි එයින් ප්‍රයොජනයක් නොපැණේ- සුෂ්ඨුභාවඃ, යහපත් බව; සෞෂ්ඨවම්, "සෞෂ්ඨව" නම් වේ. අත්‍ර, මෙහි; සුෂ්ඨුඃ, "සුෂ්ඨු" යන්න; අව්‍යයම්, අව්‍යයයි. අව්‍යයම්, අව්‍යයශබ්දය; එවමෙව, එපරිද්දෙන්ම හෙවත් සිටිපරිද්දෙන්ම තිෂ්ඨති, සිටී, සුභගස්‍ය. සෞභාග්‍යයෙන්යුක්තවූවහුගේ; භාවඃ, භාවය; සෞභාග්‍යම්, "සෞභාග්‍ය" නම් වේ; යනු එහි අර්ථයි.

302. ණිතො වා. (ණිතඃ 1, 3; වා 1, 1;)

a උක්තා වක්ෂ්‍යමාණාශ්ච* ප්‍රත්‍යයා විෂයාන්තරෙ ණිතො වා භවන්ති. අජෙ ගෞරස්ත්‍යාසාවජගුඃ-ශිවඃ. "ගොඃ" ඉති ශ්‍රුඩඃ, "ශොව්‍යඤ්ජනෙ" තස්‍යෙදං ධනුරජගවං-අජගවං වා. කුමුදස්‍යෙව ගන්ධො යස්‍යාඃ සා=කුමුදගන්ධිඃ, තස්‍යා අපත්‍යං ස්ත්‍රී=කෞමුදගන්ධ්‍යා-කුමුදගන්ධ්‍යා වා. "ආඛ්‍යාඃ ස්ත්‍රීයාම්" ඉත්‍යාජ් ගවශුරස්‍යායං=ගාවාශුරසේ-ග්‍රාමඃ, විෂ්ණොරිදං=වෛෂ්ණවම්. ගොරිදං=ගව්‍යම්. කුලෙ භවං=කුල්‍යම්. තවෙදං=ත්වදීයම්. මමෙදං=මදීයම්. (අත්‍ර ණිත්සප්‍රත්‍යයො න ණිත්).

තද්ධිතෙ පරෙ, තද්ධිතප්‍රත්‍යයා පරකල්හි; වෘද්ධිඃ භවති, වෘද්ධි වේ. යස්‍ය, යමෙකුට; අග්නිමාරුතෞ, "අග්නි මරුත්" දෙදෙන; දෙවතෙ, දෙවිවූවාහු වෙත්ද; තත්, එය; ආග්නිමාරුතං, "ආග්නිමාරුත" නම් වේ. කර්ම, කර්මයයි, සුෂ්ඨු, යහපත්වූ; හෘදයං, හෘදය; යස්‍ය, යමෙකුගේද; අසෞ, මෙතෙම; සුහෘත්, "සුහෘත්" නම් වේ. සුහෘදඃ, යහපත් හෘදය ඇත්තහුගේ; භාවඃ, භාවය; සෞහාර්දම්, "සෞහාර්ද" නම් වේ. අත්‍ර, මෙහි; භාවෙ, භාවාර්ථයෙහි අණ් වක්තව්‍යඃ, "අණ්" ප්‍රත්‍යය කියයුතුයි. (මෙහි "ආග්නිමාරුතම්" යන තන්හි දෙවතාර්ථයෙහි "අණ්" ප්‍රත්‍යයයි. එහි "අග්නි" ශබ්දයාගේ අකාරයටද පරපදයවූ 'මරුත්" ශබ්දයාගේ අකාරයටද වෘද්ධි විය. "සෞහාර්දම්" යන තන්හි භාවාර්ථයෙහි "අණ්" ප්‍රත්‍යයයි. එහි පූර්වපදයවූ "සු" යන අව්‍යයාගේ උකාරයටද පරපදයවූ "හෘත්" ශබ්දයාගේ ඍකාරයටද වෘද්ධි විය).

302 වා, ව්‍යවස්ථිතවිභාෂාවශයෙන්; ණිතඃ, (කියනලද "අණ්' ආදි ප්‍රත්‍යයෝ) ණකාරය ඉත්කොට ඇත්තෝ වෙත්.

a උක්තාඃ, අණාදිවශයෙන් කියනලද්දාවූද; වක්ෂ්‍යමාණාශ්ච, කාදිවශයෙන් කියනුලබන්නාවූද; ප්‍රත්‍යයාඃ, ප්‍රත්‍යයයෝ; විෂයාන්තරෙ, අන්‍යවිෂයෙහි හෙවත් යථොක්ත අපත්‍යාර්ථයෝ අන්‍යවූ අර්ථවිශෙෂයක් ගම්‍යමාන තන්හි; වා, ව්‍යවස්ථිතවිභාෂා වශයෙන්; ණිතඃ භවන්ති, ණකාරය ඉත්කොට ඇත්තෝ වෙත්.

---

* "වක්ෂ්‍යමාණාශ්ච" යන්න ඇතැම් පොත්වල නොපැණේ.

අජඃ. ජන්මරහිතවූ; ගෞඃ, වෘෂභතෙම; යස්‍ය, යමෙකුගේද; අසෞ, මේතෙම; අජගුඃ, "අජගු" නම් වේ. ශිවඃ, ඊශ්වරතෙමේයි. ගොඃ ඉති, "ගොඃ" යන සූත්‍රයෙන්; හ්‍රස්වඃ, (ගොශබ්දයාගේ ඕකාරය) හ්‍රස්ව වේ. 'වොව්‍යස්වරෙ" යන සූත්‍රයෙන් උකාරයට "අව්" ආදෙශ වේ. තස්‍ය, ඒ අජගුහුගේ (ඊශ්වරයාගේ); ඉදං ධනුඃ මේ දුන්නනුයි; ආජගවම්, (ණිත්පක්‍ෂයෙහි) "ආජගව" නම්ද; අජගවං වා, විකල්පයෙන් ණිත්රහිත පක්‍ෂයෙහි "අජගව" නම්ද වේ. කුමුදස්‍ය ඉව, කුමුදපුෂ්පයාගේ වැනිවූ; ගන්ධඃ, ගන්ධය; යස්‍යාඃ, යම් ස්ත්‍රියෙකුගේද; සා, ඕතොමෝ; කුමුදගන්ධිඃ, "කුමුද ගන්ධි" නම වේ. තස්‍යාඃ, ඇගේ; අපත්‍යම්, දරුවා; ස්ත්‍රී, ස්ත්‍රීවූවා; කෞමුදගන්ධ්‍යා, (ණිත්පක්‍ෂයෙහි) "කෞමුදගන්ධ්‍යා" නම්ද; කුමුද ගන්ධ්‍යා වා, විකල්පයෙන් ණිත්රහිතපක්‍ෂයෙහි "කුමුදගන්ධ්‍යා" නම්ද වේ. (මෙහි "අණ්" ප්‍රත්‍යයයි.) ආබතඃ ස්ත්‍රියාම් ඉති, "ආබ තඃ ස්ත්‍රියාම්" යන සූත්‍රයෙන්; ආප්, මෙහි "ආප්" ප්‍රත්‍යයයි. අයං, මේතෙම; ශ්වශුරස්‍ය, මාමාගේ පුතයි; ශ්වාශුර්‍යඃ, "ශ්වාශුර්‍ය" නම් වේ. ග්‍රාමඃ, ග්‍රාමයයි. (මෙහි "ණ්‍ය" ප්‍රත්‍යයයි) ඉදං, මෙය; විෂ්ණොඃ, විෂ්ණුහුගේ නුයි; වෛෂ්ණවම්, "වෛෂ්ණව" නම් වේ. ඉදම්, මෙය; ගොඃ, ගෙරිහුගේනුයි; ගව්‍යම්, "ගව්‍ය" නම් වේ. කුලෙ, කුලයෙහි; භවම්, වූයේ; කුල්‍යම්, "කුල්‍ය" නම් වේ. "ණ්‍ය" ප්‍රත්‍යයයි) ඉදම්, මෙය; තව තාගේනුයි; ත්වදීයම්, "ත්වදීය' නම් වේ. ඉදම්, මෙය; මම, මාගේනුයි; මදීයම්, "මදීය" නම් වේ. (මෙහි "ණීය" ප්‍රත්‍යයයි). අත්‍ර, මෙහි; ණීයප්‍රත්‍යයඃ, ණීයප්‍රත්‍යය; න ණිත්, ණිත්සංඥ නොවේ.

පූර්වොක්ත "ණිත්" සංඥ "අණ්" ආදි ප්‍රත්‍යයන් අර්ථාන්තර යෙහි ඇතැම්තන්හි ණිත්රහිත කිරීම පිණිසද වක්‍ෂ්‍යමාණ ණිත් රහිත "ක" ආදිප්‍රත්‍යයන් ඇතම්තන්හි "ණිත්" සංඥකිරීම පිණිසද "ණිතො වා" යන සූත්‍රය කියනලදී. මෙහි වාශබ්දයාගේ ව්‍යවස්ථා වාචිත්වයෙන් "ආජගවං-අජගවම්" යනාදියෙහි විකල්පයෙන්ද "ශ්වශුර්‍යඃ" යනාදියෙහි නිත්‍යයෙන්ද ණිත්ත්වය වේ. "ගව්‍යම්" ආදියෙහි ණිත්ත්වය නොවේ. ණිත්ත්වය වූතන්හි වෘද්ධිවීමෙන්ද නුවූතන්හි වෘද්ධිනොවීමෙන්ද පදසිද්ධිය වේ. තවද මෙහි අපත්‍යා ර්ථයෙන් අන්‍යවිෂයෙහි යයි කිවත් "කෞමුදගන්ධ්‍යා, කුමුදගන්ධ්‍යා" යනුවෙන් ඇතැම්තන්හි අපත්‍යාර්ථයෙහිද විකල්පයෙන් ණිත්ත්වය වනබව හැගේ.

303. චතුරශ්වලොපඃ (චතුරඃ 6, 1; චලොපඃ 1, 1;)

a චතුර්ශබ්දස්‍ය චකාරස්‍ය ලොපො භවති ණ්‍යණීයයොඃ ප්‍රත්‍යයයොඃ පරතඃ. ("පූරණෙර්ථෙ ණ්‍යණීයෞ භවතඃ") චතුර්ණාං සංඛ්‍යාපූරකං=තුර්‍යං-තුරීයම්.

304. අන්‍යස්‍ය දක්. (අන්‍යස්‍ය 6, 1; දක් 1, 1;)

b අන්‍යශබ්දස්‍ය දගාගමො භවති ණීයප්‍රත්‍යයෙ පරෙ. අන්‍යස්‍යෙදමන්‍යදීයම්. අර්ධං ජරද්‍යස්‍යාඃ සාර්ධජරතී, අර්ධජර ත්‍යා ඉදමර්ධජරතීයම්. "ස්වපරයොඃ කක්" ස්වකීයම්, පර කීයම්.

---

303 චතුරඃ, චතුර්ශබ්දයාගේ; චලොඃ, ("ණ්‍ය (ණීය" ප්‍රත්‍ය යන් පරකල්හි) චකාරලොපය වේ.

a ණ්‍යණීයයොඃ ප්‍රත්‍යයයොඃ පරතඃ, "ණ්‍ය ණීය" යන ප්‍රත්‍යය දෙක පරකල්හි; චතුර්ශබ්දස්‍ය, චතුර්ශබ්දයාගේ; චකාරස්‍ය, චකාරයට; ලොපඃ භවති, ලොප් වේ පූරණෙ අර්ථෙ සංඛ්‍යා පූරණාර්ථයෙහි; ණ්‍යණීයෞ භවතඃ, "ණ්‍ය ණීය" යන ප්‍රත්‍යය දෙක වෙත්. චතුර්ණාම්, සතරදෙනෙකුන්ගේ; සංඛ්‍යාපූරකම්, සංඛ්‍යාපූරණය කරන්නේ; තුර්‍යම්, "තුර්‍ය" නම්ද; තුරීයම්, 'තුරීය" නම්ද වේ. (මෙහි "ණ්‍ය" ප්‍රත්‍යය හා "ණීය" ප්‍රත්‍යයයි.)

304 අන්‍යස්‍ය, අන්‍යශබ්දයට; දක්, (ණීයප්‍රත්‍යය පරකල්හි) "දක්" ආගම වේ.

b ණීයප්‍රත්‍යයෙ පරෙ, ණීයප්‍රත්‍යය පරකල්හි; අන්‍යශබ්දස්‍ය, "අන්‍ය" ශබ්දයට; දගාගමඃ භවති, "දක්" ආගම වේ. ඉදං, මෙය; අන්‍යස්‍ය, අනිකක්හුගේ නුයි; අන්‍යදීයම්, 'අන්‍යදීය" නම් වේ. අර්ධම්, අඩක්; ජරත්, ජීර්ණවූයේ; යස්‍යාඃ, යම්ස්ත්‍රියකගේද; සා, ඕතොමෝ; අර්ධජරතී, 'අර්ධජරතී" නම් වේ. ඉදං, මෙය; අර්ධජර ත්‍යාඃ, අඩක් දිරූ ස්ත්‍රියගේ නුයි; අර්ධජරතීයම්, "අර්ධජරතීය" නම් වේ. ස්වපරයොඃ, "ස්ව පර" ශබ්දදෙකට; කක්, "කක්" ආගම වේ. ස්වකීයම්, ("ස්වස්‍යෙදම්" යන වාක්‍යයෙහි) 'ස්වකීයම්" යනුද; පරකීයම්, "පරස්‍යෙදම්" යන වාක්‍යයෙහි "පරකීයම්', යනුද වේ. (ඉදම්; මෙය; ස්වස්‍ය, තමාගේ නුයි; ස්වකීයම්,

305. කාරකාත් ක්‍රියායුක්තෙ.

(කාරකාත් 5, 1; ක්‍රියායුක්තෙ 1, 1;)

a කාරකාදපෙක්ෂ්‍යතෙ අණාදයඃ ප්‍රත්‍යයා භවන්ති ක්‍රියා යුක්තෙ කර්තරි කර්මණි වාභිධෙයෙ. කුඞ්කුමෙන රක්තං වස්ත්‍රං=කෞඞ්කුමම්. මථුරායා ආගතො ජාතො වා=මාථුරඃ, ග්‍රාමෙ භවො=ග්‍රාම්‍යඃ, ධුරං වහතීති=ධුර්‍ය්‍යඃ ධෞරෙයඃ.

"ස්වකීය" නම් වේ ඉදම්, මෙය; පරස්‍ය, අන්‍යයාගේ තුයි; පරකීයම්, "පරකීය" නම් වේ.) මෙහි "ණීය" ප්‍රත්‍යය ණිත් රහිතයි.)

305 ක්‍රියායුක්තෙ, ක්‍රියාවක් හා යුක්තවූ කර්ත්‍රර්ථයක් හෝ කර්මාර්ථයක් වාච්‍යකල්හි; කාරකාත්, කර්මාදිකාරකයා කෙරෙන් "අණ්" ආදි ප්‍රත්‍යයෝ වෙත්.

a ක්‍රියායුක්තෙ, ක්‍රියාවක් හා යුක්තවූ; කර්තරි, කර්ත්‍රර්ථයක් හෝ; කර්මණි ච, කර්මාර්ථයක් හෝ; අභිධෙයෙ, වාච්‍යකල්හි; කාරකාත් අපි, කර්මාදිකාරකයාකෙරෙන්ද; එතෙ අණාදයඃ ප්‍රත්‍යයාඃ භවන්ති, මේ "අණ්" ආදි ප්‍රත්‍යයෝ වෙත්. කුඞ්කුමෙන, කොකුමෙන්; රක්තම්, රඳනලද්දවූ; වස්ත්‍රම්, වස්ත්‍රය; කෞඞ්කුමම්, "කෞඞ්කුම" නම් වේ. (මෙහි "කුඞ්කුමෙන" යන කරණකාරකයාකෙරෙන් "අණ්" ප්‍රත්‍යයයි.) මථුරායාඃ, මථුරා නගරියෙන්; ආගතඃ, ආයේ හෝ; ජාතඃ වා, (එහි) උපන්නේ හෝ; මාථුරඃ,"මාථුර"නම් වේ. (මෙහි අපාදානකාරකයා කෙරෙන් "අණ්" ප්‍රත්‍යයයි) ග්‍රාමෙ භවඃ, ගමෙහි වූයේ; ග්‍රාම්‍යඃ, "ග්‍රාම්‍ය" නම් වේ. (මෙහි ආධාරකාරකයාකෙරෙන්"ණ්‍ය"ප්‍රත්‍යයයි) ධුරං වහතීති, ධුරය උසුලානුයි; ධුර්‍ය්‍යඃ, "ධුර්‍ය්‍ය" නම්ද; ධෞරෙයඃ, "ධෞරෙය" නම්ද වේ. (මෙහි කර්මකාරකයා කෙරෙන් "ණ්‍ය" ප්‍රත්‍යය හා "එයණ්" ප්‍රත්‍යයයි.)

මෙහි ක්‍රියායුක්තවූ කර්ත්‍රර්ථයක් හෝ කර්මාර්ථයක් ගම්‍යමාන කල්හි කර්මාදිකාරකයාකෙරෙන් යථොක්ත අණ් ආදි ප්‍රත්‍යයෝ වෙත්යයි කියනලදී. වක්ෂ්‍යමාණ "ක" ආදි ප්‍රත්‍යයෝද එසේ වෙත්. "කුඞ්කුමෙන රක්තම්" යන වාක්‍යයෙහි "රක්තම්" යන කෘදන්තක්‍රියාව හා "වස්ත්‍රම්" යන කර්මාර්ථය යුක්තබැවින් "කුඞ්කුමෙන" යන කරණකාරකයාකෙරෙන් "අණ්" ප්‍රත්‍යයයි. "මථුරායා ආගතඃ" යන වාක්‍යයෙහි "ආගතඃ" යන කෘදන්තක්‍රියාව හා

306. කෙනෙයෙකාඃ.

කෙනෙයෙකාඃ 1, 3;)

a ක ඊන ඉය ඉක එතෙ ප්‍රත්‍යයා භවන්ති භවාද්‍යර්ථෙෂු. ණිත්ත්වං චෛෂාං වෛකල්පිකම්. කර්ණාටෙ භවඃ=කාර්ණාටකඃ ග්‍රාමාදාගතස්තත්‍ර ජාතො වා=ග්‍රාමීණඃ. "අචෙර්දීර්ඝශ්ච" සධ්‍රීචි භවඃ සධ්‍රීචා යුක්තො වා=සධ්‍රීචීනඃ. සමීචි භවඃ සමීචා යුක්තො වා=සමීචීනඃ, "තිරශ්චාදයඃ" තිරශ්චි භවඃ තිරශ්චා යුක්තො වා=තිරශ්චීනඃ, උදීචි භව උදීචා යුක්තො වා=උදීචීනඃ.

පුරුෂාදිකර්ත්‍රර්ථයක් යුක්තබැවින් "මථුරායාඃ" යන අපාදාන කාරකයාකෙරෙන් "අණ්" ප්‍රත්‍යයයි. සෙසුතන්හිද මේ ක්‍රමයයි.

306 කෙනෙයෙකාඃ, (භවාද්‍යර්ථයන්හි) "ක ඊන ඉය ඉක" යන ප්‍රත්‍යයෝ වෙත්.

a භවාද්‍යර්ථෙෂු, භවාදිඅර්ථයන්හි; ක ඊන ඉය ඉක එතෙ ප්‍රත්‍යයාඃ, "ක ඊන ඉය ඉක" යන මේ ප්‍රත්‍යයෝ; භවන්ති, වෙත්. එෂාං ච, මොවුන්ගේද; ණිත්ත්වං, ණකාරඉත්භාවය; වෛකල්පිකම්, විකල්පයෙන් වේ. කර්ණාටෙ, කර්ණාටදෙශයෙහි; භවඃ, වූයේ; කාර්ණාටකඃ, "කාර්ණාටක" නම්ද; කර්ණාටකඃ, "කර්ණාටක" නම්ද වේ. (මෙහි කප්‍රත්‍යය විකල්පයෙන් ණිත්ත්වයුක්තයි) ග්‍රාමාත්, ගමෙන්; ආගතඃ, ආයේ හෝ; තත්‍ර, එහි; ජාතඃ, උපන්නේ හෝ; ග්‍රාමීණඃ, "ග්‍රාමීණ" නම් වේ. "අචෙර්දීර්ඝශ්ච" යන සූත්‍රයෙන් "අච්" යන්නේ අකාරලොපය හා පූර්වයට දීර්ඝද වේ. සධ්‍රීචි, සහචරයෙකු කෙරෙහි; භවඃ, වූයේ හෝ– සධ්‍රීචා, සහචරයෙකු හා; යුක්තඃ වා, යුක්තවූයේ හෝ; සධ්‍රීචීනඃ, "සධ්‍රීචීන" නම් වේ. සමීචි, යහපත්වූවෙකු කෙරෙහි; භවඃ, වූයේ හෝ; සමීචා, යහපත්වූවෙකු හා යුක්තඃ වා, යුක්තවූයේ හෝ; සමීචීනඃ, "සමීචීන" නම් වේ. "තිරශ්චාදයඃ" යන සූත්‍රයෙන් "තිරශ්චි" යන්න නිපාතනය කරණලැබේ. තිරශ්චි, වක්‍රගාමිසත්ත්වයෙකුකෙරෙහි; භවඃ, වූයේ හෝ; තිරශ්චා, වක්‍රගාමීසත්ත්වයෙකු හා; යුක්තඃ වා, යුක්තවූයේ හෝ; තිරශ්චීනඃ, "තිරශ්චීන" නම් වේ. උදීචි, උත්තරදිශාවෙහි; භවඃ වූයේ හෝ; උදීචා, උත්තරදිශාව හා; යුක්තඃ වා, යුක්තවූයේ හෝ; උදීචීනඃ, "උදීචීන" නම් වේ. (මෙහි "ඊන" ප්‍රත්‍යයයි.)

307. යලොපශ්ච. (යලොපඃ 1, 1; ච 1, 1;)

a කන්‍යාදීනාමුපධාභූතස්‍ය යකාරස්‍ය ලොපො භවති තද්ධිතෙ පරෙ* "යස්‍ය ලොපඃ" කන්‍යායාං භවඃ කානීනඃ,‡ පුෂ්‍යෙණ යුක්තා පෞර්ණමාසී=පෞෂී. "නක්ෂත්‍රාදණ් වක්තව්‍යඃ" (අණන්තාදීප්); පෞෂ්‍යාං භවඃ පෞෂීණඃ.

b "ඉයෙ වා" ක්ෂත්‍රශබ්දාද්වා ඉයප්‍රත්‍යයො භවති. (ක්ෂතාත් ත්‍රායත ඉති=ක්ෂත්‍රම්, ක්ෂත්‍රාදීනි නිපාත්‍යන්තෙ) ක්ෂත්‍රෙ භවඃ=ක්ෂත්‍රියඃ, ක්ෂාත්‍රඃ. "ක්ෂත්‍රශබ්දාදණ් වක්තව්‍යඃ" ශුක්‍රා දෙවතා යස්‍ය තච්ඡුක්‍රියම්-(ශෞක්‍රම්), ඉන්ද්‍රො දෙවතා යස්‍ය තදින්ද්‍රියං, (ඓන්ද්‍රම්.) අක්ෂෛර්දීව්‍යති ආක්ෂිකඃ, තර්කෙ චතුරඃ-තාර්කිකඃ, ශබ්දෙ කුශලඃ=ශාබ්දිකඃ, වෙදෙ භවා=වෛදිකී-ශ්‍රුතිඃ, ඍග්වා. (අත්‍රෙකණ්වක්තව්‍යඃ).

309 යලොපශ්ච, (කිසිතැනෙක්හි උපධාසංඥවූ) යකාරයාගේ ලොපය වේ.

a තද්ධිතෙ පරෙ, තද්ධිතප්‍රත්‍යය පරකල්හි; ක්වචිත්, කිසිතැනෙක්හි; කන්‍යාදීනාම්, "කන්‍යා" ශබ්දාදීන්ගේ; උපධාභූතස්‍ය, උපධාසඥවූ; යකාරස්‍ය, යකාරයට; ලොපඃ භවති, ලොප් වේ. "යස්‍ය ලොපඃ" යන සූත්‍රයෙන් යකාරයෙහි සිටි ආකාරලොපය වේ. කන්‍යායාම්, කන්‍යාව කෙරෙහි; භවඃ, වූයේ; කානීනඃ, "කානීන" නම් වේ. පුෂ්‍යෙණ, පුසනකතින්; යුක්තා, යුක්තවූ; පෞර්ණමාසී, පුරපසළොස්වක්තිථිය; පෞෂී, "පෞෂී" නම් වේ. නක්ෂත්‍රාත්, නක්ෂත්‍රවාචකශබ්දයාකෙරෙන්; අණ් වක්තව්‍යඃ, මෙහි "අණ්" ප්‍රත්‍යය කියයුතුයි. අණන්තාත්, "අණ්" ප්‍රත්‍යයාන්තයාකෙරෙන්; ඊප්, ස්ත්‍රීඅර්ථයෙහි "ඊප්" ප්‍රත්‍යයයි. පෞෂ්‍යාම්, පුසනකතින් යුත් පෞර්ණමාසියෙහි; භවඃ, වූයේ; පෞෂීණඃ, "පෞෂීණ" නම් වේ. (මෙහිද "ඊන" ප්‍රත්‍යයයි. තවද "යලොපශ්ච" යන්නෙන් කිසිතැනෙක්හි උපධාසංඥවූ යකාරයට ලොප් වේයයි කියනලදී. කිසිතැනෙක්හි යයි කීමෙන් "ගර්ගීයණඃ" යනාදි ඇතම්තන්හි ලොප් නොවේ.)

b වා, විකල්පයෙන්; ඉයඃ, "ක්ෂත්‍ර" ශබ්දාදියෙන් "ඉය" ප්‍රත්‍යය වේ. ක්ෂත්‍රශබ්දාත් "ක්ෂත්‍ර" ශබ්දයාකෙරෙන්; වා,

* ඇතැම්පොත්වල මෙසි "ස්වරෙ යකාරෙ ච තද්ධිතෙ පරෙ" යි දක්නාලැබේ.

† "කන්‍යායා අපත්‍යම්-කානීනඃ" යි ඇතැම්.

308. ත්‍යතනෞ. (ත්‍යතනෞ 1, 2;)

a (ත්‍යශ්ච තනශ්ච=ත්‍යතනෞ). කිමාදෙරව්‍යයෙභ්‍යශ්ච ත්‍යතනෞ ප්‍රත්‍යයෞ භවතඃ, කුත්‍ර භවඃ කුත්‍රත්‍යඃ, කුතො භවඃ=කුතස්ත්‍යඃ, තත්‍ර භවඃ=තත්‍රත්‍යඃ, තතො භවඃ=තතස්ත්‍යඃ, අත්‍ර භවො'ත්‍රත්‍යඃ, අතො භවො'තස්ත්‍යඃ, අද්‍ය භවො'ද්‍යතනඃ, හ්‍යො භවා=හ්‍යස්තනී, ශ්වො භවඃ=ශ්වස්තනඃ, සදා භවඃ=සදාතනඃ, සනා භවඃ=සනාතනඃ, පුරා භවඃ=පුරාතනඃ, චිරං භවඃ= චිරන්තනඃ, සායං භවඃ=සායන්තනඃ, ප්‍රාග්භවඃ=ප්‍රාක්තනඃ, ප්‍රාහ්ණෙතනඃ

විකල්පයෙන්, ඉයප්‍රත්‍යයඃ භවති, "ඉය" ප්‍රත්‍යය වේ. ක්ෂතාත්, ක්ෂතයෙන් (තුවාලයෙන්) ත්‍රායතෙ ඉති, ජනයා රකීණුයි; ක්ෂත්‍රම්, "ක්ෂත්‍ර" නම් වේ. ක්ෂත්‍රාදීනි, "ක්ෂත්‍ර" ශබ්දාදීහු; නිපාත්‍යන්තෙ, නිපාතන ය කරණු ලැබෙත්. ක්ෂත්‍රෙ "ක්ෂත්‍ර" නම් කුලයෙහි; භවඃ, වූයේ; ක්ෂත්‍රියඃ, "ක්ෂත්‍රිය" නම්ද; ක්ෂාත්‍රඃ, "ක්ෂාත්‍ර" නම්ද වේ. ක්ෂත්‍රශබ්දාත්, "ක්ෂත්‍ර" ශබ්දයා කෙරෙන් අණ්, ("ක්ෂාත්‍ර" යනතන්හි) "අණ්" ප්‍රත්‍යය; වක්තව්‍යඃ, කියයුතුයි. යස්‍ය, යමෙකුට; ශුක්‍රඃ, ශුක්‍ර තෙම; දෙවතා, දෙවි වේ ද; තත්, එය; ශුක්‍රියම්, "ශුක්‍රිය" නම් ද; ශෞක්‍රම්, "ශෞක්‍ර" නම්ද වේ. යස්‍ය, යමෙකුට; ඉන්ද්‍රඃ, ඉන්ද්‍ර තෙමේ; දෙවතා, දෙවිවේද, තත්, එය; ඉන්ද්‍රියම්, "ඉන්ද්‍රිය" නම් ද; ඓන්ද්‍රම්, "ඓන්ද්‍ර" නම්ද වේ. ("ක්ෂත්‍රිය, ශුක්‍රිය, ඉන්ද්‍රිය" යන තන්හි 'ඉය" ප්‍රත්‍යයයි). අක්ෂෛඃ, පසැටින්; දීව්‍යතී යි. ක්‍රීඩාකෙරේ නු යි; ආක්ෂිකඃ, "ආක්ෂික" නම් වේ. තර්කේ, තර්කවිෂයෙහි; චතුරඃ, දක්ෂවූයේ; තාර්කිකඃ, "තාර්කික" නම් වේ. ශබ්දෙ, ශබ්දවිෂයෙහි; කුශලඃ, දක්ෂවූයේ; ශාබ්දිකඃ, "ශාබ්දික" නම් වේ. වෙදෙ වෙදයෙහි; භවා, වූවා; වෛදිකී, "වෛදිකී" නම් වේ. ශ්‍රුතිඃ, ශ්‍රුති ය යි. ඍග් වා, එනම් වෙදාංශය හෝ (වෛදිකී නම්) වේ. අත්‍ර, මෙහි; ඉකඃ, "ඉක" ප්‍රත්‍යය; අණ්වත්, "අණ්" ප්‍රත්‍යය මෙන්; කාර්‍ය්‍යඃ, කටයුතුයි. හෙවත් ණිත්භාවයෙන් "ඉකණ්" යි කටයුතු යි.

මෙහි කී "ක්ෂත්‍ර" ශබ්දය පුංනපුංසක ලිඞ්ගවයෙහි ම ව්‍යවහෘත යි. පුංලිඞ්ගතන්හි "ක්ෂත්‍රිය" නාමයෙහි ම වැටේ. තවද මේ පදයන්ගේ ඇතම් වාක්‍ය සමහරතන්හි "ක්ෂත්‍රාද්භවඃ ක්ෂත්‍රස්‍යාපත්‍යං වා=ක්ෂත්‍රියඃ-ක්ෂාත්‍රඃ, ඉන්ද්‍රාද්භවම්=ඉන්ද්‍රියම් ඓන්ද්‍රම්. ශබ්දමධීතෙ වෙත්ති වා=ශාබ්දිකඃ" යනාදිවශයෙන් දක්නා ලැබෙත්.

308 ත්‍යතනෞ, (කිම්ශබ්දාදිය කෙරෙන්) "ත්‍ය තන" යන ප්‍රත්‍යය දෙක වෙත්.

a ත්‍යශ්ච, ත්‍යයන්හද; තනශ්ච, "තන" යන්නද; ත්‍යතනෞ, "ත්‍යතනෞ" යනු වේ. කිමාදෙඃ, කිම්ශබ්දාදිය කෙරෙන්ද; අද්‍යදෙශ්ච, "අද්‍ය" යනාදිය කෙරෙන්ද; භවාද්‍යර්ථෙ, භවාදී අර්ථයෙහි; ත්‍යතනෞ ප්‍රත්‍යයෞ භවතඃ, "ත්‍ය තන" යන ප්‍රත්‍යය දෙක වෙත්. කුත්‍ර භවඃ, කොහි වූයේ ද යන අර්ථයෙහි; කුත්‍රත්‍යඃ, "කුත්‍රත්‍ය" නම් වේ. කුතඃ භවඃ, කොයින් වූයේ ද යන අර්ථයෙහි; කුතස්ත්‍යඃ, "කුතස්ත්‍ය" නම් වේ. තත්‍ර භවඃ, එහි වූයේ යන අර්ථයෙහි; තත්‍රත්‍යඃ, "තත්‍රත්‍ය" නම් වේ. තතඃ භවඃ, එයින් වූයේ යන අර්ථයෙහි; තතස්ත්‍යඃ, "තතස්ත්‍ය" නම් වේ. අත්‍ර භවඃ, මෙහි වූයේ යන අර්ථයෙහි; අත්‍රත්‍යඃ, "අත්‍රත්‍ය" නම් වේ. අතඃ භවඃ, මෙයින්වූයේ යන අර්ථයෙහි; අතස්ත්‍යඃ, "අතස්ත්‍ය' නම් වේ. (මෙහි "ත්‍ය" ප්‍රත්‍යය යි) අද්‍ය භවඃ, අද වූයේ යන අර්ථයෙහි; අද්‍යතනඃ, "අද්‍යතන' නම් වේ. හ්‍යස් භවඃ, ඊයේ වූයේ යන අර්ථයෙහි; හ්‍යස්තනඃ, "හ්‍යස්තන" නම් වේ. ශ්වස් භවඃ, හෙට වන්නේ යන අර්ථයෙහි; ශ්වස්තනඃ, "ශ්වස්තන" නම් වේ. සදා භවඃ, සැම කල්හි වන්නේ යන අර්ථයෙහි; සදාතනඃ "සදාතන" නම් වේ. සනා භවඃ=සනාතනඃ" යනුද එම අර්ථයි. පුරා භවඃ, පෙර වූයේ යන අර්ථයෙහි; පුරාතනඃ, 'පුරාතන' නම් වේ. චිරං භවඃ, බොහෝ පෙර කාලයෙහි වූයේ යන අර්ථයෙහි; චිරන්තනඃ, "චිරන්තන" නම් වේ. සායං භවඃ, සවස වූයේ යන අර්ථයෙහි; සායන්තනඃ, 'සායන්තන' නම් වේ. ප්‍රාක්භවඃ, පූර්වකොට වූයේ යන අර්ථයෙහි; ප්‍රාක්තනඃ, "ප්‍රාක්තන" නම වේ. ප්‍රාග්ණෙ භවඃ, පූර්වාග්ණකාලයෙහි වූයේ යන අර්ථයෙහි; ප්‍රාග්ණෙතනඃ "ප්‍රාග්ණෙතන" නම් වේ. (මෙහි "තන" ප්‍රත්‍යය යි) මෙහි "ප්‍රාග්ණෙ" යනු නිපාතනයෙන් එකාරාන්තව සිද්ධවූ අව්‍යය යි. මෙහි කි "කිම්" ශබ්දාදි ය නම් "කිම්" ශබ්දාදියෙන් නිපන් "කුත්‍ර" යනාදියයි. ඇතැම්තන්හි 'අමාද්‍යදෙස්ත්‍යතනෞ" යනු දක්වා "අමා" යනාදි අව්‍යයන් කෙරෙන් 'ත්‍ය" ප්‍රත්‍යය හා "අද්‍ය" යනාදීන් කෙරෙන් 'තන" ප්‍රත්‍යය යද වේ ය යි කියත්. එනි-"අමා භවඃ=අමාත්‍යඃ, ඉහ භවඃ=ඉහත්‍යඃ; ක්ව භවඃ=ක්වත්‍යඃ, ඓෂමොභවඃ=ඓෂමස්ත්‍යඃ, අද්‍ය භවඃ=අද්‍යතනඃ" යනාදිය උදාහරණ කෙරෙත් මෙහි "අමාත්‍යඃ" යනු සමග වූයේ යන අර්ථ යි "ඓෂමස්ත්‍යඃ" යනු වර්තමානවත්සරයෙහි වූයේ යන අර්ථයි. තවද මෙහි "දක්ෂිණාපශ්චාත්පුර සස්ත්‍යණ්" යනු කියා "දක්ෂිණා පශ්චාත් පුරස්" යන මොවුන් කෙරෙන් "ත්‍යණ්" ප්‍රත්‍යය වේයයිද කියත්. "දාක්ෂිණාත්‍යඃ, පාශ්චාත්ත්‍යඃ, පෞරස්ත්‍යඃ" යනු ඊට උදාහරණ යි.

a "චිරාදිභ්‍යස්ත්නඃ"-චිරපරුත්පරාරිභ්‍යස්ත්නො භවාද්‍යර්ථෙ චිරං භවඃ=චිරත්නඃ පරුද්භවඃ=පරුත්නඃ, පරාරි භවඃ=පරාරිත්නඃ.

309. ස්වාර්ථෙපි. (ස්වාර්ථෙ 7, 1; අපි 1, 1;)

b උක්තාඃ ප්‍රත්‍යයාඃ ස්වාර්ථෙපි භවන්ති. දෙවදත්ත එව=දෛවදත්තිකඃ, චත්වාරො වර්ණා එව=චාතුර්වර්ණ්‍යම්. චොර එව=චෞරඃ.

c "භාගරූපනාමභ්‍යො ධෙයඃ"-භාගධෙයම්, රූපධෙයම්, නාමධෙයම්.

a චිරාදිභ්‍යඃ, "චිර" ශබ්දාදීන්කෙරෙන්; ත්නඃ, "ත්න" ප්‍රත්‍යය වේ. චිරපරුත්පරාරිභ්‍යඃ, "චිර පරුත් පරාරි" යන මොවුන් කෙරෙන්; භවාද්‍යර්ථෙ, භවාදි අර්ථයෙහි; ත්නඃ, "ත්න" ප්‍රත්‍යය වේ. චිරං භවඃ, බොහෝ පෙරකාලයෙහි වූයේ; චිරත්නඃ, "චිරත්න" නම් වේ. පරුත්භවඃ, පූර්වවර්ෂයෙහි (ගතවර්ෂයෙහි) වූයේ; පරුත්නඃ; "පරුත්න" නම් වේ. (මෙහි නිපාතනයෙන් තකාරලොපයයි) පරාරිභවඃ, පූර්වතරවත්සරයෙහි (ගතවූ තෘතීය වත්සරයෙහි) වූයේ. පරාරිත්නඃ, "පරාරිත්න" නම් වේ.

309 ස්වාර්ථෙ අපි, ස්වාර්ථයෙහිද (විශෙෂාර්ථයක් නොව තමන් පිළිබඳ ප්‍රකෘත්‍යර්ථමාත්‍රයෙහි ද) පූර්වොක්ත "අණ්" ආදි ප්‍රත්‍යයෝ වෙත්.

b උක්තාඃ ප්‍රත්‍යයාඃ, කියනලද "අණ්" ආදි ප්‍රත්‍යයෝ; ස්වාර්ථෙ අපි, ස්වාර්ථයෙහි ද; භවන්ති, වෙත්. දෙවදත්තඃ එව, දෙවදත්ත තෙමේ ම; දෛවදත්තිකඃ, 'දෛවදත්තික" නම් වේ. (මෙහි ණිත්වයෙන යුත් "ඉක" ප්‍රත්‍යය යි.) චත්වාරඃ වර්ණාඃ එව, වර්ණ සතර ම; චාතුර්වර්ණ්‍යම්, "චාතුර්වර්ණ්‍ය" නම් වේ. (මෙහි "ණ්‍ය" ප්‍රත්‍යයයි). චොරඃ එව, චොර තෙමේ ම; චෞරඃ, "චෞර" නම් වේ. (මෙහි "අණ්" ප්‍රත්‍යයයි).

c භාගරූපනාමභ්‍යඃ, "භාග රූප නාමන්" යන මොවුන් කෙරෙන්, ධෙයඃ, (ස්වාර්ථයෙහි) "ධෙය" ප්‍රත්‍යය වේ. භාගධෙයම්, ("භාග එව" යන වාක්‍යයෙහි "භාගධෙයම්" යනු වේ; රූපධෙයම්, ("රූපමෙව" යන වාක්‍යයෙහි) "රූපධෙයම්" යනු වේ. නාමධෙයම්, ('නාමෛව" යන වාක්‍යයෙහි) "නාමධෙයම්" යනු වේ. (භාග ය ම "භාගධෙය" නම් ද, රූප ය ම "රූපධෙය" නම්ද, නාම ය ම "නාමධෙය" නම් ද වේ යනු අර්ථ යි).

a "අව්‍යයසර්වනාම්නාමකච් ප්‍රාක් ටෙඃ"-අව්‍යයස්‍ය සර්වාදෙශ්චාන්ත්‍යස්වරාත්පූර්වෝ'කච්ප්‍රත්‍යයො භවති. උච්චෛරෙව=උච්චකෛඃ, නීචෛරෙව=නීචකෛඃ, සර්ව එව=සර්වකඃ, විශ්ව එව=විශ්වකඃ, මයා එව=මයකා, ත්වයා එව=ත්වයකා, තදෙව=තකත්, යදෙව=යකත්, එතදෙව=එතකත්.

b "අණීනයොර්යුෂ්මදස්මදොස්තවකාදිඃ" =අණ් ච ඊනශ්ච=අණීනෞ, තයොරණීනයොඃ ප්‍රත්‍යයයොඃ පරතොයුෂ්මදස්මදොස්තවකාදය ආදෙශා භවන්ති. ආදිශබ්දාත්තවකමමකයුෂ්මාකාස්මාකාඃ. එකත්වෙ තවකමමකෞ, ද්විත්වෙ බහුත්වෙ ච යුෂ්මාකාස්මාකෞ. තවෙදං=තාවකම්, මමෙදං=මාමකම්, තවායං=තාවකීනඃ, මමායං=මාමකීනඃ, යුවයොරයං=යෞෂ්මාකඃ, ආවයොරයමාස්මාකඃ, යුවයොරයං=යෞෂ්මාකීණඃ, ආවයොරයමාස්මාකීනඃ, යුෂ්මාකමයං=යෞෂ්මාකඃ, අස්මාකමයමාස්මාකඃ, යුෂ්මාකමයං=යෞෂ්මාකීණඃ, අස්මාකමයමාස්මාකීනඃ.

---

a අව්‍යයසර්වනාම්නාම්, අව්‍යයශබ්ද සර්වනාම ශබ්දයන්ගේ; ටෙඃ ප්‍රාක්, ටිසංඥයෙන් පූර්වයෙහි; අකච්, "අකච්" ප්‍රත්‍යය වේ.-අව්‍යයස්‍ය, අව්‍යයශබ්දයාගේ ද; සර්වාදෙශ්ච සර්වශබ්දාදීහුගේ ද; අන්ත්‍යස්වරාත්, අන්ත්‍යස්වරයෙන්; පූර්වඃ, පූර්ව ව; අකච් ප්‍රත්‍යයඃ භවති, "අකච්" ප්‍රත්‍යය වේ. උච්චෛඃ එව, උස්වූයේම, උච්චකෛඃ, "උච්චකෛඃ" යනු වේ. නීචෛඃ එව, පාත්වූයේ ම; නීචකෛඃ "නීචකෛඃ" යනු වේ. සර්වඃ එව, සියල්ලම; සර්වකඃ, "සර්වක" නම් වේ. විශ්වඃ එව, සියල්ලම; විශ්වකඃ, "විශ්වක" නම් වේ. මයා එව මාවිසින් යන අර්ථයෙහි ම; මයකා, "මයකා" යනු වේ. ත්වයා එව, තාවිසින් යන අර්ථයෙහි ම; ත්වයකා, "ත්වයකා" යනු වේ. තත්එව, එයම; තකත්, "තකත්" යනු වේ. යත් එව, යමක් ම; යකත්, "යකත්" යනු වේ. එතත් එව, මේ ම, එතකත්,"එතකත්"යනු වේ

මෙය පාණිනීයසූත්‍රයි. සිද්ධාන්තකෞමුදියෙහි "තිඞඃ" යනු මීට අනුවර්තනය කොට තිඞන්තයාගේ (ආඛ්‍යාතක්‍රියාහුගේ) ටිසංඥයෙන් පූර්වයෙහිද මේ "අකච්" ප්‍රත්‍යය වේයයි කියනලදී. මෙහි "අච්" යන්න ඉත්සංඥයි. "උච්චෛඃ" යන්නෙහි ටිසංඥය වෙන් කළ කල්හි "උච්ච ඓඃ"යි සිටී. මෙහි "ඓඃ" යන ටිසංඥයෙන් පූර්වයෙහි "අක්" යන්න කොට ස්වර හා යෙදූ කල්හි "උච්චකෛඃ" යනු වේ. සෙස්සද මෙසේයි. "පචතකි" යනාදිය තිඞන්ත උදාහරණයි.

310. වතතුල්‍යෙ. (වත් 1, 1; තුල්‍යෙ 7, 1;)

a තුල්‍යෙ සාදෘශ්‍යෙ'ර්ථෙ වත් ප්‍රත්‍යයො භවති. චන්ද්‍රෙණ තුල්‍යං= චන්ද්‍රවත්- මුඛම් ශකටෙන තුල්‍යං= ශකටවත්- උදරම්. පටෙන තුල්‍යං=පටවත්-කම්බලම්.

---

b අණීනයොඃ, "අණ් ඊන" යන ප්‍රත්‍යය දෙක පරකල්හි; යුෂ්මදස්මදොඃ, "යුෂ්මත් අස්මත්" ශබ්ද දෙකට; තවකාදිඃ "තවක" යනාදිය වේ. අණ් ච, "අණ්" යන්න ද; ඊනශ්ච, "ඊන" යන්න ද; අණීනෞ, "අණීනෞ" යනු වේ. තයොඃ අණීනයොඃ ප්‍රත්‍යයයොඃ පරතඃ, ඒ "අණ් ඊන" යන ප්‍රත්‍යය දෙක පරකල්හි; යුෂ්මදස්මදොඃ, "යුෂ්මත් අස්මත්' ශබ්ද දෙකට; තවකාදයඃ ආදෙශාඃ භවන්ති, "තවක" යනාදි ආදෙශයෝ වෙත්. ආදි ශබ්දාත්, ආදි ශබ්දයෙන්; තවකමමකයුෂ්මාකාස්මාකාඃ, "තවක මමක යුෂ්මාක අස්මාක" යන මොහු වෙත්. එකත්වෙ, එකවචන භාවයෙහි පවත්නා වූ "යුෂ්මත් අස්මත්" දෙකට); තවකමමකෞ, "තවක මමක" යන දෙක වෙත්. ද්විත්වෙ ද්විවචනභාවයෙහි ද; බහුත්වෙ ච, බහුවචනභාවයෙහි ද පවත්නාවූ "යුෂ්මත් අස්මත්" දෙකට); යුෂ්මාකාස්මාකෞ, "යුෂ්මාක අස්මාක" යන දෙක වෙත්. ඉදං, මෙය; තව, තාගේ යන අර්ථයෙහි; තාවකම්, "තාවක" නම් වේ. ඉදං, මෙය; මම, මාගේ යන අර්ථයෙහි; මාමකම්, "මාමක" නම් වේ. (මෙහි "අණ්" ප්‍රත්‍යයයි)' තවායං තාවකීනඃ, මමායං මාමකීනඃ" යනු ද මෙම අර්ථයි (මෙහි 'ඊන" ප්‍රත්‍යය යි) අයම්, මෙය, යුවයොඃ, තොපදෙදෙනාගේනුයි; යෞෂ්මාකඃ, "යෞෂ්මාක" නම් වේ. අයං, මෙය; ආවයොඃ, අප දෙදෙනාගේ නුයි; ආස්මාකඃ, "ආස්මාක" නම් වේ. (මෙහි "අණ්" ප්‍රත්‍යයයි.) "යුවයොරයං යෞෂ්මාකීණඃ, ආවයොරය මාස්මාකීනඃ" යනු ද මෙම අර්ථයි (මෙහි ද "ඊන" ප්‍රත්‍යය යි.) අයං, මෙය; යුෂ්මාකං, තොපගේ නුයි; යෞෂ්මාකඃ, "යෞෂ්මාක" නම් වේ. අයං, මෙය; අස්මාකං, අපගේ නුයි; ආස්මාකඃ, "ආස්මාක" නම වේ. (මෙහි ද "අණ්" ප්‍රත්‍යය යි.) 'යුෂ්මාකමයං යෞෂ්මාකීණඃ. අස්මාකමයමාස්මාකීනඃ" යනු ද මෙම අර්ථ යි. (මෙහි ද "ඊන" ප්‍රත්‍යයයි, මෙහි ආදෙශ වූ තාවකාදීන්ට වෘද්ධි විය.)

310 තුල්‍යෙ, තුල්‍යාර්ථයෙහි; වත්, "වත්" ප්‍රත්‍යය වේ.

311. භාවෙ තත්වයණඃ. (භාවෙ 7, 1; තත්වයණඃ 1, 3;)

a තුල්‍යෙ, "තුල්‍ය" යයි සේයි; සාදෘශ්‍ය අර්ථෙ, සමානාර්ථයෙහි; වත්ප්‍රත්‍යයඃ භවති, "වත්" ප්‍රත්‍යය වේ. චන්ද්‍රෙණ, චන්ද්‍රයා හා; තුල්‍යම්, සමානය යන අර්ථයෙහි; චන්ද්‍රවත්, "චන්ද්‍රවත්" යනු වේ. මුඛම්, මුඛයයි; ඝටෙන, ඝටය හා, තුල්‍යම්, සමානය යන අර්ථයෙහි; ඝටවත්, "ඝටවත්" යනු වේ. උදරම්, උදරයයි; පටෙන තුල්‍යම්, වස්ත්‍රය හා සමානය යන අර්ථයෙහි; පටවත්, "පටවත්" යනු වේ. කම්බලම්, කම්බලයයි.

මෙහි "වත්" ප්‍රත්‍යය තුල්‍යාර්ථයෙහි වේ යයි කීවද එය පාණිනීය සූත්‍රානුසාරයෙන් අර්ථත්‍රයෙක්හි වන බැව් පෙණේ. එනම්:- "තෙන තුල්‍යං ක්‍රියා චෙද්වතිඃ, තත්‍ර තස්‍යෙව, තදර්හම්" යන මේ සූත්‍රයෙන් ක්‍රියාතුල්‍යාර්ථයෙහි තෘතීයාන්තයාගෙන්ද, "ඉව" යන්නෙන් යුක්ත ද්‍රව්‍යගුණතුල්‍යාර්ථයන්හි සප්තමී විභක්ත්‍යන්තයාගෙන් හා ෂෂ්ඨීවිභක්ත්‍යන්තයාගෙන්ද, අර්හාර්ථයෙහි ද්විතීයාන්තයාගෙන්ද, "වති" (වත්) ප්‍රත්‍යය වන බව ප්‍රකාශිතයි. "බ්‍රාහ්මණෙන තුල්‍යං අධීතෙ" යන තන්හි "බ්‍රාහ්මණවත් අධීතෙ" යනු වේ. මෙහි අධ්‍යයන ක්‍රියාව හා තුල්‍යාර්ථ බැවින් "බ්‍රාහ්මණෙන" යන තෘතීයාන්තයාගෙන් "වත්" ප්‍රත්‍යයයි. බ්‍රාහ්මණෙන තුල්‍යඃ ස්ථූලඃ" යන තන්හි "ස්ථූල" යන ගුණය හා තුල්‍ය බැවින් තෘතීයාන්තයාගෙන් 'වත්' ප්‍රත්‍යය නොවේ. "මථුරායාමිව=මථුරාවත් ස්‍රුඝ්නෙ ප්‍රාකාරඃ" යන තන්හි "ඉව" යන්නෙන් යුක්ත ද්‍රව්‍ය තුල්‍යාර්ථයෙහි "මථුරායාම්" යන සප්තම්‍යන්තයාගෙන් "වත්" ප්‍රත්‍යයයි. ස්‍රුඝ්නදේශයෙහි ප්‍රාකාරය මථුරායෙහි මෙන් වේ යනු මෙහි අර්ථයි. "චෛත්‍රස්‍යෙව=චෛත්‍රවත් මෛත්‍රස්‍ය ගාවඃ" යන තන්හිද ද්‍රව්‍යතුල්‍යාර්ථයෙහි "චෛත්‍රස්‍ය" යන ෂෂ්ඨීවිභක්ත්‍යන්තයාගෙන් "වත්" ප්‍රත්‍යයයි. මෛත්‍රයාගේ ගෙරිනු චෛත්‍රයාගේ මෙන් වෙත් යනු එහි අර්ථයි. "විධිමර්හති=විධිවත්, පූජ්‍යතෙ" යන තන්හි "පූජ්‍යතෙ" යන ක්‍රියායුක්ත අර්හාර්ථයෙහි "විධිම්" යන ද්විතීයාන්තයාගෙන් "වත්" ප්‍රත්‍යයයි. විධියට සුදුසු සේ පුදනුලැබේ යනු අර්ථයි. මෙහි "වත්" ප්‍රත්‍යයාන්තශබ්ද අව්‍යය බැවින් ඔවුන් කෙරෙන් විභක්තිලොපය වේ.

311. භාවෙ, භාවාර්ථයෙහි; තත්වයණඃ, (ෂෂ්ඨීවිභක්ත්‍යන්තයා කෙරෙන්) "ත ත්ව යණ්" යන ප්‍රත්‍යයෝ වෙත්.

a ශබ්දස්‍ය ප්‍රවෘත්තිනිමිත්තං භාවඃ, තස්මින් භාවෙ ත ත්ව යණ් ඉත්‍යෙතෙ ප්‍රත්‍යයා භවන්ති (තප්‍රත්‍යයාන්තං ස්ත්‍රීලිඞ්ගම්, ත්වයණ් ඉත්‍යෙතදන්තං නපුංසකලිඞ්ගම්.) බ්‍රාහ්මණස්‍ය භාවො =බ්‍රාහ්මණතා- බ්‍රාහ්මණත්වම්- බ්‍රාහ්මණ්‍යම්. සුමනසො භාවඃ= සෞමනස්‍යම්, සුභගස්‍ය භාවඃ=සෞභාග්‍යම්, විදුෂො භාවො= වෛදුෂ්‍යම්.

---

a ශබ්දස්‍ය, ශබ්දයාගේ; ප්‍රවෘත්තිනිමිත්තං, පැවැත්මට නිමිති වන්නේ; භාවඃ, භාව නම් වේ; තස්මින් භාවෙ, ඒ ශබ්දප්‍රවෘත්ති නිමිත්තවූ භාවාර්ථයෙහි; තත්වයණ් ඉති, "ත ත්ව යණ්" යන; එතෙ ප්‍රත්‍යයාඃ භවන්ති, මේ ප්‍රත්‍යයෝ වෙත්; තප්‍රත්‍යයාන්තං, තප්‍රත්‍යය අන්තකොට ඇත්තේ; ස්ත්‍රීලිඞ්ගම්, ස්ත්‍රීලිඞ්ග වේ; ත්වයණ් ඉති, "ත්ව යණ්" යන; එතදන්තම්, මේ දෙක අන්තකොට ඇත්තේ; නපුංසකලිඞ්ගම්, නපුංසකලිඞ්ග යි; බ්‍රාහ්මණස්‍ය, බ්‍රාහ්මණයාගේ; භාවඃ, (ප්‍රවෘත්තිනිමිත්තසඞ්ඛ්‍යාත) භාවය තෙමේ; බ්‍රාහ්මණතා, "බ්‍රාහ්මණතා" නම්ද; බ්‍රාහ්මණත්වම්, "බ්‍රාහ්මණත්ව" නම්ද; බ්‍රාහ්මණ්‍යම් බ්‍රාහ්මණ්‍ය නම්ද වේ; සුමනසඃ, යහපත් සිත් ඇත්තහුගේ; භාවඃ, (ප්‍රවෘත්තිනිමිත්තසඞ්ඛ්‍යාත) භාවය තෙමේ; සෞමනස්‍යම්, "සෞමනස්‍ය" නම් වේ. සුභගස්‍ය, ශොභන ඓශ්වර්‍ය්‍ය යුක්තයාගේ; භාවඃ, භාවය; සෞභාග්‍යම්, 'සෞභාග්‍ය" නම් වේ. විදුෂඃ, පණ්ඩිතයාගේ; භාවඃ, භාවය; වෛදුෂ්‍යම්, "වෛදුෂ්‍ය" නම් වේ.

මේ භාවපදාර්ථය සමර්ථනය කරන්නාවූ චන්ද්‍රකීර්තිටීකාකාරයෝ "යෙන ශබ්දස්‍ය ප්‍රවෘත්තිඃ ප්‍රවර්තනං සම්පද්‍යතෙ භවති තත් ප්‍රවෘත්තිනිමිත්තං, තතො යච්ඡබ්දස්‍ය බ්‍රාහ්මණාදෙඃ ප්‍රවෘත්තෙඃ කාරණං ස එව භාවඃ, ජාතිද්‍රව්‍යගුණක්‍රියාභිඃ" යනු කියත්. යමකින් ශබ්දයාගේ පැවැත්ම වේ නම් ඒ ප්‍රවෘත්තිනිමිත්තය යි ද, එහෙයින් බ්‍රාහ්මණාදි ශබ්දයාගේ පැවැත්මට යමක් කරුණු වේ නම් ජාතිද්‍රව්‍ය ගුණක්‍රියාවන් කරණකොටගෙණවූ එයම භාවය වේ යනු එහි අදහස යි. ඒ ඒ ශබ්දයන්ගේ පැවැත්මට යමක් නිමිති වේ නම් ඒ භාවයයි මෙයින් ප්‍රකාශිත යි. මුග්ධබොධටීකාවෙහි- "භාවස්තු ප්‍රවෘත්තිනිමිත්තම්, යෙන ධර්මේණ අයං ගෞරිති ප්‍රතීතිඃ ස ධර්මො ගොශබ්දස්‍ය භාව ඉත්‍යර්ථඃ" යනු කියත්. එහි භාව නම් ප්‍රවෘත්ති නිමිත්ත ය යි කියා නැවත ඒ විස්තර කරන්නාහු යම් ධර්මයකින්

a "සමාහාරෙ තා ච" චකාරාත් ත්‍රේර්ගුණශ්ච ත්‍රයාණාං සමාහාරස්ත්‍රේතා, ජනානාං සමූහො=ජනතා, චකාරාත්සමූහෙ ප්‍රත්‍යයාන්තරමපි, තෙන හස්තිනාං සමූහො=හාස්තිකම්, ධේනූනාං සමූහො=ධෛනුකම්, අත්‍ර කප්‍රත්‍යයඃ, තස්‍ය ණිත්ත්වාදාදිවෘද්ධිඃ.

b "අචිත්තවාචකාදිකඃ"- කවචානාං සමූහඃ=කාවචිකම්, "ගණිකායා ණ්‍යඃ"- ගණිකානාං සමූහො= ගාණික්‍යම්, "කෙදාරාද්‍යඤ්ච" චකාරාදිකඃ- කෙදාරාණාං සමූහො=කෛදාර්‍ය්‍යම්-කෛදාරිකම්. "යුවත්‍යාදෙරණ්"- යුවතීනාං සමූහො= යෞවතම්, භික්ෂාණාං සමූහො=භෛක්ෂම්, "පාශාදිභ්‍යො යඃ" -ස ච ස්ත්‍රියාම්. පාශානාං සමූහඃ=පාශ්‍යා, වාතානාං සමූහො= වාත්‍යා, බලානාං සමූහඃ=බල්‍යා, ගවාං සමූහො=ගව්‍යා, රථානාං සමූහො=රථ්‍යා, "බලගොරථෙභ්‍ය ඉනිත්‍රකඩ්‍යචශ්ච"- බලිනී, ගොත්‍රා, රථකඩ්‍යා. (ගව්‍යත්‍යාදිප්‍රයොගා ඌහ්‍යාඃ).*

(යම් ආකාරයකින්) මේ ගෙරි තෙමේ ය යන බුද්ධිය වේ නම් ඒ ධර්මය (ඒ ආකාර ය) ගොශබ්දයාගේ භාවය යනු මෙහි අර්ථ ය යි කීහු සිද්ධාන්තකෞමුදීටීකාවෙහි-"භවන්ති අර්ථබොධනාය ප්‍රකෘතයඃ ප්‍රවෘත්තිමන්තො යෙනෙති=භාවඃ" යනුවෙන් යමකින් අර්ථය දැනගැණීමට ප්‍රකෘතීහු පවතිත් නම් ඒ භාව ය යි කීහු (යම් ශබ්දයක්හුගේ පැවැත්මට යම් ආකාරයක් නිමිති වේ නම් ඒ ආකාරය භාවයයි.) යජනාදික්‍රියාවිශිෂ්ටත්වය ජාතිරූපවූ බ්‍රාහ්මණ ශබ්දයාගේ ප්‍රවෘත්ති නිමිත්ත යි. එහෙයින් තදර්ථයෙහි ඔහු කෙරෙන් තප්‍රත්‍යයාදිය වීමෙන් "බ්‍රාහ්මණතා" යනාදිය සිද්ධ යි. සෙස්සද එසේ යි.

a සමාහාරෙ, සමාහාරාර්ථයෙහි (කීපයක් එක්කොට ගැණීමෙහි); තා ච, තාප්‍රත්‍යයද වේ. චකාරාත්, (මෙහි) චශබ්දයෙන්; ත්‍රෙඃ, ත්‍රිශබ්දයට; ගුණශ්ච, ගුණ ද වේ. ත්‍රයාණාං සමාහාරඃ, තුන් දෙනෙකුන්ගේ සමාහාර ය; ත්‍රේතා, "ත්‍රේතා" යනු වේ. ජනානාං

---

* "අචිත්තවාචකාදිකඃ" යනු පටන් කොට ඇති පාණිනීය සූත්‍ර හා තදාශ්‍රිත වාර්ත්තිකාදිය බොහෝ සාරස්වතයන්හි දක්නා නොලැබේ. තවද මෙහි "රථ" ශබ්දයාකෙරෙන් නියමිත "කඩ්‍යච්" ප්‍රත්‍යය ඇතම් තන්හි "කට්‍යච්"යි දක්නා ලැබේ. එකල්හි "රථකට්‍යා" යනු වේ.

සමූහඃ, ජනයන්ගේ සමූහය; ජනතා, "ජනතා" නම් වේ. චකාරාත්, (මෙහි) චකාරයෙන් (ම); ප්‍රත්‍යයාන්තරං අපි, ප්‍රත්‍යයවිශේෂයක්ද (මෙයින් අන්‍යවූ ප්‍රත්‍යයසමූහයක්ද)වේ. තෙන, එහෙයින්; හස්තිනාං, ඇතුන්ගේ; සමූහඃ, සමූහය; හාස්තිකම්, "හාස්තික" නම් වේ. ධේනූනාම්, දෙනුන්ගේ; සමූහඃ, සමූහය: ධෛනුකම්, "ධෛනුක" නම් වේ. අත්‍ර, මෙහි; කප්‍රත්‍යයඃ, කප්‍රත්‍යයයි. තස්‍ය, ඒ "ක" ප්‍රත්‍යය; ණිත්ත්වාත්, ණකාරය ඉත්කොට ඇතිබැවින්; ආදිවෘද්ධිඃ, (තදන්ත ශබ්දයන්ගේ) ආදියට වෘද්ධි වේ.

b අචිත්තවාචකාත්, චිත්තවාචක නොවන්නාවූ ශබ්දයාකෙරෙන්; ඉකඃ "ඉක" ප්‍රත්‍යය වේ. කවචානාම්, කවචයන්ගේ (සන්නාහයන් ගේ); සමූහඃ, සමූහය; කාවචිකම්, "කාවචික" නම් වේ. (මෙහි ණිත් සහිත 'ඉක" ප්‍රත්‍යයයි ගණිකායාඃ, "ගණිකා" ශබ්දයාකෙරෙන්; ණ්‍යඃ, "ණ්‍ය" ප්‍රත්‍යය වේ. ගණිකානාම්, වෙශ්‍යාවන්ගේ; සමූහඃ, සමූහය; ගාණික්‍යම්, "ගාණික්‍ය" නම් වේ. කෙදාරාත්, "කෙදාර" ශබ්දයාකෙරෙන්; යඤ් ච, "යඤ්" ප්‍රත්‍යයද වේ. චකාරාත්, (එහි) චකාරයෙන්; ඉකඃ 'ඉක" ප්‍රත්‍යයද වේ. කෙදාරානාම්, කෙදාරයන් ගේ (ක්ෂෙත්‍රයන්ගේ); සමූහඃ, සමූහය; කෛදාර්‍ය්‍යම්, "කෛදාර්‍ය්‍ය" නම් ද; කෛදාරිකම්, "කෛදාරික" නම් ද වේ. යුවත්‍යාදෙඃ, "යුවතී" ශබ්දාදිය කෙරෙන්; අණ්, 'අණ්" ප්‍රත්‍යය වේ. යුවතීනාම්, යුවතීන් ගේ; සමූහඃ, සමූහය; යෞවතම්, "යෞවත" නම් වේ. භික්ෂාණාං, භික්ෂාවන්ගේ; සමූහඃ, සමූහය; භෛක්ෂම්, "භෛක්ෂ" නම් වේ. පාශාදිභ්‍යඃ, "පාශ" ශබ්දාදීන්කෙරෙන්, යඃ, "ය" ප්‍රත්‍යය වේ. සඃ ච, හෙද; ස්ත්‍රියාම්, ස්ත්‍රීලිඞ්ගයෙහි වේ. පාශානාම් පාශයන්ගේ; සමූහඃ, සමූහය; පාශ්‍යා, "පාශ්‍යා" නම් වේ. වාතානාම්, වාතයන්ගේ; සමූහඃ, සමූහය; වාත්‍යා, 'වාත්‍යා" නම් වේ. බලානාම් බලයන්ගේ (ධාන්‍ය මර්දනස්ථානයන්ගේ); සමූහඃ, සමූහය; බල්‍යා, "බල්‍යා" නම් වේ. ගවාම්, ගෙරින්ගේ; සමූහඃ, සමූහය; ගව්‍යා 'ගව්‍යා" නම් වේ. රථානාම්, රථයන්ගේ; සමූහඃ, සමූහය; රථ්‍යා, "රථ්‍යා" නම් වේ බලගොරථෙභ්‍යඃ, "බල ගො රථ" යන ශබ්දයන්කෙරෙන්; ඉනිත්‍රකඩ්‍යචශ්ච "ඉනි ත්‍ර කඩ්‍යච්" යන ප්‍රත්‍යයෝද වෙත්. "බලිනී" ගොත්‍රා, රථකඩ්‍යා" යනු ඒව උදාහරණයි. වාක්‍ය හා අර්ථ පෙර මෙනි). ගව්‍යාඉත්‍යාදිප්‍රයොගාඃ, "ගව්‍යා" යනාදී ප්‍රයොගයෝ; ඌහ්‍යාඃ, විතර්කණය කටයුතුයි.

a **“කර්මණ්‍යපි යණ් වක්තව්‍යඃ” – කර්මණ්‍යපීත්‍යපිශබ්දාත් සාධ්වර්ථේ යණ්, තස්‍ය ණිත්වං න; සාමනි සාධුඃ-සාමන්‍යඃ, කර්මණි සාධුඃ=කර්මණ්‍යඃ, සභායාං සාධුඃ=සභ්‍යඃ, බ්‍රාහ්මණස්‍යේදං කර්ම-බ්‍රාහ්මණ්‍යම්, රාඥ ඉදං කර්ම=රාජන්‍යං-රාජ්‍යම්. “නෝවා” ඉති ටෙලෝපඃ.**

b **“අන්‍යත්‍රාපි යණ් වක්තව්‍යඃ”-“සමානස්‍ය වා ස ඉත්‍යාදේශඃ”-සමානෙ උදරෙ ශයිතඃ=සෝදර්‍ය්‍යඃ- සමානෝදර්‍ය්‍යඃ. ශතෙන ක්‍රීතඃ=ශත්‍යඃ.**

මෙහි කී “යුවති” ශබ්දාදිය නම්-“යුවති, පදති, පඨති, අර්චින්, දක්ෂිණා, භූත, විෂය, ශ්‍රොත්‍ර, හිංසා, ගර්භිණී, ක්ෂෙත්‍ර, කරීෂ, අඞ්ගාර, චර්මින්, සහස්‍ර” යන මේ ආදියයි. “පාශ” ශබ්දාදිය නම්-“පාශ තෘණ ධූම වාත අඞ්ගාර පාටල පොත ගල පිටක පිටාක ශකට හල ගට වන” යනාමේ ආදියයි.

a කර්මණි අපි, කර්මාර්ථයෙහි ද; යණ් වක්තව්‍යඃ, “යණ්” ප්‍රත්‍යය කියයුතු යි. කර්මණ්‍යපි ඉති, “කර්මණ්‍යපි” යන තන්හි; අපිශබ්දාත්, “අපි” ශබ්දයෙන්; සාධ්වර්ථේ, සාධුඅර්ථයෙහි (යහපත්ය යන අර්ථයෙහිද); යණ්, “යණ්” ප්‍රත්‍යය වේ. තස්‍ය, ඔහුගේ; ණිත්වම්, ණිත්භාවය; න, නොවේ. සාමනි, සාමවේදයෙහි; සාධුඃ, යහපත් වූයේ, සාමන්‍යඃ, “සාමන්‍ය” නම් වේ. කර්මණි, කර්මයෙහි; සාධුඃ, යහපත්වූයේ; කර්මණ්‍යඃ, “කර්මණ්‍ය” නම් වේ. සභායාම්, සභායෙහි; සාධුඃ, යහපත්වූයේ; සභ්‍යඃ, “සභ්‍ය” නම් වේ. (මෙහි සාධ්වර්ථයෙහි “යණ්” ප්‍රත්‍යයයි, එය ණිත්රහිතයි). ඉදං කර්ම, මේ කර්මය; බ්‍රාහ්මණස්‍ය, බ්‍රාහ්මණයාගේ කුයි; බ්‍රාහ්මණ්‍යම්, “බ්‍රාහ්මණ්‍ය” නම් වේ. ඉදං කර්ම, මේ කර්මය; රාඥඃ, රජහුගේකුයි; රාජන්‍යම්, “රාජන්‍ය” නම් ද; රාජ්‍යම් “රාජ්‍ය” නම්ද වේ. නෝවා ඉති, “නෝවා” යන සූත්‍රයෙන්; ටෙලෝපඃ, විකල්පයෙන් ටිසංඥ ලෝපය යි. (මෙහි කර්මාර්ථයෙහි “යණ්” ප්‍රත්‍යයයි)

b අන්‍යත්‍ර අපි, මින් අන් තන්හි ද; යණ් වක්තව්‍යඃ, ‘යණ්” ප්‍රත්‍යය කියයුතු යි. වා, විකල්පයෙන්; සමානස්‍ය, සමානශබ්දයට; සඃ ඉති ආදෙශඃ, ස යන ආදෙශය වේ. සමානෙ උදරෙ, සමානවූ උදරයෙහි; ශයිතඃ, සයනය කළේ; සෝදර්‍ය්‍යඃ, ‘සෝදර්‍ය්‍ය” නම්ද; සමානෝදර්‍ය්‍යඃ, (විකල්පයෙන් සකාරාදෙශ නුවූකල්හි) “සමානෝදර්‍ය්‍ය” නම් ද වේ. ශතෙන, සියයකින්; ක්‍රීතඃ, මිලදීගන්නාලද්දේ; ශත්‍යඃ, ‘ශත්‍ය” නම් වේ. (මෙහි “ක්‍රීතාර්ථයෙහි ‘‘යණ්”ප්‍රත්‍යයයි).

312. ලොහිතාදෙරිමන්.

(ලොහිතාදෙඃ 5, 1; ඉමන් 1, 1;)

a **ලොහිතාදෙර්ගණාද්භාවෙ‍ර්ථෙ ඉමන් ප්‍රත්‍යයො භවති, ස ච ඉත්, ඉත්වාට්ටිලොපඃ. ලොහිතස්‍ය භාවො=ලොහිතිමා. (ලොහිතාදෙරිති අනෙකස්වරාත් ඉම්වක්තව්‍යඃ, යත්‍ර එකස්වරස්තත්‍ර න ඉත්. ලොහිතාදෙරිමන් වෛකල්පිකඃ, තෙන-ලෞහිත්‍යම්, ලොහිතත්වම්). කාලස්‍ය භාවඃ=කාලිමා, ලඝොර්භාවො=ලඝිමා, අණොර්භාවඃ=අණිමා, “ගුර්වාදෙඃ” ඉති ගුරොර්ගරාදෙශඃ, ගුරොර්භාවො=ගරිමා, වරස්‍ය භාවො=වරිමා, මහතො භාවො=මහිමා.** *

---

312 ලොහිතාදෙඃ, “ලොහිත” ශබ්දාදිය කෙරෙන්; ඉමන් “ඉමන්’ ප්‍රත්‍යය වේ.

a ලොහිතාදෙඃ ගණාත්, ලොහිතාදි ගණයාකෙරෙන්; භාවෙ අර්ථෙ භාවාර්ථයෙහි; ඉමන්ප්‍රත්‍යයඃ භවති, “ඉමන්” ප්‍රත්‍යය වේ. සඃ ච, හෙද; ඉත්, ඉත්සංඥ වේ. ඉත්වාත්, “ඉත්” සංඥබැවින්; ටිලොපඃ, ටිසංඥලොපය වේ. ලොහිතස්‍ය, ලෝහිතයාගේ; භාවඃ, භාවය; ලොහිතිමා, “ලොහිතිමන්” නම් වේ. (මෙහි “ඉමන්’ ප්‍රත්‍යයයි). ලොහිතාදෙඃ ඉති, ‘ලොහිත” ශබ්දාදිය කෙරෙන් වේ යයි කී “ඉමන්” ප්‍රත්‍යය; අනෙකස්වරාත්, අනෙකස්වර ශබ්දයා කෙරෙන් වන්නේ; ඉත් වක්තව්‍යඃ, “ඉත්” සංඥායයි කිය යුතුයි යත්‍ර, යම්තැනෙක්හි, එකස්වරඃ, එකස්වර වේද; තත්‍ර, එහි(වන්නේ); න ඉත්, ‘ඉත්’ සංඥ නොවේ. ලොහිතාදෙඃ, ලොහිත ශබ්දාදිය කෙරෙන්; ඉමන්,‘ඉමන්”ප්‍රත්‍යය; වෛකල්පිකඃ, විකල්පයෙන් වේ. තෙන, එහෙයින්; ලෞහිත්‍යම්, “ලෞහිත්‍යම්” යනුද

* මෙහි-“ඉමනි ලොපඃ” ඉමන් ප්‍රත්‍යයෙ පරෙ වකාරස්‍ය ලොපො භවති, ස්ථූලස්‍ය භාවඃ-ස්ථෙමා, ස්ථූලස්‍ය ස්ථවාදෙශඃ” යනුද ඇතැම් සාරස්වතයන්හි දක්නා ලැබේ, “ඉමනි, ඉමන් ප්‍රත්‍යය පරකල්හි; ලොපඃ, වකාරලොපය වේ- ඉමනි ප්‍රත්‍යයෙ පරෙ, “ඉමන්” ප්‍රත්‍යය පරකල්හි; වකාරස්‍ය, වකාරයට; ලොපඃ භවති ලොප් වේ. ස්ථූලස්‍ය, ස්ථූලවූවහුගේ; භාවඃ, භාවය, ස්ථෙමා, “ස්ථෙමන්” නම් වේ’ ස්ථූලස්‍ය, ස්ථූලශබ්දයට; ස්ථවාදෙශඃ, “ස්ථව” යන ආදෙශයයි යනු එහි අර්ථයි. මෙහි “ඉමන්” ප්‍රත්‍යය පරකල්හි ස්ථූලශබ්දයට ආදෙශවූ “ස්ථව” යන්නේ වකාර ලොපයෙන් “ස්ථෙමන්” යි සිද්ධකළ ප්‍රකාශිතයි. සිද්ධාන්තකෞමුද්‍යාදියෙහි ‘ස්ථිර” ශබ්දයටවූ “ස්ථ” යන්නෙන් සිද්ධකළ පෙනේ.

313. ඍඃ රඉමනි. (ඍඃ 6, 1, රඃ 1, 1; ඉමනි 7, 1;)

a ඉමනි ප්‍රත්‍යයෙ පරෙ හසාදෙර්ලඝොර්ඍකාරස්‍ය රෙ භවති, පෘථොර්භාවඃ= ප්‍රථිමා, දෘඪස්‍ය භාවො= ද්‍රඪිමා, මෘදොර්භාවො= ම්‍රදිමා, භෘශස්‍ය භාවො=භ්‍රශිමා, කෘශස්‍ය භාවඃ=ක්‍රශිමා, හසාදිත්වාභාවාත් - ඍජොර්භාවො=ඍජිමා, ලඝුත්වාභාවාත්-කෘෂ්ණස්‍ය භාවඃ=කෘෂ්ණිමා, (සංයොගපූර්වකත්වාන්නලඝුඃ). "බහොර්භාවඃ" ඉති විග්‍රහඃ:-

---

ලොහිතත්වම්, "ලොහිතත්වම්" යනුද වේ. (මෙහි "අණ්" ප්‍රත්‍යය හා "ත්ව" ප්‍රත්‍යයයි) කාලස්‍ය, කාලයාගේ; භාවඃ, භාවය; කාලිමා, "කාලිමන්" නම් වේ. ලඝොඃ, ලඝු වූවහුගේ; භාවඃ, භාවය; ලඝිමා, "ලඝිමන්" නම් වේ. අණොඃ, ක්ෂුද්‍ර වූවහුගේ; භාවඃ, භාවය; අණිමා, "අණිමන්" නම් වේ. ගුර්වාදෙඃ ඉති, 'ගුර්වාදෙඃ" යනාදි වක්ෂ්‍යමාණ සූත්‍රයෙන්; ගුරොඃ, "ගුරු" ශබ්දයට; ගරාදෙශඃ, "ගර" යන ආදෙශය වේ. ගුරොඃ, බරවූවහුගේ; භාවඃ භාවය; ගරිමා, "ගරිමන්" නම් වේ. වරස්‍ය, උතුම් වූවහුගේ; භාවඃ, භාවය; වරිමා, "වරිමන්" නම් වේ. මහතඃ, මහත්වූවහුගේ; භාවඃ, භාවය; මහිමා, "මහිමන්" නම් වේ. (මෙහි "ඉමන්" ප්‍රත්‍යය හා ඒ පරගිම්නොතත් ටිසංඥ ලොපයයි) සිද්ධාන්තකෞමුදියෙහි "පෘථ්වාදිභ්‍ය ඉමනිච්වා" යනු "ඉමන්" ප්‍රත්‍යය විධාන සූත්‍රයි. "පෘථු" ශබ්දාදීන් කෙරෙන් විකල්ප යෙන් "ඉමනිච්" ප්‍රත්‍යය වේ යනු එහි අර්ථයි තත්ටීකාවෙහි "පෘථු" ශබ්දාදිය දක්වන්නාහු "පෘථු මෘදු මහත් පටු තනු ලඝු බහු සාධු අංශු උරු ගුරු බහුල ඛණ්ඩ දණ්ඩ චණ්ඩ" යනාදී ගුණවචන සමූහයක් ප්‍රකාශ කෙරෙත්.

313 ඉමනි, "ඉමන්" ප්‍රත්‍යය පරකල්හි; ඍඃ, ඍකාරයට; රඃ, රකාරාදෙශ වේ.

a ඉමනි ප්‍රත්‍යයෙ පරෙ, "ඉමන්" ප්‍රත්‍යය පරකල්හි; හසාදෙඃ, හසප්‍රත්‍යාහාරවර්ණයක්ආදිකොට ඇත්තාවූ; ලඝොඃ ඍකාරස්‍ය, ලඝුවූ ඍකාරයට; රඃ භවති, රකාරාදෙශ වේ. පෘථොඃ භාවඃ, මහත් බව; ප්‍රථිමා, 'ප්‍රථිමන්" නම් වේ දෘඪස්‍ය, දෘඪවූවහුගේ (බලවත් ශක්තිහුගේ); භාවඃ; භාවය; ද්‍රඪිමා, "ද්‍රඪිමන්" නම් වේ. මෘදොඃ, මෘදුවූවහුගේ; භාවඃ, භාවය; ම්‍රදිමා, "ම්‍රදිමන්" නම් වේ.

314. බහොරිලොපො භූ ච බහොඃ.

(බහොඃ 5, 1; ඉලොපඃ 1, 1; භූ 1, 1; ච 1, 1; බහොඃ 6, 1;)

a බහොරුත්තරෙෂාමිමන්නාදීනාමිකාරස්‍ය ලොපො භවති. බහොඃ ස්ථානෙ භූ චාදෙශඃ, භූමා.

අස්ත්‍යර්ථෙ මතුඃ. (අස්ත්‍යර්ථෙ 7, 1; මතුඃ 1, 1,)

භෘශස්‍ය, අතිශය ගුණයාගේ; භාවඃ, භාවය; භ්‍රශිමා, 'භ්‍රශිමන්" නම වේ. කෘශස්‍ය, කෘශවූවහුගේ; භාවඃ, භාවය; ක්‍රශිමා, 'ක්‍රශිමන්" නම් වේ. (මෙහි "ඉමන්" ප්‍රත්‍යය පර නිමිත්තකොට "පෘථු' ශබ්දාදීන්ගේ ඍකාරයට රකාරාදෙශයි) හසාදිත්වාභාවාත්, හස ප්‍රත්‍යාහාරවර්ණයක් ආදිකොට නැතිබැවින් ඍජොඃ භාවඃ, ඍජුවූවහුගේ භාවය යන තැන්හි; ඍජිමා, ඍජිමන්" නම වේ. (මෙහි ආදියෙහි ව්‍යඤ්ජනයක් නැතිබැවින් ඍකාරයට රකාරය නොවිය). ලඝුත්වාභාවාත්, ලඝුභාවය නැති බැවින්; කෘෂ්ණස්‍ය භාවඃ, කෘෂ්ණ වූවහුගේ භාවය යන තැන්හි; කෘෂ්ණිමා, "කෘෂ්ණිමන්" නම වේ. (මෙහි ඍකාරය සංයොගපූර්වත්වයෙන් ගුරුබැවින් රකාරය නොවිය). සංයොගපූර්වකත්වාත්, සංයොගයට පූර්වබැවින්; නලඝුඃ, ලඝු නොවේ. බහොඃ භාවඃ ඉති, "බහොඃ භාවඃ" යන (බහුගුණයාගේ භාවය යනු;) විග්‍රහෙ, විග්‍රහයෙහි වක්ෂ්‍යමාණ කාරයෙන් පදසිද්ධිය වේ.

314 බහොඃ, බහුශබ්දයා කෙරෙන් පරවූ (ඉමන්ප්‍රත්‍යයාදීන්ගේ); ඉලොපඃ, ඉවර්ණලොපය වේ. බහොඃ, බහුශබ්දයට; භූ ච "භූ" යනාදෙශ ද වේ.

a බහොඃ "බහු" ශබ්දයා කෙරෙන්; උත්තරෙෂාං, පරවූ; ඉමන් ආදීනාම්, 'ඉමන්" ආදිප්‍රත්‍යයන්ගේ; ඉකාරස්‍ය, ඉකාරයට; ලොපඃ භවති, ලොප් වේ. බහොඃ ස්ථානෙ, බහුශබ්දයාගේ ස්ථාන යෙහි; භූ ආදෙශශ්ච, භූ ආදෙශ ද වේ. භූමා, (එකල්හි "භූමන්" නම් වේ. (මෙහි "ඉමන්නාදීනාම්" යන තැන්හි ආදිශබ්දයෙන් "ඉෂ්ඨ ඊයසු" යන දෙක ගණුලැබේ. මෙහි වෘත්තියෙහි "ඉකාරස්‍ය" යි ඇතත් 'භූච" යන තැන්හි ච ශබ්දයෙන් ඊකාරලොපයද වියහැකියයි චන්ද්‍රකීර්ති ටීකාවෙහි කියනලදී.

315 අස්ත්‍යර්ථෙ, ඇත්තේය යන අර්ථයෙහි; මතුඃ, මතුප්‍රත්‍යය වේ.

a නාමතො මතුප්‍රත්‍යයො භවති අස්‍යාස්මින් වාස්තීත්‍යස්මින්නර්ථෙ. උකාරො නුම්විධානාර්ථඃ. ගෞරස්‍යාස්තීති= ගොමාන්-ගොමතී.

---

a නාමතඃ, නාමයාකොරෙන්; අස්‍ය, මොහුට හෝ; අස්මින් වා මොහු කෙරෙහි හෝ; අස්තීති, ඇත්තේය යන; එතස්මින් අර්ථෙ, මේ අර්ථයෙහි; මතුප්‍රත්‍යයඃ භවති, මතුප්‍රත්‍යය වේ. උකාරඃ, මතු ප්‍රත්‍යයාගේ ඉත්සංඥ උකාරය; නුම්විධානාර්ථඃ, නුම්විධානය ප්‍රයොජන කොට ඇත්තේය. ගෞඃ ගෙරිතෙම; අස්‍ය, මොහුට; අස්තීති, ඇත්තේනුයි; ගොමාන්, "ගොමත්" නම් වේ. ගොමතී, ස්ත්‍රී අර්ථයෙහි ඊප්ප්‍රත්‍යය කළකල්හි "ගොමතී" නම් වේ.

මේ අස්ත්‍යර්ථප්‍රත්‍යයෝ ප්‍රථමාන්තයා කෙරෙන් ෂෂ්ඨ්‍යර්ථයෙහි හෝ සප්තම්‍යර්ථයෙහි වෙත්, මොවුන්ට ස්ථාන කියන්නාවූ දුර්ග සිංහයෝ:-

"භූමනින්දාප්‍රශංසාසු නිත්‍යයොගෙතිශායනෙ,
සංසර්ගෙස්ති විවක්ෂායාමමී මත්වාදයො මතාඃ"

යනු කීහු. අස්ත්‍යර්ථයක් කියනුකැමැත්තෙහි ලා වන්නාවූ මතුප්‍රත්‍යයාදීහු "බහුත්ව නින්දා ප්‍රශංසා නිත්‍යයොග අතිශායනය (අති ශය විශිෂ්ට) සංසර්ග" යන මේ අර්ථයන්ට විෂයස්ථානයන්හි දන්නා ලද්දාහ, යනු එහි අර්ථයි. "යවමාන්, පාපී, රූපවාන්, ක්ෂීරිණො වෘක්ෂාඃ, උදරවතී කන්‍යා, දණ්ඩීපුරුෂඃ" යනු පිළිවෙළින් උදාහරණ යි. මෙහි 'යවමාන්" යන්නෙන් යව ඇත්තේයයි කීමෙන් බොහෝ යව ඇති බවද "පාපී" යන්නෙන් පව් ඇත්තේයයි කීමෙන් නින්දා වක්ද "රූපවාන්" යන්නෙන් රූ ඇත්තේයයි කීමෙන් (යහපත් රූ ඇත්තේයයි) ප්‍රශංසාවක්ද "ක්ෂීරිණො වෘක්ෂාඃ" යන්නෙන් කිරිඇති වෘක්ෂයෝ යයි කීමෙන් නිත්‍යනියමසම්බන්ධයද "උදර වතී කන්‍යා" යන්නෙන් උදරඇත්තාවූ කන්‍යාවයයි කීමෙන් අතිශය විශිෂ්ට උදර ඇත්තියක් බවද 'දණ්ඩී පුරුෂඃ" යන්නෙන් දඬුඇත්තාවූ පුරුෂයයි කීමෙන් ඒහා සංසර්ගය ඇතිබවද විෂය කොට ඇත්තේ වේ. තවද මුග්ධබොධටීකාවෙහි- "න කර්මධාරයාන්මත්වර්ථීයො බහුව්‍රීහිශ්චෙත්තදර්ථප්‍රතිපත්තිකරඃ" යන ප්‍රාමාණ්‍ය න්‍යාය දක්වා යම් බහුව්‍රීහිසමාසයක් ඒ මත්වර්ථ (අස්ත්‍යර්ථ) ප්‍රතිපාදනය කෙරේ නම් (ඒ බහුව්‍රීහිසමාසයට සුදුසු) කර්මධාරය සමාසයා කෙරෙන්ද මත්වර්ථප්‍රත්‍යය) (අස්ත්‍යර්ථප්‍රත්‍යය) නොවේයයි

a "ඵලබර්හිරජෙභ්‍ය ඉනෙනෞ වා ඛ්‍යාපනෙච"-ඵලමස්‍යාස්තීති= ඵලිනඃ- ඵලී, බර්හමස්‍යාස්තීති= බර්හිණඃ- බර්හී, රජොස්‍යාස්තීති=රජිනඃ-රජී.

b "බලවාතාභ්‍යාමූලං" බලූලඃ" වාතූලඃ. "වාතාතිසාරභ්‍යාං කින්"-වාතකී, අතිසාරකී. "ඌර්ණාහංශුභංභ්‍යොයුස්"- ඌර්ණායුඃ, අහංයුඃ, ශුභංයුඃ. "අර්ශආදිභ්‍යොඅඃ"- අර්ශස සලොමශව-අර්ශසඃ,-ලොමශඃ.

කියත්. එනම් "සුබුද්ධිඃ" යන කර්මධාරයසමාසය "ශොභනා බුද්ධිර්යස්‍ය සඃ සුබුද්ධිඃ"යි බහුව්‍රීහිසමාස කිරීමෙන් අස්ත්‍යර්ථප්‍රතිපාදනය වන බැවින් ඒ 'සුබුද්ධි" යන කර්මධාරය සමාසයා කෙරෙන් "මතු" ප්‍රත්‍යය ය ව "සුබුද්ධිමාන්"යි නොවේ යයි කියත්. මෙය විමසිය යුතුයි.

a ඵලබර්හිරජෙභ්‍යඃ, "ඵල බර්හී රජ" යන ශබ්දයන් කෙරෙන්; ඉනෙනෞ, "ඉන ඉන්" යන ප්‍රත්‍යය දෙක; වා වක්තව්‍යෞ, විකල්ප යෙන් කියයුතු යි. ඵලං, ඵලය; අස්‍ය, මොහුට; අස්තීති, ඇත්තේනුයි; ඵලිනඃ, "ඵලින" නම් ද; ඵලී, "ඵලින්" නම් ද වේ. බර්හම්; මයූරපිච්ඡය; අස්‍ය, මොහුට; අස්තීති, ඇත්තේනුයි; බර්හිණඃ, "බර්හිණ" නම්ද; බර්හී, "බර්හින්" නම්ද වේ. රජඃ, රජය; අස්‍ය මොහුට; අස්තීති, ඇත්තේනුයි; රජිනඃ, "රජින" නම්ද; රජී, "රජින්" නම්ද වේ-(මෙහි අස්ත්‍යර්ථයෙහි 'ඉන, ඉන්" යන ප්‍රත්‍යය දෙක යි).

d බලවාතාභ්‍යාම්, "බල වාත" යන ශබ්ද දෙකෙන් පරව; ඌලඃ, "ඌල" ප්‍රත්‍යය වේ. බලූලඃ, ("බලමස්‍යාස්ති" යන වාක්‍ය යෙහි) "බලූල" නම් ද; වාතූලඃ, ("වාතොස්‍යාස්ති" යන වාක්‍ය යෙහි) "වාතූල" නම්ද වේ. (බල ඇත්තේය වාතය ඇත්තේය යන අර්ථයි). වාතාතිසාරාභ්‍යාම්, "වාත අතිසාර"යන ශබ්ද දෙකින් පරව; කින්, "කින්" ප්‍රත්‍යය වේ. වාතකී, ("වාතොස්‍යාස්ති" යන වාක්‍යයෙහි) "වාතකින්" නම් ද; අතිසාරකී, ("අතිසාරොස්‍යාස්ති" යන වාක්‍යයෙහි) "අතිසාරකින්" නම් ද වේ. (වාත ඇත්තේය අතීසාරරෝග ඇත්තේය යන අර්ථයි.) ඌර්ණාහංශුභංභ්‍යඃ, "ඌර්ණා අහම් ශුභම්" යන මොවුන් කෙරෙන්; යුඃ, "යු"ප්‍රත්‍යය වේ. ඌර්ණායුඃ, ("ඌර්ණාස්‍යාස්ති" යන වාක්‍යයෙහි) "ඌර්ණායු" නම් ද; අහංයුඃ, ("අහං (අහඞ්කාරඃ) අස්‍යාස්ති" යන වාක්‍යයෙහි)

a "ශංකංභ්‍යාං වභයුස්තිතුතයසඃ" - ආභ්‍යාංමෙතෙ ප්‍රත්‍යයාඃ ස්‍යුරස්ත්‍යර්ථෙ. ශං විද්‍යතෙ යස්‍යාසෞ=ශංවඃ, ශංභඃ, ශංයුඃ, ශංතිඃ, ශංතුඃ, ශංතඃ, ශංයඃ. කං විද්‍යතෙ යස්‍යාසෞ=කංවඃ, කංභඃ, කංයුඃ, කංතිඃ, කංතුඃ, කංතඃ, කංයඃ, ඉත්‍යාදි.

"අහංයු" නම්ද, ශුභංයුඃ, (ශුභමස්‍යාස්ති" යන වාක්‍යයෙහි) "ශුභංයු" නම්ද වේ. (එළු ලොම් ඇත්තේය, (මම වෙමි යන) අහංකාර ඇත්තේය, යහපත ඇත්තේය, යන අර්ථයි.) අර්ණස්කෙශයොඃ, "අර්ණස් කෙශ" යන ශබ්දදෙදෙනාගේ අන්තයෙහි, වඃ, වප්‍රත්‍යය වේ. අර්ණසඃ, "අර්ණස්" ශබ්දයාගේ; සලොපශ්ච, සකාරලොපයද වේ. අර්ණවඃ, ("අර්ණාංස්‍යස්‍ය සන්ති' යන වාක්‍යයෙහි) "අර්ණව' නම්ද; කෙශවඃ, ("කෙශාඃ සන්ත්‍යස්‍ය" යන වාක්‍යයෙහි) "කෙශව" නම්ද වේ. (බොහෝ)ජලය ඇත්තේය. (ප්‍රශස්තවූ) කෙස් ඇත්තේය යන අර්ථයි).

a ශංකංභ්‍යාම්, "ශම් කම්" යන මකාරාන්ත අව්‍යය දෙකෙන් පරව; වභයුස්තිතුතයසඃ, "ව භ යුස් ති තු ත යස්" යන ප්‍රත්‍යයෝ වෙත්. ආභ්‍යාම්, මේ "ශම් කම්" යන දෙකෙන් පරව; අස්ත්‍යර්ථෙ, අස්ත්‍යර්ථයෙහි; එතෙ ප්‍රත්‍යයාඃ, මේ "ව" යනාදිප්‍රත්‍යයෝ; ස්‍යුඃ, වන්නාහ; ශං, සැපය; යස්‍ය, යමෙකුට; විද්‍යතෙ, විද්‍යමාන වේද; අසෞ, මෙතෙම; ශංවඃ "ශංව" නම්ද; ශංභඃ, "ශංභ" නම්ද; ශංයුඃ, "ශංයු" නම්ද; ශංතිඃ, "ශංති" නම්ද; "ශංතුඃ, "ශංතු" නම්ද; ශංතඃ, "ශංත" නම්ද; ශංයඃ, "ශංය" නම්ද වේ. යස්‍ය යමෙකුට; කම්, ජලය හෝ මස්තකය; විද්‍යතෙ, විද්‍යමාන වේද; අසෞ, මෙතෙම; කංවඃ "කංව" නම්ද; කංභඃ, "කංභ" නම්ද කංයුඃ, "කංයු" නම්ද; කංතිඃ, "කංති" නම්ද; කංතුඃ, "කංතු" නම්ද; කංතඃ, "කංත" නම්ද; කංයඃ, "කංය" නම්ද වේ. ඉත්‍යාදි, මේ ආදිය වේ (මෙහි යුස්, යස්" ප්‍රත්‍යය දෙකේ සකාරය ඉත්සංඥයි. ඒ "සිති ච" යන පාණිනීය සූත්‍රයෙන් සකාරය ඉත්කොට ඇත්තක් පරකල්හිද පූර්වයට පදසංඥාව නියමිත බැවින් මේ දෙක පරකල්හිද පූර්වයට පදසංඥා කොට මකාරයට අනුස්වාරය කිරීම පිණිසයි. මේ "ශංකංභ්‍යාම්" යනාදි සූත්‍රයද පාණිනීය සූත්‍රයි. මේ පද අනුස්වාරයට පරසවර්ණ වීමෙන් "සම්වඃ සම්භඃ" යනාදි වශයෙන්ද සිඩයි.)

a "ලොමාදිභ්‍යඃ ශඃ" - ලොමශඃ "පාමාදෙර්නඃ" පාමනඃ, අඞ්ගනා. "පිච්ඡාදෙරිලච්" - පිච්ඡිලඃ. "ඵෙනාදිලච්" - ඵෙනිලඃ, "තුන්දිවලිවටිභ්‍යො භඃ" - තුන්දිභඃ, වලිභඃ වටිභඃ "කාශ්‍යාදිභ්‍යො වලච් දිශිශව" - කාශිවලඃ.

b "ප්‍රඥාශ්‍රද්ධාර්චාවෘත්තිභ්‍යො ණඃ" - ප්‍රඥායස්‍යාස්තීති= ප්‍රාඥඃ, ආර්චඃ, ශ්‍රාද්ධඃ, වාර්තඃ, "ශෘඞ්ගවෘන්දාභ්‍යාමාරකන්" - ප්‍රශස්තං ශෘඞ්ගමස්‍යාස්තීති=ශෘඞ්ගාරකඃ, ප්‍රශස්තං වෘන්දමස්‍යාස්තීති= වෘන්දාරකඃ "මධ්වාදෙරඃ, මධුරඃ, මුඛරඃ, ශුෂිරඃ, (රන්ධ්‍රමා ණිත්‍යර්ථඃ) කුඤ්ජරඃ, (කුඤ්ජා හනුසන්ති) "සිධ්මාදෙර්ලඃ" - සිධ්මමස්‍යාස්තීති=සිධ්මලඃ චූඩාස්‍යාස්තීති=චූඩාලඃ *

---

a ලොමාදිභ්‍යඃ, "ලොමන්" ශබ්දාදීන්කෙරෙන්; ශඃ, "ශ" ප්‍රත්‍යය වේ ලොමශඃ, ("ලොමානි සන්ත්‍යස්‍ය" යන වාක්‍යයෙහි) "ලොමශ" නම් වේ. (බොහෝ ලොම් ඇත්තේ යන අර්ථයි) පාමාදෙඃ, "පාමන්" ශබ්දාදිය කෙරෙන්; නඃ, නප්‍රත්‍යය වේ. පාමනඃ, ("පාමාස්‍යාස්ති" යන වාක්‍යයෙහි) "පාමන" නම් වේ. (පාමාරොග ඇත්තේ යන අර්ථයි) අඞ්ගනා, ("අඞ්ගමස්‍යා අස්ති" යන වාක්‍යයෙහි) "අඞ්ගනා" නම් වේ. (ප්‍රශස්ත අවයව ඇත්තී යන අර්ථයි) පිච්ඡාදෙඃ, "පිච්ඡා" ශබ්දාදිය කෙරෙන්; ඉලච් "ඉලච්" ප්‍රත්‍යය වේ. පිච්ඡිලඃ, (පිච්ඡාස්‍යාස්ති' යන වාක්‍යයෙහි) "පිච්ඡිල" නම් වේ. (මණ්ඩය ඇත්තේය යන අර්ථයි). ඵෙනාත්, "ඵෙන" ශබ්දයාකෙරෙන් (ද); ඉලච්, "ඉලච් ප්‍රත්‍යය වේ. ඵෙනිලඃ, ("ඵෙනමස්‍යාස්ති" යන වාක්‍යයෙහි) "ඵෙනිල" නම් වේ. (පෙන ඇත්තේ යන අර්ථයි). තුන්දිවලිවටිභ්‍යඃ "තුන්දි වලි වටි' යන ශබ්දයන් කෙරෙන්; භඃ, භප්‍රත්‍යය වේ. තුන්දිභඃ, (තුන්දිරස්‍යාස්ති' යන වාක්‍යයෙහි "තුන්දිභ" නම් වේ. (මහත් නාභිය හෝ උදරය ඇත්තේ යන අර්ථයි). වලිභඃ ("වලිරස්‍යාස්ති' යන වාක්‍යයෙහි) "වලිභ" නම් වේ. උදරමයවූ වලිඇත්තේ යන අර්ථයි). වටිභඃ, ("වටිරස්‍යාස්ති' යන වාක්‍යයෙහි) "වටිභ" නම් වේ. (ගුලිඇත්තේ යන අර්ථයි-මෙහි හි තුන්දි" යන සතායි 'තුණ්ඩි' කියාද ඇතැම්තැන්හි දක්නාලැබේ. "තුන්දි" යන්නෙහි අර්ථයි). කාශ්‍යාදිභ්‍යඃ, "කාශි" ශබ්දාදීන්කෙරෙන්; වලච්, "වලච්"

---

* 'එලබර්න'' යනාදිය පටන් මෙතෙක් තිබෙන පාණිනීයසූත්‍ර හා වාර්තික කොනකයාදිය බොහෝ පොත්වල දක්නා නොලැබේ.

ප්‍රත්‍යය වේ. දීඝිශච, (ඉක් පූර්වයට) දීඝිද වේ. කෘෂිවලඃ, ("කෘෂි රස්‍යාස්ති" යන වාක්‍යයෙහි) කෘෂිවල නම් වේ, (කෘෂිකම් ඇත්තේ යන අර්ථයි).

b ප්‍රඥාර්චාශ්‍රද්ධාවෘත්තිභ්‍යඃ "ප්‍රඥා අර්චා ශ්‍රද්ධා වෘත්ති" යන මේ ශබ්දයන් කෙරෙන්; අණ්, (අස්ත්‍යර්ථයෙහි) "අණ්" ප්‍රත්‍යය වේ., අස්‍ය, මොහුට; ප්‍රඥා, ප්‍රඥාව; අස්තීති, ඇත්තේනුයි; ප්‍රාඥඃ, 'ප්‍රාඥ, නම් වේ. ආර්චඃ ("අර්චාස්‍යාස්ති" යන වාක්‍යයෙහි 'ආර්ච' නම් වේ. (පූජා ඇත්තේ යන අර්ථයි). ශ්‍රාද්ධඃ, (ශ්‍රද්ධාස්‍යාස්ති" යන වාක්‍යයෙහි) "ශ්‍රාද්ධ" නම් වේ. (ශ්‍රද්ධාඇත්තේ යන අර්ථයි) වාර්තඃ, ("වෘත්තිරස්‍යාස්ති" යන වාක්‍යයෙහි) "වාර්ත" නම් වේ. (පැවතුම් ඇත්තේ යන අර්ථයි). ශෘඞ්ගවෘන්දාභ්‍යාම් 'ශෘඞ්ග වෘන්ද" ශබ්ද දෙකෙන් පරව; ආරකච්, "ආරකච්" ප්‍රත්‍යය වේ. අස්‍ය, මොහුට; ප්‍රශස්තම්, ප්‍රශස්තවූ; ශෘඞ්ගම්, ශිඛරය; අස්තීති, ඇත්තේනුයි; ශෘඞ්ගාරකඃ, "ශෘඞ්ගාරක" නම් වේ. අස්‍ය, මොහුට; ප්‍රශස්තං, ප්‍රශස්තවූ; වෘන්දම්, සමූහයක්; අස්තීති, ඇත්තේනුයි; වෘන්දාරකඃ, "වෘන්දාරක" නම් වේ. මධ්වාදේඃ, මධුශබ්දාදිය කෙරෙන්; රඃ, රප්‍රත්‍යය වේ. මධුරඃ, ("මධ්වස්‍යාස්ති" යන වාක්‍යයෙහි "මධුර" නම් වේ. (මිහිරිබැව් ඇත්තේ යන අර්ථයි) මුඛරඃ, ("මුඛමස්‍යාස්ති" යන වාක්‍යයෙහි) "මුඛර" නම් වේ. (මුඛව්‍යාපාර ඇත්තේ යන අර්ථයි). ශුෂිරඃ, ("ශුෂිරස්‍යාස්ති" යන වාක්‍යයෙහි) "ශුෂිර" නම් වේ. රන්ධ්‍රවාන් ඉති, සිදුරුඇත්තේ යනු; අර්ථඃ, අර්ථයි. කුඤ්ජරඃ, ("කුඤ්ජාස්‍යාස්ති" යන වාක්‍යයෙහි) "කුඤ්ජර" නම් වේ. කුඤ්ජඃ, කුඤ්ජනම්; හස්තිහනුඃ, හස්තිහනුවයි, සිධ්මාදේඃ, සිධ්මශබ්දාදියකෙරෙන්; ලඃ, ලප්‍රත්‍යය වේ. සිධ්මම්, කිලාසරෝගය, අස්‍ය, මොහුට; අස්තීති, ඇත්තේනුයි; සිධ්මලඃ, "සිධ්මල, නම් වේ. අස්‍ය, මොහුට; චූඩා, ශිඛාව; අස්තීති, ඇත්තේනුයි; චූඩාලඃ, "චූඩාල" නම් වේ.

මෙහි කී "ලෝමන්" ශබ්දාදිය නම්–"ලෝමන් රෝමන් බභ්‍රු අරි ගිරි කර්ක කපි මුනි තරු" යන මෙයි. පාමන් ආදිය නම්–"පාමන් වාමන් වේමන් හේමන් ශ්ලේෂ්මන් කද්‍රු වලි සාමන් ඌෂ්මන් කෘමි" යනාදියයි. පිච්ඡාදිය නම්–"පිච්ඡා උරස් ධ්‍රුවක ධ්‍රැවක වර්ණ උදක පඞ්ක ප්‍රඥා" යනාදියයි. කෘෂි ආදිය නම්–"කෘෂි රජස් ආසුති පරිෂද්" යනාදියයි. මධු ආදිය නම්–"මධු ඌෂ සුෂි මුෂ්ක ඛ මුඛ කුඤ්ජ නග පාංශු පාණ්ඩු" යනාදියයි. සිධ්මාදිය නම්–"සිධ්ම ගඩු මණි නාභි බීජ වීණා කෘෂ්ණ නිෂ්පාව පාංශු" යනාදියයි.

316. අඉකෞ ච මත්වර්ථෙ.

(අඉකෞ 1, 2; ච 1, 1; මත්වර්ථෙ 7, 1;)

a මත්වර්ථෙ අඉකෞ ප්‍රත්‍යයෞ භවතඃ. වෛජයන්තී (පතාකා) විද්‍යතෙ යස්මින්නසෞ=වෛජයන්තඃ, මායා විද්‍යතෙ යස්‍යාසෞ=මායිකඃ.

317. මාන්තොපධාවත්විනෞ.

(මාන්තොපධාත් 5, 1; වත්විනෞ 1,2;).

b මශ්ච අශ්ච මෞ, අන්තශ්ච උපධා ච=අන්තොපධෙ, මෞ අන්තොපධෙ යස්‍යාසෞ= මාන්තොපධස්තස්මාත්) මකාරාන්තාන්මකාරොපධාදවර්ණාන්තාදවර්ණොපධාච්ච වත්විනෞ (ප්‍රත්‍යයෞ භවතො'ස්ත්‍යර්ථෙ. ශමොස්‍යාස්තීති=ශමවාන්

---

316 මත්වර්ථෙ, මතුප්‍රත්‍යයාගේ අර්ථයෙහි (අස්ත්‍යර්ථයෙහි; අඉකෞ ච, 'අ ඉක''යන ප්‍රත්‍යය දෙකද වෙත්,

a මත්වර්ථෙ, මතුප්‍රත්‍යයාගේ අර්ථයෙහි, අඉකෞ ප්‍රත්‍යයෞ භවතඃ, "අ ඉක" යන ප්‍රත්‍යය දෙක වෙත්. වෛජයන්තී පතාකා, වෛජයන්තී නම්පතාකාව; යස්මින්, යම්තැනෙක්හි; විද්‍යතෙ, විද්‍යමාන වේද; අසෞ මෙතෙම; වෛජයන්තඃ, "වෛජයන්ත" නම් වේ. (මෙහි අප්‍රත්‍යයයි). මායා, මායාව; යස්‍ය, යමෙකුට; විද්‍යතෙ, විද්‍යමාන වේද; අසෞ, මෙතෙම, මායිකඃ, "මායික" නම් වේ. (මෙහි " ඉක ප්‍රත්‍යයයි).

317 මාන්තොපධාත්, මකාර අවර්ණ දෙක අන්ත කොට හෝ උපධා කොට ඇත්තහු කෙරෙන්; වත්විනෞ 'වතු ඉන" යන ප්‍රත්‍යය දෙක වෙත්.

b (මශ්ච, මයන්නද; අශ්ච, අවර්ණයද; මෞ, මෞ" යනු වේ. අන්තශ්ච, අන්තයද; උපධා ච, උපධාසංඥයද: අන්තොපධෙ, "අන්තොපධෙ"යනු වේ. මෞ, මකාර අවර්ණ දෙක; අන්තොපධෙ, අන්ත උපධා දෙක වූවාහු; යස්‍ය, යමෙකුට වෙත්ද; අසෞ, මෙතෙම; මාන්තොපධඃ; "මාන්තොපධ,, නම් වේ. තස්මාත්, ඔහු කෙරෙන් (ඒ මාන්තොපධයා කෙරෙන්) යනු සමාසවාක්‍යාර්ථයි–අස්ත්‍යර්ථෙ, අස්ත්‍යර්ථයෙහි; මකාරාන්තාත්, මකාරාන්තයා කෙරෙන්ද; මකාරොපධාත්, මකාරය උපධා කොට ඇත්තහු

a ශ්‍රියාං යශසි සෞභාග්‍යෙ යෞවනෙ කාන්තෞ මහිම්නි ච;
සූර්‍ය්‍යෙ සංඥාවිශෙෂෙ ච මාංගල්‍යෙපි භගඃ ස්මෘතඃ.

b භගං (භාග්‍යං) විද්‍යතෙ යස්‍යාසෞ=භගවාන්. ලක්ෂ්මීර් යස්‍යාස්ති=ලක්ෂ්මීවාන්, පුත්‍රා යස්‍ය සන්ති=පුත්‍රවාන්, ධනං යස්‍යාස්ති=ධනවාන්-ධනී, ඡත්‍රමස්‍යාස්ති=ඡත්‍රවාන්-ඡත්‍රී, දණ්ඩො විද්‍යතෙ යස්‍යාසෞ=දණ්ඩවාන්-දණ්ඩී, ක්ෂත්‍රං විද්‍යතෙ යස්‍යාසෞ=ක්ෂත්‍රවාන්-ක්ෂත්‍රී, විද්‍යා යස්‍යාස්ති=විද්‍යාවාන්, දෘෂදඃ පාෂාණා විද්‍යන්තෙ යස්‍යාසෞ=දෘෂද්වාන්. (දෘෂද්වතී භූමිඃ, ''ෂට්ව්‍රිතඃ'') යශො යස්‍යාස්ති=යශස්වාන්, කිං විද්‍යතෙ යස්‍යාසෞ=කිංවාන්, කාමො විද්‍යතෙ යස්‍යාසෞ=කාමී, ශමො යස්‍යාස්ති=ශමී, දමො යස්‍යාස්ති=දමී. භාන් නක්ෂත්‍රාණි විද්‍යන්තෙ යස්‍යාසෞ=භවාන්

කෙරෙන්ද; අවර්ණාන්තාත්, අවර්ණාන්තයා කෙරෙන්ද; අවර්ණො පධාච්ච, අවර්ණය උපධා කොට ඇත්තනු කෙරෙන්ද; වතුවිනෞ ප්‍රත්‍යයෞ භවතඃ, ''වතු ඉන'' යන ප්‍රත්‍යය දෙක වෙත් මඝඃ, පූජාව; අස්‍ය, මොහුට; අස්ති, ඇත්තේ නුයි; මඝවාන්, ''මඝවත්'' නම වේ. (මෙහි අකාරාන්තයා කෙරෙන් '' වතු ප්‍රත්‍යයයි).

a භගඃ, ''භග'' ශබ්දය; ශ්‍රියාම්, ලක්ෂ්මී යන අර්ථයෙහිද; යශසි, යශසෙහිද; සෞභාග්‍යෙ, සුභගභාවයෙහිද; යෞවනෙ, යෞවනයෙහිද; කාන්තෞ, කාන්තියෙහිද; මහිම්නි ච, මහත්වයෙහිද; සූර්‍ය්‍යෙ, සූර්‍ය්‍යයා කෙරෙහිද; සංඥාවිශෙෂෙ ච, නාමවිශෙෂයෙහිද; මාංගල්‍යෙ අපි, මාංගල්‍යයෙහිද; ස්මෘතඃ දන්නාලදී.

b භගං, ''භගං'' යි සේයි; භාග්‍යං, භාග්‍යය, යස්‍ය, යමෙකුට; විද්‍යතෙ, විද්‍යමාන වේද, අසෞ; මෙතෙම; භගවාන්, ''භගවත්'' නම වේ. (අකාරාන්තයා කෙරෙන් වතුප්‍රත්‍යයයි) අස්‍ය, මොහුට; ලක්ෂ්මීඃ, ශ්‍රීකාන්තාව; අස්ති, ඇත්තේ නුයි, ලක්ෂ්මීවාන්, ''ලක්ෂ්මීවත්'' නාම වේ. (මෙහි මකාරය උපධා කොට ඇත්තනු කෙරෙන්; ''වතු''ප්‍රත්‍යයයි). අස්‍ය, මොහුට; පුත්‍රාඃ, පුත්‍රතෙම; සන්ති, ඇත්තේ නුයි; පුත්‍රවාන්, ''පුත්‍රවත්'' නාම වේ. ධනං, ධනය; අස්‍ය, මොහුට; අස්ති, ඇත්තේ නුයි; ධනවාන්, ''ධනවත්'' නම්ද; ධනී; 'ධනින්'' නම්ද වේ. අස්‍ය, මොහුට; ඡත්‍රං, ඡත්‍රය; අස්ති, ඇත්තේනුයි; ඡත්‍රවාන්, ''ඡත්‍රවත්'' නාම්ද; ඡත්‍රී, ''ඡත්‍රින්'' නම්ද වේ. අස්‍ය මොහුට; දණ්ඩඃ, දණ්ඩක්; අස්ති, ඇත්තේ නුයි; දණ්ඩවාන්, 'දණ්ඩවත්' නම්ද; දණ්ඩී 'දණ්ඩින්'' නම්ද වේ. අස්‍ය, මොහුට; ක්ෂත්‍රං,

ක්ෂත්‍රය; විද්‍යතෙ, විද්‍යමාන නුයි; අසෞ, මෙතෙම; ක්ෂත්‍රවාන් ''ක්ෂත්‍රවත්'' නම්ද; ක්ෂත්‍රී, 'ක්ෂත්‍රින් නම්ද වේ. (මෙහිද අකාරාන්තයා කෙරෙන් ''වතු'' ප්‍රත්‍යය හා ''ඉන්'' ප්‍රත්‍යයයි). අස්‍ය, මොහුට; විද්‍යා, විද්‍යාව; අස්ති, ඇත්තේනුයි; විද්‍යාවාන්, ''විද්‍යාවත්'' නම් වේ. (මෙහි අකාරාන්තයා කෙරෙන් ''වතු'' ප්‍රත්‍යයයි). දෘෂදඃ, පාෂාණයෝ; අස්‍ය, මොහුට; විද්‍යන්තෙ, විද්‍යමාන වෙත්නුයි; අසෞ, මෙතෙම; දෘෂද්වාන්'' දෘෂද්වත්' නම් වේ. දෘෂද්වතී, ස්ත්‍රීලිංගයෙහි ''දෘෂද්වතී'' යනු වේ. භූමිඃ, භූමියයි. 'ෂ්ට්වග්ව්‍රිතඃ'' යන සූත්‍රයෙන් මෙහි ඊප්‍රත්‍යයයි. යශඃ, යශස; අස්‍ය, මොහුට; අස්ති, ඇත්තේනුයි; යශස්වාන්, ''යශස්වත්'' නම් වේ. (මෙහි අකාරය උපධා කොට ඇත්තනු කෙරෙන් ''වතු'' ප්‍රත්‍යයයි). අස්‍ය, මොහුට, කිම්, කිඤ්චිය හෝ නිකුව; විද්‍යතෙ, විද්‍යමාන වේනුයි; අසෞ, මෙතෙම; කිංවාන්, ''කිංවත්'' නම් වේ. (මෙහි මකාරාන්තයා කෙරෙන් ''වතු'' ප්‍රත්‍යයයි). අස්‍ය, මොහුට; කාමඃ, කාමය; විද්‍යතෙ, විද්‍යමාන වේනුයි. අසෞ, මෙතෙම; කාමී, ''කාමින්'' නම් වේ. (මෙහි අකාරාන්තයා කෙරෙන් ''ඉන්'' ප්‍රත්‍යයයි). අස්‍ය, මොහුට; ශමඃ ශාන්තිය; අස්ති; ඇත්තේනුයි; ශමී, 'ශමින්'' නම වේ; අස්‍ය, මොහුට, දමඃ, ඉන්ද්‍රිය දමනය; අස්ති, ඇත්තේනුයි; දමී, ''දමින්'' නම් වේ. (මෙහි මකාරය උපධා කොට ඇත්තනු කෙරෙන් 'ඉන්'' ප්‍රත්‍යයයි). භානි, 'භාන්'' යයි; සේයි; නක්ෂත්‍රාණි, නක්ෂත්‍රයෝ; අස්‍ය, මොහුට; විද්‍යන්තෙ, විද්‍යමානවෙත්නුයි; අසෞ, මෙතෙම; භවාන් ''භවත්'' නම් වේ. (මෙහි අකාරාන්තයා කෙරෙන් '' වතු'' ප්‍රත්‍යයයි).

''මාන්තොපධාච්චමතෙ'' යන සූත්‍රය යථොක්ත මතුප්‍රත්‍යයා ගේ අපවාදය පිණිස කියනලදී; එනම් මකාරාන්ත මකාරොපධ අවර්ණාන්ත අවර්ණොපධ ශබ්දයන්කෙරෙන් මතුප්‍රත්‍යය නොව වතු ප්‍රත්‍යය වේයයි සූත්‍රාර්ථයයි. මේ සූත්‍රයේ පළමුවෙලට උදාහරණ නම්. ''කිංවාන්, ලක්ෂ්මීවාන්, මඝවාන්, විද්‍යාවාන්, යශස්වාන්, භාස්වාන්'' යන මොහු වෙත්. මුග්ධබෝධයෙහි ''මොඩ්ඣඛපාඤ් මතුඃ''යි සූත්‍රය හැරා යථොක්තමකාරාන්තාදියකෙරෙන්ද 'ඣප'' ප්‍රත්‍යාහාරාන්තයා කෙරෙන්ද වතුප්‍රත්‍යය වෙයැයි කියනලදී. එය ''මාදුපධායාශ්චමතොර්වොයවාදිභ්‍යඃ, ඣයඃ'' යන පාණිනීයසූත්‍රව ලටද සමවේ. මෙහිද වක්ෂ්‍යමාණ ''තඩිදාදිභ්‍යශ්ච'' යන්නෙන් දක්‍ෂ්‍යමාන උදාහරණ ඣපප්‍රත්‍යාහාරාන්තයනට ඇතුලත් වෙත්. තවද මෙහි පාණිනීය සූත්‍රයෙහි ''අයවාදිභ්‍යඃ'' යනුවෙන් ''යව'' ශබ්දාදීන් කෙරෙන් ''වතු''ප්‍රත්‍යය නොව මතුප්‍රත්‍යයම වේයයි කියත්.

a "තඩිදාදිභ්‍යශ්ච"- තඩිදාදිභ්‍යඃ ශබ්දෙභ්‍යො වතුප්‍රත්‍යයො භවති. තඩිද්විද්‍යතෙ යස්‍යාසෞ=තඩිත්වාන්, විද්‍යුත්වාන්. මරුද්විද්‍යතෙ යස්‍යාසෞ,=මරුත්වාන්, "තකාරාන්තස්‍ය සකාරාන්තස්‍ය භසාද්‍යවර්ණාදෞ ප්‍රත්‍යයෙ පරෙ අපදාන්තතා වක්තව්‍යා, යස්වරාදෞ ප්‍රත්‍යයමාත්‍රෙ පරෙ සර්වෙෂාමපදාන්තතා භවති, ඊයෙ පරෙ පදාන්තතා" ඉති-භවදීයම්.

යවාදිය නම්- "යව දල්මි උර්මි භූමි කෘමි කුඤ්චා වශා ද්‍රාක්‍ෂා ධ්‍රාක්‍ෂා කිරිත් කකුත් ගරුත්" යනාදියයි. මෙහි "මාදෙනාපධාත්" යනාදිසූත්‍රයට නිමිති ඇතත් වතුප්‍රත්‍යය නොව "මතු" ප්‍රත්‍යයෙන් "යවමාන්" යනාදිය සිඬයි.

